



බොරීස්
පලෙවොයි

# සැබෑ
# මිනිසෙකුගේ
# කතාවක්

RUSSIAN
*CLASSICS*




බරීස් පලෙවොයි
1908-1981

බරිස් පලෙවෝයි

# සැබෑ මිනිසෙකුගේ කතාවක්

# සැබෑ මිනිසෙකුගේ කතාවක්

**බරීස් පලෙවොයි**

අනුවාදය

**දෑදිගම වී. රුද්රිගු**

ISBN 978-624-5937-15-8

පරිගණක අකුරු සැකසුම
නිරූපමා සෙනරත්

මුද්‍රණය සහ ප්‍රකාශනය

KANOL

**සී/ස. කැනොල් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම**

2023
ශ්‍රී ලංකාවේ මුද්‍රණය කරන ලදි

## පටුන


පළමුවැනි කොටස ........................................ 5

දෙවැනි කොටස ........................................ 75

තෙවැනි කොටස ........................................ 157

හතරවන කොටස ........................................ 218

පසු වැකිය ........................................ 268



අලෙක්සේයි මෙරේස්යෙව්
1916-2001

# පළමුවැනි කොටස

## 1

අහසේ තරු බැබළේ. එහෙත්, පෙරදිග අහසේ අරුණෝදය නිසා එළිය වැටෙන්නට විය. තුරු අවට සෙවණැලි කෙමෙන් අතුරුදන් වෙයි. කඳු මුදුන් පිසගෙන සිසිල් සුළං පහරක් හමා යයි. සියවස් ගණන් පැරැණි පයින් ගස් තමන් සතු රහස් තොරතුරු හුවමාරු කරන්නට මෙන් කොඳුරන්නට විය. තුරු අතුවල රැඳී තිබුණු වියළි හිම වැටෙත්ම 'සුරු' 'සුරු' හඬක් ඇති විය.

සැණෙකින් ඇති වූ දැඩි සුළඟ එලෙස ම හදිසියෙන් ම නැවැතිණි. ගස් නැවත හිම නිද්‍රාවට වැටිණි. එවිට උදෑසන ආරංචි පතුරුවා හැරීමට මෙන් කැලෑවේ සියලු සත්තු හඬ නඟන්නට වූහ. ගුහාවල ලැග සිටින වෘකයෝ ද, හිවල්ලු ද 'හූ' හඬ නැඟූහ. කොට්ටෝරුවෙක් 'ටක්' 'ටක්' යන හඬින් ගසකට අනින්නට විය. එය කොතරම් මිහිරි හඬක් ගෙන දුන්නේ ද යත්, ගසක කඳට ගසන පහරකට වඩා වීණාවක තතක් ඇදීමකට සමාන විය.

යෝධ පයින් තුරු මුදුන් පිසගෙන නැවත දැඩි සුළඟක් හැමී ය. හිරු රැස් නිසා අහස පැහැදිලි වෙත් ම, අවසාන එළිය ද නිවී ගියේ ය. අඳුරු සෙවණැලි මකා දැමූ වනය හරිත වර්ණයෙන් සැරසිණි. පයින් හා දේවදාර ගස් මුදුන් ළා රත් පැහැයෙන් දිලිසෙන්නට වූයේ හිරු පෙරදිග අහසට නැඟ තිබෙන බව දන්වමිනි. පැහැදිලි, සිසිල්, ශීතල දවසක සලකුණු ය ඒ.

දැන් හිරු එළිය පැතිර ඇත. ඉකුත් රැයෙහි දී ගිලගත් ගොදුරු දිරවා ගැනීම පිණිස වෘකයෝ තම ගුහාවලට වැදුණහ. තම පා සටහන් සතුරන්ට සොයා ගැනීමට බැරි වන සේ කපටි ලෙස ඒවා අවුල් කර දැමූ හිවල්ලු සිය ගුහාවල සැඟවුණහ. පැරැණි වනය නොනවත්වා හඬ නඟයි. කුරුලු හඬත්, කොට්ටෝරුවන්ගේ 'ටක' 'ටක'යත්,

පුංචි කහ කුරුල්ලන්ගේ ගීත නාදයත්, කිරළුන්ගේ වියළි අඳෝනාවත්, වනයේ කැලඹුණු, දුක්මුසු ශබ්දයට මුදු නවාංගයක් එකතු කළේ ය.

ඇල්ඩර් ගසක අත්තක හිඳගෙන හොට අතුල්ලමින් සිටි පොල්කිච්චෙක් හදිසියේ හිස ඔසවා වටපිට බැලුවේ වහා ම පියාඹා යන්නට මෙනි. අතු, අනතුරු හඟවන හඬක් නැඟී ය. ලොකු ශක්තිමත් කිසිවෙක් ගස්, වැල්වල හැපෙමින් ගමන් කරයි. පඳුරු, ළපටි පයින් තුරු මුදුන් සෙලවිණි. හිම පෑගෙන 'කර' 'කර' හඬ දැන් පැහැදිලි ව ඇසේ. බිය වූ පොල්කිච්චා පියාපත් විහිදා සැණෙකින් පියාඹා ගියේ ය.

හිමෙන් වැසී ඇති පයින් ගස් අතුරෙන් දිග හොම්බක් සහිත මුහුණක් මතුවිය. අතු සහිත අං තට්ටුවකින් සැරසී ඇති එම මුහුණේ ඇස්, බියගත් විලාසයක් පාමින් අවට බලයි. එහි ළා රත් පැහැති නාස්පුඩුවලින් පිටවන වාතය උණුසුම් ය.

මහලු ගෝනා පයින් ගස් අතර ගල් රුවක් මෙන් සිට ගත්තේ ය. සනැති මවිල් ගස්වලින් ගහන උගේ හම නැටවෙයි. හැම ශබ්දයක් ම ඌ මහත් ඕනෑකමින් අසයි. දිගැති උගේ කන්වලට ඉතා ම සුළු ශබ්දයක් පවා ඇසේ. දිරාගිය පහින් ගස් කඳක සිදුරක් කරන කුරුමිණියකුගේ හඬ පවා ඌට පැහැදිලි ව ඇසේ. එහෙත්, තියුණු ශ්‍රවණයක් ඇති මේ කන්වලට පවා කුරුලු නාදය, කොට්ටෝරුවාගේ ටක ටකය සහ පයින් තුරු මුදුන්වල හඬ හැර වෙන කිසිදු හඬක් නෑසිණි.

අහසින් ඇසුණු ශබ්දයකට උගේ අවධානය යොමු විය. උගේ පිට නැටවිණි. උගේ කකුල්වල මස් පිඬු තවත් දැඩි විය.

එහෙත්, ශබ්දය භයානක නොවී ය. බර්ච් අංකුරයක අත්තක් වටා පියාඹන කුරුමිණි රංචුවක් නඟන හඬට එය සමාන ය. එම හඬට ඉඳ හිට එකතුවන තවත් ශබ්දයකි, මඩ වළක කොරවක්කකු නඟන හඬක් මෙනි.

දැන් කුරුමිණි රංචුව අත් අඬු විදහාගෙන නටන සැටි පෙනේ. නිල් පැහැති ශීත සුළං නිසා උන්ගේ අත් අඬු දිලිසේ. එක් කුරුමිණියෙක් පහළට බැස්සේ ය. ඉතිරි අය තව ම නටති. සන්සුන් වූ ගෝනා පිටියකට වැද හිම

ලෙවකමින් සුපරීක්ෂාකාරී ලෙස අහස දෙස බැලී ය. හදිසියෙන් ම රංචුවෙන් වෙන් වුණු තවත් කුරුමිණියෙක් එක එල්ලේ ම පහළට පියාසර කළේ ය. එය කොතරම් විශාල වී ද යත්, බියවුණු ගෝනා අසල පඳුරකට පැන ගැනීමට සමත් වුණේ යම්තමිනි. හේමන්තයේ චණ්ඩ කුණාටුවකට වඩා වේගවත්, බියකරු එම බලය තුරු මුදුන්වල හැපී හිමෙන් වැසුණු පොළොවට වැටුණේ මුළු මහත් වනය දෙවනත් කරමිනි. ඉන් පැන නැගුණු මහා ශබ්දය ගස් අතරින් වනය පුරා පැතිර ගියේ වේගයෙන් දුවන ගෝනා පසුකරමිනි.

දෝංකාරය වනයේ ඈතට විහිදී ගියේ ය. බිම ඇද වැටුණු අහස්යානය නිසා තුරු මුදුන්වල තිබූ වියළි හිම පියළි පොළොව සිප ගත්තේ, දිලිසෙමිනි. නැවත වනය අරක්ගත්තේ මහා නිසලතාවකි. එය බිඳගෙන මිනිසෙක් නැගූ දුක්මුසු හඬක් නැවත පැතිර යත් ම, සෝෂාව නිසා සිය ගුහාවෙන් පිට ව, පිටිය බලා යන වලසකුගේ පාවලට පෑගෙන හිම 'කර' 'කර' හඬක් නැඟී ය.

දළ ලොමින් ගැවසී ගත් ඒ වලහා මහලු ය, විශාල ය. උගේ කිලිටි ලොම් සහිත හම, ප්‍රමාණයෙන් උගට වඩා විශාල ය. හේතුව, වලසා කෘශ ශරීරයක් ඇත්තෙක් වීම ය. දෙපැත්තේ ලොම් කඩා හැලෙන්නට වූයේ තරුණ වියෙහි දී තරබාරු ව සිට මහලු වූ පසු කෙට්ටු වූ තරම පෙන්වන්නාක් මෙනි. හේමන්තයේ සිට මේ පෙදෙසේ දරුණු ලෙස යුද්ධය ඇවිළිණි.

ඉස්සර කැලෑ පරීක්ෂකයන් හා දඩයම්කාරයන් පමණක් පැමිණි මේ වනය සතුන්ගේ අභය භූමියක් විය. ශීත කාලය පුරා ම අවදි නොවී, එක දිගට ම නිදන වලසාට පවා අවදිවීමට සිදුවූයේ යුද්ධය පටන් ගත් බැවිනි. බඩගින්න හා සුපුරුදු හේමන්ත නින්ද කඩවීම නිසා කෝපයට පත් වලසා ඉබාගාතේ ඇවිදින්නට විය.

වලසා මීට මොහොතකට පෙර ගෝනා නැවතී සිටි වනාන්තරයට ආවේ ය. උගට ගෝන ඉව දැනිණි. උග කෑදර ලෙස තලු මරන්නට විය. නැවත ඉව අල්ලමින් තම කෙට්ටු සිරුර ඒ මේ අත හරවමින් කන් යොමා ශබ්දයක් අසන්නාක් මෙන් සිටියේ ය. ගෝනා එතැන

නැත. එහෙත්, ඌට සිටි තැනින් දුර්වල හඬක් ඇසෙන්නට විය. වලසාගේ බෙල්ලේ ලොම් කෙළින් සිටියාක් මෙනි. ඌ හොම්බ දිගු කොට නැවත ඉව ඇල්ලී ය. නැවත සීන් හඬක් වනයෙන් ඇසිණි.

වලසා සෙමෙන් හා ප්‍රවේසමින් මළාක් මෙන් වැතිර සිටින මිනිස් සිරුරක් වෙත ළං වෙන්නට විය. උගේ පාවලට පෑගෙන හිම 'ක්‍රීක්' හඬක් නැඟී ය. මිනිස් සිරුර අඩ වශයෙන් හිමෙන් වැසී තිබිණි.

## 2

අහස් නියමු අලෙක්සේයි මෙරේස්යෙව් 'අඬු' දෙකකට එකවර අසු වුණේ ය. අහස් සටනක දී සිදුවිය හැකි අතිශයින් ම භායනක දෙයකට ඔහු මුහුණ පෑවේ ය. ජර්මන් අහස්යානා සතරකට ඔහුගේ අහස්යානය මැදි වන විට, ඔහු සතු ව තිබූ වෙඩි උණ්ඩ සියල්ල අවසාන වී තිබිණි. සතුරු අහස්යානා සතර අලෙක්සේයිගේ යානයට පිටවී යාමට ඉඩ නොදී ඔහු ජර්මන් අහස් තොටුපළට බලෙන් ගෙන යයි...

එය සිදු වූයේ මෙසේ යඃ සතුරු අහස් තොටුපළකට බෝම්බ දැමීමට ගිය 'ඉල්' වර්ගයේ අහස්යාත්‍රා කණ්ඩායමක් කැටුව යාම අහස් නියමු ලයිතන් අලෙක්සේයි මෙරේස්යෙව්ගේ ප්‍රහාරක අහස්යානා කණ්ඩායමට භාර විය. ඒ නිර්භය ප්‍රහාරය සාර්ථක විය. පාබළ හමුදාවේ භටයන් අතර 'පියාඹන යුද්ධ ටැංකි' නමින් ප්‍රසිද්ධ 'ස්ට්‍රොමොවික්' වර්ගයට අයත් මේ අහස්යානා සතුරාට නොපෙනෙන තරම් පහතින් පියාඹා බලාපොරොත්තු රහිත ලෙස පයින් ගස්වලට ඉහළින් සතුරු අහස් තොටුපළ දක්වා ගොස්, එහි නවතා තිබූ 'යුන්කර්ස්' වර්ගයේ ප්‍රවාහන යානා විනාශ කර දැම්මේ ය. අඳුරු පයින් වනයෙන් හදිසියෙන් මතු වූ මේ ස්ට්‍රොමොවික් අහස්යානා සතුරු අහස් තොටුපළට උඩින් පියාසර කරමින් විශාල ප්‍රමාණයේ අහස්යානාවලට වෙඩි තැබී ය. මැෂින් තුවක්කු, කාල තුවක්කු හා රොකට් වෙඩිවලින් සතුරු අහස්යානා විනාශ විය. බෝම්බ දමමින් වෙඩි තබන අහස්යානා ආරක්ෂා කිරීම මෙරේස්යෙව්ගේ ප්‍රහාරක අහස්යානා

කණ්ඩායමට භාරවිය. ඔහුගේ ප්‍රහාරක යානා සතර ඒ කාර්යයෙහි යෙදේ. සතුරු අහස් තොටුපළේ මිනිස්සු ඒ මේ අත දුවන සැටි මෙරේස්යෙව්ට පෙනේ. පහර කන ප්‍රවාහන සතුරු යානා බඩගාමින් ඇදෙයි. සතුරු අහස් තොටුපළට පහර දෙන සෝවියට් ස්ට්‍රෝමොවික් යානා නැවත, නැවත පියාඹමින් බෝම්බ දමයි. වෙඩි තබයි. සමහර සතුරු 'යුන්කර්ස්' අහස්යානා ගිනි ගොඩවල් මැදින් පියාඹා අහසට නැඟීමට තැත් කරන සැටි මෙරේස්යෙව් දුටුවේ ය.

අලෙක්සේයි බරපතළ වරදක් කළේ මෙන්න මෙතැන දී ය. පහර දෙන පෙදෙස රකිනු වෙනුවට, ඔහු 'ලෙහෙසි දඩයමක්' නිසා පෙලඹවීමකට හසු විය. අහසට නැඟීමට යන සතුරු අහස්යානයක් මත ගලක් මෙන් පතිත වූ මෙරේස්යෙව්ගේ ප්‍රහාරක යානය සතුරු යානයේ බඳය හරහා මැසින් තුවක්කු වෙඩි කීපයක් තැබී ය. තම ප්‍රහාරය ගැන ඔහු කොතරම් විශ්වාසයක් තැබී ද යත්, ගිනිගෙන ඇද වැටුණු සතුරු යානය දෙස බැලීම පවා නොකෙළේ ය. අහස් තොටුපළේ එක් කොනකින් තවත් 'යුන්කර්ස්' යානයක් අහසට නැංගේ ය. එය ලුහුබැඳ ගිය අලෙක්සේයි එයට පහර දුන් නමුදු, සාර්ථක නොවී ය. සෙමෙන් අහසට නගින සතුරු යානයට උඩින් ඔහු වෙඩි තැබීම එයට හේතුවිය. සතුරු යානය වටා පියාසර කළ ඔහු නැවත පහර දුන් නමුදු, එවර ද අසාර්ථක විය. නැවත වරක් තම ගොදුර වෙත ළං වූ මෙරේස්යෙව් තෙවන වරට ද පහර දුන්නේ ය. ගිනිගත් සතුරු යානය වනය මත කඩා වැටුණේ හෙණ හඬක් මෙන් මහා ශබ්දයක් නගමිනි. සතුරු යානය කඩා වැටුණු තැනට ඉහළින් දෙවටයක් පියාඹා ගිය ඔහු සතුරු අහස් තොටුපළට යාමට තම ප්‍රහාරක යානය හැරවීය.

එහෙත්, ඔහුට එහි යාමට බැරි විය. සෝවියට් ප්‍රහාරකයන් එළවා දැමීම සඳහා ජර්මන් අහස් තොටුපළේ ප්‍රධානියා විසින් ළඟැති තවත් අහස් තොටුපළකින් ගෙන්වා ගන්නා ලද 'මෙසර්ස්'[1] වර්ගයේ ජර්මන් ප්‍රහාරක අහස්යානා නවයක් තමාගේ

1. මෙසර්ස් - මෙසර්ෂ්මිත් වර්ගයට අයත් ජර්මන් ප්‍රහාරක අහස්යානා ය.

ප්‍රහාරක යානා තුනකට පහර දෙන සැටි අලෙක්සේයි දුටුවේ ය. ප්‍රහාරය අහස්යානා තුන බෝම්බ දමන සෝවියට් අහස්යානා වෙත ළංවීමට සතුරු 'මෙසර්ස්' නවයට ඉඩ නොදී වීරයන් ලෙස සටන් කරති. කළු ග්‍රවුස් නමැති පක්ෂීන් තම පැටවුන් ආරක්ෂා කිරීමේ දී යොදන උපක්‍රමයට සමාන උපක්‍රම යොදමින් සෝවියට් ප්‍රහාරක අහස්යානා තුන, සතුරු 'මෙසර්ස්' නවය තමන් වෙත ඇද ගනිමින්, බෝම්බ දමන සෝවියට් ස්ට්‍රොමොවික් අහස්යානා ආරක්ෂා කරමින් පහර දෙති.

ලෙහෙසි ගොදුරු සොයා යමින් තමා කළ වරද අවබෝධ කරගත් අලෙක්සේයි ලජ්ජාවට පත් වූයෙන්, ඔහුගේ දෙකොපුල් රත්පැහැ විය. ගොදුරක් සොයමින් ගිය 'මෙසර්ස්' යානයක් කණ්ඩායමෙන් ඈත් විය. අලෙක්සේයි මේ යානයට පහර දීම සඳහා දත්මිටි කමින් යානය මහත් වේගයෙන් පැදවීය. සතුරු අහස් යානයේ බඳයට පහර දීම පිණිස ඔහු අහස්යානා යුද්ධ විද්‍යාවේ හැම රීතියක් ම අකුරට පිළිපදිමින් ක්‍රියා කළේ ය. ඉලක්කය බලන දක්නය තුළින් ඔහුට සතුරු යානයේ අළුපාට බඳය පෙනේ. දක්නයේ ඉලක්කය අනුව ඔහු සතුරු යානයට වෙඩි තැබීමේ ඇණය ක්‍රියා කරවීය. එහෙත්, සතුරු යානය නිරුපද්‍රිත ව පියාඹන්නට විය. වැරැදීමට කිසි ම අවකාශයක් නැත. දක්නයේ ඉලක්කය අනුව ඔහු නිවැරැදි ලෙස වෙඩි තබා ඇත. ''වෙඩි උණ්ඩ ඉවර වෙලා!'' යැයි ඔහුට සිතිණි. එවිට ම ඔහුගේ පිට දිගේ ගලා ගිය හීන් ඩහදිය බිඳුවල ශීතල ඔහුට දැනිණි. වෙඩි උණ්ඩ ඇත්දැයි සොයා බැලීමට ඔහු ඇණය නැවත ඔබන්නට විය. වෙඩි හඬ පිටවන විට ඇතිවන කම්පනය නොදැනේ. වෙඩි උණ්ඩ සියල්ල අවසන් වෙලා ය. සතුරාගේ ප්‍රවාහන අහස්යානා විනාශ කිරීම පිණිස ඔහු තමා සතු සියලු වෙඩි හා පතොරොන් පාවිච්චි කළේ ය.

එහෙත්, සතුරා තව ම ඒ ගැන නොදනී! සතුරු යානා නවයකට එදිරි ව සටන් කරන අහස්යානා තුනට ආධාර දීම් වස් ඔහු සටන් කිරීමට පටන් ගත්තේ ය. එහෙත්, ඔහුට පොට වැරැදිණි. ඔහු පහර ගැසූ 'මෙසර්ස්' යානය පදවන ජර්මන් නියමුවා හොඳ නිරීක්ෂකයෙකි. අලෙක්සේයි

වෙඩි උණ්ඩ රහිත ව යානය පදවන බව ජර්මන් නියමුවා තම සගයන්ට දැන්වීය. අහස්යානා නවයෙන් හතරක් අලෙක්සේයිගේ යානය වට කොට ගත්හ. දෙපැත්තෙන් සතුරු යානා දෙකකි. ඉතිරි දෙකින් එකක් ඉහළින් ද, අනික පහළින් ද පියාසර කරයි. ඔහු යා යුතු මඟ ඔවුහු වෙඩි පහරවලින් පිරිසිදු අහසේ ලකුණු කරති. දැන් අලෙක්සේයි සතුරු 'අඬු' දෙකකට මැදිවී ඇත.

බටහිර යුරෝපයේ සිට ස්තාරය රුස්සා නම් වූ මේ පෙදෙසට 'රිහ්ට්ගෝපෙන්' නමැති ජර්මන් අහස්යානා ඩිවිෂනය (සේනාංකය) පැමිණි බව අලෙක්සේයිට මීට දවස් කීපයකට පෙර අසන්නට ලැබිණි. පැසිස්ට් ජර්මනියේ දක්ෂම අහස් නියමුවන් මේ ඩිවිෂනයේ සේවය කරන බවත්, පැසිස්ට් නායක ගෝරිංගේ අනුග්‍රහය ඔවුන්ට ලැබෙන බවත් ප්‍රකට කරුණකි. තමා සතුරු අහස් තොටුපළට සිරකරුවකු ලෙස බලෙන් ගෙනයාමට මේ අහස් වධකයන් තැත් කරන බව අලෙක්සේයිට වැටහිණි. මෙවැනි දේ මීට පෙර ද සිදු වී ඇත. තමාගේ මිතුරකු වන සෝවියට් සංගමයේ වීරයා යන ධුරය දරන අන්ද්‍රෙයි ඩෙග්ටෙරෙන්කෝ මේ විදිහට ඔත්තු බලන ජර්මන් අහස් යාත්‍රාවක් සිරභාරයට ගෙන, සෝවියට් අහස් තොටුපළට ගොඩබැස්ස වූ සැටි ඔහුට මතක් විය.

සිරභාරයට පත් ජර්මන් අහස් නියමුවාගේ දිගැති අළු පැහැති මුහුණ ද, ඒ මේ අත වැනෙමින් ඔහු අඩි තබා ගමන් කළ සැටි ද, අලෙක්සේයිගේ මනැසෙහි දිස්විය. "හිරභාරයට අසුවෙන්න? ඒකට ඉඩ තියන්නේ නැහැ! ඒ උගුලට අසුවෙන්නේ නැහැ!" යැයි ඔහු තමාට ම කියා ගත්තේ අදිටනකිනි.

අලෙක්සේයි මෙරේස්යෙව් දත්මිටි කමින් තම අහස් යානයේ එන්ජිම තදින් ක්‍රියා කරවීය. ඔහුගේ යානය දැන් සිරස් ලෙස සිටී. තම අහස්යානය පොළොව දෙසට යැවීමට තැත් කරන ජර්මන් යානයට උඩින් පියැඹීමට අලෙක්සේයි තැත් කළේ ය. ඔහු ජර්මන් යානයට ඉහළින් තම යානය ගෙනයාමට සමත් වුව ද, ජර්මන් අහස් නියමුවා පමා නොවී වෙඩි තැබී ය. අලෙක්සේයිගේ අහස් යානයේ එන්ජිම දැන් ලෙඩකු මෙන් 'ගොර' 'ගොර' හඬක් පිට කරයි. උණ සන්නිපාත රෝගියකු මෙන් අහස්යානාව

වෙව්ලන්නට විය.

"මගේ යානයට වෙඩි වැදී ඇත." මෙසේ සිතූ අලෙක්සේයි තම යානය සුදු පැහැති වලාකුළකට මුවා කරමින් සතුරන් වල්මත් කරවී ය. මීළඟට කළ යුත්තේ කුමක් ද? තම යානය කම්පනය වන සැටි ඔහුට දැනේ. තම යානයේ අවසාන මොහොත ළං වී ඇති බව දන්වනවාට වඩා තම සිරුර උණ සන්නිපාතයට ගොදුරු වී වෙවුලන බව එම කම්පනය දන්වා සිටී.

පහර වැදී ඇත්තේ එන්ජිමේ මොන කොටසට ද? යානයට තව කොපමණ වේලාවක් අහසේ රැඳී සිටිය හැකි ද? පැට්‍රල් ටැංකිය පුපුරයි ද? මේ ප්‍රශ්න ගැන ඔහු නොසිතුව ද, ඔහුට ඒවා ගැන ඉවෙන් මෙන් දැනේ. සේවනූල ගිනි ගෙන ඇති ඩයිනමයිට් වෙඩි ගොඩක් මත තමා වාඩි වී සිටින සැටි අලෙක්සේයිට දැනුණ ද, ඔහු අහස්යානය සෝවියට් යුද හමුදා කඳවුර වෙත පදවන්නට වූයේ තමා මියගියොත්, තම සිරුර සෝවියට් යුද භටයන් වළලනු ඇතැයි යන හැඟීමෙනි.

අවසානය හදිසියෙන් ම ළං විය. එන්ජිම ක්‍රියාවිරහිත විය. කඳු බෑවුමක සිට පහතට පෙරළෙන්නාක් සේ අහස්යානය ඇද වැටෙන්නට විය. පහළ සාගරයක් වැනි කොළ පැහැති වනයකි... තම අහස් යානයේ පියාපත් වනයේ තුරු මුදුන්වල හැපෙත් ම "කොහොම වුණත්, මා සිර භාරයට පත් වන්නේ නැහැ!" යැයි ඔහුට සිතිණි. වනය, වන මෘගයෙකු සේ ඔහු වෙත කඩා පතින විට, ඔහු සියලු යන්ත්‍ර නැවැත්වීය. ඒ සමග ම ඇති වූ මහා හඬ නිසා හැම දෙයක් ම අතුරුදන් වූ සැටියෙකි. ඔහු සහ ඔහුගේ යානය කළු පැහැති කැටි ගැසුණු දියකට වැටුණාක් මෙනි.

කඩා වැටෙන යානය පයින් ගස්වල හැපිණි. මේ නිසා වේගය තරමක් අඩු විය. ගස් කීපයක් කැබැලි වී ගිය අතර යන්ත්‍රය සුන් විය. ඊට මොහොතකට පෙර තම නියමු අසුනෙන් විසි වී ගිය අලෙක්සේයි සියවස් ගණනක් පැරණි දේවදාර ගසකට පාත් වී ඒවායේ අතු දිගේ ලිස්සා ගොස්, හිම ගොඩක් මත වැටිණි. ගස මුල තිබූ මේ හිම ගොඩැල්ල නිසා ඔහුගේ ජීවිතය ආරක්ෂා විය.

සිහිසන් නැති ව මළාක් මෙන් කොපමණ වේලාවක් වැතිර සිටියේ දැයි අලෙක්සේයි නොදනී. මිනිසුන් වැනි සෙවණැලි, ගොඩනැඟිලි හා අරුම පුදුම යන්ත්‍රවල ආකෘති ඔහු ඉදිරියේ මැවී, අතුරුදන් වෙයි. සුළි සුළඟක් වැනි ඒවායේ චලනය අලෙක්සේයිට වේදනාවක් ගෙනදෙයි. මුළු සිරුර පුරා ම ඒ වේදනාව පැතිර යයි. ඉන් පසු ඒ අවුල් ජාලය තුළින් යම් කිසි විශාල උණුසුම් දේහයක් මතු වී දුගඳ හමන ප්‍රශ්වාසයක් කළේ ය. අලෙක්සේයි එම සතුරු බලයෙන් ඉවත යාමට තැත් කළ ද, ඔහුගේ සිරුර හිම ගොඩට යටවී තිබෙන බව ඔහුට දැනිණි. තමා වෙත එමින් සිටින ඒ බියජනක අවතාරයෙන් බේරීම පිණිස අලෙක්සේයි නැඟිට සිටිත් ම ඔහුගේ පෙණහලු තුළට දැඩි ශීතල සුළං ඇතුළු වන සැටි ඔහුට දැනිණි. ඔහුගේ දෙකොපුල් හිම කැට මෙන් ශීතල විය. වේදනාව දැනෙන්නේ පෙර මෙන් සිරුර පුරා ම නොව, දෙපාවල බව ඔහුට පැහැදිලි ය.

"මා ජීවතුන් අතර ය" යන හැඟීම ඔහු සිත පුරා පැතිර ගියේ ය. ඔහු නැඟී සිටීමට වෙර දරත් ම, ඔහු ළඟැති හිම යම් කිසිවකුගේ පයට පෑගෙන හඬ ඇසිණි. "ජර්මන්නු!" වහා ම නැඟිට සිය ආත්මාරක්ෂාව සඳහා සටන් කළ යුතු යැයි ඔහුට කල්පනා විය. "සිරකරුවෙක් වේවි. සිරකරුවෙක් වේවි! මම මොනවා කරන්නද?"

දවසකට පෙර, හැම වැඩකට ම හපනා යන විරුදාවලිය ලැබ සිටින මිකැනික් කෙනෙක් වන යූරා, අලෙක්සේයිගේ පිස්තෝල කොපුවේ පටි අලුත්වැඩියා කර දීමට ඉදිරිපත් විය. ඔහු එම යෝජනාව පිළිනොගත් නිසා ඔහුට පිස්තෝලය කලිසම් සාක්කුවේ දමා ගැනීමට සිදු විය. දැන් එම පිස්තෝලය ගැනීමට ඔහුට පැත්තකට පෙරළීමට සිදුවිය. සතුරාට නොදැනෙන සේ එය කළ නොහැකි ය. ඔහු මුණින් අතට වැටී සිටින බැවිනි. ඔහුගේ කකුලට පිස්තෝලය ඇති බව දැනෙයි. ඔහු නොසැලී මළාක් මෙන් සිටී. තමා මළ බව සිතා සතුරා ඉවත යනු ඇතැයි ඔහුට සිතිණි.

අමුතු ලෙස ආශ්වාස ප්‍රශ්වාස කරමින් ජර්මානුවා තමා වෙතට එන සැටි අලෙක්සේයිට දැනේ. තමා ඉදිරිපිට සිටින්නේ එක ම එක ජර්මානුවෙක් බව ඔහුට සහතික

ය. ඔහු සතුරා දෙස සැලකිල්ලෙන් බලා සිටින්නේ නම් සතුරා වෙඩි තැබීමට පෙර ඔහුගේ ගෙල මිරිකා දැමීමට ඔහුට හැකිවනු ඇත. එහෙත්, එය සුපරීක්ෂාකාරී ලෙසත්, නොවරදින ලෙසත් කළ යුත්තකි.

නොසැලී සිටිමින් ම ඇසක් ඇර අලෙක්සේයි සතුරා දෙස බැලී ය. ඔහු ජර්මානුවකු නොව, දුඹුරු පැහැති දේහයක් බව අලෙක්සේයි දිටී ය. ඔහු දෑස් විදහා ඒ දෙස බලා, නැවත ඇස් පියා ගත්තේ ය. ඔහු ඉදිරියේ පස්සා ගාත්වලින් වාඩි වී සිටින්නේ විශාල, කෙට්ටු, කඩමාලු වලසෙකි.

## 3

ශීත කාලය මුළුල්ලේ ම අවදි නොවී, එක හුස්මට නිදන වලසා අවදි වීම නිසා ඌ කෝප වී සිටී. එසේ වුව ද, වලස්සු මළ සතුන් නොකති. පුරුද්ද මැඩ බඩගින්න ජය ගත්තේ ය. සුසුමක් හෙළා කය සෙලවූ වලසා හිම ගොඩට යට වී ඇති මිනිසා ඉන් ඉවතට ඇද ඔහුගේ නියමු ඇඳුමේ සම් කබාය ඌ ඉරන්නට විය. කබාය ඉරුණේ නැත. වලසා කෝපයෙන් හඬ නැඟී ය. ඇස් ඇර කෑගසා වලසාගේ විශාල සිරුර පෙරළා දැමීමට අලෙක්සේයිට සිත්විණි. ආත්මාරක්ෂාව සඳහා බිහිසුණු සටනක් කිරීමට ඔහුගේ සිත පෙලඹුනා වුව ද, ඔහු වලසාට නොදැනෙන සේ සෙමින් කලිසම් සාක්කුවේ ඇති පිස්තෝලයට අත යවා ශබ්දය නොඇසෙන සේ එය සෙමින් එළියට ඇද ගත්තේ ය.

වලසා වඩාත් කෝපයෙන් නියමු කබාය ඉරන්නට විය. ඝනැති සම් කබාය ඉරුණ ද, එය නොගැලවිණි. ගොරවන්නට වූ වලසා කටින් සම් කබාය දෙපළු කොට අලෙක්සේයිගේ පපුව එළියට ඇද ගත්තේ ය. වලසා හිම ගොඩින් අලෙක්සේයි ඉවත ඇද ගනිත් ම ඔහුට කෑගැසීමට සිත්වූයේ අධික වේදනාව නිසා ය. වේදනාව ඉවසාගෙන නිහඬ වූ හෙතෙම පිස්තෝලය ගෙන වෙඩි තැබී ය.

වෙඩි හඬ දෝංකාරයක් ඇති කළේ ය.

වලසාගේ නිය අලෙක්සේයිගේ සිරුරෙන් ගිලිහී යත්

ම, ඔහු බිම ඇද වැටිණි. ඔහු, ඌ දෙස බලාගත්වනම සිටී. වෙඩි පහර කෑ වලසා විස්මයට පත් වූ කලෙක මෙන් පස්සා ගාත්වලින් වාඩි විය. කළු පැහැති උගේ ඇස් බියමුසු විස්මයක් පළ කළේ ය. උගේ දත් අතරින් ගලා ආ ලේ කැටි හිම මත වැටිණි. ඌ නැඟිට මහ හඬින් ගොරවා මුලින් ඉදිරූ ගසක් මෙන් අලෙක්සේයිගේ දෙපා ළඟ ඇද වැටුණේ, ඔහු තව වරක් වෙඩි තැබීමට කලිනි. යම්තම් නිල් පැහැති හිම, වලස් ලේ නිසා රත් පැහැ ගති. එය දිය වී යත් ම, සිහින් දුමක් වැනි හුමාලයක් උගේ හිස අසල දක්නට ලැබිණි. වලසා මිය ගොසිනි.

අලෙක්සේයිට සටන් කිරීමට සිදු වූ නොසන්සුන් වාතාවරණය පහ ව ගොසිනි. ඉවසිය නොහැකි තරම් අධික වේදනාවක් සහ තම දෙපා ගිනිගෙන දැවෙන සැටියක් ඔහුට දැනිණි. හිම මත ඇද වැටුණු ඔහුට සිහි නැති විය.

ඉර මුදුන් වූ පසු ඔහුට සිහිය ලැබිණි.

කිලිටි, දුගඳ හමන වලස් කුණ හිම මත තිබේ. වනයේ පක්ෂීහු නද දෙති. කොට්ටෝරුවා 'ටක්' 'ටක්' ගාමින් ගසකට අනියි. අත්තෙන් අත්තට පනින කහ කුරුල්ලෝ මිහිරි ගී ගයති.

"මා ජීවතුන් අතර! පණ පිටින්! පණ පිටින්!" යැයි අලෙක්සේයි තමාට ම කියා ගත්තේ ය. මරණය ඉදිරියේ සටන් කොට ජය ගන්නා හැම මිනිසෙකුට ම හැඟෙන බලවත්, අපූරු ආනන්දජනක හැඟීමෙකින් ඔහුගේ සිත කය පිනා ගියේ ය.

මේ බලගතු හැඟීම නිසා ඔහු නැඟිට සිටිත් ම වේදනාවෙන් කෑ ගසමින්, ඔහු වලස් කුණ මත ඇද වැටුණේ ය. ඔහුගේ හිස වේදනාව සහිත හඬකින් පිරී ඇත. ලොකු ඇඹරුම් ගල් දෙකක් තම හිස තුළ වේගයෙන් භ්‍රමණය වන බවකි, ඔහුට දැනෙන්නේ. නොපෙනෙන බලයක් විසින් ඔහුගේ ඇස් පාගා දමනු ලබන්නාක් මෙනි. වරෙක අවට ඇති හැම දෙයක් ම හිරු එළියෙන් බැබළෙන සැටි පැහැදිලි ව දකින අලෙක්සේයි තමා ඉදිරියේ හැම දෙයක් ම එකට මුසු වී අඳුරු ලපයක් මැවී පෙනෙන සැටි තවත් වරෙක දකී.

"හිසට වැදුණු පහරක් නිසා මොළය සෙලවී ඇත. මගේ කකුල් ද තුවාල වී ඇත. තත්ත්වය හොඳ නැතැ" යි ඔහු තමාට ම කියා ගත්තේ ය.

අහස්යානාවෙන් පිටතට වීසි වන විට ඔහුගේ සිතියම් බෑගය නැතිවිණි. එහෙත්, ඔහු පියාසර කළ මඟ ඔහුට ඉතා හොඳින් මතක ඇත. සෝවියට් ස්ට්‍රොමොවික් අහස්යානා බෝම්බ දැමූ ජර්මන් අහස් තොටුපළ පිහිටා ඇත්තේ යුද පෙරමුණෙන් කිලෝමීටර හැටක් බටහිරිනි. ජර්මන් අහස්යානාවලින් බේරුණු පසු ඔහු කිලෝමීටර විස්සක් පමණ නැගෙනහිර දෙසට පියාසර කළ බව ඔහුට මතක ඇත. එසේ නම් දැන් ඔහු සිටින්නේ යුද පෙරමුණට කිලෝමීටර් තිස්පහක් පමණ ඈතිනි. මෙය ජර්මන් යුද කණ්ඩායම්වලට බොහෝ සෙයින් ම පිටුපසින් පිහිටි අඳුරු වනය විය යුතු ය. ජර්මන් අහස් තොටුපළවලට බෝම්බ දැමීම සඳහා යද්දී ඔහු මේ වනයට ඉහළින් කීප වරක් ම පියාසර කොට ඇත. අහසේ සිට බලන විට එම වනය හරිත වර්ණයෙන් පිරි සාගරයක් මෙනි. පැහැදිලි කාලගුණය ඇති දවස්වල දී පයින් තුරු මුදුන් කොළ පාටින් දිලිසේ. අයහපත් කාලගුණය පවතින කල අළු පැහැති මීදුමකින් වැසී යන ඒ වනය, මතුපිට ගමන් ගන්නා කුඩා රැලිවලින් යුත් අපිරිසිදු ජලයෙන් පිරි මහා වැවක් මෙනි.

මේ මහා වනය මැදට කඩා වැටීම හොඳක් මෙන් ම නරකකි. ජර්මන් භටයන් නිතර ම මහා මාර්ග හා නගරවලට ළංවීමට ආසා කරන බැවින්, මේ වනයේ ඔවුන් මුණ නොගැසීම හොඳ දෙයකි. යුද පෙරමුණ දක්වා යා යුතු මඟ එතරම් දුර නොවූව ද, මේ මූකළන් වනයේ ගස්, පඳුරු, වළවල්, මඩ ගොහොරු ආදිය හරහා යාම ලෙහෙසි නැත. මිනිස් පණක් ඇසට හමු නොවන මෙහි ආහාරයක් සොයා ගැනීමට, උණු තේ කෝප්පයක් ලබා ගැනීමට සිතීම පවා අපහසු ය. නරක පැත්ත එය ය. ඔහුගේ දෙපා... ඔහුට නැඟී සිටීමට පුළුවන් ද? ගමන් කිරීමට පුළුවන් ද?

වලස් කුණ මත වැතිර සිටි ඔහු සෙමින් නැඟී සිටියේ ය. දෙපාවලින් පටන් ගත් තියුණු වේදනාව පිට කොන්ද දිගේ ඉහළට නැඟ මොළයට වදින්නේ විදුලි වේගයෙනි.

ඔහුට ඉබේට ම කෑ ගැසිණි. ඔහු වාඩි විය. තම දෙපා වසා ඇති උන්ති[1] හිම සපත්තු ඉවත් කිරීමට ඔහු වෙර දැරී ය. ඒවා ඉවත් කිරීම ලෙහෙසි නැත. වේදනාවෙන් කෙඳිරි ගාමින් ඔහු සපත්තුවකින් කකුලක් මුදා ගැනීමට තැත් කළේ ය. දත්මිටි කමින් හා දෑස් වසා ගනිමින් එක් කකුලක් මුදා ගනිත් ම, ඇති වූ තියුණු වේදනාව නිසා ඔහුට සිහසන් නැති විය. නැවත ප්‍රකෘති සිහිය ලැබුණු පසු පය වෙළා තිබුණු පටිය ප්‍රවේසමෙන් ඉවත් කළේ ය. රත් පැහැගෙන ඇති ඒ පය ගල් ගෙඩියක් මෙන් ඉදිමී ඇත. එහි හැම සන්ධියක් හා ඇටයක් ම වේදනාවෙන් කකියයි. හිම මත පය තැබූ විට, වේදනාව තරමක් අඩු වූවාවක් මෙනි. දෙවන වරට ද ඔහු මහත් උත්සාහයක් යොදා අනික් පයේ සපත්තුව ද ගලවා දැම්මේ ය.

මේ දෙපාවලින් වැඩක් නැත. අහස්යානාවෙන් පිටතට වීසිවෙන විට යම් කිසි දෙයකට ඔහුගේ දෙපා අසු වී ඒවායේ පා ඇට සහ ඇඟිලිවල ඇට කැඩී පිපිරී ගොසිනි. සාමාන්‍ය තත්ත්වයක දී නම් ඉදිමී, ඇට පිපිරී ඇති එම පාවලින් ඇවිදීම තබා, ඒවා සෙලවීමට පවා අලෙක්සේයි නොපෙලඹෙනු ඇත. එහෙත්, දැන් ඔහු සතුරු යුද පෙරමුණ පිටුපස මහා වනයක තනි වී සිටී. මෙහිදී මිනිසකු හමුවීම ජීවිතය නොව, මරණය ගෙන දෙන්නකි. ඔහු නැඟෙනහිර බලා ගමන් කිරීමට ඉටා ගත්තේ ලෙහෙසි පාරවල් සොයා ගැනීමට හෝ ජනාවාස පෙදෙස් කරා යාමට හෝ නොවේ. ඉදිරියට යාම හැර අන් මගක් නැති බැවිනි.

අධිෂ්ඨානයකින් යුතු ව ඔහු නැවත වරක් නැඟී සිට, දත්මිටි කමින් එක් පියවරක් ඉදිරියට තැබී ය. තවත් පියවරක් ඉදිරියට තබත් ම, හිස වේදනාවෙන් පිරිණි. වනය තොටිල්ලක් සේ පැද්දෙමින් මහා ඝෝෂාවක් නඟන සැටි ඔහුට දැනේ.

පුලුන් මෙන් මුදු හිම මත ගමන් කරන විට තියුණු වේදනාවක් නොදැනේ. තද අයිස්වලින් වැසී ඇති පාර මත එක් පියවරක් තබත් ම, ඇති වූ වේදනාව කොතරම් ද යත්, ඔහුට ගමන නැවැත්වීමට සිදුවිය. දෙපා දෙපැත්තට පළල් කොට නුහුරු ලෙස සිටගත් ඔහු, කුණාටුවකට අසු

1. උන්ති- සතුන්ගේ ලොම්වලින් කළ විශේෂ හිම සපත්තු වර්ගයකි.

වූ කලෙක මෙන් වැනෙන්නට විය.

අලෙක්සේයි හිම මත වාඩි වී හිම සපත්තුවල ලණු බුරුල් කොට, ගෙල වටා ඇති ප්ලැනල් ලේන්සුව දෙකඩ කොට ඉරා දෙපා ඔතා ලිහිල් ව සිටින සේ සපත්තු දමා ගත්තේ ය.

දැන් ගමන පහසු ය. එය ගමන් කිරීමක් ලෙස හඳුන්වන්නට බැරි ය. ප්‍රවේසමෙන් එක් පියවරක් තබන අලෙක්සේයි අනෙක් කකුල උස්සා පියවරක් ඉදිරියට තබන්නේ මඩගොහොරු බිමක් හරහා යන්නකු ලෙසිනි. හැම පියවරක් පාසා ම ඇතිවන වේදනාව නිසා ඔහුගේ හිස කකියයි. ඇට කටු තුළට වේදනාව විදින සැටි ඔහුට දැනේ. අමාරුවෙන් අඩි කීපයක් යන ඔහුගේ දෙපාවල ලේ නහර ඉදිමී ඇත. තියුණු වේදනාව නිසා හදවත ගැහෙයි. ඇස් වසා ගන්නා ඔහු ගසකට හේත්තු වෙයි, නැතිනම් හිම ගොඩක් මත වාඩි වෙයි.

මේ විදිහට පැය කීපයක් ම ඔහු පා තැබී ය. තමා කොතෙක් දුර ගමන් කොට ඇත්දැයි සොයා බැලීම පිණිස අලෙක්සේයි පිටුපස හැරී බැලී ය. ගමන පටන් ගත් තැන තව ම පෙනෙන්නට ඇත. එය ඔහුගේ කනස්සල්ලට හේතු විය. එහෙත්, ඔහු බිය නොවී ය. ගමන් වේගය වැඩි කිරීමට ඔහුට සිත් විණි. ඔහු නැඟිට තමා ඉදිරියේ ඇති කිසියම් සලකුණක් දෙස සිත් යොමු කරමින් ඒ දෙසට පා තැබී ය. පයින් ගසෙන් ගස මේ අනුව සලකුණු ලෙස සිතා ගනිමින් ඔහු ඉදිරියට ඇදුණේ ය. තුවාල ලැබූ සතෙකු මෙන් ඔහු හිම පිරි නැවුම් බිමේ පා සටහන් තැබී ය.

## 4

සවස් වන තුරු ම අලෙක්සේයි මේ විදියට ගමන් කළේ ය. රත් පැහැගත් හිරු බැස යන්නට විය. කොළ පැහැති ගස්වැල් දැන් සෙවණැලි මෙන් කළු පාට ය. ඇඳිර පැතිරිණි. බිළයක් බඳු නිම්න භූමියකට ඔහු පැමිණියේ ය. එහි වල් පැළෑටි වැවී ඇත. එතැන දී ඔහු දුටු දේ නිසා ඔහුට හීන් ඩහදිය දැම්මේ ය. හිස් වැස්මට යටින් ඇති හිසකේ පවා කෙළින් විය.

දරුණු සටනක් පැවැති මෙතැන ප්‍රථමාධාර දෙන

කඳවුරක් තිබුණු බව කියන සලකුණු ඇත. තුවාල ලැබූවන් මෙතැනට ගෙනැවිත් වියළි කොළවලින් සැදූ කොට්ට මෙට්ටවල තබා ප්‍රථමාධාර දී ඇත. මිය ගිය මොවුන්ගෙන් සමහරෙක් හිමවලට අඩ වශයෙන් යට වී උන්හ. සමහරුන්ගේ සිරුරු සම්පූර්ණයෙන් ම හිමෙන් වැසිලා ය. ඔවුන් මියගොස් ඇත්තේ තුවාල නිසා නොවන බව එකවර ම පෙනී යයි. යම් කිසිවෙකු විසින් ඔවුන්ගේ බොටු කපා දමන ලද බැව් පෙනේ. හැම සිරුරක ම හිස පිටුපසට නැමී ඇත්තේ, තමන්ට පිටුපසින් වෙන්නේ මොනවා දැයි බැලීමට හිස හැරවූ කලෙක මෙනි. එම දර්ශනය බියජනක ය. පයින් ගසකට හේත්තු වී වාඩි වී සිටින හෙදියකගේ උකුළ මත සෝවියට් අහස් නියමුවකුගේ හිසකි. හෙදියගේ මළ සිරුරේ ඉගටිය දක්වා හිමෙන් වැසී ඇත. සිහින් සිරුරක් ඇති මළ තරුණිය හිසත් බෙල්ලත් වැසෙන සේ හිම තොප්පියක් දමාගෙන සිටී. ඇගේ පිට විදගෙන ගිය කිණිස්සක මිට පමණක් පිටතට පෙනේ. ඈ ළඟ පැසිස්ට් ජර්මන් ඇස්. ඇස්. භටයකුගේ මළ සිරුරක් හා ලේ තැවරුණු වෙළුම් පටියකින් හිස වෙළා ඇති සෝවියට් සෙබළෙකුගේ මළ සිරුරකි. මේ දෙදෙනා එකිනෙකාගේ ගෙල මිරිකා ගනිමින් මිය ගිය බව ඔහුට සිතා ගත හැකි ය. තුවාල ලැබ සිටි සෝවියට් භටයන්ගේ බොටු කැපූ පැසිස්ට් මෘගයා හෙදියට කිණිස්සෙන් ඇනිත් ම තුවාල ලැබ සිටි සෝවියට් සෙබළා පැසිස්ට් මෘගයාගේ ගෙල මිරිකා ඇති අතර, දෙදෙනා ම මරණය දක්වා එලෙස සටන් කොට ඇති බව අලෙක්සේයිට වැටහිණි.

හිම කුණාටුව විසින් ඔවුන් වළලා දමන ලදි. හිම තොප්පිය හිසින් ගත් සිහින් සිරුරක් ඇති හෙදියගේ මළ සිරුර තුවාල ලැබ සිටි සෝවියට් භටයාගේ මළ සිරුර වසා සිටියේ එය ආරක්ෂා කරන්නට මෙනි. සෝවියට් භටයාගේ දණහිස් දක්වා පැරැණි සපත්තු කුට්ටමකි.

විස්මයට පත් වූ අලෙක්සේයි ගල් ගැසුණාක් මෙන් ඒ ඛේදවාචකය දෙස මොහොතක් බලා සිට, අමාරුවෙන් හෙදියගේ සිරුර වෙත ළං වී, ඇගේ පිට විදගෙන ගොස් ඇති කිණිස්ස ඇද දැම්මේ ය. පැරැණි ජර්මන් අසිපතකට සමාන එස්. එස්. කිණිස්සකි එය. යකඩ මල කා ඇති කිණිස්සේ "Alles fur Deutshland" යන වැකිය කොටා

තිබෙන බව හේ දුටුවේ ය. පැසිස්ට් භටයාගේ ඉණෙහි ඇති හම් කොපුව අතට ගත් අලෙක්සේයි කිණිස්ස එතුළට බහා ලී ය. තම ගමනේ දී එම අවිය ප්‍රයෝජනවත් වනු ඇත. කූඩාරම් කැන්වස් රෙද්දක් සොයා ගත් හෙතෙම සනැති හිම තට්ටු හාරා වළක් සාදා, කැන්වස් රෙද්දෙන් හෙදියගේ සිරුර ඔතා, ප්‍රවේසමෙන් එය වළලා දැම්මේ ය.

මේ වැඩවල යෙදෙත් ම, හවස ඇඳිර පැතිරිණි. ගස් අතරින් වැටුණු හිරු රැස් අතුරුදන් විය. බිල තුළ ඝන අන්ධකාරය පැතිරිණි.

වොල්ගා ස්ටෙප්ස්හි කමීෂින් නගරයේ උපන් අලෙක්සේයි වනගත ජීවිතය ගැන කිසිවක් නොදත්තේ, රැය ගතකිරීමට සූදානම් නොවී ය. යටත්පිරිසයෙන් ගිනි මැලයක් පත්තු කිරීමට පවා නොසිතී ය. ගන අඳුර පැතිර ඇති නිසාත්, ඇට කැඩී ඇති තම දෙපාවලින් පැන නගින වේදනාව තියුණු නිසාත් ඔහුට වියළි දර කෝටු කීපයක් එකතු කර ගැනීමට පවා බැරි විය. ළපටි පයින් ගසක් යටට බඩ ගාමින් ඇදුණු හෙතෙම ගස මුල වාඩි වී දැත් දණහිස් වටා යවා, හිස දණහිස් මත තබාගෙන ගුළි ගැසී සිටියේ ය. තම ප්‍රශ්වාසයෙන් උණුසුම ලබා ගැනීමට තැත් කරමින් නිහඬ ව විවේක ගත්තේ ය.

කෙසේ වුව ද, තම පිස්තෝලය හදිසි අවස්ථාවක දී පාවිච්චි කිරීම පිණිස සූදානම් කර ගත්ත ද, පළමුවැනි අඳුරු රැයෙහි දී ඔහුට එය පාවිච්චි කිරීමට හැකි ද යනු සැක සහිත ය. මළාක් මෙන් ඔහු නිදාගත්තේ ය. ගස්වල අතු ගැටෙන හඬ ද, මඟ අසල බස්සෙකුගේ හැඬීම ද, ඈත වෘකයන්ගේ හූ හඬ ද කිසිවක් ඔහුට නැසිණි. දැඩි අඳුර ඔහු වෙළා ගත්තේ ය.

හිමිදිරි පාන්දර ඔහු අවදිවූයේ කිසිවකු ඔහු සෙලවූ කලෙක මෙනි. මීදුම අතරින් ගස්වල සෙවණැලි දැකිය හැකි ය. තමාට සිදුවූයේ කුමක් ද තමා කොහේ ද යන්න ඔහුට මතක් වූයේ අවදිවීමෙන් පසු ව ය. අප්‍රවේසමෙන් රැය ගත කළ සැටි මතක් වූ විට ඔහු බිය විය. ලොමින් වැසී ඇති තම නියමු කබාය විදගෙන සිරුරට ඇතුළු වන ශීතල නිසා ඇටකටු පවා හිරි වැටී ඇත. සන්නිපාත රෝගියකු මෙන් ඔහු වෙව්ලන්නට විය. එහෙත්, දෙපාවලින් පැන නගින වේදනාව පෙරටත් වඩා තියුණු ය. වාඩි වී සිටින

විට පවා ඉවසිය නොහැකි වේදනාවකි. නැඟිට සිටිය යුතුය යන හැඟීම පවා බිය ගෙන දෙයි. පෙරදින සපත්තු ගලවන විට පෙන්වූ දැඩි ගතිය නැවත ආරූඪ කර ගත් අලෙක්සේයි දෙතාල් තද කරගනිමින් නැඟිට සිටියේ ය. කාලය අපතේ යැවීම නුවණට හුරු නොවේ.

වේදනාව හා ශීතල සමඟ දැඩි බඩගින්නකුත් දැනේ. ඊයේ හෙදියගේ මළ සිරුර කැන්වස් රෙද්දෙන් ඔතන විට, ඈ අසල තිබූ ප්‍රථමාධාර මල්ලක් අලෙක්සේයි දුටුවේ ය. කිසියම් කුඩා සතෙකු එය සිදුරු කොට ඇති බව මල්ල වටා ඇති කැබැලිවලින් පෙනේ. ඊයේ ඔහු එම මල්ල ගැන සැලකිල්ලක් නොදැක්වී ය. ඔහු මල්ල අතට ගෙන පිරික්සන්නට විය. එහි වෙළුම් පටි කීපයකි, ලොකු මස් ටින් බඳුනකි. ලියුම් කීපයක් සහ මූණ බලන කුඩා කණ්ණාඩියකි, මහලු කාන්තාවකගේ ඡායාරූපයකි. මල්ල තුළ පාන් ගෙඩියක් තිබූ බවට සාක්ෂි ඇත. කුරුල්ලන් හා කුඩා සතුන් එය කා දැමූ බව මල්ල පතුලේ ඇති පාන් කුඩු සාක්කි දෙයි. වෙළුම් පටි සහ මස් ටින් බඳුන නියමු ඇඳුමේ සාක්කුවල දමාගත් අලෙක්සේයි "නුඹට ස්තුතියි සහෝදරිය" යැයි කීවේ ය. මළ සිරුරේ දෙපා, කුණාටුව නිසා නැවත හිම ගොඩින් මතු වී ඇති බැවින්, එය කැන්වස් රෙද්දෙන් වසා දැමූ අලෙක්සේයි හිරු රැසින් ආලෝකය පැතිර යන නැඟෙනහිර දෙසට පා තැබී ය.

දැන් ඔහු ළඟ මස් කිලෝග්‍රෑම් එකකි. දවල් බත වෙනුවට මේ මස් දවසකට වරක් බැගින් කෑමට ඔහු තීරණය කළේ ය.

## 5

දෙපා සිට පැතිර යන වේදනාව ගැන අමතක කිරීම පිණිස හෙතෙම තම ගමන් මඟ ගැන කල්පනා කරන්නට විය. දවසට කිලෝමීටර දහයක් හෝ දොළහක් හෝ ගමන් කළොත් දවස් තුන හතරකින් යුද පෙරමුණට යන්නට හැකි වනු ඇත.

"ඒක නම් එහෙම තමා දවසකට කිලෝමීටර දහයක් යන්නේ කොහොමද? කිලෝමීටරයක් යාමට පියවර දෙදාහක් තැබිය යුතු ය. කිලෝමීටර දහයකට පියවර විසි දහසකි. පියවර පන්සීයක් තැබූ පසු මට විවේක ගන්ට ඕන.

ඒ හන්දා දිනපතා යා යුතු දුර ප්‍රමාණය සුළුපටු නොවේ...”

පෙර දින, තම ගමන පහසු කරවීමට අලෙක්සේයි කිසියම් අරමුණක් සිතින් සලකුණු කරගෙන ඒ වෙත පා තැබී ය. පයින් ගසක් දක්වා, ගස් කොටයක් දක්වා මේ විදිහට ගිය හෙතෙම විවේක ගෙන නැවත ගමන් ඇරඹී ය. දැන් ඒ වෙනුවට පියවර මනින්නට පටන් ගත් ඔහු, පියවර දහසක් තැබූ පසු, එනම් කිලෝමීටර භාගයක් ඉදිරියට ගිය පසු විවේක ගැනීමට තීරණය කළේ ය. එය ද විනාඩි පහකට වැඩි නොවිය යුතු ය. මේ විදිහට උදේ සිට සවස් වන තුරු ගමන් කළොත් කිලෝමීටර දහයක් මඟ ගෙවා යා හැකි බව ඔහු සිතී ය.

එහෙත්, පළමුවැනි පියවර දහස කොතරම් අමාරු වී ද! වේදනාව අමතක කර දැමීම් වස් හේ පියවර මනින්නට විය. පළමුවැනි පියවරයන් පන්සියය ගණන් කළ පසු ඔහුට වැරැදිණි. වේදනාව හැර අන් කිසිවක් ඔහුට නොදැනේ. එසේ වුව ද, මහත් ධෛර්යයකින් හා අධිෂ්ඨානයකින් යුතු ව හෙතෙම පියවර දහසක් ම ඉදිරියට ගමන් කළේ ය. වාඩිවීමට තරම් ශක්තියක් නැති නිසා මුණින් වැටුණු අලෙක්සේයි නැවුම් හිම පියළි ලෙව කමින් ගිනි ගෙන දැවෙන කලෙක මෙන් වේදනාවෙන් පෙළෙන තම නළල හා කංශක හිම මත තබා ගනිමින් විඩා හැරියේ ය. හිම කැට ස්පර්ශය නිසා ඔහු ප්‍රීති විය.

ඔහු සුසුම්ලමින් අත් ඔරලෝසුව දෙස බැලී ය. විවේකය සඳහා නියමිත විනාඩි පහ අවසාන වීමට තව ඇත්තේ තත්පර කීපයකි. අවසාන තත්පරය ගෙවී යත් ම, යම් කිසි බියජනක සිද්ධියක් වනු ඇතැයි යන හැඟීමෙනි ඔහු තත්පර කටුව දෙස බැලුවේ. එහෙත්, විනාඩි පහ අවසාන වූ විගස ම අලෙක්සේයි වේදනාවෙන් කෙඳිරි ගාමින් නැවත නැගිට, ගමන් ඇරැඹී ය.

දහවල් වන විට ඔහුට යා හැකි වූයේ කිලෝමීටර දෙකක් පමණ දුරකි. හතරවැනි වරට පියවරයන් දහසක් ගමන් කළ හෙතෙම, බිම ඇද වැටුණේ, මුලින් කපා හෙළූ ගසක් මෙනි. ළඟ ඇති බර්ච් ගහ මුලට බඩ ගා යාමට පවා ඔහුට ශක්තියක් නොමැත. ඔහු බොහෝ වේලාවක් එතැන වාඩි වී සිටියේ ගල් රුවක් මෙනි. ඔහුට කිසිවක් නෑසේ, කිසිවක් නොපෙනේ. බඩගිනි පවා නොදැනේ.

දිග සුසුමක් හෙළා, වාතය ඉහළට ඇද ගෙන වේදනාව හා බෙලහීනත්වය මැඩ ගනිමින් හිම කැට කීපයක් කටේ දමා ගත්, අලෙක්සේයි යකඩ මල කා තිබුණු මස් ටින් එක ගෙන ජර්මන් කිණිස්සෙන් එහි පියන කපා හැරියේ ය. ශීතල නිසා කැටි ගැසී තිබුණු සත්ව තෙල් කැල්ලක් ඔහු කටේ දමා ගත්තේ, නීරස ඒ ආහාරය ගිල දැමීමට ය. එහෙත්, එය තෙල් බවට හැරිණි. යටපත් වූ බඩගින්න මේ වර කොතරම් වේගයකින් පැන නැංගේ ද යත්, ඔහු මස් ටික එක හුස්මට කා දැම්මේ ය. ඉන් පසු හිම ගුළි ගිලින්නට විය.

නැවත ගමන් ඇරඹීමට පෙර අලෙක්සේයි අසල ජුනිපර ගසකින් සවි ඇති රිටි දෙකක් කපා ගත්තේ ය. දැන් ඔහු මේ හැරමිටිවල ආධාරයෙන් ගමන් කරයි. එහෙත්, වේදනාව වඩාත් තියුණු විය. ගමන වඩ වඩාත් අමාරු විය.

## 6

...තෙවැනි දවස උදාවිය. අලෙක්සේයි මූකළාන මැදින් ගමන් කරයි. මිනිස් පණක සේයාවක් පවා එහි නොමැත. හිටි හැටියේ ම ඔහු වටිනා දෙයක් සොයා ගත්තේ ය.

හිරු එළිය වැටෙත් ම, ශීතලෙන් වෙව්ලන්නට පටන් ගත් අලෙක්සේයි නින්දෙන් අවදි විය. තම නියමු ඇඳුමේ සාක්කුවක ගිනි ගලක් සහිත ලයිටරයක් තිබෙන බව ඔහුට මතක් විය. තමාගේ උදව්කාරයෙක් වන යූරා ඒ ලයිටරය සෑදුවේ හිස් පතරොමක ලෝහ කවරයකිනි. එය යූරාගෙන් ඔහුට ලැබුණු තෑග්ගකි. ඔහුට මේ වටිනා වස්තුව ගැන සම්පූර්ණයෙන් ම අමතක විය. පළමු දවසේ සිට ම ඔහුට ගිනිමැලයක් අවුළුවා ගැනීමට පුළුවන්කම තිබූ බව ද මතක් විය. වියළි අතු කීපයක් කඩා ගොඩ ගසා ගිනිමැලයක් පත්තු කර ගත්තේ ය. ඇවිළෙන ගින්නට වියළි කොළ සහ දර කෝටු දැම්මේ ය. දීප්තිමත් ගිනි දළු දුම් ගුළි තුළින් පැන නැඟිණි. වියළි දර කෝටු 'පට' 'පට' යන හඬක් පිට කරමින් ඇවිළිණි.

ගිනිමැලය අවට වාතය උණුසුම් කරමින් ඇවිළෙයි. අලෙක්සේයි ගිනි තැපීමට පටන් ගත්තේ, ඔහුට මහත්

සනීපයක් දැනිණි. නියමු කබායේ ලෝහ පටිය ගලවා ඇතුළු සාක්කුවෙන් ලියුම් මිටියක් ගත් හෙතෙම, ඒවා කියවන්නට විය. ඒ හැම ලියුමක් ම ලියා තිබෙන්නේ එක ම අත් අකුරෙනි. මල් වැටුණු ගවුමක් හැඳගත් සිහින් තරුණියකගේ ඡායාරූපයක් ද එහි විය. ඇය තණ බිමක වාඩි වී සිටී. ඔහු ඒ ඡායාරූපය දෙස විනාඩි කීපයක් බලා සිට, එය නැවත සෙලෝෆේන් කඩදාසියක ඔතා කවරය තුළ බහා සාක්කුවේ දමා ගත්තේ ය.

"කමක් නැහැ, හැම දෙයක් ම යසට සිදුවේවි" යැයි ඔහු තමාට ම කියා ගත්තේ ද නැතිනම් ඡායාරූපයේ තරුණියට කීවේ ද යන්න පැහැදිලි නැත. කල්පනාකාරී වූ හෙතෙම නැවත "කමක් නැහැ" යැයි කීය.

දැන් පුරුදු පරිදි නැවත වරක් සපත්තු ගලවා දෙපා දෙස ඕනෑකමින් බැලීය. ඒවා දැන් පෙරට වඩා ඉදිමිලා ය. දෙපාවල ඇඟිලි නොයෙක් අතට නැමී ඇත. දෙපා හුළං පිර වූ බෝල මෙනි. පළමු දවසේ රත් පැහැ ගෙන තිබූ දෙපා දැන් කළු පාටට හුරු ය. කෙමෙන් කෙමෙන් නිවී යන ගිනිමැලයෙන් සමු ගන්නාක් මෙන් ඒ දෙස බැලූ අලෙක්සේයි, රිටි වාරුවෙන් නැඟිට සිට, නැවත ගමන් ඇරඹීය. අයිස් බවට පෙරළී ඇති හිම බිඳින රිටි හඬක් නඟයි.

ඇඳිරි වැටුණු පසු ඔහුට පියවර පහකට හයකට වඩා තැබිය නොහැකි විය. දිරා ගිය බර්ච් කඳක් ළඟ වියළි දර කෝටු එකතු කොට ගිනිමැලයක් ගැසූ අලෙක්සේයි ගිනි තපින්නට විය. බුරමින් නඟින ගිනි දලු දීප්තිමත් ය. ගිනිමැලය අසල දිග ඇදී නිදාගන්නට වූ ඔහු ජීවමය උණුසුම ලබා ගැනීමට මෙන් වරෙක වම් ඇලය ද, තවත් වරෙක දකුණු ඇලය ද ගිනිමැලයට හරවමින් නිදන්නට විය. උණුසුම අඩුවෙත් ම ඔහු ඉවෙන් මෙන් අවදි වී වියළි දර කෝටු දමා ගිනිමැලය යළි අවුළුවයි.

මැදියම් රැය වන විට වනය හරහා කුණාටුවක් හමන්නට විය. පයින් ගස්වල අතු වේගයෙන් සැලෙමින් 'ෂූ' හඬක් ඇති කළේ ය. කුඩා හිම කැට හා හිම පියළි වලාකුළක් සේ පාවෙන්නට විය. ගිනිමැලය වටා හඬ නඟමින් සුළං හමයි. එහෙත්, මේ හිම කුණාටුව නිසා

අවදි වූයේ අලෙක්සේයි නොවේ. ගිනිමැලයෙන් උණුසුම ලබන ඔහු සැප සේ නිදා ගත්තේ ය.

වන සතුන්ගෙන් ආරක්ෂාවීමට ද ගිනිමැලය හේතුවක් විය. මෙවැනි රැයක පැසිස්ට් ජර්මනුන්ගෙන් කරදර විය නොහැකි ය. හිම කුණාටු හමන රැයක වනයට වැදීමට ඔවුහු බිය වෙති. ගිනිමැලය අසල නිදා සිටින අලෙක්සේයිට පහත් හඬක් වුව ද හොඳ හැටි ඇසේ. හිම්දිරි පාන්දර හිම කුනාටුව මඳක් අඩු වී වනය පුරා මීදුම පැතිරිණි. පයින් තුරු මුදුන් වැනෙන හඬ ද, හිම වැටෙන මුදු හඬ ද, මැඩ ඈත වෙඩි හඬ ද, වෙඩි පුපුරන හඬ ද, මැෂින් තුවක්කු හා රයිෆල් තුවක්කු හඬ ද පැහැදිලි ලෙස අලෙක්සේයිට ඇසිණි.

"යුද පෙරමුණ මේ තරම් ළඟද? මේ තරම් ඉක්මනට?"

## 7

පසු දා උදෑසන අවදි වූ අලෙක්සේයි මහත් ආයාසයකින් වෙඩි හඬ හා යුද්ධ හඬ ඇසීමට තැත් කළ ද, ඔහුට කිසිවක් නෑසිණි. කාලතුවක්කුවල වෙඩි හඬ පවා නෑසිණි.

හිරු රැස්වලින් නැවී ඇති හිම දීප්තිමත් ව බැබළේ. කුඩා හිම පියලි සුළඟට අසුව ඉහළ නගින විට සුදු පැහැති වලාකුළු මෙනි. සමහර තැන්වල හිරු රැස් නිසා රත්වන හිම පියලි වතුර බවට හැරී බිමට වැටී අයිස් බවට පත් වේ. වසන්තය ළං වී ඇත. අධිෂ්ඨාන ලෙසත්, දැඩි ලෙසත් වසන්තය පැමිණෙන බව කියන සලකුණකි එය.

පෙර දවස ටින් බඳුනෙහි ඉතිරි ව තිබූ මස් සම්පූර්ණයෙන් ම පාහේ කා දැමුව ද, ඔහු ටින් එක විසි නොකළේ ය. නැවත ඒ භාජනය අතට ගත් අලෙක්සේයි එහි ඉතිරි ව ඇති කුඩා මස් කැබැලි හා කැටි ගැසුණු තෙල් කැලි සූරන්නට විය. ඔහුගේ උදේ ආහාරය වූයේ ඒවා ය. යම්තමින් වත් ඒවා නොකෑවොත් ගමන් ඇරඹීමට ඔහුට ශක්තියක් නොවන බව ඔහු දනී. මාපට ඇඟිල්ලෙන් ඔහු එහි වූ කුඩා මස් කැලි සූරන්නට වූ විට, ඔහුගේ ඇඟිලි කැපී තුවාල විය. භාජනයේ තවත් මේදය ඇතැයි ඔහුට සිතුණු නිසා ඔහු නොපසුබට වී තුවාල ගණනකටවත් නොගෙන දිගට ම සූරමින් ඇඟිලි ලෙව කෑවේ ය. නැවුම් හිමවලින් ටින් බඳුන පුරවා ගිනිමැලයේ අඟුරු කැට උඩ

තැබී ය. හිම වතුර බවට පත් ව රත් වූ පසු, යම්තම් මස් රසැති උණු වතුර මහත් වූ සතුටකින් ඔහු බීවේ ය. ඉන් පසු ඔහු බඳුන නැවත සාක්කුවේ දමා ගත්තේ පසු ව තේ සෑදීමට එය අවශ්‍ය වන බැවිනි. උණු 'තේ' සාදා ගැනීම ප්‍රීතිමත් සොයා ගැනීමකි. ගමන් ඇරැඹූ ඔහු, එම සොයා ගැනීම නිසා මඳක් සතුටු විය.

බලාපොරොත්තු රහිත අවාසනාවකට මුහුණ පෑමට ඔහුට සිදුවිය. පෙරදා රැයෙහි ඇති වූ හිම කුණාටුව නිසා මඟ හිමෙන් වැසිණි. තැනින් තැන හිම ගොඩවල් ය. හිරු රැසින් බබළන හිම නිසා ඔහුගේ ඇස් විඩාපත් විය. හිම ගොඩේ ඔහුගේ කකුල් එරෙන්නට වූයෙන්, ඒවා නැවත ඇද ගැනීම ලෙහෙසි නොවී ය. ඔහු අත තිබූ හැරමිටිවලින් ද වැඩි ප්‍රයෝජනයක් නොවූයේ හිම ගොඩේ ඒවා ද එරුණු බැවිනි.

මෙසේ අමාරුවෙන් ගමන් කළ අලෙක්සේයිට උදේ සිට හිරු මුදුන් වන තෙක් යා හැකි වූයේ අඩි එක්දහස් පන්සියයක් පමණි. හැම පියවරක් පාසා ම ඔහු මහත් පරිශ්‍රමයක් දරන්නට විය. නිතර නිතර හිම මත වැතිර සිටින අලෙක්සේයි නළල හිම ගොඩක තබා ගෙන විඩා හරියි. ඉන් පසු නැඟිට, පියවර කීපයක් ඉදිරියට ගොස් නැවත බිම ඇද වැටෙයි. හැම දෙයක් ම අමතක කොට අත පය නොසොල්වා මළාක් මෙන් වැතිර සිටීමට තද ආසාවක් ඔහුට ඇති විය. වෙන දෙයක් වුණාවේ! ඔහු නැඟිට සිට ඒ මේ අත වැනි වැනී පියවර කීපයක් ඉදිරියට තැබී ය. එහෙත්, ඔහුට කකුල් එසවීමට පවා ශක්තියක් නොතිබිණි.

තවත් දුර යාමට ශක්තියක් නැති බව ඔහුට අවබෝධ විය. දන් වාඩිවුණොත් කිසිම බලයකට ඔහු නැඟිට්ටවීමට බැරි බව ඔහුට දනේ. හේ වට පිට බැලී ය. මඟ අසල ළපටි පයින් ගසක් ඔහුගේ ඇසට හසු විය. යෙදිය හැකි හැම ශක්තියක් ම යොදමින් ඔහු පයින් ගස වෙතට ගොස් අත්තක් දෑතින් අල්ලාගෙන එහි කරුව මත නිකට තබා ගත්තේ ය. ඇට බිඳී පිපිරී ඇති දෙපාවල වේදනාව අඩුවූවාක් මෙනි. ඔහු ගසට හේත්තු වී විඩා හරිමින් සතුටු විය. ගස් කරුවකට නිකට තබා ගත් අලෙක්සේයිගේ දෙපාවලට දන් බරක් නොදනේ. වරෙක ඔහු එක් පාදයක්

දිගු කොට මස් ගොබවලට විවේකයක් ලබා දෙයි. පසුව අනෙක් කකුල ද එලෙසම දිග හරියි. දැන් ඔහුට නව අදහසක් පහළ විය.

"මේ ළපටි ගස කපා එහි කරුව මත නිකට තබාගෙන දෙපාවලට උසුලන්ට සිදුවන බරින් ඒවා තරමක්වත් නිදහස් කොට ගමන් කළ හැකි ය. මෙසේ ගමන් කිරීම නිසා වේගය අඩු වුව ද, එතරම් විඩාපත් නොවනු ඇත. හිම තද වන තුරු නැවතී සිටීමට මට සිදු නොවේ"

ඔහු දණ ගසා, ළපටි ගස කපා ගෙන අතු සියල්ල කපා දමා, කරුව වටා ලේන්සුවක් ඔතා, ඒ මත නිකට තබා ගෙන, කරුව සහිත රිට අල්ලාගෙන වරෙක එක් පයක් ඉදිරියට තබා සිරුරේ බර නිකට රැඳි කරුවකට දී අනික් පය බරෙන් නිදහස් කරමින් සෙමින් සෙමින් පා තබන්නට වූයේ පියවර මනිමිනි.

## 8

මේ විදියට හිම ගොඩවල් මැදින් දවස් දෙකක් ම ගමන් කරන්නට විය. ඔහුගේ දෙපා සම්පූර්ණයෙන් ම හිරි වැටී ඇති බැවින් වේදනාව නොදැනුණ ද, සිරුරේ හැම මාංස පේශියක් ම වේදනාවෙන් කකියන්නට විය. ඔහුට දැන් බඩගිනි නොදැනේ. බඩ සහ බඩවැල් හැකිළීම නිසා ඇති වූ තියුණු වේදනාව දැන් අන්ධ වේදනාවකට හැරී ඇත. ආමාශය හා අභ්‍යන්තර ඉන්ද්‍රියයන් එකට ඇලුණාක් මෙනි.

විඩා හරින විට අත ළඟ ඇති ළපටි පයින් ගසකින් පොතු සූරා ගන්නා අලෙක්සේයි ඒවා ආහාරයට ගත්තේ ය. බිරියෝසා ගස්වල දලු ද ලීපා ගස්වල කොළ සහ දලු ද, එමෙන් ම, ඔහුගේ ආහාර විය. හිම තට්ටු යටැති කොළ පැහැති මොස් පැළ (පාසි වැනි පැළ වර්ගයකි) සමඟ හිම කැටි රත් කොට ගෙන රෑ නින්දට පෙර පානය කළේ ය. බිල්බෙරි ගස්වලින් කොළ කඩාගෙන ඒවායෙන් 'තේ' සාදා ගෙන බීමට ද ඔහු පුරුදු විය. උණු 'තේ' ඔහුගේ සිත කය දෙකට ම උණුසුම ගෙන දුන් නිසා දෝ කුස පුරා ආහාර ගත් සැටියක් ඔහුට දැනිණි. උණු 'තේ' සහ දුම් ගඳ සහිත මොස් පානය නිසා ඔහු සන්සුන් විය. අවසානයක් නැති බියජනක ගමන නිසා ඔහු බිය නොවී ය.

හයවැනි රැයෙහි දී විශාල අතු සහිත දේවදාර ගසක් යට වාඩි වූ අලෙක්සේයි, පසුදා එළිය වැටෙන තුරු ම ගිනි තැපිය හැකි ලාටු සහිත පරණ ගස් කොටයක් සොයා ගෙන ගිනිමැලයක් සාදා ගත්තේ ය. තව ම ඇඳිරි වැටී නැත. තමාට නොපෙනෙන ලේනෙක් ගසක අත්තක හිඳගෙන දේවදාර ගෙඩිවල ඇට සපමින් ශබ්ද කරන හැටි අලෙක්සේයිට ඇසිණි. කුසගින්න නිසා නිතර ආහාර ගැන සිතන ඔහුට මේ ඇටවල රස බැලීමට සිත්විණි. මද රහිත ඇට සහ නරක් වූ ඇට ලේනා බිමට දමයි. අලෙක්සේයි ඇටයක් ගෙන සනැති පොත්ත බිඳ බැලී ය. ඒ තුළ වූ කුඩා මදය පුංචි පරිප්පු ඇටයක් පමණ වේ. ඔහු එය සපන්නට විය. එහි තෙල් රසය නිසා ඔහු සතුටු විය.

ඔහු දේවදාර ඇට කීපයක් සොයා ගෙන, වියළි කෝටුවලින් ඒවා වසා ගිනි අවුළුවා, ඒවා පුලුස්සන්නට විය. රත් පැහැගත් ඇට පුපුරන්නට වූ විට, අලෙක්සේයි ඒවායේ මද වෙන්කොට ගෙන කටේ දමාගනිමින් සපන්නට විය.

තවත් ඇට සොයා ගෙන ඒවා ද පුලුස්සා ගෙන කෑවේ ය. තෙල් සුවඳ ඔහුට සිය ළමා කාලය මතක් කළේ ය... පුංචි, තදබද කාමරයකි. මේසයට ඉහළින් ලාම්පුවක් එල්ලා ඇත. හවස් වෙත් ම, වෙස්පර්ස් යාඥා වාරයට සහභාගි වූ අම්මා ගෙදර ආවා ය. පෙට්ටගමක තිබූ කඩදාසි බෑගයක් ගෙන එහි ඇති දේවදාර ඇට බඳුනකට දමා බැද්දා ය. පවුලේ බාලයා වූ අලෙක්සේයිත් ඔහුගේ වැඩිමහලු සොහොයුරෝ දෙදෙනාත්, අම්මාත්, ආච්චීත් මේසය වටා වාඩි වී බදින ලද ඇට සපන්නට වූහ. එය උත්සවය පටන් ගැනීමකි...

වනය හඬ නඟයි. ගිනිමැලයට හරවා ඇති තම මුහුණ රත් පැහැ ගෙන ඇති නමුදු, පිට සුළං පහර නිසා ශීතල වී ඇත. බස්සෙක් අඬයි. නරියෙක් ඈත හූ හඬ නඟන සැටි ඇසේ. නිවී යන ගිනිමැලය දෙස කල්පනාකාරීව බලාගෙන සිටින මිනිසෙකි. ඔහු කුස ගින්නෙනි. දෙපා වෙන් වී යන තරමට ඇට කැඩී පුපුරා යාම නිසා තුවාල ලැබ සිටින හෙතෙම මැරෙන තරමට ම හෙම්බත් වී සිටී. ඉමක් කොනක් නැති මහා වනයේ ඔහු අතරමං වී ඇත. ඔහු ඉදිරියේ ඝනාන්ධකාරයකි. නොපුරුදු, නුහුරු මඟකි,

බලාපොරොත්තු රහිත අවදානම් සහ පරීක්ෂණයන් ය.

"කමක් නැහැ! මගේ කාරිය ඉටු වේවි!" යැයි හේ හිටි හැටියේ ම කීවේ ය. දැඩි හිම කුණාටු නිසා පැළී ගොස් ඇති ඔහුගේ දෙතොල්වල මඳ සිනාවක් මැවී ඇති සැටි ගිනිමැලය නිසා දැකිය හැකි ය. ඒ මඳ සිනාව දුර කල්පනාවක ප්‍රතිඵලයකි.

## 9

හිම කුණාටුව පැවැති රැයෙහි ඈත පැන නැඟි සටන්වල හඬ තමාට ඇසුණේ කොහේ සිට දැයි යන්න අලෙක්සේයි දැන ගත්තේ, හත්වැනි දවසේ දී ය.

පා එසවීමට බැරි තරමට විඩාපත් වී සිටි අලෙක්සේයි හිම දියවෙමින් පවතින මඟ දිගට ඇදෙමින් නිතර නිතර විඩා හරී.

වන මඟ වමට හැරෙන වංගුවට පැමිණි හෙතෙම, ගල් ගැසුණාක් මෙන් සිට ගත්තේ ය. මඟෙහි ඉතා ම පටු තැන දෙපස ළපටි පයින් ගස් ය. එතැන ජර්මන් මොටෝ රිය තුනකි. මඟ හරහා මුලින් කපා හෙළූ යෝධ පයින් ගස් දෙකකි. එක් ගසකට හැපී ඇති ජර්මන් යුද්ධ රථය විකටයකු මෙනි. මලකඩ කා ඇත. ටයර් ගිනිබත් වීම නිසා යකඩ රෝද පමණක් නග්නව පෙනේ. යුද රියේ කුලුන යෝධමය හත්තක් සේ බිම වැටී ඇත. රිය අසල එහි පිරිස වූ පැසිස්ට් භටයන් තිදෙනෙකුගේ මළ කඳන් ය. කොළ පැහැති යුද ඇඳුම්වලින් ඔහුන්ගේ සිරුරු වැසිලා ය. හිස්වල යකඩ තොප්පි ය.

පිටුපස වූ රථ දෙක ම ගිනිබත් වී ඇත. ඒවා දැන් මල බැඳුණු රත් පැහැයකින් වැසිලා ය. අවට දිය වී යන හිම ගිනිගත් විට ඇති වූ දුම් නිසා කළු පැහැගෙන ඇත. රිය අවටත්, අසල අගල්වලත් මඟ දෙපසත් හිට්ලර් හමුදාවේ සෙබළුන්ගේ මළ කඳන් කීපයකි. ඔවුන් මරණ බියෙන් පලා යන්නට සැරසුණු බවක් පෙනේ. හැම ගසක් පිටුපසින් ම මාරයා ඔවුන් වෙත ළඟා වූ සැටි ඒ ජවනිකාව කියා පායි.

මළ කඳන් වෙත ළං වූ අලෙක්සේයි යුද පිටිය පිරික්සා බලන්නට විය. දිය වෙමින් පවතින හිමවලට අසුවුණු පුස්කෑ පරණ විස්කෝතුවක් ඔහුගේ නෙතට ලක් විය.

කුරුල්ලන් කොටා ඇති ඒ පරණ විස්කෝතුව කටේ දමා ගනිමින් ඔහු දිග හුස්මක් ඇද ගත්තේ ය. විස්කෝතු පුසුඹ නිසා ඔහුට මහත් සතුටක් දැනිණි. විස්කෝතුව කැබැලි වන සේ සපා කමින් එහි රස විඳීමට ඔහුට සිතුණ ද, ඒ ආසාව මැඩ ගත් අලෙක්සේයි එය කැබැලි තුනකට කඩා කෑලි දෙකක් කලිසම් සාක්කුවේ දමා ගනිමින්, ඉතිරි කෑල්ල කටේ දමා ගත්තේ ය. දත් නැති අත දරුවෙකු මෙන් හෙතෙම විස්කෝතු කෑල්ල උරන්නට විය. මේ විදිහට ඔහුට බොහෝ වේලාවක් විස්කෝතු රසය විඳීමට පුළුවන් විය.

නැවත ඔහු යුද පිටියට ගොස් පිරික්සා බැලී ය. පාටිසාන්වරුන් (සැඟ වී සිට යුද්ධ කරන දේශප්‍රේමී භටයෝ) මේ ළඟ සිටිතියි යන හැඟීමක් ඔහුට ඇති විය. මේ ගස් හා පඳුරු වටා ඇති හිමවල පා සටහන් ඔවුන්ගේ විය යුතු ය. ජර්මන් මළ කඳන් අසලින් යමින් ඒ මේ අත බලන ඔහු දැනටමත් පාටිසාන්වරුන් දක ඇතැයි ඔහුට සිතේ. දේවදාර ගසක මුදුනක සිට හෝ පඳුරකට මුවා වී හෝ ඔත්තු බලන පාටිසාන් භටයෙක් දැනටමත් ඔහු දක ඇත්ද? කට වටා බටයක් මෙන් දෑතේ ඇඟිලි තබා ගත් අලෙක්සේයි මහ හඬින් කෑ ගසන්නට විය.

"ඕ-හෝ-හෝ! පාටිසාන්වරුනි!"

ඔහුගේ හඬ බොහෝ දුර්වල බව දැනුණෙන්, ඔහු පුදුමයට පත් විය. ඔහුගේ කට හඬ නිසා ඇති වූ දෝංකාරය මුල් කට හඬට වඩා වැඩි හඬක් නඟන බව ඔහුට දැනිණි.

"පාටිසාන්වරුනි! පාටිසාන්වරුනි! ඕ-හෝ!" යැයි අලෙක්සේයි වාඩි වී කෑගසන්නට විය. ඔහු අවට කළු පැහැති හිම ය. නිහඬ සතුරු මළ සිරුරු ය.

ඔහුට පිළිතුරු දුන්නේ ඔහුගේ කටහඬේ දෝංකාරය පමණකි. ඔහු මහත් වුවමනාවෙන් කන් යොමා සිටියේ ය. පයින් ගස්වල ගීතමය හඬට ඉහළින් 'දඩාස්' 'දඩාස්' වැනි හඬක් ඇසේ. නැතිනම් ඔහුට එවැනි හඬක් ඇසෙන බව සිතෙයි. වරෙක එය පැහැදිලි ව ද තවත් වරෙක නොපැහැදිලි ව ද ඇසෙන නිසා ඔහු ව්‍යාකූල බවට පත් විය. ඔහුගේ කටහඬට පිළිතුරු වශයෙන් නැඟෙන මිතුරු

හඬක් ලෙස ඔහු එය පිළිගත්තේ ය. තමන්ට අසෙන ශබ්දය අවිශ්වාස කළ හෙතෙම, බෙල්ල දිගු කරගෙන කන් යොමා අසාගෙන සිටියේ ය.

නැත. ඔහුට වැරැදී නැත. නැඟෙනහිර සිට හමන වැහි සුළං, කාලතුවක්කු සටනක පැහැදිලි හඬක් ගෙන ආවේ ය.

"සත්තකින්ම ඔව්!" එය බියජනක කාලතුවක්කු සටනක රණ හඬකි. හඬ අනුව නම් යුද පෙරමුණ කිලෝමීටර දහයකට වඩා දුර නැත. එහි මහා සටනක් ඇවිළඇත. එක් පැත්තක් මරු පහරක් අරඹා ඇත. අනික් පැත්ත මාරාන්තික ලෙස ආරක්ෂා සටනක යෙදෙයි. අලෙක්සේයිගේ දෙකොපුල් දිගේ සතුටු කඳුළු වැගිරිණි.

ඔහු නැඟෙනහිර දෙස බලන්නට විය. ඔහු වාඩි වී සිටින තැනින් හැරෙන මඟ හිමෙන් පිරි විරුද්ධ පැත්ත දක්වා වැටී ඇත. පාටිසාන්වරුන්ගේ පා සටහන් ඇත්තේ ද ඒ මඟ ඔස්සේ ය. වනයේ වීරයන් වාසය කරන්නේ ඒ මඟ වැටී ඇති වන මැද ය.

අලෙක්සේයි මිමිනුවේ ය. "කමක් නැහැ, සහෝදරවරුනි! හැම දෙයක්ම නිසි පරිදි කෙරේවි." කරුව සහිත රිට දැතින් ගෙන නිකට කරුවට තබා මහත් ධෛර්යයකින් යුතු ව ඔහු ගමන් ඇරැඹී ය. කරුව සමඟ එක් පයක් ඉදිරියට තබා අනික් පයට විවේකයක් ලබාදෙන ඔහු, නැවත කරුව සහිත රිට සමඟ අනික් පය ඉදිරියට තබයි. ගමන අසීරු ය. එහෙත්, ඔහු නොසැලී ඉදිරියට ම ගියේ ය.

## 10

එදින ඔහුට අඩි එකසිය පනහක දුරක් වත් යා ගත නොහැකි විය. අඳුර නිසා ඔහුට නැවතීමට සිදුවිය. නැවතත් පැරැණි ගස් කොටයකට ළං වී වියළි අතු සහ දර කෝටු සොයාගෙන ගොඩ ගසා සිගරට් ලයිටරය ගෙන ගිනිගල කරකැවී ය. ලයිටරයේ පැට්රල් නැති නිසා පාන්කඩය වේළිලා ය. ඔහු කීපවරක් ම ගිනිගල මැද්දේ ය. එහෙත්, ගිනි ඇවිළුණේ නැත. අඳුර පැතිරිණි. ගිනිගල අතුල්ලන විට කුඩා ගිනි පුපුරක් ඇති වී නැති ව යයි. ගිනි ගල ගෙවී යන තුරු ඔහු අතුල්ලන්නට වුව ද, ගිනිමැලයක්

අවුළුවා ගැනීමට ඔහුට බැරි විය.

අඳුරේ බඩ ගාමින් හෙතෙම ළපටි පයින් ගස් පඳුරක් වෙත ගොස් වාඩි වී පළමුවැනි දවසේ දී මෙන් දැත් දණහිස් වටා යවමින් මුහුණ ඒ මත තබාගෙන නිහඬ වනය වෙත කන් යොමන්නට විය. එදින රැයේ දී ඔහු බලාපොරොත්තු සුන් වූ තත්ත්වයකට වැටීමට ඉඩ තිබුණ ද, වනයේ නිහඬතාව බිඳගෙන නැග එන කාලතුවක්කු හඬ එයට ඉඩ නොතැබී ය. දැන් පෙරට වඩා පැහැදිලි ව වෙඩි හඬ ඇසේ. පුපුරන ෂෙල් වෙඩි හඬෙහි හා කාලතුවක්කු වෙඩි හඬෙහි වෙනස පවා ඔහුට දැනෙන බවකි.

ඔහු උදෑසන අවදි වූයේ විස්තර කළ නොහැකි අනතුරු හැඟීමෙකින් හා කනගාටුවකින් යුතු ව ය. "මා දුටු සිහිනය කුමක්ද? එය අසුබ ලකුණක්ද?" ඔහු තමාගෙන්ම ප්‍රශ්න කළේ ය. සිගරැට් ලයිටරය ගැන ඔහුට මතක් විය. එහෙත්, හිරු රැස් නිසා අවට හැම දෙයක් ම උණුසුම් වී ඇත. හිම ද ගස් ද පයින් ගස්වල අතු අග ද හිරු රැස්වලින් බබළයි. මේ සියල්ල නිසා තම අවාසනාව ගැන ඔහු එතරම් බරපතළ ලෙස නොසිතුවේ ය. වඩාත් අසතුටුදායක දෙයක් සිදු වී ඇත. හිරි වැටී ඇති දෑත් දිග හැර නැගිට සිටින්නනට තැත් කළ නමුදු, ඔහු අසමත් විය. කීප වරක් ම නැඟී සිටින්නට තැත් කළ විට ඔහුගේ රිට දෙකට කැඩුණෙන්, ඔහු මල්ලක් මෙන් බිම වැටිණි. ඉදිමී තිබෙන දෙපාවලට විවේක දීම් වස් හෙතෙම උඩුබැලි අතට වැතිරී ගත්තේ ය. උසැති පයින් ගස්වලට ඉහළින් නිල් පැහැති අහස ය. රන් තරු සහිත සුදු වලාකුළු පාවෙයි. දෙපාවලින් පැන නඟින වේදනාවට සමාන වේදනාවක් දැන් මුළු සිරුරෙන් ම දැනේ. තව දුරටත් එය ඉවසා සිටිය නොහැකි ය. පයින් ගසක් බදාගෙන නැවත වරක් ඔහු නැඟී සිටීමට වෙර දැරී ය. එ වර ඔහු ජයගත්ත ද, දෙපා ගස වෙතට ඇද ගැනීමට තැත් කරත් ම බෙලහීනත්වය නිසා බිම ඇද වැටුණේ ය. දෙපාවල වේදනාව තව තවත් තියුණු විය.

මෙය මගේ අවසානය ද? මේ ගස් යට මා අවසන් හුස්ම හෙළිය යුතු ද? මගේ ඇටකටු පවා මිනිස් ඇසට හමු නොවනු ඇත. වන සත්තු මගේ සිරුර කා දමත් ද? අබල දුබල ඔහුගේ ගත මහ පොළොව තදින් සිප ගනී.

ඈත ඇවිළ ඇති සටන්වල හඬ ඔහුට නැවත ඇසිණි. ඔහුගේ සොහොයුරෝ සතුරාට එදිරි ව මහ සටන් කරති. මේ අවසාන කිලෝමීටර අට හෝ දහය හෝ යාමට තරම් ශක්තියක් ඔහුට නැත්ද?

කාලතුවක්කු වෙඩි හඬ ඔහුට නව පණක් ලබා දුන්නේ ය. එය ඔහුට අඬ ගසන්නට විය. ඔහු එම හඬට පිළිතුරු දුන්නේ ය. ඔහු සතකු මෙන් හතර ගාතෙන් යන්නට වූයේ ඉවෙන් මෙනි. වනය හරහා මේ විදිහට යාම රිටිවල ආධාරයෙන් ගමන් කිරීමට වඩා පහසු බව පසු ව ඔහුට අවබෝධ විය. පාවලට බරක් නැති නිසා වේදනාව ද මඳක් අඩු වී ඇත. හතර ගාතෙන් යාම නිසා ගමන් වේගය ද වැඩි වී ඇත. ප්‍රීතිය නිසා ඔහුගේ උගුරේ යමක් හිරවුණාක් මෙනි. මේ අරුම පුදුම ගමන නිසා බලාපොරොත්තු සුන් වූ කෙනෙකු දිරි ගැන්වීමට මෙන් හෙතෙම හඬ නඟා කතා කළේ ය.

"කමක් නැහැ උන්නැහේ. හැම දෙයක්ම සාර්ථක වේවි!"

මෙසේ හතර ගාතෙන් යාම නිසා අලෙක්සේයිගේ අතුල් හා අත්වල ඇඟිලි හිරි වැටිණි. දැත් කිහිලි ගන්වා ගනිමින් උණුසුම් කර ගත් හෙතෙම, ගසක පිට පොතු දෙකක් ගලවා ගත්තේ ය. ඇඟිලි තුවාල කර ගනිමින් බර්ච් ගසකින් දිග පට්ටා කීපයක් ඉරා ගත්තේ ය. පිට පොතු දෙක අතුල්වලට තබා දෙපා ඔතා ඇති ප්ලැනල් රෙද්දෙන් කෑල්ලක් ඉරා ගෙන එය අතුල්වලට තබා ඉන් පසු දිගැති පට්ටා තබා වෙළුම් පටිවලින් බැඳ ගත්තේ ය. දකුණු අත්ල වසා ගත් පට්ටා හොඳට ශක්තිමත් ව බැඳ ගන්නට ඔහුට පුළුවන් විය. වම් අත්ල වටා වෙළුම් පටි එතීම දත්වලින් කළේ ය. දැන් අලෙක්සේයිගේ දෑත් අත්වැසුම්වලින් වැසී ඇත. ගමන වඩාත් ලෙහෙසි විය. වේගවත් විය. ඊළඟ විඩා හරින ස්ථානයට පැමිණි පසු ඔහු දණහිස්වලට ද එවැනි ම 'සපත්තු' දැම්මේ ය.

දහවල් වන විට අලෙක්සේයිට සෑහෙන දුරක් යාමට හැකි විය. මෙසේ ඔහු සටන් ඇවිළ ඇති පෙදෙස දක්වා යන්නේ වෙඩි හඬ පැහැදිලි ව ඇසෙන නිසා ද, නැතිනම් ශ්‍රවණ මායාවක් නිසා ද යන්න කිව නොහැකි වුව ද, වෙඩි

හඬ වඩාත් ළංව වඩාත් පැහැදිලි ව ඇසේ. ඔහුට රශ්මිය දනුණෙන් නියමු කබායේ 'සිප්' පටිය ගලවා දැම්මේ ය.

පෙඳ පාසි සහිත මඩ ගොහොරුවක් මැදින් මෙසේ හතර ගාතෙන් යද්දී ඔහුට තවත් වටිනා වස්තුවක් ලැබිණි. පෙඳ පාසි සහ කුඩා පැළෑටි අතරින් ළපටි කොළ සහිත රත් පැහැති ක්රේන්බෙරි නම් වූ පලු වගයක් වැවී තිබෙන සැටි ඔහු දිටී ය. හිස පහත් කොට පැළෑටිවලට කට ළං කර ගත් අලෙක්සේයි දත්වලින් බෙරි කඩාගෙන කන්නට විය.

ප්රණීත රසය ඇති ක්රේන්බෙරි දින කීපයකට පසු ඔහුට ලැබුණු ප්රධාන ආහාරය විය. ඒවා නිසා ඔහුගේ ආමාශය හැකිළී වේදනාවක් ගෙන දුන්න ද, එය පහවන තුරු නැවතී සිටීමට ඔහුට වේලාවක් නැත. ඔහු වලසෙකු මෙන් බෙරි පඳුරුවල ඉදුණු හා අමු බෙරි කටින් කඩාගෙන කන්නට විය. තම පාවහන්වල හිම දිය වී වතුර බවට පත් වී ඇති බව හෝ පාවල වේදනවා ගැන හෝ නොසැලකූ අලෙක්සේයි විඩාපත් බව ද නොතකමින් බෙරි ගෙඩි කෑවේ ය. දිවට පැණි රසක් දැනෙයි. බඩ පිරීම නිසා සතුටක් ද දැනෙයි.

ඔහුට ඔක්කාරය දනුණ ද, බෙරි කෑම නැවැත්වීමට සිත් නොවී ය. තම අත්වැසුම් ගලවා දැමූ අලෙක්සේයි ටින් බඳුන පුරවා බෙරි එකතු කරගෙන පසු ව හිස් වැස්ම පිරෙන තුරු එහි ද බෙරි ගෙඩි අසුරා එය ඉණ වටා බැඳ ගත්තේ ය. සිරුර පුරා විහිද යන දුබල බව මැඩ ගනිමින් ඔහු නැවත දණ ගාන්නට විය.

එදින රැය ගත කිරීම පිණිස අලෙක්සේයි දේවදාර ගසක් යටට විය. ඔහු බෙරි ගෙඩි සහ දේවදාර ඇටවල මද කෑවේ ය. නිදා ගැනීමට සැරසුණ ද, රෑ මුරකරුවකු මෙන් ඔහු පරීක්ෂාකාරී විය. කිසිවෙක් නිහඬ ව තමා වෙතට බඩ ගාමින් එන සැටියක් අලෙක්සේයිට දැනේ. ඔහු දෙනෙත් ඇරගෙන ඇස්ගෙඩි දොට්ට පනින තුරු මහත් කරගෙන වටපිට බැලී ය. පිස්තෝලය අතට ගෙන වෙඩි තැබීමට සූදානම් කර ගත්තේ ය. දේවදාර ඇටයක් බිමට වැටෙන හඬක් ඇසිණි. දහවල් හිරු රැස් නිසා දිය වී ගිය හිම නැවත කැටි ගැසී අයිස් බවට පත් විය. කුඩා දිය පාරවල් ද රාත්රී ශීතල විසින් අයිස් බවට පෙරළන ලදී.

එළිය වැටෙන්නට ඔන්න මෙන්න කියා තිබිය දී ඔහුට

නින්ද ගියේ ය. ඔහු අවදිවූයේ හිරු රැස්වලින් ගස් අවට ආලෝක වූ පසුව ය. තමා නිදාගත් ගස වටේ හිවලෙකුගේ පා සටහන් ද, උගේ වල්ගය හිමට ගෑවුණු සටහන් ද දැකිය හැකි ය.

හිවලා තමා වටේ යමින් ලැග සිටි බවක් කියන සලකුණු පෙනේ. "මගේ නින්දට බාධා කළේ උඟ තමා!" යැයි හෙතෙම තමාට ම කියා ගත්තේ ය. මිනිසකුගේ මරණය ළං වන විට හිවලාට එය ඉවෙන් මෙන් දැනෙන නිසා උඟ මිය යන මිනිසා පසු පස ගමන් කරන බව දඩයක්කාරයෝ කියති. අලෙක්සේයිට මේ කතාව මතක් වූ බැවින් ඔහු කලබල විය. බියසුලු හිවලා තමා පිටුපසින් එන්නේ තමාගේ මරණය ළං වූ නිසා ද?

අලෙක්සේයි පරීක්ෂාකාරී විය. නැගෙනහිරින් ඇසුණු කාලතුවක්කු හඬ සමඟ ඔහුට මැෂින්තුවක්කු හඬක් ද ඇසිණි.

විඩාපත් ගතිය අමතක කර දමා, හිවලාගේ තර්ජනය ද අමතක කොට හෙතෙම නැවත ඉදිරියට බඩ ගා යන්නට විය.

## 11

මේ විදිහට අලෙක්සේයි තව දෙතුන් දිනක් ම දණ ගාමින් යන්නට විය. දැන් ඔහුට කාලය හා වේලාව අමතක වී ඇත. හැම දෙයක් ම එකට මුසු වී අවිච්ඡින්න පරිශ්‍රමයකට පරිවර්තනය වී ඇත. සමහර විට ඔහු අබිබවා නින්ද ජය ගනී. තවත් විටෙක විස්මෘතිය ජය ගනී. සමහර විට දණ ගාන අතර ම ඔහුට ඉබේ ම නින්ද යයි. එහෙත්, නැගෙනහිර දෙසට යාමට ඔහු තුළ ඇති අධිෂ්ඨානය කොතරම් ද යත්, එවැනි තත්ත්වයක පසුවෙද්දී පාර දිගට ම දණ ගාමින් ඉදිරියට ම ගියේ ය. ගසක හෝ පඳුරක හැප්පුණු විට පමණක් හෝ එසේත් නැතිනම් අතක් ලිස්සා තමාගේ මුහුණ හිම ගොඩක් ස්පර්ශ කළ විට පමණක් හෝ අලෙක්සේයි නැවතුණේ ය. එකම අරමුණක් මත ඔහුගේ හැම අවධානයක් ම රැඳී ඇත. ඔහු දණ ගාමින් බඩගාමින් ඉදිරියට ම ඇදුණේ ය.

ඔහුගේ ආහාරය බෙරි වර්ග හා කුඩා ළපටි පැළෑටි විය. වරෙක ඔහු දිම් තුඹසක් දුටුවේ ය. වැස්සට තෙමී සේදී ගිය පිදුරු ගොඩකට හැඩයෙන් සමාන වූ මේ තුඹසට ළං වූ අලෙක්සේයි අතක් දැමී ය. දිමියෝ හිම නින්දෙන් පසුවෙති. උන් මළාක් මෙනි. එහෙත්, ඔහු දිමියන් මිටක් ගනිත් ම, උහු ඔහුගේ හම සපන්නට විය. තොල කට වේළී ඇති නිසා දෝ ඔහු දිමියන් කටේ දමා ගනිමින් සපා කන්නට විය. උන් සැපෙන විට පිටවන ෆෝමික් අම්ලය ඔහුට රසයක් විය. ඔහු මහත් ආසාවෙන් දිමියන් අහුරු පිටින් ගෙන කටේ දමා ගනිමින් කෑවේ ය. තුඹස තුළ උන් දිමියන් මේ අවදානම නිසා අවදිවන තුරු ම ඔහු දිමියන් අහුරු පිටින් ගෙන කන්නට විය.

දිමියෝ තම ආත්මාරක්ෂාව සඳහා අභීත ලෙස සටන් කළහ. උහු ඔහුගේ අත ද කට ද තොල් ද විදිමින් සපන්නට වූහ. සමහර එවුන් අහස් නියමු ඇඳුමට යටින් රිංගා ගොස් පපුව, පිට හා ඉඟටිය සැපූහ. උන්ගේ සපාකෑම නිසා ඇති වූ වේදනාව ඔහුට එක්තරා සතුටක් ගෙන දුන්නේ ය. ෆෝමික් අම්ලය ඔහුට අමෘතයක් මෙනි. හුඹහ අසල වතුර පිරි වළක් දැක එතනින් වතුර බීමට ඔහු බෙල්ල දුගු කළා පමණකි, බියජනක මුහුණක් ඔහු දෙස එබී බලන සැටි ඔහුට පෙනිණි. පසුතලයෙහි පැහදිලි නිල්වන් අහස ය. එය මුහුණක් නොව, ඇට සැකිල්ලකි. හකු ඇට පෑදී ඇති එහි නිකට වසා ඇති යටි රැවුල කිලිටි ය. දොකොපුල් වසා ඇති රැවුල් ගස් කැරලි ගැසිලා ය. විශාල, වටකුරු ඇස් පැහැදිලි ව බබළයි. නළල වසා ගත් කෙස් රොදවල් කැටි ගැසී ඇත.

"ඇත්තටම ඒ මමද?" යි ප්‍රශ්න කළ අලෙක්සේයි නැවත තම මුහුණ බැලීමට බිය වූයෙන් වතුර බීම නවත්වා දණ ගාමින් වතුර වළෙන් ඉවත් වී හිම අහුරක් කටේ දමා ගනිමින් නැඟෙනහිර බලා ගියේ ය.

රැය ගත කිරීම සඳහා ඔහු තෝරා ගත්තේ බෝම්බ කවරයකි. එය පිපිරෙන විට කහ පැහැති පස් සහිත වළක් ඇති කළේ ය. වළ තුළ පස් සහිත බෝම්බ කවරය හොඳ තැනක් බව ඔහුට පෙනිණි. මෙතැනට කුණාටු නොහමයි. අලුත් සයනයේ සිට අහස දෙස බලන විට, තරු වඩාත් ලොකුවට තම හිසට ඉහළින් බැබළෙන සැටි පෙනේ.

පයින් ගසක අත්තක් ඒ මේ අත වැනෙන විට බැබළෙන තරු රෙදි කඩකින් පිස දමන සැටියක් පෙනෙයි. මේ පිසදැමීම නිසා තරු වඩාත් දීප්තිමත් ව බැබළේ. සුළං හමන දිශාව වෙනස් විය. උතුරු දිගින් ශීත සුළං හමන්නට විය. පිනි බිඳු අයිස් කැට බවට පෙරළිණි.

පසු දා අලෙක්සේයි අවදි වූයේ වඩාත් දුබල ගතියකිනි. උදේ ආහාරය සඳහා දේවදාර ගසක පොත්තක් සූදානම් කර ගෙන තිබුණ ද, එය කෑමට පවා රුචියක් නැති ය. ඔහු මහ පොළොවට ඇලුණාක් මෙනි. මහත් ආයාසයකින් නැඟී සිටි අලෙක්සේයි හිම කැටිවලින් තම ඇඳුම සහ රැවුළ පිරිසුදු කිරීම පවා අමතක කොට, රාත්‍රි යහනෙන් පිටවීමට උත්සාහ දැරී ය. පුනීලයක් වැනි ඒ බෝම්බ කවරයෙන් ගොඩ ඒම ලෙහෙසි නැත. කීප වරක් ම ඔහු උත්සාහ ගත් නමුදු, කවරයේ පතුලට ලිස්සා වැටිණි. වෙන කෙනෙකුගේ ආධාරය නැති ව මෙතැනින් ගොඩ වීමට බැරි බව වටහා ගත් අලෙක්සේයි බිය විය. ඔහු නැවත වරක් ඉහළට බඩ ගෑවේ ය. අඩි දෙක තුනක් ගිය පසු නැවත ලිස්සා පතුලට ඇද වැටිණි. ශක්තිය සිඳී ගොස් තමා බලාපොරොත්තු රහිත තත්ත්වයකට මුහුණ පා සිටින බව ඔහුට අවබෝධ විය.

"මේ අවසානයයි. දැන් ඉතින් මොනවා වුණත් කමක් නෑ!"

බෝම්බ කවරයේ පතුලේ ගුළි ගැසී සිටි අලෙක්සේයිගේ සිත අඩපණ කොට අධිෂ්ඨාන ශක්තිය ක්‍රියා විරහිත කරනු ලැබුවේ ඒ බියජනක හැඟීම විසිනි. උදාසීන ලෙස සාක්කුවකින් ලියුම් කීපයක් ඇද ගත්ත ද, ඒවා කියවීමට තරම් ශක්තියක් ඔහුට නැත. සෙලෝෆේන් කඩදාසියක ඔතා තිබුණු ඡායාරූපයක් ගෙන බලන්නට විය. මල් පිපී ඇති තණබිමක වාඩි වී සිටින තරුණිය පලා වන් ගවුමකින් සැරැසී සිටින්නී ය. බැරෑරුම් ලෙස හා දුක්මුසු මඳ සිනාවකින් මුව සරසා ගෙන ඔහු ඡායාරූපයේ තරුණියගෙන් මෙසේ ප්‍රශ්න කළේ යඃ

"මෙය අපේ අවසාන සමුගැනීම ද?" දිග සුසුමක් හෙළූ අලෙක්සේයි ගල් රුවක් මෙන් ක්‍රියා විරහිත විය. තමාට සුපුරුදු හඬක් ඈත අහසේ ඇසෙන බව ඔහුට දැනේ. ශීත සුළං අතරින් මහ වනයට ඉහළින් එම හඬ පැතිර යයි.



නින්දෙන් පිබිදුණු කලෙක මෙන් ඔහු තිගැස්සී අවදි විය. අමුත්තක් නැති එම ශබ්දය නොපැහැදිලි ය. තියුණු ශ්‍රවණයක් ඇති වන සතුන්ට පවා එම ශබ්දය හා ගස්වල අතු ගැටෙන ශබ්දය අතර වෙනස දැන ගැනීමට බැරි තරම් ය. එහෙත්, ඉන් පැන නැඟුණු නළා හඬකට සමාන ශබ්දයක් නිසා එය 'ඉල්-16' වර්ගයට අයත් අහස්යානයක් බව අලෙක්සේයි ස්ථිර ලෙස ම දැන ගත්තේ ය.

දැන් අහස් යානයේ එන්ජින් හඬ වඩාත් පැහැදිලි ය. වරෙක ඉන් නළා හඬක් පිටවෙයි. තවත් වරෙක එය කෙඳිරි ගාන්නාක් මෙන් හඬක් පිට කරයි. අළු පැහැති අහසේ දැන් අහස්යානය පැහැදිලි ලෙස දැකිය හැකි ය. පුංචි කුරුසියකට සමාන එම අහස්යානය වලාකුළකට වැසී යන සැටි අලෙක්සේයි දුටුවේ ය. දැන් අහස් යානයේ පියාපත්වල රතු තරු සහිත සටහන ඔහුට පැහැදිලි ව පෙනෙයි. අහස්යානය වටක් කැරකී, ඉහළ නැඟ කවාකාර හැඩයකට පියාඹා නොපෙනී ගියේ ය. එහි එන්ජින් හඬ තව ම තමාට ඇසෙන බව අලෙක්සේයිට දැනේ.

තමා එම අහස්යානය පදවන සැටි සිතින් මවා ගත් අලෙක්සේයි, මිනිසෙකු සිගරැට්ටුවක් දල්වා ගැනීමට යන කාලයට වඩා අඩු වේලාවක් තුළ දී තමාට අහස් තොටුපළ දක්වා යානය පැදවිය හැකි බව සිහි කළේ ය. ඒ යානයේ

නියමුවා කවුද? උදේ මුර සංචාරයක යෙදෙන අන්ද්‍රෙස් ඩෙග්ටෙරෙන්කෝ විය හැකි ය. එවැනි ගමන්වල දී ඔහු අහස්යානය ඉහළට නංවන්නේ සතුරු යානා දකින අටියෙනි... ඩෙග්ටෙරෙන්කෝ... අහස්යානාව... නියමු සගයෝ...

මෙවැනි හැඟීම් නිසා ඔහුට අමුතු ශක්තියක් දැනිණි. තම ඉගටියේ එල්ලා තිබුණු කිණිස්ස ගෙන පුනීලයක් වැනි බෝම්බ කුහරය වටා වැසී ඇති හිම කැට සහිත අයිස් තට්ටුව අතරින් පතර හාරා කුඩා වළවල් සෑදී ය. අයිස් තට්ටුවට යටින් ඇති ශීතල වැලි කැට ඇඟිලිවලින් සූරා දැම්මේ ය. ගත දුබල නිසා මෙය කිරීම අසීරු විය. ඔහුගේ ඇඟිලි තුවාල වී ලේ ගලන්නට විය. පඩි පෙළකට මඳක් සමාන මේ වළවල්වලට අත් හා දණහිස් තබා ගනිමින් ඔහු දණගාමින් ඉහළ නැග්ගේ ය. කුහරයේ පළල් කට ළඟට ම බඩගාමින් ආ අලෙක්සේයි ඉන් පිටවීමට තරම් ළං විය. අවාසනාවකි, ඔහුගේ පය ලිස්සා ගියෙන් නැවත පතුලට ඇද වැටිණි. මුහුණ ද අත්පා ද තුවාල විය. එහෙත්, අහස්යානාවේ හඬ ඔහු දෙකන් තුළ තවම පවතී. පළමුව හෑරූ වළවල් නැවත පිරික්සා බැලූ හෙතෙම ඒවා ගැඹුරට හාරන්නට විය. අත් පා ලිස්සා නොයන සේ පඩිවල ගැට්ට තියුණු කළේ ය. මෙසේ කළ පසු කෙමෙන් බෙලහීන වී යමින් සිටි ඔහු නැවත සුපරීක්ෂාකාරී ලෙස ඉහළට දණ ගාන්නට විය.

පුනීලයක් වැනි ඒ බෝම්බ කුහරයෙන් පිටතට දණගාමින් ගිය අලෙක්සේයි බෙලහීන වූයේ, මහ පොළොව මත වැතිර ගත්තේ ය. ඉන් පසු ඔහු අහස්යානය ගිය දෙසට දණ ගාන්නට විය. දැන් ඉර මුදුන් වී ඇත. ඉකුත් රැයෙහි දී අයිස් බවට පෙරළුණු දිය හිරු රැස් නිසා දීප්තිමත් ව බැබළේ.

## 12

දණ ගා යාම පවා දැන් අපහසු ය. දෑත්වලට සිරුරේ බර උසුලා ගැනීමට බැරි වූයෙන්, ඒවා වෙව්ලන්නට විය. දිය වී යන හිම තට්ටුවලට ඔහුගේ මුහුණ කීප වරක් ම හැප්පිණි. පෘථිවියේ ගුරුත්වාකර්ෂණ බලය කීප ගුණයකින්

වැඩි වූ සැටියකි. එම බලයට එදිරි ව නැගී සිටීමට බැරි ය. පැය භාගයක්වත් විවේක ගැනීමට ඔහුට සිතිණි. එහෙත්, අද හැකිතරම් දුර බඩගාමින් හෝ යා යුතු ය. ඔහු බඩගාන්නට විය. දැන් ඔහුට බඩගින්න, විඩාව නොදැනේ. කිසිවක් නොපෙනේ. කාලතුවක්කුවල වෙඩි හඬ හැර අන් කිසි හඬක් නොඇසේ.

දෑතේ ශක්තිය සිඳී ගිය පසු ඔහු වැළමිටිවලින් යන්නට පටන් ගත්තේ ය. එය පහසු නොවී ය. ඉන් පසු වැළමිටි වාරුවෙන් පැත්තෙන් පැත්තට පෙරළෙමින් ම නැගෙනහිර දෙසට ඇදෙන්නට විය. මෙය පහසු විය. එමෙන් ම එතරම් ශක්තියක් ද අවශ්‍ය නැත. එහෙත්, මේ ගමන් විලාසය නිසා ඔහුට ක්ලාන්ත ගතියක් දැනෙන්නට විය. වරින් වර සිහිසන් නැතිවිය. වනයත්, ගස් හා අහසත් කරකැවෙන සැටියක් දැනුණු විට ඔහු වාඩි වී ප්‍රකෘති තත්ත්වය එන තුරු විඩා හැරියේ ය.

සෝවියට් කඳවුරට යාමට තමාට හැකිවේ ද යන්න ගැන නොසිතූ අලෙක්සේයි පණ ඇති තාක් නැගෙනහිරට යාමට දැඩි ලෙස තීරණය කර ගත්තේ ය. බෙලහීනතාව ඇති ඔහුට සිහිසන් නැති වූ විට පවා ඔහුගේ අත් පා සහ ඉන්ද්‍රියයන් ඉබේ ක්‍රියා කරන යන්ත්‍රයක් මෙන්, කාලතුවයක්කු හඬ නැඟෙන නැගෙනහිර දෙසට පෙරළෙන්නට විය.

එදින රෑ කොහේ ගත කළේ ද, පසුදා උදෑසන බඩ ගා ගියේ ද යන්න ගැන අලෙක්සේයිට මතක නැත. ඔහු දැන් අඩ සිහියෙන් පසු වෙයි. මඟ ඉදිරියේ ඇති බාධක පමණක් ඔහුට පෙනේ. තමා ඉදිරියේ ඇති රන්වන් පයින් කඳක් ද ඉන් වහනය වන මී පැණි පාටට හුරු ලාටු වගයක් ද, ගස් කොටන් කීපයක් ද වයස මේ යැයි පෙන්වන කවයන් සහිත ගස් කොටයක් ද ඔහු ඉදිරියේ ඇත.

අමුතු ශබ්දයක් නිසා ඔහුට ප්‍රකෘති සිහිය ලැබිණි. වාඩි වුණු හෙතෙම වටපිට බලන්නට විය. එළි කළ කැලෑ බිමකට තමා පැමිණ සිටින බව අලේකසේයිට දැනිණි. ගස් කපා බිම හෙළා ඇත. සමහර ගස්වල අතු කපා ශුද්ධ කොට ඇති අතර, සමහර ගස් මුලින් කපා ලූ සැටියේ ම ඇත.

තමා වෙත මහ අවදානමක් එල්ල වී ඇති බව අලෙක්සේයිට වැටහිණි. ඔහු ඉතා ඕනෑකමින් වනය පිරික්සන්නට විය. යම් කිසි මිනිසුන් කොටසක්, මේ වනය කපා ඇති බව ඔහු නිගමනය කළේ ය. මේ ගස් ආරක්ෂක පවුරු සහ නිරීක්ෂණ ස්ථාන සෑදීම සඳහා හිට්ලර්ගේ භටයෝ පාවිච්චියට ගනිත් ද? එසේ නම් වහා ම මෙතැනින් පිටවිය යුතු ය. ගස් කපන්නන් දුන් දුන් එනු ඇත. එහෙත්, ඔහුගේ සිරුර ගල් ගැසී ඇත. අත පය සොලවන්නට පවා නොහැකි ය. බඩ ගා යාමට පවා ශක්තියක් නැත.

දිගට ම බඩගාන්න ද? තමා වනයේ ගත කළ ජීවිතය නිසා ඉවක් දියුණු කර ගත් අලෙක්සේයි සුපරීක්ෂාකාරී විය. යම් කිසිවෙක් ඔහු දෙස බලා සිටින බව ඔහු නොදුටුව ද, ඔහුට ඉවෙන් මෙන් දැනේ. තමා නිරීක්ෂණයට භාජන වී ඇති බව අලෙක්සේයිගේ හැම මාංශ පේශියකට ම දැනේ. ගසක අත්තක් කැඩිණි. සුළං පහරට ළපටි පයින් ගස්වල අතු සෙලවිණි. එහෙත්, සමහර අතු අනික් අතු මෙන් නොව ඊට විරුද්ධ පැත්තට, එනම් අස්වාභාවික ලෙස සෙලවෙන බව අලෙක්සේයි දුටුවේ ය. පඳුරුවලට මුවා වී සිටින යම් කිසිවෙකු මිනිස් හඬකින් කොඳුරන බව ඔහුට ඇසිණි.

නියමු කබායෙන් වහා ම හෙතෙම පිස්තෝලය අතට ගත්තේ ය. යකඩ මල කා තිබුණු පිස්තෝලයේ කොකා මානා ගැනීමට ඔහුට දැතින් ම එය ඔබන්නට සිදු විය. 'ක්ලික්' යන හඬින් පිස්තෝලයේ කොකා මානා ගනිත් ම, පඳුරුවල සැඟ ව සිටි කිසිවෙකුගේ බිය වූ හඬක් ඇසිණි. ගස්වල මුදුන් සෙලවෙන්නට විය. නැවත පෙර මෙන් ම නිසලතාවකි.

"මිනිහෙක්ද? සතෙක්ද?" යන පැනය අලෙක්සේයි තමාගෙන් ම ඇසී ය. එවිට ම වාගේ පඳුරු අස්සේ සිටි යමෙක් "මිනිහෙක්ද?" යන ප්‍රශ්නය අසන හඬ අලෙක්සේයිට ඇසිණි. කිසිවෙක් රුසියන් බසින් කතා කරන හඬ ඔහුට ඇසුණේද? නැතිනම් එය ඔහුගේ සිහි විකල වීමක්ද? ඔහුට රුසියන් බසින් කතා කරනවා ඇසුණු නිසා ඔහු ප්‍රීතියෙන් උමතු විය. ඔහු දෙස සැඟවී බලා

සිටින්නේ මිතුරෙක් ද, හතුරෙක් ද යන්න සොයා නොබැලූ අලෙක්සේයි ජයග්‍රාහී හඬක් නඟා දෙපා බිම ගසා නැඟිට සිටියේ ය. හඬ ඇසුණු දෙසට ගමන් කරත් ම ඔහු සිහිසන් නැති ව ඇද වැටුණේ ය. ඔහුගේ පිස්තෝලය ද බිම වැටිණි...

## 13

නැඟිට සිටීමට තැත් කිරීම නිසා අලෙක්සේයි සිහි නැතිව ගියෙන්, ඔහු නැවත බිම ඇද වැටුණේ ය. එහෙත්, තමා අවදානමකට මුහුණ පා සිටින බව දන්නා නිසා දෝ අලෙක්සේයිට නැවත ප්‍රකෘති සිහිය ලැබිණි.

දෑත බිම ගසා හිස ඔසවා ගත් හෙතෙම පිස්තෝලය අතට ගෙන සැඟවී සිටින අයට නොපෙනෙන සේ එය තබාගෙන වටපිට බැලී ය. අවදානම නිසා පැහැදිලි ලෙස අවට තත්ත්වය අවබෝධ කර ගැනීමට ඔහුට හැකි විය. පැසිස්ට් ජර්මනුන් විසින් කැලෑ හෙළි කිරීමට යොදවන ලද රුසියන් යුද්ධ සිරකරුවන් විය හැකි ද? ජර්මන් සේනාවලට මැදි වූ සෝවියට් භටයන්, ඔහු මෙන් යුද පෙරමුණට යාමට තැත් කිරීමක් ද? සමහර විට අවට ගමක ගොවියකු විය හැකි ද? "මිනිහෙක්!" යැයි රුසියන් බසින් යමකු කියන සැටි ඔහුට පැහැදිලි ලෙස ම ඇසිණි.

එවිට ම වාගේ පඳුරු අස්සෙන් ළමා කටහඬක් ප්‍රශ්න කළේ ය.

"ඒයි උඹ කවුද? ජර්මන් කාරයෙක්ද? ජර්මන් කතා කරනවද?"

ඒ පුදුම වචන නිසා අලෙක්සේයි වඩාත් සුපරීක්ෂාකාරී විය. ළමයෙක් රුසියන් බසින් කතා කරන බව දැන් ඔහුට පැහැදිලි ය.

"උඹ මොනවද මෙතන කරන්නෙ?" තව ළමා හඬක් ප්‍රශ්න කළේ ය.

"මම රුසියන්කාරයෙක්. රුසියන් අහස්යානා නියමුවෙක්. ජර්මන්නු මගේ අහස්යානාවට වෙඩි තැබුවා."

ළමයි ඔහු විශ්වාස නොකළහ. යුද්ධය ඔවුන්ට සුපරීක්ෂාකාරී වීමට උගන්වා ඇත. ඇරත් දැන් අලෙක්සේයිට



බිය වීමට ද හේතුවක් නැත. තමාගේ අතපය හෝ සිරුර හෝ සෙලවීමට තමාට බැරි බව අලෙක්සේයිට වැටහිණි. මීට පෙර කිසි ම දවසක ඔහු මෙතරම් දුර්වල නොවී ය. ආත්මාරක්ෂාව සඳහා සටන් කිරීමේ හැකියාවක් ද ඔහුට දැන් නැත. ඔහුගේ කළු පැහැති ලොකු ඇස්වලින් කඳුළු කැට කඩා හැලිණි.

"බලපන්! එයා අඬනවා!" යැයි පඳුරුවලට මුවා වී සිටි ළමයෙක් කීවේ ය. "ඒයි, මොකද තමුසෙ අඬන්නෙ?"

"මම රුසියන් අහස් නියමුවෙක්. හතුරෙක් නොවේ..."

"මොන අහස් තොටුපළේ ඉඳලද?"

"උඹලා කවුද?"

"තමුසෙට මොටද ඒක? අහන ප්‍රශ්නෙට පිළිතුරු දෙනවා"

"මෙන්චාලොව්ස්ක් අහස් තොටුපළේ ඉඳලා... මට උදව් වෙයල්ලා. එළියට වරෙල්ලා... මොන කෙහෙල්මලකටද..."

පඳුරු සෙලවිණි. ඔවුන් කතා කරන සැටි අලෙක්සේයිට ඇසේ.

"උඹට ඇහුණද? එයා මොන්චාලොව්ස්ක් අහස් තොටුපළේ කෙනෙක් ලු. සමහර විට එයා ඇත්ත කියනව වෙන්ට පුළුවනි. බලපන්, එයා අඬනවා..." ඉන් පසු එකෙක් කෑ ගසා මෙසේ කීය. "අහස් නියමුවා, අතේ තියන පිස්තෝලය විසි කරපන්! නැත්නම් අපි එළියට එන්නේ නැහැ පැනලා දුවනවා.!"

අලෙක්සේයි පිස්තෝලය විසි කළේ ය. එවිට ම පඳුරු දෙබෑ කරගෙන කොල්ලෝ දෙදෙනෙක් එළියට ආහ. අනතුරක සංඥාවක් දුටු විගස පියාඹා යාමට සූදානම් කුරුල්ලෝ දෙදෙනෙකුට සමාන මොවුහු අතින් අත අල්ලා ගෙන නියමුවා වෙත ආහ.

තාත්තාගේ විශාල හිම සපත්තු දෙකක් පය ලා සිටි වැඩිමහලු කොල්ලා ප්‍රවේසමෙන් අලෙක්සේයි ළඟට විත් ඔහු අසල තිබූ පිස්තෝලය ඈතට විසි කළේ ය.

"තමුසෙ අහස් නියමුවෙක්ද? බලපත්‍රයක් තියෙනවද? පෙන්වනවා!"

යට කමිසය තුළ තිබූ අහස් නියමු බලපත්‍රය ගෙන පෙන්වීමට ඔහුට සිදුවිය. තරුව සහිත නිලධාරි බලපත්‍රය දුටු ළමයි දෙදෙනා විස්මයට පත් වූහ. ජර්මන් හමුදාව තම පෙදෙස අල්ලා ගැනීම නිසා නැති ව ගිය ළමා කාලය තමන්ට ආදරය කරන සෝවියට් සෙබළෙකු තමන් ඉදිරියේ පෙනී සිටින බැවින් නැවත මතු වුණාක් මෙනි.

"මාමේ කොහොමද මෙතරම් කෙට්ටු වුණේ?"

"මෙතන සටන්වල දී පැසිස්ට් කාරයන්ව පරාද කළා. අපේ හමුදාව උන්ට හොඳට බැටේ දුන්නා. උන් පැනලා දිව්වා. හරිම භයානක සටනක් කෙරුණා..."

"උන් බයවෙලා පැනල දිව්වා. එකෙක් නාන බාල්දියක් අස්සයෙකුගේ කරේ බැඳලා බාල්දියේ හැංගිලා අශ්වයාව එළවන්ට වුණා. තුවාල ලබාපු හතුරෝ දෙන්නෙක් අස්සයෙකුව අල්ලා ගත්තා. එකෙක් උගෙ වල්ගෙ එල්ලිලා. අනිකා උගේ පිටේ නැඟිලා හරියට මුදලි කෙනෙක් වගේ.

මාමා දැක්කා නම් ඒ නාටකය... මාමාට වෙඩි තිබ්බෙ කොහොමද?"

කතාවෙන් පසු දෙදෙනා ක්‍රියා කරන්නට වූහ. මෙතැන සිට කිලෝමීටර් පහක් ඈත ඔවුන් පදිංචි වී සිටින බව ඔවුහු කීහ. "ජර්මන් දූව දඬු කඳවුරෙන්" ලී කොටන් ගෙන යාමට ළමයින් ගෙනා හිම යානය කුඩා බැවින් අලෙක්සේයිට එයට ගොඩ විය නොහැකි ය. ඇරත්, හිම ගොඩැලි සහ හිම කඳු උඩින් අලෙක්සේයි ඇදගෙන යාමට තරම් සවි බලයක් ඔවුන්ට නැත. වැඩිමහලු සොහොයුරු සිර්යෝන්කා තම මල්ලීට පේද්යාට කතා කොට, වහා ම ගමට දුවගොස් කරුණු කියා ආධාරයට මිනිසුන් කැඳවාගෙන එන ලෙස කීවේ ය. තමා නියමුවා ජර්මනුන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා නවතින බව මල්ලීට කීව ද, සිර්යෝන්කා සිතින් නියමුවා සැක කළේ ය. " විශ්වාස කරන්ට බැහැ. පැසිස්ට්කාරයෝ මැරුණා වගේ ඉඳලා අපව රවටාවි. උන්ට සෝවියට් බලපත්‍ර වුණත් හොයා ගන්ට පුළුවනි." යැයි හේ තමාට ම කියා ගත්තේ ය. ක්‍රමයෙන් සැක පහ ව ගියෙන්, සිර්යෝන්කා නැවත කතා කරන්නට විය.

පයින් ගස් අත්තක් මත වැතිර හුන් අලෙක්සේයි අඩ නින්දෙන් පසු වෙයි. සිර්යෝන්කාගේ දෙඩවීම ඔහුට ඇසෙන නෑසෙන තරම් ය. වචනයක් හෝ දෙකක් හෝ ඔහුට පැහැදිලි ව ඇසෙයි. තම මවුබසින් කරන මේ දෙඩවීම අලෙක්සේයිට අමුතු සතුටක් හා සැපතක් ගෙන දුන්නේ ය. ප්ලව්නි ගමේ වැසියන්ට මුහුණ පාන්නට වූ ඛේදවාචකය ගැන ඔහුට දැනගන්නට ලැබුණේ පසු ව ය.

කැලෑ හා වැව්වලින් පිරි මේ පෙදෙසට ජර්මනුන් පැමිණියේ ඔක්තෝබර් මාසයේ දී ය. ප්ලව්නි ගම් අවට පෙදෙසේ සටන් නොකෙරිණි. කිලෝමීටර තිහකට පමණ ඈතින් ඇති වූ සටනක දී සෝවියට් සේනාවක් පරාජය කළ පැසිස්ට් ජර්මන් හමුදාවක් ප්ලව්නි අවට ආරක්ෂක පවුරු බිඳ ඉදිරියට ගමන් ගත්තේ ය. ප්ලව්නි ගම්මානය මහ මඟින් ඈත වනයක් හා වැවක් අසල පිහිටි නිසා එය සොයා ගැනීම අපහසු ය. පැසිස්ට්වරු වයඹ හා බටහිර යුද පෙරමුණු අතර සම්බන්ධය නැති කරලීම පිණිස

බොලොගොයෙ මහ දුම්රියපොළ අල්ලා ගැනීම සඳහා ඉක්මන් වූහ.

ප්ලව්නිහි ගොවීහු තමන් යුද්ධයෙන් ගැලවීනැයි සිතා සතුටු වෙන්නට පටන් ගත්හ. ජර්මනුන්ගේ නියමය පරිදි සමූහ ගොවිපළේ සභාපති ගම්මුලාදෑනී ධුරයට පත් කරගෙන පෙර සේම සාමූහික ව ගොවිතැන් කළහ. පැසිස්ට් මෘගයන් තමා විනාශ නොකරතියි ද තමන්ට කරදරයක් නැතිව ජීවිකාව කරගෙන යා හැකියැයි ද ඔවුහු සිතූහ. අළු පැහැති යුද ඇඳුම් ඇඳ සිටි ජර්මනුන් ගිය පසු කළු පාට ඇඳුමින් හා ඉස්කබල සහ මිනී ඇටකටු දෙකක් සහිත මරණයේ සලකුණ සහිත හිස් වැසුමින් සැරසුණු ජර්මන්නු පැමිණියහ. ජර්මනියේ යුද කඳවුරුවල නිත්‍ය සේවයට යාමට කැමැති ස්වේච්ඡා සේවකයන් පහළොස් දෙනෙකු පැය 24 ක් තුළ දී ගම්මුන් ලබා දිය යුතු යැයි මේ මාරයෝ අණ කළහ. නොපැමිණිය හොත් දඬුවම් කරනු ඇත. නියමිත වේලාව ඉකුත් වුණ ද, කිසිවකු ආවේ නැත. මේ වන විට සෑහෙන අත්දැකීම් ලබා ඇති පැසිස්ට් මාරයෝ තම අණට යටත් වෙතියි නොසිතූහ. ගම්මුන්ට පාඩමක් උගැන්වීම පිණිස ඔවුහු සමූහ ගොවිපළේ සභාපති හෙවත් ගම්මුලාදෑනියා ද ළමා පාසලේ ආචාරිනී වන මහලු වෙරෝනිකා ග්‍රිගෝරියෙව්නා ද අතට අසුවුණු තවත් ගම්මුන් දස දෙනෙකු ද සමූහ ගොවිපළේ ප්‍රධාන ගොඩනැඟිල්ල ඉදිරිපිටට ගෙන ගොස් මරා දැමූහ. සිරුරු වළ ලෑමට තහනම් කළ පැසිස්ට්වරු තව පැය විසි හතරකින් ස්වේච්ඡා සේවකයන් නොපැමිණිය හොත් නැවත වරක් එලෙස ම මරා දමන බවට මෙය පාඩමක් බව ද කීහ.

පසුදා උදෑසන කිසිවෙක් නොපැමිණියහ. ඇස්. ඇස්. මාර හමුදාවේ සොන්ඩර් කොමාන්ඩ්[1] නිලධාරියා ප්‍රමුඛ සේනාංකය ගමට ඇතුළු වන විට එහි බාල, මහලු කිසිවෙක් නොසිටියහ. අවුරුදු කීපයක් තිස්සේ තමන් හරි හම්බ කරගත් හැම දෙයක් ම ද, ගෙවල් දොරවල් ද බඩු මුට්ටු හා හරකා බාන ද හැම දෙයක් ම අතහැර දමා ගම්මු රාත්‍රි අන්ධකාරයට මුවා වෙමින් අතුරුදන් වූහ. කිලෝමීටර දහඅටක් ඈත මහ වනය මැද මිටියාවතක

1 ජර්මන් යුද හමුදාවේ නිලයකි.

ඔවුහු පදිංචි වූහ. පිරිමි පාටිසාන් යුද්ධ හමුදාවට බැඳීමට වනගත වූහ. ගැහැනු සහ ළමා ළපැටියෝ වසන්තය වන තුරු මෙහි නැවතුණහ.

කැරලි ගැසූ ගම පැසිස්ට්වරු ගිනිබත් කළහ. මෙසේ ගිනි තැබූ අනිකුත් ගම් නියම් ගම් මෙන් ම මෙය ද මළ පෙදෙසක් ලෙස නම් කළහ.

"මගේ තාත්තා සමූහ ගොවිපළේ සභාපති. පස්සෙ එයාව මුලාදෑනියා කළා" සිර්යෝන්කාගේ මේ වචන අලෙක්සේයිට ඇසෙන්නේ ඈත සිට කතා කරන්නෙකුගේ වචන මෙනි. "මගේ අයියාවත් මරා දැම්මා. පැසිස්ට් කාරයෝ අපේ ගම්වැසියන් දහසය දෙනෙකු මරා දැම්මා. මා ඒවා සේරම දැක්කා. අපට පේන්නයි උන් ඒ ගොල්ලන්ව මරා දැම්මේ. අපේ තාත්තා උන්ට සාප කළා. 'තොපිට මේ අපරාධයට වන්දි ගෙවන්න සිද්ද වේවි. තොපේ ලේ ගංගාවක් වගේ ගලා යාවි' කියලා තාත්තා කිව්වා"

"ඉතින් උඹලා කැලෑවෙම ජීවත් වෙනවා ද"යි අලෙක්සේයි සිර්යෝන්කාගෙන් ඇසුවේ අඩ නින්දෙන් මෙනි. ඔහුගේ කටහඬ පවා ඇසුණේ යන්තමිනි.

"ඔව් කැලෑවේ ජීවත් වෙනවා. වෙන මොනවා කරන්න ද? ඉතුරු වුණේ අපි තුන් දෙනයි. මායි, මල්ලියි, අම්මයි, නියූෂ්කා නංගී ලෙඩ වෙලා මළා. තවත් පුංචි මල්ලි කෙනෙක් හිටියා. එයත් මළා. අපි තුන්දෙනෙක් විතරයි ඉතුරු වුණේ. අන්න පේද්යා, සීයාව අඬගහගෙන එනව. බලන්න"

මීහයිල් සීයා නමින් හැඳින් වූ මේ පුද්ගලයා කෙට්ටු ය. උස ය, වකුටු ය. ඔහුගේ මුහුණ කරුණාවන්ත ය. දැස් ළමයෙකුගේ මෙන් පිරිසිදු ය. ලොකු ය, පැහිදිලි ය. ඔහුගේ යටි රැවුල තුනී ය. රිදී පැහැයෙන් යුක්ත ය. බැටළු ලොමින් කළ පරණ හිම කබායකින් ඔහු අලෙක්සේයි එතී ය. තැනින් තැන ඉරී ගිය එම කබායට දමා ඇති අණ්ඩ විවිධ පාටින් යුක්ත ය. මිහයීල් සීයා අලෙක්සේයි ඉතා පහසුවෙන් උස්සා හිම යානය මත තබා විස්මය පත් ළමයෙකු මෙන් මෙසේ කීවේ යඃ

"අනේ පව්! ඉලන්දාරියා හොඳටම කෙට්ටු වෙලා. ඇටකටු විතරයි. මේ යුද්දෙ නිසා වෙච්ච නස්පැත්තියක

හැටි. අනේ! අනේ!”

මේ දූන් උපන් ළදරුවෙකු මෙන් ප්‍රවේසමෙන් අලෙක්සේයිව හිම යානය මත තබා, ඔහු නොවැටෙන සේ ලණුවකින් බැඳ මොහොතක් කල්පනා කළ මිහයීල් සීයා තමා හැඳ සිටි කබාය ගලවා එය හතරට නමා අලෙක්සේයිගේ හිසට යටින් තැබී ය. පුංචි අසෙකුගේ බෙල්ලට සෑහෙන රෙදි කර පටියක් හිම යානයට බැඳ තිබිණි. එම කරපටිය තුළට හිස දමා ගත් සීයා ඉතිරි පටි දෙක කොල්ලන් අතට දී ‘දෙවියන්ගෙ පිහිටයි’ කියමින් ගමනට සූදානම් විය. තිදෙනා ම එක්ව හිම යානය අදින්නට වූහ. මොවුන්ගේ පාවලට පෑගෙන හිම හඬක් නැඟී ය.

## 14

ඊළඟ දවස් දෙක තුන තුළ දී තමා අවට සිදු වූ දේ අලෙක්සේයිට දැනුණේ සනැති, උණුසුම් මීදුමකින් වැසුණු කලෙක මෙන් නොපැහැදිලි ලෙසකිනි. වරෙක ප්‍රකෘති සිහිය ලැබූ ඔහු තවත් වරෙක උණ විකාරයෙන් දොඩවන්නට විය. සිදු වූ දේ ගැන නියම අවබෝධයක් ඔහුට ලැබුණේ දින කීපයකට පසු ව ය.

මූකළාන මැද ගම්මු ජීවත් වූහ. ඔවුන් වාසය කළේ බිම්ගෙවල්වල පියස්ස සාදා ඇත්තේ පයින් අතුවලිනි. එය ද හිමෙන් වැසී ඇති බැවින් එතන මිනිසුන් ජීවත් වෙතියි ද යන්න එකවර නොපෙනේ. බිම් ගෙවල් තුළින් නගින දුම්වලා මහ පොළොවෙන් පිට වෙන්නාක් මෙනි.

ගැහැනු, ළමයි හා මහල්ලෝ කීප දෙනෙක් පමණකි මෙහි පදිංචිකරුවෝ. මිහයීල් සීයා කැලේට කඩා වැටුණු යම් කිසි සෝවියට් අහස් නියමුවකු ගෙනෙන බව ප්‍රසිද්ධ වීම නිසා ඔහු පිළිගැනීමට ගම්මු ඉදිරියට ආහ. මහල්ලා සහ ළමයින් ඇදගෙන එන හිම යානය දුටු විගස ම ඉදිරියට දුව ගිය කාන්තාවෝ, කෑ කෝ ගසමින් දුවන කොලු කෙලි රංචුව එළවා දමා, නියමුවා අසලින් ගමන් කරමින් අඬන්නට හා වැලපෙන්නට වූහ. ඔවුහු වැරැලි හැලි ඇඳගෙන උන්හ. හැම එකියක් ම එක සමාන වයස් ඇත්තියන් මෙනි. බිම් ගෙවල්වල දුමාරය, දැලි නිසා

ඔවුන්ගේ මුහුණු කළු වෙලා ය. කාන්තිමත් ඇස් හා සුදු දත් නිසා නොවේ නම්, තරුණියන් මැහැල්ලන් අතුරෙන් වෙන්කොට හඳුනාගත නොහැකි වනු ඇත.

"අනේ ගෑනු! ගෑනු! නුඹලා මොකටද මේ වටවෙලා ඉන්නේ? මේක නාට්ටියක් ද? විජ්ජාවක් ද?" මිහයිල් සීයා රොස් වී පැවසී ය. "මෙතැනින් ඉක්මනට පලයල්ලා! දෙවියන්ගෙ නාමෙට පලයල්ලා! හරිම බැටළු රැළක්."

ස්ත්‍රීන් කතා කරන සැටි අලෙක්සේයිට ඇසිණි.

"අනේ එයා හරියට කෙට්ටු වෙලා. ඇට සැකිල්ලක් වගේ. හෙලවෙන්නවත් බැහැ. එයාට පණ තියෙනවද?"

"එයාට සිහිය නැහැ... එයාට මක්වෙලාද? අනේ බලාපල්ලා ඇටෙයි හමයි විතරයි."

පසු ව අදහස් කියා පෑම හා පුදුම වීම නැවතිණි. නියමුවාට විඳින්නට සිදු වූ දුක් ගැහැට නොදත්ත ද, එහි බියජනක බව නිසා ඔවුහු විස්මයට පත් වූහ. බිම් ගෙවල් සහිත ගමට හිම යානය ඇතුළු වත් ම, නියමුවා කාගේ ගෙදර පදිංචි කරවිය යුතු ද යන ප්‍රශ්නය වටා විවාදයක් ඇති විය.

"අපේ ගෙදර තෙතමනය හොඳ නැහැ. හොඳ වැල්ල. වියළි පොළොව. මා ළඟ භූමිතෙල් ළිපක් තියෙනවා" යැයි එකියක් කීවා ය. ඇගේ නෙත් පැහැදිලි ව දිලිසෙයි.

"ළිපක් තිබුණට ඇතැයි. උඹලගෙ ගෙදර මහ ගොඩක් ඉන්නව. ගඳ නිසාම මනුස්සය මැරිල යාවි. මිහයිල් සියේ අපේ ගෙදරට ගෙනියන්න. මගේ පුත්තු තුන්දෙනෙක් ම සෝවියට් රතු හමුදාවෙ. මා ළඟ පාන් පිටි ටිකක් ඉතිරි වෙලා තියෙනවා. මට පුළුවනි එයාට රොටි හදල දෙන්න."

"අපේ ගෙදර හොඳට ඉඩකඩ තියෙනවා. ගෙදර ඉන්නෙ දෙන්නයි. උඹ රොටී අපේ ගෙදරට ගෙනෙන්. කොහෙ වුණාම මොකෝ. මටයි ක්ස්යූහටයි පුළුවනි එයාට සාත්තු කරන්න. මා ළඟ වියළි මෑ ඇටයි, හතුයි තියෙනවා. මට පුළුවනි මාළු බැදල, සුප් හදලා දෙන්ට..."

"වළ පයයි ගොඩ පයයි. ඒ මනුස්සයට මොන සුප් ද? මිහයිල් මාමේ ඔය ලෙඩාව මට බාර දීපන්. මා ළඟ එළදෙනක් ඉන්නව. කිරි දෙන්ට පුළුවනි."

මිහයිල් ගම මැද බිම් ගෙයට, එනම් තම ගෙදරට හිම යානය දක්කාගෙන ගියේ ය.

...කුඩා බිම් ගෙයක මැස්සක් මත වැතිර සිටි සැටි අලෙක්සේයිට මතක ය. බිත්තියේ එල්ලා තිබූ ලුචීනා[1] වලින් කණාමැදිරි එළියක් ලැබේ. බිම්ගෙය තුළ දුම් ගඳකි. ගෙමැද ලී කොටයක් උඩ ජර්මන් මයින් වෙඩිල්ලක පියනක් මේසය වෙනුවට තබා ඇත. පුටු වෙනුවට ලී කොට කීපයකි. මිහයිල් සීයාගේ බාල ලේළි වාර්යා කළු ලේන්සුවකින් හිස වසාගෙන මේසය වෙත නැවී යමක් කරමින් සිටී. ඈ හැඳ සිටින්නේ මැහැල්ලකගේ ඇඳුමකි. මිහයිල් සීයාගේ හිස රිදීවන් තුනී හිසකේවලින් වැසී ඇත.

අලෙක්සේයි වැතිර සිටින මැස්ස මත පිදුරු අසුරා ඇත. ඔහු පොරවා තිබෙන්නේ හිම යානයේ දී වැසූ පරණ බැටළු ලොම් හිම කබායෙනි. ඔහුගේ ඇඟපත කකියයි. දෙපා ගිනිගත් කලෙක මෙන් දැවෙයි. එසේ වුව ද තමා ආරක්ෂා සහිත තැනකට වී නොසෙල්වී, කල්පනා නොකර, නිතර ආත්මාරක්ෂාව ගැන නොසිතා, මෙසේ වැතිර සිටීම නිසා අලෙක්සේයි සතුටු විය.

ඔහු දෑස වසා ගත්තේ ය. දොර හැරී ශීත සුළං පහරක් වැදුණු විට පමණක් ඔහු ඇර බලයි. මේසය අසල කාන්තාවකි. මේසය මත මල්ලක් තැබූ ඈ තාමත් දෑත් මල්ල මත තබාගෙන සිටින්නී ය. නැවත මල්ල ආපසු ගන්නට මෙන් ඈ එදෙස බලන්නී ය. සුසුමක් හෙළා ඈ වාර්යාට මෙසේ කීවා යː

"මේ රුළං පිටි. මම මේක පරිස්සම් කරගෙන හිටියෙ කොස්ටෙන්කාට කෑම හදල දෙන්ටයි. දැන් එයාට ඒව උවමනා නැහැ. උඹලගෙ අමුත්තාට කැඳ හදල දීපන්. මේව ළමයින්ට ගුණයි. අමුත්තාට කියාපු ආහාරය..."

එම ගෙදර හැම දෙනෙකු තුළට ම ශෝකය කා වද්දමින් ඈ පිට වී ගියා ය. තවත් ගැහැනියක් වියළි මෑ ඇට ගෙනාවා ය. එක් කතක් මේ දැන් උදුනෙන් බෑව උණු රොටි කීපයක් ගෙනාවා ය. බිම් ගෙය පුරා උණු රොටි සුවඳ වහනය විය.

සිර්යෝන්කා සහ පේද්යා ද ආහ. ගොවියකුගේ බැරෑරුම් ගතියෙන් තම හිස්වැස්ම අතට ගත් සිර්යෝන්කා "ආයුබෝවන්" යැයි කියමින් දුම්කොළ සහ ලී කුඩු පොදක්

---

1 ලුචීනා - දේවදාර ගස් කඳින් කපා ගන්නා ලී පතුරු වර්ගයකි. එය පහන් තිරයකට සමාන ය.

ඇලී ඇති සීනි කැට දෙකක් මේසය මත තැබී ය.

"අම්මා මේ තෑග්ග එව්වා. සීනි ඇඟට ගුණයි. කන්න." ඔහු නැවත සීයා වෙත හැරී වෙනත් හඬකින් කතා කළේ ය. "පරණ තැනට අපි නැවත ගියා. යකඩ භාජනයකුත්, උදලු දෙකකුත්, පොරෝ තලයකුත් සොයා ගත්තා. අපට වුවමනා වෙන හන්දා අපි ඒවා ගෙනාවා"

ඊට බොහෝ කලකට පසු තමාට ලැබුණු තෑගිවල වටිනාකම අලෙක්සේයි අවබෝධ කර ගත්තේ ය. මේ තෑගි ගෙනා ගම්මුන්ගේ පවුල්වලින් තුනෙන් කොටසක් ම පසුගිය ශීත කාලයේ දී කුසගින්න නිසා මිය ගියහ. හැම පවුලකින් ම සාමාජිකයන් එකකු හෝ දෙන්නකු හෝ මාරයාට බිලි විය. එහෙත්, ඔවුහු රෝගී නියමුවා කෙරෙහි, මහත් දයාවක් දැක්වූහ.

"අනේ, අනේ මෙහෙමත් ගෑනු. මේ ගෑනුන්ගෙ වටිනාකම මෙපමණයි කියල කියන්න බැහැ. ඇහෙනව ද අලෙක්සේයි. රුසියානු ගැහැනිය මිල නොකළ හැකි වස්තුවක්! ඇගේ හදවතට කාවදින ලෙස කතා කළොත් ඈ ඕනම උදව් උපකාරයක් කරනවා. මාරයාට බිලිවෙන්න පවා ඈ බය නැහැ. එතරම් උතුම් ජාතියක් අපේ ගෑනු ජාතිය. ආ! එහෙම නේද" යි මිහයිල් සීයා ඔහුගෙන් ඇසුවේ කාන්තාවන් ගෙනා තෑගි භාර ගනිමිනි. සීයා නැවතත් යම් කිසි වැඩක් පටන් ගත්තේ ය. වරක ඔහු සැදෑලය ද, තවත් වරෙක කටපටිය ද නැතිනම් හිම සපත්තු අලුත් වැඩියා කළේ ය. "වැඩ කරනකොට මේ අපේ අම්මණ්ඩිල අපිට දෙවෙනි නෑ වැඩ කරනව. පිරිමි අපිට උන්ගෙන් පාඩම් ගන්ට පුළුවනි. ඒ වුණාට උන්ගේ කට තමා කට. උන්ගෙ කටවල් හන්දා මට ජීවිතෙත් එපා වෙලා. මගේ අනීස්යා මළාට පස්සෙ මා හිතුවා දන් ඉතින් දෙවියන්ගෙ පිහිටෙන් නිවීහැනේ ඉන්ට පුළුවනියි කියල. ඔය නපුරු සිතුවිලි නිසා දෙවියො මට දඬුවම් කරල. යුද්ධ හමුදාවට සුදුසුකම් නැති පිරිමි පාටිසාන් හමුදාවට බැඳිල සටන් කරනව. මගේ පව් ගෙවන්නට මම ගෑනුන්ගෙ නායකකම බාරගත්ත. බැටළු රැළකට මැදිවෙච්ච එළුවෙක් වගේ. හරිම පාපයක්!"

වනගත මේ උමං ගමේ දුටු බොහෝ දේ නිසා අලෙක්සේයි මවිත විය. පැසිස්ට්වරු ප්ලව්නී ගමට



ගිනි තබා එහි ගෙවල් දොරවල්, බඩුමුට්ටු, හරකා බාන, ගොවීන්ගේ ඇඳුම් පැලඳුම්, හැළි වළන්, පිඟන් කෝප්ප, කැති පොරෝ, ගෙවිතැන් උපකරණ ඇතුළු පරම්පරා ගණනක් තිස්සේ ඔවුන් හරි හම්බ කරගත් හැම දෙයක් ම විනාශ කළහ. එතැන් සිට මේ වනගත උමං ගමට ආ පසු ද, කටුක දුක්විඳින ගම්මු පැසිස්ට් සතුරාට අසුවේය යන බියෙන් නිතර පසුවෙති. ඔවුහු කුසගින්නේ සිටිය ද සමූහ ගොවි ක්‍රමය විනාශ වීමට ඉඩ නොතැබූහ. ඔවුන් බිම් ගෙවල් හැරුවේ ද සාමූහිකව ය. ඒවායේ පදිංචි වූයේ හිතු මතයට නොව, සමූහ ගොවිපළේ ශ්‍රම කණ්ඩායම් අනුව ය. මිහයීල් සීයාගේ බෑනා පැසිස්ට්වරුන් විසින් මරනු ලැබූ පසු, ඔහු සමූහ ගොවිපළේ සභාපති ධුරය

භාර ගත්තේ ය. වනය තුළ ද ඔහු සමූහ ගොවිපළේ නීති රීති අකුරට ම ක්‍රියාවේ යෙදවී ය. දැන් මිහයීල් සීයාගේ නායකත්වයෙන් මේ ගැහැනු මූකළාතේ නැවුම් බිමක් සොයාගෙන වසන්තයේ දී ගොවිතැන් කිරීමට සූදානම් වෙති.

ගම හැර පණ බේරාගෙන පලා යන විට ගෙනා සියලු ධාන්‍ය හා ආහාර පොදු ගබඩාවකට භාර දුන්නේ කුසගින්න පවා නොතකමිනි. ජර්මනුන්ගෙන් බේරා ගත් එළදෙනුන්ගේ වසුපැටවුන් රැකීම සඳහා විශේෂ පරිශ්‍රමයක් දැරීය. මරණය පවා නොතකමින් ජර්මනුන් ගිනි තැබූ ගමට ගිය කොල්ලෝ අළු ගොඩවල් භාරා අවුස්සා බලා ගින්නට හසුව නිල් පැහැ ගෙන තිබූ යකඩ නගුලක් ගෙනැවිත් ලී මිටි දෙකක් සවිකොට පාවිච්චියට ගත්හ. කාන්තා නඩ සංවිධානය වී මුළු ගමට ම සෑහෙන සේ මාළු ඇල්ලූහ. ශීත සමයේ දී මෙය ඔවුන්ගේ ආහාරයේ වැදගත් කොටසක් විය.

සමූහ ගොවිපළේ සමහර ගැහැනු තම බිම් ගෙට වැදී කිසියම් ප්‍රශ්නයක් ගැන කෑ කෝ ගසන විට, මිහයීල් සීයා දෙකන් වසා ගනී. සමහර විට සීයා තම ගොරෝසු හඬින් බැණ වදී. එසේ වුව ද, ඔහු කාන්තාවන් අගය කළේ ය. අලෙක්සේයි නිහඬ ව අසා සිටින සැටි දකින සීයා තම ‘ස්ත්‍රී වර්ගයා’ අහස උසට වැනුවේ ය.

"ඔන්න බලපන් අලෙක්සේයි! මගේ ආදරණීය කොල්ලො, වුණ දෙයක හැටි. ගැහැනිය නිතර ම යම් කිසි දෙයක් බදා ගන්නව. මගේ කීම වැරදිද? මොකද ඈ එහෙම කරන්නෙ? ඈ කෑදර හන්දද? නැහැ. කොහෙත්ම කෑදර නැහැ. ඈ එහෙම කරන්නෙ ඒ දේ ඈට වටිනා නිසා. ඈ ළමයින්ට කවයි, පොවයි. පවුලේ මුළු බරම ඈ කරපිට. උඹට පේනව නෙවද අපි ජීවත්වෙන හැටි. හැම පාන් කෑල්ලක් ම ගණන් කරනවා. ඇත්ත වශයෙන් ම අපි බඩගින්නෙ. ඔය සිද්දිය වුණේ ජනවාරි මාසෙදි. පාටිසාන් සේනාංකයක් මෙහෙ ආවා. අපේ පුතුන් නොවේ. අපේ පුත්තු ඔලෙනින් අසල සටන් කරනවා. මා කියන්නෙ අපට ලැබුණු ආරංචි අනුව. අපේ මේ උමං ගමට ආව පාටිසාන් හටයො දුම්රියපොළට අයත් උදව්විය. ඒ ගොල්ල කීව බඩගින්නෙ මැරෙනව, ආහාර

ටිකක් හොයල දෙන්ටයි කියල. පහුවදා අපේ මේ ගැනු පාටිසාන් භටයන්ගෙ මලු ආහාරවලින් පිරෙව්වා. තමන්ගෙ ළමයින් මන්දපෝෂණයෙන් පෙළෙනව. උන්ගෙ අත් පා ඉදිමිල. හාමතේ වැටිල ඉන්නව. ඒ වුණාට මේ ගැනු පාටිසන්වරුන්ට තමන්ගෙ අවසාන බත් පත පවා දුන්නා. මම ලොකු යුද්ධ සෙනෙවියෙක් නම්, ජර්මනුන්ව එළවා දැම්මට පස්සෙ අපේ ඉතාම හොඳ හමුදා රැස්කරල රුසියානු කාන්තාවට ආචාර පෙළපාළියක් පවත්වනව. ඔන්න මම කරන දේ!...”

## 15

අලෙක්සේයි තම ගෙදර නවාතැන් ගෙන දවස් තුනක් ගත වූ පසුදා මිහයීල් සීයා තීරණාත්මක ලෙස මෙසේ පැවසී යඃ

“අලෙක්සේයි උඹට නාන්ට වතුර උණු කරනව. හීතලට අහු වෙච්ච උඹේ ඇටකටු හොඳට උණුසුම් වේවි. උඹට හොඳ සනීපයක් ලැබේවි. කොහොමද උඹේ කල්පනාව. මගෙ අදහස හරිද?”

නෑම සඳහා ඔහු වුවමනා දේ පිළියෙල කරන්නට විය. ළිපට දර දමා ගිනි පත්තු කළේ ය. ගිනිමැලය කොතරම් දැඩි වී ද යත්, ළිප් ගල් පුපුරන්නට විය. මේ බිම් ගෙයට පිටතින් තවත් තැනක ගිනිගොඩක් ගසා විශාල ගලක් එම ගින්නට දැම්මේ ය. වාර්යා පරණ ලී පීප්පයකට වතුර පිරෙව්වා ය. රන් පැහැති පිදුරු බිම එළුවේ ය. ඉන් පසු උඩ කබාය ගලවා දැමූ සීයා යම් කිසි ක්ෂාර වගයක් වතුරට දිය කළේ ය. ගසක පට්ටාවලින් සෑදූ ‘මූදු හත්තක්’ ඇඟ ඇතිල්ලීම සඳහා පිළියෙල කළේ ය. බිම් ගෙය තුළ උණුසුම අධික වී වහලේ හිම දිය බින්දු බවට හැරිණි. සීයා පිටතට දුව ගොස් ගිනිමැලයට දමා තිබුණු විශාල ගල් කැටය උදලු තලයක තබාගෙන බිම්ගෙට ගෙනැවිත් එය වතුර පිරි පීප්පයට දැම්මේ ය. ගෙය පුරාම වාෂ්ප වලාවලින් පිරිණි. පසු ව මේවා කුඩා කැබැලිවලට කැඩී ගියාක් මෙන් තැනින් තැන කුඩා වලා ඇති විය. දැන් කිසිවක් කිසිවකුට නොපෙනේ. එහෙත්, අවිද්‍යමාන

අතක් තමාගේ ඇඳුම් ගලවන බව අලෙක්සේයිට දැනෙයි.

වාර්යා තම මාමණ්ඩියට උදව් වුණා ය. උෂ්ණය අධික නිසා ඇට තම කබාය සහ හිස බැඳි ලේන්සුව ගලවා දැමීමට සිදු විය. මෙතෙක් නොදුටු ගෙතූ කෙස් වැටිය උරහිස හරහා එල්ලා වැටිණි. මෙතරම් ලස්සන කෙස්වැටියක් ඇය සතු බව හිස බැඳ තිබූ ලේන්සුව නිසා සිතා ගැනීමට පවා අපහසු විය. මෙහොතකට පෙර තාපසියක් මෙන් පෙනී සිටි ඈ දැන් රූමත් තරුණියකි. මෙතෙක් ඇය දෙස වුවමනාවකින් නොබැලූ අලෙක්සේයි දැන් ඈ ඉදිරියේ නිරුවතින් පෙනී සිටීම ගැන ලජ්ජා විය.

"අලෙක්සේයි ලැජ්ජා වන්නට එපා. හිතට ධෛර්යය ගනින්. වාර්යා දැන් ඉස්පිරිතාලෙක හෙදියක් වගේ. එයා තුවාල ලබාපු සෙබළකුට සාත්තු කරනවා. ඕකත් ලජ්ජා වෙන්න වැඩක් ද? වාර්යා ඔයාව අල්ලා ගනින්, මේ කමිස හොඳටම දිරලා නෙව. කෑලි ගැලවෙනවා." යැයි මිහයිල් සීයා කීවේ ය.

තරුණ වාර්යා නෙත් විදහා ගනිමින් බියපත් විලාසයක් පාන සැටි අලෙක්සේයි දිටී ය. වාෂ්පවලින් පිරි පටලය තුළින් පළමුවරට ඔහු තම දේහය දුටුවේ ය. එය හමින් වැසුණු කටු ගොඩකි. කෝටු වැනි කකුල් ය. දණහිස් පන්දු මෙන් ගෝලාකාර ය. ශ්‍රෝණි පෙදෙස වළ ගැසිලා ය. බඩත් පිටත් එකට ඇලුණාක් මෙනි. පපුවේ ඉළ ඇට නෙරා ගොසිනි. රන් පැහැයෙන් යුතු පිදුරු පැදුර මත දුඹුරු පාට හමින් වැසුණු මේ පණ ඇති ඇටසැකිල්ල තබා ඇත.

සබන් දියර වැනි ක්ෂාරය කලතා ඇඟ අතුල්ලන හත්ත එහි ඔබා ගත් සීයා අලෙක්සේයිගේ ඇඟ එයින් අතුල්ලන්නට සැරසුණේ ය. වාෂ්ප පටලය තුළින් කෘශ ශරීරය දුටු මහල්ලා ක්‍රියා විරහිත විය. ඔහු මෙසේ කීය:

"හනේ දෙයියනේ! උඹ හරි භයානක තත්ත්වෙක ඉන්නෙ අලෙක්සේයි. ජර්මනුන්ගෙන් බේරිලා ආවා. මාරයාගෙන් බේරෙන්ට හැකි වේද...."

අලෙක්සේයිගේ පිට අල්ලා ගනිමින් ඔහු වත්තම් කරගෙන සිටි වාර්යා වෙත කඩා පැන්න මහල්ලා ඇට බැණ වැදුණේ ය. "උඹ මොකද නිර්වස්ත්‍ර මිනිහා දිහා බලාගෙන ඉන්නෙ? පච්කාරි තොල් සපා ගන්නෙ

මොකටද? ගෑනු ඔක්කොම එකයි. අලෙක්සේයි උඹ බයවෙන්න එපා පුතා! උඹව මාරයාට බිලි දෙන්න අපි ලෑස්ති නැහැ. අපි උඹට සාත්තු කරල, උඹව සුව කරනව!... උඹට සුවය ලැබේවි"

අත දරුවකු නාවන්නාක් මෙන් ප්‍රවේසමෙන් අලෙක්සේයිව නාවන්නට වූ සීයා කටු වසා ඇති ඔහුගේ හම පිරිමැද්දේ ය. ඒ මේ අත හරවමින් ඔහුගේ සිරුරට උණු වතුර වක් කොට සබන් දියරෙන් ඇඟ අතුල්ලා ඔහු පිරිසිදු කළේ ය.

වාර්යා ඔහුට නිහඬව උදව් කළා ය.

...සිහින් දිග පැදුරක් මත අලෙක්සේයි වැතිර සිටී. ඔහුගේ කය වසා ඇත්තේ අණ්ඩ දැමූ පරණ, පිරිසිදු, සිනිඳු කමිසයකිනි. එය මිහයීල් සීයාගේ ය. ඔහුට දැන් අමුතු සනීපයක් හා ශක්තියක් දැනේ. වාෂ්ප අතුරුදන් වූ පසු වාර්යා ඔහුට දුම් දමන බිල්බෙරි තේ කෝප්පයක් බොන්නට දුන්නා ය. සිර්යෝන්කා ගෙනා සීනි කැට දෙක වාර්යගේ උදව්වෙන් කුඩු කර ගත් අලෙක්සේයි සීනි කැට කීපයක් කටේ දමාගෙන තේ උගුරක් බොයි. මෙසේ තේ බී අවසන් වූ විගස ම නින්දට වැටුණු අලෙක්සේයි අනතුරට මූණ පෑ පසු පළමුවරට සිහින නොදැක සුව සේ නිදා ගත්තේ ය.

හඬ නගමින් ඇති වූ සාකච්ඡාවක් නිසා ඔහු අවදිවිය. බිම් ගෙය තුළ ඇඳිරි ය. හිරු රැස් වනයේ ගස් අතරින් යම්තමින් පෙනේ. මිහයීල් සීයා කෑගසන සැටි ඇසේ.

"ගෑනු මොළේ. වැඩක හැටි! දවස් එකොළහක් තිස්සේ ඒ මනුස්සයට හාල් ඇටයක්වත් ලැබී නැහැ. උඹ ගල් ගෙඩියක් වෙනකන් තම්බපු බිත්තර කවන්න හදනව. ඕක ගිලපු හැටියෙ ඒ අසරණයා මැරිල යාවි" දැන් ඔහු කෑ නොගසා යමක් පැහැදිලි කරන්නාක් මෙන් කතා කරයි. "එයාට දැන් ඕනෙ ගල්ගෙඩි වගේ තම්බපු බිත්තර නෙවි. වසීලිසා එයාට ඕන කුකුළු පැටව් සුප් හොද්දක්. ඔන්න එයාට කියාපු බේත. යන පණ වුණත් ඇදල ගනීවි. උඹගෙ පාටිසාන්කා කුකුළු පැටියව දීපන් එයාට සුප් හොද්දකට ආ?..."

මැහැල්ලක් තියුණු, අප්‍රසන්න, බිය වූ හඬකින් කෑ ගැසුවා ය.

"බැහැ බැහැ. දෙන්නෙ නැහැ. ඉල්ලන්ට එපා. නාකි යකා ඉල්ලන්ට එපා. ඒ ගැන මතක් කරන්නවත් එපා. මගේ පාටිසාන්කාව දෙන්න.. සුප් හොද්දට... ගම්මු ගෙනාපු කෑම ජාති මැදෑ මගුල් ගෙදරකට... මේ නාකියා හිතන දේවල්..."

දොර හැරගෙන පිටවන මැහැල්ලගේ සෙවණැල්ල පෙනේ. විවර වූ දොරින් වසන්තයේ සිසිල් සුළං බිම් ගෙය තුළට වැදිණි. අලෙක්සේයි දෑස් වසා ගනිමින් සුසුමක් හෙළී ය. මහල්ලා ඔහු ළඟට ආවේ ය.

"අලෙක්සේයි නුඹ නිදාගෙන හිටියෙ නැත්ද? නුඹට ඒ ඇහුණා වෙන්ට ඇති. එයාගෙ කතාව හන්දා නුඹ එයා පිට වරද පටවන්න එපා. උඹ හිතනවද එයා කුකුළු පැටියට කෑදරයි කියලා. අලෙක්සේයි එහෙම නෙවෙයි. ජර්මන්නු එයාගෙ පවුල එහෙම පිටින්ම විනාශ කළා! ඒ ගොල්ලන්ගේ පවුලෙ දහ දෙනෙක් හිටියා. ජර්මන්නු දැනගත්තා එයාගෙ ලොකු පුතා යුද්ද හමුදාවෙ උසස් නිලධාරියෙක් බව. පවුලෙ හැම දෙනෙක්වම එක පාරටම වෙඩි තියල මරා දැම්ම. වසිලිස්ස විතරයි බේරුණෙ. දරු මල්ලන් නැති ඔය වයසෙ නාකි අම්මණ්ඩි කෙනෙකු හැසිරෙන හැටි, හිතන හැටි නුඹට තේරෙනව ඇති. පාටිසාන්කා යන නම ඇති කුකුළු පැටිය එසේ මෙසේ එකෙක් නෙමෙයි. වසිලිස්සගෙ එකම වස්තුව ඔය කුකුළු පැටිය විතරයි. ජර්මන්නු අනික් හැම දේටම වඩා කුකුළු මස්වලට ආසා කරනවා. උන් අපේ කුකුළන් හැම දෙනෙක් ම අල්ලාගෙන ගියා. ඔය කුකුළු පැටිය විතරයි බේරුණේ. ජර්මන්කාරයා දොර ළඟට එන කොට ඔය පැටිය අට්ටාලයට නැඟලා හැංගිලා ඉන්නවා, සද්ද නොකර. තමන්ගෙ මිනිස්සු ආ හැටියෙ වත්තෙ ඇවිදිනවා. හරිම නුවණක්කාර කුකුළු පැටියෙක්. අපේ මුළු ගමටම ඉතිරි වුණේ ඔය කුකුළු පැටිය විතරයි. ඉතින් ඔය පැටියට අපි පාටිසාන්කා කියලා නම දැම්මෙ ඔය කපටි නුවණ හන්දා..."

වනයේ දී පුරුදු වූ සැටියෙන් ම අලෙක්සේයි මෙරේස්යෙව් ඇස් හැර ගෙන නිදා වැටෙන්නට විය. ඔහුගේ නිහඬතාව නිසා කලබලයට පත් මිහයිල් සීයා යමක් කරමින් සිට ඔහු ළඟට විත් නැවත කතා කරන්නට විය.



"අලෙක්සේයි ඒ අම්මණ්ඩිට දොස් පවරන්න එපා. ඇගේ තත්ත්වය ගැන අවබෝධ කරගන්න උත්සාහ කරපන්. මගෙ හොඳ යාළුවා වනාන්තරේ මහ විශාල දේවදාර ගහක් වගේ ඈ හිටියෙ. කුණාටුවලින් ඈ ආරක්ෂා වෙලා හිටියෙ. දැන් ඈ හරියට මුල දිරාගිය ගස් කොටයක් වගෙ. ඇගේ එකම සැනසීම කුකුළු පැටිය විතරයි. නුඹ ඇයි කතා නොකරන්නෙ. නිදිද? නිදා ගනින්. නිදා ගනින්!"

අලෙක්සේයි නොනිදා නිදයි. ඔහුගේ සිරුර උණුසුම් පුලුන්වලින් පිරවූ කලෙක මෙනි. ඇටකටු රහිත එම සිරුරේ ලේ ගමන් කරන සැටි පමණක් ඔහුට දැනේ. ඇට කැඩී, පිපිරී ඇති ඔහුගේ දෙපා කකියන්නට හා දැවෙන්නට විය. එහෙත්, ඔහුට හැරීමට හෝ අත පය සෙලවීමට හෝ ශක්තියක් නොතිබිණි.

අඩ විස්මෘතියෙන් පසුවන අලෙක්සේයි බිම්ගෙය තුළ තමා ගෙවන ජීවිතය වටහා ගත්තේ තාත්වික ලෙසින් නොවේ. එකට එක නොගැළපෙන අද්භූත සිනමා කතාවක ජවනිකා වශයෙන් ඒවා ඔහු ඉදිරියේ මැවිණි.

වසන්තය එළඹිණි. උමං ගම අතිශයින් ම අමාරු කාලයකට මුහුණ පෑවේ ය. දෙවන වර ජර්මන් හමුදා පැමිණෙන්නට පෙර තමන් සතු ආහාර වැළලූ ගම්මු පසු ව ඒවා උමං ගමට ගෙන ගියහ. දැන් ඔවුහු එම ආහාරවල අවසාන කොටස කා දමති. හිම දිය වී යන්නට පටන් ගත්තේ ය. කඩිමුඩියේ සැදූ බිම්ගෙවල් වසා සිටි පියස්ස අතරින් වතුර කාන්දු වෙන්නට විය. ගෙබිත්ති හා සීලිම තෙත බරිත විය. බටහිර ඔලේනින් වනයේ සටන් කළ පාටිසාන් භටයෝ රෑ කාලයේ දී එකා දෙන්නා බැගින් උමං ගමට පැමිණි නමුදු, දැන් යුද පෙරමුණෙන් වෙන් වී ඇති නිසා එය ද නැවතිණි. ඔවුන් ගැන ආරංචියක් පවා නැත. ගෙවිලියන්ගේ කටුක ජීවිතය මේ නිසා තවත් නරක අතට හැරිණි. හිම දිය වී යයි. ගොවිතැන් වැඩ පටන් ගැනීම සහ එළවළු පාත්ති දැමීම ගැන ඔවුහු සාකච්ඡා කළහ.

මිහයිල් සීයා ගෙදර ආවේ සතුට මුසු කලබලකාරී ගතියකින් යුතු ව ය. ඔහු නිල්වන් තණ ගසක් කරගැට සහිත තම අත්ලෙහි තබා ගෙනැවිත් එය අලෙක්සේයිට පෙන්වීය.

"පේනවද? මම කුඹුරෙ ඉඳල ආවේ. දෙවියන්ගෙ පිහිටයි. හිම දිය වෙනව. හීත කාලෙ වපුරපු තිරිඟු පැළ වැවිල. හොඳට හිම වැටුණ. අපට වසන්තයට ගොවිතැන් කරගන්ට බැරි වුණත්, මේ අස්වැන්න හන්දා කෑම ටික හොයා ගන්න ඇහැකි වේවි. මම ගෑනු කට්ටියට පණිවුඩය කියන්නම්. අසරණ අම්මණ්ඩිල. උන්ගෙ සිත් සතුටු වේවි!"

බිම් ගෙය අසල පිටියෙහි රැස් වූ ගැහැනු සැලළිහිණියන් මෙන් හඬ නඟමින් කතා කරන්නට වූහ. සීයා ගෙනා තණ ගස නිසා ඔවුහු උසස් බලාපොරොත්තු ඇති කර ගත්හ. හවස ගෙදර මිහයිල් සීයා දෑත් පිරිමදිමින් කතා කරන්නට විය.

"මගේ දිග කොණ්ඩකාර ඇමති මණ්ඩලය ගත්ත තීරණය ගැන දන්නවද? තීරණය නරක නැහැ. අලෙක්සේයි එක නඩයක් එළදෙනුන් ලවා බිම සකස් කරනවා. ඒ බිම්

කැල්ල සකස් කිරීම ලෙහෙසි නැහැ. අපේ හරක් ගාලෙන් අපට බේරගන්ට පුළුවන් වුණේ එළදෙනුන් හය දෙනෙකු විතරයි. දෙවැනි නඩය උඩහ පැත්තෙ වියළි පොළොව හාරනවා. උදලු, ඉස්කෝප්පවලින් ගෙවතුවල එළවළු හිටවන්න වගේ. තුන්වැනි නඩය කන්ද උඩ. එහෙ වැලි පොළොව. එතන ඒ ගොල්ල අර්තාපල් හිටවාවි. ඒක තරමක් ලෙහෙසියි. බාලයන්වයි, වයසක අම්මණ්ඩිලවයි ඒ වැඩට යොදවනව. ඉක්මනින්ම අපට ආණ්ඩුවෙන් උදව් ලැබෙයි. ඒ නැතුවත් අපට වැඩේ හරියට කරන්න පුළුවනි. ඉඩම් අපතේ යවන්ට ඉඩ තියන්නෙ නැහැ. ඒකට අපි වග කියනව. මෙතැනින් පැසිස්ටවරුන් එළවා දැමීම නිසා අපේ භටයන්ට අපි ස්තුති කරනව. දැන් ඉතින් අපට ජීවිතය ගෙනයන්ට පුළුවනි. අපි අමාරුකම්වලට පුරුදු ජාතියක්. ඕනෑම අමාරුවකට අපට පුළුවනි බය නැතුව මූණ දෙන්ට...” යැයි සීයා කීවේ ය.

එදා රෑ අලෙක්සේයිගේ තත්ත්වය නරක අතට හැරිණි.

අඩ නින්දේ පසු වුණු අලෙක්සේයිගේ සිරුර සීයාගේ උණු පැන් ස්නානයෙන් අමුතු පණක් ලැබී ය. බෙලහීනත්වය පෙරට වඩා වැඩියෙන් දැනෙන්නට විය. වේදනාව තවත් තියුණු විය. ඔහු උණ විකාරයෙන් දොඩවන්නට විය. දත් සපමින් යම් කිසිවෙකුට සීනෙන් අඬ ගැසූ ඔහු තව’කෙකුට බැණ වැදුණේ ය. ඉල්ලීම් ඉදිරිපත් කළේ ය.

යම්තම් එළිය වැටෙනවාත් සමඟ ම මිහයිල් සීයා නැඟිට, නිදියමින් සිටින අලෙක්සේයි දෙස බලා, වාර්යාට පහත් හඬින් යමක් කියා ගමනට සැරසුණේ ය. හිම සපත්තු දමාගෙන, ඒවාට උඩින් තමා ම පරණ ටයරයකින් සාදා ගත් කලෝෂි නම් වූ සපත්තු කවර දමාගෙන, හිම කබාය තද වන සේ බැඳ ගෙන, ජුනිපර් හැරමිටියක් රැගෙන එළියට බැස්සේ ය. හැරමිටිය පාවිච්චි කිරීම නිසා එහි උඩ කොටස අත්ලට ගැටී දිලිසෙයි. මේ හැරමිටිය නැති ව ඔහු දුර ගමන් නොයයි.

මිහයිල් සීයා ගෙයින් පිටත ගියේ අලෙක්සේයිට වචනයකුදු නොකියමිනි.

## 16

රෝගී අලෙක්සේයි මෙරේස්යෙව් සීයා පිටව යන සැටි නොදුටුවේ ය. දවස් දෙකක් ම අඩ සිහියෙන් පසු වූ ඔහුට ප්‍රකෘති සිහිය ලැබුණේ තුන්වන දවසේ දී ය. හිරු රැස් බිම්ගෙයි කවුළුවෙන් ඔහුගේ දෙපාවලට උණුසුම ගෙනදිනි.

බිම් ගෙය පාළු විය. ගැහැනුන් දෙදෙනෙකු කතා කරන හඬ ඇසිණි. එකියක් වාර්යා ය. අනෙක් කටහඬ අලෙක්සේයිට සුපුරුදු ය. ඔවුහු පහත් හඬින් කතා කළහ.

"කන්නෙ නැතිද?"

"එයාට කෑම රුචියක් නැහැ! ඊයෙ රොටි කෑල්ලක් කෑවා. එතකොටම වමනෙ දැම්මා. හපල කන කෑම එයාට අගුණයි. යම්තම් කිරි ටිකක් බොනව. ඊයෙ අපි කිරි ටිකක් හොයල දුන්නා"

"ඔන්න මම සුප් හොද්දක් හදල තියෙනව. ඒ අසරණ ළමයාට බොන්න දීපන්."

"වසිලිසා නැන්දේ" යැයි විස්මය පළ කළ වාර්යා "ඔය සූපය..."

"ඔව්, ඔව්. කුකුළු සුප් තමා. මොකද නුඹ පුදුම වෙන්නෙ. පුදම වෙන්ට දෙයක් නැහැ. එයාව කුද්දපන්. සුප් ටිකක් බොන්ට එයා කැමති වේවි."

දෙබස අසා සිටි අලෙක්සේයි ඇස් ඇර බැලීමටත් පෙර ඔහු වෙත ආ වාර්යා ඔහු වැරෙන් සොලවමින් ප්‍රීතියෙන් කෑ ගසන්නට වූවා ය.

"අලෙක්සේයි පෙත්රෝවිච්, අලෙක්සේයි පෙත්රෝවිච්, නැඟිටින්න... වසිලිසා නැන්දා සුප් ගෙනල්ලා. නැඟිටින්න."

බිත්තියේ එල්ලා තිබූ පහන වඩාත් දීප්තිමත්ව බැබළෙන්නට විය. කුදු ගැසුණු මැහැල්ලක අලෙක්සේයි දුටුවේ ය. ඈ කුඩා ය. ඇගේ මුහුණ රැලි ගැසිලා ය. නහය වක් ය. රොස් වූ බවක් ඇගේ මුහුණෙන් පළ වෙයි.

"මෙන්න මේ සුප් හොද්ද ගෙනාව. මේක බීපන් පුතේ අහක දාන්න එපා. නුඹට සනීපය ලැබේවි..."

අලෙක්සේයිට ඇගේ පවුල ගැනත්, පාටිසාන්කා

කුකුළු පැටියා ගැනත් මතක් විය. ආච්චි සහ වාර්යා ද ඔහු ඉදිරියේ සිටිති. ළිප උඩ ඇති හැළියේ වතුර නටයි. ඉන් නැඟෙන වාෂ්ප සහිත හුමාලය සහ දුම් අතරින් මැහැල්ලගේ දුක්මුසු මුහුණ පෙනිණි. ඔහු ඈ දෙස මහත් දයාන්විත ලෙස බැලුවේ ය.

මැහැල්ල ගෙයින් පිටවෙත් ම අලෙක්සේයිට කියන්නට පුළුවන් වූයේ "ආච්චි අම්මේ බොහොම ස්තුතියි" යන්න පමණකි.

"ස්තුති කරන්න දෙයක් නැහැ. ඔහෙ සනීප වෙන්න."

"ආච්චි අම්මේ, ආච්චි අම්මේ!" යැයි කියමින් නැඟිට සිටින්නට ඔහු තැත් කළ විට, වාර්ය ඔහු සෙමෙන් තල්ලු කළා ය.

"ඔහොම හාන්සි වෙලා මේ සුප් ටික බොන්න" යැයි වාර්යා ඔහුට කීවා ය.

"මිහයීල් සීයා කොහිද?"

"එයා ගියා... දිස්ත්‍රික්ක පක්ෂ කාර්යාලය හොයන්ට ගියා. තව දින කීපයක් යාවි එයා එන්ට. හාන්සි වෙලා මේ සුප් ටික බොන්න."

පළමුවැනි සුප් හැන්ද බිව් හැටියේ ම අලෙක්සේයිට තද බඩගින්නක් දැනිණි. ඒ සමඟ ම වේදනාවක් ද ඇති විය. අලෙක්සේයි සුප් හැඳි දහයකට වඩා නොබිව්වේ ය. සුදු පැහැති කුඩා මස් කැබැල්ලක් පමණක් කෑවේ ය. බඩගින්න බුරමින් නැඟී සිටිය ද එකවර ආහාර ගොඩක් ගැනීමෙන් එය විෂවීමට ඉඩ ඇති බැවින්, ඔහු තවත් ආහාර ගැනීම ප්‍රතික්ෂේප කළේ ය.

ආච්චිගේ සූපය ඔහුට පුදුම ශක්තියක් ගෙන දුන්නේ ය. ආහාර ගැනීම අවසන් කළ විගස ම ඔහු නින්දට වැටිණි. මීට පෙර මෙන් අඩ සිහියෙන් පසු නොවී, මේ වර ඔහු සුවසේ නිදා ගත්තේ ය. බිම්ගෙයි දුමාරය ද ඔහුට නොදැනේ. ගැහැනුන්ගේ කතාබහ ඔහුට නෑසේ. ඔහු මළ හයි බිය වූ වාර්යා ඔහුගේ අතක් අල්ලා, ඔහු වෙත නැඹුරු වී ඔහුගේ හදවත නැවතිලා දැයි පිරික්සා බැලුවා ය. මේ සියල්ල අලෙක්සේයිට නොදැනිණි.

ඔහු ක්‍රමානුකූල ව ආශ්වාස ප්‍රශ්වාස කරමින් සැප සේ නිදයි. ඔහු පසු දා එළිය වැටෙන තුරු එක හුස්මට නිදා ගත්තේ ය. මොලොව කිසි ම බලයකට ඔහු අවදි කරවීමට

ශක්තියක් නැතිවාක් මෙනි ඔහු නිදා ගත්තේ.

හිමිදිරි පාන්දර වනයේ අනිකුත් ශබ්දයන් හා ඝෝෂාවන් සමග තවත් ශබ්දයක් ඈත පැන නැංගේ ය. උස් පහත් ශබ්දයන් ඇති නොකළ හඬ නිසා කැලඹුණු අලෙක්සේයි හිස ඔසවා සවන් දෙන්නට විය. එය ඒකතානමය හඬකි. 'උ-2' වර්ගයට අයත් අහස්යානයක එන්ජිම හඬ නගන බව අලෙක්සේයි දැන ගත්තේ ය. හඬ තමා වෙත ළං වෙමින් වැඩි වන සැටි ඔහුට දැනේ. සමහර විට එය නෑසුණ ද සම්පූර්ණයෙන් ම අතුරුදන් නොවී ය. ඔහු වඩාත් කැලඹුණේ ය. අහස්යානය වනයට ඉහළින් පියාඹමින් යමක් සොයන බවත්, ගොඩ බැසීමට සුදුසු බිමක් පිරික්සන බවත් ඔහුට අවබෝධ විය.

වනයට ඉහළින් කවාකාර ලෙස පියාඹන අහස්යානය කවයන් කීයක් ගසන්නේ ද යන්න ඔහු ගණන් කරන්නට විය. පළමුවැනි කවය, දෙවැනි කවය, තුන්වැනි කවය... ඔහුට ගණන් කළ හැකි වූයේ එපමණකි. ඔහු නැවත සැපසේ නිදන්නට විය.

ඔහු අවදිවූයේ තරුණ, ගොරෝසු දෝංකාරය ඇති කරන කට හඬක් නිසා ය. සමූහ ගායනයක් අතරින් වුව ද එම කටහඬ හඳුනා ගැනීමට අලෙක්සේයි සමත් ය. ප්‍රහාරක අහස්යානා හමුදාවේ අණ දෙන නිලධාරි අන්ද්‍රේයි ඩෙග්ටෙරෙන්කෝට පමණකි එවැනි කටහඬක් ඇත්තේ.

අලෙක්සේයි ඇස් හැර බැලී ය. එහෙත්, තමාට සුපුරුදු පළල්. උස් කොපුල් සහිත කරුණාවන්ත මුහුණ පෙනෙන්නේ සැබැවින් නොව, සිහිනෙන් බව ඔහු සිතුවේ ය. දුමෙන් පිරි අඩ ඇඳිරි බිම්ගෙයි නිල්වන් දෑසක් විමසිල්ලෙන් බැලී ය.

"සීයේ, පෙන්වන්නකො සීයාගෙ සොයා ගැනීම" යැයි උක්රේනියනි උච්චාරණයකින් ඩෙග්ටෙරෙන්කෝ ඉල්ලා සිටියේ ය.

දර්ශනය අතුරුදන් නොවී ය. ඇත්තට ම ඒ අනිකකු නොව, ඩෙග්ටෙරෙන්කෝ ය. වනය මැද ඇති මේ උමං ගමේ තමා සිටින බව ඔහු දැන ගත්තේ කෙසේ ද? පළල් උරහිස් සහිත දැවැන්තයෙකු වූ මේ මිනිසා තමාට පුරුදු පරිදි කරපටියේ බොත්තම් ගලවා සිටී. එක් අතක ඔහුගේ හිස් වැසුම සහ ශ්‍රවණ යන්ත්‍රයේ කම්බිය ය. අනික් අතේ

තවත් පාර්සල් කීපයකි.

ඩෙග්ටෙරෙන්කෝ පිටුපස මිහයිල් සීයා ය. විඩාපත්ව, කැලඹී සිටින ඔහු දෑස් පිසදමා ගත්තේ ය. සීයා අසල අහස් හමුදාවේ හෙදිය ලේනා ය. රතු කුරුසය සහිත කැන්වස් බෑගයක් කිහිලි ගන්නා ගෙන සිටි ඈ අත කැලෑ මල් පොකුරකි.

වැළමිටි වාරුවෙන් වාඩිවීමට සූදානම් වූ අලෙක්සේයි "අන්ද්‍රෙය්" යැයි කියමින් තම සගයා ඇමතී ය.

පුදුමයෙන් මෙන් ඔහු දෙස බැලූ නියමුවා තමා බිය වූ බව සැඟවීමට අපොහොසත් විය.

"අන්ද්‍රෙයි නුඹට මාව හඳුනාගන්නට බැරිද?" මෙසේ ඇසූ මෙරේස්යෙව් වෙව්ලන්නට විය.

තමා ඉදිරිපිට ඇති පණ ඇති ඇටසැකිල්ල දෙස නියමුවා බැලී ය. ගින්නට හසු වී පිලිස්සුණු කලෙක මෙන් ඒ ඇටසැකිල්ල වසා ඇති හම කළු පාට ය. තමා හඳුනන ප්‍රීතිමත් ඇස් ඔහුට හමු විය. විශාල, වටකුරු ඇස් මෙරේස්යෙව්ගේ බව ඔහු හඳුනා ගත්තේ ය. ඔහු දෑත් දිගු කරත් ම, ඔහු අත තිබූ හිස් වැස්ම ද පාර්සල්වල ඔතා තිබුණු ඇපල්, දොඩම් හා විස්කෝතු ද බිම වැටිණි.

"අලෙක්සේයි ඒ උඹද?" මෙසේ ප්‍රශ්න කළ ඩෙග්ටෙරෙන්කෝගේ කටහඬෙහි චිත්තවේගී බවක් දක්නට තිබිණි. ඔහුගේ ඇස් පිහාටු එකට ගැටිණි. " අලෙක්සේයි, අලෙක්සේයි!" යැයි කී හෙතෙම ළමයකු මෙන් සැහැල්ලු අලෙක්සේයි බදා ගනිමින් "අලෙක්සේයි, අලෙක්සේයි, මගේ යාළුවා!" යැයි කියන්නට විය.

වාර්යා සහ ලේනා හෙදිය වලසෙකු මෙන් ශක්තිමත් ඩෙග්ටෙරෙන්කෝගේ අත්වලින් අබල දුබල අලෙක්සේයි මුදා ගැනීමට තැත් කළහ.

මේ දුබල කෙට්ටු මිනිසා අන් කිසිවකු නොව, තම අහස්යානා කණ්ඩායමේ සටන්කාමී සගයකු වන තම මිතුරු අලෙක්සේයි මෙරෙස්යෙව් බව අන්ද්‍රෙයි ඩෙග්ටෙරෙන්කෝ සැක හැර දැන ගත්තේ ය. තමාත් තම සගයනුත් අලෙක්සේයි සිතින් වළලා දැම්මේ මීට දවස් ගණනකට පෙර ය. ප්‍රීතියෙන් කුල්මත් වූ අන්ද්‍රෙයි හිස බදාගෙන ජයග්‍රාහී ලෙස හඬ නැගී ය. ඔහුගේ ඇස් ප්‍රීතියෙන් බබළයි.

"පණ පිටින්! දේව මෑණියනි පණ පිටින්! මෙච්චර දවස් කොහෙද හිටියෙ. නුඹට මොකද වුණේ."

මිටි තරබාරු දේහයක් ඇති හෙදිය ඉදිරියට පැන කැලඹී සිටින ඩෙග්ටෙරෙන්කෝ පැත්තකට තල්ලු කළා ය. බොත්තමක් වැනි පෙතැලි නහයකින් යුත් ඈ නිලය අනුව ලයිතන් කෙනෙක් වුව ද හැම දෙනා ම ඇය ලෙනොච්කා යන සුරතල් නමින් හැඳින්වූහ.

"කපිතාන් සහෝදරය, ලෙඩාගෙන් ඈත්වෙන්න" යැයි ඈ කියා සිටියේ දැඩි හඬකිනි.

තම අත තිබුණු මල්මිටිය ඈ මේසය මත තැබුවා ය. මේ මල් මිටිය ලබා ගැනීමට ඈ ඊයේ ප්‍රාදේශීය කාර්යාලයට ගිය ද, දූන් එය අනවශ්‍ය බව ඇයට වැටහිණි. ප්‍රථමාධාර මල්ල හැර ඉක්මනින් ලෙඩා පරීක්ෂා කරන්නට වූවා ය. දෙපා ඇඟිලි තුඩුවලින් පිරික්සමින් ප්‍රශ්න කළා ය.

"රිදෙනවද? මෙතන රිදෙනවද? මෙතන?"

අලෙක්සේයි තම දෙපා හොඳ හැටි බැලුවේ දූන් ය. ඒවා භයානක ලෙස ඉදිමිලා ය. කළු පාට වෙලා ය. ඇඟිලි තුඩු ස්පර්ශ වෙත් ම ඇති වන වේදනාව මුළු සිරුර පුරා විහිදෙයි. අලෙක්සේයිගේ පා ඇඟිලි කළු පාට වී ඇති අතර, ඒවාට වේදනාව හෝ ස්පර්ශය හෝ නොදැනීම නිසා ලේනා කැලඹුණා ය.

මිහයිල් සීයා හා ඩෙග්ටෙරෙන්කෝ මේසය වටා වාඩි වී කතා කරන්නට වූහ. නියමුවාගේ මත්පැන් බෝතලයෙන් උගුරක් බිව් සීයා උනන්දුවෙන් කතා කළේ ය. නැවත වරක් තමන් අලෙක්සේයි සොයා ගත් සැටි සීයා විස්තර කරන්නට වූයේ පළමුවැනි වතාවට නොවේ.

"අපේ කොල්ලො ජර්මන්කාරයො කැපූ කැලයට ගියා දර ගෙන්න. උන් කැලේ කැපුවෙ යුද කඳවුරක් හදන්ටයි. කොල්ලන්ගෙ අම්මා - මගේ දූ - කීව දර ගේන්ටයි කියල. එතනදි කොල්ලො දෙන්නා දැක්ක පුදුම සතෙකුව. උන් පුදුම වුණා. වලසෙක් කියල හිතල උන් බයවෙලා දුවන්න පටන් ගත්ත. හරියට මොකාදැයි හොයාගන්ට කොල්ලන්ට හිතිලා උන් දෙන්න ආපහු ගිහින් බැලුවා. 'මේ මොන ජාතියෙ වලසෙක් ද? මොකද ඌ පැත්තෙන් පැත්තට පෙරළෙන්නෙ?' කොල්ලො දෙන්නා ආපහු ගිහිල්ල

බලනකොට, පෙරළෙන වලසා කෑ ගහන හැටි ඔවුන්ට ඇහුණා..."

"පෙරළෙනවා? ඒ කොහොමද?"යි පුදුමයෙන් ප්‍රශ්න කළ ඩෙග්ටෙරෙන්කෝ සීයා වෙත සිගරැට් කොපුව දිගු කරමින් "සිගරැට් බොනවද?"යි ඇසී ය.

"පෙරළුණේ කොහොමද කියන එක එයාගෙන් අහනවා. අපේ කොල්ලො දෙන්නා දැක්කා එයා පෙරළෙන හැටි. උඩු පැත්තෙන් යටි පැත්තට ආපහු උඩ පැත්තට. හිම උඩ බඩ ගාගෙන යන්ට එයාට හයිය තිබුණෙ නැහැ. ඔන්න එයාගෙ හැටි!"

සීයාගේ විස්තරයට සවන් දෙන ඩෙග්ටෙරෙන්කෝ විටින් විට නැඟිට තම මිතුරා දෙස බලයි. වාර්යා සහ හෙදිය රෝගියාට යුද හමුදාවේ බ්ලැන්කේට්ටු පොරවමින් සිටිති.

"ලෙඩුන්ට රෙදි ඇන්දවීම පිරිමින්ට අයිති වැඩක් නොවේ. පුතේ නුඹ වාඩිවෙයන්. මා කියන දේ නුඹලගෙ ලොකුම නිලධාරියකුට කියපන්!.. ඒ මනුස්සය කළ වැඩේ වීර ක්‍රියාවක්. පේනවද එයාගෙ තරම. සුමානයක් තිස්සෙ අපේ සමූහ ගොවිපළ එයාට සාත්තු කළා. ඒ වුණාට එයාට සෙලවෙන්නවත් බැහැ. හිම ගොඩවල්, මඩ වළවල් හරහා බඩගාගෙන එන්ට තරම් එයාට ධෛර්යයක් තිබුණා. ඔහොම හපන්කමක් කරන්න හැම කෙනෙකුටම බැහැ."

මහල්ලා ඩෙග්ටෙරෙන්කෝගේ කනට තම කට ළං කොට උඩු රැවුළ හා යටි රැවුළ අතරින් 'සුරු සුරු' හඬක් නඟමින් රහසක් කියන්නට විය.

"මා හිතනව මිනිහ නොමැරෙයි කියල. තමුසෙ හිතන්නෙ කොහොමද? ජර්මනුන්ගෙන් බේරෙන්න එයාට පුළුවන් වුණා. මාරයාගෙන් බේරෙන්න එයාට පුළුවන් ද? ඇටෙයි, හමයි විතරයි. බඩ ගා ගෙන ආවෙ කොහොමද කියල මා දන්නෙ නැහැ. එයාට කොහොම හරි තමන්ගෙ මිනිස්සු ළඟට එන්ට ලොකු ආසාවක් තිබිල තියෙනව. සිහිය නැති වුණාම එයා දොඩවනවා: 'අහස් තොටුපළ, අහස් තොටුපළ' කියල 'ඕල්ගා, ඕල්ගා' කියලත් එයා කියනව. තමුසෙලගෙ අහස් තොටුපළෙ ඒ නම තියෙන තරුණියක් ඉන්නවද? එයාගෙ පවුල වෙන්න ඇති? මා කියන දේ තමුසෙට ඇහෙනවද, අහස් නියමුවා"

ඩෙග්ටෙරෙන්කෝට ඔහුගේ කතාව නැසිණි. අහස් හමුදාවේ සාමාන්‍ය අහස් නියමුවකු වන මේ තරුණයා දවස් කීයක් තිස්සේ බිඳුණු ඇට සහිත පා ඇතිව, ගමන් කළේත්, බඩ ගා ගෙන ගියේත් කොහොමද? හිම කඳු, කුණාටු, මඩ ගොහොරු නොතකා සතුරාගෙන් බේරී තම ජනතාව වෙත පැමිණීමට ඔහු සමත් වූයේ කෙසේ ද? අහස් නියමු වෘත්තිය ඩෙග්ටෙරෙන්කෝට අවදානම කුමක් ද යන්න හැඳින්විය. අහස් සටන්වලට වැදෙන ඩෙග්ටෙරෙන්කෝ මරණය ගැන කිසි දිනෙක නොසිතුවේ ය. එවැනි සටන්වල දී ඔහු තුළ කැලඹුණු සතුටක් පවා ඇති විය. එහෙත්, මහ වනයේ බිඳුණු දෙපා ඇති ව බඩගාගෙන යාම ඔහුට සිතා ගැනීම පවා අමාරු ය...

"සියා කවදාද එයාව හොයා ගත්තෙ?"

"කවදාද?" සීයා තොල මතුළේ ය. "හරියට ම සුමානෙකට ඉස්සෙල්ලා. පහු ගිය සෙනසුරාදා"

ඩෙග්ටෙරෙන්කෝ අලෙක්සේයි අනතුරට මූණ පෑ දවසේ සිට ගණන් කළේ ය. ඇට බිඳුණු පාද ඇතිව මේ මිනිසා දවස් දහඅටක් තිස්සේ වනය මැදින් බඩ ගාමින් ඇවිත් ඇත. ආහාර නැතිව නොකළ හැකි වැඩකි.

ලේනා මේ අතර අලෙක්සේයි බ්ලැන්කට්ටුවලින් පොරවා පිළියෙල කළා ය.

"කමක් නැහැ ජෝෂ්ය ලයිතන් සහෝදරය, කමක් නැහැ" යැයි ඈ කීවා ය. මල්ලකින් හැලෙන මුං ඇට නගන ශබ්දයට ඇගේ කටහඬ සමාන ය. "මොස්කව් ගියාම ඉක්මනටම ලෙඩේ සුව කරාවි. මොස්කව් විශාල නගරයක් නෙව. ඔයිට වැඩියෙ අසාධ්‍ය ලෙඩ සුව කරනව."

ඉක්මනින් ම අලෙක්සේයිට සුවය ලැබෙන බව වුවමනාවට වඩා බර කරමින් හෙදිය පවසන සැටි දකින ඩෙග්ටෙරෙන්කෝ තම මිතුරාගේ රෝගය අසතුටුදායක බව හෙදිය තීරණය කර ඇතැයි වටහා ගත්තේ ය.

උමං ගමෙහි වාසය කරන ප්ලව්නී ගම්වාසීහු හැම දෙනෙක් ම තම මිතුරාට ආයුබෝවන් කීමට පැමිණියහ. අහස්යානය දිය මිදි වැවක් මත ගොඩ බැස ඇත. වැව වටේට හිම මිදී ගිය ද, මැද කොටසේ හිම ගනව තිබිණි.

හැඩයෙන් එය දිගටි වැවකි. වැව දක්වා මඟක් නොතිබිණි. මීට පැය කීපයකට පෙර එහි සිට ගිය මිහයිල් සීයාත්, ඩෙග්ටෙරෙන්කෝ සහ ලේනාත් විසින් තබන ලද පා සටහන් පමණකි දකින්නට තිබෙන්නේ. ගමේ කොල්ලන් පෙරටුව ගමන් කරන්නේ මේ අඩි පාර ඔස්සේ ය. ඔවුන් පිටුපසින් ගම්මු කීප දෙනෙක් යති. සිර්යෝන්කාත්, පේද්යාත් ඉදිරියෙන් ගමන් කරති. වනයේ දී අලෙක්සේයි සොයා ගැනීමේ ගෞරවය හිමි සිර්යෝන්කාට ය. තම පියාගේ විශාල හිම සපත්තු දෙක හැඳගත් සිර්යෝන්කා අලෙක්සේයිගේ දකුණු පැත්තෙන් ගාටමින් යයි. ඔහුගේ මුහුණේ ගම්භීර පෙනුමකි. තමා පිටුපසින් වැරැහැලි ඇඳගෙන ගමන් කරන කොල්ලන්ට ඔහු වරින් වර බැණ වදිමින් ඔවුන්ට විධානය කරයි. ඩෙග්ටෙරෙන්කෝ සහ මිහයිල් සීයා අලෙක්සේයි සැතපී සිටින ගිලන් මැස්ස උසුලාගෙන යති. ලේනා වරෙක අලෙක්සේයිගේ දෙපා බ්ලැන්කට්ටුවෙන් වසයි. වරෙක තම හිස බැඳි ලේන්සුව ගෙන ලේනා අලෙක්සේයිගේ හිස වටා බඳී. ඔවුන් පිටුපසින් මැහැලියෝ ද මැදිවියේ ගැහැනු හා තරුණියෝ ද ගමන් කරති.

"උඹ අපට ලියාපන්! අමතක කරන්න එපා. මෙන්න ලිපිනය, කලිනීක්ස් කෝරලය, බොලොගොව්ස්ක් පෙදෙස. අනාගත ප්ලවීනී ගම. ඔව්, ඔව් අනාගත ගම. වරදින්නෙ නැතුව ලියුම අපට ලැබේවි" යැයි මිහයිල් සීයා අලෙක්සේයිගෙන් සමුගනිමින් කීවේ ය.

ගිලන් මැස්ස අහස්යානාව තුළ තැබී ය. සුපුරුදු අහස්යානා පෙට්රල් පුසුඹ නිසා අලෙක්සේයි ප්‍රීති විය. ගිලන් මැස්සට ඉහළින් පියස්ස වැසීය. තමාට ආයුබෝවන් කීමට පැමිණි පිරිස අත් වනන සැටි අලෙක්සේයිට නොපෙනේ. වක් වූ නහයක් හා කෝප වූ පෙනුමක් ඇති කපුටියකට සමාන වූ මැහැල්ල අහස්යානය ළඟට ම ආවා ය. වේගයෙන් කැරකැවෙන අවර පෙත්ත විසින් කරනු ලබන කරදරය ද නොතකා ඈ නියමු ආසනයේ වාඩි වී සිටින ඩෙග්ටෙරෙන්කෝ වෙත පැමිණ ඉතිරි කුකුළු සුප් සහිත බඳුන දුන්නා ය. අලෙක්සේයි මෙය නොදිටී ය. ගැහැනුන්ට බැණ වදිමින් කොල්ලන් එළවා දමමින් අහස්යානය වටේ යමින් සිටි මිහයිල් සීයාගේ හිස්වැස්ම

සුළං පහරට ඉගිළී යන සැටිත්, ඔහු නැවතී අහස්යානය දෙස බලන සැටිත් අලෙක්සේයිට නොපෙනිණි. ගැහැනු ගොඩක සිටි එකම පිරිමියා වූ සීයා අහස්යානාව ඉදිරියට යත් ම අත් වනමින් සමු ගත්තේ ය.

## 17

ඔහු රැගත් අහස්යානය තොටුපළට පැමිණියේ වැඩ අධික වේලාවක දී ය. වසන්තයේ හැම දවසක දී ම මෙන් ම අද ද කලබල සහිත ය.

යන්ත්‍රවල හඬ මොහොතකටවත් නොනැවතිණි. එක් අහස්යානා කණ්ඩායමක් පැට්රල් ටැංකි පුරවා ගැනීමට අහස් තොටුපළට ගොඩබසින විට, තවත් කණ්ඩායමක් ගුවන් ගනී. එය අහස්යානා තොටුපළට එන විට තෙවැනි කණ්ඩායම අහසට නඟී. අහස් නියමුවෝ ද පැට්රල් ටැංකි සහිත රථ පදවන්නෝ ද, ගබඩා භාරකරුවෝ ද විඩාපත් ව බිම වැටෙන තුරු වැඩ කරති.

වැඩ කටයුතු කොතරම් අධික වුව ද, නොසන්සුන්තාව උත්සන්න වුව ද, හැමදෙනා ම අලෙක්සේයි මෙරේස්යෙව්ගේ පැමිණීම ගැන බලාපොරොත්තුවෙන් සිටියහ.

"තවම ආවෙ නැත්ද?"යි අහස්යානයේ එන්ජිම් හඬ නිවෙන්නටත් පෙර නියමුවා මිකැනික් ශිල්පියාගෙන් ප්‍රශ්න කරයි. නියමුවා තම යානය කැපොනිය දක්වා ගෙනයාමට පෙර ඔහුගේ සුව දුක් ගැන විමසයි.

"එයා ගැන ආරංචියක් නැති ද?" යි පැට්රල් ටැංකි සහිත රථ පැට්රල් ගබඩාව වෙත ගෙන යන රියැදුරෝ ප්‍රශ්න කරති.

වනයට ඉහළින් සුපුරුදු සෞඛ්‍ය අහස් යානයේ හඬ ඇසෙත් දැයි යමෙක් සොයති.

අලෙක්සේයිට සිහිය ලැබුණු විට තමා ගිලන් මැස්සක වැතිර සිටින බවත්, තමා වටා තම මිතුරන්ගේ සිනා මුහුණු ඇති බවත් පෙනිණි. ඔහු ඇස් ඇර බලත් ම පිරිස ප්‍රීති ඝෝෂා කරන්නට වූහ. තම ගිලන් මැස්ස අසල හමුදාවේ මේජර් සිටින බව ඔහු දිටී ය. තරුණ මේජර්ගේ මුහුණ නිසල ය. එය මඳ සිනාවකින් සැරසී ඇත. මේජර් ළඟ නිලධාරි

මණ්ඩලයේ ප්‍රධානියා ය. ඔහුගේ රතු මුහුණ ඩහදියෙන් තෙමිලා ය. ඊළඟට සේවා අංශයේ ප්‍රධානියා සිටගෙන සිටී. සුදු පැහැති ඔහුගේ මුහුණ වටකුරු ය. හඳුනන මුහුණු ගොඩකි. ගිලන් මැස්සේ ඉදිරිපිටින් යන්නේ යූරා ය. අලෙක්සේයි බැලීමට ඔහු හැරෙන විට ඔහුගේ කකුලක් ගලක හැපෙයි. ඔහු අසලින් අහස් නියමු කුකුෂ්කින් ය. මිටි මිනිහෙකු වූ ඔහුගේ මුහුණ සෙංගමාල රෝගියකු මෙනි. ඔහුගේ ගතිගුණ නිසා ඔහු අප්‍රිය වී ඇත. ඉක්මනින් පා තබන යූරා සමඟ ගමන් කිරීමට තැත් කරන කුකුෂ්කින් අලෙක්සේයි දෙස බලමින් මඳ සිනා පායි.

තමාට මේ තරම් විශාල සංඛ්‍යාවක් මිතුරන් සිටින බව මීට පෙර අලෙක්සේයි නොදත්තේ ය. මිනිසුන්ගේ සුහද ගති පැන නැඟුණු විට ඔහොම තමා.

බිරියෝසා බැද්දක සඟවා තිබූ රිදී පැහැති කුඩා සෞඛ්‍ය සේවා අහස්යානයක් වෙත අලෙක්සේයි ගෙන ගියේ ය. එහි එන්ජිම ක්‍රියා කරවන සැටි ඇසේ.

හදිසියෙන් ම අනතුරු හැඟවීමේ සංඥා නළා හැඬවිණි. නියමුවෝ සහ සේවකයෝ ක්‍රියාකාරී වීමට සූදානම් වූහ. මේජර් කෙටි නියමයන් කීපයක් කළ විගස ම ඔවුහු කුහුඹුවන් මෙන් විසිර ගියහ. සමහරු සඟවා ඇති අහස්යානා වෙත දුව ගියහ. සමහරු අණ දෙන බිම් ගෙය තුළට ගියහ. සමහරු බැද්දේ සඟවා ඇති යන්ත්‍ර වෙත ගියහ. අළු පැහැති පුංචි රොකට්ටුවක් ආලෝකය ඇති කරමින් බිම වැටුණු සැටි අලෙක්සේයි දුටුවේ ය. එය 'ගුවන් ගැනීමට' කරන සංඥාවකි.

ලේනා සහ යූරා අලෙක්සේයි වැතිර සිටින ගිලන් මැස්සත් රැගෙන නුදුරු බැද්දට දුවන්නට වූහ. කැලඹීම නිසා ඔවුන්ට එකවර පා තැබීමට බැරි වුව ද, ආරක්ෂක ස්ථානයකට ඔහු ගෙනයාමට ඔවුහු සමත් වූහ.

ආරක්ෂක ස්ථානයේ බිම් ගෙය තුළට ගිලන් මැස්ස ගෙන යාමට බැරි ය. මන්ද යත්, එහි දොර ගිලන් මැස්සට වඩා පටු බැවිනි. යූරා සහ හෙදිය මැස්ස පසෙක තබා අලෙක්සේයි වඩා ගෙන යාමට සූදානම් වූ විට, ඔහු එයට විරුද්ධ වෙමින් ගිලන් මැස්ස විශාල ලෙස මුල් බැස ඇති බිරියෝසා ගස මුල තබන ලෙස ඉල්ලා සිටියේ ය.

ඊළඟ විනාඩි කීපය තුළ දී ඇති වූ අහස් සටන් දෙස ඔහු බලා සිටියේ සිහිනෙන් මෙනි. පොළොවේ සිට අහස් සටන් දෙස බැලීමට නියමුවකුට අවස්ථාව ලැබෙනුයේ කලාතුරකිනි. යුද්ධයේ පළමුවැනි දවසේ සිට ප්‍රහාරක යුද්ධ අහස් යාත්‍රාවක් පැදවූ අලෙක්සේයි මෙරේස්යෙව් කිසි දිනෙක බිම සිට අහස් යාත්‍රා සටනක් දැක නැත. අහස් සටන්වල විදුලි වේග ප්‍රහාරය ගැන හොඳ දැනුමක් ඇති අලෙක්සේයිට මේ සටන පෙනෙන්නේ බොහොම හෙමින් කෙරෙන්නක් ලෙසය. බිම සිට බලන විට ඒ සටන් බිහිසුණු ලෙසත්, මැෂින් තුවක්කු පහර භයානක දෙයක් ලෙසත් නොදැනේ. 'ඉල්' වර්ගයේ අහස්යානා ඒ මේ අත යමින් කරන මේ සටන ඔහුට ගෘහමය හා සුපුරුදු බවක් ගෙන දුන්නේ ය. ගස මුල වැතිර සිට අහස් සටන දෙස බලන අලෙක්සේයිට මහන මැසිමක හඬකට සමාන වූ ද, කපු පිළි ඉරන විට ඇති වන හඬකට සමාන වූ ද හඬක් ඇසිණි. සටනින් පසු ප්‍රහාරක අහස්යානා අහස් තොටුපළට ගොඩ බසින්නට විය. පුරුදු පරිදි තොටුපළට උඩින් කවාකාර ලෙස පියාඹන්නේ නැතිව හැකිතරම් ඉක්මනින් ගොඩ බසිමින් සිය ආරක්ෂක ස්ථාන බලා දුවති....

නැවත නිහඬතාවකි. අහස්තොටුපළ හිස්විය. අහස්යානා එන්ජින්වල හඬ නැවතිණි. එහෙත්, අණ දෙන කඳවුරේ නිලධාරීහු තවමත් අහස දෙස බලාගෙන සිටිති.

"නොම්මර නවය ඇවිත් නැහැ. කුකුෂ්කින් කොහේ හරි අමාරුවක වැටිල වගේ" යැයි යූරා කීය.

කුකුෂ්කින්ගේ සෙංගමාල රෝගී මුහුණ අලෙක්සේයි ඉදිරියේ මැවී පෙනේ. හැමදා මෙන් ම, දැනු දු කුකුෂ්කින් නොසතුටු බවක් පළ කරයි. ඔහු තමාගේ ගිලන් මැස්ස මහත් ප්‍රවේසමකින් උස්සාගෙන ආ සැටි අලෙක්සේයිට මතක් විය. කුකුෂ්කින්ට මක්වුණා ද? සටන් අධික දවස්වල සාමාන්‍ය දෙයක් ලෙස හැම නියමුවෙක් ම සලකන මේ කරුණ ගැන දැන් ගිලන් මැස්ස මත වැතිර සිටින අලෙක්සේයි සිතන්නේ සුසුම් ලමිනි.

අහස්යානයක හඬ ඇසිණි.

යූරා ප්‍රීතියෙන් කෑ ගැසී ය.

"නොම්මර නවය"

අණ දෙන ස්ථානය නැවත ක්‍රියාකාරී විය. කිසිවක් සිදු වූවාක් මෙනි. අංක නවයේ අහස්යානය අහස් තොටුපළට ගොඩ බසින්නේ නැතිව කවාකාර ලෙස පියාඹන්නට විය. ඒ අහස් යානයේ එක් පියාපතකට වෙඩි වැදී ඇති බවත්, එහි එක් 'පයක්' කැඩී ගොස් ඇති බවත් අලෙක්සේයි දක්කේ ය. රතු රොකට් දෙකක් අහස් ගත විය. කුකුෂ්කින් නැවත වරක් අහස් තොටුපළට උඩින් පියාඹා ගියේ ය. විනාශ වුණු කුරුලු කූඩුවකට ඉහළින් පියාසර කරන කුරුල්ලෙක් සුදුසු තැනක් සොයමින් ළතැවෙන සැටියක් කුකුෂ්කින්ගේ ක්‍රියාවෙන් හැඟේ.

ගොඩබැසීමකට බැරි තත්ත්වයක අහස්යානය තිබේ නම්, ඉහළ නැඟ පැරචුටයේ ආධාරයෙන් බිමට පැනීමට නියමුවාට අවසර ඇත. එසේ කරන ලෙස අණ දෙන ස්ථානයෙන් ඔහුට නියෝගයක් ලැබී ඇතැයි සිතිය හැකි වුව ද, කුකුෂ්කින් මුරණ්ඩු ලෙස වටේට පියාඹයි.

තුවාල ලබා සිටින අංක නවයේ අහස්යානයට ආධාර දීම් වස් අංක එක දරන ප්‍රහාරක අහස්යානය ගුවන් ගත්තේ ය. අංක එක දක්ෂ ලෙස අංක නවයේ බිඳී ගිය පියාපත වෙත ළං විය. එය පදවන්නේ නියමුවන්ගේ අණ දෙන නිලධාරියා බව අලෙක්සේයි දැන ගත්තේ ය. කුකුෂ්කින්ගේ විදුලි පණිවුඩ උපකරණ ක්‍රියා විරහිත වී ඇතැයි ද, නැතිනම් හිසට වැදුණු පහරක් නිසා කුකුෂ්කින් කම්පනයට පත් වී ඇතැයි ද සිතූ අණ දෙන මණ්ඩලය ආධාර වශයෙන් ප්‍රහාරක යානය යවා එය අනුකරණය කරන ලෙස ඉඟියෙන් කියා සිටී. ප්‍රහාරයක යානය ඉහළ නැංගේ ය. එවිට කුකුෂ්කින් ගෑස් අඩු කොට ගොඩ බැසීමට සූදානම් විය. බිඳී ගිය පියාපත සහ කැඩුණු පයක් සහිත කුකුෂ්කින්ගේ අහස්යානය අලෙක්සේයිගේ හිසට උඩින් පියාඹා ගියේ ය. නොකැඩුණු කකුලෙන් තොටුපළේ කෙළවරට බට අංක නවය වේගය අඩු කරමින් මඳ දුරක් ගොස් දකුණු පැත්තට වැටී වටයක් කරකැවිණි. හිම කුණාටුවක් ඇති වූ කලෙක මෙන් කුඩා හිම කැට හා හිම ඉහළ නැංගේ ය.

හිම පටලය අතුරුදන් වූ පසු අහස්යානය ළඟ යම් කිසි කළු පැහැති ලපයක් පෙනිණි. සයිරන් නළාව හඬවමින් සෞඛ්‍ය සේවා රථයක් ඒ ලපය දෙසට දිව ගියේ ය.

"කුකුෂ්කින් අහස්යානය බේරා ගත්තා. යස හාදයා. ඒ වගේ හපන්කමක් කරන්න එයා ඉගෙන ගත්තෙ කවදාද?" ගිලන් මැස්සේ වැතිර ගෙන තමාටම එසේ කියා ගත් අලෙක්සේයි තම සොහොයුරා කෙරෙහි ඊර්ෂ්‍යා කළේ ය. හැම දෙනා ම අප්‍රිය කරන ඒ මිටි මිනිහා වෙත දුව ගොස් ඔහුගේ වීරත්වයට උපහාර දැක්වීමට අලෙක්සේයිට සිතිණි. එහෙත්, ගිලන් මැස්සට බැඳ ඇති ඔහුගේ සිරුර වේදනාවෙන් කකියයි...

සුවසේවා අහස්යානයේ ඇඳකට අලෙක්සේයිගේ ගිලන් මැස්ස සවි කළේ ය. දොරක් විවර වී නාඳුනන දොස්තර කෙනෙක් ඇතුළු විය.

"එක ලෙඩෙකුව ගෙනවිත් නේද?" යි ඔහු අලෙක්සේයි දෙස බලමින් ප්‍රශ්න කළේ ය. "අපූරුයි අනික් ලෙඩාත් ගේන්න" යැයි හෙතෙම කීය.

යූරාගේ ආධාරය ඇතිව දොස්තර තවත් ගිලන් මැස්සක් යානය තුළට ගෙන සවි කළේ ය. රෝගියා වසා ඇති බ්ලැන්කට්ටුව මාරු කරන විට, වේදනාවෙන් පිරුණු කුකුෂ්කින්ගේ මුහුණ පෙනිණි.

දොස්තර වටපිට බලා, දෑත් පිරිමැද අලෙක්සේයි දෙසට හැරී කතා කළේ ය.

"අපූරුයි! තරුණයා තමුසෙට තනිවට මෙන්න තවත් කෙනෙක්. දැන් ඉතින් පිට උදව්ය එළියට බහින්න!"

පිටවීමට අකැමැත්තෙන් සිටි යූරා දොස්තර විසින් පිටතට තල්ලු කර දමන ලදි. දොර වැසිණි. අහස්යානය ගුවන් ගත්තේ ය. දොස්තර අලෙක්සේයි වෙත ආවේ ය.

"කොහොමද සැප සනීප?" මෙසේ ඇසූ දොස්තර, "මෙහෙට දෙනව අත තමුසෙගෙ නාඩි බලන්න". ඔහු අලෙක්සේයි වෙත සැලකිල්ලෙන් බලා හිස වනමින් මෙසේ කීය. "හ්ම්! ලොකු චිත්ත ධෛර්යයක් ඇති මිනිහෙක්. තමුසෙගෙ යාළුවො මට කීව තමුසෙගෙ හපන්කම් ගැන. හිතන්න පවා අමාරුයි! ජැක් ලන්ඩන්ගෙ නවකතාවක් වගෙ."

දොස්තර තම සනීප පුටුවට වැදී හරිබරි ගැසී වාඩි විය. මෙහොතකින් ඔහු නිදි කිරා වැටෙන්නට විය. තරුණයකු නොවන, සුදුමැලි මුහුණක් ඇති මේ දොස්තර විඩාපත්වී සිටින සැටි පෙනිණි.

"ජැක් ලන්ඩන්ගෙ නවකතාවක් වගෙ" යැයි තමාට කියාගත් අලෙක්සේයි මෙරේස්යෙව්ට තම ළමා කාලය ගැන සිහිවිය. දෙපා හිරි වැටුණු මිනිහෙක් කාන්තරය මැදින් ගමන් කරයි. ඔහු පසු පස බඩගිනි වෘකයෙක් ලුහු බඳින සැටි විස්තර කරන කතාවක් මතක් විය. අහස් යානයේ යන්ත්‍රවල ඒකතානමය හඬ නිසා අඩ නින්දට අලෙක්සේයිට තමා වටා හැම දෙයක් ම පාවෙන සැටියක් දැනිණි. ඔහු සිහිනයක් දකී. යුද්ධයක් නැත. බෝම්බ දැමීමක් නැත. එහෙත්, දෙපාවලින් නැඟෙන වේදනාව ඉවසා සිටීමට පවා බැරි ය. මොස්කව් නගරය බලා පියාඹන අහස්යානාවක් ද නැත. තමා උපන් කමීෂින් ගමේ දී කියවූ අපූරු ළමා කතා පොතක කතාවකි මේ.

# දෙවැනි කොටස

## 1

අහස්හමුදාවේ අණ දෙන සෙනෙවි තැනගේ ඉල්ලීම පිට අලෙක්සේයි මෙරේස්යෙව් සහ කුකුෂින් මොස්කව්හි උසස් රෝහලකට ගෙන ගියේ ය.

යුද්ධයට පෙර මෙතැන චිකිත්සාගාර ආයතනයක් තිබිණි. සුප්‍රසිද්ධ සෝවියට් වෛද්‍ය විද්‍යාඥයෙක් රෝග හා තුවාල සුව වූ පසු ඉක්මනින් මිනිස් සිරුර ප්‍රකෘති තත්ත්වයට ගෙන ඒමේ ප්‍රතිකාර ක්‍රම අත්හදා බැලුවේ මෙහිය. මේ ආයතනයට ආවේණික වූ සම්ප්‍රදායයන් තිබුණු අතර, එය විශ්ව කීර්තියක් ලබා තිබිණි.

යුද්ධය පටන් ගත් පසු විද්‍යාඥයා තම ආයතනය සෝවියට් යුද්ධ හමුදාවේ නිලධාරීන් සඳහා රෝහලක් බවට පත් කළේ ය. විද්‍යාව දත් නවීනතම ක්‍රම හා විධි පෙර මෙන් ම, දැනුදු මෙහි රෝගීන් සඳහා යොදවති. යුද්ධය මොස්කව් නගරය ළඟ ම ඇවිළිණි. තුවාල ලැබූ යුද භටයන් ගලා එන්නට වූයෙන්, පෙර තිබූ ඇඳන් ගණන හතර ගුණයකින් වැඩි කිරීමට සිදු විය. රෝහලේ කාර්යාල කාමර හා ගබඩා කාමර ලෙඩුන්ගෙන් පිරිණි. විද්‍යාඥයා තම කාර්යාලයද ලෙඩුන් සඳහා දී කාර්යාල උපකරණ, ලිපිගොනු ආදිය වෙනත් තැනකට ගෙන ගියේ ය. තම එදිනෙදා වැඩ කටයුතුවලට හෙදියකගේ කුඩා කාමරයක් තෝරා ගත්තේ ය. මෙසේ වුව ද, කොරිඩෝරයෙන් ගිලන් ඇඳන් තබා රෝගීන්ට වෙදකම් කිරීමට සිදු විය.

රෝහලේ ප්‍රධානියා වූ සුප්‍රසිද්ධ විද්‍යාඥයා උත්තරීතර සෝවියට් මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයෙකි. ඔහු ඇතුළු සියලු දොස්තරවරු හා හෙදියෝ, සුළු සේවකයෝ, මුරකරුවෝ ආදී හැම කෙනෙක් ම එකා මෙන් රෑ දවල් නොබලා වෙහෙස නොතකා වැඩ කළහ. අධික වෙහෙස නිසා ඔවුන්ගේ දෙපා ගැටෙන්නට විය. අඩක් කුසගින්නේ සිටීම නිසා නිතර ක්ලාන්ත ගති ඇති විය. එහෙත්, මේ සියලු කරදර මැද ඔවුහු නියමිත වේලාවට වැඩ භාරගත්හ. රෝහල සේදීම, ඇඳන් ශුද්ධ කොට ලෙඩුන්ට අලුත්

ඇඳුන් ඇන්දවීම ආදිය පමා නොවී කෙරිණි. කෙට්ටු ශරීර අති හෙදියෝ සුදු ඇඳුමින් සැරසී වැඩටආහ. මන්ද පෝෂණය හා කුසගින්න නිසා ඔවුහු මැහැලියන්ට සමාන වූහ. විඩාපත් වීම නිසා දෙපා බිම ගසා කෙළින් සිටීමට තරම් ශක්තියක් නොතිබුණ ද, ඔවුහු දොස්තරවරුන්ගේ සියලු නියමයන් අකුරට ම ක්‍රියාවට යෙදවූහ. කනිෂ්ඨ දොස්තරවරු පෙර මෙන් ම, ගිලනුන්ගේ ඇඳන්වල ඉතා කුඩා ලපයක් පවා ඇතිවීමට ඉඩ නොහරිමින් තමන්ගේ ලේන්සුවලින් රෝහලේ බිත්තිවල දොරවල කුණු පැල්ලම් ආදිය පිස දැමූහ. රෝහලේ ප්‍රධානියා වූ සුප්‍රසිද්ධ වෛද්‍ය විද්‍යාඥයා යුද්ධයට පෙර කාලයේ දී මෙන් ම, දැන් ද තම දොස්තර පිරිස කැටුව නියමිත වේලාවට වාට්ටුවෙන් වාට්ටුව කරා යමින්, ලෙඩුන් පරීක්ෂා කරමින්, අසාධ්‍ය ලෙඩුන්ට ප්‍රතිකාර කිරීම ගැන උපදෙස් දෙමින්, අලුතෙන් ඇතුළු කරගත් ලෙඩුන්ගේ රෝගයන් ගැන සොයා බලමින් කටයුතු කළේ ය. ප්‍රධානියාගේ මුහුණ රතු ය. හිසකේ පැසිලා ය. ඔහුගේ උඩු රැවුළ පැරණි රජකු සිහි කරවයි. කැඳ දමා මදින ලද සුදු ලෝගු ඇඳගත් දොස්තරවරුන් සමඟ එකතුව ඔහු මේ විදිහට දවසකට දෙවරක් ලෙඩුන් පරීක්ෂා කරයි.

තම කනිෂ්ඨ සේවකයකුගේ යම් කිසි වැරැද්දක් දකින ප්‍රධානියා ලෙඩුන් ඉදිරිපිට, එම වැරැද්ද සිදු වූ තැන ම ඔහුට හඬ නගා බැණ වදිමින් දොස් පවරයි. යුද්ධයට පෙර කාලයේ දී මෙන් ම, දැනුදු තම රෝහල ආදර්ශවත් ආයතනයක් විය යුතු යැයි කියමින් කෑ ගසන ප්‍රධාන තැන සතුරු අහස්යානා බෝම්බ දමන විටදීත්, යුද්ධය මොස්කව් නුවරට ළං වී තිබෙන විටදීත් එසේ ම තම යුතුකම් ඉටුකළ යුතු යැයි කියා සිටී. හිට්ලර්ගේ හා ගෝරින්ගේ ම්ලේච්ඡයන්ට පිළිතුරු දිය හැක්කේ ඒ විදිහට බව කියා සිටින ප්‍රධාන තැන යුද්ධ කාලයේ අමාරුකම් නිසා තම වැඩ කටයුතු නිසි ලෙස ඉටු නොකිරීම පිළිනොගත හැකි බව කියයි. යුද්ධ අමාරුකම් නිසා ම හැම දෙයක් ම ආදර්ශවත් ලෙස කළ යුතු යැයි හෙතෙම කියාසිටී. නියමිත වේලාවට විනාඩියක්වත් පමා නොවී ප්‍රධාන තැන තම පරීක්ෂණ කටයුතු කරන්නට පටන් ගනී. බෝම්බ

ප්‍රහාරයක දී පවා ඔහු තම වැඩකටයුතු පමා නොකරයි. යුද්ධ කාලයේ අමාරු කම් නොබලා රෝහලේ සියලු සේවකයන් ආදර්ශවත් ලෙස තම කටයුතු ඉටු කිරීමට ආස්වාදයක් ලබා ගත්තේ ප්‍රධානියාගෙනි.

දවසක් දා රෝහලේ ප්‍රධානියා වසීලියි වසීලෙවිච් සිරිත් පරිදි ලෙඩුන් පරීක්ෂා කිරීම පටන් ගත්තේ ය. තුන්වැනි මාලයේ පඩිපෙළ අසල ගිලන් ඇඳන් දෙකක් තබා ඇති සැටි හෙතෙම දුටුවේ ය .

"මොකද මෙතන ප්‍රදර්ශනයක් ද?" යි ප්‍රධානියා ප්‍රශ්න කරමින් රවා බැලුවේ ය. තුන්වැනි මාලය භාර සැත්කම් දොස්තර තැන උස ය, වටකුරු දෙවුරක් ඇති ඔහු මැදිවියේ පසුවන කඩවසම් පෙනුමැත්තෙකි. පාසල් යන කොල්ලකු ප්‍රධානාචාර්යවරයා ඉදිරියේ පෙනී සිටින්නාක් මෙන් සීරුවෙන් සිට ඔහු පිළිතුරු දුන්නේ ය.

"ඊයේ රෝහලට ඇතුළු කරගත්තේ අහස්නියමුවෝ... මේ එක්කෙනාගෙ කකුල සහ දකුණු අත කැඩිල. සෞඛ්‍ය තත්ත්වය සමාන්‍යයි. අර ලෙඩා - ඔහු ඈත ඇඳේ වැතිර සිටින ඇට සැකිල්ලක් වැනි රෝගියකු පෙන්වමින් කතා කළේ ය. රෝගියා දෑස් වසාගෙන නොසෙල්වී වැතිර සිටී- බොහොම අසාධ්‍ය තත්ත්වයක. එයාගෙ දෙපාවල ඇට සියල්ලම පුපුරා කැඩී තියෙනවා. දෙපාවල මස් කුණුවීම නිසා කෝප රෝගයෙන් පෙළෙනවා. එයා හොඳටම කෙට්ටුයි දුර්වලයි. ඒ ලෙඩා ඇට බිඳුණු දෙපා ඇතිව දවස් දහඅටක් තිස්සේ බඩගාමින්, දණ ගාමින් සෝවියට් කඳවුර සෙවූ බව ලෙඩා සමඟ පැමිණි යුද්ධ වෛද්‍ය නිලධාරියා වාර්තා කළා. මම එය ඇත්තක් හැටියට විශ්වාස කරන්නේ නැහැ. ඇත්තෙන්ම එය අතිශයෝක්තියක්"

දොස්තරගේ කතාවට සවන් නොදුන් වසීලියි වසීලෙවිච් රෝගියා වසා ඇති කම්බිලිය ඇර බැලී ය. දෑත් පපුව මත තබාගෙන ඇස් පියාගෙන සිටින අලෙක්සේයි මෙරේස්යෙව්ගේ කළු පැහැති කෙට්ටු අත්, සුදු පැහැති ඇඳ ඇතිරිලි මත වඩාත් හොඳින් කැපී පෙනෙයි. මිනිසෙකුගේ ඇටකටු සෑදි ඇති සැටි ඔහුගෙන් පෙනේ. වසීලියි වසීලෙවිච් මහාචාර්ය තැන ප්‍රවේසමෙන් රෝගියා වසා, දොස්තර වෙත හැරී ප්‍රශ්න කළේ ය.

"මොකද මෙතන තියල තියෙන්නේ?"

"කොරිඩෝරයෙ ඉඩ නැහැ. ඔබ තුමා..."

"ඇති ඇති 'ඔබ තුමා', 'ඔබ තුමා'! හතළිස් දෙවෙනි කාමරේ?" යැයි මහාචාර්යතුමා ප්‍රශ්න කළේ ය.

"ඒ කාමරේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ට"

"ජ්‍යෙෂ්ඨ නිලධාරින්ටද?" මහාචාර්යතුමා ගුගුළේ ය. "මොන මෝඩයද එහෙම වෙන් කළේ. අමන කමක හැටි!"

"සෝවියට් සංගමයේ වීරයන් සඳහා විශේෂ කාමරයක් වෙන් කරන්ට කියල නියම කරල තියෙනව"

"වීරයො, වීරයො මේ යුද්දෙ හැම කෙනෙක්ම වීරයෙක්. තමුසෙ මට උගන්වන්ට හදනවද? මගේ නියමයන්ට අකමැති නම් යන්න පුළුවනි. වහාම මේ ලෙඩ්ඩු දෙන්නව හතළිස් දෙකට ගෙනියනව. ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙ කාමර කියල මෝඩ අදහස් මතු කරන්ට එපා."

වසිලියි වසීලෙවිච් තම පිරිවර දොස්තරුන් සමඟ ඉවත ගිය ද, වහා ම නැවත ඇවිත් අතක් අලෙක්සේයිගේ උරහිස මත තැබී ය. නොයෙකුත් විෂබීජ නාශක බෙහෙත්වලින් සෝදා ඇති ඔහුගේ අත්වල හම රැලි ගැසී ඇත.

"ඇත්තද තමුසෙ සතුරු කඳවුරට පිටුපසින් සුමාන දෙකකටත් වැඩි කලක් බඩ ගා ගෙන ගියයි කියන්නේ?"

"ඇත්තටම මට කෝථ රෝගය හැදිලද?" අලෙක්සේයි මහාචාර්ය වරයාගෙන් ඇසී ය.

වසීලයි වසීලෙවිච් දොර ළඟ නැවතී සිටින තම පිරිවර ජනයා දෙස රවා බැලී ය. අලෙක්සේයිගේ විශාල ඇස් සහිත කැලඹුණු මුහුණ දෙස කෙළින් බැලූ මහාචාර්ය වරයා මෙසේ පැවසීය: "තමුසෙ වගේ කෙනෙකුට බොරු කියන එක පාපයක්. කෝථ රෝගය තමා. අධෛර්ය වෙන්ට එපා. සුව නොකළ හැකි රෝගයක් නැහැ. බලාපොරොත්තු රහිත තත්ත්වයකුත් නැහැ. තේරුණාද? ඔන්න ඔහොම..."

## 2

"ජ්‍යෙෂ්ඨ නිලධාරීන්" සඳහා වූ කාමරය කුඩා එකකි. බිම ඇති සටහන් අනුව බලන විට යුද්ධයට පෙර එහි ඇඳන් දෙකකුත් වට මේසයකුත් කුඩා ලාච්චු මේස දෙකකුත් තිබුණු බව පෙනේ. දැන් මෙහි ගිලන් ඇඳන්

හතරකි. එක ඇඳක වැතිර සිටින රෝගියාගේ මුළු සිරුර ම වෙළුම්පටිවලින් බැඳ ඇත. ඔහු ඒ අනුව මේ දූන් උපන් යෝධ බිළිඳෙකු මෙනි. උඩුබැලි අතට වැතිර සිටින හෙතෙම සීලිම දෙස බලාගත්වනම සිටී. අලෙක්සේයිගේ ඇඳ ළඟ උන් අනික් රෝගියා සිහින් ය. ඔහුගේ මුහුණ පුරා කැළැල් ය. හම රැලි ගැහිලා ය. උඩු රැවුළ සිහින් ය. ඔහු නිතර කතා කරයි. සගයන්ට උදව් වෙයි.

රෝහලක රෝගීහු ඉක්මනින් මිශ්‍ර වෙති. තමා අසල ඇඳේ සිටින රෝගියා සයිබීරියානුවෙකු බවත්, ඔහු සමූහ ගොවිපළක සභාපතිවරයෙකු බවත්, දඩයම් කාරයකු වූ ඔහු යුද්ධ කාලය විසින් සැඟවී වෙඩි තැබීමෙහි දක්ෂයකු බවට පත් කරනු ලැබ ඇති බවත් අලෙක්සේයි දැන ගත්තේ ය. ඔහු සෝවියට් සංගමයේ වීරයෙකි. ඔහු තමාගේ නම කී විට අලෙක්සේයි කුතුහලයකින් යුතු ව ඔහු දෙස බැලී ය. ඔහුගේ නම අතිශයින් ම ප්‍රසිද්ධ ය. ප්‍රධාන පුවත්පත් මේ වීරයා ගැන කතුවැකි පවා ලියා ඇත. රෝහලේ හැම දෙනෙක් ම වාට්ටුව භාර දොස්තරත් මහාචාර්යතුමාත් ඔහු අමතන්නේ ස්තෙපාන් ඉවානොවිච් යන ගෞරව නමිනි.

මේ කාමරයේ හතරවැනි රෝගියා වෙළුම් පටිවලින් බැඳ ඇත. ඔහු වචනයකුදු කතා නොකරයි. හැම දෙයක් ම දන්නා ස්තෙපාන් ඉවානොවිච් ඔහුගේ ඉතිහාසය අලෙක්සේයිට විස්තර කළේ ය. ඔහුගේ නම ග්‍රිගොරි ග්වොස්දේව්ය. යුද ටැංකි හමුදාවේ ලයිතන් කෙනෙකු වූ ඔහු ද සෝවියට් සංගමයේ වීරයෙකි. යුද ටැංකි යුද්ධාභ්‍යාස විදුහලින් උපාධි ලබාගත් හෙතෙම, යුද්ධයේ පළමුවැනි දවසේ සිට ම පෙරමුණ ගෙන සටන් කළේ ය. බොලොස්ටොක් අසල ඇති වූ මහ සටනක දී ඔහුගේ ටැංකිය විනාශ විය. වෙනත් යුද්ධ ටැංකියකට ඇතුළු වූ හෙතෙම ඉතිරි වූ යුද්ධ ටැංකි සමඟ එකතුව මින්ස්ක් නගරය දෙසට පසුබසින පාබළ හමුදාව ආරක්ෂා කළේ ය. බුග් නගරයේ දී කළ සටනින් තම දෙවැනි යුද්ධ ටැන්කිය ද විනාශ වූයෙන්, තෙවෙන වරටත් යුද්ධ ටැංකියක් සොයාගෙන මියගිය ප්‍රධානියකු වෙනුවට යුද්ධ ටැන්කි කණ්ඩායමක් මෙහෙයවීය. ඔහුගේ යුද්ධ ටැන්කි කණ්ඩායම සතුරු හමුදා විසින් වටකෙරිණි. ජංගමශීලී යුද ටැංකි කණ්ඩායමක් සංවිධානය කළ ග්‍රිගොරි ග්වොස්දේව්

මසක් තිස්සේ ම සතුරාට පහර දෙමින් ඔහුගේ ප්‍රවාහන සේවයට හා හමුදාවලට අලාභ හානි සිදු කළේ ය. මේ කණ්ඩායම යුද්ධ ටැංකි තුනකින් යුක්ත විය.

ඔහු දොරොගොබුෂ්හි උපන්නෙකි. යුද පෙරමුණ තම ගම හරහා වැටී ඇති බවත්, එහි සටන් ඇවිළ පවතින බවත් රේඩියෝ මගින් නිකුත් කරන සෝවියට් ඉන්ෆෝම් බියුරෝ පුවත් මගින් දැනගත් ග්‍රිගොරි ග්වොස්දේව් යුද්ධ ටැංකි තුන පුපුරවා දමා ඉතිරි සෙබළුන් අට දෙනාත් කැටුව කැලෑ පාරවල් ඔස්සේ ගොස් සෝවියට් හමුදාවන්ට එකතු විය.

යුද්ධය පටන් ගැනීමට ඔන්න මෙන්න කියා තිබිය දී ග්වොස්දේව්ට නිවාඩු පිට ගෙදර යා හැකි විය. ඔහුගේ මව පාසල් ගුරුවරියකි. ඈ රෝගී වූ බැවින්, ඔහුගේ පියා - පැරැණි කෘෂිකාර්මික විද්‍යාඥයෙකි, ප්‍රාදේශීය සෝවියට් සභාවේ සාමාජිකයෙකි - විදුලි පණිවුඩයකින් ඔහු ගෙන්වා ගත්තේ ය.

ගමේ පාසල අසල තම කුඩා ගෙය ග්වොස්දේව්ට සිහි විය. මිටි, කෙට්ටු සිරුරක් ඇති ඔහුගේ මව ලෙඩ ඇඳේ වැතිර සිටියා ය. පරණ තාලේ කබායක් ඇඳ සිටි පියා මව ළඟ සිටගෙන කහිමින් සහ යටි රැවුලේ රැවුළු ගස් උගුල්ලමින් නොසන්සුන් ව සිටියේ ය. ඈ ළඟ ඔහුගේ නංගිලා තිදෙනකි. පුංචි නංගිලා බෙහෙවින් ම මවට සමාන ය. ගමේ උප දොස්තරවරිය - ජේන්යා ගැන ද ඔහුට මතක් විය. සිහින් සිරුරක් ඇති, නිල් පැහැති නෙත් ඇති මේ කාන්තාව දුම්රියපොළට ඔහු කැටුව ගියා ය. ඇයට දිනපතා ම ලියුම් ලිවීමට ඔහු පොරොන්දු විය.

ගමට පැමිණි ග්වොස්දේව් තමා කිසි දිනෙක බලාපොරොත්තු නොවූ විනාශයක් දුටුවේ ය. තම ගෙය හෝ දෙමාපියන් හා නැගණියන් හෝ ජේන්යා දොස්තරවරිය හෝ ඔහු නොදුටුවේ ය. අඩ සිහියෙන් යමක් දොඩවමින් ගිනි උදුනක් ළඟ සිටගෙන ආහාරයක් පිසින මැහැල්ලක දුටු ග්වොස්දේව් ඈ වෙත ගොස් තම දෙමාපියන් ගැන තොරතුරු විමසුවේ ය. කෘෂිකාර්මික විද්‍යාඥයාගේ බිරිඳ අසාධ්‍ය ලෙස රෝගාතුර වී සිටි බැවින් ඔහුගේ පියාත්, නංගිලා තිදෙනාත් මව අන් තැනකට ගෙන නොගොස් ගමේ ම නැවතුණහ. ඔහුගේ පියා ප්‍රාදේශීය

සෝවියට් සභාවේ සාමාජිකයකු බව දැනගත් ජර්මන්නු මුළු පවුලම ඔහුගේ ගෙය අසල වූ බිරියෝසා ගසේ එල්ලා මරා දමා ගෙයට ද ගිනි තැබූහ. කෘෂිකර්ම විද්‍යාඥයාගේ පවුල බේරා ගැනීම පිණිස ප්‍රධාන ජර්මන් නිලධාරියා හමුවීමට ගිය ජේන්යා දොස්තරවරියට බලහත්කාරකම් කොට ඇයට වධ දී මරා දැමූ බව ද මැහැල්ල කීවා ය. ජර්මන් කාර්යාලය තුළ සිදු වූ දේ තමා නොදන්නා බව කී මැහැල්ල ජේන්යාගේ මළ සිරුර ගඟ අසල දවස් දෙකක් ම තබා තිබුණු බව ඈ කීවා ය.

වචනයකුදු නොකියා කඳුළු බින්දුවකුදු නොසලා මැහැල්ලගේ කතා අසා සිටි ග්වොස්දේව් ආපසු ගියේ ය.

කෝනෙව් සෙනෙවියාගේ යුද සේනා ජූනි මාසයේ දී බටහිර පෙරමුණේ ප්‍රහාරයක් ඇරැඹී ය. ග්රිගෝරි ග්වොස්දේව් අනිකුත් යුද්ධ ටැංකි භටයනුත් සමග එකතුව ජර්මන් පෙරමුණ බින්දේ ය. අගෝස්තු මාසයේ දී ඔහුට නවීන 'ටී-34' වර්ගයේ යුද්ධ ටැංකියක් ලැබිණි. ඊළඟ ශීත ඍතුව වන විට 'සීමාරහිත මිනිසා' යන විරුදාවලිය ලැබීමට ග්වොස්දේව් සමත් විය. ඔහු ගැන විස්තර පුවත්පත්වල පළවන්නට විය. විශ්වාස කළ නොහැකි වුව ද ඇත්තවශයෙන් ම ඔහු කළ වීර ක්‍රියා ගැන කතාවක් ලිව්වේ ය. දවසක් දා රැයෙක ඔත්තු බැලීමට යැවූ විට අධික වේගයකින් තම යුද්ධ ටැංකිය පැද වූ ග්වොස්දේව් මයින් වෙඩි වළලා තිබූ පිටිය හරහා ගොස් සතුරු කඳවුරට වැදී සතුරා බිය ගන්වමින් වෙඩි තැබී ය. සෝවියට් හමුදා විසින් අඩක් වට කරන ලද ගමකට වැද සතුරාට තදබල ලෙස අලාභ හානි කොට සෝවියට් හමුදාවන්ට නැවත එක් විය. ජංගමශීලී ටැන්කි හමුදාවක සේවය කළ ග්වොස්දේව් සතුරු කඳවුරකට වැදී ඔවුනගේ ප්‍රවාහන හමුදාවක අසුන්ට, සෙබළුන්ට හා යුද්ධායුධවලට මහත් අලාභ හානි කළේ ය.

ශීත සමයේ දී ඔහුගේ යුද්ධ ටැංකි කණ්ඩායමක් ර්ෂෙව් නගරය අසල ජර්මන් හමුදා කඳවුරකට පහර දුන්නේ ය. ර්ෂෙව් අසල ගමක ආරක්ෂක ස්ථාන පසු කර යද්දී ග්වොස්දේව්ගේ යුද්ධ ටැංකියට ගිනි ගන්නාසුලු ද්‍රව්‍ය පිරවූ බෝතලයකින් ගැසුවේ ය. යුද්ධ ටැංකිය පුරා ගිනි ඇවිළී ගිය ද, ග්වොස්දේව් සහ ඔහුගේ භට පිරිස දිගට ම

සටන් කළහ. ජර්මනුන්ගේ වටලෑමකින් ග්වොස්දේව් සමග ගැලවී ආ මේ පිරිස දැන් දැන් තම යුද්ධ ටැන්කියේ පැට්රල් ටැංකිය හා වෙඩි බෙහෙත් කාමරය පුපුරා ගොස් සියලු දෙනා ම නැසෙන බව දැන දැනත් අභීත ව සටන් කළ හ. ඇවිළෙන ගිනි හා දුම් නිසා ඔහුන්ට ආශ්වාස ප්‍රශ්වාස කිරීමට අපහසු විය. ගිනිගෙන ඇති යුද්ධ ටැන්කියේ උෂ්ණය නිසා ඔහුන්ගේ ඇඳුම් ද හම ද පිලිස්සුණ ද ඔවුහු සතුරාට පහර දීම නොනැවැත්වූ හ. සතුරු වෙඩි පහරට අසු වූ යුද්ධ ටැන්කිය උඩු යටිකුරු වී පෙරළිණි. පිපිරීම නිසා හෝ වැලි සහ හිම කුණාටුව නිසා හෝ යුද්ධ ටැන්කියේ ගිනි නිවිණි. ග්වොස්දේව් යුද්ධ ටැන්කියෙන් පිටතට ඇදගත් විට, ඔහු මියගිය කාලතුවක්කු භටයා වෙනුවට වෙඩි තබමින් සිටියේ ය. ඔහුගේ මුළු සිරුර ම ගින්නට හසු වී පිලිස්සී තිබිණි.

දෙමසක් ම ඔහු මාරයා ඉදිරිපිට සටන් කළේ ය. ඔහුට සුවය ලැබෙතියි කිසිවෙක් නොසිතූ හ. සමහර විට, දින ගණනක් ම ඔහු වචනයකුදු කතා නොකළේ ය.

බරපතළ ලෙස තුවාල ලැබුවන්ගේ ලෝකය රෝහලේ බිත්ති හතරට පමණක් සීමා වෙයි. අසීරු, විඩාපත් කරවන මේ කාලය තුළ දී ඔහු තම ගිලන් ඇඳ මත වැතිර ගෙන කල්පනා කළේ තුවාලය ගැන ය. ඔහුට සිහිනෙන් පවා තම තුවාල වණ සහ බිඳුණු ඇට කටු පෙනිණි. තින්දෙන් පිබිදෙන ඔහු තුවාල සුව වී ඇත්ද, ඉදිමීම අඩු වී ඇත්ද උණ බැස ඇත්දැයි සොයා බලයි. නිදි නැතිව ඇඳ මත වැතිර සිටින ඔහුට කුඩා ශබ්දයක් පවා මහා ඝෝෂාවක් මෙන් ඇසේ. නිතර ම තම රෝගය හා තුවාල ගැන සිතන නිසා සුළු වේදනාවක් මෙන් ඇසේ. නිතර ම තම රෝගය හා තුවාල ගැන සිතන නිසා සුළු වේදනාවක් පවා තියුණු වේදනාවක් මෙන් දැනේ. යුද්ධයේ දී මරණ බිය කුමක් ද යන්න නොදැන අභීත ව සටන් කරන යුද භටයන් පවා රෝහලේ බිත්ති හතරට මැදි වූ පසු මෙලෙස තම රෝගයන් ගැන සැක කරමින්, ප්‍රධාන දොස්තර තම රෝගය ගැන කියන විට, ඔහුගේ කටහඬේ වෙනස් වීමක් ඇති වී තිබේද, ඔහුගේ මුහුණේ පෙනුම වෙනස් වී ඇත්තේ තම රෝග යේ බරපතළ තත්ත්වය නිසා යැයි ද සිතමින් තැවෙති.



අලෙක්සේයි තම මානසිකා හා ශාරීරික වේදනාවන් හෙළි නොකළේ ය. තම රෝගය ගැන දොස්තරවරුන් කරන කතාබහ නොසලකන බවක් ඇඟවීය. ප්‍රතිකාර කිරීම සඳහා ඔහුගේ දෙපාවල ඔතා ඇති වෙළුම්පටි ඉවත් කරන හැම වාරයක දී ම දෙපාවල කෝථා රෝගය හඳුන්වන දම්පාට වඩාත් පැතිර ගෝස් ඇති සැටි දකින අලෙක්සේයි බිය වන්නේ ය.

ඔහු නොසන්සුන් විය. ක්‍රමානුකූල ලෙස ලැබෙන පෝෂ්‍යදායක ආහාර නිසා ඔහුගේ පොදු සෞඛ්‍ය තත්ත්වය මඳක් යහපත් විය. පුහුණුව ලබන දොස්තරවරු පෙර මෙන් ඔහු දකින විට බිය නොවෙති. පොදු සෞඛ්‍ය තත්ත්වය යහපත් වන අතර, ඔහුගේ දෙපාවල තත්ත්වය වඩාත් අයහපත් විය. ඇස්වටය දක්වා හම දම්පැහැ ගෙන ඇත. දෙපාවල ඇඟිලිවලට වේදනාව හෝ ස්පර්ශය හෝ නොදැනේ. ඉඳිකටුවලින් ඇඟිලිවලට ඇන්නේ ය. දෙපයේ හම සිදුරු කර ගෙන ඉඳිකටු මස තුළට කාවැදුණ ද ඔහුට වේදනාව නොදැනේ. රෝගය ඉහළට පැතිරයාම වළක්වාලීමට වෛද්‍යවරු සමත් වූහ. වේදනාව දියුණු තියුණු වූයෙන් ඉවසා සිටීමට බැරි විය. කොට්ටයට මුහුණ ඔබා ගන්නා අලෙක්සේයි දිවා කාලයේ නිහඬ ව වැතිර

සිටී. රාත්‍රි කාලෙය් දී වාට්ටුව භාර හෙදිය වන ක්ලාව්දියා මිහයිලොව්නා වේදනා නාශක මෝපියා බෙහෙත විද්දා ය.

"දෙපා කපා දැමීමේ" සැත්කමක් ගැන දොස්තරවරු නිතර කතා කරන්නට වූ හ. වසීලියි වසීලෙවිච් සමහර දාට අලෙක්සේයිගේ ඇඳ ළඟට වී ප්‍රශ්න කරයි.

"කොහොමද කකුල් දෙක කපා දමමුද? කැපුවා සනීප කළා"

අලෙක්සේයි ගල් ගැසුණාක් මෙන් නිහඬ වෙයි. දත්මිටි කමින් හේ හිස සලයි. මහාචාර්වරයා නොසතුටකින් මුමුනයි.

"ඉවසපන්, ඉවසපන් මෙන්න මේ බෙහෙතත් කරමු." යි කියන හෙතෙම තවත් ප්‍රතිකාර නියම කරයි.

ඔහුගේ කාමරයේ දොර වැසිණි. මහාචාර්යවරයා ප්‍රධාන දොස්තරවරුන් ඉවත යන සැටි ඇසිණි. දෑස් වසාගෙන සිටි අලෙක්සේයි කල්පනා කළේ ය. "මගේ කකුල්, මගේ කකුල්" උපන් ගමේ බඩු කරත්ත දක්කන අර්කාෂා මාමා මෙන් මාත් සදහට ම අබ්බගාතයෙකුව ලී කරුවල ආධාරයෙන් ගමන් කරන්ටද? අර්කාෂා මාමා නාන්ට යන විට බොරු කකුල් ගලවා දමා දෑතින් ගඟට පනින්නේ වඳුරකු මෙනි.

මේ වේදනාව වැඩිවීමට තවත් හේතුවකි. රෝහලට ඇතුළු වූ පළමු දවස්වල දී ම තම උපන් ගමෙන් -කමීෂින්වලින් ලියුම් කීපයක් ම ඔහුට ලැබිණි. අම්මා එවූ ත්‍රිකෝණ ලියුම්[1] හැම එකක් ම එක සමාන ය. ඒවායින් අඩක් නෑයන්ගේ සුබ පැතුම් ය. ගෙදර කටයුතු ගැන කලබල නොවන ලෙස අම්මා පුතුට දැන්වීම ය. ඉතිරි කොටස පුතුට අවවාදයන් ය. සෙම්ප්‍රතිශ්‍යාව හදාගන්ට එපා. දෙපා තෙමන්න එපා. භයානක තැන්වලට යන්න එපා. සතුරා කපටි කෛරාටික බව අමතක කරන්ට එපා. ප්‍රවේසම් වන්න.

නිල් පැහැති ලියුම්කවරවල ලොකු අකුරෙන් ලිපිනය සඳහන් කර ඇත. ඒවා අලෙක්සේයි සමඟ තරුණ වියේ සිට එක පන්තියේ ඉගෙනගත් ඔල්ගාගෙනි. ඈ දැන් කමීෂින්ස්ක් දැව කම්හලේ කාර්මික

---

1 ලියුම් කවරය රහිතව යුද්ධ කාලයේදී මෙලෙස ලියුම් යැවූහ.



ශිල්පිනියක ලෙස වැඩ කරන්නී ය. යුද්ධයට පෙර ඔහු එහි ලෝහ ඉංජිනේරු ශිල්පියකු මෙන් වැඩ කළේ ය. ඔල්ගා ඔහුගේ ළමාවිය සිහිකරවන මිතුරියක් පමණක් නොවූවා ය. ඇගේ ලියුම් අමුතු ය. විශේෂ ය. ඔහු ඇගේ ලියුම් කීප වාරයක් ම කියැවී ය. පැහැදිලි වචනවල පවා සැඟවී ගත් අරුත් සෙවීමට වෙහෙස වූ අලෙක්සේයි නැවත නැවතත් වචන කියැවී ය.

ඈ ගෙදර පවා නැවිත් කම්හල තුළ ම නිදාගනිමින් එහි ම නැවතී වැඩ කරන බවත්, දන් කම්හල කොතරම් වෙනස් වී තිබේ ද යත්, ඔහුට එය හඳුනා ගැනීමට පවා අපහසු බවත්, කම්හල නිපදවන භාණ්ඩ ගැන ඇසුවොත් ඔහු ප්‍රීතියෙන් පිනා යන බවත් ඈ අලෙක්සේයිට ලියුවා ය. ඉඳහිට, එනම් මසකට වරක් නිවාඩු ලැබුණු විට ඈ

ඔහුගේ අම්මා බැලීමට යන බවත්, මහලු ඇගේ සෞඛ්‍ය තත්ත්වය අයහපත් බවත්, ඔහුගේ වැඩිමහලු සොයුරන් ලියුම් නොලියන බවත්, පසුගිය දිනවල සිට ඔහුගේ මව නිතර නිතර අසනීප වන බවත් ඔල්ගා අලෙක්සේයිට දන්වූවා ය. නිතර අම්මාට ලියුම් ලියන ලෙස ඉල්ලා සිටි ඔල්ගා ඔහුගේ කරදර හා අමාරුකම් ගැන ඈට නොලියන ලෙස දන්වා සිටියේ පුතා දූන් අම්මාගේ එක ම ප්‍රීතිය බව මතක් කරවමිනි.

දොස්තරවරු වැඩි වැඩියෙන් "දෙපා කපා දැමීමේ" සැත්කම ගැන කතා කරන්නට පටන් ගත්හ. අලෙක්සේයිට මේ වචනය බිය ගෙන දුන්නේ ය. ඔහුට දෙපා නැති අබ්බගාතයකු ලෙස කමීෂින්වලට යාමට සිදුවේ ද? දෙපා නැති තමා ඔල්ගා ඉදිරියෙහි පෙනී සිටින්නේ කෙසේ ද? අලෙක්සේයිගේ වැඩිමහලු සොහොයුරෝ හැම දෙනෙක් ම යුද්ධයේ දී මිය ගියෝ ය. අම්මා දූන් බාල පුතා ගෙදර එනතුරු බලා සිටින්නී ය. ඇය කනස්සල්ලට පත්කිරීම ද නොකළ යුත්තකි.

"දෙපා කැපීම? නැහැ එයට ඉඩ දෙන්නේ නැහැ! මරණය වඩා හොඳයි. කපා දැමීම කොතරම් නපුරු වචනයක් ද? කොහොමවත් ඒකට ඉඩ නොදෙමි!" යි අලෙක්සේයි සිතා ගත්තේ ය.

මවගෙන් හා ඔල්ගාගෙන් ඇත්ත සැඟවීමට තීරණය කළ, අලෙක්සේයි තමා දූන් වෙනස් කොටසකට - නිසල පෙදෙකට මාරු කොට ඇති බවත්, එම කොටස් විශේෂ කටයුතු භාර ව සිටින බැවින් තව සෑහෙන කාලයක් එහි සේවය කරන බවත් ලියුවේ ය. ලිපිනය වෙනස් වීම ගැන කලබල නොවීම පිණිසය ඔහු එසේ ලීවේ.

## 3

අංක 42 වාට්ටුවේ රෝගීන් සතර දෙනා සතියක් එහි විසූහ. එක් දවසක් ඔවුන් වෙත පැමිණි ක්ලාව්දියා මිහයිලොව්නා ඔවුන්ගේ වාට්ටුවට තවත් රෝගියකු ඇතුළු කරන බැවින් තරමක තදබදයක් ඇති වන බව දන්වා සිටියා ය. ඈ සමඟ පැමිණි සේවකයන් දෙදෙනා ඇඳන් එහා මෙහා කරමින් තවත් ඇඳකට ඉඩ සොයාගත්හ. ස්තෙපාන් ඉවානොවිච්ගේ ඇඳ ජනේලය

ළඟට ගෙන ගියේ ඔහු සතුටු කරවමිනි. කුකුෂ්කින් ඔහු අසල තැබුවේ ය. හිස් තැන ඇඳක් පිළියෙල කළේ ය.

එවිට ම වාගේ පස්වෙනි රෝගියා ගෙන ආහ.

ඔහු තරබාරු රෝගියෙකි. ගිලන් මැස්ස ඔහුගේ බර නිසා 'ක්‍රික්' යන හඬක් නැගී ය. ගිලන් මැස්ස ඔසවාගෙන ආ සාත්තු සේවකයෝ සෙමෙන් පා තබමින් ගමන් ගත්හ. වැතිර සිටින රෝගියාගේ මුහුණ ඒ මේ අත වැනිණි. ඉදිමී ඇති ඒ මුහුණ ඉටි රුවක් මෙන් පණ නැති ය. සුදුමැලි දෙතොල වේදනාව කියා පෑවේ ය.

රෝගියා සිහිසන් නැතිවාක් මෙනි. එහෙත්, ගිලන් මැස්ස බිම තැබූ විගස ම රෝගියා ඇස් ඇර වැළමිටි වාරුවෙන් හිස ඔසවා රෝගීන් දෙස බලා ස්තෙපාන් ඉවානොවිච් දෙස බලමින් ඉඟි මැරුවේ 'ජීවිතය එතරම් නරක නැහැ' කියන්නාක් මෙනි. ඉන් පසු ඔහු කැස්සේ ය. ඔහුගේ ස්ථූල ශරීරය දරුණු පහරවලට ගොදුරු වී ඇති බැවින් ඔහුට තියුණු වේදනාවක් දැනිණි. යම් කිසි හේතුවක් නිසා මේ අලුත් රෝගියා ගැන අලෙක්සේයි තුළ ඇති වූයේ නොසතුටකි. සේවකයන් දෙදෙනා සහ හෙදිය රෝගියා උස්සා ඇඳ මත තබන සැටි ඔහු බලාසිටියේ ය. ලී කොටයක් මෙන් පණ නැති ඔහුගේ කකුල නුහුරු අතට හැරෙත් ම, ඔහුගේ මුහුණ වේදනාවෙන් ගැහෙන්නට විය. දෙතොල් වෙව්ලා කට ඇද විය. වේදනාව උසුලා ගත නොහැකි ව ඔහු දත්මිටි කෑවේ ය.

මොහොතකට පසු තම ඇඳ ඇතිරිලි මනා සේ සකස් කරගත් හෙතෙම, ඇඳ අසල ඇති කුඩා අල්මාරියේ තම පොත්, සටහන් පොත්, දත් බෙහෙත්, ඕඩිකොලොන් බෝතලය, රැවුල බාන උපකරණ ආදිය නිසි ලෙස තැබී ය. තමා ගෙනා සියලු දේ නියම ලෙස තැබී දැයි බලන්නාක් මෙන් අල්මාරිය දෙස බැලී ය. ඉන් පසු හෙතෙම ගොරෝසු කටහඬකින් කතා කළේ ය.

"හොඳයි අපි හඳුනාගනිමු. සේනාංකයක දේශපාලන කොමසාරිස් සෙමේන් වොරබියොව්. තමුසෙලගෙ කණ්ඩායමට මාවත් ඇතුළු කර ගන්න. මම සාමකාමී. දුම් නොබොන පුද්ගලයෙක්."

ඔහු සන්සුන් ලෙස වාට්ටුවේ රෝගීන් දෙස බැලී ය. ඔහුගේ බැල්ම ප්‍රවේසම්කාරී පරීක්ෂාකාරී බවත්, ඔහුගේ

රන්වන් නෙත් තියුණු නිරීක්ෂකයන් බවත් ඔහු දෙස බැලූ මෙරේස්යෙව් දුටුවේ ය.

"මම මෙහෙ ආවෙ ටික කාලෙකට. අනික් අය ගැන මට කියන්න බැහැ. මගේ අසරු සේනාංකය මා එනතුරු බලන් ඉන්නවා. හිම දිය වෙලා පාරවල් වේළුණාම ගියා...

"අපි කවුරුත් එහෙම තමා. හිම දියවුණ හැටියෙම පාද පෙරට තබා නොම්මර පනහෙ වට්ටුවට යනවා." යැයි කී කුකුෂ්කින් බිත්තිය පැත්තට හැරුණේ ය.

රෝහලේ අංක පනහ දරන වාට්ටුවක් නැත. එනමින් රෝගීන් හඳුන්වන්නේ මිනී කාමරය ය. කොමසාරිස් ඒ ගැන තව ම නොදනගත්ත ද, කුකුෂ්කින් කනගාටුදායක මනෝභාවයකින් පසුවන බව තේරුම් ගත්තේ, අමනාප නොවී විස්මයෙන් යුතු ව කුකුෂ්කින් දෙස බලමින් මෙසේ ඇසී යඃ

"යාළුවා තමුසෙට වයස කීයද? යටි රැවුළ පැහිලා! තමුසෙ අකලට නාකිවෙලා"

## 4

රෝගීන් විසින් කොමිසාර් වශයෙන් හඳුන්වනු ලැබූ මේ රෝගියා නිසා අංක හතළිස් දෙකේ වාට්ටුවේ ජීවිතය වෙනස් විය. දෙවැනි දවසේ දී සියලු රෝගීන් හඳුනාගෙන කතාබහ කරන්නට පටන් ගත් කොමිසාර්, පසු ව ස්තෙපාන් ඉවානොවිච් කී පරිදි 'හැම කෙනෙකුගේ ම හදවතට සරිලන යතුරු' සොයා ගැනීමේ දක්ෂයෙක් විය.

ඔහු ස්තෙපාන් ඉවානොවිච් සමඟ අසුන් ගැනත්, දඩයම් කිරීම ගැනත් කතා කළේ ය. මේ අංශවල විශේෂඥයන් වූ මේ දෙදෙනාට අසුන්ට හා දඩයම් කිරීමට ආසා කළහ. යුද්ධය පිළිබඳ ව දර්ශනවාදී ලෙස කතා කිරීමට කැමැති මෙරේස්යෙව් සමඟ හෙතෙම අහස්යානා, යුද්ධ ටැංකි හා අසරු හමුදාව ගැන ද වාද විවාද කළේ ය. අහස්යානාව සහ යුද්ධ ටැන්කි අතිශයින් ම ප්‍රයෝජනවත් ය. අසරු හමුදාව යල්පැන ගිය අවියක් ලෙස සැලකීම වැරැදි ය. අසරු හමුදාවට නවීන අවි ආයුධ සපයා, පළපුරුද්ද ඇති පැරැණි සෙනෙවියන්ට දක්ෂ තරුණ සෙනෙවිවරුන් පුහුණු කිරීමට ආධාර දුන්නොත්, අපේ අසරු හමුදාව ලොව මවිත කරවනු ඇතැයි කොමිසාර්

කියා සිටියේ ය. ගොළුවත රකින යුද්ධ ටැන්කි භටයා සමඟ කතා කිරීමට ද ඔහු සමත් විය. ඔහු දේශපාලන කොමසාරිස් ධුරය දැරූ ඩිවිෂනය යාර්ට්සෙව්හි සටන් කළේ ය. පසු ව කොනෙව් සෙනෙවියාගේ සුප්‍රසිද්ධ ප්‍රතිප්‍රහාරයේ දී එම ඩිවිෂනය ද සහභාගි විය. යුද්ධ ටැංකි සෙබළා ද තම යුද්ධ ටැංකි සෙබළ පිරිස සමඟ එක්ව සතුරු වටලෑම බිඳගෙන සෝවියට් හමුදා සමඟ එක් වූයේ මෙතැන දී ය. කොමිසාර් තැන මහත් උනන්දුවකින් යුතු ව ඒ ප්‍රතිප්‍රහාරයේ දී මුදාගත් ගම් නියම්ගම්වල නම් සහ පැසිස්ට් සතුරා ලැබූ අලාභහානි ගැන විස්තර කළේ ය. යුද්ධ ටැංකි සෙබළා ද ඒ ගම් හා නියම් ගම් හොඳින් දනී. පෙර මෙන් ම, ඔහු නිහඬ ව සිටිය ද, බිත්තිය පැත්තට මුහුණ හරවා නොගනිමින් කොමිසාර්ගේ කතාවට සවන් දුන්නේ ය. මුහුණ වසා ඇති වෙළුම් පටි නිසා ඔහුගේ විලාසය නොපෙනුණ ද ඔහු හිස වැනී ය. තමා සමඟ චෙස් දාම් ඇදීමට එන ලෙස කොමිසාර් කුකුෂ්කින්ට යෝජනා කළ විට නිතර රොස් වී සිටි අහස්නියමුවා තුටු විය. චෙස් දාම් ලෑල්ල තිබුණේ කුකුෂ්කින්ගේ ඇඳ මත ය. කොමිසාර් තැන 'දෑස් වසාගෙන' එම දාම් ඇද්දේ ය. ලෙහෙසියෙන් ම කොමිසාර් ජය ගත් බැවින් කුකුෂ්කින් ඔහු සමඟ සදහට ම මිත්‍ර විය.

කොමිසාර්ගේ පැමිණීම රෝහල් සේවිකාව සෑමදා ම වාට්ටුවේ ජනේලය හරින විට ඇතුළු වන වසන්ත සුළඟට සමාන විය. වාට්ටුවේ අහිතකර නිහඬතාව බිඳගෙන ඇතුළු වන වීදියෝ ඝෝෂාවට සමාන විය. මෙවැනි යහපත් වාතාවරණයක් ඇති කිරීමට ඔහු ආයාසයක් නොදැරී ය. ඔහු චාම් ලෙස පූර්ණ ජීවිතයක් ගත කළේ ය. සතුටු සිතින් කතාබහ කළේ ය. රෝගය නිසා හටගත් බලවත් වේදනාව ඔහු අමතක කළේ ය. නැතිනම් අමතක කර දැමීමට උත්සාහ කළේ ය.

හැමදා ම උදෑසන ඇඳ මත වාඩි වන කොමිසාර් දෑත් ඔසවමින් සිරුර වම් අතට සහ දකුණු අතට නවමින්, බෙල්ල හරවමින් අභ්‍යාස කළේ ය. මුහුණ සේදීම පිණිස වතුර ගෙනැවිත් දුන් විට, ඔහු හැමදා ම ශීතල වතුර ඉල්ලා සිටී මුව, බෙල්ල සහ පපුව සෝදා ගන්නා හෙතෙම ඉදිමී ඇති තම කහ පැහැති සිරුරේ හම රත් පැහැ

වන තුරු තුවායකින් පිරිමදී. කොමසාරිස් දෙස බලන අනිකුත් රෝගීහු ද ඔහු අනුකරණය කිරීමට කැමැත්තක් දක්වූහ. පුවත්පත් ගෙනා විගස ඒවා ගන්නා කොමසාරිස් පළමුවෙන් ම සෝවියට් ප්‍රවෘත්ති බියුරෝව විසින් නිකුත් කරනු ලබන යුද්ධ ප්‍රවෘත්ති හඬ නගා කියවයි. පසු ව හැම යුද්ධ වාර්තාවක් ම කියවයි. ඔහු කලාත්මක ලෙස හඬ නගා කියවීමෙහි හපනෙකි. තමා කැමැති යම් කිසි වැකියක් දුටු විට ඔහු හඬ නගා කියවා පසු ව සෙමින් නැවත වරක් එය කියවා 'ඒක හරි' යැයි මුමුනයි. හිටි හැටියේ ම ඔහු කෝපයෙන් කෑ ගසයි. 'බොරුකාරයා! බල්ලා! මේ වාර්තාකාරයා යුද පෙරමුණට නොගිය බවට ඔට්ටු අල්ලන්නම්. මගේ ඔළුව හිස් බීර බෝතලයකට. අලි හොරා! ඒ වුණාට වාර්තා ලියනව" එවැනි වාර්තාකාරකුට විරුද්ධ ව ඔහු වරක් පුවත්පත් කතුවරයාට ලියා යැවී ය. එම වාර්තාවේ සඳහන් දේ යුද්ධයේ දී නොවන බැවින් එවැනි බොරු වාර්තාවලට ඉඩ නොතබන ලෙස ඉල්ලීමක් කළේ ය. සමහර දවස්වල දී යුද්ධ වාර්තාවක් කියවන හෙතෙම කල්පනා කිරීමට පටන් ගනියි. නැතිනම් තම අසරු සේනාංකය ගැන රසවත් කතාවක් කියයි. ඔහුගේ අසරු හටයෝ හැම එකෙක් ම වීරයෝ ය. පසු ව ඔහු නැවත කියවයි.

දවසකට දෙපැයක් ප්‍රතිකාර කිරීමේ හා දවල් ආහාරය අතරතුර ඔහු ජර්මන් බස ඉගෙන ගත්තේ ය. වචන පාඩම් කිරීම හා කෙටි වැකි ආදිය තැනීම කළේ ය. යම් කිසි වචනයක් කටපාඩම් කරමින් සිටින ඔහු මෙසේ කියයිඃ

"තමුසෙල දන්නවද ජර්මන් බසින් කුකුළු පැටියට කියන නම? ක්යූහෙල්හෙන්. අපූරුයි නෙවෙද? ක්යූහෙල්හෙන් කිව්වම යම් කිසි පුංචි පුලුන් ගොඩක් වැනි මෘදු දෙයක් සිහියට නැඟෙනව. පුංචි සීනුවට ජර්මන් බසින් කියන්නේ ග්ලෙක්ලිංග්. හඬ ඇති වචනයක් නේද?"

ස්තෙපාන් ඉවානොවිච්ට ඉවසුම් නැති විය.

"මොකටද කොමිසාර් සහෝදරය ඔය ජර්මන් ඉගෙන ගන්නෙ? ඔහෙ නිකරුණේ මහන්සි වෙනව. ශක්තිය ප්‍රවේසම් කර ගන්න..."

කොමිසාර් මහලු සෙබළා දෙස කපටි බැල්මක් හෙළී ය.

"අනේ සුදු රැවුළො! ඔහොමත් පුළුවන්ද රුසියානුවන්ට ජීවත් වෙන්න. අපි බර්ලිනය අල්ලගත්තම ජර්මන් ගෑනුන් එක්ක කතාකරන්නෙ මොන බාසාවෙන්ද?"

ස්තෙපාන් ඉවානොවිච් විරුද්ධ වීමට සූදානම් වුණ ද - යුද පෙරමුණ දැන් මොස්කව් අසල ය. එය බර්ලිනයෙන් බොහෝ ඈත ය- කොමිසාර්ගේ විශ්වාසදායක වචන නිසා මුල් අදහස වෙනස් කර ගනිමින් මෙසේ පැවසී යඃ

"ඒක නම් එහෙම තමා. ඒ වුණත් කොමිසාර් සහෝදරයා ඔය තරම් බරපතළ රෝගයකින් පස්සෙ මහන්සිවීම හොඳ නැහැ නෙව"

"ඕනෑවට වැඩියෙ පරිස්සම් කරන අශ්වයා ඉක්මනට බිම වැටෙනවා කියන කතාව අහල නැතිද? රැවුළො තමුසෙ මට දෙන උපදෙස් හොඳ නැහැ"

වාට්ටුවේ රෝගීන් රැවුළු නොවැව්ව ද, කොමිසාර් ඔවුන්ට 'රැවුළා' යැයි අමතයි. ඔහු එසේ කියන්නේ අපහාස කිරීමට නොවේ. කවටකමට මෙනි. හැම කෙනෙක් ම ඒ නිසා සතුටු වූහ.

අලෙක්සේයි නිතර සුපරීක්ෂාකාරී ලෙස කොමිසාර් දෙස බැලුවේ ය. කොමිසාර් උග්‍ර වේදනාවකින් පසුවන බව නොරහසකි. ස්වයං පාලනයෙන් මිදුණු හැටියේ ම ඔහු වේදනාවෙන් කෑ ගසයි. දත්මිටි කමින් සුසුම්ලයි. වේදනාවෙන් සැලෙයි. තම දුබලකම ගැන දන්නා කොමිසාර් දිවා කාලයේ දී නොනිදා යම් කිසිවක් කරයි. නින්දේ දී වේදනාවෙන් කෑ ගසන කොමිසාර් අවදි වූ විගස ම සන්සුන් ලෙස හැසිරෙයි. කිසිදු වේදනාවක් නොතිබුණාක් මෙනි. දොස්තරවරු ඔහු පරීක්ෂා කරන විට ඔහුට තියුණු වේදනාවක් දැනුණ ද, ඔහු පිටතට නොපෙන්වයි. අත් නුහුරු අතට පෙරළී තිබෙන සැටියෙන් හා නළලෙන් කඩා වැටෙන ඩහදිය බින්දුවලින් ඔහුගේ වේදනාව දැන ගත හැකි ය. මෙතරම් උග්‍ර වේදනාවකින් පෙළෙන මේ මිනිසා ඒ සියල්ල යටපත් කරගෙන සිනා මුහුණෙන් හා සතුටු සිතින් ඉන්නේ කෙසේ ද යන්න වටහා ගැනීමට අලෙක්සේයි අපොහොසත් විය. කොමිසාර්ට වැඩි වැඩියෙන් නිදි වින්දන බෙහෙත් දුන්න ද, ඔහු නොනිදා වේදනාව ඉවසා ගත නොහී බ්ලැන්කේට්ටුවේ

කොනක් සපමින් රෑ ගත කරන සැටි දුටු අලෙක්සේයිට මෙය ප්‍රහේලිකාවක් විය.

## 5

ඒ දවස ළඟා විය. වසීලි වසීලෙවිච් ප්‍රධාන දොස්තර තැන එදින බොහෝ වේලාවක් යන තුරු ම අලෙක්සේයිගේ දෙපා පරීක්ෂා කළේ ය. ඒවාට ස්පර්ශ සහ වේදනාව නොදැනේ. 'කපල දාන්ට ඕන' යැයි අවසානයේ දී නැඟී සිටි හේ කීවේ ය. අලෙක්සේයි මළගිය ඇත්තකු මෙන් මලානික විය. ඔහු පිළිතුරු දීමට පෙර නැවත වසීලි වසීලෙවිච් මෙසේ කීය: "කපල දාන්ට ඕන. වචනයකින් වත් විරුද්ධ වෙන්ට එපා. නැතිනම් නුඹ මැරිල යාවි. මා කියන දේ නුඹට තේරුණාද?"

වසීලියි වසීලෙවිච් තම පිරිවර දෙස නොබලා වාට්ටුවෙන් පිට විය. දැඩි නිහඬතාවකි. අලෙක්සේයි මෙරේසියෙව් ගල් ගැසුණාක් මෙන් වැතිර සිටී. ඔහුගේ නෙත් විවර ව ඇත. ඔහු ඉදිරියේ අබ්බගාත බෝට්ටු පදවන්නාගේ රුව මැවී පෙනේ. ඇඳුම් ගලවා දමූ ඒ මිනිහා වඳුරකු සේ දෑතින් යමින් ගඟට බට සැටි ඔහුට නැවත සිහි විය.

"අලෙක්සේයි!" කොමිසාර් සෙමින් කතා කළේ ය.

"මොකද?" යි අලෙක්සේයි ඇසුවේ බොල් හඬකිනි.

"නොකර බැහැ අලෙක්සේයි"

නැවත ඔහුගේ මනැස ක්‍රියාකරී විය. දෙපා නැති අබ්බගාතයෙකු වන තමා වඳුරකු සේ දෑතින් යමින් වතුරට පනී. තම පෙම්වතිය ඔල්ගා ලස්සන ගවුමකින් සැරසී ගං ඉවුරේ සිටින්නී ය. ඈ අද වෙනදාටත් වඩා සුන්දර ය. රූමත් ය. ඔහු දෙස බලන ඈ නොසන්සුන් ව යටි තොල සපන්නී ය. ඇත්තට ම ඒ විදිහට ම තමා යැයි තමාට ම කියාගත් අලෙක්සේයි නිහඬ ව සුසුම් ලෑවේ ය. කොට්ටයට මුහුණ ඔබාගත් හෙතෙම වැලපුණේ ය. අමාරුවෙන් නැඟී සිටි ස්තෙපාන් ඉවානොවිච් කබාය පොරවාගෙන සෙරෙප්පු දෙක පය ලාගෙන සෙමින්, සෙමින් අලෙක්සේයිගේ ඇඳ ළඟට ආවේ ය. එහෙත්, කොමිසාර් ඔහුට බාධා කරමින් අතක් වැනී ය. "එයාට

බාධා කරන්න එපා. අඬන්ට ඉඩ හරිනව"

අලෙක්සේයිට පහසු බවක් දැනිණි. බොහෝ කාලයක් තිස්සේ තමන්ට වේදනාව ගෙන දුන් යම් කිසි ගැටලුවක් නිරාකරණය කළ පසු ඇතිවන සැහැල්ලු ගතිය හා සතුට ඔහු තුළ ද ඇති විය. සවස සුව සේවකයන් ඔහු සැත්කම් කාමරයට ගෙන යාමට පැමිණෙන තුරු ම ඔහු නිහඬ ව සිටියේ ය. කිරිපැහැති පිඟන් කැටවලින් බබළන සැත්කම් කාමරයේ දී ද ඔහු වචනයකුදු කථා නොකළේ ය. ඔහුගේ හෘදය වස්තුව දුර්වල බැවින් වේදනා නාශක බෙහෙත් ආශ්වාස කිරීමට හා නහරගත කිරීමට නොහැකි බව ඔහුට දැන්වී ය. දෙපා හිරිවට්ටන බෙහෙත් පමණක් විද සැත්කම කිරීමට කැමැති දැයි ඔහුගෙන් ඇසූ විට, ඔහු හිස වැනී ය. සැත්කම කරගෙන යද්දී ඔහු කෙඳිරි නොගෑවේ ය. වේදනාව නිසා කෑ නොගැසී ය. අමාරු නොවන ඒ සැත්කම -දෙපා කපා දැමීම වසීලියි වසීලෙවිච් විසින් ම කරන ලදි. ඔහු කීප වරක් ම තර්ජනාත්මක ලෙස තම හෙදියන් හා දොස්තරවරුන් දෙස බැලී ය. වේදනාව නිසා රෝගියා මිය ගියා දැයි බලන ලෙස ඔහු කීප වරක් ම දොස්තරවරුන්ට අණ කළේ ය.

දෙපයේ හම, නහර, ස්නායු හා මස් කපා වෙන් කොට කටු කැපීමට දැති සහිත පිහිය පාවිච්චි කරද්දී වේදනාව දියුණු තියුණු විය. වේදනාවට පුරුදු වී සිටින අලෙක්සේයි හඬකුදු පිට නොකළේ ය. හිසත්, කටත්, නහයත් වසාගෙන සුදු ලෝගු ඇඳගෙන ඔවුන් තම දෙපා ළඟ මොනවා කරත් දැයි ඔහුට නොවැටහිණි.

ඔහු ඇහැරුණේ වාට්ටුවට ගෙනා පසු ව ය. ක්ලාව්දියා මිහයිලොව්නාගේ කරුණාබර මුහුණ ඔහු පළමුවෙන් ම දුටුවේ ය. ධවල කේශී සුන්දර කාන්තාව ප්‍රශ්නයක් නඟන ලීලාවෙන් ඔහු දෙස බලන සැටි තේරුම් ගත නොහැකි වූයෙන් ඔහු පුදුමයට පත්විය. ඔහු ඇස් ඇර බලත් ම ඈ ඔහුගේ අතක් ගෙන මඳ සිනා පෑවා ය.

"අලෙක්සේයි හරිම දක්ෂයෙක්" යැයි කී ඈ නාඩි පිරික්සා බැලුවා ය.

මීට පෙර වේදනාව දැනුණාට වඩා ඉහළින් දෙපයේ වේදනාවක් ඇති බව ඔහුට දැනිණි. පෙර මෙන් දෙපය

ගිනිගත් බවක් දැන් නොදැනේ. ඔහුගේ දෙපා අග නහර ස්නායු හා මස් ගොබ එකට අල්ලා ගැට ගැසුවාක් මෙන් ඔහුට දැනේ. දෙපා වසා ඇති පොරෝනය දෙස බලත් ම ඔහුගේ සිරුර දිගින් අඩු වී ඇති බව ඔහුට දැනිණි. එවිට ඔහුගේ මනැස ඉදිරියේ සැත්කම් කාමරය ද තරහෙන් කතා කරන වසීලි වසීලවිච්ගේ කටහඬ ද, එනැමල් බඳුනට යමක් දමන ශබ්දය ද මැවිණි. 'අවසානයි' පුදුමයට පත් අලෙක්සේයි හෙදිය දෙස බලා ආයාසයෙන් මඳ සිනා පෑවේ ය.

"මගේ දෙපා කොට වෙලා වගේ"

ඔහුගේ මඳ සිනාව විරිත්තන විට ඇති වන විකෘතියට සමාන විය.

"කමක් නැහැ. මගෙ හොඳ ළමයො දැන් ඉතින් පහසුවක් දැනේවි" යැයි කී ක්ලාව්දියා මිහයිලොව්නා ඔහුගේ හිස පිරිමැද්දා ය.

"ඔව් පහසුයි. රාත්තල් කීයක් අඩු වුණාද?"

"එහෙම කියන්න එපා. මගෙ හොඳ ළමයො. ඔපරේෂන් කරනකොට කී දෙනෙක් කෑ ගහනවද? සමහරුන්ව පටිවලින් බඳිනව. ඔය ළමය නිකමටවත් කෑ ගැහුවෙ නැහැ. යුද්ධය හන්ද වුණු විපතක හැටි."

වාට්ටුවේ අඩ අඳුර බිඳිමින් කොමිසාර් කෑ ගැසී ය.

"මොකද ඔතන මළ ගමකට වගේ වැලපෙන්නෙ? සහෝදරි ඔය ලෙඩාට මේ ලියුම් මිටිය දෙන්න. අම්මප මටත් ඉරිසිය හිතෙනව ඔයතරම් ගොඩක් ලියුම් එකපාරටම ලැබෙන කොට"

කොමිසාර් අලේකසේයිට ලියුම් මිටිය දුන්නේ ය. එය අහස්යානා හමුදාවේ සගයන් එවූ ලියුම් ය. එවා එකවර එක ම දවසක නොලීව ද, යම් හේතුවකින් එක දවසක දී රෝහලට ලැබිණි. දෙපා රහිත අලෙක්සේයි ඇඳෙහි වැතිරගෙන ලියුම් කියවන්නට විය. තම සගයන් ඈත යුද පෙරමුණේ ජීවිතය නොතකා සටන් කරන සැටි කියවූ අලෙක්සේයි තුළ ජීවත් වීමේ ආසාව ඇති විය.

තමාගේ සගයන් එවූ ලියුම් එක ම දවසක දී නොලියූ බව ඔහු නොදක්කේ ඒවායේ තොරතුරු ගැන මහත් වුවමනාවකින් කියවූ බැවිනි. කොමිසාර් තැන හෙදිය කැඳවා, අලෙක්සේයි පෙන්වමින් කොඳුළේ ය. "ඔහෙලගෙ

ලුමිනාල්, වෙරොනාල් වැනි බෙහෙත්වලට වඩා මගේ බෙහෙත අපූරුයි නෙවෙද?" ලියුම් කල්තබා එකතු කරගත් කොමිසාර් තැන අලෙක්සේයි සැත්කමට මුහුණ පෑ පසු ඔහුට භාරදීමට අදහස් කළේ ඔහුගේ චිත්ත පීඩාව සැහැල්ලු කිරීමට ය. තම සගයන්ගේ සුබ පැතුම් සහ තොරතුරු දැනගැනීම නිසා අලෙක්සේයිගේ දරුණු චිත්ත පීඩාව සැහැල්ලු විය. පළපුරුදු යුද සෙබළෙක් වූ කොමිසාර් කඩිමුඩියේ ලියූ ඔවැනි ලියුම් බෙහෙත් හා ආහාරවලට වඩා වටිනා බව දන්නේ ය.

## 6

සැත්කමින් පසු ව අලෙක්සේයි මෙරේස්යෙව් අතිශය භයානක මානසික පීඩනයකට මුහුණ පෑවේ ය. ඔහු දුක්ගැනවිලි ඉදිරිපත් නොකළේ ය. නොහැඬුවේ ය. නොසන්සුන් නොවී ය. ඔහු තමාගේ ම ලොවකට වැද සැඟවුණේ ය.

මින් පසු කිසිදිනෙක තම අහස්යානා කණ්ඩායම යුද පෙරමුණට නොයනු ඇතැයි ඔහුට සිතිණි. අහස්යානාවක් පැදවීමට අහස් සටනක යෙදීමට මින් පසු කිසිදිනක නොලැබෙනු ඇත. දැන් ඔහු දෙපා නැති අබ්බගාතයෙකි. ගෙදරට බරකි. ජීවිතයෙන් තොර ව ජීවත් වන්නෙකි. මරණ මොහොත පැමිණෙන තෙක් ම මෙම අභාග්‍යයෙන් මිදීමට ඔහුට බැරි ය.

දින ගණනක් ම ඔහු වාට්ටුවේ සීලිමේ පැල්ලමක් දෙස බලාගත්වනම උන්නේ ය. යම් කිසිවෙක් ප්‍රශ්නයක් ඇසුවොත් ඔහු 'ඔව්', 'නෑ' කෙටි පිළිතුරක් දී නැවත නිහඬ වෙයි. වෛද්‍යන් නියම කළ සියලු බෙහෙත් හා ප්‍රතිකාර ඔහු නොකඩවා ගත්තේ ය. ආහාර රුචියක් නොතිබුණ ද ඔහු දුන් ආහාර ගිල දමා නැවත ඇඳ මත දිගා වෙයි.

"අලෙක්සේයි උඹ මොනවා ගැනද ඔය හැටි කල්පනා කරන්නෙ?" යැයි කොමිසාර් වරක් ඔහුගෙන් ඇසී ය. ඔහු දෙසට හැරුණු අලෙක්සේයි මෙසේ කීවේ ය. ඔහු නොදකින්නාක් මෙනි.

"මොනව ගැන කල්පනා කරනව කියලද අහන්නෙ?"

"කිසිම දෙයක් ගැන කල්පනා කරන්නේ නැහැ."

මේ අතර වසීලියි වසීලෙවිච් වාට්ටුවට ඇතුළු විය.

"ආ! අලෙක්සේයි කොහොමද සුවදුක්? වීරයා, නියම වීරයා. ඔපරේෂන් එක වෙලාවෙදි එක වචනයක් වත් කතා කළේ නැහැ. හඬක්වත් නැගුවේ නෑ. මගේ මේ ජීවිත කාලෙදි කොතරම් ලෙඩුන් ඔපරේෂන් කරල තියෙනවද? මේ වගේ මිනිහකු දුටු පළමු වතාවයි මේ. දැන් මම විශ්වාස කරනවා උඹ දවස් දහ අටක් තිස්සේ යුද පෙරමුණට බඩ ගා ගෙන ආ බව. නියම වීරයෙක්" යැයි වෙදනා කීවේ ය. "මොකද උඹ බුම්මාගෙන? බලාපල්ලකො එයා ගැන වර්ණනා කරනවා. එයා බුම්මාගෙන ඉන්නවා. මම නිලය අනුව ලයිතන් ජනරාල් කෙනෙක්. මම නුඹට අණ කරනව වහා ම හිනාවෙයන්."

අලෙක්සේයි ආයාසයෙන් දත් විළිස්සමින් සිනාසෙමින් කල්පනා කරන්නට විය. "මේ වගේ ඉරණමකට මූණ පාන බව දන්නව නම් බඩගානවද? පිස්තෝලෙ පතොරොම් තුනක් ඉතිරි වෙලා තිබුණ නෙව."

යුදවෙස් ගෙන සිටි මොස්කව් නගරය අසල පෙදෙසකින් ලබාගත් මල් රහිත විලෝ ඉති කීපයක් අතින් ගත් ක්ලාව්දියා මිහයිලොව්නා වාට්ටුවට ඇතුළු ව ලෙඩුන් ඉදිරියේ ඇති වීදුරුවල එක එක ඉත්තක් බැගින් හිඳුවා පිට ව ගියා ය. රත් පැහැති ඒ ඉතිවල පුලුන් රොදක් වැනි ගෝලාකාර පොහොට්ටු කීපයකි. වාට්ටුව තුළ සුවදායක බවක් ඇති විය. වසන්ත කාලයේ දී මෙනි. හැම කෙනෙක් ම ප්‍රීති වූහ. නිතර ම නිහඬ ව සිටින යුද්ධ ටැංකි භටයා පවා එදා කතා කළේ ය.

වැතිර සිටි අලෙක්සේයි කල්පනා කරන්නට විය. කමීෂින්හි කුඩා දිය පාරවල් මඩ සහිත අතු පාරවල් ඔස්සේ ගලා බසිමින් ගලින් වැසූ මහ පාර තෙමාලයි. ඉන් උණුසුම් හුමාලයක් පැන නගී. ඔහු සහ ඕල්යා, වොල්ගා නදී තීරය අසල සිටගෙන සිටියේ මෙවැනි දවසක දී ය. තමන් ඉදිරියේ යෝධ වොල්ගාවේ හිම දිය වී යාමට පටන් ගත්තා පමණි. හිම කැට හිම දූපත් සෙමින් පාවෙන සැටි පෙනේ. නිහඬතාව බිඳිනු ලබන්නේ කුඩා කුරුල්ලන්ගේ රිදීමය හඬ විසිනි. දිය වී සෙමින් පාවෙන්නේ හිම දූපත් නොව, තමා සහ ඕල්යා බව අලෙක්සේයිට සිතේ. ඔවුහු ගංගාවේ ජල කඳට මුහුණ දීමට යති. නිහඬ ව සිටින

ඔවුහු තම ප්‍රීතිමත් අනාගතය ගැන සුන්දර සිහින දකිති. යෝධමය ගඟ මැද සිටිමින් ඔවුන්ට හුස්ම ගැනීමට අපහසු ය. ශීත සුළං හමයි. දැන් එවැනි සිහින කිසිදිනක සැබෑ නොවනු ඇත. ඈ ඔහු ප්‍රතික්ෂේප කරනු ඇත. එසේ නොකළ ද, ඇය පිළිගැනීමට ඔහුට බැරි ය. එතරම් සුන්දර, එතරම් ගුණවත් යහපත් තරුණියකගේ අනාගතය විනාශ නොකළ යුතු ය. ඇය සමඟ බොරු කකුල්වලින් පැන පැන යන්නේ කෙසේ ද? වසන්තය සිහිපත් කරවන ඒ බොළඳ වස්තුව ඉවත් කරන ලෙස අලෙක්සේයි හෙදියගෙන් ඉල්ලා සිටියේ ය.

මල් ඉත්ත ඉවත ගෙන ගියේ ය. එහෙත්, දුක්සහිත සිතුවිලි නොනැවැතිණි. දෙපා නැති වූ බව දැනගත් විට ඕල්යා කුමක් කියයි ද? තමා අතහැර ගොස් තමා අමතක කොට සදහට ම වෙන් වී යාවි ද? ඔහුගේ මේ අදහසට විරුද්ධ ව මුළු මහත් සිත කය දෙක ම නැඟී සිටී. ඈ එහෙම කෙනෙක් නොවේ. ඔහු අතහැර දමා ඈ නොයනු ඇත. එය වඩාත් අයහපත් ය. උසස් ගතිගුණ ඇති ඕල්යා ඇගේ සිහිනය වන උසස් අධ්‍යාපනය ලබාගැනීම ද අතහැර දමා ඔහු සමඟ විවාහ වනු ඇත. අබ්බගාතයාට උදව් කරනු වස් ඈ නැවත පරණ රැකියාව කරමින් දුක්විඳිනු ඇත. සමහර විට දරුවන් ද උපදිනු ඇත...

එවැනි පරිත්‍යාගයක් පිළිගැනීමට ඔහුට අයිතියක් තිබේ ද? ඔවුන් කිසිදු බැම්මකින් බැඳී නැත. ඈ ඔහුගේ බිරිඳ නොවේ. ඔහු ඇයට ආලය කරයි. ඒ හේතුව නිසා ම ඔහුට එවැනි අයිතියක් නැත. අප අතර ඇති සබඳකම් වහා ම සිඳ බිඳ දැමිය යුතු ය. ඇය මහා දුකකින් මුදාලීම පිණිසත්, මතු වී ඇති ගැටලුව විසඳීම පිණිසත් එකවර ඒ සම්බන්ධකම් සියල්ල අවසන් කළ යුතු ය.

එදිනම කමීෂීන්වලින් ලියුමක් ලැබිණි. එය ඕල්යාගෙනි. සැඟවුණු නොසන්සුන්තාවකින් යුතු ව එය ලියා ඇත. මොනවා වුණත්, ඈ ඔහු සමඟ එක් ව සිටින බව ලියා එවා තිබෙන්නේ අභාග්‍යය කල් ඇති ව දැනගත්තාක් මෙනි.

ගමෙන් ලැබෙන ලියුම් නිසා පළමුවැනි වරට ඔහු තුළ අප්‍රසන්නතාවක් ඇති විය. ඔහුගේ සිත තවත් දුර කැලඹිණි. පසු කලෙක ඔහුගේ සිතට වධ දෙන වැරැදි තීරණයකට - එනම් තමාගේ දෙපා කපා දැමූ බව ගමට

නොදැන්වීමට- ඔහු එළඹීය.

දුක්මුසු කල්පනාවලින් අලෙක්සේයි මෙරේස්යෙව්ගේ රෝහල් ජීවිතය ගෙවිණි. ඔහුගේ ශක්තිමත් දේහයනට සැත්කම පහසුවෙන් උසුලා ගත හැකි විය. සැත්කම් වනය සුව වෙන්නට පටන් ගති. එහෙත්, අලෙක්සේයි දුර්වල විය. දිනෙන් දින කෙට්ටු වීමට පටන් ගත් හෙතෙම දුර්වල විය.

## 7

වසන්තය උදා විය.

හැම වසන්තයක දී මෙන් ම, මෙවර ද හදවත් උණුසුම් විය. නව බලාපොරොත්තු ඇති විය.

"ආ, ස්තෙපාන් ඉවානොවිච් තුවක්කුවක් අරගෙන කොහේ හරි දඩයමේ යන්ට ඇත්නම්! සතුන් දඩයම් කිරීමේ බලාපොරොත්තුවෙන් පැලක එළිවන තුරු බලා සිටීමට ඇත්නම්.. කොතරම් අගේද? හිමිදිරි පාන්දර ළා රත් පාටයි. පිනි බිඳු හා කුඩා හිම කැට. බොහොම සනීපදායක ශීතලක්. හිටි හැටියේ ම පියූ... පියූ... පියූ... යන හඬින් අත්තටු ගහනව. වලිගය දිග හැර හිට ගන්නව. එකයි, දෙන්නයි, තුන්දෙනයි..."

ස්තෙපාන් ඉවානොවිච් ශබ්ද කරමින් දොතොල් උරන්නට වූයේ කටට කෙළ ඉනූ කලෙක මෙනි. කොමිසාර් දිගට ම කතා කළේ ය.

"ඉන් පස්සේ ගිනිගොඩක් පත්තු කරල ඒ ළඟින් කුඩාරමක් ගහල උණු තේ හදාගන්නව. තේ කෝප්පෙට වොඩ්කා ටිකක් කලවම් කරනව. ඒක බිව් හැටියෙ ම මස් පිඩු රත්වෙලා ඇඟට පණ එනව. නේද? අවංක ලෙස මහන්සි වුණාට පස්සෙ..."

"කියනකොට වුණත් ආසයි කොමිසාර් සහෝදරය..."

දඩයම් කිරීම පිළිබඳ කතා කියන්නට වූහ. සාකච්ඡාවට යුද පෙරමුණේ තත්ත්වය භාජන විය. ඩිවිෂනයේ සේනාංකයේ වෙන්නේ මොනවාද? හිම සහිත ශීත ඍතුවේ දී සෑදූ තාවකාලික යුද්ධ බිම්ගෙවෙල්වල හිම දිය වී යන්නට පටන් ගෙන ඇතිද? බළ කඳවුරු දුබල වී ඇති ද? තාරපාරවල ගමන් කොට පුරුදු පැසිස්ට් සේනාවන්ට

හිම දිය වී යද්දී හිරිහැර ඇති වේද යන ප්‍රශ්න ගැන ඔවුහු සාකච්ඡා කළහ.

දිවා ආහාරයෙන් පසු ඔවුන් විවේකය ගත කරන්නේ කුරුල්ලන්ට කෑම දීමෙනි. ඉතිරි වන ආහාර කැබැලි එකතු කරන ස්තෙපාන් ඉවානොවිච් කවුළුවෙන් එපිට ඒවා විසිකරයි. කුරුල්ලෝ ඒ කෑම අහුලාගෙන කති. මෙය පුරුද්දක් බවට පත් විය. පාන් කෑලි කුඩු කර හා කුඩා කැබැලිවලට කඩා කුරුල්ලන්ට දෙති. ස්තෙපාන් ඉවානොවිච් කී පරිදි එය කුරුලු රංචුවකට සෑහිණි. කුරුල්ලන් කෑම කන සැටි බැලීමට රෝගීහු ප්‍රිය කළහ. කුඩා වී කුරුල්ලෝ කිච් බිච් ගාමින් පොරකමින් පාන් කැබැලි අහුලාගෙන කති, ඉන් පසු විවේක ගනිති. පසු ව තම කුරුලු කාර්යයන් සඳහා ඈතට ඉගිළී යති. කුරුල්ලන්ට කෑම දීම විනෝදයක් විය. රෝගීහු කෙමෙන් කෙමෙන් කුරුල්ලන් හැඳින ගත්හ. කොට වලිගයක් ඇති කඩිසර දඟකාර කුරුල්ලෙක් ජනප්‍රිය විය. ස්තෙපාන් ඉවානොවිච් ඌට 'මැෂින් තුවක්කුකාරයා' යන නම තැබී ය.

කුරුල්ලන්ට කෑම දීමෙන් පටන්ගත් මේ විනෝද ක්‍රීඩාව නිසා යුද්ධ ටැංකි භටයාගේ හුදෙකලා නිහඬතාව බිඳී ගියේ ය. පළමුවැනි දවසේ දී ස්තෙපාන් ඉවානොවිච් දෙකට නැවී ගෙන කරුවල ආධාරයෙන් ජනේලය වෙත ගොස් මහත් අමාරුවෙන් හුළං කපොල්ල හැර කෑම විසි කරන සැටි යුද්ධ ටැංකි භටයා බලා සිටියේ එතරම් උනන්දුවකින් නොවේ. දෙවනි දවසේ දී කුරුල්ලෝ පැමිණි විට ඔහු වේදනාවෙන් දත්මිටි කමින් ඇඟ උඩ වාඩි වී උන් දෙස බැලී ය. ඊළඟ දවසේ දී යුද්ධ ටැංකි භටයා තම ආහාරයෙන් කොටසක් වූ කේක් කෑල්ලක් සඟවා ගත්තේ කුරුල්ලන් පැණි රසැති ආහාරවලට කැමැති බව දැනගත්තාක් මෙනි. දවසක් දා 'මැෂින් තුවක්කුකාරයා' නාවේ ය. බළලෙක් ඌව අල්ලාගෙන ඇතැයි ද, ඌ යස පාඩමක් ඉගෙන ගෙන ඇතැයි ද කුකුෂ්කින් කීවේ ය. යුද්ධ ටැංකි භටයා කුකුෂ්කින්ට බැණ වැදුණේ ය. පසු දා 'මැෂින් තුවක්කුකාරයා' පැමිණ හොටෙන් අනිමින් දබර කරමින්, ආහාර කැබැලි කන්නට වූ විට, ජයග්‍රාහී ලීලාවෙන් හිස ඔසවා බැලූ යුද්ධ ටැංකි භටයා කොක්

හඬ ලමින් සිනාසුණේ ය. මාස කීපයක් ම ගොළුවත රැකි හෙතෙම පළමු වරට තම පිළිවෙත බින්දේ ය.

දින කීපයක් යුද්ධ ටැංකි හටයා ග්‍රිගොරි ග්වොස්දෙව් අන් අය මෙන් කතාබහ කරන්නට විය. එයට මුල පුරන ලද්දේ කොමිසාර් විසිනි.

හතළිස් දෙකේ වාට්ටුවට පැමිණි ක්ලාව්දියා මිහයිලොව්නි අතක් පිටුපස සඟවා ගෙන ප්‍රීතිමත් නෙත්වලින් දයාන්විත ලෙස බලමින් මෙසේ ඇසුවා ය.

"ආ අද කවුද නටන්නේ?"

එහි තේරුම කාටහරි ලියුමක් ලැබී ඇති බවයි. ලියුම ලබන්නා ඇඳ මත වැතිර සිට සිරුර ඒ මේ අතට සොලවමින් නටන බවක් ඇඟවිය යුතු ය. වැඩි වැඩියෙන් ම මෙසේ නැටීමට සිදු වන්නේ කොමිසාර්ට ය. මන්ද යත් ඔහුට ලියුම් දහයක් පමණ එකවර ලැබෙන බැවිනි. සිය සේනාංකයෙන් ද පෙරමුණට පිටුපසින් ද සෙබළු ද මිතුරු නිලධාරිහු ද දේශපාලන සංවිධායකයෝ ද කොමිසාර්ට නිතර ලියුම් එවූහ. නිලධාරීන්ගේ බිරියෝ ඔහුට ලියමින්, ඔවුන්ගේ සැමියන්ට 'අවවාද කරන ලෙස' අයැද සිටියහ. යුද්ධයේ දී සැමියන් මියගිය කනවැන්දුම් ස්ත්‍රීහු තම වැඩ කටයුතු ලිහිල් කරගැනීමට ඔහුගෙන් ආධාර ඉල්ලා යැවූහ. යුද්ධයේ දී මියගිය කසාක් ජාතික යුද්ධ නිලධාරියෙකුගේ පුංචි දුවක් පවා ඔහුට ලිපියක් එව්වා ය. කසාක් ජාතික ඒ නම ඔහුට නිතර අමතක විය. මේ සියලු ලියුම් කියවූ ඔහු ඒවාට පිළිතුරු යැවී ය. නිලධාරීන්ගේ බිරියනට ආධාර දෙන ලෙස ඉල්ලමින් ලිපි යැවිය යුතු අංශවලට වහා ම ලියා යැවූ කොමිසාර්, දඟකාර සැමියනට නිසි පරිදි අවවාද කළේ ය. යුද පෙරමුණේ සටන් කරන නිලධාරින්ගේ ගෙවල්වලට අවශ්‍ය දෑ නොසපයන කළමනාකරුවනට තර්ජනාත්මක ලියුම් ලියන හෙතෙම වහා ම අඩුපාඩු නොපිරවුවහොත් තමා විත් ඔහුගේ "බෙල්ල කඩා දමන බව" ලියා යැවී ය. නිතර නම අමතක වන කසාක් ජාතික දැරියට ලියුමක් යැවූ කොමිසාර් ගණිත විද්‍යාවට 'පහත් ලකුණු' ලබා ගැනීම නිසා දොස් පැවරී ය.

යුද පෙරමුණ සමඟ ද ස්තෙපාන් ඉවානොවිච් ලියුම් ගනුදෙනු කළේ ය. ඔහුගේ පුතුන්ගෙන් - ඔහු මෙන් ම

පුත්තු ද ඉලක්කයට වෙඩි තබන ස්නයිපර්වරු වූහ - ලියුම් ලැබිණි. සමූහ ගොවිපළේ නඩ නායිකාවක් වන දුවණියගෙන් ද ඔහුට ලියුම් ලැබිණි. සමූහ ගොවීන් ගෙන්, නෑයන්ගෙන් හා මිතුරන්ගෙන් සුබ පැතුම් එවූ ඈ සමූහ ගොවිපළේ දියුණුව ගැන ද ලීවා ය. ස්තෙපාන් ඉවානොවිච් මහත් ආසාවකින් එම ලියුම් හඬ ගා කියවන විට රෝගීහු ද හෙදියෝ ද සෙංගමාල රෝගියකුට සමාන පෙනුමක් ඇති වාට්ටුව භාර දොස්තර ද අසාගෙන සිටියහ. ඔවුහු හැම දෙනෙක් ම ඔහුගේ පවුලේ කටයුතු ගැන දත්හ.

මිනිස් සමාජය සමඟ නිත්‍ය අරගලයක යෙදී සිටින කුකුෂ්කින්ට ද බරනවූල්හි ජීවත් වන මවගෙන් ලියුම් ලැබිණි. හෙදියගෙන් ලියුම උදුරා ගන්නා කුකුෂ්කින් අනික් රෝගීන් නින්දට ගිය පසු මවගේ ලිපි වචනයෙන් වචනය කියවමින් සතුටු විය. දුටුවන් අප්‍රිය කරවන ඔහුගේ මුහුණේ පවා පියකරු ශාන්ත බවක් ඇති වන්නේ මවගෙන් ලැබෙන ලිපි කියනව විට ය. කුකුෂ්කින් තම මවට බෙහෙවින් ආදරය කළේ ය. එහෙත්, යම් කිසි හේතුවක් නිසා ඔහු එම හැඟීම ගැන ලැජ්ජා වූයේ නිතර සැඟවී ය.

එවැනි ප්‍රීතිදායක මොහොතක දී වාට්ටුවේ රෝගීන් තමන්ට ලැබුණු ලියුම්වල සඳහන් තොරතුරු හුවමාරු කරගන්නා විට, යුද්ධ ටැංකි භටයා පමණක් බිත්තිය පැත්තට හැරී බ්ලැන්කට්ටුවකින් හිස වසා ගන්නේ ය. ඔහුට කිසිවෙක් නොලියූහ. එදින ක්ලාව්දියා මිහයිලොව්නා පැමිණියේ ප්‍රීතියෙනි.

"අද කවුද නටන්නෙ?"

සුන්දර සිනාවකින් මුව සරසාගත් ඈ යුද්ට ටැංකි භටයා දෙස බැලුවා ය. යම් කිසි අමුත්තක් සිදු වී ඇති බව පෙනිණි. රෝගීහු නිහඬ වූහ.

"ග්වොස්දෙව් ලියතන් සහෝදරයා, නටන්න. ඇයි නිකම් ඉන්නෙ?"

ග්වොස්දෙව් තිගැස්සුණ සැටි අලෙක්සේයි දිටී ය. සැණෙකින් සන්සුන් වූ ග්වොස්දෙව් නොසැලකිලි ලෙස මෙසේ කීවේ යː

"වැරැදිලා වෙන්න ඕන. මේ ළඟ වාට්ටුවක ඇති

ග්වොස්දෙව් වාසගම ඇති කෙනෙක්." හෙදිය අත ඇති ලියුම් කවර තුන දෙස ඔහු බැලුවේ ගිජු ඇස්වලිනි.

"වැරදීමක් නොවෙයි. ජී. එම්. ග්වොස්දෙව් ලයිතන් තැනට. අංක හතළිස් දෙකේ වාට්ටුව. ඉතින් නටන්න"යි ඈ කීවා ය.

ග්වොස්දෙව් ගිජුලෙස අතක් දිගු කළේ ය. හෙදිය තිගැස්සී බලා සිටිය දී, ග්වොස්දෙව් දත්වලින් ලියුම් කවරය ඉරා කියවන්නට විය. වෙළුම් පටිවලින් වැසී ඇති මුහුණේ සිදුරු තුළින් ඔහුගේ දෑස් දිලිසෙන හැටි පෙනිණි. පුදුම අන්දමේ ලියුම් තුනකි. එක ම සරසවියක, එක ම පන්තියක ඉගෙන ගන්නා තරුණියෝ තිදෙනෙක් එකිනෙකට වෙනස් අකුරුවලින් සමාන අදහස් දක්වමින් ලියූහ. වීරයකු වන යුද්ධ ටැංකි භටයකු වන ග්වොස්දෙව් මොස්කව්හි රෝහලක ප්‍රතිකාර ලබන බව දැනගත් ඔවුහු මෙසේ ලියන බව දැන්වූහ. බිය සැක නැති ව මෙසේ ලිවීම ගැන සමාවන ලෙස ඉල්ලා සිටි ඔවුහු, ඔහු කැමැති නම් ඔහු සමඟ ලියුම් හුවමාරු කිරීමට සතුටු බව ද දන්වා එවූහ. ලියුම් තුනෙන් එකක් ලියා ඇත්තේ අනූටා නමැත්තියකි. ඈ වැඩි දුරටත් මෙසේ ද ලීවා ය. "ඔබට අවශ්‍ය පොත්පත් ආදිය සැපයීම මට සතුටක් බැවින් අවශ්‍ය දෑ දන්වා එවන ලෙස ඉල්ලා සිටිමි"

ග්වොස්දොව් මුළු දවස තිස්සේ ම ලියුම් තුන පිරික්සමින් බලන්නට විය. මෙවැනි ලියුම් රෝගී සෙබළුන් වෙත එවන බව ඔහු නොදන්නේ නොවේ. ඔහු විස්මය පත් වූයේ මේ තරුණියන් තිදෙනා තමා බලාපොරොත්තු නොවූ අවස්ථාවක දී ලියුම් එවීම නිසා ය. වෛද්‍ය ශිෂ්‍යාවන් වූ මේ තිදෙනා තම යුද්ධ ක්‍රියා ගැන දැනගත්තේ කෙසේ ද යන්න ග්වොස්දෙව්ට ප්‍රහේලිකාවක් විය. වාට්ටුවේ හැම රෝගියෙක් ම පුදුම වූහ. හැමට ම වඩා පුදුම වූයේ කොමිසාර් ය. ස්තෙපාන් ඉවානොවිච් හා හෙදිය දෙස බලා ඉඟිමරන කොමිසාර් දුටු අලෙක්සේයි මේ සියල්ල සංවිධානය කර ඇත්තේ කොමිසාර් බව අවබෝධ කර ගත්තේ ය.

කෙසේ වුව ද, පසුදින උදෑසන කොමිසාර්ගෙන් ලියුම් ලියන කඩදාසි කීපයක් ඉල්ලා ගත් ග්වොස්දෙව්,

අවසර නොලබා තම දකුණ'තේ වෙළුම් පටිය ලිහාගෙන ලියන්නට පටන් ගත්තේ ය. වැකියක් ලියන ඔහු නැවත කටු ගායි. නැවත යමක් ලියා කඩදාසිය ගුළි කොට විසි කර දමා නැවත මුල සිට ලියයි. මේ විදිහට සවස් වන තුරු ම ලියූ ඔහු අවසානයේ දී තිදෙනාට ම පිළිතුරු යැවුවේ ය.

මුල දී ලියුම් එවූ තිදෙනාගෙන් දෙදෙනෙක් ලියුම් එවීම නැවැත් වූ නමුදු, අනූටා ඔවුන් දෙදෙනාගේ අඩුව පිරිමසමින් ග්වොස්දෙව්ට ලියන්නට වූවා ය. ග්වොස්දෙව් හැම දෙයක් ම එළිපිට කරන මිනිසෙක් වූයෙන් වෛද්‍ය විද්‍යාලේ තුන් වන වර්ෂයේ හැම දෙයක් ම වාට්ටුවේ රෝගීහු දැනගත්හ.

ග්වොස්දෙව් කතා කරන්නට පටන් ගත්තා පමණක් නොව, ප්‍රීතියෙන් ප්‍රමෝදයට පත් විය.

කුකුෂ්කින්ගේ තුවාලවලින් වානේ පතුරු ඇද බෙහෙත් දැමී ය. ස්තෙපාන් ඉවානොවිච් කිහිලි කරුවල ආධාරයෙන් තොර ව ඇවිදින්නට උගත්තේ ය. කොමිසාර්ගේ හා අලෙක්සේයි මෙරේස්යෙව්ගේ තත්ත්වය පමණක් නරක අතට හැරිණි. කොමිසාර්ගේ තත්ත්වය වඩාත් නරක් විය.

හැමදා ම උදෑසන හෙදියක් කොමිසාර්ගේ මුහුණ සේදුවා ය. හැන්දකින් ඔහුට කැව්වා ය. කොමිසාර්ට තම තියුණු වේදනාව උසුලාගත හැකි වුව ද, ඔහුගේ මේ අවාසනාවන්ත තත්ත්වය උසුලාගත නොහැකි විය. එහෙත්, ඔහු බලාපොරොත්තු සුන්කර නොගත්තේ ය. දිවා කාලයේ දී කොමිසාර් ප්‍රීතිමත් හඬකින් කතා කළේ ය. පුවත්පත් කියවීම නොකඩවා ම කළේ ය. ජර්මන් බස ඉගෙනීම ද අතපසු නොකළේ ය. දෑතින් පොත අල්ලා ගැනීමට ඔහු තුළ ශක්තියක් නොතිබුණෙන් ස්තෙපාන් ඉවානොවිච් ඔහුට පොත් තබා කියවීමට සුදුසු පොත් මැස්සක් සාදා දුන්නේ ය. ස්තෙපාන් ඉවානොවිච් කොමිසාර්ගේ ඇඳ ළඟ වාඩිවී ඔහු කියවා අවසාන වෙත් ම පිටුවෙන් පිටුව පෙරළන්නට විය.

කොමිසාර්ගේ සිරුර වඩ වඩාත් අබල දුබල වෙත් ම, ඔහුගේ ආත්ම ශක්තිය ප්‍රබල විය. ඔහුට ලැබෙන ලියුම්වලට ඔහු පිළිතුරු සැපයී ය. වරෙක කුකුෂ්කින් ද තවත් වරෙක ග්වොස්දෙව් ද ඔහුගේ වචන ලීවේ

ය. ප්‍රතිකාරවලින් පසු දවසක් දා අලෙක්සේයි නිදිකිරා වැටෙමින් සිටින විට කොමිසාර්ගේ බැරෑඩි කටහඬ විසින් ඔහු අවදි කෙරිණි.

"ආරක්ෂක සටන් කරන විට ඔහොම ලියන්නෙ ඔවුන් පිස්සු වැටුණු හන්දද?"යි ඇසූ ඔහු කෝප විය. "ක්‍රොසොව් නිලධාරිවාදියෙක්? යුද්ධ හමුදාවේ හොඳම පශු වෙදා නිලධාරිවාදියෙක්ද? ග්‍රිගොරි ලියපන්. ලියපන්!"

ඔහු කියන දේ ග්වොස්දෙව් ලියන්නට විය. දක්ෂ, හොඳ පශු වෙදෙකුට පදනම් රහිත ව චෝදනා කරන 'ලියන්නාට' විරුද්ධ ව යුද්ධ කමිටුවේ සාමාජිකයකු වෙත කොමිසාර් පැමිණිලි කළේ ය. ලිපිය තැපැල් කිරීමට හෙදියට භාර දුන් පසු ද කොමිසාර් වාර්තාව පළ කළ 'ලියන්නාට' බැණ වැදීම නොනැවැත්විය. කොට්ටය මත හිස හැරවීමට පවා බැරි ව සිටින මේ පුද්ගලයා මෙතරම් තද වචන පාවිච්චි කරනු ඇතැයි කිසිවෙක් නොසිතූහ.

හවස් වන විට කොමිසාර්ගේ සෞඛ්‍ය තත්ත්වය වඩාත් අයහපත් විය. ඔහුට බෙහෙත් විද අම්ලකර වායුව දුන්නේ ය. බොහෝ වේලාවක් යන තුරු ඔහුට සිහි නොලැබිණි. සිහි ලැබුණු වහා ම ඔහු අම්ලකර වායුව පිරි මල්ල අතින් ගෙන සිටින ක්ලාව්දියා මිහයිලොව්නා දෙස බලා මඳ සිනාවක් පෑමට තැත් කළේ ය.

රෝගයට එදිරි ව දැඩි සටනක් කරන මේ යෝධමය පුරුෂයා දිනෙන් දින දුර්වල වන සැටි බලා සිටීම පවා මහත් වේදනාවකි.

## 8

අලෙක්සේයි මෙරේස්යෙව් ද දිනෙන් දින දුබල වෙමින් සිටී.

හැම කෙනෙකුගේ ම හදවත්වලට යතුරු සොයා ගැනීමෙහි දක්ෂ කොමිසාර්, අලෙක්සේයි පරාජිත ලොවින් මුදා ගැනිමට මෙතෙක් අසමත් විය. අලෙක්සේයිගේ සැත්කමින් පසු පළමුවැනි දවසේ දී ම කොමිසාර් 'වානේ පණපෙවූ හැටි' නවකතාව හඬ නගා කියවන්නට පටන් ගත්ත ද, එය කා සඳහා කියවන්නේ ද යන්න දැනගත් හෙතෙම සැලකිලිමත් නොවී ය. එම නවකතාවේ

වීරයා වන පාවෙල් කොර්චාගින් අලෙක්සේයිගේ සිත දිනාගත් වීරයෙකි. ඔහු ළමාවියේ සිට ම එම චරිතයට ඇලුම් කළේ ය. "ඒ වුණාට කොර්චාගින් අහස් නියමුවෙක් නොවෙයි නෙව! අහස්යානා පැදවීමේ රෝගයෙන් ඔහු පෙළුණේ නැහැ නෙවදැ?" යි අලෙක්සේයි පාවෙල් කොර්චාගින්ගේ චරිතය විග්‍රහ කරමින් තමාට ම කියා ගත්තේ ය.

නවකතාව කියවීම අසාර්ථක වූයෙන්, කොමිසාර් වෙනත් උපායයන් යොදන්නට විය. තම මිතුරෙක් වන පක්ෂාඝාත රෝගියෙක් සමාජ වැඩ කටයුතු කරන හැටි ඔහු අලෙක්සේයිට ඇසෙන සේ විස්තර කළේ ය. හැම දෙයක් ගැන ම මහත් උනන්දුවෙන් අසන ස්තෙපාන් ඉවානොවිච් ඔහුගේ කතාව අනුමත කළේ ය. තම ගම් පළාතේ පදිංචි දොස්තර ගැන ස්තෙපාන් ඉවානොවිච්ට මතක් විය. අතක් නැති ඔහු මුළු පෙදෙසේ ඉතාම දක්ෂ දොස්තර විය. ඔහු අසු පිට ගියේ ය. තනි අතින් තුවක්කුවත් රැගෙන දඩයමේ ගියේ ය. ලේනකුගේ ඇසට වුව ඉලක්කය බලා වෙඩි තැබීමට ඔහු සමත් විය. තමා පෞද්ගලිකව දන්නා විලියම් නම් විද්‍යාඥයා ගැන කොමිසාර් විස්තර කළේ ය. අංශභාග රෝගය නිසා එක් අතක් හා පයක් ක්‍රියා විරහිත වුව ද, විලියම්ස් කෘෂිකාර්මික විද්‍යායතනයේ පර්යේෂණ කටයුතු මෙහෙයවමින් වැඩ කළේ ය.

මේ කතා අසන අලෙක්සේයි සාවඥ ලෙස සිනාසුණේ ය. කතා කිරීම, කියවීම, ලිවීම, අණ කිරීම, වෙදකම් කිරීම, පමණක් නොව, දඩයම් කිරීම පවා දෙපා නැතිව කළ හැකි ය. එහෙත්, අහස්යානාවක් පැදවීම කළ නොහැකි ය. අලෙක්සේයි අහස්නියමුවෙකි. උපන් අහස්නියමුවෙකි. තමා කුඩා කල පැණි කොමඩු වත්තක් උඩින් අහසේ පියාසර කළ රිදී පැහැති සරුංගලය දුටු දා පටන් අලෙක්සේයි අහස්යානා පැදවීම ගැන සිහින දුටුවේ ය. සුප්‍රසිද්ධ වොල්ගා පැණිකොමඩු වත්තට උඩින් ස්ටාලින්ග්‍රාඩය දෙසට සෙමින් සෙමින් පියාසර කර ඒ සරුංගලය දෙස ඔහු බොහෝ වේලාවක් බලා සිටියේ ය.

අහස්නියමුවකු වීමේ ආසාව එදා සිට ඔහු අත් නොහළේ ය.

කොම්සොමොල් තරුණ සංවිධානය ඔහු ඈත පෙරදිගට යැවී ය. අමුර් ගඟ අසබඩ කොම්සොමොල් තරුණ නගරය ඉදි කිරීමට ඔහු වෙහෙස නොබලා වැඩ කළේ ය. එහෙත්, අහස්නියමුවකු වීමේ සිහිනය ඔහු නිතර දුටුවේ ය. එම නගරය ගොඩ නැගූ තරුණ තරුණියන් අතර සිටි අහස්යානා ලෝලයෝ එක් ව නගරය ගොඩ නැඟීමට පෙර අහස්යානා සමාජ ශාලාවක් සංවිධානය කළහ. සාදාගෙන යන ගොඩනැඟිලි මීදුමෙන් වැසුණු පසු තම නේවාසිකාගාරවලට යන තරුණ නිර්මාණකයෝ ගිනිමැලයක් ගසා ගිනි තැපූහ. මදුරුවන් හා මැක්කන් විනාශ කළහ. මෙවැනි සවස් කාලවල දී මදුරුවන්ගෙන් හා මැක්කන්ගෙන් බේරීම පිණිස භූමිතෙල් ඇඟපුරා ගාගෙන තයිගා වනයට වැදෙන අහස්යානා ලෝලයෝ ගස් කපා හෙළමින් අහස්යානා තොටුපළක් සඳහා බිම සකස් කළහ. මොවුන්ගේ නායකයා වූයේ අලෙක්සේයි මෙරේස්යෙව් ය. තයිගාවට එදිරිව සටන් කොට තොටුපළක් සෑදීම ලෙහෙසි කරුණක් නොවී ය. බාධාවන් මැඩගෙන වෙහෙස නොබලා විවේක නොගෙන වැඩ කළ ඔවුහු අහස්යානා තොටුපළක් සෑදූහ. මේ සියල්ල ඔවුන් කළේ අනික් අය විවේක ගන්නා කාලයේ දී ය.

අලෙක්සේයි තම ළමාවියේ සිහිනය වූ අහස්යානා පැදවීම ඇරඹුවේ මේ අහස් තොටුපළෙනි.

පසු ව යුද්ධ අහස්යානා ආයතනයක අහස් නියමු ශිල්පය හැදෑරූ හෙතෙම, තරුණ නියමුවන් පුහුණු කළේ ය. යුද්ධය පටන් ගත් විට ආයතනයේ අධ්‍යක්ෂවරුන්ගේ තහනම හා තර්ජන නොතකා වහා ම යුද පෙරමුණ බලා ගියේ ය. ඔහුගේ මතු බලාපොරොත්තු ද ප්‍රීතිය ද අනාගතය ද ඔහු අහස්යානා ශිල්පය සමඟ සම්බන්ධ කළේ ය.

ඔවුහු ඔහුට විලියම්ස් ගැන කියති.

"විලියම්ස් අහස්යානා පදවන්නෙක් නොවේ" යැයි කී අලෙක්සේයි බිත්තිය දෙසට මුහුණ හරවා ගත්තේ ය.

කොමිසාර් ඔහු 'දිනාගැනීමට' කළ උත්සාහය අතහැරියේ නැත. මන්දෝත්සාහි ලෙස හුදෙකලාව කල්පනාවෙහි යෙදී සිටි අලෙක්සේයිට කොමිසාර්ගේ කටහඬ ඇසිණි.



"අලෙක්සේයි මේ බලපන්, මෙන්න නුඹ ගැන ලියල තියෙනව"

ස්තෙපාන් ඉවානොවිච් සඟරාව අලෙක්සේයිට දුන්නේ ය. එක් ලිපියක් වටා පැන්සලයකින් සලකුණු කර තිබිණි. අලෙක්සේයි සඟරාව ගෙන ලිපිය දෙස බලමින් තමාගේ නම සෙවී ය. පළමුවැනි ලෝක මහා යුද්ධ කාලයේ දී රුසියානු අහස්නියමුවකු ගැන ලියූ ලිපියකි ඒ. තමා නොහඳුනන අහස්නියමුවකුගේ ඡායාරූපයක් ද ලිපිය සමඟ පළ කොට ඇත. තුනී උඩු රැවුලකින් හෙබි තරුණ නියමුවා 'කැප්' තොප්පියක් හිස ලා ගෙන සිටී.

"කියවපන්, කියවපන්, නුඹටම ලියාපු ලිපියක් තමා" යැයි කොමිසාර් කීය.

මෙරේස්යෙව් ලිපිය කියැවීය. පසුගිය පළමුවැනි ලෝක මහා යුද්ධයේ දී ජර්මන් යුද පෙරමුණට ඉහළින් පියාසර කළ රුසියානු අහස් නියමු වලෙරියාන් අර්කාද්යෙවිච් කාර්පොවිච්ගේ කකුලට වෙඩි වැදිණි. තුවාල ලැබූ කාර්පොවිච් තම 'පාර්මන්' අහස්යානය රුසියානු අහස් තොටුපළ දක්වා ගෙන යාමට සමත් විය. කකුල කපා දැමුව ද කාර්පොවිච් අහස්යානාවෙන් ඈත් වීමට සූදානම් නොවී ය. තමාගේ ම සැලැසුමක් අනුව ඔහු ලී කකුලක් සාදවා ගත්තේ ය. ඉන් පසු මහත් ධෛර්යයකින් ව්‍යායාම්

කළ හෙතෙම යුද්ධාවසානයේ දී නැවත වරක් අහස් හමුදාවට ඇතුළු විය. අහස් හමුදාවේ පරීක්ෂක ධුරයට ඔහු පත් කළේ ය. ඔහු 'සිය අහස්යානයෙන් පියාඹමින් අභ්‍යාස සටන්වල යෙදුණේ ය.' සාර් ආණ්ඩුව ජෝර්ජ් කුරුසිය ඔහුට ප්‍රදානය කළේ ය. අහස්යානය කඩා වැටී මිය යන තෙක් ම ඔහු අහස් හමුදාවේ නියමුවකු ලෙස සේවය කළේ ය.

අලෙක්සේයි මෙරේස්යෙව් එම ලිපිය තෙවරක් ම කියැවී ය. සිහින් සිරුරකින් හෙබි ඒ තරුණ නියමුවා තමා දෙස බලා මඳ සිනා පාන්නක් මෙනි. ඔහු විඩාපත් වූ බවක් පෙනේ. වාට්ටුවේ රෝගීහු අලෙක්සේයි දෙස නිහඬ ව බලා උන්හ.

"කොහොමද කියෙව්වද?" කොමිසාර් කපටි බැල්මක් හෙළමින් ප්‍රශ්න කළේ ය. (නිහඬ ව උන් අලෙක්සේයි නැවත වරක් ලිපිය බලන්නට විය) "ඉතින් තමුසෙගෙ අදහස කොහොමද?" යි කොමිසාර් ඇසී ය.

"එයාට නැතිවුණෙ එක කකුලක් නෙව"

"තමුසෙ සෝවියට් රටවැසියෙක්"

"එයා පැදෙව්වෙ 'පාර්මාන්' යානාවක්. ඒකත් අහස්යානාවක්ද? හරිම පෙට්ටගමක්. එය පැදවීම බොහොම ලෙහෙසියි. නවීන යන්ත්‍ර සූත්‍ර ක්‍රියා කරවන්ට ඕන නැහැ. වේගයක් ඇත්තෙම නැහැ"

"තමුසෙ සෝවියට් රටවැසියෙක්" යැයි නැවතත් කොමිසාර් කීවේ ය.

"සෝවියට් රටවැසියෙක්" යැයි තමාට ම යාන්ත්‍රික ලෙස කියාගත් අලෙක්සේයි නැවතත් එම ලිපිය බැලී ය. ඔහුගේ සුදුමුලි මුහුණ යම් කිසි අභ්‍යන්තර බලයක් විසින් ආලෝකවත් කෙරිණි. ප්‍රීතියෙන් හා විස්මයෙන් පිරි නෙත්වලින් ඔහු රෝගීන් දෙස බැලී ය.

එදා රෑ ඔහුට නින්දක් නොවී ය. ලෙඩුන්ගේ සුසුම්ලෑම් සහ කෙඳිරිගෑම් ඔහුට නැසිණි. වරින්වර කොට්ටය යටින් සඟරාව එළියට ගත් අලෙක්සේයි රෑ පහනේ ඇඳිරි එළියෙන් අහස්නියමුවාගේ ඡායාරූපය දෙස බැලී ය. "උඹට අමාරු වෙන්න ඇති. ඒ වුණත් උඹ ජයගත්තා." ඔහු සිතී ය. "මට උඹටත් වැඩියෙ අමාරු වේවි. නමුත්, මම පරාද වෙන්නෙ නැහැ."

මැදියම් රෑ කොමිසාර් හිරිහැටියේ ම නිහඬ විය. අලෙක්සේයි වැළමිටි වාරුවෙන් හිස ඔසවා බැලී ය. කොමිසාර් හුස්ම නොගෙන මළාක් මෙන් සිටින සැටි දුටු අලෙක්සේයි බියගත්තේ සීනුව නාද කළේ ය. දෑස් පිසදමමින් ක්ලාව්දියා මිහයිලොව්නා දුවගෙන ආවා ය. හිස් වැස්මෙන් ආවරණය නොලැබූ ඇගේ හිසකේ ගොතා තිබිණි. සැණෙකින් වාට්ටුව භාර දොස්තර කැඳවා කොමිසාර්ට බෙහෙත් විද අම්ලකර වායුව ආශ්වාස කිරීමට සැලැස්වී ය. පැයක් පමණ වේලා ඔහුට ප්‍රතිකාර කළ කොමිසාර් මඳ සිනාවක් පෑවේ ය. ක්ලාව්දියා මිහයිලොව්නා දෙස බැලූ හෙතෙම මුදු ලෙස මෙසේ කීවේ ය.

"ඔහෙලට මෙතරම් කලබල කිරීම ගැන මට සමාවෙන්න"

දොස්තර වාට්ටුවෙන් පිටව ගියේ ය. සාත්තු සේවක සේවිකාවෝ ද පිටවූහ. ක්ලාව්දියා මිහයිලොව්නා කොමිසාර්ගේ ඇඳ අසල වාඩිවූවා ය. අලෙක්සේයි හැර අනෙක් රෝගීහු නිදාගත්හ. තම අහස්යානාවට සවි කරන කෘත්‍රිම කකුල් ගැන අලෙක්සේයි සිතන්නට විය. ඒවා පටි සහිත වුව ද, කම් නැත. සිවිල් යුද්ධ කාලයේ මිටි නියමුවකුගේ අහස් යානයේ පා පැදුම්වලට ලී කැලි සවි කළ බව ආයතනයේ ගුරුවරයා වරක් කී සැටි ඔහු මතක් කළේ ය.

"සහෝදරය මම තමුසෙගෙන් ඈත් වෙන්නෙ නැහැ"යි කාර්පොවිච්ගේ ඡායාරූපය දෙස බලමින් හේ කීවේ ය. "මම නැවත පියාඹමි, පියාඹමි"යි යන හැඟීම ඔහු සිත පුබුදුවාලී ය. දෑස් පියාගෙන ඔහු වැතිර සිටින සැටි බලන කෙනෙකුට පෙනෙන්නේ ඔහු සැපට නිදා ගනිමින් මඳ සිනා පාන සැටියකි.

මෙසේ පසුවන ඔහුට දෙබසක් ඇසිණි. තම ජීවිතයේ අසීරු අවස්ථාවල දී ඔහු එය නිතර සිහි කළේ ය.

"ඔහෙ ඇයි ඔහොම හැසිරෙන්නේ? ඔතරම් වේදනා විඳිනකොට විහිළු කිරීමත් හිනා වීමත් හරි භයානකයි. ඔහෙ කොතරම් වේදනා විඳිනවද, එය දකින මගෙ හදවත උණු වෙනව. ඇයි ඔහෙ වෙන් කරපු වාට්ටුවකට නොයන්නෙ?"

එසේ කීයන ලද්දේ වාට්වෙුවේ හෙදිය වන ක්ලාව්දියා මිහයිලොව්නා නොව, සුන්දර මිහිරි කටහඬක් ඇති ගැහැනියක විසිනැයි ඔහුට සිතිණි. කොමිසාර්ගේ ක්‍රියාවන්ට එදිරි ව කතාකරන ඇගේ කටහඬෙහි ශෝකාන්විත බවක් පමණක් නොව, තවත් යමක් ගැබ්වී ඇත. අලෙක්සේයි ඇස් හැර බැලී ය. ආවරණයකින් වසා ඇති පහනේ ඇඳිරි එළියෙන් කොමසාරිස්ගේ සුදුමැලි මුහුණ පෙනේ. ඔහුගේ බැල්ම දයාන්විත ය. හෙදියගේ සුන්දර මුහුණ ද පෙනිණි. ඇඳිරි පහන් ආලෝකය නිසා අගේ කෙස් වැටිය දිලිසිණි. තමා ඈ දෙස නොබැලිය යුතු බව ඔහුට වැටහුණ ද, ඔහු ඈ දෙස බලාගත්වන ම සිටියේ ය.

"අනේ අනේ සහෝදරි... ඇයි ඔහොම අඬන්නෙ. හිත සැහැල්ලු වෙන්න බ්‍රෝමයිඩ් ටිකක් බොනවද?" යි කොමිසාර් ඇයට කීවේ පොඩි ළමයෙකු අමතා කතා කරන්නාක් මෙනි.

"ඔහේ ආයෙමත් හිනාවෙනව. ඔහේ මහ පුදුම මිනිහෙක්. ඔහේ හරිම නපුරුයි. ඔව් නපුරුයි. මෙතරම් වධ විඳිනව. අඬනව වෙනුවට එයා හිනාවෙනව. අනුන්ට උපදෙස් දෙනව. ආදරණීය සහෝදරය ඔහොම හැසිරෙන්න එපා. මීට පස්සේ ඔහොම හැසිරෙන්න එපා.!"

ඈ මුහුණ සඟවාගෙන නිහඬ ව ඇඬුවා ය. සුදු ඇඳුමින් සැරසී සිටින ඈ දෙස කොමිසාර් කාරුණික බැල්මක් හෙළී ය.

"දැන් පමා වුණා වැඩියි. මගේ ආදරණීය වස්තුව. මගේ පෞද්ගලික කටයුතුවල දී මම නරක විදිහට පමාවෙලා තියෙනව. මම හැමදාම අනුන්ගෙ වැඩ ගැන උනන්දු වුණා. දැන් ඉතින් හොඳටම පමා වුණා"

කොමිසාර් සුසුම් ලෑවේ ය. හෙදිය කඳුළු පිරි දෙනෙතින් යුතු ව ඔහු දෙස බැලුවා ය. ඇගේ ඇස්වල යම් කිසි බලාපොරොත්තුවකි. ඔහු මඳ සිනා පා සුසුමක් හෙළා සුපුරුදු විකට හඬින් ඇය අමතා මෙසේ කීවේ ය:

"පුංචි කෙල්ල මා කියන කතාව අහන්න. මට මේ දැන් මතක් වුණා බොහොම ඉස්සර තුර්කිස්තානයේ සිවිල් යුද්ධ කාලෙ සිද්දවුණ දෙයක්. බස්මචී හොර දෙටුවන්

පන්නමින් අසරු කණ්ඩායමක් ගියා. රුසියානු අශ්වයන්ට වාලුකා කාන්තාරයෙ යන්ට පුරුදු නැහැ. ඉක්මනින්ම අශ්වයො එකිනෙකා මැරෙන්ට පටන් ගත්තා. මේ හන්ද අසරු හමුදාව පාබළ හමුදාවක් වුණා. හමුදා නායකයා අවි හැර අන් සියලු බඩු බාහිරාදිය විසිකොට ළඟම ඇති නගරයට යාමට අණ කළා. ළඟම ඇති නගරයට කිලෝමීටර් 160ක් පයින් යා යුතුයි. වැලි කඳු හරහා අපට යාමට සිදුවුණා. ගිනි අව්ව. බොන්ට හොයාගන්ට වතුර උගුරක් වත් නැහැ. අපේ දිව සහ තොල පැළී ඉරි තැළුණා. අපි ඔය දුක් විඳගෙන දවස් තුනක් ම පයින් ගමන් කළා. වැලි සුළං අපේ නහයට, කටට ඇතුළු වුණා. කට ඇතුළෙ වැලි ඇට. ඇස් කෙවෙන්ට පටන් ගත්තා වැලි හින්දා. මිනිහෙක් පය පැටලී වැටුණොත් එයාට බොහෝ වෙලාවක් යනතුරු නැඟිටින්න බැහැ. අපේ කොමිසාර් - යාකොව් පාව්ලොවිච් වොලෝඩින් තරබාරු මිනිහෙක්. එයා ඉතිහාසඥයෙක්. බුද්ධිමතෙක්. එයා තද බොල්ෂෙවික්වාදියෙක්. ඇගේ හැටි බැලුවම ඉස්සෙල්ලාම බිම වැටෙන්න ඕනෙ එයයි. නමුත්, එයා අනික් අය දිරි ගන්වමින් ගමන් කළා. 'තව ටිකයි, තව ටිකයි. ඉක්මනින් ම නගරයට යන්න පුළුවනි'යි එයා අපට නිතරම කිව්වා. යම් කිසිවෙක් බිම වැටුණොත් එයා පිස්තෝලය අල්ලා කෑ ගහනවා. නැඟිටපන්. නැතිනම් නුඹට වෙඩි තියනව..."

හතරවෙනි දවසෙදි නගරයට කිලෝමීටර් පහළොවක් විතර දුර තියෙන විට මෙන්න මිනිහ සින්දුවක් කියන්ට පටන් ගත්තා. ඒ වෙලාවෙ මිනිස්සු හොඳට ම මහන්සි වෙලා දෙපා ඔසවන්න පවා බැරිවයි හිටියෙ. හරියට තුවාල ලැබූ සත්තු වගෙ අපි ගමන් කළේ. එයාගෙ කටහඬත් හරිම සවුත්තුයි. බොහොම හීන් කටහඬක්. එයා පටන් ගත්තෙ පරණ තාලෙ සින්දුවක්. අපි හැමදෙනා ම ගායනා කළා. 'සීරුවෙන් ගමන් කරනු' කියල මම අණ දුන්න. හිතන්නවත් අමාරුයි. අපි හැමදෙනාම ගමන් කළා.

එක සින්දුවක් ගායනා කළාට පස්සෙ අපි තවත් සින්දුවක් ගායනා කළා. ගිනි අව්වේ පිච්චෙමින් අපි ගී ගායනා කළා. අපේ කට, දිව, තොල පැළිලා. ඔය විදිහට අපිට පුළුවන් වුණා එක මිනිහෙකුවත් කාන්තාරයෙ නොතබා නගරයට සේන්දු වෙන්න. ඔන්න වැඩක හැටි..."

"කොමිසාර්ට මොකද වුණේ" ක්ලාව්දියා මිහයිලොව්නා ප්‍රශ්න කළා ය.

"කොමිසාර් ද? එයා සනීපයෙන් ජීවත් වෙනවා. පුරාවිද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙක්. ඉතිහාසයට පෙර වුසූ ජනතාව ගැන සාක්ෂි සොයාගෙන තියෙනවා. කාන්තාරෙ සින්දු කිව්වයින් පස්සෙ එයාගෙ කටහඬ හොඳටම බැරෑඩි වුණා. එයාට කටහඬෙන් වැඩක් නැහැ නෙව... මදෑ කතාන්දර කීව. අදට ඇති. පුංචි ළමයා ගිහින් නිදාගන්න. අසරුහටයා අද රෑ නොමැරෙන බවට පොරොන්දු වෙනවා."

අලෙක්සේයි බොහොම පමා වී අවදි විය. කිසියම් ප්‍රීතිමත් සිහිනයක් නිසා ඔහු සතුටු විය. කොතරම් අපූරු සිහිනයක් ද? නින්දේ දී පවා අත්නොහැර අල්ලා ගෙන සිටි සඟරාව දෙසට ඔහුගේ නෙත් යොමු විය. කාර්පොවිච්ගේ ඡායාරූපය ඔහු දෙස තවමත් මඳ සිනාවෙන් බලන සැටි ඔහු දුටුවේ ය. අලෙක්සේයි ප්‍රවේසමෙන් සඟරාව අත ගාමින් ඡායාරූපය දෙස බලා ඉඟිමැරුවේ ය.

උදෑසන මුහුණ සෝදාගෙන හිස පීරාගෙන සිටි කොමිසාර් මඳ සිනාවකින් යුතු ව ඔහු දෙස බලා සිටියේ ය.

"තමුසෙ මොකද ඡායාරූපෙට ඉඟිමරන්නෙ?" කොමිසාර් ප්‍රශ්න කළේ සතුටු ලීලාවෙනි.

"මගෙ අදහස ආායෙමත් පියාසර කරන්නයි" අලෙක්සේයි පිළිතුරු දුන්නේ ය.

"එහෙමත් පුළුවන්ද? එයාට එක කකුලක් තියෙනව. තමුසෙට දෙකම නැහැ නොවැ?"

"ඒ වුණාට මම සෝවියට් රටවැසියෙක්. රුසියන් කාරයෙක්" අලෙක්සේයි කීවේ ය.

ඔහු එසේ කීවේ එම වචන ඔහුට අහස්යානා පැදවීමට සහතිකයක් දුන්නාක් මෙනි. කාර්පොවිච් අබිබවා ඔහුට ජයගත හැකි යැයි ඔහු දැඩි ලෙස විශ්වාස කළේ ය.

උදෑසන ආහාර ගෙනා විට, තමාගේ කොටස සම්පූර්ණයෙන් ම කා දැමූ අලෙක්සේයි තවත් වැඩිපුර ඉල්ලාගෙන එය ද කෑවේ ය. ගීයක් ගැයීමට උරුවම් බැමට තැත් කළ හෙතෙම තම අදහස් එළියට දමන්නට

විය. මහාචාර්ය තුමා ලෙඩුන් බැලීමට පැමිණි විට ඔහුට තමාට දක්වන විශේෂ කරුණාව ප්‍රයෝජනයට ගනිමින් ඔහුගෙන් ප්‍රශ්න අසමින්, ඉක්මනින් සුවය ලැබීමට කුමක් කළ යුතුදැයි ඇසී ය. වැඩියෙන් ආහාර ගෙන වැඩියෙන් නිදා ගත යුතු යැයි මහාචාර්ය තැන කීය. දවල් ආහාරය ද, තවත් අමතර ආහාර කොටසක් ද අනුභව කළ ඔහු හතරවැනි මස් කට්ටලය ගිල දැමුවේ ආයාසයෙනි. දහවල් කාලයේ දී ඔහුට නින්ද නොගිය ද, දෑස් වසාගෙන ඔහු පැය එකහමාරක් පමණ වැතිර සිටියේ ය.

ප්‍රීතිය නිසා කෙනෙකු ආත්මාර්ථකාමී විමට ඉඩ ඇත. අලෙක්සේයි මහාචාර්යවරයාගෙන් දිගින් දිගට ප්‍රශ්න ඇසූ නමුදු, මුළු වාට්ටුව ම දුටු විශේෂයක් දැකීමට ඔහු අපොහොසත් විය. වසීලියි වසීලෙවිච් පුරුදු පරිදි නියමිත වේලාවට ලෙඩුන් බැලීම ඇරඹී ය. බැසයන හිරුගේ රැස්, මැද්ද ලී පොළොවේ සිදුරකට ළඟා වත් ම, ඔහු වාට්ටුවට ඇතුළු විය. බාහිර වශයෙන් ඔහුගේ කිසි ම වෙනසක් නොපෙනුණ ද, අභ්‍යන්තරික වශයෙන් ඔහුගේ සිත වෙනත් අරමුණක යෙදී ඇති බව පෙනෙන්නට තිබිණි. ඔහු තමාට පුරුදු පරිදි කෑ ගැසුවේ හෝ බැණ වැදුණේ හෝ නැත. ඔහුගේ ඇස් අග ලේ නරහරවල එක්තරා ගැස්මක් දකින්නට තිබිණි. සවස ඔහු නැවත ආ විට වඩාත් මහලු බවක් හා හැකිළී ගිය බවක් දක්නට තිබිණි. දූලි පිසදමන රෙදිකඩ දොරෙහි එල්ලා තිබීම නිසා ඔහු සේවිකාවට දොස් පැවරුවේ පහත් හඬකිනි. කොමිසාර්ගේ උණ වාර්තාව දෙස බලා යම් කිසි බෙහෙතක් නියම කොට ඔහු නිහඬ ව පිටවිය. ඔහුගේ පිරිවර දොස්තරවරු හා හෙදියෝ ද කැළැඹුණු ස්වභාවයකින් යුතුව ඔහු පිටුපසින් නිහඬ ව ගමන් කළහ. මහාචාර්යවරයාගේ කකුල යමක හැපී ඔහු වැටෙත් ම කෙනෙක් ඔහු අල්ලා ගත්හ.

පසුදින ඔවුන්ට රහස එළි විය. වසීලියි වසීලෙවිච්ගේ එක ම පුතා බටහිර යුද පෙරමුණේ දී මිය ගිය බව ආරංචි විය. දොස්තර කෙනෙකු වූ ඔහුගේ නම ද වසීලියි වසිලෙවිච් ය. විද්‍යාඥයෙකු වීමේ පෙර ලකුණු ඔහු තුළ දක්නට තිබුණෙන් පියා, පුතු ගැන ආඩම්බර විය;

සතුටු විය. ඔහුට සිටි එක ම දරුවා ද යුද්ධයට බිලි විය. මහාචාර්යතුමා තමන් බැලීමට පැමිණ ඇත් දැයි ලෙඩ්ඩු මෙන් ම, රෝහලේ සේවකයෝ ද හුස්ම නොගෙන බලා සිටියහ. හතළිස් දෙකේ වාට්ටුවට වැදුණු හිරු රැස් මහාචාර්යතුමා පැමිණෙන වේලාව දක්වන්නාක් මෙන් සිදුරට ළං විය. අද මහාචාර්යතුමා නොඑතියි කියන්නාක් මෙන් ඔවුහු එකිනෙකා තම තමන්ගේ මුහුණු දෙස බැලූහ. හිරු රැස් සිදුර මත වැටෙත් ම, සුපුරුදු සපත්තුවල හඬ ඇසිණි. මහාචාර්යතුමා අද ඊයේට වඩා සතුටින් ඉන්නා සැටියකි. තද හෙම්බිරිස්සාවක් හැදුණු විට දී මෙන් ඔහුගේ ඇස් පිය හා නහය ද තරමක් ඉදිමී ඇත. ඔහුගේ අත් වෙනදාට වඩා වෙව්ලන හැටි කොමිසාර්ගේ උණ වාර්තාව අල්ලා ගෙන සිටින සැටියෙන් පෙනේ. හැමදා මෙන් ම අද ද හේ කඩිසර ය; උනන්දු ය. ඔහුගේ කෑගැසීම් හා බැණවැදීම් අඩු වී ඇත.

කලින් එකඟ වූ කලෙක මෙන් තුවාලකාරයෝ සහ රෝගීහු මහාචාර්යවරයා සතුටු කිරීමට ඉදිරිපත් වූහ. හැම දෙනෙක් ම සුවය ලබන බව කියා සිටියහ. බරපතළ රෝගීහු පවා තම වේදනාව යටපත් කර ගත්තෝ සිනාසුණහ. රෝහලේ හැම දෙයක් ම අගනා ලෙස සංවිධාන කර ඇති බවත්, ප්‍රතිකාර ඉතා ම උසස් බවත් ඔවුහු එක හඬින් කියා සිටියහ. විශාල පොදු දුකක් නිසා රෝගීහු හා සේවකයෝ එක ම පවුලක් බවට පත් වූහ.

රෝගීන් පිරික්සමින් වාට්ටුවෙන් වාට්ටුවට ගිය වසීලියි වසීලෙවිච් එදින තම කටයුතු මෙතරම් සාර්ථක වූයේ මන්දැයි සිතමින් පුදුමයට පත් විය.

ඇත්ත වශයෙන් ම ඔහු පුදුමයට පත් වී ද? රෝගීන්ගෙන් ඒ සුහද කුමන්ත්‍රණය ගැන ඔහු දැන ගත්තේ නම්, ඔහු ලැබූ දරුණු සුව කළ නොහැකි තුවාලයේ වේදනාව අඩුවීමට එය හේතුවක් වනු ඇත.

## 9

මොස්කව් නදියේ හිම කැට දිය වී ගියේ ය. මුල දී ගංගා ජලය උතුරා ගිය ද, පසු ව මෙල්ල වූ කලෙක මෙන් එය තම සුපුරුදු නදී තීරයන් දක්වා පසු බැස්සේ ය. නැව්, පාරු බඩු නැව් හා මඟීන් ගෙන යන යාන්ත්‍රික බෝට්ටු ඉහළ පහළ දුවන්නට විය. ගොඩබිම ප්‍රවාහණය යුද්ධය නිසා අඩු වූ බැවින් එම හිඟය පිරිමැසීමට දිය මතු පිට ප්‍රවාහණය ඉදිරිපත් විය. වසන්ත ගංවතුරු නිසා හතළිස් දෙකේ වාට්ටුවේ එක රෝගියකුටවත් හානි නොවී යැයි කුකුෂ්කින් අඳුරු අනාවැකි පළ කළ ද, කොමිසාර් හැර අන් හැම දෙන ම සුවය ලැබීමට පටන් ගත්හ. සුවය ලබා රෝහලෙන් ටිකට් කපා යාම ගැන ඔවුහු කතා කළහ.

පළමුවෙන් රෝහලෙන් පිට වූයේ ස්තෙපාන් ඉවානොවිච් ය. ඔහු තම යුද ඇඳුමෙන් සැරසී ලෙඩුන්ගෙන් සමුගැනීමට පැමිණියේ ය. ඔහුගේ පරණ යුද කබාය සෝදා අපුල්ලපු නිසා සුදු පැහැ වී තිබිණි. කබාය මනා ලෙස හැඳ හම්පටිය ඉණ වටා බැඳ සිටි නිසා කබායේ රැලි නොපෙනේ. ස්තෙපාන් ඉවානොවිච් දැන් අවුරුදු පහළොවකින් පමණ තරුණ වී ඇත. සෝවියට් සංගමයේ වීරයා - රන් තරුව ද, ලෙනින් සම්මාන පදක්කම සහ නිර්භයත්වයේ පදක්කම ද ඔහු පැලඳ සිටියේ ය. රෝහලේ සුදු කබායෙන් ඔහු දෙවුර වසාගෙන සිටියේ ය. ඔහුගේ සිහින් උඩු රැවුළ ද ඇඳුම් හා සපත්තු ද ඉරියව් ද 1914 පළමුවැනි ලෝක මහා යුද්ධ සමයේ නත්තල් උත්සව පතක සෙබළෙකුගේ පින්තූරයට සමාන විය.

වාට්ටුවේ හැම රෝගියකු ම වෙත පැමිණි ස්තෙපාන් ඉවානොවිච් ඔවුන්ගෙන් සමුගත්තේ ය. දෙපයේ විළුඹ එකිනෙකට ගැටෙන සේ සපත්තු අඩි හප්පමින් සීරුවෙන් සිට ඔහු තම රෝගී සගයන්ගෙන් සමුගනිමින් ආචාර කළේ දුටුවන් මන පිනවමිනි.

කොමිසාර් වෙත පැමිණි හෙතෙම දයාන්විත ලෙස මෙසේ කීයඃ "සේනාංක කොමිසාර් සහෝදරය, අවසර දෙන්න ඔබගෙන් සමුගන්න."

"ආයුබෝවන් ස්තෙපාන්. සුබ ගමන්" යැයි කොමිසාර් කීවේ වේදනාව මැඩ ගනිමින් ඔහු වෙත හිස හරවමිනි.



"සනීප වෙයන්. සෙමේන් වසීලෙවිච් කොමිසාර් සහෝදරය. දෙවියන්ගෙ පිහිට ලැබේවි! දීර්ඝායුෂ ලැබේවි! උඹේ හෘදවස්තුව රත්රන් කඳක්. පියකුට වඩා හොඳින් නුඹ අපිට සැලකුවා. මා මැරෙන තුරු නුඹව අමතක කරන්නෙ නැහැ." යැයි ස්තෙපාන් ඉවානොවිච් කීවේ චිත්ත වේගයෙනි.

"යන්න, යන්න ස්තෙපාන් ඉවානොවිච් එයාගෙ හිත අවුල් කරන්න එපා" යැයි ක්ලාව්දියා මිහයිලොව්නා තෙපලා ය.

"සහෝදරිය, උඹටත් අනේක වාරයක් ස්තුති කරනව. සහෝදරිය අපේ සෝවියට් දෙව්දුවක්" යැයි ස්තෙපාන් ඉවානොවිච් ඇට ආචාර කරමින් පැවසී ය.

නැවත වාට්ටුවේ රෝගීන්ට ආචාර කළ සෝවියට් සංගමයේ වීර සෙබළා වාට්ටුවේ දොර හැර පිට ව ගියේ ය.

හැම කෙනෙක් ම සුවය ලබන්නට වූහ. දැන් එය සිහිනයක් නොවී ය. අනාගත වැඩ ගැන ඔවුහු කතා කළහ. කොරිඩෝරය දිගේ ඇවිදින්නට පටන් ගත් කුකුෂ්කින් රෝහලේ අනෙකුත් වාට්ටුවල රෝගීන් සමඟ ද කලහ කළේ ය. යුද්ධටැන්කි සෙබළාගේ තුවාල වෙළා තිබූ වෙළුම් පටි ගලවා දැමීමෙන් පසු, ඔහු කොරිඩෝරයේ කණ්ණාඩිය ඉදිරිපිට සිට ගෙන බෙල්ලේත්, මුහුණේත්, අත්වලත් ඇති තුවාල හා කැළැල් පිරික්සුවේ ය. අන්යූටා සමඟ ඔහුගේ ලියුම් හුවමාරුව වැඩිවෙත් ම, ඔහු වෛද්‍ය විද්‍යාලයේ තොරතුරු වැඩියෙන් දැන ගත්තේ ය. පෙරට වඩා ඔහු කණ්ණාඩිය ඉදිරපිට සිටගෙන මුහුණේ කැළැල් පිරික්සමින් කල්පනා කළේ ය. හිමිදිරි පාන්දර සහ හවස ඇඳිරි වැටුණු පසු නම්, ඔහුගේ මුහුණ ලස්සන ය. පළල් නළල, මඳක් වක් වූ පුංචි නහය, යෞවන මුරණ්ඩුකම් කියාපාන සිහින් දෙතොල, උඩුතොල වසා ඇති සිහින් රැවුළ ඔහුගේ මුහුණේ හැඩය ඔප් නංවයි. එහෙත්, දහවල නම් ඔහුගේ මුහුණේ සම පිලිස්සී ඇති බව පෙනේ. ඒ කැළැල් වසා ඇති හම ගොරෝසු ය. අවලස්සන ය. ග්වොස්දෙව් කැලඹී ගත් විට සහ ප්‍රතිකාරවලින් පසු එම කැළල් වඩාත් ඉදිමී පෙනෙයි. එවැනි අවස්ථාවල දී කණ්ණාඩියෙන් මුහුණ බලන හෙතෙම අඬා වැලපීමට පවා සූදානම් විය.

"උඹ මොකද බය වෙන්නෙ? සිනමා තරුවක් වෙන්ට හදනවද? උඹගෙ ඔය පෙම්වතිය උඹට හැබෑටම පෙම් කරනව නම් තුවාල කැළැල් නිසා එයා බය වෙන එකක් නැහැ. බය වෙනව නම් එයා උඹට හැබෑටම පෙම් කරල නැහැ. එහෙනම් එයාව යන අතක යන්ට හරිනව" යැයි කී අලෙක්සේයි ඔහු සැනසුවේ ය.

"ගෑනු ජාතිය ඔහොම තමා!" කුකුෂ්කින් කීවේ ය.

"තමුසෙගෙ අම්මත් එහෙමද?" යි එම කතාව අසාගෙන සිටි කොමිසාර් ඔහුගෙන් ඇසී ය. වාට්ටුවේ හැම රෝගියෙකු ම තම සොහොයුරෙකු මෙන් පිළිගෙන ඇති කොමිසාර්, කුකුෂ්කින් ඇමතුවේ පිටත්තර කෙනෙකු මෙනි.

ඒ ප්‍රශ්නය නිසා කුකුෂ්කින් වෙනස් වූ හැටි දකින විට පවා විශ්වාස කළ නොහැකි විය. ඔහුගේ දෑස් රතු විය. මුහුණ කඩදාසි කොළයක් මෙන් සුදුමැලි විය.

"ඔන්න පේනව නේද? මේ ලෝකෙ හොඳ යහපත් ගැහැනුත් ඉන්නවා" යැයි කොමිසාර් ශාන්ත ලෙස පැවසී ය. "එහෙනම් තමුසෙ ඇයි ග්වොස්දෙව්ට හරියන්නෙ නැතැයි කියන්නෙ? තට්ටු කරන්නාට දොර ඇරෙනව යන කියමන අහල නැතිදැ?"යි කොමිසාර් ඇසී ය.

වාට්ටුවේ හැම රෝගියකුගේ ම තත්ත්වය යහපත් වූ අතර, කොමිසාර්ගේ තත්ත්වය වඩාත් අයහපත් විය. මෝපියා, කැම්පර් වැනි බෙහෙත් නිතර ඔහුට විදීමට සිදු විය. සමහර විට මුළු දවසේ ම ඔහු අඩ සිහියෙන් පසු විය. ස්තෙපාන් ඉවානොවිච් ගිය පසු කොමිසාර්ගේ රෝගය බරපතළ විය. තම ඇඳ කොමිසාර්ගේ ඇඳ ළඟින් තබන ලෙස අලෙක්සේයි ඉල්ලා සිටියේ ඔහුට උදව් කිරීමේ අදහසිනි. ඔහුගේ සිත වඩ වඩාත් කොමිසාර් කෙරෙහි ඇදෙන්නට විය.

දෙපා නැති ජීවිතය කිව නොහැකි තරම් අසීරු බව දන්නා අලෙක්සේයි බරපතළ ලෙස රෝගාතුර වී සිටින කොමිසාර් තම අසාධ්‍ය රෝගය ගැන නොසලකා අනුන්ට උදව් කිරීමට නිතර ඉදිරිපත් වීම නිසා ඔහු වෙත ඇදී ගියේ කාන්දමකට ඇදෙන ඉඳිකටුවක් මෙනි. කොමිසාර්ට ප්‍රකෘති සිහිය ලැබුණේ ඉඳ හිටලා ය. ඒ හැම අවස්ථාවක දී ම ඔහු පෙර මෙන් හැසිරුණේ ය.

දවසක් දා රාත්‍රී නවයට පමණ වසීලියි වසීලෙවිච් දෑත් පිටිතල හයා තබාගෙන සෙමින් සෙමින් වාට්ටුවට ඇතුළු විය. දොස්තර කබායේ බොත්තම් දමා නොතිබිණි. පැසුණු හිසකෙස් ඔහුගේ නළල මත වැටී ඇත.

"වසීලියි එනවා" යැයි අලෙක්සේයි කොඳුරා කීවේ ය. මේ වන විට අලෙක්සේයි කෘත්‍රිම කකුල් සෑදීමේ විශේෂ සැලැස්මක් ගැන සිය අදහස කොමිසාර්ට දන්වා තිබිණි.

බිත්තියට මුහුණ දී සිටගත් වසීලියි වසීලෙවිච් යමක් මුමුනා හතළිස්දෙකේ වාට්ටුවට ඇතුළු විය. ඇඳන් ඉදිරිපිට සිටගෙන නළල අතගාමින් හෙතෙම යමක් කල්පනා කරන්නට විය. ඔහු වෙතින් මත් ද්‍රව්‍ය ගඳක් වහනය විය.

"වසීලියි වසීලෙවිච් වාඩිවෙන්න. අපි පොඩ්ඩක් කතා කරමු" යි කොමිසාර් ඔහුට යෝජනා කළේ ය.

සෙමින් ඇඳ ළඟට ආ මහාචාර්යතුමා එහි කොනක වාඩි වෙත් ම, ඇඳේ දුනු 'කිටි' 'කිටි' යන හඬක් නැගී ය. හේ තම කංශක අතින් පිරි මැද්දේ ය. දිනපතා ලෙඩුන් පරීක්ෂා කරන මහාචාර්යතුමා කොමිසාර් සමඟ මඳ වේලාවක් යුද්ධය ගැන කතා කළේ ය. සවස ඔහු හමුවී කතා කිරීම ගැන පුදුමයක් නොවූයේ එබැවිනි. එවැන්නක් අතර විශේෂ සාකච්ඡාවක් ඇතිවනු ඇතැයි සිතූ අලෙක්සේයි දෑස් වසාගෙන නිදාගත්තාක් මෙන් සිටියේ ය.

"අද අප්‍රේල් 29 දා. එයාගෙ උපන් දවස. එයා ජීවත්ව හිටිය නම් අද එයාට අවුරුදු 36ක් පිරෙනව" මහාචාර්යතුමා පහත් හඬින් කීවේ ය.

බොහෝ අමාරුවෙන් බ්ලැන්කට්ටුවට යටින් අතක් එළියට ගත් කොමිසාර් වසීලියි වසීලෙවිච්ගේ අත මත තබත් ම නොසිතූ දෙයක් සිදුවිය. මහාචාර්යතුමා ළමයෙකු සේ අඬන්නට විය. ලොකු, ශක්තිමත්, අධිෂ්ඨාන බලයකින් යුතු ඒ පුද්ගලයා අඬන සැටි දැකීම අසීරු කරුණකි. ඉබේට ම මෙන් අලෙක්සේයි තම බ්ලැන්කෙට්ටුවෙන් මුහුණත්, හිසත් වසා ගත්තේ ය.

"යුද පෙරමුණට යන්ට ඉස්සෙල්ල, පුතා ආවා මා හම්බවෙන්ට. මහජන හමුදාවට බැඳුණු හන්දා වැඩ බාරදෙන්නෙ කාටද කියල කීවොත්, මම එයාට බැණවැදුණා. වෛද්‍ය විද්‍යාව අනුව එයා පශ්චාත් උපාධි ලබාගෙන පරීක්ෂණ කටයුතු කරන දොස්තර කෙනෙක්. බොහොම හොඳ අනාගතයක් තිබුණා. එයාට තුවක්කුවක් අරන් සටනට යාමට ඇති වුවමනාව මට තේරුම් ගන්ට බැහැ. 'පශ්චාත් උපාධි ලැබූ විද්‍යාඥයො පවා තුවක්කු ගන්න වෙලාවන් තියෙනව තාත්තේ' කියලා එයා මට කිව්වා. 'මගේ වැඩ කාටද බාරදෙන්නෙ?' කියල ආයෙමත් මගෙන් ප්‍රශ්න කළා. මම ටෙලිෆෝනය අරගෙන ප්‍රධාන යුද්ධ කාර්යාලයට එක වචනයක් කිව්ව නම් බේරාගන්ට තිබුණා. ඔය මරණය වළක්වන්න තිබුණ! මගේ පුතා යුද්ධ භටයන්ට වෙදකම් කරන මේ රෝහලේ අංශය භාරව වැඩ කළා!... එහෙම නේද?"

වසීලියි වසීලෙවිච් නිහඬ විය. ඔහු සුසුම්ලන සැටි ඇසිණි.

"...සහෝදරය, මා සනසන්ට ඕන නැහැ. තමුසෙ හොඳටම වේදනා විඳින බව මට තේරෙනව... මම මුළු රෑම කල්පනා කළා මොනවද කරන්නෙ කියලා. මම ටෙලිෆෝන් කළේ නැහැ..."

"දැන් මහාචාර්යතුමා ඒ ගැන කනගාටු වෙනවද?" යි කොමිසාර් ඇසී ය.

"නැහැ. ඒක කනගාටුවක් කියල හඳුන්වන්න බැහැ. මගේ පුතාව මැරුවෙ මම නොවේද? කියල මම, මගෙන් ම අහනව. අප දෙන්නට රටේ ප්‍රයෝජනය සඳහා බොහෝ වැඩ කටයුතු කරන්ට අවස්ථාවක් තිබුණ. ඔහු බොහොම දක්ෂ, කුසලතාවක් ඇති විද්‍යාඥයෙක්. වෛද්‍ය විද්‍යාවට විශාල සේවයක් කරන මහා විද්‍යාඥයෙක් වීමේ වාසනවා එයාට තිබුණ... එදා මම ටෙලිෆෝන් කළා නම්!"

"ටෙලිෆෝන් නොකළාට ඔබතුමා කනගාටු වෙනවද?"

"මොනවද කිව්වෙ? ආ... මට ඒකට කෙළින්ම පිළිතුරු දෙන්න බැහැ"

"නැවත වරක් ඔහෙගෙ පුතා යුද පෙරමුණට යන්න ලෑස්ති වුණොත් ඔහෙ එයාගෙ ගමන වළක්වන්න ඉදිරිපත් වෙනවද?" යි කොමිසාර් ඇසී ය.

මහාචාර්යතුමා නිහඬ විය. වාට්ටුවේ රෝගීන්ගේ ආශ්වාස ප්‍රශ්වාස හඬ ඇසිණි. මහාචාර්යතුමා වාඩි වී සිටි ඇඳේ දුනු 'ක්‍රික්' යන හඬක් පිට කළේ ය. ඔහු පැත්තකට හැරුණා විය යුතු ය. කාමරයට උණුසුම ලබාදෙන උණුවතුර බැටරියක වතුර හඬ නඟමින් දුවන සැටි ඇසිණි.

"එහෙම කොහොමද?" යි මහාචාර්යතුමා ප්‍රශ්න කළේ ය. ඔහුගේ කටහඬ උණුසුම් විය.

"ඔය ප්‍රශ්නෙට පිළිතුරු දීම ලෙහෙසි නැහැ. ලෙහෙසි නැහැ... ආයෙමත් ඔය දේ සිදු වුණොත් මම ටෙලිෆෝන් කරල එයාව නවත්වන්ට ලෑස්ති වෙන්නෙ නැහැ. මේ යුද්ධය කොතරම් භායනක දෙයක් ද? කොහොම කතා කළත්, එහි බියජනක බව අඩු වෙන්නෙ නැහැ..."



නැඟිට සිටි මහාචාර්යතුමා කොමිසාර්ගේ අත බ්ලැන්කට්ටුව යටින් තබා නිහඬ ව වාට්ටුවෙන් පිට විය. එදින රෑ කොමිසාර්ගේ රෝගය අසාධ්‍ය විය. සිහිසන් නැති ව හෙතෙම ඇඳ මත දඟලන්නට විය. දත්මිටි කමින්, හඬ නඟා සුසුම් ලමින් හුන් හෙතෙම හිටි හැටියේ ම මළාක් මෙන් නිහඬ විය. ඔහුගේ අවසානය පැමිණ ඇතැයි අපි සිතුවෙමු. සිය පුතාගේ මරණින් පසු ගෙදර නැවතීම අතහැර දමූ මහාචාර්යතුමා රෝහලේ ම කුඩා කාමරයක රැය ගත කළේ ය. කොමිසාර්ගේ තත්ත්වය බලාපොරොත්තු රහිත වූයෙන් ඔහුගේ ඇඳ වටා ආවරණයන් තබන ලෙස මහාචාර්යතුමා අණ කළේ ය. පණ අදින ලෙඩුන් වටා මෙවැනි ආවරණයන් තබන්නේ මළ පසු 'පනහේ වාට්ටුවට' ගෙන යාමට බව රෝගීහු කීහ.

වසීලියි වසීලෙවිච් හා වාට්ටුව භාර දොස්තර කොමිසාර්ට බෙහෙත් විද, අම්ලකර වායුව දුන්නේ ය. කොමිසාර්ගේ හදවත නැවත ක්‍රියාකාරී විය. නාඩි වැටෙන්නට විය. ඔවුන් ගිය පසු ලෙඩා සමග ක්ලාව්දියා මිහයිලෙව්නා පමණක් නැවතුණා ය. නොනිදා සිටි අලෙක්සේයි කල්පනා කරන්නට විය. "ඇත්තටම මෙය ඔහුගේ අවසානයද?" කොමිසාර් වේදනාව ඉවසා ගත නොහී දඟලන්නට විය. අමාරුවෙන් කටහැර ගත් කොමිසාර් යම් කිසි වචනයක් කියන සැටි අලෙක්සේයිට ඇසුනාක් මෙනි.

"ජලය" යනුවෙන් කොමිසාර් හඬ නගන හැටි ඔහුට ඇසිණි.

ක්ලාව්දියා මීහයිලොව්නා වෙව්ලන අත්වලින් යුතු ව බඳුනට වතුර වක් කරන සැටි ඔහුට පෙනිණි.

රෝගියාගේ කටට වතුර වක්කළ ද, වතුර කට දෙපැත්තෙන් ගලා ගිය නමුදු, ඔහු නොපැහැදිලි ලෙස 'ජලය, ජලය...' යන වචනය කීවේ ය. කොමිසාර් ගොත ගසමින් කියන වචනය 'ජලය' නොව 'ජීවිතය' බව අලෙක්සේයිට තේරුම් ගත හැකි විය. මේ මහා පුරුෂයා සිහිසන් නැතිව සිටිද්දී පවා අභීතව මරණයට එදිරිව සටන් කරන සැටි ඔහු දුටුවේ ය.

නිහඬ වූ කොමිසාර් ඇස් ඇර බැලී ය.

"දෙවියන්ගෙ පිහිටයි!" කී ක්ලාව්දියා මීහයිලොව්නා ආවරණය ඉවත් කිරීමට සැරසුණා ය.

"සහෝදරිය, ඉස්කිරීම ඉවත් කරන්න එපා. ඔහොම තියන්න හරින්න. අඬන්ට එපා. ඔබේ කඳුළු කැට නැතුවට ලෝකෙ බොහොම අම්හිරි දේ තියෙනව. ඔයා සෝවියට් දේව දූතියක්. ඔයා වැනි දේව දූතියන් පවා, මාරයාගෙ කට ළඟට ආ පසු හමුවීම කනගාටුවට කරුණක්"

## 10

අලෙක්සේයි විස්මයජනක අත්දැකීමක් ලැබී ය.

ශාරීරික ව්‍යායාම් කිරීම මඟින් නැවත සම්පූර්ණ මිනිසෙකු ලෙස අහස්යානා පැදවීමට පුළුවන් බව තදින් ම විශ්වාස කළ අලෙක්සේයි තුළ ක්‍රියාකාරී වීමේ දැඩි ආසාවක් පහළ විය.

දැන් ඔහුට පරමාර්ථයක් ඇත. ප්‍රහාරක අහස් නියමුවකු ලෙස නැවත සේවය කිරීම ය. ඒ අරමුණ ඉටු කර ගැනීම සඳහා හෙතෙම දැඩි ආත්ම විශ්වාසයකින් යුතු ව වැඩ කිරීමට පටන් ගත්තේ ය.

අහස්යානා පැදවීමේ විද්‍යාව ගැන දත් මිනිසෙකුට පවා එය විශ්වාස කළ නොහැකි දෙයක් විය. දෙපා රහිත වුව ද, අහස්යානා පැදවිය හැකි යැයි තමාට ඔප්පු කොට පෙන්විය හැකි බවට අලෙක්සේයි මෙරේස්යෙව් දැඩි ලෙස ඉටා ගත්තේ ය. ඔහු තම වැඩ පිළිවෙළ ක්‍රියාවේ යෙදවී ය. සියලු ප්‍රතිකාර හා බෙහෙත් නොකඩවා ගත්තේ ය. නිතර අමතර ආහාර ගත්තේ ය. තමාට නුපුරුදු දහවල් නිදා ගැනීම පුරුදු කර ගත්තේ ය. හැම වැඩකට ම නියමිත වේලාවක් වෙන් කළේ ය. සියලු වැඩ කටයුතු කාලසටහනක් අනුව කළේ ය.

ආහාර ගැනීම, බෙහෙත් හා ප්‍රතිකාර ගැනීම, නිදා ගැනීම අමාරු දේ නොවේ. එහෙත්, ශාරීරික ව්‍යායාම් කිරීම දුෂ්කර කාර්යයකි. දෙපා නැති, ඇඳට සීමා වී සිටින මිනිසෙකුට සාමාන්‍ය ව්‍යායාම් ක්‍රම පමණක් නොසෑහේ. දෙපැත්තට නැමීම, අත්වලට බෙල්ලට කවන්ධයට විශේෂ ශක්තියක් ලබාදෙන ව්‍යායාම් කළේ ය.

සැත්කම් තුවාල සුව වීමෙන් පසු වෙළුම් පටි ලිහුවේ ය. දැන් ඔහුගේ (දෙපා නැති) කකුල්වල මාංස පේශීන් ශක්තිමත් කළ හැකි ය. දෑතේ ශක්තියෙන් හිස හා කඳ ඔසවන හෙතෙම විළුඹ හා ඇඟිලි නැති කකුල්වලින් ව්‍යායාම් කරයි. ඇඳේ යකඩ රිටිවලට කකුල් තද කරගෙන හිසත්, පපුවත් ඔසවා ඉදිරියට නැමෙයි. මේ ව්‍යායාම් දිනපතා කළ ඔහු වාර ගණන ද වේලාව ද ක්‍රම ක්‍රමයෙන් වැඩි කළේ ය. කකුල් දණහිස්වලින් නවා කඳට තද කොට නැවත සැණෙකින් විදහා හරිමින් දිගු කළේ ය. මෙය හොඳ ව්‍යායාමයක් විය. පළමුවරට ඒ ව්‍යායාම් කළ විට ඔහුට තියුණු වේදනාවක් දැනිණි. ඇස්වටය දක්වා කපා දැමූ කකුල්වලින් ව්‍යායාම් කිරීම කොතරම් අපහසු ද යන්න ඔහුට පැහැදිලි විය. පියාපතක් හෝ වලිගයක් හෝ කැඩුණු අහස්යානයක් පැදවීම අසීරු දෙයකි, ඇස්වටය දක්වා කපා දැමූ කකුල්වලින් ව්‍යායාම් කිරීම. අලෙක්සේයි

තම සිරුර අහස්යානයකට සම කළේ ය. මිනිස් සිරුර සැදී ඇත්තේ උත්කෘෂ්ට අන්දමට ය. දෙපා නැති නිසා ඔහු දැන් අසම්පූර්ණ මිනිසෙකි. ව්‍යායාම් මඟින් සිරුර ශක්තිමත් කළ හැකි ය. එහෙත්, විළුඹ හා ඇඟිලි නැති දෙපාවලින් පෙර මෙන් සමබර ව සිටිය නොහැකි ය. කොතෙක් ව්‍යායාම් කළත් දෙපා නැති නිසා ළමා වියේ සිට පුරුදු පුහුණු වූ වැඩ කළ නොහැකි ය.

කකුල්වලින් ව්‍යායාම් කිරීම තියුණු වේදනාවක් ගෙන දුන්නේ ය. එහෙත්, අලෙක්සේයි දැඩි අදිටනකින් යුතු ව දිනපතා ව්‍යායාම් කිරීමේ කාලය විනාඩියකින් වැඩි කළේ ය. ඒ වැඩිපුර විනාඩිය ඔහුට තියුණු වේදනාවක් ගෙන දුන්නේ ය. දෑසින් කඳුළු කැට වැටිණි. තොල් රත් පැහැ විය. කෙඳිරි ගෑම මැඩ පවත්වා ගනු වස්, දෙතොල සපා ගන්ට වූයෙන් ලේ රසය පවා දැනිණි. එහෙත්, හේ පසු නොබැස්සේ ය. මුලින් දවසකට වරක් ද පසු ව දෙවරක් ද ව්‍යායාම් කළ අලෙක්සේයි කාලය දිනපතා විනාඩියකින් වැඩි කළේ ය. මෙසේ ව්‍යායාම් කළ පසු ඔහු ඇඳ මත වැතිර ගත්තේ නැවත වරක් එසේ කිරීමට ඔහුට ශක්තියක් ඇත්දැයි සැක කරමිනි. ව්‍යායාම් කිරීමේ කාලය පැමිණි විට ඔහු නැවත එය පටන් ගත්තේ දුබලත්වය මැඩ ගනිමිනි.

අලෙක්සේයි නිතර සිතුවේ කකුල් ගැන ය. සමහර විට තම විළුඹේ හා පා ඇඟිලිවල වේදනාවක් හටගෙන තිබෙන බව ඔහුට සිතිණි. ඔහු කකුල් ඒ මේ අත සොලවන්නට විය. ඇස්වටය දක්වා තම පාදයන් කපා හැර තිබෙන බව ඔහුට මතක් වූයේ පසු ව ය. ඔහු නිතර තම කකුල් ගැන කල්පනා කරන්නට වූයේ, ඒවා සම්පූර්ණ, නිරෝගී බව සිතී ය. ඔහු අහස්යානයේ පියාපතකට නැඟ පසු ව පදවන නියමු ආසනයේ වාඩි වී තම අත් උදව් කාර යූරා යානය වසා ඇති කවරය ගලවන තුරු නොඉවසිලිමත් ව බලා සිටින සැටි සීනෙන් දුටුවේ ය. ඕල්යාගේ අතක් ගෙන ඈ සමඟ පාවහන් රහිත ව දුවන සැටි ද ස්ටෙප්ස්හි සිසිල් පිනි බිඳුවලින් දෙපා තෙත් වූ සැටි ද, ඔහුට සිහිනෙන් පෙනිණි. ඔවැනි සුන්දර සිහිනවලට පසු ව අවදි වන ඔහු තම පාදයන් නැති බව දකින්නේ, බෙහෙවින් දුක්විය.

සමහර දවස්වල දී අලෙක්සේයි මෙවැනි සිහිනවලින් පසු ව අධෛර්යයට පැමිණියේ ය. මෙලෙස ව්‍යායාම්

කිරීමෙන් කිසිදු ඵලක් නැතැයි ද, තමාට කිසිදිනෙක අහස්යානාවක් පැදවීමට බැරිවනු ඇතැයි ද කල් ගෙවී යත් ම තමාට වඩාත් ළං වී ඇති, වඩාත් සුන්දර වස්තුවක් බවට පත් වී ඇති කමීෂින්හි ඕල්යා සමඟ අත්වැල් බැඳගෙන ස්ටෙප්ස් බිම දිගේ දිවීමට බැරිවනු ඇතැයි ද සිතූ අලෙක්සේයි කනගාටුවට පත් විය.

ඕල්යා සමඟ සම්බන්ධකම් පවත්වා ගැනීම අලෙක්සේයිගේ සිතට සතුටක් නොවී ය. සතියක් පාසා ම පැහැදිලි අකුරින් ලියූ ලියුමක් ගෙනෙන ක්ලාව්දියා මීහයිලොව්නා ඔහු 'නැටීමට' එනම් ඇඳ මත වැතිර සිරුර ඒ මේ අත වනමින් අත්පොළසන් දීමට සැලැස්සුවා ය. කල් යත් යත් ම, මේ ලියුම් දිගින් වැඩි විය. යුද්ධය නිසා පීඩා ලැබූ ඕල්යාගේ ආලය මුහුකුරා වැඩී ඇති බව ඒවා කියා පෑවේ ය. කැලඹුණු සිතින් ඒ ලියුම් කියවූ ඔහු ඇගේ ආලයට නිසි පිළිතුරු සැපයීමට තමාට අයිතියක් නැති බව අමතක නොකළේ ය. පාසල් සිසුන් වූ අලෙක්සේයි හා ඕල්යා ළමා වියේ සිට ම එකිනෙකාට ඇලුම් කළහ. වැඩිහිටියන් මෙන් පෙනී සිටීමට ආසා කළ ඔවුහු මේ හැඟීම් ආලය වශයෙන් හැඳින්වූහ. පසු ව දෙදෙනා අවුරුදු හතකට පමණ ඈත්වූහ. තරුණිය කාර්මික පාසලකට ඇතුළු වූවා ය. ඈ නැවත තම නගරයට විත් කම්හලේ ශිල්පිනියක ලෙස වැඩ කිරීමට පටන් ගත්තා ය. මේ වන විට අලෙක්සේයි අහස් නියමුවන් පුහුණු කරන පාසලේ උගත් බැවින් ඈ ඔහු හමු නොවූවා ය. යුද්ධාසන්න සමයේ දී ඔවුහු මුණ ගැසුණහ. වසන්ත සමයේ එක් දවසක අලෙක්සේයි තම මව සමඟ ගමනක් යද්දී ඔවුන් වෙත තරුණියක් ගමන් කරන සැටි ඔහු දුටුව ද, ඔහු ඇය හඳුනා නොගත්තේ ය.

"ඇයි පුතේ නුඹ අර ගෑනු ළමයට ආචාර නොකළේ. ඒ ඕල්යා, නුඹට අමතක වුණාද?" යි අම්මා ඇසුවා ය.

අලෙක්සේයි ආපසු හැරී බලත් ම, ඔහු ඈ ද ඔහු දෙස බැලුවා ය. ඔහුගේ හදවත ගැස්සිණි. පොප්ලර් ගසක් යට සිටගෙන සිටි ඕල්යා වෙත ඔහු දුව ගියේ ය.

"ඕල්යා ද?"යි ඔහු ඇසුවේ වෙනත් ලොවකින් බට සුන්දර කතක් හදිසියෙන් ම කුඩා නගරයකට පැමිණි බැවින් පුදුම වූ කලෙක මෙනි.

"අලෙක්සේයි!" යැයි ඕල්යා කීවේ ඔහු තරම් ම පුදුම වෙමිනි.

මනහර රූ සපුවෙන් යුත් තරුණියකි, ඔහු දුටුවේ. ඇගේ මුහුණ වටකුරු ය, සුන්දර ය. නහය ළඟ රන් පැහැති ලපයකි. ඈ තම දීප්තිමත් නෙත්වලින් ඔහු දෙස බැලුවා ය. ඇගේ ඇස් බැමි ඝන ව වැවී ඇත. දැන් අලෙක්සේයි ඉදිරිපිට සිටගෙන සිටින මේ රූමත් තරුණිය තමා පාසල් යන කාලයේ තමා සමඟ එකට ගමන් කළ කෙල්ලට කොහෙත් ම සමාන නැත. එදා ඈ තම පියාගේ ලොකු කබායක් ඇඳගෙන දෑත් නවාගෙන ඔහු සමඟ පාසල් ගියේ කොල්ලකු මෙනි.

මව සමඟ යන ගමන පවා අමතක කළ අලෙක්සේයි ඇය දෙස බලාගත්වන ම සිටියේ පසුගිය අවුරුදු කීපය තිස්සේ ම ඇය හමුවීමට බලාපොරොත්තුවෙන් සිටියාක් මෙනි.

"ඔයා වෙනස් වෙලා තියෙන හැටි" යැයි අලෙක්සේයි කීවේ ය.

"වෙනස් වෙලා ද"යි ඈ අසන්නී, කොක් හඬලමින් සිනාසුණා ය. ඇගේ සිනාව පාසල් යන කාලයේ දී මෙන් නොවී ය.

තරුණ දෙදෙනා දෙස බැලූ මව, දුක්මුසු ලෙස මඳසිනාවක් පා ඉවත ගියා ය. මහලු කාන්තාවට සියල්ල අවබෝධ විණි. මහල්ලන් මහලු විය යුතු ය. තරුණයන් වර්ධනය විය යුතු ය. මැහැල්ල දුක් වූයේ මේ නිසා ය.

ඔවුහු තම ආලය ගැන එකවර කතා නොකළහ. වොල්ගා නදියේ ජලය නිසල ව ගලා බසී. වසන්තයේ හිරු අවර දිගට හැරිණි. තම නිවාඩු කාලයත් ගෙවී යන බව අලෙක්සේයිට වැටහිණි. ඕල්යාට තම අදහස් පැවසිය යුතු යැයි අලෙක්සේයි තීරණය කළේ ය. ඔවුහු චිත්‍රපට බැලීමට ද රැඟුම් හා සර්කස් බැලීමට ද ගියහ. ඔහු තිරය දෙස හෝ රඟ මඩල දෙස හෝ නොබැලී ය. ඒ වෙනුවට ඕල්යා දෙස බලමින් සිතන්නට විය. "දැන් ගෙදර යන ගමන් මම ඇට ආලය කරන බව සත්තකින් ම කියනවා." ඇගේ නිවස ළඟට ම පැමිණිය ද, ඔහුට තම අදහස කියා පෑමට තරම් ධෛර්යයක් නොවී ය. ඉරිදා දවසක

ඔවුහු වොල්ගාව අසල මිටියාවතට ගියහ. එහි වූ විවිධ මල්වල සිරි බලමින් ඈ ඇවිදින විට ඔහු ඇය ඡායාරූප ගත කළේ ය. ඈ ඇඳුම් ගලවා නාන ඇඳුම් අඳින විටත්, නැවත තෙත ඇඳුම් ගලවා ගවුම අඳින විටත් ඉවත ගිය ඔහු ඈ දෙස නොබැලී ය.

ඕල්යා ඔහුට අඬ ගැසුවා ය. ඈ සුදු වැලිතලාව මත වාඩි වී හිස වටා තුවායක් ඔතාගෙන සිටියා ය. ඇගේ කකුල් ඉරු රැස් නිසා රත් පැහැගෙන තිබිණි. පිරිසිදු රෙදි කඩක් එළා කුඩා ගල් සතරක් ඒ මත තැබූ ඕල්යා තමා ගෙනා සලාද මාළු, සහ විස්කෝතු පිළිවෙළින් රෙදි කඩ මත තබා ඔහුට ආරාධනා කළා ය. දෙදෙනා ම සතුටින් ආහාර ගත්හ. දිය ලුණු හා අඹ ආදිය පවා ගෙන ඒමට අමතක නොකළා ය. ඈ ඔහුට ආහාර බෙදා දුන්නී ය. ඇගේ හැම වැඩක ම පියකරු බවක් පෙනෙන්නට තිබිණි. තව දුරටත් පමා නොකළ යුතුයැයි ද තීරණය කළ අලෙක්සේයි, අද සවස තම අදහස ඈට දන්වන බව සිතා ගත්තේ ය. ඈ ඔහුගේ බිරිඳ විය යුතුයැයි ද ඈට ඒත්තු ගැන්විය යුතුයැයි ද ඔප්පු කළ යුතුයැයි ද ඔහු ඉටා ගත්තේ ය.

නැවත වරක් දිය නාමින් පීනමින් ප්‍රීති වූ මොවුහු සවස ඇගේ ගෙදර දී නැවත හමුවීමට තීරණය කර ගත්හ. ගඟෙන් එගොඩ වීම පිණිස ඔවුන් තොටුපළට පැමිණියේ විඩාපත් ව සතුටු සිතිනි. එහෙත්, බෝට්ටු, ඔරු හෝ යාන්ත්‍රික බෝට්ටු හෝ නොවී ය. හිරු නොපෙනී යාමට ආසන්න ය. අවරදිග අහස ලේ පැහැ ගත්තේ ය. ගෙවල්වල වහලවල් හිරු රැස් නිසා රන් පැහැයක් දැරී ය. නගරයේ උසැති තුරු මුදුන් බැබළිණි. කවුළුවල වීදුරු රතු පැහැති හිරුගේ රැස් පිළිබිඹු කළේ ය. මෙවැනි වේලාවක නගරයේ වීදි පාළු විය යුතු ය. එහෙත්, අද වීදි පුරා මිනිස්සු දුවති. මිනිසුන් රැගත් ලොරි රථ දෙකක් දුව ගියේ ය. කුඩා කණ්ඩායම් යුද්ධ සරඹ කළහ.

"ඔරුකාරයා නාවොත් අපට මෙතන රෑ ගතකරන්න සිද්ද වේවි නේද?" යි අලෙක්සේයි ඇසී ය.

"ඔයා ඉන්නා විට මම බය වෙන්නෙ නැහැ" යි ඕල්යා පිළිතුරු දුන්නා ය.

ඔහු ඇයගේ ගෙලවටා අත යවමින් සිප වැලඳ ගත්තේ ය. ඔහු ඇය සිපගත් පළමුවෙනි හා එක ම වාරය ද එය විය. ඔරුව පැදෙන හඬක් ඇසිණි. එගොඩ සිට මෙගොඩට පැදවූ ඔරුව මිනිසුන්ගෙන් පිරී තිබිණි. අලෙක්සේයි සහ ඕල්යා පිළිකුල් සහගත ව ඔරුව දෙස බලා පෙරට ගියේ තමන්ට මතු දැනගන්නට ලැබෙන පුවත ගැන කිසිදු හෝඩුවාවක් හෝ නොදැන ය.

මිනිස්සු නිහඬ ව ඔරුවෙන් බැස්සාහ. හැම දෙනෙක් ම උත්සවයකට මෙන් අගනා ඇඳුම්වලින් සැරසී සිටිය ද, ඔවුන්ගේ විලාසය බැරෑරුම් ය. මුහුණු අඳුරු වෙලා ය. ඔවුහු, ඔවුන් දෙදෙනා අසලින් නිහඬ ව ගමන් කළහ. පිරිමි ඉක්මන් වූහ. ගැහැනුන්ගේ ඇස්වල කඳුළු පිරී තිබිණි. අලෙක්සේයි සහ ඕල්යා කිසිවක් නොදැන ඔරුවට නැඟ වාඩි වූහ. දෙපා නැති ඔරුකාරයා වන අර්කාෂා මාමා ඔවුන්ගේ පියකරු මුහුණු දෙස නොබලා මෙසේ පැවසී ය.

"යුද්දෙ පටන් අරගෙන, ගුවන්විදුලිය මගින් දැනුම් දුන්නා."

"යුද්දෙ? කා සමඟද?" යි ඇසූ අලෙක්සේයි හුන් තැනින් නැඟී සිටියේ ය.

"ජර්මන් දුෂ්ටයො සමඟ, වෙන කා සමඟ ද" යි කී අර්කාෂා මාමා වේගයෙන් හබල් ගැසී ය. "මිනිස්සු ගියා යුද්ධ කාර්යාලෙට. පිරිමි හැම දෙනෙකුට ම යුද්දෙට බැඳෙන්න නියම කරල..." යැයි ආර්කාෂා මාමා කීවේ ය.

අලෙක්සේයි ගෙදර නොගොස් කෙළින් ම යුද්ධ කාර්යාලයට ගියේ ය. එදින රාත්‍රි 12.40 දුම්රියෙන් තම අහස්යානා පාසලට යාමට ඔහුට අණ කළේ ය. තම ඇඳුම් බෑගය ගැනීමට ගෙදර දුව ගිය ඔහු ඉක්මනින් ම දුම්රියපොළට ගියෙන් ඕල්යාට ආයුබෝවන් කීමට පවා වේලාවක් නොතිබිණි.

ඔවුන් එකිනෙකාට ලියුම් ලීවේ ඉඳ හිටලා ය. එකිනෙකා කෙරෙහි ඇති හැඟීම වෙනස්වීම නිසා නොවේ එසේ ඉඳ හිට ලියුම් ලීවේ. ඔහු නොඉවසිල්ලෙන් ඇගේ ලියුම් ගැන බලා සිටියේ ය. ඔහු ඒ ලියුම් තම සාක්කුවේ දමාගෙන

හුදෙකලාව සිටින විට නිතර, නිතර කියැවී ය. වනයේ දණ ගාමින් හා බඩගාමින් යන විට පවා ඔහු ඒ ලියුම් කියවා පපුවට තබා තදකර ගත්තේ මහත් ආදරයකිනි. ඔවුන් දෙදෙනා අතර සම්බන්ධකම හිටිහැටියේ ම කඩාවැටීම නිසා ඔවුන්ගේ ලියුම්වලින් ඔවුන් එකිනෙකා ඇමතුවේ සුහද මිතුරන් ලෙසිනි. එතැනින් ඔබ්බට යාමට තම හැඟීම් ගැන කීමට ඔවුහු ඉදිරිපත් නොවූහ.

ඕල්යා තම හැඟීම් ගැන ඔහුට එළිපිට ම ලියමින්, ඔහු නැති නිසා ඈ කාන්සියෙන් හා කනගාටුවෙන් පසුවන බවත්, එදා සවස අර්කාෂා මාමා ඔරුව රැගෙන නොපැමිණියා නම් ඈ වඩාත් සතුටු වන බවත් දන්වමින් ලියුම් එවීම නිසා අලෙක්සේයි මවිත විය. කවර අභාග්‍යයකට මුහුණ පෑවත් ඔහු වෙනුවෙන් ඕනෑ ම දෙයක් කිරීමට නිතර සූදානමින් සිටින බව දන්වා යැවූ ඕල්යා සටන් කරමින් තැනින් තැන ගිය ද, තමාගේ ගෙයක් තිබෙන බව ද අමතක නොකරන ලෙස ද ඈ ඔහුගෙන් ඉල්ලා සිටියා ය. මේ ලියුම් අනුව අමුතු ඕල්යා කෙනෙකු ඔහුට ලියන බව හැඟිණි. ඕල්යාගේ ඡායාරූපය දෙස ඔහු බැලී ය. මල් වැටුණු ගවුමක් ඇඳ සිටින ඈ, සුළඟක් හැමූ විගස ඩැන්ඩේලියන් මලක පියලි මෙන් ඉගිළී යනු ඇතැයි ඔහුට සිතිණි. ඒ ලියුම් තම පෙම්වතා එනතුරු කාන්සියෙන් බලා සිටින යහපත් පෙම්බර කතක්, විසින් ලියන ලද්දකි. මේ නිසා ඔහු තුළ සතුටත් ශෝකයත් උපන්නේ ය. ඔහුගේ සිත මැඩගෙන සතුට පැන නැංගේ ය. ඔහු ශෝක වූයේ ඈට ආලය කිරීමට ඔහුට අයිතියක් නැති බැවිනි. පෙර මෙන් ඔහු කඩිසර තරුණයකු නොවන බවත් අර්කාෂා මාමා මෙන් දෙපා නැති කොරකු බවත් ලියා යැවීමට ඔහුට ශක්තියක් නොතිබිණි. රෝගී ව සිටින තම මවට ඇත්ත ලියා යැව්වොත් ඈ මිය යතියි බියගත් අලෙක්සේයි ඕල්යාගෙන් ද සත්‍ය සඟවා තැබී ය. ඇය දිගට ම රැවටීම සඳහා වැඩි වැඩියෙන් බොරු කීමට ඔහුට සිදු විය.

ඕල්යාගෙන් ලියුම් ලැබෙන විට ඔහු තුළ සතුට හා ශෝකය එකවර පැන නැංගේ මේ හේතුව නිසා ය. ප්‍රීතිය හා සිත්තැවුල ද ප්‍රීතිය හා වේදනාව ද එකවර ඇති විය.

ඔහු නැවත අහස්යානා සේවයට ගොස් තම බලාපොරොත්තුව මුදුන්පත් කර ගත් පසු, ඕල්යා කෙරෙහි ඇති ආලය ගැන ඈට දන්වන බවට ගිවිසුම් දුන්නේ, තම අදහස මුදුන් පමුණුවා ගනු වස් අලෙක්සේයි වෙහෙස නොබලා ක්‍රියා කළේ ය.

## 11

මැයි පළමුවෙනිදා කොමිසාර් මිය ගියේ ය.

එය කෙසේ සිදුවීදැයි කිසිවෙක් නොදත්හ. එදින උදෑසන ඔහුගේ රැවුළ බෑම සඳහා පැමිණි කාන්තාව සමඟ සතුටු සිතින් කථා කළ හෙතෙම කාලගුණය පිළිබඳ තොරතුරු ඇසී ය. මැයි දින උත්සවය නිමිත්තෙන් මොස්කව් නගරය සරසා තිබෙන සැටි ඇසී ය. යුද්ධ කපොලු ඉවත් කිරීම ගැන හේ ප්‍රීති විය. මැයි දින පෙළපාළිය නොපැවැත්වීම ගැන දුක්විය. ඔහුට ගුණය ලැබී ඇති බැව් බොහෝ දෙනා විශ්වාස කළහ. මාරක දවස් පසුවිණැයි ඔවුහු සිතූහ.

ඔහුට පුවත්පත් කියවීම අපහසු වූවාට පසු ශ්‍රවණ පෙති සහිත ගුවන්විදුලි යන්ත්‍රයක් ඔහුගේ ඇඳ ළඟින් සවිකළේ ය. යුද්ධ ටැංකි හමුදාවේ ලයිතන් වන ග්වොස්දෙව් ගුවන්විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීම ගැන සෑහෙන දැනීමක් ඇත්තෙකි. ඔහු ශ්‍රවණ පෙති ද ගුවන්විදුලි යන්ත්‍රයෙන් ම මහ හඬින් ගී ගැයීමට හා කතා කිරීමට සැලැස්වීය. මැයි දින උදේ නවයට ගුවන්විදුලි ප්‍රකාශකයා ආරක්ෂක ඇමැතිවරයාගේ ආඥාව හඬ නඟා කියැවී ය. බිත්තියේ එල්ලා ඇති වටකුරු, කළුපැහැති ශ්‍රවණ පෙතිවලට ඔවුන් කන් දුන්නේ මහත් වුවමනාවෙනි. අවසානයේ දී ප්‍රකාශකයා මෙසේ කීවේ ය. "ශ්‍රේෂ්ඨ ලෙනින්ගේ අපරාජිත ධජය යටතේ ජය සඳහා ඉදිරියට යමු" වාට්ටුව තුළ නිහඬතාව රජ කරන්නට විය.

"කොමිසාර් සහෝදරය! මට මෙන්න මේ ගැන විස්තර කරන්නැ"යි කී කුකුෂ්කින් ඔහු සමඟ විවාදයකට මුල පුරමින්, ඔහු දෙස බලන්නේ, "කොමිසාර් සහෝදරයා!" යැයි මහත් බියකින් කෑගැසී ය.

හැම දෙනා ම කොමිසාර් දෙස බැලූහ. ඇඳ උඩ වැතිර සිටි කොමිසාර්ගේ අත් පා දිග හැරී ඇත. දෑස් සීලිමේ එක් තැනකට යොමු වී ඇත. අප්‍රාණික, සුදුමැලි ඔහුගේ

මුහුණේ කිසියම් ගාම්භීරත්වයක් පෙනෙන්නට තිබිණි.

"කොමිසාර් මළා!" යැයි කුකුෂ්කින් මහ හඬින් කී ය. ඔහු කොමිසාර්ගේ ඇඳ වෙතට ගොස් දණින් වැටී කෑගැසී ය. "කොමිසාර් මළා අනේ!"

සේවක-සේවිකාවෝ ඉක්මන් වූහ. වාට්ටුව භාර හෙදිය යුහුසුලු වූවා ය. දොස්තර තැන ඉක්මනින් පැමිණියේ ය. හැම දෙනාගේ ම පිළිකුලට භාජනය වී සිටි කුකුෂ්කින් ලයිතන් තැන මළ සිරුර බදාගෙන පොඩි දරුවකු මෙන් විලාප කියමින් හැඬුවේ අවට සිටි අය ගැන නොතකමිනි...

එදින සවස හතළිස්දෙකේ වාට්ටුවට වෙනත් රෝගියකු ගෙනාවේ ය. ඔහු ප්‍රහාරක අහස්යානා පදවන්නෙකු වූ පාවෙල් ඉවානොවිච් ස්ට්රුච්කොව් ය. මැයි දිනයේ දී මොස්කව් නගරයට බෝම්බ දැමීමට තීරණය කළ පැසිස්ට් හමුදාව අහස්යානා විශාල ගණනක් එව් ය. සතුරු අහස්යානාවලට එදිරිව පොද්සෝල්නෙච්නයා පෙදෙසේ දැඩි සටනක් කළ සෝවියට් අහස්යානා ජය ගත්හ. බොහෝ ඉහළින් පියාසර කළ 'යුන්කර්ස්' වර්ගයට අයත් එක් සතුරු යානාවක් පමණක් සෝවියට් අහස්යානාවලින් බේරී මොස්කව් දෙසට යන්නට විය. කෙසේ හෝ මැයි දින උත්සව සිරිය විනාශ කිරීමට ඒ සතුරු අහස්යානාව මෙහෙයැවූ පැසිස්ට්වරු ඉටාගෙන සිටියහ. අහස් සටනෙහි යෙදී සිටි මේජර් ස්ට්රුච්කොව් සතුරු අහස්යානාව බේරී පැන යන සැටි දුටුවේ, තම යානය සතුරාට පහර දීම පිණිස මෙහෙයැවී ය. ඒ දවස්වල දී සෝවියට් අහස් හමුදාවට ලැබුණ නවීනතම ප්‍රහාරක යානයක් පැදවූ ස්ට්රුච්කොව් මහ පොළොවට කිලෝමීටර් හයක් ඉහළින් පියාඹමින් ජර්මන් යානය පසු කළේ ය. සතුරු යානයට ළං වූ හෙතෙම එයට වෙඩි තැබී ය. එහෙත්, වෙඩි වදින ශබ්දය නෑසිණි. වෙඩි තැබීම් පිණිස ක්‍රියාකරවන බොත්තම මෙවර ක්‍රියා විරහිත විය.

ජර්මන් අහස්යානය තරමක් ඈත් විය. එහෙත්, ස්ට්රුච්කොව් සතුරා ලුහුබැන්දේ ය. ජර්මන් අහස්යානාවේ මැෂින් තුවක්කුවලට තම යානාව ගොදුරු නොවන සේ යානය පැදවීමට හේ වග බලා ගත්තේ ය. මැයි දින අහස පිරිසිදු ය. මීදුමෙන් වැසුණු කන්දක් සේ මොස්කව් නගරය පෙනිණි. ස්ට්රුච්කොව් සතුරාට පහර

දීමට තීරණය කළේ ය. සතුරු අහස්යානය වෙත කඩා පැනීමට ලැහැස්ති වන්නාක් මෙන් ස්ට්‍රැච්කොව් පටි බුරුල් කොට සූදානම් විය. දැන් ඔහුගේ ප්‍රහාරක යානය පැසිස්ට් යානයට සමාන්තර ව පියාඹයි. මේ යානා දෙක අවිදයාමන් නූල්පටකින් බැඳ තැබුවාක් මෙනි. ජර්මන් යානයේ විනිවිද පෙනෙන පියස්ස තුළින් පැසිස්ට් ජර්මන් මැෂින් තුවක්කුකාරයා තමාට පහර දීමට අර අඳින සැටි පෙනිණි. කැලඹී ගත් ජර්මන් භටයා තම තොප්පිය අතට ගෙන නැවත හිස ලා ගන්නා සැටි පවා ඔහු දිටී ය. පැසිස්ට් භටයාගේ හිසකේ රන් පැහැති ය. දිග ය. ඔහු මැෂින් තුවක්කු දෙක ස්ට්‍රැච්කොව් දෙසට හරවා වේලාව එන තුරු බලා සිටියේ ය. නිරායුධ මිනිසකු මත ආයුධ ගත් හොරෙක් පහර දීමට සැරසෙන විට, නිරායුධ මිනිසා සොරා මත කඩා පනියි. ස්ට්‍රැච්කොව් ද එවැනි ම උපක්‍රමයක් අනුගමනය කරමින් තම යානය මෙහෙයවමින් සතුරු යානය මත කඩා වැදුණේ ය. ඔහුගේ යානයේ නාසයෙන් සතුරු යානයේ වලිගයට පහර දුන්නේ ය.

අහස්යානා කඩා වැටුණු හඬ ඔහුට නෑසිණි. තම අහස්යානය පුපුරා ගොස් තමා අහසේ පිනුම් ගසන සැටි ඔහුට දැනිණි. පැහැදිලි කොළ පැහැති දිලිසෙන මහ පොළොව ඔහු වෙත වේගයෙන් එන සැටි ඔහු දිටී ය. ස්ට්‍රැච්කොව් තම පැරචුටය දිග හැරියේ ය. ඔහුගේ සිහිය නැතිවීමට මොහොතකට පෙර පැසිස්ට් යානය වලිගය රහිත ව මහ පොළොවට පතිත වන සැටි ඔහුට පෙනිණි. ඔහුගේ පැරචුටය මොස්කව් නගරය අසල ගෙයක වහලය මත වැටෙත් ම ඔහුට සිහි නැති විය. බිම සිට අහසේ සිදුවූ සටන දෙස බලා සිටි වැසියෝ ඔහුට ආධාර පිණිස දුව ආහ. සිහි නැති ව සිටි ස්ට්‍රැච්කොව් වහලේ හැපී මැයි දින උත්සවයට සරසා තිබූ මඟකට වැටුණේ ය. ස්ටරැච්කොව් රෝහලට ගෙනා විට මොස්කව් නගර වැසියෝ ඔහුට කෘතඥතාව දක්වමින් මල්, පලතුරු හා චොකලට් ආදිය ගෙන ආහ.

ස්ට්‍රැච්කොව් සමාජ ප්‍රිය පුද්ගලයෙක් විය. ඔහු වාට්ටුවට ඇතුළු වූ සැටියේ ම කෑම ගැන සොයා බැලී ය. වාට්ටුවේ නීති රීති දැඩි ද, ලස්සන හෙදියන් ඉන්නේ ද ආදී ප්‍රශ්න ලෙඩුන්ගෙන් ඇසී ය. ඔහුගේ තුවාල වෙළීමට

ක්ලාව්දියා මීහයිලොව්නා පැමිණි විට ඈට උපහාස කතාවක් කියමින් සිනාසුණේ ය. ඇය රූප සුන්දරියක් බව කීමට ද ඔහු අමතක නොකළේ ය. ඈ ගිය පසු ඉගි මැරූ ස්ට්රුච්කොව් මෙසේ කීය:

"කෙල්ල ලස්සන වුණාට සැරකාරියක් වගේ! තමුසෙලව එයා බය කරනවද? ඒවට බය වෙන්න නරකයි. උපාය උපක්‍රම දන්නෙ නැතිද? අල්ලා ගැනීමට නොහැකි බළකොටුවක් නැහැ. යටත් කර ගැනීමට බැරි ගැහැනියකුත් නැහැ." පසු ව ඔහු හඬ නඟා සිනාසුණේ ය.

මහ හඬින් කතා කිරීම සහ විහිළු කිරීම ඔහු කළ ද, කිසිවකු ඔහු කෙරෙහි රොස් නොවූයේ ඔහුගේ හැසිරීමේ නරක ගති නොතිබුණු බැවිනි. මෙරේස්යෙව් හැර අනෙකුත් රෝගීහු ඔහු කෙරෙහි සතුටු වූහ. ස්ත්‍රීන් දකින විට ස්ට්රුච්කොව් කුලප්පු වීම අලෙක්සේයිට රිසි නොවී ය. හමුවන හැම ස්ත්‍රියකට ම විහිළු කරන ස්ට්රුච්කොව් ඔවුන් ගැන සිය අදහස් නොසඟවා කීවේ ය.

පසුදා කොමිසාර්ගේ අවමඟුල් පෙරහැර පැවැත්වී ය.

අලෙක්සේයි මෙරේස්යෙව්, ග්වොස්දේව් සහ කුකුෂ්කින් ජනේලය අසලට වී අවමඟුල් පෙරහැරට එන කාලතුවක්කු සහ අස්රිය බලමින් සිටියහ. යුද්ධ තූර්යවාදක කණ්ඩායමේ සංගීත භාණ්ඩ හිරු රැස් නිසා දිලිසෙන්නට විය. විශේෂ සේවා භට කණ්ඩායමක් ද පැමිණියේ ය. ක්ලාව්දියා මීහයිලොව්නා වාට්ටුවට පැමිණ ඔවුන්ට ජනේලය ළඟින් ඉවත් වන ලෙස අණ කළා ය. ඈ වෙනදා මෙන් නිසල ය. එහෙත්, ඇගේ කටහඬෙහි වෙව්ලන ගතියක් තිබෙන බව අලෙක්සේයිට දැනිණි. ඈ අලුතෙන් පැමිණි රෝගියගේ උණ බලත් ම වාදකයෝ අවමඟුල් ගීයක් වාදනය කළහ. ක්ලාව්දියා මීහයිලොව්නාගේ දෑත් වෙව්ලිණි. උණකටුව බිම වැටී කැඩිණි. රසදිය කුඩා කැටිවලට වෙන් වී විසිරිණි. දෑතින් මුහුණ වසාගත් ඈ හඬමින් දිව ගියා ය.

"මොකද එයා අඬමින් එළියට දිව්වෙ. මැරුණු එක්කෙනා එයාගෙ පෙම්වතාද?" යි ඇසූ ස්ට්රුච්කොව් අවමඟුල් වාදනය හඬ ඇසෙන පෙදෙසට ඉගි කළේ ය.

කිසිවෙක් ඔහුට පිළිතුරු නොදුන්හ.

රෝගීහු ජනේලයෙන් එළියට හිස් දමාගනිමින් යුද්ධ රථයක් මත තැබූ රතු පාට මිනී පෙට්ටිය දෙස බැලූහ. රථයට පිටුපසින් කුඩා සේද මෙට්ටවලට ඇමිණූ කොමිසාර්ගේ පදක්කම් ගෙන ගියේ ය. උසස් ම පෙළේ පදක්කම් අටක් එහි විය. සෙනෙවිවරු කීප දෙනෙක් හිස් පහත් කරගෙන ගමන් ගත්හ. වසීලියි වසීලෙවිච් ලයිතන් ජනරාල් කබායෙන් සැරසී ගමන් කළ ද, ඔහු හිස් වැස්මක් දමා නොසිටියේ ය. ඔවුන්ට පිටුපසින් ක්ලාව්දියා මීහයිලොව්නා ගමන් කළා ය. සුදු කබායක් ඇඳ සිටි ඈ පා තබන්නී, පෙරටුව යන කිසිවකු නොදුටුවා ය. කිසිවෙක් ඇගේ කර වසන්ත කබායකින් වැසූහ. එය ගණනකට වත් නොගෙන ඈ ගියා ය. කබාය බිම වැටිණි. ඇය පිටුපසින් ගමන් ගත් භටයෝ කබාය නොපෑගීමට වග බලා ගත්හ.

"කොල්ලනේ අවමඟුල කාගෙද?"යි ස්ට්රැච්කොව් ඇසී ය.

ඔහු ද ජනේලය අසලට යාමට තැත් කළ ද, ඔහුගේ දෙපා දිගැති ලී පතුරු තබා වෙළා තිබුණෙන් සෙලවීමට පවා නොහැකි විය.

අවමඟුල් පෙරහැර නොපෙනී ගියේ ය. ඈත ගඟ අසලින් නැඟ එන අවමඟුල් ගීත රාවය මුදු ලෙස ගෙවල්වල බිත්තිවලට වැදිණි. මුරකරු ගැහැනිය ගේට්ටුව වසා දැම්මා ය. හතළිස්දෙකේ වාට්ටුවේ රෝගීහු ජනේලය අසල සිටගෙන සිතින් අවමඟුල් පෙරහැරට සහභාගි වූහ.

"කාගෙ අවමඟුලද? ආ මොකද බං උඹල ගල් ගැහිලද?"යි ස්ට්රැච්කොව් ඇසුවේ තරමක නොසන්සුන්තාවකිනි.

කුකුෂ්කින් වියළි හඬකින් පිළිතුරු දුන්නේ ය.

"නි ය ම මි නි හෙ කු ගෙ . . . වී ර යෙ කු ගෙ . . . බොල්ෂෙවික්වාදියෙකුගෙ අවමඟුලක්"

නියම මිනිහෙකුගෙ අවමඟුලක් යන වැකිය අලෙක්සේයිගේ සිතට තදින් ම කා වැදිණි. ඇත්ත වශයෙන් ම කොමිසාර් හැඳින්විය හැක්කේ නියම මිනිහෙකු වශයෙනි. මේ දැන් අවසන් ගමන් ගිය කොමිසාර් මෙන් නියම මිනිහෙකු වීමට අලෙක්සේයි තුළ දැඩි ආසාවක් ඇතිවිණි.

නියම වෛද්‍ය උපදෙස් හා ප්‍රතිකාර ලැබීම නිසා ලෙඩ්ඩු සුව වූහ. සම්පූර්ණ සුවය ලබා රෝහලෙන් පිටව යන දවස ළං වෙත් ම, ඔවුහු තම ලෙඩ රෝග හා තුවාල ගැන අඩුවෙන් සිතන්නට වූහ. රෝහලෙන් පිට ජීවිතය ගැන ද තම සේනාංකය තමා පිළිගන්නේ කෙසේ ද ආදිය ගැන කල්පනා කළහ. සුවය ලබා පිට වී යන හැම කෙනෙක් ම විසින් මෙතෙක් නොලියනු ලැබූ, කතා නොකරනු ලැබූ නමුදු, දැන් දැන් පටන් ගනිතියි බලාපොරොත්තු වන ප්‍රති ප්‍රහාරයේ කොටස්කරුවන් වීමට බලාපොරොත්තු වූහ. යුද පෙරමුණේ නිහඬතාව ළඟ එන ප්‍රහාරයක් ගැන කියා පෑවේ ය.

රෝහලේ සිට යුද පෙරමුණට ගොස් සටනට සහභාගි වීම හැම සෙබළකුගේ ම කාර්යයකි. අලෙක්සේයිගේ ගැටලුව තව ම විසඳී නැත. දෙපා නැති ව ඇවිදීමට ඉගෙන ගැනීමෙන් හා ශාරීරික ව්‍යායාම් කිරීමෙන් තමාට නැවත ප්‍රහාරක අහස්යානාවක් පැදවීමට පුළුවන් ද? යන පැනය ඔහු තුළ පැන නැංගේ ය. තම අදහස් මුදුන් පමුණුවා ගැනීමට ඔහු වඩාත් වැඩි මහන්සියක් දරා ව්‍යායාම් කළේ ය. විනාඩි කීපයකට පමණක් සීමා වූ ව්‍යායාම් කිරීම් ඔහු දවසකට දෙපැයක් දක්වා, එනම් උදේ සවස පැය බැගින් ව්‍යායාම් කිරීම දක්වා වැඩි කළේ ය. එයින් ද ඔහු සෑහීමට පත් නොවූයෙන්, දවල් ආහාරයෙන් පසුව ද ව්‍යායාම් කළේ ය.

දෙපා නැති ව ප්‍රහාරක යානා පැදවීම ගැන හතළිස් දෙකේ වාට්ටුවේ එක ද රෝගියෙක්වත් විශ්වාස නොකළ ද, දැඩි ආත්ම විශ්වාසයකින් යුතු ව ව්‍යායාම් කරන අලෙක්සේයිට ඔවුහු ගරු කළහ. තම අදහස් සඟවමින් විහිළු කළ ඔවුහු ඔහුගේ ආත්ම විශ්වාස ගැන පැසසූහ.

මේජර් ස්ට්රුච්කොව්ගේ පුපුරාගිය දණිස් කටු කෙමෙන් ප්‍රකෘති තත්ත්වයකට හැරුණ ද, ඒවායේ තත්ත්වය පෙර සිතුවාට වඩා බරපතළ විය. ඔහුගේ දෙපාවලට ලී පතුරු තබා බැඳ තිබිණි. ඔහුගේ තුවාල සුවවන බවට කිසිදු සැකයක් නොතිබුණ ද, ඔහු තම දණිස්කටුවලට දොස් පැවරීම නොනැවැත්වී ය. ස්ට්රුච්කොව්ගේ මේ බැණ වැදීම් සහ දොස් පැවරීම් කන්දොස්කිරියාවක් බවට

පෙරළිණි. සුළු දෙයකට කිපෙන ස්ට්රුච්කොව් හැම දෙනෙකුට ම බැණ වදී.

තම කෝපයට හේතුව තමාට වැසිකිළියට ගොස් දුම් බීමට අවස්ථාවක් නැති වීමත්. සැත්කම් අංශයේ හෙදිය හමුවීමට කොරිඩෝරයට යාමට පවා බැරි වීමත් බව ස්ට්රුච්කොව් කීවේ ය. එය එසේ වුව ද, මොස්කව් අහසේ අහස්යානාවක් පියාඹන සැටි දුටු විට දී අහස්යානා සටනක් ගැන පුවත්පත් මගින් දුටු විට දී ස්ට්රුච්කොව් වඩාත් කිපී බැණ වදින සැටි අලෙක්සේයි දුටුවේ ය. අලෙක්සේයි මෙරේස්යෙව් ද මේ නිසා රොස් විය. එහෙත්, ඔහු ස්ට්රුච්කොව් මෙන් තම කෝපය පිට නොකළේ, සිය ආත්ම දමනය නිසා ප්‍රීති විය. තම පරමාදර්ශය වන ‘නියම මිනිසෙකු වීමේ’ තත්ත්වයට ළං වී ඇති බැව් අලෙක්සේයිට වැටහිණි.

ටික දවසකට පසු ව කුකුෂ්කින් සුවය ලැබ රෝහලෙන් පිට විය. ඔහු චිත්තවේගයෙන් තොර ව, තම වාට්ටු සගයන්ගෙන් සමු ගනිමින්, වෙදකම් හා බෙහෙත් නිසා තමා හෙම්බත් වී සිටින බව පැවසී ය. තම මවගෙන් ලියුම් ලැබුණොත් ඒවා තමාට නොවරදවා ම එවන ලෙස ඔහු හෙදියන්ගෙන් හා අලෙක්සේයිගෙන් කීප වරක් ම ඉල්ලා සිටියේ ය.

“උඹ ව පිළිගන්න හැටි, වැඩ පටන් ගන්න හැටි දන්වා ලියුමක් ලියපන්” යැයි ඔහුට අලෙක්සේයි කීවේ ය.

“මම මොකටද උඹට ලියන්නෙ, උඹ මා ගැන සලකනවද? උඹට ලියල නිකං මොකටද මම කඩදාසි නාස්ති කරන්නෙ...”

## 12

ගිම්හානයේ හිරු රැස් ආලෝකවත් වූ දවසක උදෑසන ක්ලාව්දියා මීහයිලොව්නා උදාර ලීලාවකින් වාට්ටුවට පැමිණියා ය. ඈ සමඟ මහල්ලෙක් ද ආවේ ය. ඔහු පැලඳ සිටි උපැස් යුගල සියුම් රෙදි පටියකින් බැඳ තිබිණි. අලුත් සුදු පැහැති රෝහල් කබායක් ඔහු ඇඳ සිටිය ද, ඔහු රෝහලේ සේවකයකු නොව, හස්ත කර්මාන්තකරුවකු බව බැලූ බැල්මට පෙනිණි. සුදු රෙද්දකින් ඔතා ඔහු ගෙන ආ යමක් අලෙක්සේයිගේ ඇඳ අසලින් තැබී ය. ඉන් පසු

එහි වූ අනෙකුත් කොටස් ඔහු පූට්ටු කළේ විජ්ජාකාරයකු මෙනි. 'ක්‍රික්' යන හඬ එයින් පිට විය. පදම් කළ සමෙන් නැඟෙන සුවඳ වාට්ටුව පුරා පැතිරිණි.

ඒ ලීයෙන් හා සමෙන් කළ කෘත්‍රිම කකුල් දෙකකි. ඇස්වටයේ සිට විළුඹ හා ඇඟිලි ලීයෙන් සාදා තිබිණි. නියමම හැඩයට හා ප්‍රමාණයට නිම වී තිබූ මේ කෘත්‍රිම පාද වසා ඇත්තේ මිලිටරි සපත්තු දෙකකිනි. කෘත්‍රිම පාද ඒ සපත්තුවලට කොතරම් හොඳින් ගැළපුණේ ද යත්, සපත්තුවලින් වැසී තිබෙන්නේ කෘත්‍රිම පාද යැයි සැක කිරීමට පවා නොහැකි විය.

තම නිර්මාණය දෙස ශිල්පියා මහත් ආසාවෙන් බලමින් මෙසේ කීවේ ය.

"ගලෝෂි දෙකක් ඇන්දම මඟුල් ගෙදරකට වුණත් යන්න පුළුවනි. වසීලියි වසීලෙවිච් තමා මේ වැඩේ මට භාර දුන්නෙ. උන්නැහෙ මට මෙහෙම කිව්වා 'සූයෙව් හැබෑ කකුල් දෙකටත් වැඩියෙ හොඳ කකුල් දෙකක් හදන්න' ඔන්න සූයෙව් හැදුවා බලන්න කොයි තරම් අගනේ ද කියලා. රජෙකුට වුණත් සෑහෙනවා"

කෘත්‍රිම පාද දුටු හැටියේ ම අලෙක්සේයි මෙරේස්යෙව්ගේ හදවත හැකිළී, ගල් ගැසිණි. එහෙත්, ඒ හැඟීම මැඩ ගෙන කෘත්‍රිම පාදවලින් හෝ කාගේ වත් ආධාරයක් නැති ව හෝ ස්වාධීන ව ගමන් කිරීමේ ආසාව ඔහු තුළ උපනි. තමා කොට කකුල් බ්ලැන්කට්ටුවෙන් පිටතට ගත් අලෙක්සේයි කෘත්‍රිම පාද ඒවාට සවි කරන ලෙස ඉල්ලා සිටියේ ය. විප්ලවයට පෙර අසකු පිටින් වැටීම නිසා කකුලක් කඩා ගත් 'සාමිවරයකුට' පවා තමා කෘත්‍රිම කකුලක් සාදා දුන් හැටි විස්තර කළ සූයෙව් ශිල්පියා, ඉක්මන් වීමට අකැමැති විය. තම නිර්මාණය නිසා ආඩම්බර වූ හේ එය භාර දීම හැකි තරම් පමා කළේ ය.

රෝහල් කබායේ අතකින් ඔහු කෘත්‍රිම පාද පිස දා, නියෙන් එහි තිබූ ලපයක් ගලවා, නැවත එය ඔප වැටෙන සේ මැද, එය ඔතා තිබූ රෙදිකඩ ප්‍රවේසමෙන් ඔතා සාක්කුවේ ලා ගත්තේ ය.

ඇඳෙහි වාඩි වූ අලෙක්සේයි ඉවසුම් රහිතව "අනේ සීයේ! ඉක්මනට අන්දවන්නැ"යි කීවේ ය.

අලෙක්සේයිගේ කකුල් කොට දෙස අමුතු බැල්මක් හෙළූ ශිල්පියා සතුටු වූ බවක් පළ කළේ ය. සැත්කමෙන් ඉතිරි ව ඇති කකුල් කොට ක්‍රියා විරහිත වීම නිසා මහත් වී අප්‍රාණික ලෙස තිබීම ඔහු දැක ඇත. එහෙත්, අලෙක්සේයිගේ දෙපා රහිත කකුල් කොට ශක්තිමත් ය, සිහින් ය. මස්ගොබ යහතින් වැඩී ඇති. ධාවන ක්‍රීඩකයෙකුගේ කකුල් මෙනි.

"මොකටද ඔය හැටි කලබල වෙන්නෙ. කියන්න ලේසියි, කරන්න අමාරුයි" ශිල්පියා මැසිවිලි කීවේ ය. " වසීලියි වසිලෙවිච් මට කීවා 'සූයෙව්, ලෝකයේ මෙතෙක් හදපු ඉස්තරම්ම පාද දෙකක් හදපන්. මේ ලයිතන් කැමතියි ආයිමත් අහස්යානා පදවන්න' ඔන්න බලන්න මම හදාපු පාදවල හැටි. මේ වගේ පාදවලින් ගමන් කරන්නට විතරක් නෙමෙයි, බයිසිකල් පදින්න, නෝනලා එක්ක පොල්කා නැටුම් වුණත් නටන්න පුළුවනි... ඒ තරම් අගනා පාද!"

අලෙක්සේයිගේ දකුණු කකුල කොට ය. කෘත්‍රිම පාදයේ වුලන් කෙවෙනියට එබූ ශිල්පියා හම් පටියෙන් තද කොට වෙළී ය.

"හරිම අගේ ඇති සපත්තුව! කකුලට අමාරුයිද? සූයෙව්ට වැඩි දක්ෂ ශිල්පියෙකු මේ මොස්කව් නගරයේම හොයා ගන්ට ලැබෙන්නෙ නැහැ!"යි කී හෙතෙම තලු මැරී ය.

ඔහු දක්ෂ ලෙස වම් කකුලට ද කෘත්‍රිම පාදය දැම්මේ ය. අලෙක්සේයි සැණෙකින් කෘත්‍රිම පාවලින් නැගිට සිටියේ ඇඳේ සිට බිමට පනිමිනි. කෘත්‍රිම පාදවල කෙවෙනි තුළ වූ කකුල්වල කොතරම් තියුණු වේදනාවක් ඇති වී ද යත්, මුලින් කපා හෙළූ ගසක් මෙන් ඔහු ඇද වැටිණි.

අලෙක්සේයි මේ තරම් නොසැලකිලිමත් ලෙස පනිතියි නොසිතූ ශිල්පියා, තම උපැස් යුගල නළල මත රඳවමින් විස්මයට පත් විය. මෙරේස්යෙව් බිම වැතිර ගත්තේ බලාපොරොත්තු රහිත ව ය. ඔහුගේ කෘත්‍රිම දෙපා දෙපැත්තට විහිදී තිබිණි. විමතියට හා භීතියට පත් වූ හෙතෙම, වේදනාවෙන් පෙළුණි. මෙතෙක් කල් තමා රැවටුණේ ද යන පැනය අලෙක්සේයි තමාගෙන් ම ඇසී ය.

ක්ලාව්දියා මීහයිලොව්නා දෑත් එක් කර ගනිමින් විස්මය පළ කරමින් අලෙක්සේයිට උදව් කිරීමට ඉදිරිපත් වූවා ය. මහලු ශිල්පියාගේ ද ආධාරය ඇතිව ඈ අලෙක්සේයි ඇඳ මත තැබුවා ය. කොරගසන්නට වූ හෙතෙම අධෛර්යයට පත් ව බලාපොරොත්තු රහිත ව සිටියේ ය.

"ආ... තරුණයා... එහෙම කරන්ට එපා..."යැයි මහලු ශිල්පියා කීවේ ය.

"හැබෑ කකුල්වලින් වගේ ඔහොම පනින්න එපා! හිතේ කනගාටුව ඇති කර ගන්න එපා. ඇවිදින්න ඉගෙන ගන්න ඕන. මුල ඉඳල ඉගෙන ගන්න ඕන. සොල්දාදුවෙකු බව අමතක කරන්න. පොඩි දරුවකු වගේ ඇවිදින්න ඉගෙන ගන්න ඕන, අඩියෙන් අඩිය. ඉස්සෙල්ල කිහිලි කරුවල උදව්වෙන් ගමන් කරන්න ඕන. ඊට පස්සෙ බිත්තිය අල්ලාගෙන ගමන් කරන්න ඕන. ඊටත් පස්සෙ හැරමිටියක් අතේ ඇතිව ගමන් කරන්න ඕන. මේවා සියල්ල එකවර කරන්න බැහැ. හෙමිහිට, ක්‍රම ක්‍රමයෙන්... තමුසෙ එකපාරටම පනිනව. ඔහොමත් පුළුවන්ද? මම හදපු කකුල් බොහොම හොඳ ඒව වුණාට හැබෑ මනුස්ස කකුල් වගේ නෙමෙයි. අම්මයි තාත්තයි හදන කකුල් වගේ ඉස්තරම්ම ඒවා නෙමෙයි"

එකවර ම පැනීම නිසා ඔහුගේ කකුල්වල වේදනාව වැඩි වුව ද, තම කෘත්‍රිම කකුල්වලින් ගමන් කිරීමට අලෙක්සේයි තුළ උපන් ආසාව සීමා රහිත විය. ඇලුමීනියම්වලින් සැදූ කිහිලිකරු දෙකක් ගෙනාවේ ය. සැහැල්ලු කරු දෙක කිහිලිවල තබාගෙන අලෙක්සේයි ප්‍රවේසමෙන් නැඟිට සිටියේ ය. ඔහු ගමන් කිරීමට නොදත් කුඩා දරුවකුට බෙහෙවින් සමාන විය. ගමන් කිරීමට පුළුවන් වුව ද, බිත්තියෙන් ඈත් වීමට හේ බිය විය. මව සහ ආච්චිගේ දෑතින් අල්ලා ගනිමින් කුඩා දරුවකු ඇවිදවන්නා සේ ක්ලාව්දියා මීහයිලොව්නා සහ ශිල්පියා අලෙක්සේයිගේ දෑත් අල්ලාගෙන ඔහු ඇවිද්දවූහ. කෘත්‍රිම පාදවලට ස්පර්ශ වන කකුල් අගින් තියුණු වේදනාව දනුණෙන්, අලෙක්සේයි සිටගෙන සෙමින් එක් කකුලකට බර වෙමින් පියවරක් ඉදිරියට තැබී ය. පසු ව අනෙක් පැත්තට බර වෙමින් තවත් පියවරක් ඉදිරියට තැබී ය. කෘත්‍රිම පාදයෝ 'ක්‍රික්', 'ක්‍රික්' යන හඬක් පිටකළේ ය.

"සුබ ගමන්, සුබ ගමන්" යැයි ශිල්පියා සෙමෙන් කී ය.

අලෙක්සේයි තවත් පියවර කීපයක් තබමින් දොර දක්වා ගොස් ආපසු ඇඳ ළඟට ආවේ ය. ඔහුට තියුණු වේදනාවක් හා මහන්සියක් දැනිණි. බරැති පිටි මිටියක් කරින් ගෙන පස් මහල් ගොඩනැගිල්ලකට නැංගාක් මෙන් ඔහුට දැනිණි. ඔහු ඇඳ මත මුණින් වැටිණි.

"ආ, කොහොමද මගේ වැඩේ හැටි. අපූරුයි නේද? සූයෙව් වගේ දක්ෂ ශිල්පියෙක් ජීවත් වීම ගැන දෙවියන්ට පින් දෙනවා"යැයි ශිල්පියා පුරසාරම් දොඩමින් කෘත්‍රිම පාද ගැලවී ය. අලෙක්සේයිගේ කකුල් අග පීඩනය නිසා මඳක් ඉදිමී තිබිණි. "මේ කකුල්වලින් අහස්යානා පදවන්නට විතරක් නෙමෙයි, දෙව්ලොවට වුණත් පියාඹන්ට හැකියි. ඒ තරම් අනර්ඝ කකුල්! අපූරු, වටිනා බඩුවක්"

"ස්තුතියි, ස්තුතියි, සීයේ. බොහොම හොඳට හදල තියෙනවා."යැයි අලෙක්සේයි තොල මතුළේ ය.

"මට වසීලියි වසීලෙවිච් කිව්වා 'සුයෙව් මේ විශේෂ ඕඩර් එකක්. ඉතාම ඉහළින් වැඩේ කරන්න ඕන කියලා' සූයෙව් කවදාහරි බාල වැඩ කරන්නෙ නැහැ, කරලත් නැහැ. ඔහේ වසීලියි වසීලෙවිච් හමුවුණොත් කියන්න වැඩේ බොහොම හොඳයි කියලා" මෙසේ කී ශිල්පියා තොල් මතුරමින් වාට්ටුවෙන් පිට විය.

ඇඳේ වාඩි වූ අලෙක්සේයි තම කෘත්‍රිම පාද දෙස බැලී ය. ශිල්පියා විසින් සාදන ලද ලස්සන, සැහැල්ලු පාද ඔහුගේ සිත් ගත්තේ ය.

එදින ඔහු ඕල්යාට දිගැති, ප්‍රීතිමත් ලියුමක් ලියුවේ ය. අලුත් අහස්යානා ලබා ගැනීමේ කාර්යය අවසාන වීගෙන එන බැවින්, ඉක්මනින් ම යුද පෙරමුණ බලා යන බවත්, ඔහුගේ අහස් නියමු සගයන් ඔහු එන තුරු බලා සිටින බවත් ඔහු සඳහන් කළේ ය. අනතුරට මුහුණ පෑමෙන් පසු තම පෙම්වතියට අලෙක්සේයි ලියූ පළමුවැනි ආදර ලිපිය එය විය. ඇය දැකීමට නොලැබීම නිසා ඔහු දුකින් පසුවන බව පළමුවරට ඔහු ලියුවේ ය. ඔහු සිය අදහස් බයාදු ලෙස දන්වමින්, යුද්ධය අවසාන වූ පසු ඈ සමඟ ජීවත් වීමට කැමැති නම් තමා සූදානම් බව අලෙක්සේයි ඇයට ලියුව ද, ලියුම කීප වරක් කියවා, දිග සුසුමක් හෙළා අවසාන කොටස කපා හැරියේ ය...



මේ අතර හතළිස් දෙවැනි වාට්ටුවේ 'රාජකීය කෘත්‍රිම කකුල්' පාවිච්චි කරන්නෙක් ඇතිවීම ගැන මොස්කව් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය අංශයේ තෙවැනි වසරේ ශිෂ්‍යයෝ සාකච්ඡා කළහ. යුද කාලයේ වෛද්‍ය පීඨයේ ශිෂ්‍යයන්ගෙන් ඉතා විශාල කොටසක් වූයේ තරුණියන් ය. අන්යුටා හතළිස් දෙවැනි වාට්ටුවේ සියලු තොරතුරු හොඳින් දැන සිටි අතර, ඈ ඒවා තම යෙහෙළියන් අතර ප්‍රචාරය කළා ය.

"රාජකීය කෘත්‍රිම කකුල්" පාවිච්චි කරන අලෙක්සේයි මෙරේස්යෙව්ට ප්‍රහාරක අහස්යානාවක් පදවන්න පුළුවන්ද බැරිද යන ප්‍රශ්නය ගැන විශ්වවිද්‍යාලයේ කැන්ටිමේ විවාදයක් ඇති විය. තරුණ සිසුහු හැම

දෙනාම අලෙක්සේයිට අනුකම්පා කළහ. නවීන ප්‍රහාරක අහස්යානා පැදවීම අතිශයින් ම දුෂ්කර වැඩක් බව කියා සිටි සර්වාශුභවාදීහූ අලෙක්සේයි අසමත් වන බව කීහ. බිඳුණු දෙපා ඇති ව මහා වනයක දින ගණනක් තිස්සේ දණ ගාමින් හා බඩ ගාමින් ගොස් සතුරන්ගෙන් බේරීමට තරම් ආත්ම ශක්තියක් තිබුණු අලෙක්සේයි ප්‍රහාරක අහස්යානා පදවනු ඇතැයි සර්වශුභවාදීහු පැවසූහ. තම මතය සනාථ කරනු වස් ඔහු ඉතිහාසයෙන් හා පොත්වලින් කරුණු ගෙන හැර දැක්වී ය.

අන්යූටා මෙම විවාදයට සහභාගි නොවූවා ය. තමා නොහඳුනන අහස් නියමුවාගේ කෘත්‍රිම පාද ගැන ඈ නොසිතුවා ය. තමාට විවේකය ඇති අවස්ථාවල දී ඈ සිතුවේ යුද ටැංකි ලයිතන් ග්වොස්දේව් හා තමා අතර ඇති සම්බන්ධකම් ගැන ය. මේ සම්බන්ධකම වැඩි වැඩියෙන් සංකීර්ණ වී ඇති බව ඈට වැටහිණි. වීර සෙබළෙකුගේ ශෝකාන්විත ඉරණම ගැන පළමු වරට දැන ගත් අන්යූටා ඔහුට ලියුවේ ඔහුගේ ශෝකය තුනී කරන අදහසිනි. එහෙත්, පසු ව මේ ලියුම් හුවමාරුව දිග්ගැස්සුණු පසු දේශප්‍රේමී යුද්ධයේ වීරයාගේ වියුක්ත රූපය අතුරුදන් වී ඒ වෙනුවට තරුණයකුගේ රූපය දිස්විය. මේ තරුණයා ඇගේ සිත වඩාත් ඇද ගත්තේ ය. ඔහු, ඈට ලිවීම අතපසු වූ විට ඇය තුළ කාන්සියක් හා ශෝකයක් ඇති වන සැටි ඈට දැනිණි. මේ නිසා ඇය තුළ බියක් හා සතුටක් එකවර ඇති විය. මෙයත් ආලයක් ද? කිසිදිනෙක නොදුටු පුද්ගලයකුගේ ලියුම් නිසා ඔහුට ආලය කළ හැකි ද? ග්වොස්දෙව් තම ලියුම් මගින් ඈට 'ආලය කරන' බව දැන්වීමෙන් පසු ව, අන්යූටා ද ඔහුට ආලය කරන බවත් එය පාසල් සමය තුළ ඇති වන ළමා ආදරය නොවන බවත් වටහා ගත්තා ය. ග්වොස්දෙව්ගෙන් ලියුම් ලැබීම පමා වුවහොත් කැලඹී ගන්නා අන්යූටා ඔහු ලියුම් ලිවීම නැවත්වුවහොත් ජීවත් වීමේ තේරුම පවා නැති වන බව වටහා ගත්තා ය.

එකිනෙකා නොදැන ඔවුහු එකිනෙකාට පෙම් කළහ. ඉන් පසු ව ග්වොස්දෙව් තුළ විශාල වෙනසක් ඇති විය. කෝලයකින්, අසීරුවකින්, නොපැහැදිලිතාවකින් ඔහු ඈට ලිව්වේ ය. එකිනෙකා නොදැක පෙම් කිරීම නුවණට

හුරු නැති බවත්, තමාගේ තුවාලය නිසා තමා කොතරම් අවලස්සන වී ඇති ද යන්න ඈට සිතා ගැනීමට පවා අපහසු බවත්, ඈට එවා ඇති ඡායාරූපයට වඩා දැන් ඔහු බොහෝ සෙයින් ම වෙනස් වී ඇති බවත් දැන්වී ය. ඇය රැවැට්ටීමට ඔහු සූදානම් නැති නිසා ඈ ඔහු දුටු පසු ඇගේ අදහස් පවසන ලෙස ඉල්ලා සිටි ග්වොස්දෙව් ලියුම් ලිවීම නවත්වන ලෙස ද ඉල්ලා සිටියේ ය.

ග්වොස්දෙව් රෝහලෙන් පිට වන දිනය ළං විය. වරෙක ඔහු දුර සිටගෙන කැඩපතකින් තම මුහුණ බලයි. තවත් වරක් ඔහු කැඩපතට ළං වී තම මුහුණේ කැළැල් එකිනෙක පිරික්සා බලයි.

ඈතින් සිට බලන විට ඔහුගේ පෙනුම පියකරු ය. පළල් උරහිස්, සිහින් ඉඟටිය, ශක්තිමත් කකුල් ඔහුගේ සිරුරේ හැඩය කියාපයි. ළං වී බලන විට ඔහුගේ දෙකොපුල්වල තුවාල කැළැල් ද, රත් පැහැති සනැති හම ද මුහුණ විරූපී කළ සැටි පෙනේ. ඔහු බියෙන් යුතුව සිතී ය. 'ඈ මා දුටු විට මොනවා සිතාවි ද?' ඈ බියේ පැන දුවනු ඇත. සිත නොකලකිරවනු පිණිස ඈ පැයක් පමණ ඔහු සමඟ කතා කොට ඔහුගෙන් සමුගෙන සදහට ම ඉවත් වී යනු ඇත.

තමා සිතූ ඒවා සියල්ල සැබැවින් ම සිදු වූවාක් මෙන් ඔහු කනගාටුවට පත් විය.

එවිට ඔහු තම සාක්කුවෙන් ඡායාරූපයක් ගෙන බැලී ය. පළල් නළලක් ඇති එම තරුණිය මහත ය. හිසකේ මෘදු ය. තුනී ය. නියම රුසියන් නහයකි. දෙතොල් පොඩි දරුවෙකුගේ මෙනි. උඩු තොලේ කුඩා උපන් ලපයකි. ඇගේ ඇස් අළුපාට හෝ නිල් පාට හෝ විය යුතු ය. මුහුණ කපටි නැත. ඡායාරූපය ඔහු දෙස අවංක බැල්මක් හෙළයි.

"තී කවුද? තී බියවන්නෙහිද? පැන දුවන්නෙහිද? මාගේ අවලස්සන මුහුණ දැක බිය නොවීමට ඈ සමත් වන්නීද?" ආදී ප්‍රශ්න අසන්නාක් මෙන් ග්වොස්දෙව් අන්යුටාගේ ඡායාරූපය දෙස බැලී ය.

මේ අතර, කොරිඩෝරය දිගේ කෘත්‍රිම පාදවලින් හා කරුවල ආධාරයෙන් අලෙක්සේයි ඇවිද්දේ ය. වරක්, දෙවරක්, දසවරක්, විසිවරක් එහා මෙහා යන ජ්‍යෙෂ්ඨ ලයිතාන් අලෙක්සේයි මෙරේස්යෙව් දුටු ග්වොස්දෙව් කල්පනා කරන්නට විය. දිනපතා ම උදේ සවස මේ විදිහට

ඇවිදින අලෙක්සේයි තම ගමන දිගු කළේ ය.

"හරිම හොඳ හාදයා" යැයි අලෙක්සේයි දෙස බැලූ ග්වොස්දෙව් තමාට ම කියා ගත්තේ ය. "පුදුම ධෛර්යයක් ඇති මිනිහෙක්, එයාට කොයින් ද මේ තරම් දැඩි ආත්ම ශක්තියක්. සාමාන්‍ය මිනිහෙකුට ඔහොම ඇවිදින්ට ඉගෙන ගන්න මාස ගණනක් යනව. මේ යෝධයා ඊයේ පඩිපෙළ දිගේ තනියම බැහැලා ආපහු නැග්ගා. කකුල් කොටවල අගින් නගින වේදනාව නිසා එයාගේ ඇස්වලින් කඳුළු ගැලුවා. ඒ වුණත්, එයා පයින් ම බැස්සා, නැග්ගා. එයාට උදව් කරන්න ආපු සේවකයාට බැණ වැදුණා. පඩිපෙළ නැඟ වාට්ටුවට ආ පසු එයාගෙ මූණ ප්‍රීතියෙන් බැබළුණා. හරියට එල්බ්රුස් කන්ද නැංගා වගෙ"

...සවස කොරිඩෝරය දිගේ විසිතුන් වරක් එහා මෙහා ඇවිද්ද අලෙක්සේයිගේ කකුල් අගින් පැන නැංගේ තියුණු වේදනාවකි. කරු නිසා කිහිලිවල ද වේදනාවක් ඇති විය.

ටක්, ටක්, ක්‍රික්, ක්‍රික්, ටක්, ටක්, ක්‍රික්, ක්‍රික්...

දෙතොල් සපමින්, කඩා හැලෙන කඳුළු බිංදු නවත්වා ගනිමින්, ජ්‍යොෂ්ඨ ලයිතන් අලෙක්සේයි මෙරේස්යෙව් විසි නවවෙනි වරට ද කොරිඩෝරය දිගේ ගමන් කරමින් තම සවස ව්‍යායාම් අවසන් කළේ ය.

## 13

ජූනි මස දෙවැනි සතිය අන්තයේ දී ග්වොස්දෙව් රෝහලින් පිට විය.

ඊට දවස් දෙකකට පෙර ඔහු හා අලෙක්සේයි අතර කුලුපග ළෙන්ගතු සාකච්ඡාවක් ඇති විය. අවාසනාවත් බව අනුව එක ම ඉරණමකට මුහුණ පා ඇති මේ දෙදෙනා අතර විශේෂ සහෝදරත්වයක් ඇති විය. තම උදාරත්වය නිසා අභාග්‍යයකට මුහුණ නොපෑ, පිට අයට හෙළි නොකරන හැඟීම් ඔවුහු තමන් අතර නොසඟවා හෙළි කළහ. තම පෙම්වතියන්ගේ ඡායාරූප ඔවුහු තම තමන්ට පෙන්වූහ.

අන්යූටා තමා පිළිගන්නා සැටිත්, ඈ තම පිලිස්සුණු මුහුණ කෙරෙහි දක්වන සැලකිල්ල ගැනත් අලෙක්සේයිට ලියා දන්වීමට ග්වොස්දෙව් පොරොන්දු විය. ග්වොස්දෙව්ගේ පෙම්වතිය ඔහු සතුටින් පිළිගතහොත්,

තමාට සියලු බාධාවන් හා අභාග්‍යයන් ගැන ඕල්යාට දන්වා, තමා ගැන ඔත්පළව සිටින මවට නොදැන්වීමට ඇය පොරොන්දු කරවා ගැනීමට අලෙක්සේයි ඉටා ගත්තේ ය.

ග්වොස්දෙව් රෝහලින් පිටවීම ගැන ඔහු මෙන් ම, අලෙක්සේයි ද කැලඹුණු සිතින් පසුවුණේ එබැවිනි. නොනිදා රැය ගත කළ මිතුරෝ දෙදෙනා නිහඬ ව වාට්ටුවෙන් පිට වී කොරිඩෝරයට ආහ. ග්වොස්දෙව් කැඩපත ඉදිරිපිටට වී තම තුවාල බලමින් ඒවා පිරිමැද්දේ ය. අලෙක්සේයි තම කකුල් අග රෙදිකඩවලින් ඔතා නැවත වරක් කෘත්‍රිම පාදවලින් ඇවිද්දේ ය.

උදේ දහයට වාට්ටුවට පැමිණි ක්ලාව්දියා මිහයිලොව්නා ග්වාස්දෙව් කැටුව යාමට කෙනෙක් ඇවිත් සිටින බව දැන්වූවා ය. මහා කුණාටුවකට හසු වූ කලෙක මෙන් ග්වොස්දෙව් කලබල විය. ඔහුගේ මුහුණේ කැළැල් තවත් රත් පැහැ ගත්තේ ය. තම ඇඳුම් ආදිය ඔහු ඉක්මනින් එකතු කළේ ය.

"හරි හොඳ තරුණියක්. පෙනුම බොහොම වැදගත්." යැයි ක්ලාව්දියා මිහයිලොව්නා කියන්නේ, ග්වොස්දෙව් ඉක්මන් වන සැටි බලමින් දඟකාරී ලෙස සිනාසුණා ය.

මේජර් ස්ට්රුච්කොව් ද අලෙක්සේයි සහ අලුත් රෝගීහු දෙදෙනෙක් ද රෝහලින් පිට ව ගිය ග්වොස්දෙව් මහ මඟ යන සැටි බලනු වස් ජනේලය අසලට පැමිණියහ.

"අන්න එනවා!" යැයි අලෙක්සේයි සෙමෙන් කීය.

රෝහලේ විශාල දොරවල් විවර වී දෙදෙනෙක් මඟට බටහ. තරුණිය තරමක් මහත ය. ඇගේ හිසකේ පස්සට පීරා ඇත. සුදු හැට්ටයක් හා කළු පැහැති සායක් ඇඳි ඈ අලෙක්සේයිට පවා හඳුනා ගත නොහැකි තරුණ සෙබළකු සමඟ ගමන් කළා ය. ඔහු එක් අතකින් සූට්කේසය ද අනෙක් අතින් වැහි කබාය ද ගෙන ගමන් කළේ ය. ඔහු කොතරම් කඩිසර ලෙස ගමන් කළේ ද යත්, ඔහු දෙස බැලීම පවා සතුටකි. නිදහසේ ඇවිදීමට අවස්ථාව ලැබීම නිසා සතුටු වූ තරුණ සෙබළා ග්වොස්දෙව් තම ශක්තිය මැන බැලීමට මෙන් යම්තමින් උඩ පනින්නාක් මෙන් කඩිසර ලෙස පා තැබී ය. තරුණිය ඔහුගේ අතක් ගෙන රන් වන් වැහි පොදින් සේදී ගිය පදික වේදිකාව ඔස්සේ ගමන් කළා ය.

ඔවුහු වාට්ටුවේ ජනේලය අසලින් යද්දී අලෙක්සේයිගේ හදවත ප්‍රීතියෙන් සැලිණි. "හැමදෙයක්ම අගේට සිදු වී ඇත! ඇගේ මුහුණ සුන්දරය. පෙනුම අවංකය. චාම්ය. එවැනි තරුණියක් විපතට පත් මිනිහෙකුව අත හරින්නේ නැහැ"යි හේ තමාට ම කියා ගත්තේ ය.

ඔවුහු ජනේලය ඉදිරිපිට නැවතී, වාට්ටුව දෙස බැලූහ. ඔවුහු වැසි නිසා ඔප් නැඟී දිලිසෙන තාප්පය ළඟ සිටගත්හ. තාප්පය දිගේ ගලායන වැහි බිංදු කුඩා සර්පයන්ට සමාන විය. යුද්ධ ටැංකි හමුදාවේ ලයිතන් තැන්පත් ග්වොස්දෙව් ලජ්ජාවෙන් හා කරදරයකින් පසුවන බව අලෙක්සේයි දිටී ය. ඡායාරූපයෙන් මෙන් ම සුන්දර රූ සපුවකින් හෙබි අන්යුටා ද ලජ්ජාවෙන් හා කැලඹුණු සිතින් පසු වූවා ය. ඈ ග්වොස්දෙව්ගේ අත අල්ලාගෙන සිටින්නේ ද දෙගිඩියාවෙනි. ග්වොස්දෙව් අතහැර ඈ පලායාමට සූදානම් බවක් ඇගේ පෙනුම කියාපායි...

මුළු දවස තිස්සේ ම අලෙක්සේයිට අසහනයක් දැනිණි. එදින සවස ව්‍යායාම් නොකළ ඔහු, කලින් නින්දට ගියේ ය. එහෙත්, අනික් රෝගීන් නින්දට ගිය පසු ද ඔහු නොනිදා ඇඳ මත පෙරළුණේ ය.

පසු දා උදෑසන හෙදිය වාට්ටුවට ඇතුළු වූ විගස ම අලෙක්සේයි තමාට ලියුම් තිබේ දැයි ඇගෙන් ඇසී ය. ලියුම් නොතිබිණි. ඔහු උදාසීන ලෙස මුහුණ කට සෝදා ගෙන රුචියකින් තොර ව ආහාර ගත්තේ ය. එහෙත්, ඔහු වෙනදාට වඩා වැඩි වාර ගණනක් කෘත්‍රිම පාදවලින් ගමන් කරමින් ඊයේ දක්වූ අලසකමට දඬුවම් වින්දේ ය. වෙනදාට වඩා පහළොස් වරක් වැඩියෙන් ගමන් කිරීමෙන් ලැබුණු චිත්ත ධෛර්යය නිසා ප්‍රීති විය. කරුවල ආධාරයෙන් වැඩි මහන්සියන් නොවී ගමන් කළ හැකි බව ඔහු ඔප්පු කළේ ය. කොරිඩෝවේ දිග මීටර පනහකි. පනහ හතළිස් පහකින් වැඩි කළ විට මීටර් දෙදහස් දෙසිය පනහකි. නැතහොත් කිලෝමීටර් දෙකකුත් කාලකි. මෙය ඔහු ගමන් කළ දුර ප්‍රමාණයයි. දෙවියනි! එය සෑහෙන දුරකි.!

තමා ගමන් කරන දුර ප්‍රමාණය හතළිස් හය වාරයක් දක්වා වැඩි කිරීමට හෙතෙම තීරණය කළේ ය. උදේට වාර විසිතුනක් ද, සවසට වාර විසි තුනක් ද බැගිනි. හෙට

ඔහු පළමු වරට කරු රහිත ව ඇවිදීමට සිතුවේ ය. මේ නව අදහස නිසා පරාජිත හැඟීම පහ ව ගොස් ඔහු තුළ ප්‍රබෝධයක් ඇති විය. සවස ඔහු තම ව්‍යායාම් වාරය අරඹා, තිස් වාරයක් කොරිඩෝව දිගේ ගමන් කරත් ම සේවිකාව ලියුමකුත් අරගෙන ඔහු වෙත පැමිණියා ය.

අලෙක්සේයි කවුළුව අසලට වී ලියුම කිය වී ය. යුද පෙරමුණට පිටත් ව ගිය ග්වොස්දෙව් දුම්රියපොළේ සිට එවූ ලියුමකි. එය කියවන අලෙක්සේයිගේ මුහුණ වඩ වඩාත් සුදුමැලි විය. අන්යුටා තරම් රූමත් තරුණියක් මොස්කව් නගරයේ නැති බවත්, ඇය තමා සිතූ විදියේ කෙනෙකු බවත්, ඈ තමාට හොඳින් සැලකූ බවත්, ඔහු ඇයට තදින් ඇලුම් කරන බවත් ග්වොස්දෙව් ලිව්වේ ය.

"...ඒ වුණත් අපේ අදහස තහවුරු වුණා. ඈ බොහොම හොඳ කෙනෙක්. ඈ මට කිසිවක් නොකීවා පමණක් නොව, මාගේ මුහුණ ගැන ඉඟියක්වත් කළේ නැහැ. ඒ වුණාට මම පොට්ටයෙක් නෙවේ. මට පෙනුණා ඈ මා නිසා බිය වී සිටින සැටි. හිටිහැටියේ මා ඈ දිහා බැලුවා. එවිට මා දැක්කා මා දිහා ඈ බියෙන් බලන හැටි. ලැජ්ජාව, බිය සහ අනුකම්පාව මුසු බැල්මකිනුයි ඈ මා දෙස බැලුවේ... ඈ තනි ව ම ගෙදර ඉන්නේ. ඇගේ මව සහ පියා පිට පළාතකට ගිහින්. වැදගත් පවුලක්. ඈ තේ හදන්ට ගියා. තේ පෝච්චියේ මගේ මුහුණ පිළිබිඹු වන සැටි බලමින් ඈ උහුල්ලන්ට පටන් ගත්තා. මම කියන්ට ඕනෑ දේ කෙළින්ම කිව්වා. 'මගේ මුහුණ නිසා අන්යුටා බය වෙලා තියෙන හැටි මට පේනවා. මම ඒ ගැන අමනාප වෙන්නෙ නැහැ' එවිට අන්යුටා අඬන්නට පටන් ගත්තා. 'අන්යුටා අඬන්න එපා. ඔයා හොඳ තරුණියක්. හොඳ කෙනෙක් ඔයාට පෙම් කරාවි. මා හන්දා ඔයාගේ ජීවිතේ කාලකණ්ණි කර ගන්න එපා' ඊට පස්සෙ මම ඇට මෙහෙම කිව්වා. 'අන්යුටා දැන් මගේ හැටි දැක්කා නෙව. මාගේ ඇඩ්රසය තියලා යන්නම්. කල්පනා කරලා පස්සේ ලියන්න' ඒ වන විට අහස් අනතුරු සංඥාවක් කළා. ඈ ආරක්ෂක බිම් ගෙට දිව්වා. මම ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනයක් අරගෙන ගෙයින් පිට වුණා. නිලධාරි සේනාංකයට ගිහින් මා යා යුතු තැනට පත්වීමක් ලබා ගත්තා. අලෙක්සේයි, මම දැන් යුද පෙරමුණ බලා යනවා.

පෙරටත් වඩා මම දැන් අන්යූටාට ආලය කරනවා. ඈ නැතුව ජීවත් වෙන්නේ කොහොමද කියා හිතන්නවත් බෑ"

අලෙක්සේයි තම මිතුරාගේ ලියුම කියවන්නේ, තම අනාගතය ගැන ද සිතී ය. ඔහුත් එවැනි ම ඉරණමකට මුහුණ පාන්නට ඕල්යා ඔහු ප්‍රතික්ෂේප නොකරනු ඇත. අනුකම්පා සහගත ව ඈ ආත්ම පරිත්‍යාග කරනු ඇත. කඳුළු මැඩගෙන සිනාසෙනු ඇත. දුක මැඩගෙන ප්‍රීති වනු ඇත.

"නැහැ. නැහැ. එහෙම ජීවිතයක් ඕනෑ නැහැ." අලෙක්සේයි හඬ නගා කීවේ ය. ඔහු තම ඇඳ මත වාඩි වී ඕල්යාට කෙටි, අමිහිරි ලිපියක් ලීවේ ය. "අප දෙදෙනා අතර ඇති සම්බන්ධකම් ගැන කල්පනා කර බැලීමි. ඕල්යාට මා එනතුරු බලා සිටීම කරදරයකි. යුද්ධය තව අවුරුදු කීයක් පවතීද? කාලය ගෙවී යයි. ඒ සමඟ ම තරුණ විය ද ගෙවේ. යුද්ධ කාලයේ දී බලාපොරොත්තු සියල්ල විනාශ වෙනවා. යුද්ධයේ දී මා මළොත් ඔබට බිරියක් නොවී ම කනවැන්දුම් ගැහැනියක් වීමට සිදුවනු ඇත. මාගේ අතපය කැඩී ගියොත් ඔබට අබ්බගාතයෙකුගේ බිරියක් වීමට සිදුවනු ඇත. එවැන්නෙකු කුමට ද? ඔබේ තරුණ විය අපතේ නොයවා මා අමතක කරන්න. ඕල්යා මේ ලියුමට පිළිතුරු නොලිව්ව ද මම අමනාප නොවෙමි. මෙවැනි තීරණයක් ගැනීම කොතරම් අමාරු වුව ද එසේ කළ යුතු ය..."

එදින අලෙක්සේයිට නින්දක් නොවී ය. අමුතු වර්ගයක 'ලා-5' හේ අහස්යානාවක් හේ සිහිනෙන් දිටී ය. එහි පාපුවරුව කුරුලු පාද මෙනි. යානයට නැග ගත් කාර්මික ශිල්පි යූරා "අලෙක්සේයි අහස්යානා පැදවූ කාලය ඉවරයි. දැන් ඉතින් මගේ කාලයයි" කියමින් යානාව පදවන්නට විය. ඉන් පසු ඔහු මිහයිල් සීයාව දුටුවේ ය. අලෙක්සේයි පිදුරු පැදුරක් මත වැතිර සිටී. සුදු කමිසයක් ඇඳ සිටි මිහයිල් සීයා දුම් දමන උණු වතුරෙන් අලෙක්සේයි නාවමින් ඔහුගේ පිටට ළපටි කොළ අත්තකින් පහර දෙමින් සම පිරි මැද්දේ ය. "කසාදෙට ඉස්සෙල්ලා නාවන්ට ඕනෑ" යැයි සීයා කීවේ ය. හිමිදිරි පාන්දර ඔහුට ඕල්යා සිහිනෙන් පෙනිණි. ඈ පෙරළුණු ඔරුවක් මත වාඩි වී දෙපා දියට ඔබාගෙන සිටියා ය. ඇගේ කකුල් හිරු රැස්

නිසා දුඹුරු පැහැයෙන් දිලිසිණි. හිරුරැස් වැළක්වීම් වස් එක් අතකින් දෑස් ආවරණය කර ගත් ඕල්යා මඳ සිනා පාමින් ඔහුට අඬ ගසමින් අතක් වැනුවා ය. ඔහු ඈ වෙත පීනන්නට විය. එහෙත්, සැඩ පහර නිසා ඔහුට ඈ වෙත පීනන්නට බැරි වූ අතර, ඔහුත් ඈත් අතර දුර ප්‍රමාණය වැඩි වූයෙන් ඔහු ගඟ මැදට විය. ඔහු වෙර යොදා ඈ වෙත පීනමින් ඈට ළං විය. ඔහුට ඇගේ හිසකේ ද, දුඹුරු පැහැති දෙපාවල දිය බිඳු ද පෙනිණි...

ඔහු අවදිවූයේ ප්‍රීතිමත් හැඟීමකිනි. දෑස් වසාගෙන වැතිර සිටි අලෙක්සේයි ඇය නැවත සිහිනෙන් දකින ආසාවෙන් නිදා ගැනීමට උත්සාහ කළේ ය. නිතර එක ම දෙයක් ගැන සිහින දැකීමට හැක්කේ ළමා කාලයේ දී ය. ඕල්යා සිහිනෙන් දැකීම නිසා ඔහු ප්‍රබෝධයට පත් විය. පසු නොබැස ඕල්යා වෙත යා යුතු ය. සැඩ පහරට එරෙහි ව පීනීමෙන් ඈ වෙත ළං විය යුතු ය. ඒ සඳහා යෙදිය හැකි හැම ශක්තියක් ම යෙදිය යුතු ය. ලියුම? ඒ ලියුම ඈට ලැබුණාවේ! එවැනි ලියුමකින් නියම ආලයට හානි සිදු නොවේ.

උදෑසන අලෙක්සේයි කරු නැති ව කෘත්‍රිම පාදවලින් ඇවිදීමට උත්සාහ කළේ ය. ප්‍රවේසමෙන් නැඟිට සිටගත් හෙතෙම, දෑත් දෙපැත්තට වනමින් සමබර ව සිට ගත්තේ ය. පසු ව තාප්පය අල්ලා ගනිමින් සෙමින් පියවරක් ඉදිරියට තැබී ය. කෘත්‍රිම පය ක්‍රික් යන හඬ නැඟී ය. ඇවිදීම මෙතරම් අසීරු වැඩක් බව හේ මීට පෙර නොදත්තේ ය. සිරුර එක් පැත්තකට බර කරමින් තවත් පියවරක් තැබී ය. ඔහු තෙවැනි පියවර ඉදිරියට තබත් ම බිම ඇද වැටිණි.

වාට්ටුවේ රෝගීන් නොයෙකුත් ප්‍රතිකාර ගැනීම සඳහා චිකිත්සාගාරවලට යන වේලාව තම ව්‍යායාම් සඳහා අලෙක්සේයි තෝරා ගත්තේ ය. ආධාර සඳහා කිසිවකු නොකැඳවීමට ඔහු තීරණය කළේ ය. බිත්තිය ළඟට ගිය ඔහු තම වැළමිටේ තුවාල කැළලය දෙස බලා සුසුමක් හෙළා, දත්මිටි කමින්, පියවරක් තබා බිත්තියෙන් ඈත් විය. දැන් ඔහු රහස ඉගෙන ගෙන ඇතැයි ඔහුට සිතිණි. කෘත්‍රිම පාද සැබෑ පාදවලට වඩා නම්‍යතාවයෙන් අඩු ය. මේ පාදවල ගුණයන් ගැන ඔහු තව ම හරි හැටි

නොදනී. පියවරක් තැබීමට පෙර සිරුරේ බර අනෙක් පයට දී ගමන් කළ යුතු ය. දෙපය සමාන්තර ව නොතබා දෙපයේ ඇඟිලි දෙපැත්තට විහිද යන සේ කෝණාකාර ව තැබිය යුතු ය. මෙයින් සමබර ව සිටීමට හා ස්ථිර ව පා තැබීමට පුළුවන් විය.

මේවා සියල්ල ම කෙනෙක් ඉගෙන ගන්නේ ළමා කාලයේ දී ය. මවගේ මඟ පෙන්වීම යටතේ සිඟිති දරුවා පළමු වරට පා තබයි. පසු ව මෙසේ ගමන් කිරීම ඉබේට ම සිදු වේ. එය ස්වාභාවික දෙයක් බවට පත් වේ. එහෙත්, මිනිසෙක් කෘත්‍රිම පාද සවිකරගත් පසු, ඔහු ළදරු කාලයේ සිට පුරුදු වූ මේ ප්‍රකෘති ක්‍රමය බාධාවක් වෙයි. පැරණි පුරුද්දට එදිරි ව නැඟී නොසිටින්නේ නම් ඔහුට කෘත්‍රිම පාදවලින් ගමන් කළ නොහැකි ය. ළමා කාලයේ දී ඉතා ලෙහෙසියෙන් ඇවිදීමට ඉගෙන ගත් මිනිසෙකුගේ පා නැති වීමෙන් පසු ඔහු කෘත්‍රිම පාද සවිකරගත්තේ නම්, කරුවල ආධාරය නැති ව ගමන් කිරීම පුරුදු කර ගැනීම සඳහා ඔහු තුළ දැඩි ආත්ම ශක්තියක් තිබිය යුතු ය. නොඑසේ නම්, ඔහුට නැවත ගමන් කළ නොහැකි ය.

අලෙක්සේයි මෙරේස්යෙව් තම අරමුණ වෙත යාමට දැඩි අදිටනකින් යුතු ව ක්‍රියා කළේ ය. පළමු වර කළ වැරැදිවලින් පාඩම් ඉගෙන ගත් ඔහු, නැවත උත්සාහ කළේ ය. මෙවර කෘත්‍රිම පාදවල විළුඹ පිටතට විහිද යන සේ සිට ගත් අලෙක්සේයි මෙරේස්යෙව් සිරුරේ බර විළුඹට දුන්නේ ය. පසු ව සිරුරේ බර ඇඟිලි සහිත ඉදිරි කොටසට මාරු කරන විට කෘත්‍රිම පාද කෝපය පිට කරන්නාක් මෙන් හඬ නැඟී ය. මෙලෙස සිරුරේ බර මාරු කරමින් ඔහු පියවරක් ඉදිරියට තැබී ය. බිත්තියෙන් ඈත් වූ ඔහු බිම තැබූ පය එසවීමට බිය වූයේ, සමබර ව සිට ගනිමින් නොසෙල් වී උන්නේ ය. විඩා පත් වීම නිසා ඔහුට හීන් දාඩිය දැමිණි.

ඔහු මෙලෙස සිටගෙන සිටින විට වසීලියි වසීලෙවිච් ඔහු දිටී ය. ඔහු දොර ළඟ සිටගෙන අලෙක්සේයි දෙස බලමින්, පසු ව ඔහු වෙත ගොස්, ඔහුට උදව් වෙමින් මෙසේ පැවසී යඃ

"ඇවිදින්නට පටන් ගැනීම අපූරුයි! ඇයි හෙදියට හෝ සේවකයෙකුට හෝ කතා නොකළේ, ආඩම්බරකම හන්දා

වෙන්ට ඕනේ... කමක් නැහැ... හැම වැඩක දී මෙන්ම දනුත් පටන් ගැනීම තමා ඉතාම වැදගත්. තමුසෙ අමාරු කාරිය පසු කළා"

"මෙරේස්යෙව් අපි ආයෙමත් පටන් ගනිමු"යි කී මහාචාර්යතුමා තම ගෝල පිරිසට මෙසේ පැවසී ය. "මොකද නුඹලා බලා ඉන්නෙ? මේක සර්කස් එකක් නෙමෙයි. මා නැතුව ඉතිරි ලෙඩ්ඩුන් ගැන බලාපල්ලා" නැවත අලෙක්සේයි දෙසට හැරී "පටන් ගනිමු. තරුණයා ලැජ්ජ වෙන්න එපා. මාව අල්ලා ගන්නවා. මම යුද්ධ නිලය අනුව ජනරාල් කෙනෙක්. මට කීකරු වෙනවා. පියවරක්, තවත් එකක්... දකුණට හැරී... වමට හැරීම අපූරුයි!"

ලෝක ප්‍රසිද්ධ වෛද්‍යවරයා දැන් පිරිමැද්දේ යම් කිසි වැදගත් වෛද්‍ය පරීක්ෂණයක් සාර්ථක ලෙස කළාක් මෙනි. තමා කරන හැම වැඩකින් ම උනන්දුවක් හා ප්‍රබෝධයක් ලබා ගැනීම ඔහුගේ චරිත ලක්ෂණයකි. හැම වැඩක් ම සපුරා ලීම සඳහා ඔහු සම්පූර්ණ ශක්තිය යෙදවී ය. විඩාපත් වී සිටි අලෙක්සේයි ඔහු තවත් වරක් වාට්ටුව දිගට ඇවිද්දවිය. අලෙක්සේයි පුටුව මත ඇද වැටුණ විට ඔහු ද පුටුවක් ගෙන ඔහු ළඟින් වාඩි විය.

"කොහොමද පියාසර කරමුද? අතක් නැති මිනිහෙක් එක් අතින් බෝම්බයක් අරගෙන ප්‍රහාර අරඹනවා. මරණීය තුවාල ලබපු හටයෝ මැෂින් තුවක්කුවලින් සතුරන්ට වෙඩි තියනවා. සෝවියට් හටයෝ තම පපුවෙන්, සිරුරෙන් මැෂින් තුවක්කුවල කටවල් වසා තම සගයන් මරණින් ගලවා ගන්නවා... මැරිච්ච මිනිස්සු විතරයි මේ යුද්ධයේ දී සටන් නොකරන්නේ" මෙසේ කී වසීලියි වසීලෙවිච්ගේ මුහුණ අඳුරු විය. "මැරිච්ච අය පවා සටන් කරනවා. ඒ ඒගොල්ලන්ගේ කීර්තියෙන්... ඔව්, ඔව් තරුණයා අපි නැවත පටන් ගනිමු"

දෙවෙනි වර ඇවිද විවේක ගැනීමට වාඩි වූ විට ග්වාස්දෙව්ගේ ඇඳ පෙන්වූ මහාචාර්යවරයා මෙසේ ප්‍රශ්න කළේ යඃ

"යුද ටැංකි හටයා ගැන මොනවද ආරංචි? එයා රෝහලෙන් පිට වුණාද?"



ග්වොස්දෙව් සුවය ලැබ තම සේනාංකයට ඇතුළු වූ බවත්, ඔහුගේ නිකට හා කම්මුල්වල පිලිස්සුම් තුවාල නිසා මුහුණ විරූපී වී තිබෙන බවත් අලෙක්සේයි මහාචාර්යවරයාට පැවසී ය.

"ග්වොස්දෙව් තමුසෙට ලියුවද? තරුණියෝ ආලය කරන්නෙ නැති හන්දා මිනිහ කනගාටු වෙලා වගෙ. මිනිහට කියනව උඩු රැවුළකුයි යටි රැවුළකුයි වවන්ට කියල. අලුත් පැෂන් එකක් හැටියට තරුණියො ඒ වගේ අයට ආලය කරාවි!" යැයි වසීලියි වසීලෙවිච් පැවසී ය.

ඔහු වාට්ටුවේ දොර ළඟට විත් නැවත හඬ නඟා කතා කළේ ය.

"ලියන්න, ග්වොස්දෙව්ට මගේ උපදෙස් ගැන අත්හදා බලාපු ඖෂධයක්. තරුණියො ඒකට කැමති වේවි."

සවස රෝහලේ සේවකයෙක් කළුවර ලීයෙන් සෑදූ වටිනා සැරයටියක් අලෙක්සේයිට භාර දුන්නේ ය. එය මහාචාර්ය වසීලියි වසීලෙවිච්ගෙන් තෑග්ගකි. උඩ කොටස

ඇත්දත් කැටයමින් නිම වී ඇති ඒ සැරයටියේ නමක මුල අකුරක් ද කොටා ඇත.

"මහාචාර්යතුමා එයාගේ පෞද්ගලික හැරමිටිය එව්වා ලයිතන් සහෝදරයට තෑග්ගක් වශයෙන්. ඇවිදින විට හැරමිටිය පාවිච්චි කරන්න කිව්වා."යැයි සේවකයා කීය.

ගිම්හානයේ දවසක් වූ එදා සවස රෝහල තුළ විනෝද විය හැකි කිසිවක් නොතිබුණෙන්, බොහෝ රෝගීහු හතළිස් දෙවැනි වාට්ටුවට විත් මහාචාර්යවරයාගේ තෑග්ග බැලූහ. සැරයටිය වටිනා වස්තුවක් විය.

## 14

යුද පෙරමුණේ ප්‍රහාරයට පළමු ව ඇති වන නිහඬතාව වුවමනාවට වඩා දිගු කල් පැවැතිණි. සුළු සටන් ගැන හා ඔත්තු බලන සටන් ගැන වාර්තා පමණක් පළ විය. රෝහලේ රෝගීන්ගේ සංඛ්‍යාව අඩු වූයෙන්, හතළිස් දෙවැනි වාට්ටුවේ හිස් ඇඳන් අස් කරන ලෙස දැන්වී ය. වාට්ටුවේ ඉතිරි වූයේ අලෙක්සේයි මෙරේස්යෙව් හා මේජර් ස්ට්‍රැච්කොව් පමණකි. අලෙක්සේයිගේ ඇඳ වම් පැත්තේ ද ස්ට්‍රැච්කොව්ගේ ඇඳ දකුණු පැත්තේ ද ජනේලය අසල තැබී ය.

ඔත්තුකාරයෝ සුළු සටන්වල යෙදෙති. නිහඬතාව දිග්ගැස්සුණු තරමට ම ප්‍රති ප්‍රහාරය බිහිසුණු වන බව මෙරේස්යෙව් සහ ස්ට්‍රැච්කොව් වැනි පළපුරුදු සෙබළෝ දනිති.

සෝවියට් සංගමයේ වීරයෙක් වන ස්තෙපාන් ඉවුෂ්කින් දකුණු දිග පෙරමුණේ ජර්මන් භටයන් විසිපස් දෙනෙකු මැරූ බව දන්වෙන පුවත්පත් නිවේදනයක, යුද්ධය පටන් ගත් දා සිට ඒ වීර භටයා පැසිස්ට් ජර්මනුන් දෙසීය දෙනෙකු මරා ඇති බව ද සඳහන් විය. ග්වොස්දෙව්ගෙන් ලිපියක් ලැබිණි. ඔහු සටන් කරන පෙරමුණ ගැන සඳහන් නොකළ ද, තම පැරණි මහ සෙනෙවි රොත්මීස්ටර්ගේ සේනාවට ඇතුළු වීමට ඉඩ ලැබීම ගැන සතුටු විය. මේ ලියුම ලැබුණු විගස ඉඩ තිබුණොත් අන්යුටාට ලියුමක් ලියන ලෙස ඉල්ලා සිටියේ ය. ග්වොස්දෙව් ද ඇට ලියූ නමුත්, ඔහුගේ ලියුම් ඇට නොලැබී ඇතැයි ඔහු සිතන බව ද ඔහු සඳහන් කළේ ය.

මේ පුවත් දෙකින් වුව ද, දකුණු දිග මහා ප්‍රහාරයක් ඇරඹෙන ලකුණු පළපුරුදු යුද්ධ භටයෝ දුටහ. අලෙක්සේයි තම මිතුරාගේ ඉල්ලීම පරිදි අන්යූටාට ලිපියක් යැවී ය. මහාචාර්යතුමාගේ උපදෙස් පරිදි ග්වොස්දෙව් රැවුළක් වැවිය යුතු බව ඔහුට දන්වා යැවී ය. මහා ප්‍රහාරයකට සූදානම් වන ග්වොස්දෙව්ට අන් හැම භටයකුට මෙන් ම සතුට මුසු කැලඹුණු හැඟීමකි. ඔහුට රැවුළ වැවීම තබා අන්යුටාට ලියුමක් ලිවීමට පවා විවේකයක් නැති බව අලෙක්සේයි දනී.

හතළිස් දෙවැනි වාට්ටුවේ තුවාල කාරයෙක් වන මේජර පාවෙල් ඉවානොවිච් ස්ට්‍රැච්කොව්ට සෝවියට් සංගමයේ වීරයා යන උසස් නාමය ප්‍රදානය කළේ ය. එය එම වාට්ටුවේ රෝගීන්ට උත්සවයක් විය. එහෙත්, අහස් නියමු මේජර් ස්ට්‍රැච්කොව් සතුටු සිතින් පසු නොවී ය. මෙවැනි වේලාවක තමාගේ "කාලකණ්ණි දණහිස්" නිසා ඇඳට සීමා වී සිටීම ගැන ඔහු තමාට ම දොස් නඟා ගත්තේ ය.

රෝහල් කාර්යාලයේ හෙදියක් වන හීන්දෑරි මැදිවියේ කාන්තාවක් හතළිස් දෙවැනි වාට්ටුවට ඇතුළු වූවා ය.

"අලෙක්සේයි මෙරේස්යෙව්ට පයින් යන්න පුළුවනිද"යි ඈ ඇසුවා ය.

"එයාට දුවන්නත් පුළුවනි" යැයි ස්ට්‍රැච්කොව් මහ හඬින් කීවේ ය.

"මා මෙහි ආවෙ විහිළු කරන්ට නොවේ" යැයි දැඩි හඬකින් හෙදිය කීවා ය. "අලෙක්සේයි මෙරේස්යෙව් ජ්‍යෙෂ්ඨ ලයිතන් තැනට ටෙලිෆෝන් මගින් ගැහැනියක් කතා කරනව" යැයි ද ඈ පැවසුවා ය.

"තරුණියක්ද?" මෙසේ ප්‍රශ්න කළ මේජර් ස්ට්‍රැච්කොව් හෙදිය වෙත ආවේ ය.

"මම ඇගේ උප්පැන්න සහතිකය දැක්කෙ නැහැ" යැයි කී හෙදිය ආඩම්බර ලෙස වාට්ටුවෙන් පිට වූවා ය.

අලෙක්සේයි වහා ම ඇඳෙන් පැන තම සැරයටිය ද ගෙන හෙදියට වඩා වේගයෙන් ගමන් කොට පඩිපෙළ දිගේ පහත මාලයට බැස්සේ ය. ඔහු ඕල්යාගෙන් ලියුමක් බලාපොරොත්තුවෙන් සිටි නිසා සමහර විට ඈ ඔහුට ටෙලිෆෝන් කරතියි සිතුවේ ය. ස්ටාලින්ග්‍රාඩ් වැනි

නගරයකට ආසන්න පෙදෙසක සිට ඕල්යාට මොස්කව් නුවරට පැමිණිය නොහැකි ය. එසේ පැමිණිය ද, ඔහු මේ රෝහලේ සිටිතියි ඈ නොදන්නී ය. ඔහු ඇට ලියුවේ මොස්කව් අසල නගරයක කිසියම් වැදගත් වැඩක යෙදී සිටින බව ය.

එහෙත්, අලෙක්සේයි හාස්කම් ගැන විශ්වාස කළ වෙලාවකි මෙය. නොදැන ම ඔහු දුවන්නට පටන් ගත්තේ ය. ඉඳහිට ඔහු තම සැරයටියට වාරු විය. ඔහු දුවන විට ඔහුගේ කෘත්‍රිම පාද ක්‍රික්, ක්‍රික්, ක්‍රික් යන හඬ නැඟී ය.

ඔහු රිසිවරය අතට ගත් විට, තමා කිසිදිනෙක නොඇසූ ප්‍රීතිමත් ගැඹුරු ගෑනු කටහඬක් ඇසිණි. හතළිස් දෙවැනි වාට්ටුවේ ජ්‍යෙෂ්ඨ ලයිතාන් අලෙක්සේයි මෙරේස්යෙව් දැයි කාන්තාව ඇසුවා ය.

ඒ ප්‍රශ්නයේ යම් කිසි රළු ගතියක් නිසා නොසතුටට පත් මෙරේස්යෙව් ද මහ හඬින් පිළිතුරු දුන්නේ ය.

"ඔව්. මමයි!"

මොහොතක් නිහඬ වූ කාන්තාව ඔහුට කරදර කිරීම ගැන සමාව ඉල්ලා සිටියා ය.

"මේ කතා කරන්නේ අන්යූටා ග්‍රීබොවා, ඔහෙගෙ යාළුවා වන ග්වොස්දෙව් අඳුනන කෙනෙක්. ඔහේ මාව අඳුනන්නෙ නැහැ" යැයි කාන්තාව අලෙක්සේයිගේ පිළිතුර නිසා අමනාප වූ අසහනයකින් මෙන් පැවසුවා ය.

දෑතින් ම රිසීවරය අල්ලාගත් අලෙක්සේයි මහ හඬින් කතා කළේ ය.

"ඔය කතා කරන්නෙ අන්යූටා ද? මම ඔහෙව බොහොම හොඳට දන්නවා. ග්වොස්දෙව් මට ඔහෙ ගැන කියල තියෙනව...."

"එයා කොහෙද එයාට විපත්තියක්වත් වෙලාද? එදා එයා හිටි හැටියෙම පැනල ගියා. අහස් අනතුරු සංඥාව ඇසුණු හැටියෙම මම ගියා. මම එක ආරක්ෂක බිම්ගෙයක් භාරව කටයුතු කරනව. ඒ වෙලාවෙ එයා අතුරුදහන් වුණේ මන්ද කියල මට තේරෙන්නෙ නැහැ... අලෙක්සේයි දයාබර සහෝදරය... මා එහෙම කතා කරනවට සමාවෙන්න. මම ඔහෙ ගැනත් දන්නව. මම ග්‍රිගොරි ගැන කලබල වෙලා. කැලඹිලා. එයා එදා එහෙම අතුරුදන් වුණේ ඇයි..."

අලෙක්සේයිගේ හදවතට උණුසුමක් දැනිණි. ඔහු මිතුරා නිසා ප්‍රීති විය. සැබෑ තරුණියන් යුද්ධ අනතුරුවලට බිය වන්නේ නැහැ. එහෙනම් ග්‍රිගොරි ග්වොස්දෙව්ට අන්යුටා ආලය කරන්නා සේම ඕල්යා ගැන ද ඔහුට බලාපොරොත්තු තැබිය හැකි ය. ඕල්යා ඔහු මහත් වුවමනාවකින් සොයනු ඇත! ඔහු අන්යූටා ගැන කතා කරන අතර, එම අදහස් ශීඝ්‍ර වේගයෙන් ගලා එන්නට විය. ඔහු ඈට කතා කළේ ය.

"අන්යූටා හැම දෙයක් ම හොඳින් ඉටු වී තිබෙනවා. පොඩි අත්වැරැද්දක් අන්යූටා! ග්‍රිගොරි සනීපෙන්. යුද පෙරමුණේ සටන් කරනවා. තැපැල් පෙට්ටිය අංක 42531-වී. ඒ ලිපිනයට ලියුවම එයාට ලියුම් ලැබේවි. දැන් එයා යටි රැවුළක් වවනාවා. හරි අගේ ඇති යටි රැවුළ. හරියට... හරියට දේශප්‍රේමී ගරිල්ලා භටයකු වගේ. මිනිහටම කැපෙන රැවුළ. අනේ අම්මප ඇත්ත."

රැවුළ වැවීම ගැන අන්යූටා කැමැත්තක් නොදක්වූවා ය. නොවුවමනා දෙයක් හැටියට ඈ ඒ රැවුළ සැලකුවා ය. අන්යූටා අකැමැති නම් රැවුළ ග්‍රිගොරිට ඉතා හොඳින් ගැළපුණ ද ඔහු එය එකවර ම කපා දමනු ඇතැයි අලෙක්සේයි කී ය.

ටෙලිෆෝන් කතාව අවසන් වූයේ ඉඩක් ලැබුණු විගස අලෙක්සේයි අන්යූටාට ටෙලිෆෝන් කරන බවට පොරොන්දු වෙමිනි.

ටෙලිෆෝන් කරන්ට යද්දී දුවන්ට හැදූ නමුදු, එම තැත අසාර්ථක වූ බව ටෙලිෆෝන් කතාවෙන් පසු හැරී ආ අලෙක්සේයිට මතක් විය. ඔහු දුවන්ට හැදූ විට කෘත්‍රිම පාද තම කකුල්වල අගට තදින් හැප්පුණු නිසා තියුණු වේදනාවක් ඇති වී, එය සිරුර පුරා විහිද ගියේ ය. කමක් නැහැ, අද හෙට නොව, හෙට අනිද්දා නොව, ටික කලකින් ඔහු තම කෘත්‍රිම පාදවලින් දුවනු ඇත. හැම දෙයක් ම අගේට ඉටු වී ඇත. දිවීමට, අහස්යානා පැදවීමට, යුද්ධ කිරීමට තමා සමත් වන බවට සැක නැත. දිව්රුම් දීමට කැමැති අලෙක්සේයි මෙරේස්යෙව් නැවත යුද පෙරමුණට ගොස් පළමුවැනි අහස්යානා සටනට සහභාගි වී පළමුවැනි සතුරු යානය විනාශ කළ විගස තමාට සිදු වූ සියලු විපත් ඕල්යාට දන්වන බවට දිවුරුම් දුන්නේ ය.

# නෙවැනි කොටස

## 1

1942 ගිම්හානයේ දී සෝවියට් අහස්යානා හමුදාවේ නිල ඇඳුමකින් සැරසුණු පළල් උරහිස් සහිත ජ්‍යොෂ්ඨ ලයිතන් කෙනෙක්, කළුවර ලීයෙන් සෑදූ සැරයටියකුත් රැගෙන යුද්ධ රෝහලේ විශාල දොරටුවෙන් පිටවිය. ඔහු කැටුව හෙදියක් ගමන් කළා ය. පළමුවැනි ලෝක මහා යුද්ධ කාලයේ දී හෙදියන් පැලඳි රතු කුරුසිය සහිත හිස් වැස්මකින් සැරසී සිටි ඇගේ මුහුණ ශාන්ත ය. රෝහලේ දොර අසල ඔවුහු නැවතුණහ. අහස් නියමුවා තම හිස්වැසුම ගලවා නුහුරු ලෙස කඳ නවා ඇගේ අතක් ගෙන සිපගත්තේ ය. හෙදිය ඔහුගේ හිස දෑතින් බදාගෙන නළල සිප ගත්තා ය. පසු ව තම සැරයටියට තරමක් වාරුවී ඉක්මනින් පඩිපෙළ බැස ගිය අහස් නියමුවා ආපසු හැරී නොබලා ම රෝහලෙන් පිට විය. නොබෝ වේලාවක් හෙතෙම රෝහල අසල පදික වේදිකාව දිගේ ගමන් කළේ ය.

නිල්, කහ සහ දුඹුරු පැහැති පීජාමා ඇඳුමින් සැරසුණු රෝගීහු ජනේල අසල සිටගෙන රෝහලින් පිට වූ තම සගයා අමතමින් 'ආයුබෝවන්' 'සුබ ගමන්' යැයි කෑගැසූහ. සමහරු අත් වැනූහ. තවත් සමහරු සැරයටි වනමින් උපදෙස් දුන්හ. ඔහු ද ඔවුන් දෙස බලා අත් වැනී ය. තම කැලඹීම යටපත් කර ගැනීම පිණිස ඔහු ඉක්මනින් රෝහල් ගොඩනැඟිල්ලෙන් ඈත්ව ගියේ ය. ඍජු, නුහුරු, ඉක්මන් ගමනින් යන ඔහු තම සැරයටියට වාරු විය. කෘත්‍රිම පාදවලින් නැඟෙන හඬක් නිසා නොවේ නම්, මේ කඩිසර තරුණයාගේ දෙපා නැති බව කිසිවකුට සිතා ගැනීම පවා අපහසු ය.

රෝහලේ ප්‍රතිකාරවලින් පසු ව අලෙක්සේයි මෙරේස්යෙව් මොස්කව් අසල පිහිටි සෝවියට් අහස්යානා හමුදාවේ සුඛාගාරයට යැවී ය. මේජර් ස්ට්රුච්කොව් ද එම සුඛාගාරයට යැවී ය. සුඛාගාරයේ මෝටර් රථයක් රෝහලට

යැවුව ද, අලෙක්සේයි මොස්කව් නගරයේ තම නෑයන් ඉන්නා බව පවසමින් මෝටර් රථයෙන් යාම ප්‍රතික්ෂේප කළේ ය. තම ඇඳුම් පෙට්ටිය මේජර් ස්ට්රුච්කොව් අත යැවූ අලෙක්සේයි හවස විදුලි දුම්රියෙන් එන බව පවසමින් රෝහලෙන් පිට විය.

මොස්කව් නගරයේ අලෙක්සේයිගේ නෑයෝ නොවූහ. මොස්කව් නගරය නැරඹීමට ද තමා ගැන නොසිතන නගර ජනතාව අතරට වැද ස්වාධීන ව ඇවිදීමට ද ඔහුට වුවමනා විය. මොස්කව් ගඟ අද්දර ගල් බැම්මෙන් සැදූ වැට දිගේ ඔහු ගමන් කළේ ය. ගිම්හාන හිරු රැස් නිසා ගඟේ ජලය රිදී කඳක් මෙන් දිලිසිණි. සුවදායක ගිම්හාන වාතය ආශ්වාස කළ ඔහු ප්‍රීතියට පත් විය.

අවට හැම දෙයක් ම සුන්දර ය.

ඔහු දුටු හැම ගැහැනියක් ම ලස්සන ය. තුරුලතා හරිත වර්ණයෙන් බැබළිණි. පිරිසුදු ගිම්හාන වාතය නිසා ඔහුගේ හිස ක්ලාන්ත වූවාක් මෙනි. ඔහු දකින හැම දෙයක් ම ඈත තිබුණ ද, ඒවා ළඟ තිබෙන සැටියකි ඔහුට දැනුණේ. ඔහු මෙතෙක් පින්තූරවලින් පමණක් දුටු ක්‍රෙම්ලින් තාප්පය, ඝණ්ටාරය සහිත මහා ඉවාන්ගේ කුලුන, ගඟ හරහා ඇති මහා පාලම ආදී සියල්ල ම ඔහු අත ළඟ මෙනි.

මොස්කව් නගරය කිසිදිනෙක නොදුටු අලෙක්සේයි එහි නොයෙක් අංශ දැක ඇත්තේ පත්‍රවල, සඟරාවල පින්තූර හා වාර්තා මගිනි. මැදියම් රෑ දොළහට මිහිරි ගී හඬක් පිට කරමින් වේලාව කියන ක්‍රෙම්ලින් ඔරලෝසුව දුටු කෙනෙකුගේ විස්තරය ද උත්සව පෙළපාළි පවත්වන දවස්වල දී මොස්කව් නගරයේ ගුවන්විදුලි වාර්තා ද අසා ඇති අලෙක්සේයි ඉදිරිපිට දැන් සැබැවින් ම මොස්කව් නගරය ය.

මේ මොස්කව් නගරය ය.!

හාරමසක් තිස්සේ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි අලෙක්සේයි, පළමුවරට නගරය දැකීම නිසා මහත් සේ සතුටට පත් විය. නගරය යුද්ධයට සැරසී තිබෙන සැටි දැකීමට අපොහොසත් වූ හෙතෙම නගරාරක්ෂක පවුරු ආදිය නොදුටුවේ ය. අහස් නියමුවන් හඳුන්වන පරිදි 'අංක එකේ සූදානම' හෙවත් ඕනෑ ම මොහොතක දී සතුරාට පහර දීමට මොස්කව් නගරය සූදානමින් සිටියේ ය. මහ

පාර හරහා යුද කපොලු ය. පොඩි දරුවකුගේ සෙල්ලම් මේසයක් මත ඇති සනකවලට සමාන කොන්ක්‍රීට් සිමෙන්තිවලින් සෑදූ විශාල සනක පාර හරහා දමා ඇත. පාලම් දෙපස මැෂින් වෙඩි කපොලු ය. රතු චතුරස්‍රය මත ගෙවල් තණ පිට්ටනි හා පටු මාර්ග විවිධ පාටවලින් ඇඳලා ය. ගෝර්කි වීදියේ විශාල කඩසාප්පුවල ජනේල ආරක්ෂක වැලිමිටිවලින් වසා ඇත. පටු මාර්ගවල ද විවිධ වර්ගවලට අයත් ආරක්ෂක උපකරණ හා කපොලු ය. මොස්කව් නගරය නොදුටු සෙබළෙක් යුද පෙරමුණේ සිට පැමිණියහොත් අගනුවරේ වෙනස වටහා නොගනු ඇත.

විඩාපත් අලෙක්සේයි සැරයටියට වාරු වෙමින් ගෝර්කි වීදිය දිගේ උඩහට යන්නේ, සතුරු බෝම්බ නිසා විනාශ වී ගිය තැන් සෙවීමට වට පිට බැලී ය. සතුරු බෝම්බ පහරට ලක් වූ ගොඩනැඟිලි ගෙවල් කිසිවක් නොදුටු ඔහු පුදුම විය. බටහිර යුද පෙරමුණේ අහස් තොටුපළක සේවය කළ අලෙක්සේයි හැමදා ම රෑට නැගෙනහිර දෙස බලා යන පැසිස්ට් ජර්මන් අහස්යානා හමුදා දක ඇත. එක සතුරු අහස් හමුදාවක හඬ නෑසෙත් ම, තවත් සතුරු අහස්යානා කණ්ඩායමක් හඬ නඟමින් නැගෙනහිරට පියාඹා යයි. සමහර දවස්වල සතුරු අහස්යානා වැල නොකැඩී සෝවියට් දේශය තුළට පියාඹයි. පැසිස්ට් අහස්යානා මොස්කව් නගරයට යන බව දත් සෝවියට් අහස් නියමුවෝ අගනුවර නියම අපායක් බවට පත් ව ඇතැයි සිතූහ.

දැන් යුධාවතීරණ වී ඇති මොස්කව් නගරයේ බෝම්බ පහරවල් නිසා විනාශ වී ගිය තැන් සොයමින් අලෙක්සේයි ගමන් කළ ද, ඔහුට එවැනි තැන් හමු නොවී ය. තාර පාරවල් පලුදු රහිත විය. ගොඩනැඟිලි එක පෙළට ඇත. ජනේලවල වීදුරු මත කඩදාසි තීරු අලවා තිබුණ ද බිඳුණු ජනේලයක් දකින්ට ලැබුණේ ද කලාතුරකිනි. යුද පෙරමුණ ඈත නොවන බව කියන සලකුණු පෙනිණි. නගර වැසියන්ගෙන් අඩකට වඩා යුද භටයන් ය. දූලි සහිත බූට්ස් සපත්තු ඇඳගත් ඔවුන්ගේ මුහුණුවල විඩාපත් බවක් පෙනේ. දහදියෙන් තෙමී ඇති ඔවුන්ගේ උරහිස්වල සෙබළ මලු ය. විශාල ට්‍රක් රථ කීපයක් පෙළ ගැසී එන සැටි පෙනිණි. දීප්තිමත් හිරු රැස් නිසා දූලිවලින් වැසී

ඇති ඒ රථ දුඹුරු පැහැති ය. රියැදුරු ආසන ඉදිරිපිට ඇති වීදුරු බිඳිලා ය. ඒවායේ වාඩි වී සිටින සෙබළ පිරිස් කුතුහලයෙන් යුතු ව වටපිට බලති. මේ රථ පෙළ නගර ප්‍රවාහනය ට්‍රොලිබස්, ට්‍රෑම්, මඟීන් ගෙන යන බස් පසුකොට වේගයෙන් ගියේ යුද පෙරමුණ වැඩි ඈත නොවන බව හඟවමිනි.

මහා කවි පුෂ්කින් ස්මාරකය සහිත චතුරස්‍රයට ඔහු ළඟා වූයේ මහත් අමාරුවෙනි. කීපවරක් ම ඔහු සැරයටියට වාරුවෙමින් විඩා හැරියේ අසල කඩ සාප්පුවල විසිතුරු භාණ්ඩ පරීක්ෂා කරන්නාක් මෙනි. මහත් සතුටකින් අලෙක්සේයි බංකුවක් මත වාඩි වී ගිමන් හැරියේ ය. ඔහු වාඩි නොවී ය. ගිම්හාන හිරුරැස්වලින් උණුසුම් වී ඇති බංකුව මත ඔහුට හිඳ ගැනිණි. වේදනාවෙන් විඩාපත් වී ඇති තම දෙපා දිගහරිමින් අලෙක්සේයි සතුටු සිතින් වටපිට බැලී ය. වලාකුළු සහිත පිරිසිදු අහස නිල් පැහැති ය. හිරු රැස් දීප්තිමත් ය. සිසිල් සුළඟක් හමා ගියෙන්, ලීපා ගස්වල මිහිරි සුවඳ චතුරස්‍රය පුරා පැතිරිණි. ට්‍රෑම් රථ ටින්, ටින්, ටින් හඬ නඟමින් දුව ගියේ ය. පුෂ්කින් ස්මාරකය අසල රැස් වූ සුදුමැලි, කෙට්ටු ළමයි හඬනඟා සිනාසෙමින් වැලි කෙළියෙහි යෙදුණහ.

දෑස් වසාගෙන හිරු දෙසට මුහුණ හැර වූ අලෙක්සේයි මඳ සිනා පෑවේ ය.

## 2

විදුලි දුම්රිය හඬ නඟමින් මොස්කව් නගරයෙන් පිට විය. එකටෙක ගැටෙන ගීතමය හඬක් එහි රෝදවලින් පිටවූවාක් මෙනි. අලෙක්සේයි ඉදිරිපිට වාඩි වී සිටියේ මක්සිම් ගෝර්කි තොප්පියක් දමා ගෙන රන් වළලු සහිත 'පෙන්ස්-නේ' උපැස් යුගලක් ලා ගත් මහල්ලෙකි. ඔහුගේ උපැස් යුගල කළු පාට සිහින් පටියකින් බැඳ තිබිණි. පුවත්පතකින් එතූ රිටිකරුවක්, උදැල්ලක් හා ඉස්කෝප්පයක් ඔහුගේ දණහිස් මත තිබිණි. හැම දෙනෙකු මෙන් ම, මහල්ලා ද යුද්ධය ගැන නිතර සිතී ය.

අලෙක්සේයි මෙරෙස්යෙව් ඉදිරිපිට මහත් වැදගත් ලෙස තම ගොරහැඩි අතක් වැනූ මහල්ලා, ඔහුගේ කනට කොඳුරා මෙසේ පැවසී යඃ

"මම යුද්ධ සේවයට නොබැඳුණාට අපේ උපාය උපක්‍රමය ගැන නොදන්නවයි කියල හිතන්න එපා. මට එය හොඳට අවබෝධ වෙනව. හතුරාව වොල්ගා පෙදෙස දක්වා ඇදගෙන ඔහුගේ ප්‍රවාහන හා පණිවුඩ සම්බන්ධකම් දිග්ගස්සවා ඔහුගේ ගුහාවෙන් ඔහු එළියට ඇද, ඉන් පසු ඔහුට දකුණින්, බටහිරින්, උතුරින් පහර දී විනාශ කිරීම තමා අපේ සංග්‍රාම උපාය. ඒක බොහොම හොඳ සැලැස්මක්. අපට විරුද්ධ හිට්ලර් විතරක් නෙවෙයි නෙව. මුළු යුරෝපයම අපට විරුද්ධව හිට්ලර් යුද්ධයට යොදවනව. රටවල් හයකට විරුද්ධ අපි තනිවම සටන් කරනව. ඔව්, තනිවම. අපේ රටේ විශාලත්වය ප්‍රයෝජනයට ගෙන හෝ සතුරා දුර්වල කරන්ට ඕනෑ. කළ හැකි එකම දේ එය තමා. අපේ මිතුරෝ නිහඬව ඉන්නවා. එහෙම නේද? ඔහෙ කොහොමද හිතන්නෙ?"

"මා හිතන්නෙ තමුසෙගෙ කතාවෙ කිසිම තේරුමක් නැහැ කියල. ලොකු උන්නැහෙ පහර වැළැක්විමට රට තුළ ඉඩ දෙනවා කියන කතාව වැරැදියි. අපේ රට අපට බොහොම වැදගත්" යැයි අලෙක්සේයි නොසතුටු ලීලාවකින් පැවසී ය.

මහල්ලා අලෙක්සේයි වෙත වඩාත් ළං වෙමින් මිමිනුවේ ය. ඔහු වෙතින් දුම්කොළ හා බාර්ලි කෝපි සුවඳක් නික්මිණි.

"...තමුසෙ යුද්ධ නිලධාරියෙක්. අවුරුද්දකට වැඩි කාලයක් තිස්සේ අපි තනිවම යුද්ධ කරනව. ඒක සාධාරණ ද? අපේ මිතුරෝ කොහිද? දෙවැනි පෙරමුණ කෝ? ඔහේ හිතනවද මේක හරි වැඩක් කියලා. ඔන්න කල්පනා කරල බලනව, කිසිම අන්තරාවක් ගැන සැක නොකරන මිනිහෙක් දාඩිය මහන්සියෙන් වැඩ කරමින් ඉන්නකොට ඒ මිනිහට පල් හොරු පහර දෙනව. ඒ වුණාට ඒ මිනිහ බය වෙන්නෙ නැහැ. පල්හොරුන්ට පෙරළා පහර දෙනවා. පල්හොරු එයාට බරපතළ තුවාල කළත්, එයා අතට අසුවන හැම අවියකින් ම ඔවුන්ට පහර දෙනව. පල්හොරු මේ මිනිහට පහර දිමට බොහෝ කලක් තිස්සේ බලාගෙන හිටිය. අවි ආයුධ ගත් පල්හොරු ඒ මිනිහට පහර දෙන විට අසල්වැසියෝ ගෙවල්වලට වී බලාගෙන කයිවාරු ගහනවා. 'හා! හා! හරි හපනා. ගහපිය! ඇනපිය!' කියලා

ඒ මිනිහට කටින් උදව් කරනව වෙනුවට ඒ ගොල්ල ලී කෝටු, ගල් මුල් දෙනව 'ගහපිය! මේ කෝටුවෙන් ඇනපිය! මේ ගලෙන් ගහපිය!' කියල ඒ අය කියනව. අපේ මිතුරො හැසිරෙන්නෙ ඔහොම තමා... කයිවාරුකාරයො..."

අලෙක්සේයි මෙරේස්යෙව් මහත් වුවමනාවෙන් මහල්ලා දෙස බැලී ය. මේ වන විට දුම්රිය මැදිරියේ බොහෝ දෙනෙක් මහල්ලා දෙස බලන්නට වූහ.

"හරි! එයා කියන කතාව හරි. අපි තනිවම සටන් කරන්නෙ. දෙවෙනි පෙරමුණ කෝ?" යැයි කීප දෙනෙක් ම ඇසූහ.

"කමක් නැහැ, අපි කොහොම හරි සටන් කරල සතුරාව පරාජය කරමු. යුද්දෙ අවසාන වී ගෙන එන කොට දෙවෙනි පෙරමුණ පටන් ගනීවි."

දුම්රිය විනාඩි කීපයකට නැවැත්වීය. පිජාමා ඇඳුමින් සැරසුණු රෝගීහු කීප දෙනෙක් දුම්රියට ඇතුළු වූහ. කරුවල ආධාරයෙන් සමහරු ගමන් කළ අතර, සමහරු සැරයටි වාරුවෙන් ගමන් කළහ. ඔවුන් හැම කෙනෙකු අත සූරිය මල් හෝ පළු වර්ග සහිත කඩදාසි බෑග් හෝ තිබිණි. නුදුරු සුබාගාරයකින් පැමිණි රෝගීන්ය ඔවුන්. තම අසුනෙන් නැඟී සිටි මහල්ලා දුම්රියට ඇතුළු වූ තරුණ රෝගියකුට තම අසුන දෙමින් මෙසේ කී යː

"පුතේ මෙන්න මෙතනින් වාඩි වෙන්න. මා ගැන හිතන්ට එපා. මම ඉක්මනින් බහිනවා."

මහල්ලා තම උදලු සහ අනිකුත් උපකරණ රැගෙන දොර ළඟට ගියේ ය. ගෙවිලියෝ තෙරපී වාඩිවෙමින් තුවාලකාරයකුට වාඩිවීමට ඉඩ දුන්හ. ගැහැනියක් චෝදනා මුඛයෙන් කතා කරන හැටි අලෙක්සේයිට ඇසිණි.

"එයාට ලැජ්ජා නැතිද? තුවාලකාරයෙක් එයා ළඟ හිටගෙන ඉන්නව එයා මහ ලොකුවට වාඩි වෙලා. අසරණ තුවාලකාරයා අමාරුවෙන් ඉන්න හැටි පවා පෙනෙන්නෙ නැතුව වගේ. හරියට වෙඩි උණ්ඩ එයාට වැදෙන්නෙ නැතුව වගේ. ඒ මදිවට එයා අහස් හමුදාවෙ නිලධාරියෙක්!"

ගැහැනියගේ අවලාදය නිසා අලෙක්සේයි කෝප වූයේ ඔහුගේ නාස්පුඩු නැටවිණි. එහෙත්, මොහොතකින් ඔහු

තම හැඟීම් යටපත් කර ගනිමින් හුන් තැනින් නැඟිට සිට ගත්තේ ය.

"වාඩිවෙන්න සහෝදරය!" යැයි ඔහු කීය.

තුවාලකාර සෙබළා අන්දමන්ද විය. "ජ්‍යෙෂ්ඨ ලයිතන් සහෝදරයා කමක් නැහැ. මම හිටගෙන ඉන්නම්. ඉක්මනට අපි බහිනවා"

"ඉඳගන්න, ඉඳගන්න" යැයි අලෙක්සේයි ඔහුට කීවේ උද්ගත වී ඇති තත්ත්වයේ හාස්‍ය රසය අවබෝධ කර ගනිමිනි...

දුම්රිය නිලධාරි තැන ඊළඟ නැවතුම්පොළේ නම හඬ නඟා කීයෙන්, අලෙක්සේයි දොර ළඟට ගියේ ය. තමා සමඟ යුද්ධය ගැන කතා කළ මහල්ලා අලෙක්සේයි දෙස බලා ඉඟිමරා පහත් හඬින් මෙසේ ඇසී යː

"කොහොමද ඒ ගොල්ල දෙවෙනි පෙරමුණ පටන් ගනීවිද?"

"පටන් නොගත්තොත් අපි තනිවම සටන් කරනව" යැයි අලෙක්සේයි පවසා දුම්රියෙන් පිටතට බැස්සෙ ය.

මිට පෙර සුඛාගාරයට යන මඟ ඔහුට විස්තර කර තිබුණෙන් විනාඩි දහයක ගමනින් පසු අලෙක්සේයි වැවක් අසල පිහිටි සුඛාගාරයට පැමිණියේ ය.

සාම කාලයේ දී අහස්යානා හමුදා නිලධාරීහු තම බිරියන් සමඟ ද, සමහර විට දූ දරුවන් සමඟ ද මෙහි පැමිණ විවේක ගත්හ. යුද්ධය පටන් ගත් පසු තුවාල ලැබූ නියමුවන් රෝහල්වල ප්‍රතිකාර ලබා සම්පූර්ණ සුවය ලැබීමට සුඛාගාරයට යැවී ය. අලෙක්සේයි සුඛාගාරයට පැමිණියේ පළල් තාර පාර ඔස්සේ නොව, දුම්රිය නැවැතුම්පොළේ සිට සුඛාගාරය දක්වා ඇති අඩි පාරක් ඔස්සේ ය. සුඛාගාරයේ පෝටිකෝව අසල නවත්වා ඇති මඟීන්ගෙන් පිරි බස්රථ දෙකක් වෙත පැමිණි අලෙක්සේයි කිසිවෙක් නොදුටහ.

සුවය ලැබූ අහස් නියමුවන් යුද පෙරමුණ බලා පිටත්ව යද්දී ඔවුන්ට ආයුබෝවන් කීමට පැමිණි අය කියන කතාවලට ඔහු සවන් දුන්නේ ය. යුද පෙරමුණට යන නියමුවෝ මහත් සතුටකින් උන්හ. හැම වලාකුළකම

මාරයා සැඟවී ඇති බව දූන දූනත් ඔවුහු ප්‍රීති වූහ. සාම කාලයක අහස් තොටුපළක සේවයට යන නියමුවන් මෙන් ඔවුහු ප්‍රීතියෙන් කැලඹුණහ. ඔවුන්ට ආයුබෝවන් කියන්නට පැමිණි අය තුළ එවැනි සතුටක් දකින්නට නොතිබිණි. එය අවබෝධ කර ගත හැකි ය. දකුණු යුද පෙරමුණේ මහා සටන ඇරඹීමෙන් පසු එම සටනට සහභාගි වීමට අලෙක්සේයි තුළ ද පැන නැඟී ඇති ආසාව ඉමහත් ය. යුද පෙරමුණේ තත්ත්වය මේ මහා සටන නිසා වඩාත් උග්‍ර විය. යුද්ධ කවයන්වල 'ස්ටාලින්ග්‍රාඩ්' යන නම ශාන්ත හා ප්‍රවේසම් සහිත ලෙස කියන විට, රෝහලේ වැඩක් නැති ව සිටි භටයන් තුළ එහි ගොස් සටන් කිරීමේ ආසාව ඉමහත් ලෙස වැඩිණි.

අලුත් පන්නයේ බස්රථවල වීදුරු ජනේලවලින් නිරෝගීමත් මුහුණු මඳ සිනා පෑහ. පිජාමා ඇඳුමකින් සැරසුණු ආමීනියානු ජාතිකයෙක් කොර ගසමින් හැම බස් රථයකට ම ගොඩ වෙමින් තම සැරයටිය වනමින් යුද පෙරමුණ බලා යන්නවුන්ට සුබ පතයි. සුබාගාරයේ විකට ධුරයට තමා ම පත් වී ඇති මොහු තට්ටයෙකි. ඔහුගේ කතාවෙන් ඔහු විකටයකු බව හැඟිණි.

"පේද්‍යා! ජර්මන්කාරයට අහසේ දී මගේ සුබ පැතුම් බාරදීපන්. සඳරුස් නෑමට නුඹට ඉඩ නොදුන්නාට නුඹ උන්ගෙන් පළිගනින්. පේද්‍යා සෝවියට් ශූරයන්ට හඳරුස් නෑමට ඉඩ නොදීම අසභ්‍ය ක්‍රියාවක් බව ඔවුන්ට ඔප්පු කරපන් පේද්‍යා"

"පේද්‍යා! ඉක්මනින් එවපන් නුඹේ ලිපිනය. සීනා ඇගේ හදවත රෙජිස්ටර් තැපෑලෙන් නුඹට එවාවි..."

බස් රථ දූලි නංවමින් වංගුවෙන් හැරී නොපෙනී ගිය පසු සුබාගාරයේ තුවාලකාරයෝ උද්‍යානය දෙසට සෙමින් සෙමින් ගියහ. සුබාගාර කාර්යාලයට මෙරේස්යෙව් කැඳවා ගෙන ගියේ කොර ගසන ආමීනියානු අහස් නියමුවා ය. ළං වී බලන විට ඔහුගේ මුහුණ පියකරු ය. දෙනෙත් ලස්සන ය, ලොකු ය. ඔහුගේ බැල්ම කනගාටුදායක ය. තමා සඳරුස් නාන කමිටුවේ සභාපති බව ආමීනියානුවා කීවේ ය. ඕනෑ ම තුවාලයක් සඳරුස් නෑම නිසා සුව වන බව කී ඔහු සඳරුස් නෑමේදී විනය ගරුක විය යුතු බවත්, එයට වුවමනා සියලු කටයුතු තමා සංවිධානය කරන

බවත් පැවසී ය. ඔහු විහිළු කළේ ආයාසයකින් තොර ව ය. එහෙත්, බැල්ම බැරෑරුම් ය. කතා කරන අතර ඔහු තම සගයා දෙස විමර්ශනාත්මක බැල්මක් හෙළී ය.

පිළිගැනීමේ කාමරයේ දී අලෙක්සේයි ඉදිරිපිටට ආ හෙදිය සුදු කබායක් හැඳ සිටියා ය. ඇගේ කෙස්වැටිය තද රතු පාට ය. හිස මත ගිනි උදුනක් ඇත්තාක් මෙනි.

"මෙරේස්යෙව් දැ?"යි ඈ බැරෑරුම් ලෙස ප්‍රශ්න කළේ කියවමින් සිටි පොත පසෙක තබමිනි. "මෙරේස්යෙව් අලෙක්සේයි පෙට්‍රෝවිච් ද"යි ඇසූ ඈ නියමුවා දෙස විචාරාත්මක බැල්මක් හෙළුවා ය. "මා රවටන්ට එපා. මෙරේස්යෙව් අහස් හමුදාවේ ජ්‍යෙෂ්ඨ ලයිතන්, රෝහලින් පිට වූ දෙපා නැති කෙනෙක් බව මෙහෙ ලියලා තියෙනව! ඒ වුණාට තමුසෙ..."

හැම රක්ත කේශියකගේ මෙන් ම, ඇගේ මුහුණ ද වටකුරු බව අලෙක්සේයි දිටී ය. සුදු පැහැති ඇගේ මුහුණ රත් පැහැති හිසකේ ගොඩකින් වැසිලා ය. සිනිඳු හම රත් පැහැති ය. ඈ තම විශාල, වටකුරු දඟකාරී ඇස්වලින් ඔහු දෙස බලන්නී, විස්මය පළ කළා ය.

"කොහොම වුණත්, මම අලෙක්සේයි මෙරේස්යෙව්. මෙන්න මගේ බලපත්‍රය... ඔහෙගෙ නම ල්යොලා නේද?"

"නැහැ මගේ නම සීනා" මෙසේ කී ඈ සැක සහිත ව අලෙක්සේයිගේ පා දෙස බැලුවා ය. "ඔහෙට ඔයතරම් හොඳ කෘත්‍රිම කකුල් ලැබුණද?"

"ඔව්. පේද්යාගේ ආදරය දිනා ගත්තු සීනා ඔහෙද?"යි ඇසී ය.

"මේජර් බූර්නස්යාන් ඔහෙට දනටමත් බොරු ආරංචි කියලද? මම ඒ නිලධාරියා එක්ක හැබෑටම තරහයි. එයා හැම දෙනාටම විහිළු කරනව. හැම දෙනාවම සිනාවට ලක් කරනව. මම පේද්යාට නටන්ට ඉගැන්නුව. ඕකත් හිනාවෙන්න වැඩක්ද?"

"දැන් ඔය සහෝදරිය මටත් නටන හැටි උගන්වන්න. කැමතිද? බූර්නස්යාන් කිව්වා සඳරැස් නාන කම්ටුවට ඇතුළුවීමට බලපත්‍රයක් දෙනවයි කියල"

තරුණිය වඩාත් විස්මය පළ කරමින් අලෙක්සේයි දෙස බලන්නී මෙසේ කීවා යඃ

"ඒ කොහොමද නටන්නෙ? කකුල් නැතිව නටන්න පුළුවන්ද? අනේ යන්න.... ඔහෙත් එනව මට සිනහවෙන්න"

මේ අතර කාමරයකින් එළියට පැමිණි මේජර් ස්ට්රුච්කොව් තම සගයා වැලඳගත්තේ ය.

"සීනා අපි කතා කරගත්තු විදිහට ජොෂ්ඨ ලයිතන්ව මගේ කාමරයට එවන්න" යැයි ස්ට්රුච්කොව් තරුණියට කීවේ ය.

එක ම රෝහලක බොහෝ කාලයක් එකට ප්‍රතිකාර ලැබූ අය හමු වූවිට සහෝදරවරුන් මෙන් හැසිරෙති. ස්ට්රුච්කොව් දුටු අලෙක්සේයි සතුටු වුණේ අවුරුදු කීපයක් හමු නොවූවාක් මෙනි. තම ඇඳුම් බෑගය කාමරයට ගෙන්වා ගත් ස්ට්රුච්කොව් සුබාගාරයේ හැම දෙනෙකුම හඳුනා ගත්තේ ය. බොහෝ අය ස්ට්රුච්කොව් හඳුනා ගත්හ.

රාත්‍රී ආහාරයෙන් පසු ඉක්මනින් ම ඇඳ මත වැතිර ගත් අලෙක්සේයි සිසිල් පොරෝනයන්ගේ මුදු පහස ලබමින් නිදා ගත්තේ ය.

එදා රෑ ඔහුට අරුම පුදුම බියජනක සිහින පෙනිණි. නිල්වන් හිම, සඳ, මහ වනය ඔහු වටා දැලක් මෙන් විහිද ඇත. දැල ඉරාගෙන පැන යාමට ඔහු තැත් කළ ද, හිම ඔහුගේ පාද දැඩිකොට අල්ලාගෙන ඇත. තමා නොපැහැදිලි අනතුරකට මුහුණ පා ඇති බව වටහාගත් අලෙක්සේයි දැඩි ලෙස සටන් කළේ ය. හිම ගොඩක එරුණු දෙපා ගලවා ගැනීමට තරම් ශක්තියක් ඔහුට නොමැති විය. දැන් ඔහු ඉදිරියේ වනයක් නොව, අහස් තොටුපළක්. අහස් නියමු ආසනයේ වාඩි වී සිටියේ මිකැනික් ශිල්පි යූරා ය. අහස්යානය ද අරුම පුදුම පියාපත් රහිත යානයකි. යූරා අලෙක්සේයිට අතක් වනා සිනා සී යානය පැදවීය. කුඩා බිළිඳකු වඩා ගන්නාක් මෙන් අලෙක්සේයි දෑතට ගත් මිහයිල් සීයා ඔහු නළවමින් මෙසේ කී යː "කමක් නැහැ, උණුවතුර නාමු! එතකොට හොඳ සනීපයක් දැනේවි. එහෙම නේ ද?" උණුවතුර නාවනු වෙනුවට සීයා ඔහු හිම ගොඩකට ඇද දැම්මේ ය. අලෙක්සේයි නැඟිටීමට උත්සාහ කළ ද, සීයා ඔහු වැරෙන් අල්ලා ගත්තේ ය. හිම ගොඩෙහි එරුණු ඔහුට පා එසවීමට පවා බැරි විය. නැත, එය හිම ගොඩක් නොව, වලසෙකි. වලසා අලෙක්සේයිගේ පපුව

මතට නැඟ ඔහු ගෙල මිරිකුවේ ය. අහස් නියමුවන් රැගත් බස් රථ කීපයක් ඔහු අසලින් ගිය ද, ඔවුහු ඔහු නොදුටහ. නියමුවන් වෙත යාමට, ඔවුන්ට අඬ ගැසීමට සංඥා කිරීමට ඔහුට වුවමනා වුව ද, කළ නොහැකි විය. කට ඇර කෑගැසුව ද හඬ පිට නොවේ. තමාගේ බෙල්ල වලස් ග්‍රහනයට හසු ව සිහි නැති වන සැටිත්, හදවත නවතින හැටිත් ඔහුට දැනිණි. ඔහු අවසන් වරට වෑයමක් දැරී ය...

කැලඹුණු ගතියකින් යුතු ව අලෙක්සේයි අවදි විය. නිහඬතාව රජ කළේ ය. ස්ට්‍රැච්කොව් සෙමින් ගොරවමින් නිදයි. අවතාරයක් වැනි සඳ රැස් කාමරයට වැටී ඇත. බියජනක දවස් නැවත ඔහු වෙත පැමිණියේ ඇයි? තමා සිහි නොකළ ඒ දවස් නැවත තමා වෙත පැමිණ ඇත. නොනිදා සිටින විට ඒ ගැන සිහි කළ ද, එය සුරඟනා කතාවකට සමාන විය. සිසිල් සුවදායක සුළං පහරක් වනය පිසගෙන, සඳ එළියෙන් පිරි කාමරය තුළට වැදිණි. වරෙක පහත් හඬක් ද තවත් වරෙක උස් හඬක් ද ඇසිණි.

ඇඳ මත වාඩි වූ අලෙක්සේයි පයින් තුරුවල ගුප්තමය හඬට සවන් දුන්නේ ය. අප්‍රියජනක සිහින සිතින් එළවා දැමූ අලෙක්සේයි නැවත ප්‍රිය ජනක දේ ගැන සිතන්නට විය. සුබාගාරයේ දින විසිඅටක් නැවතී ප්‍රතිකාර ගත යුතු ය. මේ දින කීපය තුළ දී ඔහු එක්කෝ අහස්යානා පැදවීමට, සටන් කිරීමට, ජීවත් වීමට තීරණය කර ගත යුතු ය. නැතිනම් අසරණයකු ලෙස ඔහුට අනුකම්පා කොට වාඩි වීමට ආසනයක් ලබා ගැනීමේ තත්ත්වය දක්වා ඔහු පහත වැටෙනු ඇත. නියම මිනිසෙකු වීමේ සටනින් දිනා ගැනීමට ඇති කාලය දින විසි අටක් පමණි.

කාමරය තුළට පිවිසී ඇති සඳරැස් අවතාරයක් වැනි ය. ස්ට්‍රැච්කොව් ගොරවමින් සැප සේ නිදයි. අලෙක්සේයි ඇඳ මත වාඩි වී ශාරීරික ව්‍යායාම් කිරීමේ සැලැස්මක් සිතින් ඇන්දේ ය. උදේ හවස ව්‍යායාම් කිරීම, ඇවිදීම, දිවීම, කකුල්වල මස් පිඬු ශක්තිමත් කිරීම සඳහා විශේෂ ව්‍යායාම් කිරීම. මේ හැමට ම වඩා ඔහු සිත් ගත්තේ තම දෙපා ශක්තිමත් කිරීමේ ඉතා ම හොඳ ක්‍රමයක් වන නැටුම් ඉගෙනීම ගැන ය. සීනා සමඟ කතා කරන විට ඔහුට එම අදහස ඇති විය.

ඔහු ඇගෙන් නැටුම් ඉගෙන ගැනීමට ඉටා ගත්තේ ය.

## 3

අගෝස්තු මාසයේ නිසල දහවල් කාලයක හැම දෙයක් ම හිරු රැස් නිසා රත් වී දිලිසෙමින් තිබිණි. හේමන්තය වැඩි ඈතක නොවේ යන පාළු හැඟීම පැතිරී යන සලකුණු ඇති ඒ දවස කුඩා බැද්දක් අතරින් ගලා ගිය දිය පාරක් අසල අහස් නියමුවෝ කීප දෙනෙක් හිරු රැස් නාමින් සිටියහ.

සූර්ය තාපය නිසා විඩාපත් ඔවුහු නිහඬ ව වැතිරගත් වන ම සිටියහ. විඩාපත් නොවන බුර්නස්යාන් පවා නිහඬ ව, සෙමෙන් සුවය ලබන තම කකුලේ තුවාලය මත රත් වූ වැලි වක් කරමින් සිටියේ ය. ඔවුන් වැතිර සිටින තැන ඝන ව වැඩුණු හේසල් පඳුරු නිසා කිසිවකුට නොපෙනේ. එහෙත්, පඳුරුවලට මුවා වූ ඔවුන්ට දියපාර උඩහ ඇති අඩිපාර සහිත තණබිස්ස පෙනේ. තම තුවාලයට සාත්තු කරමින් සිටි බුර්නස්යාන් හිස ඔසවා බලන්නේ පුදුම සහගත දර්ශනයක් දිටී ය.

ඊයේ සුබාගාරයට පැමිණි අහස් නියමුවා පිජාමා කලිසමකින් හා සපත්තුවලින් සැරසී ගං ඉවුරට ආවේ ය. වට පිට බලා කිසිවකු නැති බව දැනගත් ඔහු වැළමිටිවලින් දෙපැත්ත තද කරගනිමින් උඩ පනිමින් දුවන්නට විය. මීටර් දෙසියයක් පමණ දුව ගිය ඔහු ගමන් කරන්නට විය. හති දැමූ ඔහුගේ සිරුර පුරා දහඩිය ගලා ගියේ ය. විඩා හැරිය පසු ඔහු නැවත දුවන්නට පටන් ගත්තේ ය. දුවන අසෙකුගේ කඳ මෙන් ඔහුගේ සිරුර දිලිසිණි. බුර්නස්යාන් තම සගයන්ට ඔහු පෙන්වී ය. සංකීර්ණ නොවන මේ ව්‍යායාම් නිසා ඔහුගේ මුහුණ වේදනාවෙන් විකෘති විය. සමහර විට ඔහු නැවතුණ ද, නැවත ඔහු දිව්වේ ය.

"ඒ මිනිහා සර්කස්කාරයෙක්ද? පිස්සෙක්ද?"යි බුර්නස්යාන් ඇසී ය.

නිදි කිරමින් සිටි ස්ටරුච්කොව්, ඇස් ඇර දුවන මිනිහා දෙස බලා පැහැදිලි කරමින් මෙසේ කීය:

"එයාගෙ කකුල් දෙකම නැහැ. ඔය දුවන්නෙ බොරු කකුල් දාගෙන. එයාගෙ එකම බලාපොරොත්තුව ආයෙමත් ප්‍රහාරක අහස්යානාවක් පදවන්ට"

නිදිකරමින් සිටි අලසයෝ සිසිල් දියෙන් තෙමූ කලෙක මෙන්, හිස් ඔසවමින් එකවර කතා කළහ. අපූරු හැඩයකට

පා තබමින් ගමන් කරන මේ අහස් නියමුවාගේ පාද නැති බව ඔවුහු නොදත්හ. පා නැත්තෙක් ප්‍රහාරක යානාවක් පැදවීම විහිළුවකි, නොඇසූ විරූ කතාවකි. අවමානයකි. ඇඟිලි දෙකක් නැතිවීම, ස්නායු දුර්වලත්වය, සමතලාපාද නිසා ඇති වන රෝගී ආදී සුළු කරුණු නිසා අහස්යානා සේවයෙන් අස්කරන සැටි ඔවුහු විස්තර කළහ. යුද්ධ කාලයේ දී පවා අහස් නියමුවන් සෞඛ්‍යය හා ශාරීරික ශක්තිය අතින් අනිකුත් යුද්ධ සේවාවල භටයන්ට වඩා උසස් විය යුතු ය. පා නැත්තෙකුට ප්‍රහාරක අහස්යානාවක් වැනි සංකීර්ණ යන්ත්‍රයක් ක්‍රියා කරවිය නොහැකි බව අවසානයේ දී ඔවුහු නිගමනය කළහ.

නොකළ හැකි දෙයක් කිරීමට අලෙක්සේයි බලාපොරොත්තු වන බව කී ඔවුහු ඔහුගේ දැඩි අධිෂ්ඨාන ශක්තිය නිසා පැහැදුණහ.

"තමුසෙගෙ යාළුවා එක්කෝ අමුම අමු මෝඩයෙක්, නැත්නම් මහා ශ්‍රේෂ්ඨ පුරුෂයෙක්" යැයි බුර්නස්යාන් ස්ට්රුච්කොව්ට කීවේ ය.

දෙපා නැති ව වුව ප්‍රහාරක අහස්යානා පැදවීමේ බලාපොරොත්තුවෙන් ව්‍යායාම් කරන්නෙක් සුඛාගාරයේ සිටින බව සැණෙකින් පැතිර ගියේ ය. එදින දහවල් ආහාරයෙන් පසු හැම දෙනාම අලෙක්සේයි දෙස බලන්නට වූහ. එහෙත්, ඔහු දෙස බලන බව ඔහු නොදත්තේ ය.

අලෙක්සේයි මහ හඬින් සිනාසෙන සැටි ද, රුචියකින් යුතු ව ආහාර ගන්නා සැටි ද රූමත් වේටර තරුණියන්ට ප්‍රශංසා කරන සැටි ද, උද්‍යානය දිගේ ඇවිදින සැටි ද ක්‍රකට් ක්‍රීඩාවෙහි පමණක් නොව, වොලිබෝල් ක්‍රීඩාවෙහි පවා යෙදීමට වෑයම් කරන සැටි ද දුටු සුඛාගාරයේ රෝගීහු ඔහු අමුතු කෙනෙකු ලෙස නොසැලකූහ. දුන්නක් ලෙස පනිමින් සෙමින් ගමන් කිරීම හැර විශේෂ ලක්ෂණයක් ඔවුහු නොදුටහ. ඔහු සමාන්‍යයෙක් විය.

දෙවැනි දවසේ දී අලෙක්සේයි සුඛාගාර කාර්යාල කාමරයට ගොස් සීනා හමුවිය. ඈ ඉදිරිපිට අසුනක ගරු සරු නැති ව වාඩි වූ ඔහු, පොරොන්දුව ඉටු කරන්නේ නැතිදැයි ඇගෙන් ඇසී ය.

"මොන පොරොන්දුව ද?"යි සීනා ප්‍රශ්න කරන්නී නෙත් විදහා ගත්තා ය.

"සීනා පොරොන්දු වුණා මට නැටුම් උගන්වන්ට"

"ඔහෙගෙ..." ඈ ඔහුගේ දෙපා ගැන කීමට තැත් කළා ය.

"කකුල් නැති අයට නැටුම් උගන්වන්ට තරම් දක්ෂ ගුරුවරියක් බව මට කීවා. දෙපා ඇති අය ඔහෙගෙන් ඉගෙන ගන්න කොට ඒ ගොල්ලන්ගෙ දෙපා විතරක් නෙවි, ඔළුවත් නැති වන බව පේද්‍යාගේ නිදසුනෙන් පේනවා. කවදද පටන් ගන්නෙ? කාලය නාස්ති කරන්න නරකයි"

අලුතින් ආ මේ මිනිහා ඇගේ සිත් ගත්තේ ය. දෙපා නැතුවට නැටුම් ඉගෙන ගන්ට ඕනලු. ඇයි බැරි? සීනාගේ ජීවිතයේ නැටුම් වැදගත් තැනක් ගත්තේ ය. නැටුම්වලට තරම් ඈ කිසිවකට ඇලුම් නොකළා ය. ඔහුට උගැන්වීමට ඈ එකඟ වූවා ය. ඈ ඉදිරිපත් කළ කොන්දේසි බරපතළ ඒවා විය. ඔහු කීකරු විය යුතු ය. ආචාරශීලී විය යුතු ය. ඇයට ආලය නොකළ යුතු ය. ඊර්ෂ්‍යා නොකළ යුතු ය. අනික් අය නැටුම් සඳහා ඇයට ආරාධනා කළ විට එරෙහි නොවිය යුතු ය. එක ම පුද්ගලයකු සමඟ නටන විට කලා නිපුණත්වය පහත වැටීමට ඉඩ ඇති බැවිනි. ඇරත් එක ම මිනිහකු සමඟ නැටීම ද කාන්සිය ගෙන දෙන වැඩකි.

ඒ සියලු කොන්දේසි ඔහු එකවර ම පිළිගත්තේ ය. ගිනි මෙන් රත් පැහැති හිසකේ සකස් කරගත් සීනා තම සිහින් පාද තාලයකට තබමින් එක් නැටුමක් නටන සැටි පෙන්වූවා ය. තම ජන්ම භූමිය වූ කමීෂින්හි ගිනි නිවන හමුදාවේ වාදක කණ්ඩායම නගර උද්‍යානයේ වාදනය කරන 'රුසියන්' නැටුම හා අනෙකුත් නැටුම් නැටීමට අලෙක්සේයි පුරුදු වූ සැටි ඔහුට මතක් විය. තාලය අනුව පා තබමින් නැටීමට ඔහු තුළ සහජ දක්ෂතාවක් තිබිණි. දැන් ඔහු ඉදිරියේ අසීරු කාර්යයකි. පණැති ජංගමශීලී සැබෑ පාද නොව, කකුල්වල කෙණ්ඩාවලට සවි කොට ඇති කෘත්‍රිම පාදවලින් තාලය අනුව නැටීම ලෙහෙසි වැඩක් නොවී ය. අප්‍රාණික බරැති ලී කකුල් වේගයෙන් එහා මෙහා තැබීමත්, තාලය අනුව නැටීමත් සඳහා මිනිස් ශක්තිය පරදවනසුලු දැඩි ආත්මශක්තියක් අවශ්‍ය ය.

අලෙක්සේයි සියලු අමාරුකම් මැඩ ජය ගත්තේ ය. අසීරු හැම නැටුමක් ම ඔහු කීපවරක් පුරුදු විය. නාට්‍ය ශිල්පයේ හැම විජ්ජාවක් ම ඉගෙන ගත්තේ ය. විවිධ නැටුම්වල රාග, තාල, රිද්ම ආදිය උගත් ඔහු කොල්ලකු මෙන් ප්‍රීති විය. කිසියම් නැටුමක් කීප වරක් පුහුණු වන අලෙක්සේයි තම ගුරුවරිය වටා වටයක් නටන්නේත් දෑතින් ඇය ඔසවන්නේත් ජයග්‍රාහී ලීලාවෙනි. මේ සංකීර්ණ නැටුම් නිසා ඔහුගේ කෙණ්ඩාවලින් පැන නැඟ මුළු සිරුර පුරා විහිද යන වේදනාව කොතරම් තියුණු දැයි නැටුම් ගුරුවරිය ඇතුළු කිසිවෙක් නොදත්හ. විඩාපත් වීම සහ වේදනාව නිසා දෙනෙතින් කඩා වැටෙන කඳුළු කැට කිසිවෙකුටත් නොපෙනෙන පරිදි ඔහු පිස දැමුවේ මඳ සිනා පාමිනි.

නැටුම් පාඩම්කන් පසු ව වරක් ඔහු තම කාමරයට පැමිණියේ විඩා පත්වුණු වේදනාවෙන් නමුදු, සතුටිනි.

"නැටුම් ඉගෙන ගන්නව" යැයි ඔහු නිහඬ ව ජනේලයෙන් පිටත බලාගෙන සිටි මේජර් ස්ට්‍රුච්කොව් අමතා කීවේ ගම්භීර ලීලාවකිනි. බැස යන හිරුගේ රැස් ඈත තුරු මුදුන් ආලෝක කළේ ය.

"ඔව් ඉගෙන ගන්නවාමයි!" මෙසේ කී අලෙක්සේයි ඇඳ මත වාඩි වී තම කෘත්‍රිම පාද ලිහා දමා කෙණ්ඩා පිරි මැද්දේ ය.

## 4

සීනා කාර්යාලයේ වැඩ අවසන් කොට එළියට බසිත් ම, ඇගේ ගෝලයා ඈ බලාපොරොත්තුවෙන් සිටියේ ය. ඈ නියම ගුරුවරියක මෙන් ඔහුට අත දී ආචාර කොට ඔහු සමඟ ගිම්හාන ශාලාවට ගියා ය. අලෙක්සේයි වේලාසනින් ශාලාවේ පුටු මේස අස්කොට නැටුම් සඳහා බිම පිළියෙල කළේ ය. ටේබල් ටෙනිස් ක්‍රීඩාව සඳහා වූ මේසය ද බිත්තියට ළං කළේ ය. සීනා අලුත් නැටුමක් නටන සැටි පෙන්වා දුන්නා ය. ඈ තම කුඩා පාදයන් වේගයෙන් තබන්නී, සුන්දර නැටුමක් නැටුවා ය. ඇස් බැම් හකුළුවා ගත් අලෙක්සේයි ඇගේ නැටුම දෙස මහත් වුවමනාවෙන් බලා සිට ඇගේ අණ අනුව පා තබමින් නැටුවේ ය.

"එකයි, දෙකයි, තුනයි, වමට හැරෙන්න! එකයි-දෙකයි-

තුනයි, දකුණට හැරෙන්න! වටයක් කරකැවෙන්න. එකයි-දෙකයි-තුනයි එක්ව නටමු...”

දෙපා නැතියකුට නැටුම් උගැන්වීම ඇගේ සිත් ගත්තා විය හැකි ය. තලෙළු පැහැති, කළු හිසකේ ඇති, උපහාසාත්මක ඇස් ඇති තරුණයා ඇගේ සිත් ගත්තා විය හැකි ය. කෙසේ වුව ද, ඈ තම නිවාඩු කාලය ඔහුට නැටුම් ඉගැන්වීම සඳහා යෙදවූයේ සතුටකිනි.

හවස් වත් ම, ගඟ අද්දර නාන ස්ථානය ද, වොලිබෝල් ක්‍රීඩා පිටිය හා ගරද්කී ක්‍රීඩා පිටිය ද හිස් වූ විට හැම දෙනෙක් ම නැටුම් පිටියට ගියහ. අලෙක්සේයි හැම නැටුමක් ම දක්ෂ ලෙස නැටුවේ ය. ඔහුට දැඩි කොන්දේසි ඉදිරිපත් කිරීම ගැන ගුරුවරිය නිතර කනගාටු වූවා ය. බයානය නමැති රුසියානු සංගීත භාණ්ඩයේ වාදනය අනුව ජෝඩු නටන්නට වූහ. අලෙක්සේයි තම මිතුරිය සමඟ ‘ග්ලිසේඩ්’, ‘ස්මියා’ ආදී අපරදිග මූලික නැටුම් ඇතුළු සියලු නැටුම් නටමින් තාලය අනුව පා තබමින් දුටුවන් විස්මයට පත් කළේ ය. තම දස්කම් නිසා පැහැදුණු ඔහු සතුටු විය. ඔහුගේ දෙනෙත් ප්‍රීතියෙන් බැබළිණි. හිටි හැටියේ ම නැටුම්හලින් පිට ව යන ඔහු මොනවා කරති දැයි කිසිවකුට සිතා ගැනීමට පවා බැරි ය.

ලේන්සුවක් වනමින්, මඳ සිනා පාමින් නැටුම් හලෙන් පිට වී යන ඔහු අඩ අඳුර සහිත බැද්දට ළං වූ සැටියේ ම වේදනාව පිට කිරීමට මෙන් සුසුම් ලෑවේ ය. වැට අල්ලා ගනිමින්, වැනෙමින් පඩිපෙළ බැස ගිය ඔහු පිනි බිඳු සහිත තණ බිම මත වැතිර ගෙන වේදනාවෙන් කෙඳිරි ගෑවේ ය.

කෘත්‍රිම පාද ගලවා කකුල්වලට නිවාඩුවක් දුන් හෙතෙම නැවත ඒවා දමාගෙන ඉක්මනින් නැටුම්හල දෙසට ගියේ ය. කිසිවකුට නොදැනෙන පරිදි නැටුම්හලට ඇතුළු වූ ඔහු, විඩාපත් නොවන අබ්බගාත සංගීතඥයා වාදනයෙන් කුල් මත් වී නටන පිරිස අතරට වැදෙමින් සීනා සොයා ගියේ ය. සීනා ද තම ගෝලයා සොයමින් ඉදිරියට ගියා ය. කිරි පැහැති සුදු දත් පෙනෙන සේ සිනහ වූ අලෙක්සේයි සීනොච්කා හමුව ඇගේ අතක් අල්ලා ගනිමින් නටන්නට විය.

ඉළ කැඩෙන අසීරු නැටුම් ඉගෙන ගැනීම නිසා යහපත් ප්‍රතිඵල ලැබිණි. තම කෘත්‍රිම පාදවල බාධාව වඩාත්

අඩුවෙන් අලෙක්සේයිට දැනිණි. ලීයෙන් සැදූ ඒ කෘත්‍රිම පාද සැබෑ කකුල්වලට බද්ධ කළාක් මෙනි.

අලෙක්සේයිගේ ප්‍රීතියට බාධා කරන්නේ එක් කාරණයකි. ඕල්යාගෙන් ලියුමක් නොලැබීම ය. ග්වොස්දෙව් සිද්ධියෙන් පසු කැලඹුණු සිතින් අලෙක්සේයි ඕල්යාට මසකට පෙර මාරක ලියුමක් යැවී ය. එය ඇත්ත වශයෙන් ම අමන ක්‍රියාවක් විය. ඒ ලියුමට ඔහුට මෙතෙක් පිළිතුරු නොලැබිණි. හැමදා ම උදෑසන ආහාරයෙන් පසු අලෙක්සේයි දිව්වේ ය. ගමන් කළේ ය. දිනපතා ම ඔහු තම ගමන් මඟ අඩි සියයකින් දිගු කළේ ය. ඉන් පසු ඔහු කාර්යාලයට ගොස් ලියුම් රාක්කය පිරික්සා බැලී ය. 'එම්' අකුර සහිත පෙට්ටියේ අනික් පෙට්ටිවලට වඩා ලියුම් තිබුණ ද, මෙරේස්යෙව් අලෙක්සේයිට ලියුම් නොතිබිණි. එහෙත්, ඔහු නිතර එම ලියුම් මිටිය පිරික්සා බැලී ය.

දවසක් දා අලෙක්සේයි නැටුම් ඉගෙන ගනිමින් සිටින විට බුර්නස්යාන් එම කාමරයට ඇතුළු විය. ඔහු අත ලියුම් කවරයකි. බුර්නස්යාන්ට වචනයකුදු කතා කිරීමට ඉඩ නොතබා ඔහුගෙන් ලියුම උදුරා ගත් අලෙක්සේයි ඔහු අන්දමන්ද කරවමින් හා නැටුම් ගුරුවරිය - සීනා කෝප කරවමින් ඉවතට ගියේ ය. ලියුම් කවරයේ අලෙක්සේයි හොඳින් දන්නා වටකුරු සිසු අකුරින් ලියා තිබිණි.

ලියුම් කවරය අතිනත මාරු වීම නිසා ඉරි තැලී තිබිණි. කවරය ඉරා ලියුම අතට ගත් අලෙක්සේයි එහි අග කොටස කියැවී ය. "මිට, ඔබගේ පෙම්වතිය, ඕල්යා"යැයි එහි ලියා ඇත. ඔහුට සැහැල්ලුවක් දැනිණි. බිම වාඩි වුණු අලෙක්සේයි ඇක්සයිස් පොතකින් කඩාගත් කොළවල ලියූ ඒ ලියුම කියවන්නට විය. අකුරු පේළි අතරින් මඩ ඉටි පැල්ලම් තිබීම ඔහුගේ පුදුමයට හේතු විය. ඕල්යා හැම වැඩක් ම පවිත්‍ර ලෙස කළා ය. දැන් ඇට කුමක් වී ද? ලියුම කියවූ පසු කරුණ පැහැදිලි විය. ඈ කම්කරු තරුණියන් සමඟ 'එක්තරා විශාල නගරයක' ආරක්ෂාව සඳහා යුද්ධ ටැන්කි නාශක කපොලු සාදන්නී ය. ස්ටාලින්ග්‍රාඩයේ නම එහි කොතැනකවත් සඳහන් නොවිණි. එහෙත්, ඈ එම නගරය ගැන කොතරම් වුවමනාවකින් හා සැලකිල්ලෙන් ලියුවා ද යත්, එම නගරයට ඈ කොතරම් ආදරය කළා ද යත් එහි ඉරණම ගැන කොතරම් කැලඹුණා ද යත් එම

ලියුමේ සඳහන් නගරය ස්ටාලින්ග්‍රාඩය බවට පැහැදිලි විය.

නගරාරක්ෂක කටයුතු ගැනත්, තම දිවිය ගෙවන සැටිත් විස්තර කළ පසු ඕල්යා ඔහුගේ පැනයට පිළිතුරු ලියුවා ය. ඔහුගේ පැනය ඈට නින්දා කළ බව දැන් වූ ඈ එය ලැබුණේ නගරාරක්ෂක කපොලු සාදන විට දී බවත්, යුද්ධ නිසා හැම දෙනාගේ ම ස්නායු කිපී ඇති බැවින් ඔහුට සමාව දෙන බවත්, නැතිනම් එවැනි පැනයක් නිසා ඇගෙන් කිසි දිනෙක ඔහුට සමාව නොලැබෙන බවත් ඈ ලියුවා ය.

"පෙම්වත, පරිත්‍යාග කිරීමට බිය නම් එවැනි ආලයක් සැබෑ එකක් නොවේ" යැයි ඇගේ ලියුමේ සඳහන් විය. "එවැනි ආලයක් තිබේ නම් එය ආලයක් නොව, බොරුවකි. නගරාරක්ෂක වැඩවල දවසේ පැය විසි හතරේ ම යෙදෙන අපට මුහුණ සෝදා ගැනීමට පවා කාල වේලාවක් නැත. සුමානයක්ම මා මුහුණ සේදුවේ නැත. දිග කලිසම් ඇඳ අපි වැඩ කරමු. මගේ සපත්තු දෙක කැඩී පා ඇඟිලි එළියට නෙරා ඇත. තද ඉර අව්ව නිසා හම පිච්චී ගොසිනි. පිටේ හා උරහිසේ හම ගැලවී දම්පාට ගැසිලා ය. විඩාපත්ව, වැරැහැලි ඇඳගෙන මඩ හා කුණු තවරාගෙන අවලස්සන වී සිටින මා නුඹ වෙත ආවොත්, නුඹ මා එළවා දමන්නෙහි ද? චෝදනා කරන්නෙහි ද? දඟකාර කොල්ලකු වෙන්ට එපා. නුඹට මොනවා වුණත්, මම නුඹ එනතුරු හැමදාම, නිතරම බලා සිටිමි... හති වැටෙන තුරු අගල් හාරන අපි නවාතැන්පළට ආ විගස ම නින්දට යමු. වැඩ කරන විට මම නුඹ සිහි කරමි. නින්දට ගිය පසු සිහිනෙන් දකිමි. මා ජීවත්ව සිටින තුරු ඕනෑම දවසක ඕනෑම වේලාවක නුඹට මා වෙත පැමිණිය හැකි ය. මම නුඹ පතමින්, නුඹ ගැන සිතමින් ජීවත් වෙමි..."

"මේ මොකක්ද?"

"පූර්ව හැඟීමක්ද? ජේන කීමක්ද?" අනාවැකි පළ කිරීමක්ද?" වරක් ඔහුගේ මව එසේ පවසා ඇත. ඔහු ඈට නොකී දෙය, අගල් හැරීමේ අසීරු රැකියාව නිසාදෝ ඉවෙන් මෙන් දැනගෙන ඇත. ඈට දිවැස් ලැබුණේ කෙසේ ද?යි ඔහු කල්පනා කළේ ය. ඔහු නැවත වරක් ලියුම කියැවී ය. එවැනි අනාවැකි පළ කිරීමක් එහි නැත. ඔහුගේ ප්‍රශ්නයට ඈ පිළිතුරු සපයා ඇත.



## 5

යුද්ධ වාර්තාවල ස්ටාලින්ග්‍රාඩ් යන නාමය සඳහන් නොවී ය. එහෙත්, හැම කෙනෙක් ම එම නගරය ගැන සඳහන් කළහ. 1942 හේමන්තයේ දී ස්ටාලින්ග්‍රාඩය ගැන කැලඹුණු සිතින්, වේදනාවෙන් කතා කළහ. මාර සටනක යෙදෙමින් සිටි එම නගරය ගැන ඔවුන් කතා කළේ තමන්ට බෙහෙවින් ම කිට්ටු මිනිසකු ගැන කතා කරන්නාක් මෙනි. අලෙක්සේයිට එම නගරය වඩාත් වැදගත් වූයේ තම පෙම්බරිය එහි ආරක්ෂාව සඳහා තවත් දස දහස් ගණනක් සමඟ වැඩ කරන බැවිනි. ඈ විඳින ගැහැට කිසිවෙක් නොදනිති. ඔහු ඈට දිනපතා ම ලියුවේ ය. ඇගේ ලිපිනය යුද පෙරමුණක තැපැල් පෙට්ටියකි.

වොල්ගා නදිය අසල ස්ටෙප්ස් බිම්හි පැන නැඟී ඒ මාරාන්තික සටන් අස්සේ ඔහුගේ ලියුම් ඈට ලැබෙතියි කා හට නම් කිව හැකි ද?

පැඟූ තුඹසක දිමියන් සේ සුබාගාරයේ අහස් නියමුවෝ කැලඹුණහ. හැම දෙනෙක් ම උද්‍යෑසනින් නැඟිට, උද්‍යෑසන යුද පුවත්වලට සවන් දුන්හ. කම්මැළියෝ පවා ගුවන්විදුලි යන්ත්‍රය අසලට වී උන්හ. අහස් සටන් ගැන විස්තරත් ඒවාට සහභාගි වූ අහස් නියමුවන් දක් වූ වීරත්වයත් ඇසූ ඔවුහු මලානික වූහ. මෙවැනි උග්‍ර සටන් පවතින වේලාවක සුබාගාරයක වැවක් අසල වැතිර ගෙන හිරු රැස් නෑමට සිදුවී ඇත්තේ සුබාගාර පාලනයේ වරදින් යැයි සිතූ නිසා දෝ ඔවුහු හෙදියන්ට චෝදනා කළහ. ආහාර හොඳ නැතැයි ද, රෝගීන් සඳහා වූ දින චරියාව නුසුදුසු යැයි ද කීහ. විවේක ගැනීම තිත්ත වී ඇති බැවින් වහාම යුද පෙරමුණට යා යුතුහයි ඔවුහු එක හඬින් ඉල්ලා සිටියහ.

සවස් වන විට අහස් හමුදාවේ විශේෂ කොමිසන් සභාවක් සුබාගාරයට ළඟා විය. දූවිලි සහිත මොටෝ රියකින් අහස් හමුදාවේ නිල ඇඳුමින් සැරසුණු දොස්තරවරු කීප දෙනෙක් පැමිණියහ. ඉස්සරහ ආසනයෙන් එළියට ආවේ අහස්යානා හමුදාවේ සුප්‍රසිද්ධ දොස්තරෙක් වූ මිරොවොල්ස්කි ය. අහස් නියමුවෝ ඔහු පියෙකු මෙන් සැලකූහ. පළමුවැනි ශ්‍රේණියේ නිලධරයෙක් වූ ඔහු මහත ය. රාත්‍රි ආහාරයෙන් පසු ඉක්මනින් යුද පෙරමුණ බලා යාමට කැමැති සුවය ලැබූ නියමුවන් පරීක්ෂණයට භාජනය කරන බවට නිවේදනය කළේ ය.

එදින වෙනදාටත් වඩා වේලාසනින් පිබිදුණු අලෙක්සේයි මෙරේස්යෙව් සිරිත් පරිදි ශාරීරික ව්‍යායාම් නොකර බැද්දට වැදී සක්මන් කළේ ය. උද්‍යෑසන ආහාර සඳහා වාඩි වූ අලෙක්සේයි හේතු රහිත ව වේටර තරුණියට බැන්නේ ය. ඔහුට ආධාර කිරීමට පැමිණි තරුණියට බැණ වැදීම නුසුදුසු දෙයක් ලෙස ස්ට්රුච්කොව් කීවෙන්, ඔහු අවන් හලෙන් පිට වී ගියේ ය.

වෙනදාටත් වඩා කොර ගසමින් ගමන් කළ අලෙක්සේයි කාමරය තුළට වී දොර අගුළු ලා ගත්තේ ය.

වෛද්‍ය කොමිෂන් සභාව කටයුතු ඇරඹී ය. අහස් නියමුවන්ගේ පෙණහලුවල වායු ප්‍රමාණය මැන බලන

යන්ත්‍ර, කාය ශක්තිය පෙන්වන මීටර, අක්ෂි පරීක්ෂණය සඳහා උපකරණ කොමිසන් සභාව රැස් වූ ශාලාවට ගෙනාවේ ය. ඉක්මනින් යුද පෙරමුණ බලා යාමට කැමැති හැම කෙනෙක් ම සුබාගාරයේ විවේක ගත් හැම කෙනෙක් ම එතැනට රැස් ව පෙළ ගැසී සිටියහ. සීනා හැම අහස් නියමුවකුට ම කොමිෂන් සභාව ඉදිරියට පැමිණිය යුතු වේලාව සටහන් කරමින් ටිකට් පතක් බැගින් දී නියමිත වේලාවට පැමිණෙන ලෙස දන්වා සිටියෙන් ඔවුහු විසිර ගියහ. පළමුවැනි අහස් නියමුවා කොමිෂන් සභාව ඉදිරිපිටට පැමිණි පසු, ඉක්මනින් පෙරමුණට යාම සඳහා අවසර ලබා ගැනීම අමාරු නොවන බවට කතා පැතිරිණි. වොල්ගාව අසල යෝධමය සටන් පැන නැඟ ඇති මෙවැනි අවස්ථාවක දී වඩ වඩාත් පිරිස් බලය අවශ්‍ය ව තිබිය දී අමාරු නීති රීති ඇති විය නොහැකි ය. පෝටිකෝව ඉදිරිපිට තාප්පය මත වාඩි වුණු අලෙක්සේයි බොරු කකුල් දෙක වනමින් කොමිෂන් කාමරයෙන් පිට වී යන නියමුවන් අමතා ඕනෑවට එපාවට මෙන් මෙසේ ඇසී ය.

"ආ... කොහොමද?"

"පෙරමුණට යනවා" යැයි පිටතට ආ නියමුවා කීවේ ඉණපටිය තද කරගනිමිනි.

මෙරේස්යෙව්ට පෙර ශාලාවට ඇතුළු වූයේ බුර්නස්යාන් ය. තම සැරයටිය ආලින්දයේ තබා කොට කකුලේ අඩුව නොපෙනෙන සේ ගමන් කළ බුර්නස්යාන් ශාලාවට ඇතුළු වූ නමුදු, ඔහු බොහෝ වේලාවක් යන තුරු පිටතට නාවේ ය. හැර ඇති ජනේලයෙන් හඬක් පිටවන සැටි අලෙක්සේයිට ඇසිණි. ටික වේලාවකට පසු ව බුර්නස්යාන් එළියට ආවේ ය. ඔහු අලෙක්සේයි දෙස කෝපාන්විත බැල්මක් හෙළූ නමුදු, නිහඬ විය. පිට්ටනිය දෙසට ගමන් කළ බුර්නස්යාන් බැණ වදින සැටි ඇසිණි.

"නිලධාරිවාදී අලිහොරු! අහස්යානා පැදවීම ගැන උන් දන්න උලව්වක් නැහැ. කකුලක් කොටලු. මම බැලේ නටන්න යන්නෙ නැහැ. වස්ති කරන්න විතරයි ඔවුන් දන්නෙ!"

අලෙක්සේයිට හීන් දාඩිය දැමිණි. ඔහු මඳ සිනාවකින් මුව සරසාගෙන කඩිසර ගමනින් ශාලාවට ඇතුළු

විය. කොමිෂන් සභාවේ සාමාජිකයෝ වාඩි වී උන්හ. මේසය මැද පළමුවැනි ශ්‍රේණියේ යුද්ධ වෛද්‍ය නිලධාරි මිරොවොල්ස්කි ඇත්පැටවකු මෙන් අසුන් ගෙන සිටියේ ය. පෞද්ගලික ලියවිලි තබා ඇති කුඩා මේසයක් අසල සීනා වාඩි වී සිටියා ය.

"ආ තරුණයා ගලවනව කමිසය!" යැයි කී ප්‍රධානියා ඇස් හකුළුවා ගත්තේ ය.

හැමදාම ව්‍යායාම් කිරීම හිරු රැස් නෑම අලෙක්සේයිට බෙහෙවින් පිහිට විය. තලෙළු පාටැති හමින් වැසී ගත් ඔහුගේ උඩු කයේ මාංස පේශීන් මනා ලෙස වැඩී තිබිණි.

ශාරීරික ශක්තිය පෙන්වන මීටරය අලෙක්සේයි තද කළේ ය. වුවමනාවටත් වඩා ඔහුට ශක්තිය ඇති බව එයින් පෙනිණි. පෙණහලුවල වායු ප්‍රමාණය පෙන්වන යන්ත්‍රයේ නළය කටින් ගෙන එක හුස්මට තම පෙණහලුවල වාතය සිස් කරමින් ප්‍රශ්වාස කරත් ම එහි බැලුම උපරිම ස්ථානය දක්වා ඉහළ නැංගේ ය. රුධිර පීඩනය සාමාන්‍ය විය. ස්නායුවල තත්ත්වය ද යහපත් විය. පිටකොන්දේ ශක්තිය පෙන්වන යන්ත්‍රයේ වානේ දම්වැල කොතරම් වේගයෙන් ඔහු විසින් අදිනු ලැබීද යත් එය කැඩිණි.

"අහස් නියමුවෙක් ද"යි වෛදනා ප්‍රශ්න කළේ සතුටිනි. ඔහු ඒ. පී. මෙරේස්යෙව්ගේ පෞද්ගලික ලිපි ගොනුව ගෙන තම තීරණය ලිවීමට සූදානම් විය.

"ඔව්, අහස් නියමුවෙක්" යැයි අලෙක්සේයි පිළිතුරු දුන්නේ ය.

"ප්‍රහාරක යානා පදවන්නෙක්ද?"

"ඔව්. එහෙමයි"

"හොඳයි යන්න යුද පෙරමුණට. දැන් මහ සටන් පටන් අරගෙන. තමුසෙ වගේ අය හොඳටම අවශ්‍ය වෙලා! ඉස්පිරිතාලෙට ඇතුළු වුණේ ඇයි?"

සියල්ල බිඳ වැටිණැයි සිතූ අලෙක්සේයි සිනාසුණේ ය. ඒ අතර අලෙක්සේයිගේ රෝග ඉතිහාසය කියවන්නට වූ වෛදනාගේ කරුණාභරිත මුහුණ විස්මයෙන් පිරිණි.

"කකුල් දෙක කපා දැමීමේ සැත්කම කළා.... මේක වෙන්න බැරි දෙයක්! වැරදීමක් නොවේද? ඇයි තමුසෙ නිහඬ වෙලාද?"

"නැහැ වැරදීමක් නොවේ" යැයි අලෙක්සේයි සෙමෙන් ඇද පැද කීවේ කන්දක් නැග්ගාක් මෙනි.

වෙදනා ඇතුළු කොමිෂන් සභාව ශක්තිමත් ජංගමශීලී යෞවන අලෙක්සේයි දෙස සැකසිතින් බැලූහ. තමන් දුටු දේ ඔවුහු අවිශ්වාස කළහ.

"කලිසම ගලවන්න!" යැයි වෙදනා කීවේ ය.

අලෙක්සේයි සුදුමැලි විය. කෘත්‍රිම දෙපාත් සමඟ ඔහු කොමිසම ඉදිරියේ සිටගෙන සිටියේ ගල්රුවක් මෙනි.

"ඇයි තරුණයා අප දෙස බලන්නේ. තමුසෙ අපේ කාලෙ නාස්ති කළා. කකුල් නැතිව තමුසෙ අහස්යානා පදවන්ට යනවද?"යි ඔහුගෙන් ප්‍රශ්න කළේ ය.

"ඔව් සත්තකින්ම යනවා." කළු පැහැති දෙනෙත්වලින් ඔහු ඔවුන්ට අභියෝග කළේ ය.

"තමුසෙට පිස්සු! දෙපා නැතුව අහස්යානා පදවන්ට පුළුවන්ද?"

"ඔව්. දෙපා නැතිව අහස්යානා පාදවනවාමයි!" මෙවර අලෙක්සේයි සන්සුන් ලෙස පිළිතුරු දුන්නේ ය. ඔහු තම සාක්කුවට අත දමා පුවත්පතකින් කපාගත් ලිපියක් ගෙන වෙදනා අතට දුන්නේ ය. "බලන්න එයා අහස්යානා පැදෙව්වා එක කකුලක් නැතිව. මට පුළුවනි අහස්යානා පදවන්ට කකුල් දෙක ම නැතුවට"

ලිපිය කියවූ වෙදනා විස්මයෙන් හා ගෞරවයකින් යුතු ව අලෙක්සේයි දෙස බැලී ය.

"ඒ වුණාට බොහොම අමාරුවෙන් පුරුදු පුහුණු වෙන්ට ඕන. මෙයා අවුරුදු දහයක් පුහුණු වුණා. බොරු කකුල්වලින් වැඩ කරන්ට ඉගෙන ගන්ට ඕන." යැයි ඔහු මුදු ලෙස පැවසී ය.

මෙතැනදී අලෙක්සේයිට බලාපොරොත්තු රහිත ආධාරයක් ලැබිණි. තම මේසයෙන් නැඟී සිටගත් සීනා දෑත් එක්කොටගෙන කතා කළා ය. ඇගේ මුහුණ ලැජ්ජාවෙන් රත් පැහැගෙන තිබිණි.

"ප්‍රධාන නිලධාරි සහෝදරය! මෙයා නටන හැටි බලන්න. හැබෑ දෙපා ඇති මිනිහෙකුටත් වඩා හොඳට නටනවා. මම කියන්නෙ සම්පූර්ණ ඇත්ත!"

"නටනව- කොහොමද? හරිම යකෙක් නොවැ!" යැයි

කී වෙදනා සෙසු සාමාජිකයන් දෙස දයාන්විත බැල්මක් හෙළී ය.

සීනා ඉදිරිපත් කළ අදහස අලෙක්සේයි දැඩිකොට අල්ලා ගත්තේ ය.

"මා ගැන දැන් තීරණයක් ගන්න එපා. ඔය සහෝදරවරු හවසට එන්න නැටුම්හලට. එතකොට ඔහෙලට පෙනේවි මට අහස්යානා පදවන්ට පුළුවන් බව"

ශාලාවෙන් එළියට යන අලෙක්සේයි කොමිෂන් සභාවේ සමාජිකයන් උනන්දුවකින් යුතු ව සාකච්ඡා කරන සැටි කණ්ණාඩියේ සේයාවෙන් දුටුවේ ය.

දවල් ආහාරයට පෙර අලෙක්සේයි සොයා ගිය සීනා ඔහු උද්‍යානයේ පඳුරක් අසල වාඩි වී සිටින සැටි දිටී ය. ඔහු ගිය පසු කොමිසමේ සාමාජිකයෝ බොහෝ වේලාවක් ඔහු ගැන කතා කළ බවත්, අලෙක්සේයි මෙරේස්යෙව් අසමාන පුද්ගලයකු බවත්, සැබැවින් ම ඔහුට අහස්යානා පැදවීමට හැකි වනු ඇතැයි තමා සිතන බවත් වෙදනා කී බව සීනා අලෙක්සේයිට කීවා ය. රුසියානු ජාතිකයාට හැම දෙයක්ම කළ හැකි ය. කොමිසමේ එක් සාමාජිකයෙක් විරුද්ධත්වය ප්‍රකාශ කරමින් එවැනි නිදසුනක් අහස්යානා පැදවීමේ ඉතිහාසේ නොතිබුණු බව කීවේ ය. අහස්යානා පැදවීමේ ඉතිහාසය නොදත් බොහෝ දේ මේ යුද්ධයේ දී සෝවියට් ජනතාව උගන්වනු ඇතැයි ඔහුට පිළිතුරු වශයෙන් වෙදනා පැවසී ය.

යුද පෙරමුණට යාමට අවසර ලබා ගත් අහස් නියමුවෝ - ගණනින් ඔවුහු දෙසීයක් පමණ වූහ - එදින සවස බාල් නැටීමට පටන් ගත්හ. විඩාපත් වීම හා වැගිරෙන දහඩිය පිසදමා ගනිමින් එදින සවස අහස් නියමුවෝ නැටූහ. මේ අය අතර අතිශයින්ම දක්ෂකම් පාමින් අලෙක්සේයි ප්‍රීතියෙන් නැටුවේ ය. අලෙක්සේයි සහ ඔහුගේ රක්තකේශිය දුටුවන් සිත් ඇද ගනිමින් නැටූහ. එදින ඔවුන් දෙදෙනා තරම් දුටුවන් මන පිනවන යුවළක් නොවී ය.

නැටුම්හලේ ජනේලයක් අසල වාඩි වී සිසිල් බීර වීදුරුවක් බොමින් සිටි මිරොවොල්ස්කි වෙදනා, මෙරේස්යෙව් හා ඔහුගේ රක්තකේශිය දෙස ඇසි පිය නොහෙළා බලා ගත්වන ම සිටියේ ය. ඔහු

වෛද්‍යවරයෙකි, එපමණක් නොව, ඔහු යුද්ධ හමුදාවේ වෛද්‍යවරයෙකි. සැබෑ හා බොරු කකුල්වල වෙනස ඔහු ඉතා හොඳින් දැන සිටියේ ය.

එහෙත්, දැන් ශක්තිමත් තලෙළු, අහස් නියමුවා දෙසත්, ඔහුගේ සුන්දර ගුරුවරිය දෙසත් බලා සිටින ඔහුට මේ හැම දෙයක ම එක්තරා මායාකාරී බලයක් ඇතැයි සිතිණි. අවසානයේ දී අත්පොළසන් මැද 'බාරිනියා' නමැති රුසියානු ජන නැටුම දක්ෂ ලෙස නැටූ අලෙක්සේයි මෙරේස්යෙව් අත්පුඩි ගසමින්, උඩ පනිමින්, වේගයෙන් කරකැවෙමින් බලා සිටියවුන් විස්මයට පත් කළේ ය. නැටුම අවසානයේ දී ඔහු මිරොවොල්ස්කි වෙත ගියේ ප්‍රබෝධයකින් යුතු ව ය. ඔහු නැඟිට අලෙක්සේයිට අත දී ආචාර කළේ ය. අලෙක්සේයි නිහඬ ව සිටිය ද ඔහුගේ දැඩි බැල්ම වේදනාගෙන් පිළිතුරු ඉල්ලා සිටියේ ය.

"දැන් ඔහෙට තේරෙනව ඇති, ඔහෙව එහෙම යුද පෙරමුණට යැවීමට මට බලයක් නැති බව. මම ශිල්පීන් පුහුණු කරන අංශයට රෙකමදාරුවක් කරන්නම්. අපේ අදහස් දැන්වෙන ලිපියක් ලියන්නම්. සෑහෙන පුහුණුවකින් පසු ඔහෙට පුළුවන් වේවි නැවත අහස්යානා පැදවීමට. කොටින් කියතොත් මගේ ඡන්දය ඔහෙට පක්ෂව පාවිච්චි කරනව" යැයි මිරොවොල්ස්කි පැවසී ය.

මිරොවොල්ස්කි, තවත් දක්ෂ සැත්කම් දොස්තරකු වන සුබාගාර පාලකයා සමඟ නැටුම් හලින් පිට විය. දෙදෙනා ම අලෙක්සේයි නිසා පැහැදී සිටියහ. දැඩි අධිෂ්ඨානයකින් කටයුතු කළහොත් සෝවියට් රට වැසියාට නොකළ හැකි දෙයක් නැතැයි, නින්දට පෙර දුම් බොමින් සාකච්ඡා කළ දෙදෙනාගේ මතය විය.

නැටුම්හල සංගීතයෙන් පිරී ඇත. බාල් නැටුම් නටන ජෝඩු තාලය අනුව පා තබති. නාන කාමරයට ගිය අලෙක්සේයි නාන බාල්දිය ශීතල වතුරෙන් පුරවා තම කකුල් අග එහි එබුවේ ය. බොහෝ වේලාවක් වේගයෙන් නැටීම නිසා ඇති වූ වේදනාව ඔහු සිහිසන් නැති කරවීමට තරම් දරුණු විය. දෙතොල් සපා ගනිමින් ඔහු තම කකුල් අග රත් පැහැ වූ තුවාල සිසිල් ජලයට ඔබා ගෙන සුසුම් ලෑවේ ය.

## 6

හිමිදිරි පාන්දර බස් රථ කීපයක් සුබාගාර ගේට්ටුවෙන් පිට විය.

බස් රියක පාපුවරුවේ වාඩි වී සිටි මේජර් ස්ට්රුච්කොව් කබායේ බොත්තම් ගලවා ගෙන මොස්කව් අවට සිරි නරඹමින් මඳ සිනා පෑවේ ය. නිතර සංචාරයෙහි යෙදෙන මේ සෙබළා යුද පෙරමුණ බලා යන්නේ ඉමහත් ප්‍රීතියෙනි. මෙවර ඔහු නොදන්නා අහස්යානා සේනාංකයට ගිය ද, ඔහුට එය ද තම ගෙදර මෙනි. අලෙක්සේයි නිහඬ ව කල්පනා කාරීව සිටියේ ය. අසීරු කාලය ඉදිරියට ය. ඉදිරියේ ඇති විය හැකි බාධාවන් මැඩ නැඟී සිටීමට ඔහු සමත් වෙති ද?

මොස්කව් පැමිණි විගස ම රෑ නවාතැන ගැන පවා නොතකා ඔහු තම සුහද අනුග්‍රාහකයා වන මිරොවොල්ස්කි සොයා ගියේ ය. මිරොවොල්ස්කි හදිසියෙන් ම යුද කටයුත්තක් සඳහා පිට පළාතකට ගිය බවත්, ඔහු ඉක්මනින් ආපසු නොඑන බවත් ඔහුට දැනගන්නට ලැබිණි. පළමුවැනි ප්‍රයත්නය අවාසනාවක් විය. සාමාන්‍ය නීති රීති අනුව වාර්තාව භාර දෙන ලෙස අලෙක්සේයිට දැන්වූයෙන්, ඔහු ජනේලය අසල පඩියට නැඹුරු වී එය ලියා භාර දුන්නේ ය. වාර්තාව භාරගත් නිලධාරියා මිටි ය. ඔහුගේ දෙනෙත් විඩාපත් බවක් පළ කළේ ය. දවස් දෙකකින් පිළිතුරු සපයන බවට ඔහු පොරොන්දු විය. අලෙක්සේයි ඉක්මන් කරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියේ ය. කන්නලව් කළේ ය. අවසානයේ දී තර්ජනය කළේ ය. එහෙත්, එය ඵල රහිත විය. තම සිහින් දෑත් පපුව මත තබාගත් නිලධාරියා නීතිය අනුව ක්‍රියා කරනවා මිස, ඉන් පිටතින් ක්‍රියා නොකළ හැකි බව පැහැදිලි කළේ ය. ඇත්තවශයෙන් ම ඔහුට තම වාර්තාව ගැන තීරණය ඉක්මන් කරවීමට බලයක් නැතුවා විය යුතු ය. අලෙක්සේයි එතැනින් පිටවූයේ නොසතුටකිනි.

අන්යූටා වැඩ කරන රෝහලට අලෙක්සේයි ටෙලිෆෝන් කළේ ය. ඈ යම් කිසි වැඩක යෙදී සිටින බව අන්යූටාගේ කටහඬින් දැනුණ ද, ඔහු ටෙලිෆෝන් කිරීම නිසා ඈ බෙහෙවින් සතුටු වූවා ය. දවස් කීපයකට ඇගේ ගෙදර නවාතැන් ඉල්ලා සිටි අලෙක්සේයි නිසා ඈ වඩාත් සතුටු

වුවා, තමා මේ දිනවල රෝහල් නේවාසිකාගාරයේ නැවතී සිටින බැවින් ගෙය පාවිච්චි කිරීමේ සම්පූර්ණ නිදහස ඔහු සතු බව දන්වා සිටියා ය.

සුබාගාරයේ දවස් පහකට සෑහෙන වියළි ආහාර සලාකයක් හැම අහස් නියමුවෙකුට ම දී ඇත. අලෙක්සේයි තම ආහාර සලාකයත් රැගෙන මහ ගොඩනැගිලි මත ඇති අන්යූටාගේ පුංචි ගෙය සොයා ගියේ ය. නවාතැන සහ ආහාර ගැන ප්‍රශ්නයක් නැත. පිළිතුරු බලා සිටිය යුතු ය.

තම වාර්තාවට පිළිතුරු ලබා ගැනීමට කාර්යාලයට යාමට පෙර අලෙක්සේයි සැටිය මත වැතිර දෑස් ඇරගෙන කල්පනා කරන්නට විය. මුළු රැය ම පාහේ නොනිදා පහන් කළ අලෙක්සේයි උදෙන් ම නැගිට රැවුළු කපා මූණ සෝදා පළමුවෙන් ම කාර්යාලයට ඇතුළු වී තම අනාගතය විසඳීමට භාර ව ඇති මේජර වෙත ආවේ ය. මේජර ඔහු නොදුටුවාක් මෙන් බොහෝ වේලාවක් කඩදාසි, ලිපිගොනු අවුස්සමින් සිට, පසු ව තම ලේකම්වරියට ටෙලිෆෝන් කොට ලිපි ගොනුවලට අංක දමන සැටි බොහෝ වේලාවක් විස්තර කොට, අසුනෙන් නැගිට පිට වී ගියේ ය. බොහෝ වේලාවක් යනතුරු ආපසු නොපැමිණි ඔහු, පළමු ව අලෙක්සේයි සිත් නොගත්තේ ය. දැන් ඔහු අලෙක්සේයිගේ කෝපයට ලක් වී ඇත. අවසානයේ දී නැවත පැමිණි මේජරයා දින දර්ශනයේ කොළයක් පෙරළා අලෙක්සේයි දෙස බැලී ය.

"ජොෂ්ඨ ලයිතන් මා හමුවන්ටද ආවේ?" ඔහු ආත්මාඩම්බරයෙන් පැමිණි කාරණය ගැන මේජරට විස්තර කළ පසු, ඔහු ලේකම්වරිය ලවා අලෙක්සේයි මෙරේස්යෙව්ගේ පෞද්ගලික ලිපිගොනුව ගෙන්වා ගෙන බැලී ය. "සැත්කමින් දෙපා කපා දමලා ය" යන වැකිය කියවූ පසු මේජර මෙතෙක් වේලා සිටගෙන සිටි අලෙක්සේයිට වාඩි වන ලෙස පුටුවක් පෙන්වී ය. නැවත ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුවේ අවසාන පිටුව දක්වා කියවූ මේජර අලෙක්සේයිගෙන් ප්‍රශ්න කළේ ය.

"තමුසෙ ඉල්ලා සිටින්නේ මොකද්ද?"

"ප්‍රහාරක අහස්යානා සේනාංකයට පත්වීමක්"

මේජර පුටු ඇන්දට හේත්තු වී තමා ඉදිරිපිට සිටින අලෙක්සේයි දෙස විස්මයෙන් බලා නැවත වරක් වාඩි

වන ලෙස කියමින් පුටුවක් පෙන්වී ය. මේජරගේ ඇස් බැමි තෙල් පෙරෙන නළල දක්වා ඉහළ ගොස් තිබිණි.

"තමුසෙට අහස්යානා පදවන්ට බැහැ නෙව?"

"මට පුළුවනි, මම අහස්යානා පදවනවා."යැයි කී අලෙක්සේයි "මාව අභ්‍යාස පාසලකට යවන්නැ"යි මහ හඬින් කීය. අසල මේසවල වැඩවල යෙදෙමින් සිටි අනෙකුත් නිලධාරීහු හිස් ඔසවමින් මේ තලෙළු ලයිතන් තැන දැඩි ලෙස ඉල්ලා සිටින්නේ මොනවා දැයි අවබෝධ කර ගැනීමට මෙන් බැලූහ.

"මේ අහනව. කකුල් නැතුව කොහොමද ඔය වැඩේ කරන්නේ? පිස්සුවක් නෙව. කවදාවත් අහල තියෙනවද? තමුසෙට කවුද අවසර දෙන්නෙ?" මෙසේ ඇසූ මේජර තමා ඉදිරිපිට සිටින්නේ පිස්සෙක් දැයි සැක සිතින් බැලී ය.

අලෙක්සේයිගේ කෝපාන්විත මුහුණ හා අනුකම්පාසහගත බැල්ම දෙස බැලූ මේජර වඩාත් මුදු ලෙස කතා කිරීමට වෑයම් කළේ ය.

"මීට ඉස්සෙල්ලා අහල නැතුවට මීට පස්සෙ අහවි" යැයි අලෙක්සේයි පිළිතුරු දුන්නේ ය. පළමුවැනි ලෝක යුද්ධයේ දී කකුලක් නැති මිනිහෙක් අහස්යානා පැදවීම පිළිබඳ පුවත පළ වූ ලිපිය මේ වර ඔහු මේජරට දුන්නේ ය.

අසල මේසවල වැඩ කරමින් සිටි නිලධාරීහු තම වැඩ නවත්වා සාකච්ඡාවට සවන් දුන්හ. එක් නිලධාරියෙක් තම අසුනෙන් නැඟිට මේජර වෙත විත් ගිනිපෙට්ටියක් ඉල්ලන ගමන් අලෙක්සේයි දෙස බැලී ය. මේජර ඔහු දුන් ලිපිය කියැවී ය.

"මේක අපට ලියවිල්ලක් හැටියට ගණන් ගන්න බැහැ. අපට වෙනම නීති රීති තියෙනව. අහස්යානා හමුදාවට නුසුදුසු අය ගැන විස්තර එහි තියෙනවා. කකුල් දෙක නැති අය ගැන නෙවෙයි, ඇඟිලි දෙකක් නැති වුණු අයට පවා අහස්යානාවක් පැදවීමට අවසර දීමට මට බලයක් නැහැ. මේ ලිපිය ආපහු ගන්න. මේක ඔප්පු කිරීමක් නොවේ. මට තමුසෙගෙ ආසාව ගැන තේරුම් ගන්ට පුළුවනි..." යැයි මේජර කීවේ ය.

තව මොහොතකින් අලෙක්සේයි මේජරගේ මූණට ළඟ

ඇති තීන්ත කුඩුවෙන් ගසනු ඇතැයි යන හැඟීම ඔහුට ඇති වුව ද, ඔහු එය යටපත් කර ගනිමින්, "මේ ලියවිල්ල ගැන මොනවද කියන්නේ?" යැයි ඇසී ය.

පළමුවැනි ශ්‍රේණියේ වෛද්‍යවරයා විසින් දෙන ලද ලියුම මේසය මත තැබී ය. මේජර සැක සිතින් ලියුම කියැවී ය. එය නියම සහතිකයකි. අහස්යානා හමුදාවේ ජනප්‍රිය මිරොවොල්ස්කි අත්සන් තබා ඇති මේ ලියවිල්ල දෙස වෛද්‍ය කොමිෂන් සභාවේ මුද්‍රාව සහිත විය. එය කියවූ පසු මේජර තැන වඩාත් ආචාරශීලී ව කතා කරන්නට විය. ඔහු ඉදිරියේ සිටින්නේ පිස්සකු නොවේ. මේ තරුණයා ඇත්ත වශයෙන් ම අහස්යානා පැදවීමට ඉටාගත් එකෙකි. කකුල් නැති මොහු එතරම් ගරු කටයුතු වෙදනා පවා රැවටීමට සමත් වී ඇත.

"ඒ කොහොම වුණත්, ඉල්ලීමට ඉඩ දෙන්ට බැහැ."යි මේජර අලෙක්සේයි මෙරේස්යෙව්ගේ පෞද්ගලික ලිපි ගොනුව පැත්තකින් තැබී ය. "පළමුවෙනි ශ්‍රේණියේ යුද්ධ වෛද්‍යවරයාට කැමැති දෙයක් ලියන්ට පුළුවනි. අපට දීල තියෙන අණ හා නියමයන් අනුව සුදුසු නැති අය අහස් හමුදා සේවයට බඳවා ගන්ට බැහැ. මම නීතිය උල්ලංඝනය කළොත්, ඒකට වග කියන්නේ දොස්තරද?"

අලෙක්සේයි තරබාරු උඩඟු මේජර දෙස කෝපාන්විත පිළිකුල මුසු බැල්මක් හෙළී ය. ඔහු නිසල ය. ආචාරශීලී ය. ඔහුගේ කරපටිය පිරිසිදු ය. අත්වල මවිල් ගහන ය. අවලස්සන ඇඟිලිවල නිය කපා ඇත. මොහුට විස්තර කරන්නේ කොහොමද? ඔහුට අවබෝධ කරගත හැකිද? අහස්යානා සටන් යනු කුමක් ද යන්න ඔහු දනිත්ද? ඔහු මුළු ජීවිත කාලයේ දී එක ම වෙඩි හඬක් පවා අසා නැතිවා විය හැකි ය. තම හැඟීම මැඩ ගත් අලෙක්සේයි මෙසේ ඇසී යː

"මම මොනවද කරන්නෙ?"

"තමුසෙට හොඳටම වුවමනා වෙලා තියෙනව නම් නිර්මාණ අංශයේ කොමිෂන් සභාවට යවන්ට පුළුවනි. හැබැයි වේලාසනින් ම දැනුම් දෙනව, තමුසෙගෙ වැඩේ හරි යන්නෙ නැහැ"යි මේජර දෙළර සෙලවී ය.

"යකාට ගියත් කමක් නැහැ. ඒ කොමිසමට වත් යවනව" මෙතෙක් වේලා සිටගෙන සිටි මෙරේස්යෙව් පුටුව මත වාඩි විය.

තම කාර්යය සපල කර ගැනීම් වස් කාර්යාලයෙන් කාර්යාලයට යාමට අලෙක්සේයි පටන් ගත්තේ ය. වැඩ බහුල විඩාපත් නිලධාරීහු ඔහුට සවන් දුන්හ. විස්මයට පත්වූහ. අනුකම්පා කළහ. පුදුම වූහ. ඉටු නොකළ හැකි බව පවසමින් දෑත් වැනූහ. ඇත්ත වශයෙන් ම ඔවුනට කළ හැකි දෙයක් තිබේ ද? ප්‍රධාන නිලධාරි මණ්ඩලය විසින් සම්මත කරන ලද පැහැදිලි නීති රීති මාලාවක් ද, එමෙන් ම අවුරුදු කීපයක් තිස්සේ හැඩ ගැසුණු සම්ප්‍රදායක් ද තිබේ. දෙපා නැතියකුට ඉඩ දීම සඳහා ඒ නීතිවලට හා සම්ප්‍රදායයට පටහැනි විය හැකි ද? ප්‍රහාරක අහස්යානාවක් පැදවීමේ ආසාවෙන් නිලධාරීන්ගෙන් අවසර ඉල්ලා සිටින දෙපා නැති තරුණයාට අනුකම්පා කළ ඔවුහු, ඔහුගේ ඉල්ලීම එළි පිට ප්‍රතික්ෂේප නොකළහ. එක් අංශයකින් තවත් අංශයකට ඔහුගේ ඉල්ලීම යැවී ය. හැම අංශයක දී ම ඔහුට අනුකම්පා කළ නිසා ඔහු පරීක්ෂණ කොමිසමක් ඉදිරියට යැවී ය.

ප්‍රතික්ෂේප කිරීම්, උපදෙස් දීම්, අනුකම්පා කිරීම්, උපහාස කිරීම් ආදිය නිසා අලෙක්සේයි කෝප නොවී ය. ඔහු තම හැඟීම මැඩ ගැනීමට සමත් විය. ඔහු යමක් ඉල්ලා සිටින්නෙකු කතා කළ යුතු සැටි උගත්තේ ය. එක ම දවසක දී නිලධාරීන් දෙතුන් දෙනෙකු ප්‍රතික්ෂේප කළ ද, ඔහු බලාපොරොත්තු සුන් කර නොගත්තේ ය. පයක් නැති අහස් නියමුවාගේ වීරක්‍රියාව ගැන ලිපිය හා වෙදනාගේ සහතිකය හැම කාර්යාලයක ම නිලධාරීන්ට පෙන්වීමත්, නැවත ඒවා නවා සාක්කුවේ දමා ගැනීමත් නිසා ඉරි තැළුණෙන් තෙල් කඩදාසියකින් අලවා අලුත්වැඩියා කිරීමට ඔහුට සිදු විය.

## 7

මෙරේස්යෙව් කොමිෂන් පරීක්ෂණයට පළමුවෙන් ම කැඳෙව්වේය. පරීක්ෂණ මඬුල්ලේ මුලසුන හොබවන ලද්දේ මිරොවොල්ස්කි වෙදනා විසිනි. ඔහු අලෙක්සේයි මෙරේස්යෙව් වහාම හඳුනා ගෙන නැඟිට ඔහුට අත දී

ආචාර කිරීමට ඉදිරියට ගියේ ය.

"මොකද? ගන්නෙ නැතිද? ඕව් තරුණයා තමුසෙගෙ තත්ත්වය හොඳ නැහැ. නීතිය තමුසෙට විරුද්ධව තියෙනව. කොහොමද නීතියට උඩින් පනින්නෙ?" යැයි ඇසූ වෙදනා අනුකම්පාව පළ කළේ ය.

ඔහු පරීක්ෂා නොකළ වෙදනා ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව මත කොළයක රතු පැන්සලයකින් මෙසේ ලියුවේ ය. "පරීක්ෂණය සඳහා අහස්යානා පාසලට යැවීමට සුදුසු බව කොමිෂන් සභාව තීරණය කළා ය." අවසර පත ද රැගෙන අලෙක්සේයි කොමිෂන් සභා ශාලාවෙන් පිටවිය. ඔහු පෞද්ගලික අංශයේ ප්‍රධාන සෙනවියා වෙත යාමට අවසර ඉල්ලා සිටි නමුදු, ඔහුට අවසර නොලැබිණි. අලෙක්සේයි කෝපයට පත් වී කෑගැසීමට ඉඩ තිබුණ ද, සෙනෙවියාගේ පෞද්ගලික ලේකම් තැන්පත් කපිතාන් කාරුණික පුද්ගලයෙක් වූයෙන්, ඔහුගේ කෝපය සන්සිඳිණි. අලෙක්සේයි කියන පරිදි 'රැකවල් දූතයන්' ඔහු නොරිස්සුව ද සීන් කළු උඩු රැවුළකින් හෙබි කපිතාන් ඔහුගේ සිත් ගත්තේ ය. අලෙක්සේයි කපිතාන්ට තම මෑත ජීවිත කතාව කීවේ ය. ඔහුගේ කතාවට බාධා කරමින් නිතර ටෙලිෆෝනය හැඬුවේ ය. වරෙක කතාව නවත්වා කපිතාන් තම ලොක්කාගේ කාමරයට දුව ගියේ ය. එහෙත් නැවත එන කපිතාන් කුඩා ළමයකු මෙන් දෙනෙත් විදහා ගනිමින් කතාවට සවන් දුන්නේ ය. වරෙක කුතුහලය ද විස්මය ද, තවත් වරෙක අවිශ්වාසය ද කපිතාන් තුළ ඇති විය.

"ඉතින් ඉතින් ඊට පස්සෙ?" යැයි ඔහු අලෙක්සේයිට සවන් දෙමින් ප්‍රශ්න කළේ ය. "මට විශ්වාස කරන්ට බැහැ. දෙවියම්ප විශ්වාස කරන්ට බැහැ!"

කාර්යාලයෙන් කාර්යාලයට යමින් තමා විඳි ගැහැට ගැන කී විට ළමයකු මෙන් කතාව අසාගෙන සිටි කපිතාන්ගේ මුහුණ වෙනස් විය. කාර්යාලවල සියලු රහස් දන ගෙන සිටි කපිතාන් තැන කෝපයෙන් කෑ ගැසී ය.

"උන් හරිම කාලකණ්ණියො වගයක්. උන්ට අයිතියක් නැහැ තමුසෙව ඔහොම රස්තියාදු කරවන්න... තමුසෙ ඉතාම දක්ෂ මිනිහෙක්. දෙපා නැති අයට අහස්යානා පදවන්ට බැරි බවත් ඇත්ත"

"නැහැ දෙපා නැතුව පුළුවනි" යැයි කී අලෙක්සේයි පුවත්පතින් කපාගත් ලිපිය හා වෙදනාගේ සහතිකය පෙන්වී ය.

"තමුසෙ දෙපා නැතිව අහස්යානා පදවන්නෙ කොහොමද? 'දෙපා නැති මිනිහට නැට්ටුවෙක් වෙන්න බැහැ' කියන කතාව අහල නැතිද"යි කපිතාන් ඇසී ය.

වෙන යමෙක් එසේ කීවේ නම් අලෙක්සේයි කෝප වී බැණ වදිනු ඇත. කපිතාන්ගේ කරුණාබර හැඟීම සහ උනන්දුව නිසා ඔහු එසේ නොකළා පමණක් නොව, ළමයකු සේ කෑ ගසමින් නැඟිට කෑ ගැසී ය.

"ඒව හරියන්නෙ නැත්ද?" නැඟිට සිටි අලෙක්සේයි කපිතාන්ගේ කාමරය තුළ නටමින් උඩ පනිමින් තම දස්කම් පෙන්වී ය.

කපිතාන් මහත් විස්මයෙන් ඔහු දෙස බලා සිට ඔහුගේ අයදුම්පත ගෙන නිහඬව සෙනෙවියාගේ කන්තෝරු කාමරයට ඇතුළු විය.

ඔහු බොහෝ වේලාවක් යනතුරු නොපැමිණියේ ය. සෙනෙවියාගේ කාමරයෙන් පිට වූ හඬ සහ කතා නිසා අලෙක්සේයිගේ හදවත සැලුණේ ය. වේගයෙන් දුවන මොටෝ රියකින් වංගු සහිත පාරක ගියාක් මෙන් ඔහුගේ හිස වේදනාවෙන් පෙළිණි.

කපිතාන් තැන සෙනෙවියාගේ කාර්යාලයෙන් පිට වූයේ මඳ සිනාවක් පාමිනි.

"තමුසෙ අහස්යානා පදවනවාට සෙනෙවියා කැමති නැහැ. ඒ වුණාට තමුසෙව අහස් තොටු පොළවලට උපකරණ සැපයීමේ අංශයේ සේවයට මාරු කළා. පඩිත් ආහාර සලාකයත් අඩු නොකර. ඇඳුම ද අඩු නොකර..."යැයි කපිතාන් කීය.

"උපකරණ සපයන අංශයේ සේවය කරන්න මම ලැහැස්ති නැහැ. මම පඩි ගැන, ආහාර ගැන සොයන මිනිහෙක් නෙවි. මම අහස් නියමුවෙක්. මට යුද්ධ පෙරමුණට ගිහින් සටන් කරන්ට ඕන! ඇයි තමුසෙලාට මාව තේරුම් ගන්ට බැරි? මෙයටත් වඩා පැහැදිලිව මට කියන්ට බැහැ..."

කපිතාන් මෙවර වඩාත් පුදුම විය. වෙන කෙනෙකුට මෙවැනි වාසියක් කළොත් ඒ මිනිහා සන්තෝෂයෙන්

නටාවි... මේ මිනිහා මහ පුදුම කෙනෙක්! එහෙත්, මේ පුදුම මිනිහා කපිතාන්ගේ සිත් වඩාත් ඉක්මනින් දිනා ගත්තේ ය. කෙසේ හෝ අලෙක්සේයිට උපකාර කළ යුතු යැයි කපිතාන් ඉටා ගත්තේ ය. ඔහුට අමුතු අදහසක් පහළ විණි. ඇසක් අඩවන් කරගත් කපිතාන් තම ලොක්කාගේ කාමරය පෙන්වමින් මිමිනුවේ ය..

"අපේ සෙනෙවිතුමාට කළ හැකි හැම දෙයක්ම කළා. ඔයිටත් වඩා යමක් කරන්න එයාට බලයක් නැහැ. දෙපා නැතියෙකුට අහස්යානා පැදවීමට අවසර දෙන්න කියල ඔහු ලියුවොත් ඔහුවත් පිස්සෙකුට ගණන් ගනීවි. තමුසෙ කෙළින්ම යනව මහ සෙනෙවිතුමා වෙතට" යැයි කපිතාන් මහ සෙනෙවියා හමුවීම සඳහා බල පත්‍රයක් ද ලබා දුන්නේ ය.

පැය භාගයකට පසු අලෙක්සේයි මෙරේස්යෙව් මහ සෙනෙවි කාර්යාලයේ බුමුතුරුණු දිගේ සෙමින් ගමන් කළේ ය. ඔහු මීට පෙර ඒ ගැන කල්පනා නොකළේ ඇයි? මේ තරම් දවස් කාලය නාස්ති නොකර ඔහු පළමුවෙන් ම මේ කාර්යාලයට ආ යුතු ව තිබිණි. ජය හෝ පරාජය... මහ සෙනවියා ද පෙර කලක ප්‍රහාරක යානා පැදවීමෙහි ශූරයකු ලෙස ප්‍රසිද්ධියක් ලැබූ කෙනෙක් ලු.

උපකරණ සපයන අංශයේ සේවය කිරීමට ප්‍රහාරක අහස් නියමුවන් කැමැති නොවන බව ඔහුට අවබෝධ විය යුතු ය.

මහ සෙනෙවියා හමු වීමට සෙනෙවිවරු සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු පැමිණ සිටිහය. ඔවුහු දුම් බොමින් පහත් හඬින් කතා කළහ. ජ්‍යෙෂ්ඨ ලයිතන් අලෙක්සේයි මෙරේස්යෙව් පමණක් දුම් නොබී අමුතු හැඩයකට පා තබමින් කාර්යාල කොරිඩෝරයේ ඒ මේ අත ඇවිද්දේ ය. ඔහුගේ වේලාව පැමිණි විට ඔහු මහ සෙනෙවිගේ ලෙක්ම් වන මේජර ඉදිරියට ආවේ ය.

"තමුසෙ මහ සෙනෙවිතුමා හමුවන්ටද ලයිතන් සහෝදරයා?" යැයි වටකුරු මුහුණක් ඇති මේජර තැන ඇසුවේ ය.

"ඔව්, මට පුද්ගලික වැදගත් ඉල්ලීමක් ඉදිරිපත් කරන්න තියෙනවා"

"ඔහෙ මට ඉස්සෙල්ලා ඒ ගැන විස්තර කරන්ට කැමති නැතිද? වාඩිවෙන්න. සිගරැට්ටුවක් දල්වා ගන්නවද?" මේජර තැන අලෙක්සේයිට සිගරැට් පෙට්ටිය දිගු කළේ ය.

සිගරැට්ටුවක් අතට ගත් අලෙක්සේයි එය නොදල්වාගත් නමුදු, ඇඟිලිවලින් පොඩි කරමින් කපිතාන්ට කීවාක් මෙන් තම කතාව මේජරට ද කීවේ ය. සෙනෙවිවරුන්ගේ 'රැකවල් දූතයන්' ගැන අලෙක්සේයි තුළ තිබූ අමනාපය එදින දුරු විය. ඔහු අලෙක්සේයිගේ කතාවට සවන් දුන්නේ සැලකිල්ලෙනි. ව්‍යාජ ගති ඔහු තුළ නොවී ය. ඔහු පුවත්පත් ලිපිය ද වෙදනාගේ වාර්තාව ද කියැවී ය. කපිතාන් ඉදිරියේ නැටුවාක් මෙන් නැවත වරක් මේජර ඉදිරියේ ද නැටීමට ඔහු නැඟී සිට ගත්තේ ය. තම බලාපොරොත්තු සුන් වී යාමට පවා ඉඩ තිබිණි. එවිට ම දොර හැරගෙන සිහින් උස පුද්ගලයෙක් එළියට ආවේ ය. කළු හිසකේ සහිත ඒ පුද්ගලයාගේ ඡායාරූපය දුක ඇති අලෙක්සේයි ඔහු මහ සෙනෙවියා බව එකවර ම හඳුනා ගත්තේ ය. තමා පිටුපසින් ආ සෙනෙවියාට ඔහු පහත් හඬින් යමක් කී ය. කැලඹී සිටි මහ සෙනෙවියා අලෙක්සේයි නොදිටී ය.

"මම ක්‍රෙම්ලිනයට යනවා. හවස හයට අහස්යානාවක් සූදානම් කරන්න ස්ටාලින්ග්‍රාඩ්වලට යන්න. වෙර්හ්නායා පග්රෝම්නයාවලට අහස්යානය පාත් වෙන්න ඕන" මේජරට කී මහ සෙනෙවියා අත්ඔරලෝසුව දෙස බලා ඉක්මනින් පිට විය.

එවෙලෙම අහස්යානාවක් අවශ්‍ය බව ටැලිෆෝන් මගින් දන් වූ මේජර අලෙක්සේයි ගැන මතක් වී දැත් වැනී ය.

"අවාසනාවක හැටි, අපි ස්ටාලින්ග්‍රාඩ් යනවා. තමුසෙට නැවත බලා ඉන්ට සිදුවේවි. නවතින්න තැනක් තියෙනවද?"

තමා ඉදිරියේ පෙනී සිටි මේ අසමාන මිනිසාගේ මුහුණ මොහොතකට පෙර අධිෂ්ඨානයෙන් පිරී පැවැතිය ද දුන් ඔහු බලාපොරොත්තු රහිත ව විඩාපත් ව සිටින සැටි දුටු මේජර තැන මෙසේ කීයඃ

"කමක් නැහැ. අපේ ලොක්කගෙ හැටි මම දන්නව. ඔහු වුණත් මෙවැනි තීරණයක් ගනීවි"

අලෙක්සේයිගේ ඉල්ලුම්පත අනුව, නිල කඩදාසියක යමක් ලියූ මේජර තැන එය ලියුම් කවරයක බහා "පෞද්ගලික අංශයේ ප්‍රධාන තැනට" යන වැකිය ලියා අලෙක්සේයි අතට දී ඔහුට සුබ පැතී ය.

"තමුසෙගෙ පැතීම හැම අතින්ම සාර්ථක වේවා!"

එම ලිපියේ මෙසේ සඳහන් විය. "ලයිතන් අලෙක්සේයි මෙරේස්යෙව්ට නැවත ප්‍රහාරක අහස්යානා පැදවීම සඳහා හැම උපකාරයක් ම හා සැලකිල්ලක් ම දැක්විය යුතුයි"

පැයකට පසු අලෙක්සේයිට උපකාර කළ කාරුණික කපිතාන්වරයා අලෙක්සේයිව තම ලොක්කාගේ කාමරයට කැඳවී ය. මහලු තරබාරු සෙනෙවියා තම දිගැති ඇස්බැමි හකුළුවා ගනිමින් ලියුම කියවා අලෙක්සේයි දෙස බැලී ය. ඔහුගේ නෙත් විශාල ය. නිල්පාට ය. දයාන්විත ය. හේ සිනාසුණේ ය.

"මහ සෙනෙවියා හමුවුණා. හරිම ඉක්මන්කාරයෙක් මම නුඹව උපකරණ සැපයීමේ අංශයට යැවූ හන්දා නුඹ අමනාප වුණාද? හා-හා-හා!" ඔහු හඬ නඟා සිනාසුණේ ය. "හරිම දක්ෂයෙක්! අහස් නැවියෙකුගෙ නියම ලේ නුඹේ ඇඟේ තියෙන්නෙ. උපකරණ අංශයේ සේවය කරන්න කැමති නැහැ. එයාට අපි නින්දා කළා!... හරිම විහිළුවක්!... නැට්ටුවා මට මොනවද කරන්න කියන්නෙ, ආ? තමුසෙ බෙල්ල කඩා ගත්තම මගේ හිස ගහල දාවි. මේ මහල්ලා මොකටද දෙපා නැති මිනිහෙකු අහස්යානා පදවන්ට යැව්වෙ කියලා අහවි... මොනව වේවිදැයි දන්නෙ කවුද? මේ යුද්දෙදි අපේ කොල්ලො ලෝකය මවිත කළේ ඔය වගේ දේවලින් විතරක් නෙවි... මෙහෙට දෙනව තමුසෙගෙ ලියවිලි."

මහලු සෙනෙවියා අලෙක්සේයිගේ අයැදුම් පත මත නිල් පැන්සලයකින් නොපැහැදිලි ලෙස මෙසේ ලියුවේ ය. "අහස්යානා පැදවීම පුහුණු කරන පාසලට යැවීමට තීරණය කළේ ය" අලෙක්සේයි මෙරේස්යෙව් වෙව්ලන අත්වලින් එම ලියුම අල්ලා ගත්තේ ය. සෙනෙවියාගේ තීරණය ඔහුගේ මේසය ළඟ සිටගෙන කිය වූ අලෙක්සේයි පඩිපෙළ අසල දී ද, කාර්යාලයෙන් පිටවන දොරටුව අසල දී ද, කියැවී ය. ට්‍රෑම් රථයට ගොඩ වුණු හෙතෙම නැවතත්

එම ලියුම කියවා, වැස්ස ද නොතකා පදික වේදිකාවේ සිටගෙන තව වරක් කියැවී ය. නොසැලකිලිමත් ලෙස ලියා ඇති ඒ වචන කීපයේ තේරුම, පෘථිවි ගෝලයේ සියලු මිනිසුන් අතරින් වටහා ගෙන ඇත්තේ ඔහු පමණකි.

## 8

මොස්කව් අසල කුඩා අහස්යාත්‍රාංගණයක් අසල තිබුණු අභ්‍යාස පාසලේ ඒ දවස්වල වැඩකටයුතු අධික විය.

මොස්කව් අසල පිහිටි මේ අභ්‍යාස පාසලේ ප්‍රධානියා මිටි, මහත රතු මුහුණක් ඇති ලයිතන් කර්නල් ධුරයක් දරන නිලධාරියෙකි. නිදි මැරීම නිසා ඔහුගේ ඇස් ඉදිමිලා ය. "මොන කෙහෙල්මලකටද නුඹ මෙතෙන්ට ආවේ. නුඹ නැතුවට මට ඇති වැඩ හොඳටම ඇති"යි කියන්නාක් මෙන් පාසල් ලොක්කා අලෙක්සේයි දෙස බැලී ය. ඔහුගේ පත්වීම් කඩදාසි ලොක්කා උදුරා ගත්තේ ය.

"මට දෙපා නැතැයි කියා මා එළවා ගනීවි" යැයි ලොක්කාගේ මුහුණේ ඉපනැලි වැනි රැවුල් කොට දෙස බැලූ අලෙක්සේයි සිතී ය. එවිට ම වාගේ ලොක්කාට එකවර ටෙලිෆෝන් පණිවිඩ දෙකක් ලැබිණි. ඔහු එක රිසීවරයක් කනට තබා ගෙන අනෙක උරහිසට තද කරගෙන අනෙක් රිසීවරයට කට ළං කොට කෑ ගැසී ය. ඔහු කියවූයේ සෙනෙවියාගේ ලියුම පමණක් විය යුතු ය. සෙනෙවියාගේ අත්සනට පහළින් ඔහු මෙසේ ලීවේ ය. "තුන්වන අභ්‍යාස කණ්ඩායම භාර නවුමව් ලයිතන් තැනට - කණ්ඩායමට ඇතුළු කර ගන්න" රිසීවර දෙක ම පසෙක තැබූ ලොක්කා විඩාපත් ලෙස මෙසේ ඇසී ය.

"තමුසෙට නිල ඇඳුම් බලපත්‍ර තියෙනවද? ආහාර කූපන් තියෙනවද? මා දන්නවා තමුසේ කියන්න යන්නේ මොකද්ද කියලා. ඉස්පිරිතාලෙ හිටිය හන්දා වේලාවක් නැහැ කියලද? මම කොහොම ද තමුසෙට කෑම දෙන්නෙ. වහාම අයදුම්පත් ලියනවා. වැටුප ඉල්ලා අයදුම්පතක් ලියනවා. නැතිනම් තමුසෙව බාර ගන්නෙ නැහැ"

"හොඳමයි මම වහාම ලියන්නම්" යැයි අලෙක්සේයි කීවේ සතුටෙනි. ඔහු ඍජුව සිට ආචාර කොට "මට යන්න අවසර ද"යි ඇසී ය.

"යනවා" යැයි ලොක්කා අතක් වැනී ය. නැවත ඔහු මහ හඬින් කෑ ගැසී ය. "ඒයි මේ මොකද්ද?"යි ඔහු අලෙක්සේයිගෙන් අසමින් වසීලියි වසීලෙවිච් විසින් තෑගි කළ සැරයටිය පෙන්වී ය. වසීලියි වසීලෙවිච්ගේ නමේ මුල අකුරු සහිත ඒ සැරයටිය ගෙන යාමට අලෙක්සේයිට අමතක වූයේ ඔහු කැලඹුණු බැවිනි. "මේ මොකද්ද? විසි කරල දානවා. මේක යුද කඳවුරක් මිසක් අභිගුණ්ඨික කූඩාරමක් නොවේ. උද්‍යානයකුත් නොවේ. බස්තම්, වේවැල්, හැරමිටි ඉක්මනට කරේ බොරලාක්කම් එල්ලා ගෙන නියමු ආසනවලට කළු බළල්ලු ගෙන යාවි. ඔය හැරමිටිය මට පේන්න තියන්න එපා. හරිම ජේත්තුවක්!" යැයි කියමින් ලොක්කා බැණ වැදුණේ ය.

"එහෙමයි ලයිතන් කර්නල් සහෝදරයා!"

තුන්වැනි අභ්‍යාස කණ්ඩායම භාර ලයිතන් නවූමව් සොයා පළමුවෙනි දවසේ ම අලෙක්සේයි ගියේ ය. මිටි, දිගැති අත් සහිත කඩිසර මිනිසකු වූ නවූමව් "T"[1] ලකුණ අසල දුවමින්, උෂ්කා නමැති කුඩා අහස්යානය පියාසර කරන සැටි බලමින් එය පදවන්නාට පරුෂ වචනයෙන් බැණ වැදුණේ ය.

"ඒකා හරිම පකිස් පෙට්ටියක්... පිටි මුට්ටියක්... ප්‍රහාරක අහස් නැවියෙක් ලු. මාව රවට්ටන්න එයාට බැහැ!"

මෙරේස්යෙව් ඍජු ව සිටගෙන තමා හඳුන්වා දුන්න ද, අතක් ගසා දමූ නවූමව් අහසට අතක් යොමු කරමින් මෙසේ කෑ ගැසී යː

"පේනවද? ප්‍රහාරක අහස් නැවියගෙ හැටි. 'ගුවනේ තර්ජකයා!' ඒ මේ අත පාවෙනවා"

ගුරුවරයා අලෙක්සේයිගේ සිත් ගත්තේ ය. සිතින් හා කයින් තම රැකියාවට ආදරය කරන මෙවැනි මිනිසුන්ට අලෙක්සේයි කවදත් ඇලුම් කළේ ය. දක්ෂ හා කාර්යශූර නියමුවන්ට ඔවුන් සමඟ ඇසුරු කිරීම ලෙහෙසිය. නියමුවා අහස්යානය පදවන සැටි බලා සිටි නවූමව් ඔහු විවේචනය කළේ ය. නියමු ගුරු නවූමව් තම නවක සිසු දෙස විනිවිද යන බැල්මක් හෙළී ය.

"මගේ කණ්ඩායමටද? නම මොකක්ද? මොන අහස්යානාවද පැදෙව්වෙ? අහස් සටන්වල යෙදිල

1 එය අහස් යානය ගොඩ බෑසීමට සුදුසු පෙදෙස ය.

තියෙනවද? කොපමණ කල් පදවන්නෙ නැතුව හිටියද?"

තමාගේ පිළිතුර නවුමව්ට ඇසිණි යැයි අලෙක්සේයිට කිව නොහැකි ය. ඔහු නැවත අහස දෙස බලමින් හිරු රැස්වලින් දෙනෙත් මුවා කරමින් අතක් මිට මොළවාගෙන නැවත අහස් නැව්යාට බණින්නට විය.

"අන්න බලනවා. හරිම බර කරත්තයක්. විසිත්ත කාමරයට රිංගපු මී හරකෙක් වගේ"

හෙට උදේ පැමිණෙන ලෙසත්, පැමිණි විගස පරීක්ෂණය සඳහා අහස්යානාවක් පැදවීමට දෙන බවත් නවුමව් අලෙක්සේයිට කීවේ ය.

"දැන් නිවාඩු ගන්න. ගමන් මහන්සි ඇති නෙව ද? කෑම ගත්තද? කලබල මැද්දේ තමුසෙට ආහාර දීමට අමතක වෙන්නත් පුළුවනි..." යි කී නවුමව් නැවත අහස්යානය පදවන්නාට බැණ වැදුණේ ය. "...පල් මෝඩයෙක්! නුඹ බිමට බැහැපන්කො, නුඹට යස ප්‍රහාරක නැව්යෙක් පෙන්වන්න"

අලෙක්සේයි විවේක ගැනීමට නොගියේ ය. බැටෑලියනයේ සපත්තු මහන්නා සොයා ගොස් ඔහුට සතියක දුම්කොළ සලාකය දෙන බවට පොරොන්දු වූ අලෙක්සේයි තම බොරු කකුල් අහස් යානයේ පැඩල්වලට සවි කිරීම සඳහා ගාංචු සහිත හම්පටි දෙකක් සාදා දෙන ලෙස ඉල්ලා සිටියේ ය. ඔහු නැවත අහස් තොටුපළට විත් සවස් වන තුරු ම ගුවන් ගත් අහස්යානා නැරඹී ය.

ඔහුට ඒවා සාමාන්‍ය පියෑඹීම් නොවී ය. ශූර අහස් නියමුවන්ගේ තරගයක් සේ එය සැලකූ ඔහු අවසාන අහස්යානය ගුවන් තොටුපළට පැමිණි පසු එය බැඳ දැමීම දක්වා බලා සිටියේ ය. අලෙක්සේයි ගුවන් ගත් හැම යානයක් දෙස ම නෙබැලී ය. ඔහු වඩාත් ප්‍රිය කළේ වටපිටාවට ය. අහස්යානා නඟන හඬට ය. රොකට්වල ශබ්දයට ය. පෙට්‍රල් හා තෙල් සුවඳට ය. අහස්යානය හෙට තමාට අකීකරු වී විපතක් සිදු වනු ඇත යන හැඟීම ඔහුගේ සිතට නොවැදිණි.

උදෑසන ගුවන් තොටුපළ හිස්ව තිබිය දී අලෙක්සේයි පැමිණියේ ය. ඇත එන්ජිම රත් කරන හඬ ඇසිණි. ගුවන් තොටුපළේ ගිනි උදුන්වලින් ගිනි දලු පිටවිය. අවර පෙති

කරකැවූ මිකැනික්වරු ඒවා නයින් මෙන් සිතා ඇත් වූහ. උද්‍යෑසන වැඩ ආරම්භ විය.

"ලෑස්තියි"

"ස්පර්ශය දැනෙනවද?"

"ඔව් දැනෙනවා"

මෙතරම් පාන්දරින් ගුවන් තොටුපළට ආවේ මන් දැයි කිසිවෙක් අලෙක්සේයිගෙන් අසා ඔහුට බැණ වැදුණහ. රොස් වූවන්ට විහිළු කළ අලෙක්සේයි සිතින් තමාට මෙසේ කියාගත්තේ ය.

"ස්පර්ශය දැනෙනවා, ස්පර්ශය දැනෙනවා, ස්පර්ශය දැනෙනවා" අහස්යානය සෙමෙන් සෙමෙන් ගුවන් මඟට පිවිසියේ ය. ඒවායේ අත් අඬු වැනෙන්නට වූයෙන් මිකැනික්වරු ඒවා දෙපැත්තෙන් අල්ලා ගත්හ. මේ වන විට පැමිණි නවූමව් කොතරම් කුඩා සිගරැට් කොටයක් උරන්නට වී ද යත්, දුම්කොළ කාරමෙන් වැසී ගත් ඔහුගේ ඇඟිලි තුඩුවලින් දුම් පිට වෙන්නාක් මෙන් දැනිණි.

අලෙක්සේයි මිලිටරි සැලියුට් ආචාරයකින් ඔහු පිළිගත්තේ ය. "තමුසෙ ආව ද?"යි ඇසූ නවූමව් " ඉස්සෙල්ලා ආ අයට ඉස්සෙල්ලා බෙදනවා. අංක 9 අහස් යානයේ පිටුපස ආසනයට නඟිනවා. මම මොහොතකින් එන්නම්. බලමු තමුසෙගෙ දක්ෂකම්" යැයි පැවසී ය.

නවූමව් තම සිගරැට් කොටය දෙතුන් වරක් උරන්නට විය. අලෙක්සේයි අහස්යානය දෙසට ගියේ ය. නවූමව් පැමිණෙන්නට පෙර ඔහු තම බොරු කකුල් දෙක අහස්යානාවේ පැඩල්වලට සවි කළ යුතු ය. ඔහු හොඳ මිනිසෙක් වුව ද, කුමක් කරත් ද? ඔහු බැණ වැදී පරීක්ෂණය සඳහා අහස්යානයක් නොදෙනු ඇත. අලෙක්සේයි වැනි වැනී අහස් යානයේ අත් අණ්ඩක් දිගේ ගොස් පිටුපස ආසනයට ඇතුළු වුණ ද, පැඩල්වලට පා තැබීමට අපොහොසත් විය. කැලඹීම හා පුරුදු නැතිකම ඊට හේතු විය. දිගැති මලානික මුහුණක් ඇති මැදිවියේ සිටි මිකැනික් අලෙක්සේයි දෙස බලන්නේ පුදුමයෙන් මෙන් සිතී ය. "මේ බැල්ලිගෙ පුතා බීලා"

අවසානයේදී අමාරුවෙන් තම බොරු කකුල් දෙක පෙඩල් ඇති කුහරයට ඔබා ගත් විට ඔහුට ඉබේටම

ආසනයේ ඉන්දවිණි. ඔහු තම බොරු කකුල් දෙක පැඩල්වලට තබා ගාංචු සහිත හම්පටිවලින් ඒවා සවි කළේ ය. හම්පටි අගනා ලෙස සාදා තිබිණි. අලෙක්සේයිට සිය ළමා වියේ දී හැඳි හිම යානා සහිත සපත්තු සිහි විය.

නවූමව්, අලෙක්සේයි වාඩි වී සිටි ආසනයට හිස ඔබා විමසිල්ලෙන් ප්‍රශ්න කළේ ය.

"තමුසෙ බීලද? හුස්ම පිට කරනවා බලන්න."

අලෙක්සේයි ප්‍රශ්වාස කළ විට එහි මත්පැන් ගඳක් නොතිබුණෙන්, සතුටු වුණු නවූමව් මිකැනික් දෙස තර්ජනාත්මක ලෙස බලා අණ දුන්නේ ය.

"ලෑස්තිද?"

"ස්පර්ශය!"

"ඔව් ස්පර්ශය!"

අහස්යානයේ එන්ජිම කීප වරක් ගොරවා, පසුව රිද්මයානුකූල ව හඬ නැගුවේ ය. ප්‍රීති වූ අලෙක්සේයි එකවරම ගෑස් ලිවරය ඇරියේ ය. එවිට ම ශබ්ද නළය දිගේ නවූමව්ගේ රොස් හඬ ඇසිණි.

"වළන් කඬේ ගොනා වගේ පනින්ට එපා!"

නවූමව් ක්‍රමයෙන් ගෑස් ලිවරය විවෘත කරත් ම අහස්යානය තරමක් උඩ පැන ධාවනය කරන්නට විය. නවූමව් සුක්කානම අතට ගත් විට, ඒ කුඩා අහස්යානය ගුවන් ගත්තේ ය. හැම අහස් නැවියකු ම පළමුවෙන් පුරුදු වන්නේ මෙවැනි යානාවලිනි.

හැඩයට තබා ඇති කැඩපතින් නවූමව්ට තම නවක සිසුගේ මුහුණ පෙනේ. බොහෝ කලක් අහස්යානා නොපදවන අයගේ මුහුණ ඔහු කී වරක් දැක තිබේ ද? ශූර අහස් නියමුවන්ගේ තෘප්තිමත් සිනාව ද, රෝහලින් රෝහලට යමින් ප්‍රතිකාර ගත් උනන්දු සහගත අහස් නියමුවන්ගේ ප්‍රබෝධවත් මුහුණ ද ඔහු දැක ඇත. බරපතළ අනතුරුවලට මුහුණ පෑ නියමුවෝ සුවය ලැබූ පසු පළමුවරට අහස්යානාවක් පදවන විට කැලඹෙති, තොල් සපති. ඔවුහු මලානික වෙති. ගරුසරු නැති නවකයෝ පළමු වන වරට අහස්යානාවක් පදවන විට හැම දෙයක් ම අතපත ගාති. නියමුවන් පුහුණු කරන්නෙකු ලෙස අවුරුදු කීපයක් ම සේවය කර ඇති නවූමව් තමා සමඟ වාඩි වී අහස්යානය පදවනු අලෙක්සේයිගේ මුහුණේ ඇති

ස්වභාවය වැනි යමක් මීට පෙර දක නැත. එසේ වුව ද කඩවසම් පෙනුම ඇති ජොෆ්ය්ඨ ලයිතන් අලෙක්සේයි නවකයෙක් නොවේ.

ඔහුගේ මුහුණ රත් පැහැ ගෙන ඇත. තොල් සුදුමැලි ය. ඒ බිය නිසා නොවේ. නවූමව්ට තේරුම් ගැනීමට බැරි චිත්ත වේගයක සලකුණකි, එය. මොහු කවරෙක් ද? ඔහුට කුමක් සිදු වන්නේ ද? ඔහු මත්පැන් බී ඇතැයි මිකැනික් සිතුවේ කවර හේතුවක් නිසා ද? අහස්යානය තොටුපළේ සිට ගුවන් ගන්නා විට කළු පැහැති ඔහුගේ ඇස්වලින් කඳුළු කැට කඩා වැටුණේ මන් ද? දෙකොපුල් මත වැටුණු කඳුළු කැට සුළං පහර නිසා වියළිණි.

"මිනිහා ඔල්මාදකාරයෙක් වෙන්ට ඕන. ප්‍රවේසමෙන් කටයුතු කරන්න ඕන. මොනව වේවිද කවුද දන්නේ." යැයි නවූමව් සිතා ගත්තේ ය. එහෙත්, අලෙක්සේයිගේ මුහුණේ යම් කිසි ලක්ෂණයක් නවූමව්ගේ සිත් ගත්තේ ය. උගුරේ යමක් හිරවන සැටියක් ද, යන්ත්‍රය තමාට කීකරු වන සැටියක් ද නවූමව්ට දැනිණි.

"අහස්යානය පැදවීම තමුසෙට භාර දෙනවා."යැයි නවූමව් හඬනගා කී නමුදු, ඔහු යන්ත්‍රය සම්පූර්ණයෙන් ම භාර නොදී අත් හා පය බුරුල් කළේ ය. ඔය ඔල්මාදකාරයා මොනව හරි කළොත් නැවත පැදවීම භාර ගන්නා අටියෙනි.

නාවකයා අහස්යානය පදවන්නට විය. ඔහුගේ හැම ක්‍රියාවක් ම වුවමනාවෙන් බලා සිටි නවූමව් ඔහු පළපුරුදු ඇත්තෙකු බව වටහා ගත්තේ ය. පැරැණි අහස්යානා ශූරයකු වූ අභ්‍යාස පාසලේ නායකයා හැඳින් වූ පරිදි ඔහු "දෙවියන් එවූ අහස් නැවියෙක්" විය. පළමු වැනි වටය පැදවීමෙන් පසු ඔහු නවූමව් අලෙක්සේයි ගැන සැක නොකළේ ය.

අහස්යානය "ගුවන් විද්‍යාවේ හැම රීතියක් ම පිළිපදිමින්" අලෙක්සේයි විසින් පැදවිණි. අහස්යානය කෙළින් පදවන විට, නවකයා යම්තමින් වමට බර වී නැවත යන්තමින් දකුණට බර වන සැටි දුටු නවූමව් පුදුම විය. තවත් වරෙක ඔහු තරමක් ඉදිරියට නැමී නැවත පසුපසට බර විය. නවකයා තම ශක්තිය පිරික්සා බලන සැටියකි. හෙට අලෙක්සේයිට තනිව ම අහස්යානාවක්

පැදවීමට ඉඩ දිය යුතු යැයි ද, දවස් දෙක තුනක දී 'උට්-2' නමැති කුඩා ප්‍රහාරක යානාව පැදවීමට ඉඩදිය යුතු යැයි ද නවුමව් තීරණය කළේ ය. ලීයෙන් තැනූ 'උට්-2' නමැති අහස්යානය ප්‍රහාරක අහස්යානයක ආදර්ශයකි.

එදින ශීත දවසකි. උෂ්ණත්වය බින්දුවෙන් පහළ ශීත අංක 12ක් විය. නවුමව්ගේ හම්සපත්තු විනිවිද ගොස් දෙපා හිරිවැට්ටවීමට සමත් වූ ශීත සුළඟක් අහස්යානය තුළට වැදිණි. ගොඩ බැසීමට වේලාව ළං විය.

"ගොඩ බසිනු!" යැයි නවුමව් අණ කළ හැම වාරයක දී ම අලෙක්සේයිගේ උණුසුම් තියුණු කළු පැහැති නෙත් ඉල්ලීමක් කරන සැටි ද, එය ඉල්ලීමක් පමණක් නොව, ඉල්ලා සිටීමක් වන සැටි ද කැඩපතින් දුටු නවුමව් නැවත අණ කිරීමට ඉදිරිපත් නොවී ය. විනාඩි දහයක් වෙනුවට පැය බාගයක් පමණ වේලා අහස්යානය පැදවීමට අලෙක්සේයිට ඉඩ ලැබිණි.

අහස්යානය ගොඩ බට පසු ඉන් පැන ගත් නවුමව් උඩ පනිමින් අත් පිරිමදිමින් උණුසුම් විය. එදින උදෑසන ශීතල සුළඟ කටුක විය. අලෙක්සේයි බොහෝ වේලාවක් තම නියමු ආසනයේ වාඩි වී යමක් කරමින් සිට නොකැමැත්තෙන් මෙන් සෙමෙන් පිට විය. අහස්යානයේ පියාපත් ළඟ ඇන තබාගෙන වාඩි වූ අලෙක්සේයිගේ මුහුණ සැබැවින් ම මත් පැන් බී ගත් මිනිසෙකුගේ මෙනි. ශීත සුළං නිසා ඔහුගේ මුහුණ රත් පැහැ ගෙන ඇත. දෙනෙත් දීප්තිමත් ලෙස බැබැළිණි.

"කොහොමද හීතල ආ.. මගේ කකුල් හිරිවැටුණා. තමුසෙ සැහැල්ලු සපත්තු නොව ඇඳල ඉන්නෙ. කකුල් හිරි වැටුණේ නැත්ද?"

"මට කකුල් නැහැ"යි කී නවකයා තම සිත තුළින් මඳ සිනා පාමින් කල්පනා කළේ ය.

"මොනව නවුමව් ගල් ගැසිණි"

"මට කකුල් නැහැ"යි අලෙක්සේයි පැහැදිලි ලෙස නැවත වරක් පිළිතුරු දුන්නේ ය.

"කකුල් නැහැ කියන්නේ කොහෙමද? තමුසෙගෙ කකුල්වලට රෝගයක් හැදිලද?"

"කකුල් නැහැ... බොරු කකුල්"

නවුමව්ගේ හිසට යකඩ මිටියකින් පහරක් වැදුණු

කලෙක මෙන් ඔහු අන්ද මන්ද විය. මේ පුදුම තරුණයා ඔහුට කී කතාව නොවිය හැක්කකි. තව කකුල් නැහැයි කියන්නේ කොහොමද? ඔහු අහස්යානයක් පැදවූයේ මේ දූන් ය. ඇරත් ඔහු පැද වූ සැටි නරක නැත.

"පෙන්නාපන්" යැයි නවූමව් කීවේ යම් කිසි බියගත් හඬකිනි.

නවූමව්ගේ කුතුහලය නිසා අලෙක්සේයි කෝප නොවී ය. එය නින්දාවක් ලෙස ද හේ නොසැලකී ය. මේ ප්‍රීතිමත් කවටයා විස්මය පත් කිරීම ඔහුට සතුටකි. ඔහු කලිසම උස්සමින් තම දෙපා පෙන්වූයේ සර්කස් ක්‍රීඩාවක විජ්ජාකාරයකු මෙනි.

හමින් හා ඇලුමිනියම්වලින් සෑදූ තම බොරු කකුල් පෙන්නමින් ඒවා බලන නවූමව් හා මිකැනික් දෙස ද තම වාරය පැමිණෙන තුරු බලා සිටින නියමු සිසුන් දෙස ද අලෙක්සේයි මඳ සිනා පෑවේ ය.

අලෙක්සේයිගේ කැලඹීම් ද ඔහුගේ මුහුණේ ඇති වුණ අසමාන පෙනුම ද, කළු පැහැති ඔහුගේ ඇස්වලින් කඳුළු කැට කඩා වැටීම ද, අහස්යානය පැදවීමේ කාලය දිගු කරවා ගැනීමට ඔහු දූරූ තැත ද දූන් නවූමව්ට අවබෝධ විය. මේ සිසු ඔහු කැලඹීමට පත් කළේ ය. නවූමව් ඉදිරියට පැන අලෙක්සේයිගේ දෑතින් අල්ලාගෙන මෙසේ කීවේ යඃ

"තමුසෙ කොහොමද ඔවැනි වැඩක් කළේ. තමුසෙ දන්නවද... තමුසෙ කොහොම මිනිහෙක් ද කියල!..."

දූන් ප්‍රධාන කාර්ය සපල වී ඇත. ගුරුවරයාගේ හිත දිනාගෙන ඇත. සවස නවූමව් හමු වූ අලෙක්සේයි ඔහු සමඟ එකතු වී අභ්‍යාස වැඩ පිළිවෙළක් සෑදුවේ ය.

## 9

මාස පහකට වැඩි කලක් අලෙක්සේයි මෙරේස්යෙව් අහස්යානා අභ්‍යාස පාසලේ පුහුණුව ලැබී ය. ගුවන් තොටුපළ හිමවලින් වැසිණි. රෝද වෙනුවට අහස්යානයට හිම යානා සවි කළේ ය. වස්සාන ඍතුවේ දකින්නට ලැබෙන විවිධ පාට වෙනුවට අලෙක්සේයි දුටුවේ කළු සහ සුදු පාට පමණකි. ස්ටාලින්ග්‍රාඩ් මහ සටනේ දී පැසිස්ට් ජර්මන් හමුදාව අන්ත පරාජයක් ලැබූ බවත්, හයවෙනි

ජර්මන් හමුදාව සමූලඝාතනය කළ බවත් ජර්මන් මහ සෙනෙවි පවුලස් සිර භාරයට ගත් බවත් දැනගන්නට ලැබිණි. දකුණෙහි තවමත් මහා ප්‍රහාරයක ලකුණු පහළ විය. රෝත් මිස්ට්රොව් සෙනෙවියාගේ යුද ටැංකි හමුදාවෝ නිර්භයව ඉදිරියට ගොස් සතුරාට පහර දුන්හ. සතුරාගේ පිටුපස කඳවුර විනාශ කළහ. මෙවැනි සටන් පැන නැඟ ඇති අවදියක දී අලෙක්සේයිට අහස්යානා පැදවීම රෝහල් කොරිඩෝව දිගේ ඇවිදීම මෙන් ම, ඉදිමී ඇති කකුල් අගින් පැන නගින වේදනාව නොතකා බාල් නැටුම් හා 'මෂූර්කා' වැනි නැටුම් නැටීම මෙන් ම අපහසු කරුණක් විය.

නැවත අහස් හමුදාවට බැඳී සේවය කිරීමට ඔහු ප්‍රතිඥා දුන්නේ රෝහලේ දී ය. එම අරමුණ ඔහු වෙත ළඟා වීම සඳහා වූ වේදනා විඳිමින් විඩා නොතකා කටුක දුක්වලට හා බලාපොරොත්තු සුන්වීම්වලට මුහුණ පාමින් දැඩි අදිටනකින් යුතු ව ක්‍රියා කළේ ය. ඔහුගේ අලුත් ලිපිනයට ලොකු ලියුම් කවරයක් ලැබිණි. රෝහලේ හෙදිය වන ක්ලාව්දියා මීහයිලොව්නා ඔහුට ලියමින් ඔහුගේ දුක සැප ද ඔහුගේ අරමුණ කරා ඔහු කොතෙක් ළං වී ඇති ද ආදී දේ ගැන විමසුවා ය.

"තම අදහස් ඉටුවුණා ද? නැති ද?" යන ප්‍රශ්න ඔහු තමාගෙන්ම ඇසී ය. එයට පිළිතුරු නොදුන් අලෙක්සේයි තමාට ලැබුණු ලියුම් මිටිය පිරික්සී ය. එහි ලියුම් කීපයකි. එකක් මවගෙනි. අනෙක ඕල්යාගෙනි. තෙවැන්න යුද ටැංකි ලයිතන් ග්වොස්දෙව්ගෙනි.

මව විසින් එවන ලද ලියුම අලෙක්සේයි පළමුවෙන් ම කියවී ය. මව පුතුගේ දුක සැප ගැන මහත් වුවමනාවකින් විමසා තිබිණි. ලියුම අවසානයේ දී ජර්මනුන් ස්ටාලින්ග්‍රාඩයෙන් පන්නා දැමූ බව ඇය ලියා තිබිණි. ස්ටාලින්ග්‍රාඩ් මහා සටනින් පසු ඕල්යා දවස් පහක නිවාඩුවක් ගත කිරීමට කමීෂින්වලට ආ බවත්, ඇගේ ගේ ජර්මන් බෝම්බවලින් විනාශ වූ නිසා ඈ තමා සමඟ නැවැතුණු බවත් මව පුතාට එවූ ලිපියේ සඳහන් කර තිබිණි. ඕල්යා දැන් ඉංජිනේරු යුද්ධ හමුදාවේ ලයිතන් ධුරයක් දරන බවත්, ස්ටාලින්ග්‍රාඩ් මහ සටනේ දී තුවාල වූ බවත්, ඇට උසස් සම්මානයක් පිරිනමා ඇති බවත්,

එහි නම තමා හරි හැටි නොදන්නා බවත් ලියා තිබූ මව ඕල්යා ඇගේ නිවාඩු කාලය මුළුල්ලේ ම නිදා ගත් අතර, නොනිදා සිටි අවස්ථාවල දී දෙදෙනා ම ඔහු ගැන කතා කළ බවත් දන්වා තිබිණි. මවත්, ඕල්යාත් එක්ව කාඩ් කුට්ටම මගින් අනාගතය බැලූ අතර, නිතර ම කලාබර හේරාට උඩින් රුවිත පොරොව ආ බැවින් - මෙහි තේරුම අලෙක්සේයි හොඳින් දන සිටියේ ය. - රුවිත පොරව තම ලේළි වශයෙන් පිළිගැනීමට මව බොහෝ සෙයින් ම සතුටු බවත් මව පුතුට දන්වා තිබිණි.

මවගේ රාජ්‍ය තාන්ත්‍රිකමය ඉඟිය ගැන සිතමින් මඳ සිනාවක් පෑ අලෙක්සේයි, "රුවිත පොරොව" - ඕල්යා ලිපිය එවූ ප්‍රවේසමෙන් කඩා බැලී ය. ලියුම දිග නොවී ය. යුද අගල් හා ආරක්ෂක කපොලු තැනීමෙන් පසු ඉතා ම දක්ෂ අය නිත්‍ය ඉංජිනේරු යුද හමුදාවට බඳවාගත් බව සඳහන් කළ ඕල්යා, දූන් නිලයෙන් ඈ ලයිතන් කෙනෙකු බව ද කීවා ය. ඕල්යා සේවය කළ හමුදාව මමායෙව් කුර්ගාන්හි ආරක්ෂක කපොලු සෑදි ය. එය ස්ටාලින්ග්‍රාඩ් සටනේ දී ප්‍රසිද්ධියට පත් විය. පසු ව ඈ සේවය කළ හමුදා ට්‍රැක්ටර් කම්හල වටා ආරක්ෂක වළලලක් තැනී ය. ඈට රතු ධජයේ පදක්කම සහිත සම්මානයක් පිරිනැමී ය. උදලු තලයේ සිට ටින්වල ඇසුරූ ආහාර දක්වා වූ හැම දෙයක් ම වොල්ගා නදිය හරහා ගෙනෙන්නට වූ බැවින්, නිතර සතුරු ප්‍රහාරයට ලක් වූ බව ද ඕල්යාගේ ලියුමේ සඳහාන් විණි. ස්ටාලින්ග්‍රාඩයේ එක ද ගෙයක් හෝ ගොඩනැගිල්ලක් හෝ නැත. හැම තැන ම විනාශ වූ ගෙවල්, කම්හල් හා මාර්ග ය. එය හඳේ ඡායාරූපයකට සමාන විශාල වළවල්වලින් පිරී ඇත.

තුවාල ලැබූ ඕල්යා රෝහලෙන් පිට වූ පසු රියකින් ස්ටාලින්ග්‍රාඩය හරහා ගිය සැටි තම ලියුමෙන් අලෙක්සේයිට විස්තර කර තිබිණි. "ස්ටාලින්ග්‍රාඩය පුරා පැසිස්ට් භටයන්ගේ මළකඳන් ය. මහ පාර දෙපැත්තේ ගොඩ ගසා ඇති සතුරු මළ සිරුරු ගණන කොපමණ දැයි කිව නොහැකි ය. ඔබේ යහළුවා වන යුද ටැංකි ලයිතන් තැන සතුරු මළ සිරුරු දුටුවා නම් මැනවැයි මට සිතිණි. ඔහුගේ මව සහ පියා ද සහෝදරයන් සියලු දෙනා ද පැසිස්ට් ජර්මන්නු මරා දැමුවාට අපි ඔවුන්ගෙන්

පළි ගතිමු. එවැනි අයට සතුරු මළ සිරුරු පෙන්විය යුතු ය. ස්ටාලින්ග්‍රාඩ් සටනේ දී සතුරන් මාරාන්තික පරාජයක් ලැබූ සැටි චිත්‍රපටි මඟින් පෙන්විය යුතු ය."

"දැන් ස්ටාලින්ග්‍රාඩ් සංග්‍රාමයෙන් පසු ඈ ඔහුගේ බිරිඳ වීමට, එනම් වීරයකුගේ බිරිඳ වීමට සුදුසුකම් ලබා ඇතැ"යි යන වැකිය අලෙක්සේයිට නොතේරුණෙන් ඔහු එය කීප වරක් ම කියවී ය. මේ ලියුම ඕල්යා ලියා ඇත්තේ හදිසියකින් නොව, සෙමෙනි. ඇගේ සේනාංකය දුම්රියපොළට පැමිණි විට ලැබුණු විවේකය තුළ දී එය ලියා ඇත. මීළඟට තම සේනාංකය යන තැන නොදත් ඈ, තම ලිපිනය නොලීවා ය. ඇගෙන් තවත් ලියුමක් ලැබෙන තුරු ඈට පිළිතුරු සැපයීමට ඔහුට බැරි විය. වීරයන්ගේ වීරවරිය ඈ - යුද්ධයේ ගිනිජාලා මැද නොසැලී තම කාර්යය සපුරාලන ඒ තරුණිය - මිස ඔහු නොවෙයි.

...අවසානයේ දී නවූමව් අලෙක්සේයිට අවසාන පරීක්ෂණයට සූදානම් වන ලෙස දන්වා සිටියේ ය. "උට්යොන්කා" නම් වූ කුඩා අහස්යානාව පදවමින් අවසාන පරීක්ෂණයට මුහුණ පෑ යුතු විය. ඔහුගේ දක්ෂතාව පිරික්සනු ලබන්නේ නවූමව් නොව, ආචාර්ය මණ්ඩලයේ ප්‍රධාන තැන විසිනි. අලෙක්සේයි අභ්‍යාස පාසලට පැමිණි දින ඔහුට අකාරුණික ලෙස සැලකූ රතු මුහුණක් ඇති, තරබාරු ලයිතන් කර්නල් විසිනි.

ගුවන් තොටුපොළේ සිටගෙන තමා පදවන අහස්යානය දෙස විමසිල්ලෙන් බලා සිටින බව දැන ගත් අලෙක්සේයි තමා සිතුවාටත් වඩා උසස් අන්දමින් අහස්යානය පැදවී ය. ඔහු ඒ කුඩා අහස් යානයෙන් කොතරම් අසීරු අභ්‍යාස සරඹ කළේ ද යත්, ලයිතන් කර්නල් තැන ප්‍රබෝධවත් වී ප්‍රශංසා කළේ ය. පසු ව අලෙක්සේයි අහස්යානය ගුවන් තොටුපළට ගොඩ බස්සවා නිලධාරි මණ්ඩලය ඉදිරිපිට පෙනී සිටින විට නවූමව්ගේ ප්‍රීතිමත් මුහුණ දුටුවේ ය. ඔහු තමා පරීක්ෂණයෙන් සමත් වූ බවට එය සාක්ෂියක් විය.

"තමුසෙ හරිම දක්ෂයෙක්! දේව කරුණාව ලැබූ අහස් නැවියා කියන්නේ තමුසෙ වගේ උදවියට" යැයි කී ලයිතන් කර්නල් "තමුසෙට නරකද අපේ පාසලේ නැවතිල ගුරුවරයෙකු ලෙස සේවය කරන්ට ආ?" ඇසී ය.

අලෙක්සේයි එම ඉල්ලීම එක හෙළාම ප්‍රතික්ෂේප කළේ ය.

"ඔන්න මෝඩයෙක් වෙන්න හදනව. හැම එකෙකුටම යුද්ධ කරන්න පුළුවනි. උගන්වන්න ලේසි නෑ"

ලයිතන් කර්නල් තැනගේ ඇස් අලෙක්සේයි නැඹුරු වී සිටින සැරයටිය දෙසට යොමු විණි. ඔහු කෝපයට පත්ව කෑ ගැසී ය.

"ආයෙමත්! මෙහෙ දීපන්! නුඹ හැරමිටිය අරගෙන සිදාදියෙ ඇවිදින්න හදනවද? නුඹ කොහෙද ඉන්නෙ මහ පාරෙද... පැය හතළිස් අටක් හිරභාරයට... අණට අකීකරු වුණ හන්ද... කවච පාවිච්චි කරන අහස්යානා ශූරයා... පැය හතළිස්අටක් හිරභාරයට...ඇහුණද?"

අලෙක්සේයිගෙන් සැරයටිය උදුරා ගත් ලයිතන් කර්නල් තැන එය කැඩීමට සූදානම් විය.

"ලයිතන් කර්නල් සහෝදරය අවසර දෙන්න වාර්තා කරන්න. එයාගෙ කකුල් දෙක ම නැහැ" යැයි නවූමව් කීවේ ය. ලොක්කාගේ රතු මුහුණ සුදුමැලි විය. දෙනෙත් පිස දා ගනිමින් ඔහු අමාරුවෙන් හුස්ම ගත්තේ ය.

"ඒ කොහොමද? නුඹ මාව පිස්සෙක් කරන්න හදනව ද? ඒ කතාව ඇත්තක්ද?"

එය සත්‍යයක් බව අඟවමින් හිස වැනූ අලෙක්සේයි තම සැරයටිය දෙස බැලුවේ දැන් දැන් මහා විනාශයකට මුහුණ පෑමට සිදු වනු ඇතැයි යන බියකිනි. වසීලියි වසීලෙවිච් ඔහුට තෑගි කළ ඒ සැරයටියෙන් දැන් ඔහු සැබැවින් ම ඇත් නොවිණි.

ලයිතන් කර්නල් තැන සැක සිතින් දෙදෙනා දෙස බලමින් මෙසේ පැවසී ය. "හා තත්ත්වෙ එහෙම නම් උන්නැහෙ තමුසෙගෙ කකුල් දෙක මට පෙන්නනවා... ඔව්, ඔව්!"

අභ්‍යාසවලින් අලෙක්සේයි සම්මාන උපාධි ලබා ගත්තේ ය. අන් හැමට ම වඩා අලෙක්සේයිගේ දක්ෂතාව ගැන, නිතර කිපෙන පාසල් අධ්‍යක්ෂ වන, ලයිතන් කර්නල් පැහැදුණේ ය. "දක්ෂ, පළපුරුදු ඇති, ආත්ම ශක්තියකින් හෙබි නියමුවකු" ලෙස ලයිතන් කර්නල් අලෙක්සේයි හඳුන්වමින් ඔහුට චරිත සහතිකයක් දුන්නේ ය.

## 10

ශීත කාලය හා වසන්ත කාලය තුළ දී අලෙක්සේයි තම දක්ෂතාව දියුණු කරගැනීමෙහි යෙදුණේ ය. අලෙක්සේයි මෙරේස්යෙව් ඇතුළු තවත් නියමුවන් විශාල කණ්ඩයමක් එවකට නවීන පන්නයේ සෝවියට් අහස්යානාවක් වූ "ලා-5" පැදවීමට පුරුදු විය. එය අංගසම්පූර්ණ පුහුණුවක් ම විය. ප්‍රහාරක යානයේ එන්ජිම ගැන ද අනෙකුත් කොටස් ගැන ද, කාර්මික ශිල්පය ගැන ද ඔවුහු ඉගෙන ගත්හ. අහස්යානා පැදවීමේ ශිල්පය ගැන ශාස්ත්‍රීය දේශනයන් ඇසූ අලෙක්සේයි මවිතයට පත් විය. ඔහු සේවයෙන් ඈත්ව සිටි ඒ කෙටි කාලය තුළ දී සෝවියට් අහස්යානා විද්‍යාව බොහෝ සෙයින් වර්ධනය වී ඇත. යුද්ධය පටන් ගත් කාලයේ දී නවීනතම අහස්යනා වශයෙන් ගැනුණු අහස්යානා දැන් යල් පැන ඇති ඒවා බවට පත්ව ඇත. වේගවත්, 'ලාස්තොච්කා' සහ සැහැල්ලු 'මිග්' වර්ගවලට අයත් අහස්යානා උඩු ගුවනේ සටන්වලට ඔබින ඒවා විය. යුද්ධය පටන් ගත් කාලයේ දී උසස්තම අහස්යානා වශයෙන් නම් කළ මේවා දැන් නිපදවීම පවා නවතා ඇත. යුද්ධය පටන් ගත් පසු සෝවියට් අහස්යානා කම්හල් ඉතාමත් කෙටි කාලයක් තුළ දී ඉස්තරම් ම අහස්යානා වූ 'යාක්', 'ලා-5', මහ පොළොව මත හැම දෙයක් ම සමතලා කරමින් සතුරාගේ හිස මත බෝම්බ වෙඩි උණ්ඩ, ෂෙල් වෙඩි පතුරවමින් ජර්මනුන්ට මරු පෙන්වූ - ජර්මනුන් විසින් 'මාරයා' වශයෙන් නම් කරන ලද - ආසන දෙකේ 'ඉල්' යානය ද නිපදවූහ. සටන් වැදී සිටින ජනතාවගේ ප්‍රඥාව විසින් නිර්මාණය කරන ලද සංකීර්ණමය අහස්යානා විසින් අහස් සටන් වඩාත් අසීරු කරනු ලැබුවා පමණක් නොව, අහස් නියමුවාට එම යානය ගැන අංගසම්පූර්ණ අවබෝධයක් ද ලබා ගැනීමට බල කළේ ය. සටන් බිමේ දී අසමසම නිර්භීතකමක් ද ඉක්මනින් තමාගේ තත්ත්වය අවබෝධ කර ගැනීමද, සටන නියමිත අංග සම්පූර්ණ කොටස්වලට බෙදීම ද, අණ ලැබෙන තුරු නොසිට අවශ්‍ය හා වුවමනා තීරණ ගෙන සටන් කිරීම ද සෝවියට් අහස් නියමුවාගේ යුතුකම විය.

මේ හැම දෙයක් ම අතිශයින් ම සිත් ගන්නාසුලු විය.

ප්‍රතිප්‍රහාර දීම නොකඩවා කෙරිණි. ඉඩ පහසු ඇති පන්ති කාමරයේ වාඩි වී යුද්ධ විද්‍යාව හදාරන අලෙක්සේයි මෙරේස්යෙව් යුද පෙරමුණට ගොස් සටන් කිරීමට ඉඩ නොලැබීම නිසා දුක් විය.

අලෙක්සේයි සමග එක ම රෝහලේ ප්‍රතිකාර ගත් මේජර ස්ට්රුච්කොව් මේ විදුහලේ පුහුණුව ලැබීම ඔහුගේ සතුටට හේතු විය. ඔවුහු පැරණි මිතුරන් මෙන් මුණ ගැසුණ හ. ස්ට්රුච්කොව් මේ විදුහලට ආවේ අලෙක්සේයිට සති දෙකකට පමණ පසු ය. ඔහු පැමිණි වහා ම යුද්ධ කාලයට පවා අසමාන වූ දැඩි විනයගරුකත්වයට කීකරු වී අනෙකුත් අහස් නියමුවන් සමග කුලුපග විය. අලෙක්සේයි චිත්ත පීඩාවකින් පසුවන බව වටහා ගත් ස්ට්රුච්කොව්, රාත්‍රි ආහාරයෙන් පසු ඇඟ සෝදා නිදා ගැනීමට සැරසෙන විට ඔහු හමු වී මිත්‍ර ලීලාවෙන් මෙසේ පැවසුවේ යඃ

"තරුණයා කනගාටු වෙන්න එපා. මේ යුද්ධය ඉක්මනට ඉවර වෙන්නෙ නැහැ. බර්ලින් දක්වා යා යුතු දුර කොපමණ දැයි කියා බලපන්! අපට යුද්ධය කරන්න ඉඩ ලැබේවි. ඕන තරම් ඉඩ ලැබේවි"

ශීත ඍතුවේ මැද භාගයේ දී මෙරේස්යෙව් හා ස්ට්රුච්කොව් ඇතුළු කණ්ඩායම අහස්යානා පැදවීම ආරම්භ කළහ. කුඩා පියාපත් ඇති මාළුවකුට සමාන 'ලා-5' වර්ගයේ අහස්යානය පදවා පුරුද්දක් අලෙක්සේයිට තිබිණි. විවේක ඇති වේලාවේ දී ගුවන් තොටුපළට එන අලෙක්සේයි ඒ අහස්යානා ගුවන් ගන්නා සැටි ද, හැරෙන පෙරළෙන සැටි ද, ගුවනේ පිනුම් ගසන විට එම අහස් යානයේ කඳ ළා නිල් පාටින් බැබළෙන සැටි ද දුටුවේ ය. අහස්යානයට ළං වූ අලෙක්සේයි එහි පියාපත් අත ගාමින්, කඳට සෙමෙන් තට්ටු කළේ ය. ඔහුට එය යන්ත්‍රයක් නොව උසස් වර්ගයට අයත් ලස්සන අසකු මෙනි. අහස් නියමු කණ්ඩායම අහස්යානා පැදවීම සඳහා සූදානම් විය. හැම කෙනෙක් ම ගුවන් ගත වීමට නොඉවසිලිමත් වූහ. පළමු ව අහස්යානය පදවන්නේ කවුද යන්න ගැන තරගයක් ඇති වූවාක් මෙනි. ගුරුවරයා ස්ට්රුච්කොව් පළමුවෙන් ම කැඳවී ය. ඔහුගේ දෙනෙත් ප්‍රීතියෙන් බැබළිණි. මුහුණට දඟකාර ගතියක් ආරූඪ විය. තම පැරචුටය බැඳගෙන

නියමු ආසනයට උඩින් පියස්ස ස්ට්රුච්කොව් වසාගත්තේ උරුවම් බාමිනි.

'ලා-5' හේ ඇන්ජිම හඬ නඟමින් දිව්වේ ය. හිම සහිත වලා පටලයක් ඇති කළ අහස්යානය ගුවන් ගත්තේ ය. ගුවන් තොටුපළට ඉහළින් කවාකාර ලෙස පියාසර කළ ස්ට්රුච්කොව් ලස්සන පිනුම් කීපයක් ගැසුවේ ය. ප්‍රහාරක නියමුවෙක් දැනගත යුතු සරඹ අභ්‍යාස සියල්ල අගනා ලෙස කළේ ය. පියාපතෙන් පියාපතට ද උඩු යටිකුරු කොට ද පෙරළෙමින් ඔහු දස්කම් පෙන්වී ය. හිටි හැටියේ ම අතුරුදන් වූ ස්ට්රුච්කොව් ගුවන් තොටුපළේ ගොඩනැඟිල්ලට ඉහළින් මතු වී අහස්යානාව පැදවීමට තම වාරය එන තුරු බලා සිටි සිසුන්ගේ හිස්වලට වැදෙන නොවැදෙන තරම් ඉහළින් පියාසර කර නැවත අතුරුදන් වී නියමිත ස්ථානයට ගොඩ බසිනු වස් දක්ෂ ලෙස තම අහස්යානය මෙහෙය වී ය. දුටුවන් බලා සිටිය දී අගනා ක්‍රීඩාවකින් ජය ගත් දඟකාර කොල්ලකු සේ, සිනහවෙමින්, ප්‍රීතිවෙමින්, ප්‍රමෝදයෙන් යුතු ව ස්ට්රුච්කොව් අහස් යානයෙන් එළියට ආවේ ය.

"යානාවක් නෙවි, වීණාවක්. දෙවියම්ප ඇත්ත වීණාවක්!" යැයි ඔහු කීවේ, ඔහුගේ සාහසික බව නිසා ඔහුට දොස් පැවරූ ගුරුවරයාගේ කතාවට බාධා කරමිනි. "චයිකොව්ස්කිගේ සංගීත වාදනයක් පවා වාදනය කළ හැකි" යැයි කී මේජර ස්ට්රුච්කොව් තම ශක්තිමත් දෑත්වලින් අලෙක්සේයි වැළඳ ගනිමින් මෙසේ පැවසී ය: "ජීවිතය හරිම අගෙයි අලෙක්සේයි! දෙවියම්ප ඇත්ත!"

අහස්යානය සැබැවින් ම අපූරු ය. හැම කෙනෙක් ම එය වැනූහ. අලෙක්සේයි වාරය පැමිණි විට ඔහු හම්පටි දෙකින් තම බොරු කකුල් යානයේ පැදි පුවරුවලට සවිකොට අහසට නැංගේ ය. දෙපා නැති ඔහුට මෙවැනි අසෙකු මෙල්ල කිරීම ලෙහෙසි කාර්යයක් නොවන බැවින් ප්‍රවේසම් විය යුතු බව ඔහු වටහා ගත්තේ ය. අහස්යානය සමඟ සම්පූර්ණ සබඳකම් ඇති වූ විට ලැබෙන සතුට මේවර ඔහුට නොලැබිණි. අහස්යානයේ යන්ත්‍රවලට පාදවල ස්පර්ශය පමණක් නොව, අත්වල වෙව්ළීම පවා දැනිණි. ඒ අනුව අහස්යානය සිය හැසිරීම ගුවනේ වාර්තා කළේ ය. එය සැබැවින් ම වීණාවක් මෙනි. තම ජීවිතයේ

පළමුවන වරට දෙපා නැතිවීමේ පාඩුව අලෙක්සේයිට දැනිණි. කෘත්‍රිම පාද කොතරම් ඉස්තරම් ලෙස සාදා තිබුණ ද, ඒවා සැබෑ පා මෙන් ජංගමශීලී නොවී ය.

අහස්යානය ලෙහෙසියෙන් හා නම්‍යතාවයෙන් ගුවන් ගත්තේ ය. අලෙක්සේයිගේ හැම ක්‍රියාවක් ම සැණෙකින් පිළිබිඹු කළේ ය. එහෙත්, ඔහුට අහස්යානයට බිය විය. කවාකාර ලෙස අහස්යානය හරවන විට තම බොරු කකුල් පමා වන සැටි අලෙක්සේයිට දැනිණි. එසේ පමා වීම නිසා අහස් යානයේ එන්ජිම ගැස්සී මාරක අනතුරකට මූණ පෑමට ඉඩ ඇති බව ඔහු දනී. තමා නොණ්ඩි අසකුට සමාන බව අලෙක්සේයිට හැඟිණි. ඔහු බියගුල්ලෙක් නොවී ය. ඔහු අහස්යානයට නැංගේ පැරචුටය ගැන ද නොතකමිනි. තමා අතින් සිදුවිය හැකි අතිශය සුළු වැරැද්ද පවා ඔහුට ප්‍රහාරක නියමුවකු වීමට බාධා කරනු ඇත. තමා අතිශයින් ම කැමැති වෘත්තියෙන් ඈත්වීමට තමාට සිදු වෙතියි යන බියක් ඔහු තුළ උපනි. වුවමනාවට වඩා ප්‍රවේසම් සහිත වීම නිසා නියමිත තැනට ගොඩ බැසීමට පවා අලෙක්සේයිට බැරි විය. ඔහුගේ බොරු කකුල්වල පමා වීම නිසා අහස්යානය හිමට ගොඩ බට පසු කීප වරක් ම ගැස්සිණි.

නිහඬ ව බුම්මාගෙන අලෙක්සේයි අහස්යානයෙන් එළියට ආවේ ය. සිසු නියමුවෝ ද, ගුරුවරයාගේ සැබෑ හැඟීම සඟවා ගනිමින් ඔහුට ප්‍රශංසා කළහ. එහෙත්, මේ ඉච්චා සහගත ක්‍රියාව නිසා ඔහු වඩාත් රොස් විය. මාර්තු මාසයේ දී ඔහුගේ අහස්යානය කඩා වැටුණු විට ඔහු මුහුණ පෑ ඛේදවාචකයට සමාන හානියකට දැන් ඔහු මුහුණ පෑවේ ය. දවල් ආහාරය හා රාත්‍රි ආහාරය ගැනීමට ඔහු භෝජන ශාලාවට නොපැමිණියේ ය. අභ්‍යාස විදුහලේ නීති රීති උල්ලංඝනය කරමින් හෙතෙම සපත්තු පිටින් ම ඇඳ මත වැතිරගෙන, කොට්ටය බදාගෙන සිටියේ ය. ඔහුගේ දුක දන්නා සේවයෙහි යෙදී සිටි සිසු නියමුවා ද අනෙකුත් ගුවන් සේනා නිලධාරිහු ද ඔහුට දොස් නොපැවරූහ. ස්ට්රුච්කොව් පැමිණ තම මිතුරා සමග කතා කිරීමට උත්සාහ ගත් නමුදු, ඔහුට පිළිතුරු නොලැබුණෙන් ඔහු හිස වනමින් පිට වී ගියේ ය.

ස්ට්රුච්කොව්ට පසු අලෙක්සේයි වෙත පැමිණියේ අභ්‍යාස විද්‍යාලයේ දේශපාලන නිලධාරී තැන්පත් ලයිතන් කර්නල් කපූස්තින් ය. හේ මිටි ය. බෝතල අඩිවලට සමාන උපැස් යුගලක් පැලඳ සිටි ඔහුගේ පෙනුම සිත් නොගත්තේ ය. ඔහුගේ නිල ඇඳුම කොට්ට උරයකට සමාන විය. ජාත්‍යන්තර දේශපාලන තත්ත්වය ගැන ඔහු කළ කතාවලට සිසුහු සතුටින් සවන් දුන් හ. දේශප්‍රේමී මහා යුද්ධයට සහභාගී වීම ගැන ඔහු කළ විස්තරය නිසා සිසුන්ගේ සිත් ආඩම්බරයෙන් පිරිණි. නිලධාරියකු හැටියට ඔහු ගැන කිසිවෙක් සැලකිලි නොදක්වූහ. සිවිල් නිලධාරියෙක් වන ඔහු අහස්යානා ගැන කිසිවක් නොදත්තෙකියි ඔවුහු සිතූහ. අලෙක්සේයි මෙරේස්යෙව් ගැන සැලකිලි නොදක්වමින් කාමරය පිරික්සා බැලූ කපූස්තින් ඉව අල්ලා රොස් වී කෑ ගැසී ය.

"මෙතන දුම් බීවෙ මෙන යකාද? දුම්බීමට විශේෂ කාමර තියෙනව. ජොෂ්ය ලයිතන් සහෝදරය මේකෙ තේරුම මොකද්ද?"

"මම දුම් නොබොන කෙනෙක්" යැයි අලෙක්සේයි පිළිතුරු දුන්නේ උදාසීන ගතියකිනි.

"ඇයි තමුසෙ ඇඳ මත දිගාවෙලා ඉන්නෙ? නීතිය දන්නෙ නැත්ද? නිලයෙන් උසස් කෙනෙක් එන විට ඇයි නැඟිට්ටෙ නැත්තෙ?.... නැඟිටිනව" යැයි කපූස්තින් පැවසී ය.

එය අණ කිරීමක් නොව, ආචාරශීලී පැවසීමකි. මෙරේස්යෙව් වහා ම ඍජු ව නැඟිට්ටේ ය.

"අන්න හරි ජොෂ්ය ලයිතන් සහෝදරය. දැන් වාඩිවෙනව. අපි පොඩ්ඩක් කතා කරමු." යැයි කපූස්තින් කීවේ ය.

"මොනව ගැනද?"

"තමුසෙ ගැන. අපි එළියට යමු. මෙතන දුම් බීම තහනම්. මට දුම් බොන්න ඕන."

ඔවුහු කණ්ණාඩි මැදිරි එළියකින් ආලෝක කර ඇති කොරිඩෝරයට ගියහ. නිල් පැහැති විදුලි බුබුළු සහිත එහි කවුළුවක් අසල ඔවුහු සිට ගත්හ. කපූස්තින් තම දුම්කොළ පයිප්පය ගෙන උරන්නට විය. පයිප්පය උරන

හැම වරක දී ම දුම්කොළ ඇවිළෙන ගින්නෙන් ඔහුගේ මුහුණ ආලෝකවත් විය.

"තමුසෙගෙ ගුරුවරයට අවවාද කිරීමට මා බලාපොරොත්තු වෙනවා"

"මොනවටද?"

"විදුහලේ අණ දෙන නිලධාරි මණ්ඩලයේ අවසරය නැතිව තමුසෙට අහස්යානය පැදවීමට ඉඩ දුන්න හින්ද... ඇයි තමුසෙ මා දිහා ඔහොම බලන්නෙ? ඇත්තටම තමුසෙ එක්ක මීට ඉස්සෙල්ලා මා කතා නොකළාට මටත් දොස් පවරන්න ඕන. මට ඒකට වෙලාවක් තිබුණෙ නැහැ. නමුත් මා කලින් හිතාගෙන හිටියා... කමක් නැහැ! මෙරේස්යෙව් මා කියන දේ අහනව. තමුසෙට අහස්යානා පැදවීම සෙල්ලමක් නෙමෙයි. ඔව්... තමුසෙගෙ ගුරුවරයට සැරෙන් කතා කරන්න අදහස් කරන්නේ ඒ හන්ද"

අලෙක්සේයි නිහඬ විය. තමා ළඟ සිටගෙන දුම් පයිප්පයක් උරන මේ මිනිසා කවරෙක් ද? ඔහු නැතිවට බෙල්ලේ වැළලාගැනීමට තරම් අමාරු තත්ත්වයක් ඇති වී තිබෙන මේ වේලාවේ ඔහු මෙතනට ආවේ ඇයි? ඔහුට වුවමනා මොනවා ද?

මහත් අමාරුවෙන් අලෙක්සේයි තම හැඟීම් මැඩ ගත්තේ ය. තමා මෙල්ල කර ගත්තේ ය. මාස කීපයක් තිස්සේ විඳි දුක් විසින් හදිසි තීරණයක් නොගැනීමට අලෙක්සේයිට උගන්වන ලදි. අලෙක්සේයි විසින් සැබෑ මිනිසකු ලෙස හඳුන්වනු ලැබූ දේශපාලන කොමිසාර් වරබියොව් හා කපූස්තින් අතර එක්තරා සමානතාවක් ඇති බව ඔහුට පෙනිණි. ඔහුගේ දුම්කොළ පයිප්පයේ මඳ ගින්න නැවත ආලෝකවත් වෙත් ම ඔහුගේ ලොකු නාසය ද, බුද්ධිමත් දෙනෙත් ද පෙනී, නැවත ඇඳිර පැතිරිණි.

"ඇහෙනවද මෙරේස්යෙව් මා කැමති නැහැ තමුසෙට බොරු ප්‍රශංසා කරන්න. එහෙත්, කොහොම වුණත් දැනට මුළු ලෝකෙම දෙපා නැති අහස් නියමුවෙක් ඉන්නෙ තමුසෙ විතරයි. ඔව් එකම මිනිහා!" ඔහු තම දුම්කොළ පයිප්පයේ නළය ගලවා එහි සිදුර පිරික්සීම පිණිස කණාමැදිරි පහන් ආලෝකයට ළං කළේ ය. පසුව හිස වනමින් කපූස්තින් මෙසේ පැවසී ය. "ප්‍රහාරක

අහස්යානා හමුදාවට නැවත බැඳී සේවය කිරීමේ ආසාව ගැන නෙමෙයි මම දැන් කියන්නෙ. එය ඇත්ත වශයෙන් ම වීර ක්‍රියාවක්. ඒ වුණාට එහි විශේෂයක් නැහැ. හැම කෙනෙක්ම තමන්ට දිය හැකි හැම දෙයක්ම ජයග්‍රහණය සඳහා දෙන වෙලාවක් මේක... බලනවකො මගෙ පයිප්පෙ මොනවද හිරවෙලා!"

කපූස්තින් නැවත තම දුම්කොළ පයිප්පයේ බටය ශුද්ධ කරන්නට වූයේ, ඔහු එම කාර්යයෙහි සම්පූර්ණයෙන් ම යෙදී සිටින බව පෙනිණි. කැලඹී සිටි අලෙක්සේයි, කපූස්තින් මොනවා කියාවි දැයි නොඉවසිල්ලෙන් බලා සිටියේ ය.

තම දුම්කොළ පයිප්පයේ බටය ශුද්ධ කිරීම නොනවත්වා කරගෙන යන අතර ම කපූස්තින් තම කතාව නිසා අලෙක්සේයි තුළ ඇතිවිය හැකි හැඟීම් ගැන නොසලකා මෙසේ පැවසී ය:

"මෙය ජොයෂ්ඨ ලයිතන් අලෙක්සේයි මෙරේස්යෙව්ගේ පෞද්ගලික කාරණයක් නොවේ. තමුසෙගෙ දෙපා නැතුවට තමුසෙට පුළුවන් වුණා, හොඳ ශරීර සනීපය ඇති සියයකින් එක්කෙනෙකුටවත් බැරි දෙයක් වන ප්‍රභාරක අහස්යානා පැදවීම ඉගෙන ගැනීමට. තමුසෙ නිකම් සෝවියට් රට වැසියෙක් නොවේ. විශාල පරීක්ෂකයෙක්. ඔන්න දැන් මම කාරණාව පැහැදිලි කරන තැනට ආවා! මෙතනින් නවතියි කියල හිතුවද? තමුසෙට සාමාන්‍ය අහස් නියමුවකුට මෙන් සලකන්න අපිට අයිතියක් නැහැ. එහෙම කිරීමට යුතුකමක් නැහැ. තේරුණාද! තමුසෙ ඉතාම වැදගත් පරීක්ෂණයක් කරන්නෙ. අපේ යුතුකම තමුසෙට උදව් කිරීමයි. මොන විදිහෙ උදව්ද වුවමනා කියන එක තමුසෙගෙ කාර්යයි. අපට කියනව තමුසෙට ඕන මොන විදිහෙ උදව්ද?"

නැවත තම පයිප්පයට දුම්කොළ පුරවාගෙන ඔහු දුම් උරන්නට විය. කපූස්තින් දුමක් උරන විට මඳ ගිනි අලෝකයක් ඇති කරයි. එවිට අඳුර බිඳගෙන ඔහුගේ මුහුණ පැහැදිලි ව පෙනිණි.

අභ්‍යාස විදුහලේ ප්‍රධානාචාර්ය තැන සමඟ කතා කොට අලෙක්සේයි මෙරේස්යෙව්ගේ අභ්‍යාස වැඩපිළිවෙළ සහ

පියාඹන කාලවේලාව දිගු කිරීමට කටයුතු කරන බව පැවසූ කපූස්තින්, සිය අභ්‍යාස වැඩ පිළිවෙළ අලෙක්සේයි විසින් ම සාදා ගනු ලැබිය යුතු යැයි දැන්වී ය.

"ඒ වගේ වැඩවලට පැට්‍රල් කොතරම් වියදම් වේවි ද" යි ඇසූ මෙරේස්යෙව් සිත් නොගන්නාසුලු පෙනුමක් ඇති මේ මිටි පුද්ගලයා ඔහුගේ සැක දුරු කිරීම සඳහා ක්‍රියා කළ සැටි සිතමින් පුදුම විය.

"පෙට්‍රල් බොහොම වටිනා දෙයක් තමා. ඇත්ත වශයෙන්ම මේ වගෙ යුද්දෙ ඇති වෙලාවක. පෙට්‍රල් මනින්නෙ ගැලොම් ගණනින්. ඒ වුණාට පෙට්‍රල්වලට වඩා වටිනා දේ තියෙනව" යැයි කී කපූස්තින් තම සපත්තු අඩියට දුම්කොළ පයිප්පය ගසමින් දුම්කොළ හිස් කළේ ය.

ඊළඟ දවසේ සිට අලෙක්සේයි විශේෂ වැඩ පිළිවෙළක් අනුව පුරුදු වෙන්නට පටන් ගත්තේ ය. බොරු කකුල් දමාගෙන ගමන් කිරීමට, නැටීමට හා දිවීමට පුරුදු වුණාක් මෙන් දැඩි අදිටනින් යුතු ව පුරුදුවීම ආරම්භ කළේ ය. එපමණක් නොව, ඔහු තුළ මහත් ආස්වාදයක් ඇති විය. මුළු මහත් පියාසැරියම විශ්ලේෂණය කොට එහි එක් එක් අංශය හා කොටස බැගින් වෙන් කොට හැදෑරීම ද හැම අංග චලනයක් ම පුරුදු වීම ද අලෙක්සේයි තම වැඩපිළිවෙළට ඇතුළු කළේ ය. තරුණ වියේ දී ම ඉබේට ම වාගේ කළ දෙයක් දැන් ඔහු හැදෑරී ය. නුවණින් සොයා බැලී ය. පළපුරුද්දෙන් කළ දෙය විග්‍රහ කොට බලා ඉගෙන ගත්තේ ය. අහස්යානයක් පැදවීමේ දී ඇති වන සියලු සැන්තතිය ඉතා හොඳින් කල්පනා කොට එහි සෑම කොටසකට ම අවශ්‍ය පැදවීම් හා ඒවා ලී කකුල්වලින් කරන සැටි කීප වරක් ම පුරුදු විය.

එය කිව නොහැකි තරම් අසීරු කාර්යයක් විය. ආරම්භයේ ප්‍රතිඵල නොදැනෙන තරම්සුලු විය. අහස්යානය පදවන හැම වාරයක දී ම එය ඔහුට වඩ වඩාත් කීකරු වන සැටි දැනිණි.

"අහා, මේ කොහොමද ආචාර්යතුමනි!" යැයි දවසක් දා කපූස්තින් අලෙක්සේයිගෙන් ඇසී ය.

වැඩ සාර්ථක බව හඟුන්වමින් ඔහු තම දකුණතේ මාපට ඇඟිල්ල පෙන්විය. ඔහු අතිශයෝක්තියෙන් තම ප්‍රතිඵල

වැනුවේ නැත. ප්‍රතිඵල ඉක්මන් නොවුණ ද, ස්ථිර ලෙස ම බාධා මැඩ ඉදිරියට යන බව පෙනෙන්නට තිබිණි. වේගයෙන් දුවන අකීකරු අසකු පිට යන විට දී මෙන් අපහසු ගතියක් හා අස්ථිර ගතියක් අහස්යානය පදවන විට අලෙක්සේයිට නොදැනුණේ ඔහුගේ විශේෂ පුහුණු වීම් නිසා ය. අසරුවාට කීකරු වන අසකු මෙන් හැම වාරයක දී ම අහස්යානය වඩ වඩාත් අලෙක්සේයිට මෙල්ල විය. ප්‍රහාරක අහස් නියමුවකුට තිබිය යුතු හැම දස්සකමක් ම ලබා ගැනීමට කෙමෙන් ඔහු සමත් විය.

## 11

අලෙක්සේයි මෙරේස්යෙව් අහස්යානය පැදවීම සඳහා බොහෝ වේලාවක් යෙදවී ය. අහස් යානයේ හැම චලනයක් ම දැනගැනීම් වස්, බොරු කකුල්වල සහ ලෝහය විනිවිද හඟනු වස් ඔහු දැඩි ආත්මශක්තියකින් යුතු ව ක්‍රියා කළේ ය. සමහර විට තාමට අහස්යානය කීකරු වන සැටියක් දැනුණ ද, ඔහු කිසියම් අභ්‍යාසයක් කළ විගස අහස්යානය තමාට අකීකරු වන සැටි වටහා ගත්තේ ය. මෙසේ ස්වාධීන අභ්‍යාසයක් කළ විට අහස්යානය තමාට මෙල්ල නොවීම ගැන ශෝකයට හා පසුතැවිල්ලට පත් අලෙක්සේයි නැවත තම මුල් වැඩ පිළිවෙළ අනුව පුහුණුවීම නැවත ඇරැඹී ය.

මාර්තු මාසයේ දී එක දවසක තදින් හිම වැටිණි. අහස ඇඳිරි විය. ගුවන් තොටුපළ හිමෙන් පිරිණි. අලෙක්සේයි තම ප්‍රහාරක යානය ගෙන ගුවන් ගත විය. දැඩි කුණාටුවකට හසුවුණු අහස්යානය නිතර, නිතර නියම මගෙහි යෙදවීමට ඔහුට සිදු විය. හිම කුණාටුවට එදිරි ව කළ සටනේ දී අලෙක්සේයිට තම අහස්යානය මෙල්ල කොට ජය ගත හැකි විය. එදින නැවත ගුවන් තොටුපළට හැරී එන විට අහස්යානය තමාට සම්පූර්ණයෙන් ම කීකරු වන සැටියක් දැනිණි. එහෙත්, ඔහු එය අවිශ්වාස කළේ ය. එවැනි හැඟීම් නිසා කීප වරක් ම ඔහුගේ බලාපොරොත්තු කඩ විය. ඔහු තම වාසනාව විශ්වාස කිරීමට එකවර ම ඉදිරිපත් නොවූයේ මේ හේතුව නිසා ය.

ඔහු ගැඹුරට කිඳා බැස දකුණට හැරවී ය. අහස්යානය

අකුරට ම කීකරු විය. ඇඳිරි දවස ආලෝකවත් වූ සැටියකි.

ඔහුගේ පුහුණුවීමේ ප්‍රතිඵල එකවර කිසි අවිද්‍යමාන බලයක් විසින් පිරික්සුමට භාජනය කරන ලැබූ සැටියකි. දැන් ඔහු එම දීර්ඝ පුහුණු වීමෙන් නිසි ඵල ලබා ගැනීමට පටන් ගෙන ඇත. ඔහුට මෙතෙක් ලබාගත නොහැකි වූ ප්‍රධාන දෙය දැන් ඔහුට ලැබී ඇත. තම ප්‍රහාරක අහස්යානය දැන් අලෙක්සේයිට තම සිරුර මෙනි. එහි හැම චලනයක්මත් ඉරියව්වක්මත් ඔහුට ඉතා හොඳින් දැනේ. ඔහුගේ අප්‍රාණික බොරු කකුල්වලට පවා මේ දැනීම හා ස්පර්ශය නැවැත්වීමට නොහැකි විය. ප්‍රීතියට හා ප්‍රබෝධයට පත් අලෙක්සේයි ගුවනේ කවයන් කීපයක් අඳිමින් තම අහස්යානය පැදවී ය. ඉන් පසු අතිශයින් ම අසීරු අභ්‍යාසයක් වන 'තොණ්ඩුව හෙවත් මළ පුඩුව' ගුවනෙහි ඇඳ පෙන්වී ය. එවිට ම වාගේ අහස්යානය ගැස්සෙන්නට විය. තමාට පහළින් ඇති හැම දෙයක් ම -ගුවන් තොටුපළ, කුලුන, කාලගුණ වාර්තා කාර්යාලය - එක ම කවයකට සෑදී ගැස්සෙන කරකැවෙන සැටියක් ඔහුට දැනිණි. ඔහු ගැස්සෙමින් තිබුණු අහස්යානය ස්ථිර ලෙස මෙල්ල කොට වටයක් පැදවී ය. යුද්ධ කාලයේ දී සුප්‍රසිද්ධ 'ලා-5' වර්ගයේ අහස්යානයේ සියලු රහස් තමාට දැන ගන්නට ලැබුණු බව අලෙක්සේයිට වැටැහිණි. අහස්යානය පළපුරුදු අත්වලට පත්වී ද, අලෙක්සේයිගේ අණට කීකරු වූ අහස්යානය අසීරු, සංකීර්ණ අභ්‍යාස රූප කීපයක් ඇඳ රොකට්ටුවක් මෙන් වේගයෙන් ඉහළ නැංගේ ය.

අලෙක්සේයි තම ජයග්‍රාහී පියාසැරියෙන් පසු අහස් යානයෙන් එළියට ආවේ ප්‍රබෝධයෙන් මත් වූවකු ලෙසිනි. ඔහුගේ සිනාවේ සාහසික බවක් තිබිණි. කෝප වූ ගුරුවරයා ඔහුට බැණ වදින සැටි පවා නැසුණාක් මෙන් ඔහු ගමන් කළේ ය. සාහසික ලෙස අහස්යානය පැදවීම නිසා ඔහුට දඬුවම් විඳීමට සිදුවේ ද? කමක් නැත. ඔහු එයට සූදානම් ය. එක් කරුණක් පැහැදිලි ය. ඔහු -අලෙක්සේයි හොඳ අහස් නියමුවෙකි. අතිශයින් ම වටිනා ද්‍රව්‍යයක් වන පැට්‍රල් නාස්ති වුණ ද, පුහුණුවීම ඉතා හොඳ ප්‍රතිඵල ලබා දී ඇත. පැට්‍රල් මෙන් සිය ගුණයක්

වටිනා ජයග්‍රහණයන් ලබා දීමට ඔහුට හැකි බව සිතේ. ඉක්මනට යුද පෙරමුණට ගොස් සටන්වලට සහභාගි වීමට පුළුවන් නම්...!

නේවාසිකාගාරයට ගිය අලෙක්සේයිට තවත් සතුටුදායක පුවතක් ලැබිණි. ග්වොස්දෙව් එවූ ලියුමක් ඔහුගේ ඇඳෙහි කොට්ටය මත තිබිණි. එම ලියුම අලෙක්සේයි අතට පත්වීමට පෙර කොතෙක් දුර ගමන් කර තිබේ ද, කී දෙනෙකු අතට පත් වී ඇත් ද යන්න එය තැළී පොඩි වී තිබෙන සැටියෙන් පෙනිණි. පරණ කවරය වෙනුවට අන්යූටාගේ අත් අකුරින් ලියූ අලුත් කවරයක් තුළ එම ලියුම බහා තිබිණි.

යුද්ධ ටැන්කි ලයිතන් තැන අලෙක්සේයිට තමා මුහුණ පෑ අභාග්‍යය ගැන විස්තර කරමින් ලියුවේ ය. ජර්මන් අහස්යානයක පියාපතක් වැදීම නිසා ඔහුගේ හිස තුවාල විය. රෝහලේ නැවතී ප්‍රතිකාර ලැබූ ඔහු, ළඟදී ම ඉන් පිටවීමට බලාපොරොත්තු වන බව ද ලියා තිබිණි. ඔහු එම අභාග්‍යයට මුහුණ පෑ සැටි මෙසේ විය. හයවැනි ජර්මන් හමුදාව වට වූ පසු, පසුබසිමින් සිටින ජර්මන් පෙරමුණ බිඳගෙන ඔවුන්ට පිටුපසින් පහර දුන් යුද්ධ ටැන්කි හමුදාවේ ග්වොස්දෙව්ගේ යුද්ධ ටැංකිය ද විය. මේ සටනේ දී යුද්ධ ටැංකි බැටැලියනයක් මෙහෙයැවීම ග්වොස්දෙව්ට භාර විය.

එය දරුණු පහරක් විය. සෝවියට් යුද්ධ ටැන්කි ජර්මන් ආරක්ෂක පවුරු බිඳිමින් සතුරු දුම්රිය මාර්ග විනාශ කරමින් සතුරා තැති ගන්වමින් පහර දුන්හ. ජර්මන් බළකොටුවේ ඉතිරි ව සිටි හටයෝ හිස් ලූ ලූ අත පලා ගිය විට සෝවියට් යුද්ධ ටැන්කිවලින් ගෙනා ජංගමශීලී සෝවියට් පාබළ හමුදාවෝ සතුරු වෙඩි බෙහෙත් ගබඩා, පාලම්, දුම්රිය මාර්ග පාලක ස්ථාන ආදියට පහර දී ඒවා විනාශ කළහ. මේ නිසා පසුබසින ජර්මන් හමුදාව කොටු විය. සෝවියට් යුද්ධ ටැන්කි කිනම් මඟක් ඔස්සේ ඉදිරියට යන්නේ දැයි සතුරාට දැන ගැනීමට ඉඩක් නොතැබූ සෝවියට් හමුදාවෝ, අල්ලා ගත් සතුරු ඛනිජ තෙල්, ආහාර ආදිය ප්‍රයෝජනයට ගනිමින් නැවත පහර ගසමින් ඉදිරියට ගියෝ ය.

"...මා අභාග්‍යයකට මූණ පෑවේ මෙහෙමයි. යුද්ධ ටැන්කි හමුදාවේ සෙනෙවියා අප කැඳවා මෙතැන සිට තරමක් දුරින් සතුරු ගුවන් තොටුපළක් තිබෙන බවත්, එහි සතුරු අහස්යානා තුන්සියයක් පමණ තිබෙන බවත්, ඔත්තු බලන සෝවියට් අහස්යානාවක් තමාට දැන් වූ බව පැවසී ය. 'ග්වොස්දෙව් අද රෑට තමුසෙ යුද්ධ ටැන්කි කණ්ඩායමක් අරගෙන ඒ ගුවන්තොටුපළට යන්න ඕන ශබ්ද නොකර. ගුවන් තොටුපළට හොඳටම ළං වූ පසු පහර දෙන්ට ඕන. එකම බැල්ලිගෙ පුතෙකුටවත් පණ බේරාගෙන යන්ට ඉඩ තියන්න එපා' යැයි සෙනෙවියා පැවසී ය. මේ කාර්යය සඳහා මට යුද්ධ ටැන්කි බැටැලියන් දෙකක් භාර දුන්නේ ය. හමුදාවේ ඉතිරි යුද්ධ ටැන්කි රෝස්ටොව් බලා ගියේ ය."

"ඉතින් අලෙක්සේයි අපි ඔය ගුවන් තොටුපළට වැදුණෙ කුකුළු කොටුවකට වැදුණු හිවල්ලු වගේ. ගුවන් තොටුපළේ ප්‍රවාහන පාලක කාර්යාලය දක්වා අපි ගියා. අපව කිසිවෙක් නැවැත්තුවෙ නැහැ. පාර මීදුමෙන් වැසී තිබුණා. උන්ට ඇහුණෙ යුද්ධ ටැන්කිවල හඬ විතරයි. සතුරා හිතුව අපිත් ජර්මනුන් කියල. ඉතින් අලෙක්සේයි අපි හොඳටම ළං වෙලා ලෝහ පසා කරගෙන යන වෙඩි උණ්ඩවලින් වෙඩි තැබුවා. එක පහරකින් ජර්මන් අහස්යානා පහක් හෝ හයක් විනාශ වුණා. ඔය විදියට පහර දීලා කාර්යය ඉටු කරන්ට බැරි බව අවබෝධ වුණා. සමහර ජර්මන් අහස් නියමුවො උන්ගෙ අහස්යානාවල එන්ජිම් ක්‍රියා කරවන්ට පටන් ගත්තා. යෝධ ප්‍රවාහන අහස්යානාවල එන්ජිමට ඉක්මනට පහර දෙන්ට බැරි බව පෙනුණා. අපි යුද්ධ ටැන්කිවල කවුළු වසා දමා සතුරු අහස්යානාවල වලිග පොඩිකර විනාශ කරන්ට පටන් ගත්තා. වලිගය නැතිවුණාම ඉගිළෙන්ට බැහැ නෙව, හරියට එන්ජිම නැතිවුණා වගෙ. මම මගේ යුද්ධ ටැන්කියෙ කවුළුව ඇරල වට පිට බලන්ට හිස එළියට දමූ හැටියෙම අහස්යානාවක පියාපතකින් කොටසක් මගේ හිසට වැදුණා. මගේ වාසනේ හිස්වැස්ම හන්දා මා බේරුණා. නැත්නම් මම එදා කපෝතියි... දැන් ඒව සියල්ල යටගියාවට අයිතියි. ඉක්මනින්ම සම්පූර්ණ සුවය ලබා මම

මගේ යුද්ධ ටැන්කි කණ්ඩායමට යනවා. මට වුණ අනික් අභාග්‍යය මෙයයි. රෝහලේ දී මගේ යටි රැවුළ කපා දැම්මා. බොහෝ කාලයක් තිස්සෙ මම ප්‍රවේසමෙන් ඔය රැවුළ වැව්වෙ. කිසිම කනගාටුවක් නැතුව ඒ අය මගෙ රැවුළ කපලා දැම්මා. කමක් නැහැ! යුද්දෙ ඉවර වෙන්න ඉස්සෙල්ලා තවත් රැවුළක් වවා මගේ අවලස්සන මුහුණ සඟවා ගැනීමට හැකි වෙතියි මා හිතනවා. අලෙක්සේයි තවත් කරුණක් කියන්න ඕන. අන්යූටා මගෙ රැවුළට විහිළු කරමින් ලියුම් එවනවා. එයා කියනව මට රැවුළ බූගා දමන්නට කියලා"

ලියුම දිග ය. රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි ග්වොස්දෙව් කාන්සිය දුර කර ගැනීම පිණිස මේ ලියුම ලියූ බව පෙනිණි. ස්ටාලින්ග්‍රාඩ් සටන අවසානයේදී ග්වොස්දෙව්ගේ යුද්ධ ටැන්කිය කැඩී ගියෙන්, අලුත් යුද්ධ ටැංකියක් ලබා ගැනීමට යන අතර පාබළ හමුදාවට එක්ව සටන් කිරීමට ඔවුන්ට සිදු විය. මමායෙව් කුර්ගානයේදී ග්වොස්දෙව්ට මහලු ස්තෙපාන් ඉවානොවිච් හමු විය. විශේෂ පුහුණුවක් ලැබූ ස්තෙපාන් ඉවානොවිච් දැන් යුද්ධ ටැන්කි නාශක හමුදාවේ සාජන්ට් මේජර ධුරයක් දරන බව ග්වොස්දෙව් ලියුවේ ය. ඉස්සර ස්තෙපාන් ඉවානොවිච් නිදැල්ලේ හිරු රැස් නාමින් සිටි ජර්මනුන් එකා බැගින් මරා දැම්මේ ය. දැන් ඔහු ලොකු දඩයමක යෙදී සිටී. වඩාත් ශක්තිමත් හා නපුරු මෘගයන් වන පැසිස්ට් යුද්ධ ටැන්කි විනාශ කිරීමේ යෙදී සිටී. යුද්ධ ටැන්කි විනාශ කිරීමේ දීත් මේ දක්ෂ දඩයම්කාරයා තම නිපුණත්වය ද ශෛලමය ඉවසීම ද ධෛර්යය ද ඉලක්කයට වෙඩි තැබීමේ දක්ෂතාව ද පෙන්වමින් සටන් කළේ ය. ග්වොස්දෙව් හමුවීම නිමිත්තෙන් දූරදර්ශී ස්තෙපාන් ඉවානොවිච් බාල වර්ගයේ ජර්මන් වයින් බෝතලයක් විවෘත කොට අනික් අයත් සමඟ එකතුව පානය කළේ ය. මෙය ජර්මනුන්ගෙන් උදුරා ගත් ආහාර තොගයක තිබිණි. ස්තෙපාන් ඉවානොවිච්, මෙරේස්යෙව්ට උණුසුම් සුබ පැතුම් එවන බව ද එහි සඳහන් විය. යුද්ධයෙන් පසු තිදෙනා ම ජීවතුන් අතර සිටියොත්, ලේනුන් හා කුරුල්ලන් දඩයම් කිරීම සඳහා තම සමූහ ගොවිපොළට පැමිණෙන ලෙස මහල්ලා

අලෙක්සේයි මෙරේස්යෙව්ට හා ග්වොස්දෙව්ට ආරාධනා කරන බව දන්වා තිබිණි.

ග්වොස්දෙව් විසින් එවන ලද මේ ලියුම නිසා අලෙක්සේයි තුළ උණුසුමක් ද, කනගාටුවක් ද ඇති විය. හතළිස් දෙවැනි වාට්ටුවේ සිටි හැම කෙනෙක් ම පෙරමුණ ගෙන යුද්ධ කරති. ග්රිගොරි ග්වොස්දෙව් සහ ස්තෙපාන් ඉවානොවිච් දැන් කොහි ද? යුද පෙරමුණේ කිනම් තැනක දැන් ඔවුහු සටන් කරත් ද? ඔවුන් ජීවතුන් අතර ද? ඕල්යා කොහි ද?...

යුද පෙරමුණේ සිට එන ලියුම් නිවී ගිය තරුවක ආලෝක ධාරාවකට සමාන යැයි දේශපාලන කොමසාරිස් කළ ප්‍රකාශය අලෙක්සේයිට මතක් විය. තරුව නිවී ගිය ද, එහි ආලෝක ධාරාවක් පැහැදිලි ප්‍රීතිමත් ආලෝකයක් ඇති කරමින් විහිද යයි. නොපවතින එම තරුවේ ආලෝක ධාරාවක් මිනිසුන් වෙත සුභාරංචි ගෙන එයි.

# හතරවැනි කොටස

## 1

1943 ගිම්හනයේ දී එක් උෂ්ණ දවසක දී ඉදිරියෙන් ගමන් කළ සෝවියට් යුද්ධ හමුදාවේ පෙරමුණ බළඇණි විසින් තණකොළ සහ කුඩා පැළැටි පාගා සාදන ලද පාරක් ඔස්සේ පරණ ට්‍රක් රථයක් වේගයෙන් ගමන් කළේ ය. කුඩා වළවල්වල වැටෙමින්, ගොඩ එමින් මේ රිය යුද පෙරමුණ බලා ගියේ ය. දූලි ගැවුණු රියේ දෙපස සුදු පැහැති කුඩා අකුරින් මෙසේ ලියා තිබිණි. 'යුද පෙරමුණේ තැපැල් සේවය'. රථය පිටුපසින් නැගෙන දූලි, වලාකුළු මෙන් සෑදී ඉහළ නැංගේ ය.

ලියුම් මිටි සහිත මලු සහ පුවත්පත් ගොඩක් සහිත මෙම රියේ අහස්යානා හමුදාවේ නිලධාරීහු දෙදෙනෙක් ද ගමන් කළහ. රිය සෙලවෙන විට ඔවුහු ද සෙලවුණහ. මේ දෙදෙනාගෙන් එකෙක් තරුණ ය. ඔහුගේ අලුත් නිල පටි අනුව ඔහු අහස් හමුදාවේ සාජන්ට් මේජර් කෙනෙකි. ඔහු සීන්දෑරි ය, කඩවසම් ය. ඔහුගේ හිසකේ රන් පැහැති ය. ඔහුගේ මුහුණේ හම කොතරම් සිනිඳු ද යත්, ලේ නහර පවා රත් පැහැයෙන් සම විනිවිද පෙනිණි. ඔහුගේ වයස අවුරුදු දහනවයකට වැඩි නොවූව ද, ඔහු පළපුරුදු සෙබළෙකු මෙන් හැසිරීමට වෑයම් කළේ ය. කෙළ ගසා බැරෑඩි හඬකින් බැණ වැදුණේ ය, ඇඟිල්ලක් තරම් මහත සිගරට් එතුවේ ය. හැම දෙයක් ගැන ම උදාසීන ලෙස බැලී ය. මේ සියලු ලක්ෂණ මැද ඔහු පළමුවරට යුද පෙරමුණට යන බවත්, ඔහු කැලඹී සිටින බවත් පෙනෙන්නට තිබිණි.

ඔහු සමඟ ගමන් ගත් අනෙක් සගයා පළපුරුදු සෙබළෙකු බව එකවර ම පෙනිණි. හේ ජ්‍යෙෂ්ඨ ලයිතන් කෙනෙකි. බැලූ බැල්මට ඔහුගේ වයස විසිහතරක් හෝ විසි පහකැයි කිව හැකි ය. එහෙත්, අව්වට දැවුණු ඔහුගේ මුහුණේ ලකුණු අනුව - ඇස් වටේට කට දෙපස හා



නළලේ රැලි නිසා ද, කල්පනාකාරී විඩාපත් ඇස් නිසා ද ඔහුගේ වයසට තව අවුරුදු දහයක් වැඩි කළ හැකි ය.

මිටිවලට බැඳ තිබුණු පුවත්පත්වලින් සැප පහසු ආසනයක් සාදාගත් ජෝෂ්ඵ ලයිතන් තැන එහි වාඩි වී නිකට සැරයටියක් මත තබාගෙන නිදි කිරා වැටෙන්නට විය. කළුවර ලීයෙන් සෑදූ ඒ අපූරු සැරයටියේ රන් අකුරු දෙකකි. ඉඳහිට අවදි වන ජෝෂ්ඵ ලයිතන් තැන උණුසුම් සුවඳ වාතය ළය පුරා ඇද ගත්තේ ය. ඈත අහසේ කුඩා තිත් දෙකක් ඔහුගේ ඇසට ලක්විණි. ඔහු මහත් වුවමනාවෙන් ඒවා දෙස බැලූ විට ඒ අහස්යානා බව පෙනිණි. එකිනෙකා ලුහුබඳිමින් වැඩි කලබලයකින් තොර ව පියාඹන අහස්යානා දුටු හෙතෙම ප්‍රබෝධවත් විය. ඈත කළු ලපවලට සමාන ඒ අහස්යානා දෙක බලාගත්වන ම ඔහු ට්‍රක් රථයේ රියැදුරු කාමරයේ පියස්සට මිටින් ගසමින් කෑ ගැසී ය.

"මහපාරෙන් හරවපන්! ආවරණයක් සොයන්ට ඕන!"

නැඟිට සිටි ජෝෂ්ඵ ලයිතන් තැන වට පිට සැණෙකින් පිරික්සා කුහරයක් තුළින් ගලා යන දිය පාරක් දැක රථය ඒ දෙසට හරවන ලෙස අණ කළේ ය. එතැන නොයෙකුත් වල් පැළෑටි හා පඳුරු ද තණකොළ ද වැවී තිබිණි.

තරුණ සාජන්ට් මේජර තැන සාවඥ ලෙස සිනාසුණේ ය. ඈත අහසේ කිසිවකුට හානියක් නොවන ලෙස පියාඹන අහස්යානාවලින් දූලි නංවමින් දුවන මේ රියට හානියක් වන්නේ කෙසේ දැයි ඔහුට වටහා ගත නොහැකි විය. ඔහු තම විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට පළමු ව රියැදුරා රිය මහ පාරෙන් හරවාගෙන බිම් ගෙයක් වැනි කුහරය දෙසට පැදවී ය.

ජ්‍යෙෂ්ඨ ලයිතන් තැන රියෙන් පැන තණ බිම මත වාඩි වී අහස පිරික්සා බැලී ය.

"තමුසෙට මක් වෙලා ද..." සාවඥ ලෙස තරුණයා ඔහු දෙස බලා කීවා පමණකි. තණබිම මත දිගාවුණු නිලධාරියා තරුණයාට කෑගැසී ය.

"වැතිරියන්!"

එවිට ම වාගේ යෝධ එන්ජින් යන්ත්‍ර දෙකක බියකරු හඬ ඇසිණි. විශාල අහස්යානා දෙක මහ ඝෝෂාවක් ඇති කරමින් ඔවුන්ගේ හිස්වලට ඉහළින් පියාසර කරයි. තරුණයා මෙයින් බිය නොවූයේ, ඒ අහස්යානා සෝවියට් යුද හමුදාවට අයත් විය යුතු යැයි සිතූ බැවිනි. හේ වටපිට බැලී ය. මහ මඟ අසල තිබුණු යකඩ මල කෑ පරණ ලොරිය දුමෙන් වැසී ගොස් ගිනි ගත් සැටි ඔහුට පෙනිණි.

"ගිනි ඇවිළෙන බෝම්බ දමනවා" යැයි රියැදුරු තැන මඳ සිනා පාමින් කියන්නේ ගිනිගෙන දැවෙන රථය දෙස බැලී ය. "පැසිස්ට්කාරයෝ රථවලට පහර දෙනවා"

තණබිම මත වඩාත් පහසු ලෙස වැතිරගත් ජ්‍යෙෂ්ඨ ලයිතන් තැන "උන් දඩයම්කාරයෝ" යැයි පැවසී ය. "අපිට නැවතී සිටීමට සිදුවේවි. හතුරා ආපසු අප සොයා එනවා සහතිකයි. ඩ්‍රයිවර් උන්නැහෙ තමුසෙගෙ රථය අන්න අර බිරියෝසා ගහ යටට ගෙනියන්න."

ජ්‍යෙෂ්ඨ ලයිතන් තැන එසේ කීවේ ජර්මන් අහස් නැවියෝ තම අදහස ඔහුට විශේෂ පණිවුඩයක් මගින් දන්වූවාක් මෙන් ස්ථිරත්වයකින් හා විශ්වාසයකිනි. කැලඹුණු තරුණයා නොසැලකිල්ලෙන් මෙසේ පැවසී ය.

"මෙතන ඉන්නවට වඩා හොඳයි යනවා. කාලෙ නාස්ති කරන්නෙ මොකටද? එල්ලා මැරීමට නියම වූ මිනිහා ගිලෙන්නෙ නැහැ."

ජෝෂ්ඨ ලයිතන් තැන තණ පැළයක් සපමින් තරුණයා දෙස බැලී ය. කළු පැහැති ඔහුගේ ඇස්වල නොසතුට මුසු උපහාසාත්මක බවක් තිබිණි.

"ඒයි යාළුවා, මේ අහපන්. තමුසෙ ඔය මෝඩ කතාව අමතක කරනවා. තවත් එක කරුණක් ගැන මතක් කරන්ට ඕන සාජන්ට් සහෝදරයා, යුද පෙරමුණේ නීතිය අනුව උසස් නිලධාරීන්ගේ අණට කීකරු වෙන්ට ඕන 'බිම වැතිර දිගා වෙයන්' කියලා අණ කළාම එහෙම කරන්න ඕන"

ජෝෂ්ඨ ලයිතන් තැන තවත් පැළෑටියක් ගෙන සෙමෙන් සපන්නට වූයේ, එහි පිට පොත්ත ගලවා දමමිනි. නැවත එන්ජින්වල හඬ ඇසිණි. මහ මගට ඉහළින් වේගයෙන් පියාඹා ගිය අහස්යානාවල පියාපත්හි ඇඳ තිබුණු සුදු කුරුසය ද, එක් ජෝෂ්ඨ යානයක බඳේ ඇඳ තිබුණු ඉස්කෝප්ප ආසියා සටහන ද ඔවුහු දුටහ. ජෝෂ්ඨ ලයිතන් තැන තවත් පැළෑටි කීපයක් උදුරමින් උදාසීන ලෙස අත්ඔරලෝසුව දෙස බලා රියැදුරාට අණ කළේ ය.

"යමු යන්ට. දැන් ඉතින් යන්ට පුළුවනි. යාළුවා ඉක්මනින් මෙතනින් පිට වෙන්න ඕන"

"ආයෙමත් සතුරු අහස්යානා නොපැමිණෙතියි ලයිතන් සහෝදරයා දන්නේ කොහොමදැ?"යි නිහඬව සිටි තරුණයා ප්‍රශ්න කළේ, ගල්මුල්වල රිය හැපෙන විට ඒ අනුව තමාත් වැනෙමිනි.

"ඒක එතරම් අමාරු වැඩක් නෙමේ. ඔය ජර්මන් අහස්යානා වර්ගය 'මෙසර්ස්' 'මෙ-109' ඒවාවල පැට්රල් ටැංකිය විනාඩි 45ක් තුළ දී හිස් වෙනවා. ඊට පස්සෙ උන්ට සිද්ද වෙනවා පැට්රල් ටැංකි පුරවා ගැනීම සඳහා ගුවන් තොටුපළට යන්න."

ඔහු එය විස්තර කළේ උදාසීන ගතියකිනි. මෙවැනි සාමාන්‍ය දේ නොදැන සිටීම ඔහුට තේරුම් ගත නොහැකි විය. තරුණයා අහස දෙස වුවමනාවකින් බලන්නට විය 'මෙසර්ස්' අහස්යානා පළමුවෙන් දැකීමට ඔහු තුළ මහත් ආසාවක් ඇති විය. අවට වාතය පිරිසිදු ය. තණ සුවඳ මුසු නැවුම් සුවඳක් පැතිර ගියේ ය. අව්වට පිලිස්සෙන පසින් දූලි නැඟී ඇත. තණපෙත්තෝ මහ හඬින් ශබ්ද කළහ. කොවුලෝ මිහිරි ගී ගැයූහ. මේ සියල්ල නිසා

තරුණයාට ජර්මන් අහස්යානා ගැන අමතක වූයෙන් ඔහු ඒ දවස්වල යුද භටයන්ගේ ජනප්‍රිය ගීතයක් ගයන්නට විය. යුද පෙරමුණේ අගලක සිටින තරුණ යුද භටයෙක් තම සුන්දරිය සිහි කරමින් ගයන ගීතයකි ඒ...

තැපැල් රිය කුඩා ගමක මඟකට පිවිසෙන විට ඇඳිරි වැටී තිබිණි. අහස්යානා සේනාංකයක ප්‍රධාන කාර්යාලයක් අසල පිහිටා ඇති බව පළපුරුදු ඇස්වලට පෙනිණි. චෙරිගස් සහ ඇපල් ගසක අතු අතරින් ටෙලිෆෝන් කම්බි විහිද යන සැටි දැකිය හැකි ය. ගොවීන් තම උපකරණ සහ කරත්ත තබන මඩුවක් අසල 'එම්කා' සහ 'විලීස්' රථ කීපයකි. කණාමැදිරි එළියක් ඇති ගොවිපැලක යුද ඇඳුමෙන් සැරසුණු අය වැඩවල යෙදී සිටින සැටි එහි ජනේලයෙන් පෙනිණි. ටයිප්රයිටර ක්‍රියා කරවන හඬ ද විදුලි කම්බි රාශියක් එකට ඈඳී ඇති තැනින් 'ටික්-ටික්' යන හඬ නඟමින් විදුලි පණිවුඩ හුවමාරු කරන හඬ ද ඇසෙන්නට විය.

තැපැල් රිය ගමේ පාසල් ගොඩනැගිල්ල ඉදිරිපිට නැවැත්විය. පාසල් ගොඩනැගිල්ලේ එක් ජනේලයක් තුළට ඈඳා තිබෙන විදුලි කම්බි ද, ගොඩනැගිල්ල මුර කරන මැෂින් තුවක්කු භටයා ද නිසා එය ප්‍රධාන කාර්යාලය බව හඳුනාගත හැකි විය.

"මට සේනාංක භාර නිලධාරියා හමුවන්ට ඕන" යැයි ජෝෂ්ඨ ලයිතන් තැන සේවයෙහි යෙදී සිටි නිලධාරියාට පැවසී ය.

සේනාංක භාර නිලධාරියාගේ කාර්යාල කාමරය පිහිටා ඇත්තේ ලොකු පන්ති කාමරයක ය. ඕක් ලීයෙන් සෑදූ එම කාමරය මැද එක් මේසයකි. එහි ටෙලිෆෝන් යන්ත්‍ර කීපයකි. අහස් සිතියම් සහිත හම්බෑගයකි. රතු පැන්සලකි, මිටි, කඩිසර පුද්ගලයෙක් වූ සේනාංක භාර නිලධාරියා තම කාර්යාල කාමරය තුළ ඒ මේ අත ඇවිදිමින් සිටියේ ය. ගැඹුරු කල්පනාවෙක යෙදී සිටි හෙතෙම, සීරුවෙන් සිට ගෙන හුන් අහස්යානා භටයන් දෙදෙනා නොදිටී ය. හිටි හැටියේ ම ඔවුන් දෙදෙනා ඉදිරිපිට නැවතුණු නිලධාරියා විමසිල්ලෙන් ඔවුන් දෙස බැලී ය.

"ජෝෂ්ඨ ලයිතන් අලෙක්සේයි මෙරේස්යෙව් වාර්තා කරනවා" යැයි සීරුවෙන් සිටි ලයිතන් තැන සපත්තු අඩි

එකට හප්පමින් ආචාර කරමින් කියා සිටියේ ය.

"සාජන්ට් - මේජර් අලෙක්සාන්දර් පෙත්රෝව් "යැයි තමා හඳුන්වා දුන් තරුණයා වඩාත් වැරෙන් සපත්තු අඩි හප්පමින්, ආචාර කරමින් ඊගසක් මෙන් ඍජු ව සිටියේ ය.

"සේනාංක භාර නිලධාරි කර්නල් ඉවනෝව් මම"යැයි කී නිලධාරියා "නිවේදනයක්ද" යි ඇසී ය.

අලෙක්සේයි මෙරේස්යෙව් තම සිතියම් බෑගයෙන් සන්දේශය ගෙන නිලධාරි තැනට භාර දුන්නේ ය. නිලධාරියා ඉක්මනින් එය කියවා තමා ඉදිරියේ සිටගෙන සිටින්නන් දෙස විමසුම් සහිත බැල්මක් හෙළී ය.

"හොඳා. නියම වෙලාවට තමුසෙලා ආවේ. ඇයි මේ තරම් අඩු ගාණක් ඒව්වේ" සැණෙකින් ඔහුට කිසිවක් මතක් වූවාක් මෙන් විස්මයට පත්වෙමින් බැලී ය. "ප්‍රධාන කාර්යාලයෙන් මට දැනුම් දුන්නා තමුසෙ ද මෙරේස්යෙව්, එයා මට කිව්වා තමුසෙ..."

"කර්නල් සහෝදරයා එය අවශ්‍ය කරුණක් නොවේ" යැයි ඔහුගේ කතාවට බාධා කළ අලෙක්සේයි, "වැඩ භාර ගැනීමට අවසර දෙන්න"යැයි ඉල්ලා සිටියේ ය.

කුතුහලයෙන් යුතු ව ලයිතන් තැන දෙස බැලූ නිලධාරියා ඔහුගේ ඉල්ලීම පිළිගනිමින් මඳ සිනා පෑවේ මෙසේ කීවේ යඃ

"හොඳයි, ඕර්ඩර්ලි★! මේ දෙදනා මගේ නිලධාරි මාණ්ඩලයීය කාර්යාලයට ගෙන ගොස් ආහාර හා නිදන්ට තැන් දෙන්ට යි කියල මා අණ කළ බව කියන්ට. ගාඩ්ස් කපිතාන් චෙස්ලොව්ගේ අහස්යානා කණ්ඩායමට ඔවුන් බඳවා ගන්නා ලෙස මා අණ කළ බව දන්වන්න."

## 2

සාජන් පෙත්රොව් තම දහවල් ආහාරයට අයත් තුන් වන වටය වූ රස කැවිලි කෑමට සූදානම් වෙත් ම, ජ්‍යෙෂ්ඨ ලයිතන් ඔහුත් ඇදගෙන අවන් හලෙන් පිට වී ඛනිජ තෙල් පටවාගෙන යන රථයක නැඟී, ගම කෙළවර පාළු පිටියක ඇති ගුවන් තොටුපළ බලා ගියේ ය. එහි දී ඔවුහු ගාඩ්ස් කපිතාන් චෙස්ලොව් හමුවූ හ. බුම්මාගෙන, නිහඬ ව සිටි චෙස්ලොව් අතිශයින් ම කරුණාවන්ත පුද්ගලයකු බව ඔවුන්ට පෙනිණි. වැඩි කතාබහක් නොකොට ම

චෙස්ලොව් ඔවුන් දෙදෙනාත් සමඟ තොටුපළේ නවතා තිබුණු අලුත් ම වර්ගයට අයත් 'ලා-5' අහස්යානාවක් වෙත ගියේ ය. එහි සුක්කානම්වල අංක '11', '12' යන සටහන් ඇඳ තිබිණි. අලෙක්සේයි පැදවිය යුත්තේ මේ අහස්යානය ය. සුවඳ හමන බිරියෝසා වනයේ කුරුල්ලෝ අහස්යානාවල ඝෝෂාව නොතකමින් මිහිරි ගී ගැයූහ. අලෙක්සේයි සහ පෙත්රෝව් තම මිකැනික්වරුන් සමඟ කතා කරමින් ඔවුන් හඳුනා ගනිමින් සවස් කාලය ගෙවූහ.

ඔවුහු ගුවන් තොටුපළේ සේවකයන් සමඟින් සතුටු සාමීචි කතාවල යෙදී සිට, රෑ බෝවී නේවාසිකාගාරයට පැමිණිය හ. මේ නිසා ඔහුට රාත්‍රි ආහාරය පවා නොලැබිණි. තම ගමන් මලුවල ඉතිරි ව තිබූ ආහාර ස්වල්පය ඔවුන්ට පිහිට විය. නිදා ගැනීමේ ප්‍රශ්නය වඩාත් අසීරු වූයේ සේනාංක දෙකක් සඳහා එක් කුඩා නේවාසිකාගාරයක් පමණක් තිබූ බැවිනි. එය ද කාන්තාරයක ක්ෂේම භූමියකට සමාන විය. කුඩා ගෙවල් කීපයකින් සමන්විත වූ මේ නේවාසිකාගාරයේ පැරැණි පදිංචිකරුවෝ නවකයන්ට ඉඩ දීමට අකැමැති වූ හ. නේවාසිකාගාරය රබර්වලින් සාදා තිබිණි නම් කොතරම් හොඳ ද ආදී දර්ශනවාදාත්මක වදන් දෙඩූ, පාලක තැන ළඟ ම තිබුණු කුඩා ගෙයකට ඔවුන් ඇතුළු කොට මෙසේ පැවසී යː

"අද රෑ මෙහෙ ගත කරනවා. හෙට වෙන තැනක් සොයා දෙන්නම්"

ඒ කුඩා ගෙයි අහස් නියමුවෝ නව දෙනෙක් නිදාගත්හ. සමහරු ඇඳන්වල ද, සමහරු පිදුරු ගොඩවල් මත එළූ ඇඳන්වල ද නිදා ගත් අතර, ගෙදර හාම්පුතා ඔහුගේ බිරිඳ සහ තරුණ දූ විශාල රුසියානු උදුන මත නිදාගත්හ.

නවකයෝ දොර ළඟ සිටගෙන ගෙතුළට යන්නේ කොහොම දැයි කල්පනා කළෝ ය. උදුන මත නිදා සිටි මැහැල්ල කෝපාන්විතව කෑ ගැසුවා ය.

"ඉඩ නැහැ, ඉඩ නැහැ. පේනව නේද නිදා ඉන්න හැටි. උඹලව සීලිමේ එල්ලන්ට ද?"

තරුණ පෙත්රොව් ලැජ්ජා වී ආපසු යන්ට හැරෙත් ම, අලෙක්සේයි නිදා හුන් අය නොපෑගෙන සේ පා තබමින් මේසය ළඟට ගොස් මෙසේ කී යː

"අනේ අම්මේ අපට කෑම ටිකක් කන්ට ලැබුණොත් ඒ ඇති. අද මුළු දවසේම කෑමක් නැහැ. පිඟානකුයි කෝප්ප දෙකකුයි දෙන්න! නිදා ගන්න අපි ගෙවත්තට යනවා. අද උණුසුම් දවසක් නෙව."

රොස් වූ මැහැල්ලට පිටුපසින් නැඟී සිටි සිහින් සිරුරක් කුඩා දෙපා සමබරට තබමින් නිදා සිටි උන්ගේ සිරුරු උඩින් පනිමින් ගබඩා කාමරයට ගොස් පිඟන් සහ කෝප්ප දෙකක් ගෙනාවා ය. ඇගේ සිහින් ඇඟිලි කෝප්ප අඬු පැලඳ සිටියේ ය. ඒ කොලු ගැටයෙකි යැයි පළමු ව පෙත්රොව් සිතුව ද, ඇය පහන් ආලෝකයට ළං වූ විට රූමත් එකියක් බව දැන ගත්තේ ය. ඈ ඇඳ සිටි දුඹුරු හැට්ටය සහ ගෝණි රෙදි සාය ඇගේ රුව යටපත් කළේ ය. හිස වසා සිටි පරණ කඩමාලු සළුව ඈ මැහැලියක් කළේ ය.

"මරීනා, මරීනා මෙහෙ වර ලැජ්ජා නැති කෙල්ල!" යැයි මැහැල්ල ඇට දොස් පැවරුවා ය.

මැහැල්ලගේ කෑ ගැසීම ඇට ඇසුණු බවක් පවා නොහඟවමින් ඈ කඩදාසියක් ගෙන මේසය මත එළා හැඳි හා ගෑරුප්පු තබමින් ඇස්කොනින් පෙත්රොව් දෙස බැලුවා ය.

"කන්න, ලැජ්ජ වෙන්න එපා. පාන් කපා දෙන්නද රත් කරන්න මොනව හරි තියෙනව නම් මම ඉක්මනට ලෑස්ති කරන්නම්!"

"මරීනා! මෙහෙවර!" යැයි මැහැල්ල නැවතත් කෑ ගැසුවා ය.

"ඔහෙලා එයා ගැන අමනාප වෙන්න එපා. එයාව ජර්මන්කාරයො බය කළා. රට සොල්දාදුවො දැක්කම මාව රකින්න එයා ඉදිරිපත් වෙනවා. තරහ වෙන්න එපා. රැට ඔහොම වුණාට දවල් කාලයේ දී ඈ කරුණාවන්තයි"

අලෙක්සේයිගේ මල්ලේ කොල්බසා නමැති මස් වර්ගය ද, වියළි මාළුවන් දෙදෙනෙකු ද ලොකු පාන් ගෙඩියක් ද තිබිණි. පෙත්රොව්ගේ ආහාර තොගය එයට අඩු ය. ඔහු සතු ව තිබුණේ මස් සහ විස්කෝතු පමණකි. මරීනා තම කුඩා අත්වලින් පාන් කපා මස් සහ මාළු පෙති ගසා පිඟන් මත තබන්නී, යටැසින් පෙත්රෝව් දෙස නැවත

වරක් බැලුවා ය. පෙත්රෝව් ද හොරෙන් හොරෙන් ඈ දෙස නෙත් යොමු කළේ ය. දෙදෙනාගේ නෙත් හමු වූ විට ඔවුන්ගේ මුහුණු ලැජ්ජාවෙන් රතු විණි. දෙදෙනා ම එකවර ඉවත බැලූහ. ඔවුන් එකිනෙකාට කතා කළේ ද අලෙක්සේයි මගිනි. ඔවුන්ගේ සැටි දුටු අලෙක්සේයි සතුටු වූ අතර ම, දුක් විය. ගැටවරයා හා තරුණිය දෙස බැලූ ඔහුට තමන් මහල්ලෙකු බවත් බොහෝ කල් ජීවත් වුණු විඩාපත් පුද්ගලයකු බවත් සිතිණි.

"මරීනා, ළපටි කැකිරි ගෙඩියක් එහෙම නැති ද?" යි අලෙක්සේයි ඇසී ය.

"ඇයි නැත්තෙ තියෙනවා" යැයි තරුණිය කීවේ මඳ සිනා පාමිනි.

"තම්බපු අලගෙඩියක් දෙකක් එහෙම සොයා ගන්ට පුළුවන්ද?"

"ඉල්ලනවනම් සොයලා දෙන්නම්"

ඈ නැවත නිදන්නන් අතරින් සෙමින් පා තබමින් මුළුතැන් ගෙට ගියා ය.

"ජ්‍යෙෂ්ඨ ලයිතන් සහෝදරයා! කොහොමද ඔහේ නාඳුනන තරුණියකගෙන් කැකිරි ඉල්ලන්නෙ. ඇය සමඟ කුලුපග ලෙස කතා කරන්නෙ..."

අලෙක්සේයි මෙරේස්යෙව් හඬ නඟා සිනාසුණේ ය.

"තරුණයා නුඹ කොහෙද? යුද පෙරමුණේද? නැතිද? අම්මේ නිකං බොරුවට කෑගහන්නෙ නැතිව අප සමඟ වාඩි වෙලා කන්න."

මැහැල්ල මුමුනමින් උදුනෙන් බැස මේසය අසල වාඩි වී කොල්බසා නමැති මස් වර්ගය කෑමට පටන් ගත්තා ය. සාම කාලයේ දී ඇය කොල්බසා කෑමට මහත් ආසාවක් දක් වූ බව පසු ව හෙළි විය.

මැහැල්ලත්, තරුණියත් ඔවුන් දෙදෙනා සමඟ එක්ව ආහාර ගත්හ. නිදන්නෝ, ඔවුන්ගේ ආහාර රුචිය වැඩි කිරීමට මෙන් තාලයකට සෙමෙන් ගෙරවූහ. දිගට ම කතා කළ අලෙක්සේයි මැහැල්ලට සරදම් කරමින් තරුණිය සිනා ගැස්සුවේ ය. පිටරටවල දිගු කලක් ඇවිද්ද පසු නැවත ගෙදර පැමිණියකු සේ අලෙක්සේයි නව සතුටක් ලැබ ප්‍රබෝධවත් විය.

මේ ගම විනාශ නොවූයේ එහි ජර්මන් යුද්ධ හමුදාවේ ප්‍රධාන කාර්යාලය තිබුණ බැවිනි. සෝවියට් හමුදාව කොතරම් වේගයකින් ප්‍රති ප්‍රහාර එල්ල කළේ ද යත්, පැසිස්ට් හමුදාවට ගම විනාශ කර දැමීමට පවා වේලාවක් නොතිබුණු බව දැන් ඔවුහු දැන ගත්හ. මැහැල්ලගේ වැඩිමහලු දියණිය මව ඉදිරිපිට පැසිස්ට් භටයකු දූෂණය කළ පසු, ඈ සිහිමඳකමින් පෙළෙන්නට වූවා ය. වැඩිමහලු දියණිය ලැජ්ජාව ඉවසා ගත නොහී සිය දිවි නසා ගත්තා ය. ජර්මන්නු ගම අල්ලාගෙන සිටි අටමස් කාලය තුළ දී පිදුරු මඩුවක මරීනා සඟවා තැබූ මැහැල්ල, මහා රෑ ඇට කෑම් බීම් ගෙන ගියා ය. මරීනා හිරු නොදැක අඳුරු පිදුරු මඩුව තුළ අටමසක් ගත කළා ය. අලෙක්සේයි ඈ සමඟ කතා කරන විට ඈ තරුණ පෙත්රෝව් දෙස නිතර බලන්නී, ලැජ්ජාව මුසු දඟකාරී ගතියක් පළ කළා ය. ඈ තරුණයා කෙරෙහි පැහැදී සිටින බව සැඟවීමට ඇට බැරි විය.

ආහාර ගැනීමෙන් පසු ඉතිරි වූ ආහාර කොටස් සියල්ල මනා ලෙස ඔතා ඒවා අලෙක්සේයිගේ මල්ල තුළ බහාලී ය. යුද භටයෙකුට හැම දෙයක් ම අවශ්‍ය වෙයි. තරුණිය මැහැල්ල සමඟ කසුකුසු ගා තීරණාත්මක ලෙස මෙසේ පැවසුවා යඃ

"පාලකයා ඔහේලට මෙහේ නිදාගන්ට කීවා නෙව. ඔහෙලා උඳුන උඩට වෙලා නිදාගන්ට. අපි ගබඩා කාමරයේ නිදාගන්නවා. ඔහෙලට ගමන් මහන්සිය ඇති නෙවද, හෙට ඔහෙලට තැනක් සොයා දෙන්නම්"

ඉක්මනින් ගෙවත්තට ගිය තරුණිය වියළි පිදුරු මිටියක් ගෙනවිත් උඳුන මත විසුරුවා හැර බැළලියක මෙන් නිහඬ ව පිටව ගියා ය.

"තරුණයා, කෙල්ල නම් අපූරුයි!" මෙසේ කී අලෙක්සේයි සතුටු සිතින් උඳුන මත වැතිර ගත්තේ ය. ඔහු අත් පා දිග හරින විට ඇට කැඩෙන හඬක් නික්මිණි.

"ඔව් කෙල්ල නරක නැහැ?" බොරු උදාසීන බවක් ඇඟවූ පෙත්රොව් කීවේ ය.

"ඒකි නුඹ දිහා බලපු හැටි..."

"ඈ එහෙම බැලුවේ නැහැ. ඈ ලයිතන් සහෝදරයා

සමඟ කතා කළා මිස"

යම් කිසි බියජනක සිද්ධියක් නිසා අලෙක්සේයි අවදි විය. කුමක් වී ද යන්න නොදත් නමුදු, නියම සෙබළ ඉවක් ඇති අලෙක්සේයි නැඟිට වහා පිස්තෝලය අතට ගත්තේ ය. ඔහු කොහිද? ඔහුට කුමක් වී දැයි ඔහු නොදනී. සුදුලූනු සුවඳක් සහිත දුමකින් හැම තැන ම වැසී ඇත. තම හිසට උඩින් විශාල තරු වැනි යමක් දිලිසෙන සැටි දුම් වලා පහ ව ගිය පසු ඔහුට පෙනිණි. දහවල මෙන් පැහැදිලි ය. ගොවිපළේ හැම ලී බිත්තියක් ම විසිර ගොස් ගිනි ගෙන ඇවිළී ඇත. හැඩයකට ඇති යමක් තරමක් දුරින් ගිනි ගෙන භ්‍රමණය වේ. බෝම්බ හෙළන අහස්යානාවල හඬ සහ බෝම්බ වැටෙන විට ඇති වන බියකරු හඬ ද ඇසුණේ ය. අවදි වූ පෙත්රොව් දණින් හිටගෙන වටපිට බලන සැටි දුටු අලෙක්සේයි "බිම වැතිරියන්!" යැයි කෑ ගැසී ය.

ඔවුහු උදුන මත මුණින් වැටී සිටියහ. එවිට ම වාගේ උදුනේ ගඩොල් දුම් බටයට බෝම්බයක පතුරක් වැදී ගඩොල් කුඩු සහ පස් ඔවුන් මත වැටිණි.

"හෙල්ලෙන්නේ නැතුව ඉඳපන්!" යැයි අලෙක්සේයි අණ කළේ පැන දිවීමට ඇති ආසාව මැඩ ගනිමිනි. රාත්‍රි කාලයේ දී සිදුවන පහර දීමක දී කොහේ වුණත් පැන දිවීමට හැම කෙනෙකු තුළ ම ආසාවක් ඇති වේ.

සතුරු යානා නොපෙනේ. අඳුරු අහසේ කවාකාර ලෙස පියාඹන සතුරෝ බෝම්බ දමූහ. අඳුර බිඳගෙන එක් බෝම්බයක් පුපුරන විට ඇති වන ආලෝකය නිසා කළු පැහැති බෝම්බ පාත් වන සැටි ද, ඒවා පුපුරන සැටි ද, කළු පැහැති බෝම්බ කැබැලි ගිනිගෙන විසිර යන සැටි ද දැකිය හැකි විය. මහ පොළොව කැබැලිවලට කැඩී පිපිරී යන සැටියක් ඇසිණි; දැනිණි.

උදුන මත වැතිර සිටි අහස් නැවියෝ තවත් වැතිරගෙන ගඩොල් පියස්ස බදා ගත්හ. මුහුණත්, බෙල්ලත්, පපුවත් පියස්සට තද කරමින් එයට හා වීමට ඔවුහු තැත් කළහ. පසුව අහස්යානාවල හඬ කෙමෙන් කෙමෙන් ඈත් වෙත් ම ඉදිරිපස පිහිටි වීදියේ කිසියම් තැනක් ගිනිගෙන දැවෙන සැටි සහ එහි ඝෝෂාව ද ඇසිණි.

"ඔවුන් අපට හොඳ සංග්‍රහයක් කළා" යැයි කී අලෙක්සේයි නිසල බවක් පෙන්වමින් තම ඇඳුම් මත තිබූ පස්, අඟුරු හා දූවිලි පිස දැමී ය.

"මෙතන නිදා හිටි අයට මක් වුණා ද?"යි ඇසූ පෙත්රෝව් කැලඹුණෙන් ඔහු ඉක්කා ගසන්නට විය. "මරීනා කොහෙද?"

ඔවුන් උදුනෙන් බිමට බැස ගත් අතර, අලෙක්සේයි ටෝච් පහන අතට ගෙන ගෙබිම සොයා බැලී ය. එතැන කිසිවෙක් නොවූ හ. අනතුරු සංඥා හඬ ඇසූ අහස් නැවියෝ ආරක්ෂක ස්ථාන වෙත දුව ගිය බව පසු ව දැන ගන්නට ලැබිණි. බෝම්බවලින් විනාශ වූ පෙදෙසට ගිය අලෙක්සේයිට සහ පෙත්රෝව්ට මැහැල්ල සහ තරුණිය සොයා ගත නොහැකි විය. ඔවුන්ට අඬ ගැසූ නමුදු, පිළිතුරු නොලැබිණි. ඔවුන්ට අනතුරක් සිදු වී ද? ඔවුහු ආරක්ෂක ස්ථානයකට ගියෝ ද?

යුද භටයෝ වීදිවල සාමය හා නීතිය රැක්කාහ. ඉංජිනේරු භටයෝ ගිනි නිවා දමා මළ සිරුරු ඉවතට ගත්හ. තුවාල ලැබූවන් ප්‍රතිකාර සඳහා ගෙන ගියහ. අහස් නැවියන්ගේ නම් අඬ ගසමින් සේවකයෝ කෑ ගැසූහ. සේනාංකය වෙනත් තැනකට ගෙන ගියේ ය. හිමිදිරියේ ම අහස්යානා පැදවීමට අහස් නියමුවෝ සූදානම් වූහ. මූලික පරීක්ෂණ අනුව අලාභහානිය විශාල නොවී ය. එක් අහස් නියමුවෙක් තුවාල ලැබූ අතර, මිකැනික්වරු දෙදෙනක් හා මුර භටයෝ කීප දෙනෙක් ද මිය ගියහ. ගම්මුන් බොහෝ ගණනක් මිය ගිය බව වාර්තා කළ ද, කොපමණ දැයි කිව නොහැකි විය. අඳුර හා විනාශය නිසා මිය ගිය අයගේ නියම සංඛ්‍යාව කිසිවෙක් නොදත්හ.

උදෑසන ගුවන් තොටුපළට යන ගමන් අලෙක්සේයි මෙරේස්යෙව් සහ පෙත්රොව් රෑ නවාතැන් ගත් ගේ අසල නැවැතුණහ. ඉංජිනේරු භටයන් දෙදෙනෙකු විනාශ වූ ගෙයින් කිසිවක් ගිලන් මැස්සක් මත තබා ගෙන එළියට ගෙන යන සැටි දුටු ඔවුහු මෙසේ ඇසූහ.

"කාවද ගෙනියන්නේ?" යැයි පෙත්රෝව් ඇසූවේ කිසියම් අභාග්‍යයක් බලාපොරොත්තුවෙනි. ඔහු මලානික විය.

අලෙක්සේයි මෙරේස්යෙව් සමග එක රෝහලේ ප්‍රතිකාර ගත් ස්තෙපාන් ඉවානොවිච්ට සමාන මුහුණක් ඇති ඉංජිනේරු භටයෙක් පිළිතුරු දුන්නේ ය.

"අර බිම් ගෙයි තුළින් මේ මළ මිනී දෙක ඉවතට ගත්තේ. වයසක අම්මා කෙනෙකුයි තරුණියකුයි එකට මැරිලා හිටියා. තරුණිය බොහොම පුංචියි මුහුණ හරිම ලස්සනයි බිම්ගෙයි බිත්තිය කඩා වැටෙන විට ගලක් ඇගේ පපුවට වැටිලා එතනම මැරිලා. තරුණිය හරියට පුංචි ළමයෙක් වගේ."

එදින රාත්‍රියෙහි ජර්මන් හමුදාව තම අවසාන මහා ප්‍රති ප්‍රහාරය එල්ල කළහ. මෙසේ පහර දෙමින් ඔවුහු කුර්ස්ක් අඩකවයේ මහා සටන ඇරඹූ අතර, එය ඔවුන්ට පසු ව නින්දිත පරාජයක් ගෙන දුන්නේ ය.

## 3

ගිම්හානයේ රෑ බෝවී බැස යන හිරු පැය කීපයකින් නැවත පායයි. එවැනි කෙටි රැයකින් පසු හිමිදිරි පාන්දර සෝවියට් යුද හමුදාවේ ගුවන් තොටුපළක අහස්යානා හඬ නගන්නට විය. පිනිබිඳු සහිත තණ බිම මත සිතියමක් දිග හැර තැබූ කපිතාන් චෙස්ලොව් අලුත් තත්ත්වය පැහැදිලි කළේ ය.

"දෑස් ඇරගෙන බලපල්ලා. එකිනෙකා නොපෙනී යන්ට ඉඩ තියන්න එපා. අහස් යාත්‍රාංගණය යුද පෙරමුණේ තියෙන්නෙ"

ගිම්හානයේ පළමු හිරුරැස් රෝස පැහැයෙන් නැඟෙනහිර අහස් ආලෝකවත් කරත් ම, සේනාංකය භාර නිලධාරියාගේ අහස්යානා කණ්ඩායම ගුවන් ගත් විගස ම, දෙවැනි අහස්යානා කණ්ඩායම ද එකිනෙකා පිටුපසින් ක්‍රමවත් ලෙස ගුවන් ගනිමින් දකුණ බලා පියාඹන්නට විය. අලෙක්සේයි මෙරේස්යෙව් සහ පෙත්රොව් පළමු වරට එක් ව පියැඹූහ. මේ පියාසැරිය විනාඩි කීපයකට සීමා වුණ ද, ප්‍රධාන නියමුවා වූ අලෙක්සේයිගේ දක්ෂතාව හා ආත්ම විශ්වාසය ගැන පෙත්රොව් බෙහෙවින් පැහැදුණේ ය. බලාපොරොත්තු රහිත අහස්යානය හරවමින්, වට කීපයක් පියැඹූ අලෙක්සේයි දෙවෙනි නියමු පෙත්රොව්ට

තියුණු ඇස් හා ශක්තිමත් ස්නායු තිබෙන බවත්, ප්‍රධාන ලක්ෂණයක් වන හොඳ නියමුවකුගේ ගතිගුණය -පළපුරුදු මඳ වුව ද- තිබෙන බවත් සැක හැර දැන ගත්තේ ය.

අලුත් අහස් තොටුපළ යුද පෙරමුණේ පාබල සේනාංකයට පිටුපසින් පිහිටා තිබිණි. සියලු අහස්යානා අංක 2 දරන සූදානමින් සිටිය යුතු විය. එනම් අහස්යානාවලින් එළියට නොගොස් සංඥා වෙඩිල්ල තැබූ විගස ම අහසට නැඟීමට සූදානම් විය යුතු ය. බිරියෝසා ගස්වලින් ආවරණය ලැබ ඇති තැනක අහස්යානා සඟවා තැබී ය. වනය මැදින් හමා ගිය සුළඟ හතු සුවඳක් ගෙන ආවේ ය. අවට කුඩා අගල්වලින් එළියට ආ මදුරුවෝ අහස් නියමුවන්ගේ මුහුණුවලට ද, හිස්වැසුම් හා ඇඳුම්වලට ද විද්දාහ. කාලතුවක්කු වෙඩි හඬක් දෙකන් බිහිරි කරවමින් මහපොළොව දෙදරවමින් දසත පැතිරිණි.

මෙරේස්යෙව් තම හිස්වැසුම ගලවා උදාසීන ලෙස මදුරුවන් එළවමින්, උදෑසන සිසිල් සුවඳ ආශ්වාස කරමින් සතුටු විය. මෙරේස්යෙව්ට පිටුපසින් තම දෙවැනි නියමුවාගේ අහස්යානය විය. එහි නියමු ආසනය මත වාඩි වී සිටි පෙත්රොව් ආසනය මත නැඟී සිට යුද්ධය ඇවිළෙන පැත්ත දෙසත්, බෝම්බ දමන අහස්යානා ගුවන් ගන්නා සැටිත් බැලී ය.

මෙරේස්යෙව් තම සහායක නියමුවා දෙස බලමින් සිතන්නට විය. වයස අනුව දෙදෙනා ම සම සමයෝ ය. පෙත්රොව්ගේ වයස අවුරුදු දහනවයකි. අලෙක්සේයිගේ වයස විසි තුනකි. අවුරුදු තුන හතරක වෙනසක් මිනිසෙකුට බල පාන්නේ ද? එහෙත්, පෙත්රොව් දෙස බලන විට තමා මහල්ලෙකු බව අලෙක්සේයිට දැනිණි. ඔහු විඩා පත් වූ පළපුරුදු මිනිසෙකි. අලෙක්සේයි තම නියමු ආසනයේ සැප පහසු ලෙස වාඩි වී නිසල ව විවේක ගත්තේ ය. ඔහුට දෙපා නැත. අහස්යානාවක් පැදවීම ඔහුට තරම් වෙන කිසිවෙකුට අසීරු නැත. එසේ වුව ද ඔහු නිසල ව සිටියේ ය. ඔහු තම දක්ෂතාව ගැන හොඳින් දැන සිටි අතර, තම කෘත්‍රිම පාද කෙරෙහි විශ්වාසය තැබී ය.

මේ විදියට හවස් වන තුරු ම අංක දෙක දරන යුද්ධ සූදානමෙන් ඔවුහු සිටියහ. එදින ඔවුන් සටනට ගියේ

නැත. එම අහස් තොටුපළ තිබෙන තැන වේලාවට කලින් සතුරා දනා ගනිතියි යුද නායකයෝ බිය වූ හ.

නියමුවන්ට රාත්‍රිය ගත කිරීම සඳහා බිම්ගෙයක් වැනි ආරක්ෂක ස්ථානයක් වෙන් කළේ ය. ජර්මන්නු මේ පෙදෙස අල්ලාගෙන සිටි කාලයේ දී ඔවුන් විසින් සාදන ලද මෙම බිම් ගෙයි පියස්ස ලීයෙන් සාදා ඒ මත පස් සහ කාඩ්බෝඩ් ද කහ පැහැති කඩදාසි ද දමා තිබිණි. බිම්ගෙය තුළ බිත්තියේ ජර්මන් චිත්‍රපට තාරකාවන්ගේ ඡායාරූප ද ජර්මන් නගරවල චිත්‍ර ද අලවා ඇත.

කාලතුවක්කු සටන මහ පොළොව දෙදරවමින් කැරිණි. බිම්ගෙය දෙදරුම් කෑවේ ය. ලී පියස්ස අතරින් වැටෙන පස්කැට කඩදාසිවලින් වසා ඇති පොළොව මත වැටුණේ කුඩා කෘමි සතුන්ගෙන් බිම් ගෙය පිරී ගිය සැටියක් මවා පාමිනි.

මෙරේස්යෙව් සහ පෙත්රොව් තම කැන්වස් මෙට්ට ද රැගෙන එළිමහනේ නින්දට ගියහ. නියමු ඇඳුම් නොගලවා නිදා ගන්නා ලෙස අණ කර තිබිණි. මෙරේස්යෙව් තම බොරු කකුල්වල පටි තරමක් බුරුල් කොට උඩුබැලි අතට වැටී අහස දෙස බැලී ය. වෙඩි උණ්ඩ හා බෝම්බ පිපිරීම නිසා අහස රතු පාට පැල්ලම් සහිත විය...

## 4

කුර්ස්ක් අඩ කවයේ මහා සටන භයානක ලෙස ඇවිළිණි. යෝධමය යුද ටැංකි බළසේනා කුර්ස්ක් නගරයට උතුරින් හා දකුණින් ඇති සෝවියට් ආරක්ෂක පවුරු බිඳ නගරය වට කොට එහි වූ සෝවියට් සේනා විනාශ කර දැමීම පැසිස්ට් හමුදා නායකයන්ගේ සැලැස්ම විය. කෙටියෙන් කියතොත් 'ජර්මන් ස්ටාලින්ග්‍රාඩයක්' සතුරා බලාපොරොත්තු විය. එහෙත්, සෝවියට් හමුදාවල දැඩි ආරක්ෂක බලය විසින් එම තැත විනාශ කර දමන ලදි. ප්‍රහාරය පටන් ගත් පළමු දවස් කීපය තුළ දී ම ජර්මන්නුන්ට ආරක්ෂක පවුරු බිඳිය නොහැකි බව පැහැදිලි විය. සෝවියට් ආරක්ෂක පවුරු බිඳගෙන ඉදිරියට ගිය ද, එම සටන්වල දී විශාල සේනාවක් මිය ගොස් යුද්ධායුධ විශාල තොගයක් විනාශ වන බැවින් කුර්ස්ක් නගරය වට කිරීමට තරම් බලැති සේනාවක් ඉතිරි

නොවන බව ජර්මන් සෙනෙවිවරුන්ට අවබෝධ විය. එහෙත් ප්‍රහාර නැවැත්වීමට බැරි ය. උපායමය උපක්‍රමීය හා දේශපාලනමය වශයෙන් මෙම ප්‍රහාරය කෙරෙහි හිට්ලර් බොහෝ බලාපොරොත්තු තැබී ය. ලෝදිය ගලන්නාක් මෙන් ඒ මහා ප්‍රහාරය ඇරැඹිණි. ඉදිරියේ ඇති සප්‍රාණික, අප්‍රාණික හැම වස්තුවක් ම විනාශ කරමින් ඉදිරියට ගලා ගිය ලෝදිය ප්‍රවාහයක් වැනි මෙම ප්‍රාහරය නැවත්වීමට එය පටන් ගත්තෝ පවා අසමත් වූ හ. ජර්මන් හමුදාව සෙමෙන් කිලෝමීටරයෙන් කිලෝමීටරය ඉදිරියට ගිය ද, ඒ සඳහා දස දහස් ගණන් පැසිස්ට් හටයෝ දිවි පිදූහ. ජර්මන් යුද්ධ ටැංකි සිය ගණනින් විනාශ විය. යුද රථ දහස් ගණනින් ගිනි බත් විය. ප්‍රහාරක ජර්මන් හමුදාව දුර්වල විය. පටන් ගත් ප්‍රහාරය නැවැත්වීමට තමන් අපොහොසත් බැවින්, තමන් සතු සියලු අතිරේක හමුදාවන් සහ යුද්ධායුධ යොදමින් ප්‍රහාරය කර ගෙන යාම හැර අන් කිසිවක් කිරීමට ජර්මන් සෙනෙවියෝ අපොහොසත් වූ හ. සෝවියට් ආරක්ෂක සේනා පමණක් යොදවමින් ජර්මන් ප්‍රහාරයට මුහුණ දීමට සෝවියට් හමුදාවන්ට පුළුවන් විය. පැසිස්ට් ජර්මන් හමුදාවල ප්‍රහාරක කෝපය නැඟ එන සැටි දුටු සෝවියට් මහා සෙනෙවි මණ්ඩලය සතුරා මෙල්ල වූ පසු ප්‍රතිප්‍රහාර ගැසීමට අතිරේක සේනා සංවිධාන කොට සුරැකිව තැබී ය. පසු ව අලෙක්සේයි මෙරේස්යෙව්ට දැන ගන්නට ලැබුණු පරිදි ඔහු සේවය කළ අහස්යානා හමුදාව ආරක්ෂක සටනට නොව, ප්‍රතිප්‍රාහරය සඳහා යෙදවීමට කලින් ම නියම කර තිබිණි. එබැවින් කුර්ස්ක් අඩ කවයේ මහා සංග්‍රාමයේ පළමුවැනි අවදියේ දී, සෝවියට් යුද ටැංකි හටයෝ සහ ඔවුන්ට ආධාර පිණිස වෙන් කර සිටි සෝවියට් ප්‍රහාරක අහස්යානා හටයෝ ද නිරීක්ෂකයන් බවට පත් වූ හ. සතුරා ප්‍රහාරය සඳහා මුළු බලය ම යෙදවූ බව දැන ගත් පසු, අංක දෙක දරන යුද්ධ සූදානම් තත්ත්වය නිෂ්ප්‍රභ කොට රාත්‍රියෙහි නේවාසිකාගාර, බිම්ගෙවල් තුළ නිදා ගැනීමට හා යුද ඇඳුම් ගැලවීමට ද නියමුවන්ට අණ ලැබිණි.

උදෑසන සිසිල් සුළං අලෙක්සේයි හා පෙත්රොව් නිදා සිටි බිම් ගෙයට ඇතුළු විය. පයින් අතුවල සුවඳ වහනය විය. බිත්තියට සවි කළ ලී ඇඳන් මත වැතිර සිටින

මිතුරෝ ඇඟ මැළි කඩන්නට වූ හ. කිසිවෙක් බිම්ගෙට ඇතුළු වූ සැටියක්, පා නඟන හඬක්, දැනෙන්නට විය. "තැපැල්කාරයා ඇවිල්ලා!" යන හඬ පැතිර ගියේ ය.

දෙදෙනා ම පොරෝනය ඉවත ලා ඉඳගත්හ. අලෙක්සේයි තම බොරු කකුල්වල පටි බැඳගන්නට වූ අතර, පෙත්රොව් දුවමින් ගොස් ලියුම් බෙදන්නාගෙන් ලියුම් දෙකක් ලබා ගෙන ජයග්‍රාහී ලීලාවෙන් අලෙක්සේයි වෙත ආවේ ය. එකක් අලෙක්සේයිගේ මවගෙනි. අනෙක ඕල්යාගෙනි. අලෙක්සේයි ලියුම් දෙක උදුරාගත් විට ම වාගේ අහස්යානා පැදවීමට වහා සූදානම් වන ලෙස දැන්වෙන සංඥා හඬ ඇසුණෙන්, ඔහු ලියුම් තම කබා සාක්කුවේ දමා ගත්තේ ය.

දෙදෙනා ම අඩි පාර ඔස්සේ දුව යමින් අහස්යානාවලට ළඟා වූහ. අලෙක්සේයි තම සැරයටිය බිම අනිමින් තරමක් කොරගසමින් වේගයෙන් දිව්වේ ය. ඔහුගේ අහස් යානයේ එන්ජින් කවරය ගලවා දමූ මිකැනික් ඔහු එන තුරු නොඉවසිල්ලෙන් බලා සිටියේ ය. මුහුණ පුරා කුරුලෑ ඇති මිකැනික් තැන නිතර සිනාසීමට පුරුදු වූවෙකි.

"අංක 6" දරන අහස්යානය සේනාංක භාර නිලධාරියා තැන පදවන සැටි අලෙක්සේයි බලා සිටියේ ය. කපිතාන් චෙස්ලොව් එළිමහන් තැනකට තම යානය ගෙන ගොස් අතක් එසවී ය. "සවන් දෙන්න" යන්න එහි තේරුම විය. සියලු අහස්යානාවල යන්ත්‍ර හඬ නැඟු හ. සුළං පහර නිසා තණගස් පොළොව සිපගනී. බිරියෝසා ගස්වල කොළ වේගයෙන් සැලිණි.

අලෙක්සේයි ළඟින් දුවමින් ගිය තවත් නියමුවෙක් "යුදටැංකිකාරයෝ" ප්‍රතිප්‍රහාර ඇරැඹූ බව කී හ. විනාශ වූ සතුරු කාලතුවක්කු හා ආරක්ෂක කපොලු අතරින් ඉදිරියට යන සෝවියට් යුද්ධ ටැංකිවලට ආරක්ෂාව සැලැසීම ප්‍රහාරක අහස්යානාවලට නියමිත කාර්යයකි. අහස ආරක්ෂා කිරීම ද? එහි තේරුම කුමක්ද? මෙවැනි උග්‍ර සටනක දී සාමකාමී ලෙස අහස ආරක්ෂා කළ නොහැකි ය.

අලෙක්සේයි කලබල විය. එය මරණ බියක් නොවී ය. අතිශයින් ම නිර්භය හා නිසල මිනිසුන්ට පවා දැනෙන අවදානම නිසා නොව, ඔහු කලබල වූයේ. ඔහු

සැලකිලිමත් වූ වෙනත් කරුණු නිසා ය. මැෂින් තුවක්කු හා කාලතුවක්කු හොඳින් ක්‍රියා කරාවිද? සටනක දී තව ම නොපැහැදිලි හිස්වැසුමේ ඇති ශ්‍රවණ යන්ත්‍රය හරි හැටි ක්‍රියා කරාවිද? සතුරාට එදිරි ව සටන් කිරීමට සිදු වුව හොත් පෙත්රොව් ඔහු හැර යාවිද සටන් කිරීම අතපසු කරාවිද? වසීලියි වසීලෙවිච්ගේ තෑගි දුන් හැරමිටිය කොහිද? එය නැති කර ගැනීමට අලෙක්සේයි සූදානම් නැත. පෙත්රොව්ට් ආයිබෝවන් නොකී බව ඔහුට මතක් වූයෙන්, ඔහු තම අසුන මත වාඩි වී අතක් වැනුවද, පෙත්රොව් එය නොදුටුවේ ය. අලෙක්සේයි හිස්වැසුම දමා ගත්තේ ය. ඔහුගේ මුහුණ රත් පැහැ ගත්තේ ය. කපිතාන් චෙස්ලොව් අත පහත් කරත් ම නියමු ආසනවල පියන් වැසිණි.

පළමුවෙනි අහස්යානා තුන හඬ නගමින් අහසට නැඟිණි. ඉන් පසු දෙවැනි, තෙවැනි කණ්ඩායම් ද අහසට වැදිණි. මෙරේස්යෙව් තම අහස්යානය පදවමින් අහසට නැංගේ ය. ඔහු පළමු වැනි අහස්යානා තුන අනුව තම යානය පැදවී ය. ඔහුට පිටුපසින් තව අහස්යානා ගුවන් ගත විය.

ඔවුහු යුද පෙරමුණට ඉහළින් පියාඹා ගොස්, සතුරු අහසේ අඩ කවාකාරයට පියාඹා, නැවත යුද පෙරමුණ ඉහළින් පියෑඹී ය. ඔවුන්ට සතුරෝ වෙඩි නොතැබූ හ. ඉහළ අහසේ පියාඹන කුඩා අහස්යානා නවයට වෙඩි තබනවාට වඩා වැදගත් සටනක් කිරීමට සතුරාට සිදු වී ඇත. එහෙත්, රැකවල් කළ යුතු යුද ටැංකි කොහේ ද? අසල කැලයක සිට යුද පෙරමුණට එන යුද ටැංකි දෙස අලෙක්සේයි බැලී ය. ඒවා කුරුමිණියන්ට සමාන ය. පෙළ ගැසී යුද පෙරමුණට එන යුද ටැංකිවල ගණන විශාල ය. ඉදිරියෙන් ගිය සෝවියට් යුද්ධ ටැංකිය ෂෙල් වෙඩිවලින් දැවී ගිය කඳු ගැටයකට නඟිත් ම, එහි තුවක්කුවෙන් ගිනි පිටවන සැටි ඔහු දිටී ය. ප්‍රහාරය අරඹා දුර්වල වූ සතුරු කඳවුරට පහර දෙමින් ඉදිරියට යන දහස් ගණන් සෝවියට් යුද ටැංකි තබන වෙඩි නිසා පැන නැඟී ඝෝෂාව අසමින්, අලෙක්සේයි සමඟ අහසේ සිට සටන නැරඹීමට ළමයකු හෝ ගැහැනියක හෝ ඉදිරිපත් වුවහොත්, ඔවුන් පවා බිය නොවනු ඇත. අලෙක්සේයිගේ හිස් වැස්මට සවි කොට

තිබූ ශ්‍රවණ යන්ත්‍රය 'ෂූ' හඬ නඟමින් ක්‍රියාත්මක විය. කපිතාන් චෙස්ලොව්ගේ බැරෑඬි උදාසීන කටහඬ ඇසිණි.

"සවන් දෙනු! මම ව්‍යාඝ්‍රයා! ව්‍යාඝ්‍රයා" දකුණින් "ලප්ටේෂ්නික්, ලප්ටේෂ්නික්"

තමා ඉදිරිපිට ඇත සමාන්තර රේඛාවක් දුටු අලෙක්සේයි එය කපිතාන්ගේ අහස්යානය බව දැනගත්තේ ය. එම අහස්යානය වැනිණි. කපිතාන් අනුගමනය කරන ලෙස දැන්වීමකි, ඒ. මෙරේස්යෙව් එම අණ තම කණ්ඩායමට දැනුම් දුන්නේ ය. ඔහු පෙත්රොව්ගේ අහස්යානය දෙස බැලී ය. ඔහු අලෙක්සේයි ළඟින් පියාඹයි. හොඳ කොල්ලා!

"තරුණයා, ඔන්න ඔහොම එනවා" යැයි අලෙක්සේයි තම මයික්‍රොෆෝනයෙන් ඔහුට කීවේ ය.

"හරි! එනවා" යැයි පෙත්රොව් පිළිතුරු දුන්නේ ය.

"මම ව්‍යාඝ්‍රයා! ව්‍යාඝ්‍රයා" ඉන් පසු ඔහු අණ දුන්නේ ය. "මම කරන විදිහට කරපල්ලා!"

පහළින් පියෑඹූ සතුරෝ ළං වූහ. 'යූ-87' වර්ගයේ තනි එන්ජිමේ ජර්මන් අහස්යානා දෙක බැගින් පෙළ ගැසී පියාඹති. බෝම්බ දමන මේ ජර්මන් අහස්යානා පෝලන්ත, ප්‍රංශ, ඕලන්ද, ඩෙන්මාර්කය, බෙල්ජියම සහ යුගොස්ලාවියාව ආදී රටවල දී කළ සටන් නිසා ප්‍රසිද්ධියට පත් විය. මේ යානාවල බඳයෙන් නෙරාගිය කොටස 'ලාප්ටි' නම් වූ පාවහන් ඇඳ ගත් දෙපාවලට සමාන බැවින් ඒවා 'ලප්ටේෂ්නික්' නමින් හඳුන්වන්නට වූහ. අහස් කොල්ලකරුවන් හැටියට මහත් ප්‍රසිද්ධියක් ලත් මේ ජර්මන් අහස්යානා සෝවියට් සංගමයට විරුද්ධ ව කළ සටන්වල දී යල් පැන ගිය බව ඔප්පු විය.

අහස් සටන් කීපයක දී 'යූ-87' නම් වූ ජර්මන් අහස්යානාවල දුර්වලකම් ගැන හොඳින් දැන ගත් සෝවියට් අහස් ශූරයෝ ඒවාට එදිරි ව සටන් කොට, ඒවා විනාශ කිරීම හාවුන් දඩයම් කිරීමක් ලෙස සැලකූ හ. එතරම් දක්ෂ නොවූවන්ට පවා 'යූ-87' හෙවත් 'ලප්ටේෂ්නික්' නමින් හැඳින් වූ මෙම අහස්යානා විනාශ කිරීම ලෙහෙසි කාර්යයක් විය.

කපිතාන් චෙස්ලොව් තම අහස්යානා කණ්ඩායම මෙහෙයවා සතුරාට කෙළින් ම පහර නොදී වෙන අතකට පියාරස කළේ ය. 'හිරු රැස්වලට පිටු පා'

සතුරාට නොපෙනී ඇස් අන්ධ කරවන දීප්තිමත් හිරු රැස් තම වාසියට හරවා ගෙන හිටිහැටියේ ම සතුරාට පහර දීමට කපිතාන් සැරසෙන බව අලෙක්සේයි තීරණය කළේ ය. අලෙක්සේයි සිනාසුණේ ය. ''ලප්ටේෂ්නික් අහස්යානාවලට ඕනෑවටත් වඩා සැලකිලි දක්වීමක් නොවේ ද?'' කොහි හැටි වුවත්, ප්‍රවේසම් වීම අහිතකර නොවේ. ඔහු නැවත හැරී බැලී ය. පෙත්රොව් පිටුපසින් සිය යානය පැදවී ය. සුදු පැහැති වලාකුළක පසුතලය නිසා ඔහුගේ අහස්යානය පැහැදලි ව පෙනිණි.

ජර්මන් අහස්යානා කණ්ඩායම සෝවියට් ප්‍රහාරක අහස්යානා කණ්ඩායමට දකුණින් විය. ජර්මන්නු පෙළ ගැසී ලස්සනට පියෑඹූහ. ඔවුනතර අවිද්‍යමාන නූල්පටක් තිබෙන්නාක් මෙනි. හිරු රැස්වලට මුහුණ ලා පියාසර කළ ජර්මන් අහස්යානාවල පියාපත් දිලිසිණි.

"මම ව්‍යාඝ්‍රයා.. පහර දෙනු!" යැයි අලෙක්සේයිගේ ශ්‍රවණ යන්ත්‍රය කෑ ගැසී ය.

චෙස්ලොව් හා ඔහුගේ අහස්යානා කණ්ඩායම දකුණු පෙදෙසින් ගොදුරකට පාත්වන රාජාලියන් සේ ජර්මන් අහස්යානාවලට පහර දුන්හ. චෙස්ලොව්ගේ මැෂින් තුවක්කු පහරට ලක්වුණු ජර්මන් අහස්යානාවක් ගිනිගෙන පහළට කඩා වැටිණි. පෙළට පියාඹමින් සිටි ජර්මන් අහස්යානා පෙළෙහි ඇති වූ හිස් තැනට වැදුණු චෙස්ලොව්ගේ අහස්යානා කණ්ඩායමට විරුද්ධ පැත්තට පියෑඹූ හ. නැවත පෙළ ගැසුණු ජර්මන් අහස්යානා පෙර සේ ම පියාසර කළ හ.

අලෙක්සේයි තම සංකේත සංඥාව දන්වා 'පහර දෙනු!' යැයි කෑ ගැසුව ද ඔහුගේ කටින් පිට වුණේ 'ප-හ-ර' යන ශබ්ද පමණකි. ඔහු එතරම් කැලඹී සිටියේ ය. ඔහු විදුලි වේගයෙන් තම අහස්යානය ජර්මන් අහස්යානා මත හැරවී ය. තමා ඉදිරියේ පියාඹන සතුරා හැර අන් කිසිවකු අලෙක්සේයි නොදුටුවේ ය. චෙස්ලොව්ගේ පහරට ගොදුරු ව බිම වැටුණු පසු එතැන ගෙන පියාඹමින් සිටි ජර්මන් අහස්යානය තම ඉලක්කය වශයෙන් අලෙක්සේයි තෝරා ගත්තේ ය. ඔහුගේ දෙකන් රත් විය. හදවත එළියට පැනීමට තැත් කරන සැටියක් දැනිණි. ඉලක්කය බලන කණ්ණාඩියේ කතිරය ජර්මන් අහස්යානයට එල්ල කොට

මැෂින් තුවක්කුව ක්‍රියා කරවී ය. ජර්මන් අහස් යානයෙන් කළු පැහැති දුම් පිටවිය. සතුරා පෙරළා වෙඩි තැබුව ද අලෙක්සේයිගේ අහස්යානයට නොවැදිණි. පෙත්රොව්ට කුමක් වී දැයි ඔහු හැරී බැලී ය. ඔහු නිරුපද්‍රිත ව වමින් පියෑඹුවේ ය. සතුරු වෙඩි පහරක් වැළැක් වූ පෙත්රොව් අහස්යානය හැරවීය. 'හොඳ කොල්ලා!' තවත් ජර්මන් අහස්යානාවක බඳය තම ඉලක්ක කණ්ණාඩියේ කතිරයට හසු වී ඇත. අලෙක්සේයි මැෂින් තුවක්කුවේ බොත්තම අතට ගත්තේ ය. සතුරා ළං වන තුරු සිටියි යුතු ය.

තමා සිය අහස්යානය සමඟ එකට බද්ධ වී ඇති බව අලෙක්සේයිට දැනුණේ දැන් ය. අහස් යානයේ එන්ජිම තම පපුව තුළ ක්‍රියා කරන සැටියක් ද පියාපත් හා වලිගය තම සිරුරේ ම කොටස් ලෙස ද, ඔහුට දැනිණි. අප්‍රාණික ලී කකුල්වලට පවා පණ ඇවිත් තිබෙන සැටියකි. අහස්යානය හා තම සිරුර අතර ඇති සම්බන්ධතාවට බොරු කකුල් බාධා නොකළේ ය. ජර්මන් යානය තම ඉලක්ක කණ්ණාඩියෙන් මොහොතකට ඉවත් වුණ ද, නැවත එය අසුවිය. එවිට ම අලෙක්සේයි වෙඩි තැබී ය. ඔහුගේ පහර ලැබූ සතුරු අහස්යානය දෙස නොබලා ම පහළට වැටෙන එම යානය සමඟ ඝට්ටනය නොවීම පිණිස වේගයෙන් ඉවතට පැදවී ය. එක අහස්යානයක් වෙනුවට අහස්යානා දෙකක් කඩා වැටෙන සැටි දුටු අලෙක්සේයි මවිත විය. ඔහු සතුරු අහස්යානා දෙකකට වෙඩි තැබුවේ ද? නැත. එය පෙත්රොව්ගේ වැඩකි. නවක නියමුවකු වන පෙත්රොව්ගේ වාසනාව නිසා අලෙක්සේයි වඩාත් සතුටු විය.

ජර්මන් අහස්යානය පෙළේ ඇති වූ හිස් ඉඩ තුළින් සෝවියට් ප්‍රහාරක අහස්යානා පියෑඹූහ. පැසිස්ට් ජර්මන් අහස්යානා කණ්ඩායම දෙවැනි පෙළ පදවනු ලබන්නේ අඩු පළපුරුද්දක් ඇති නියමුවන් විසින් බව පෙනිණි. ඒ සතුරු යානා පෙළට වැදුණු චෙස්ලොව්ගේ අහස්යානා කණ්ඩායම ඒවා පලවා හරිමින් ජර්මන් කඳවුරට ඔවුන්ගේ ම අහස්යානා විසින් බෝම්බ දැමීමට සලස්වන ලදි. සතුරාට පහර දීම පිණිස කපිතාන් චෙස්ලොව් සිය අහස්යානා කණ්ඩායම මෙහෙයවද්දී ඔහුගේ අරමුණ වූයේ පැසිස්ට් ජර්මනුන් ලවා ඔවුන්ගේ ගොඩබිම හමුදාවලට බෝම්බ

දැම්මවීම ය. හිරු රැස්වලට පිටුපා අහස්යානා පැදවීම ඔහුගේ ප්‍රධාන අරමුණ නොවී ය.

නැවත පැසිස්ට් ජර්මනුන්ගේ අහස්යානා කණ්ඩායමේ පළමුවැනි පෙළ සෝවියට් යුද්ධ ටැන්කි ගමන් කරමින් සිටි තැන බලා පියාසර කළේ ය. සෝවියට් අහස්යානා තෙවැනි වරට පහර ගැසූ නමුදු, එක ද සතුරු අහස්යානාවක් වත් අලාභ හානි නොලැබුවා පමණක් නොව, ජර්මන් තුවක්කු පහරකට හසු වූ එක් සෝවියට් ප්‍රහාරක යානාවක් විනාශ විය. සතුරු අහස්යානා පහර ගසමින් ඉදිරියට යන සෝවියට් යුද්ධ ටැන්කිවලට වඩාත් ළං විය. ඉහළට නැග පහර දීමට තරම් වේලාවක් නැත. සතුරු, යානාවලට යටින් ගොස් පහර ඇරැඹීමට කපිතාන් චෙස්ලොව් කළ තීරණය අලෙක්සේයි සිතින් සම්මත කළේ ය. 'ලා-5' වර්ගයේ සෝවියට් අහස්යානය අතිශයින් ම ජංගමශීලී ය. සතුරු අහස්යානාවල 'යටි බඩට' පහර දීමට අලෙක්සේයි යුහුසුලු විය. ඉදිරියෙන් පියාඹා ගිය ප්‍රහාරක අහස්යානා පෙළ සිරස් ලෙස සතුරු යානාවලට පහර දුන්නේ ය. සතුරු යානා දෙකක් බිම වැටිණි. ඉන් එක අහස්යානයක් දෙකට කැඩී වෙන් වුණා විය යුතු ය. කොටසක් අලෙක්සේයිගේ යානයේ නොහැප්පුණේ යම්තමිනි.

"මා පස්සේ එනවා!" යැයි පෙත්රොව්ට දැන් වූ අලෙක්සේයි ඔහු දෙස යන්තමින් හැරී බලමින් සුක්කානම අල්ලා ගත්තේ ය.

මහ පොළොව ඉහළ ගොස් පහළට වැටුණාක් මෙන් අලෙක්සේයිට දැනිණි. පහරක් වැදුණු කලෙක මෙන් ඔහු අසුනට තද විය. කටට ලේ රසයක් දැනුණු අතර, අවට රත් පැහැයක් ගැසුණාක් මෙන් විය. අලෙක්සේයිගේ අහස්යානය සිරස් ලෙස ඉහළට පියාඹන්නට විය. ඔහු අසලින් පියාඹන ජර්මන් අහස්යානයක යටි පැත්ත ද එහි රෝද ද ඔහු දිටී ය. රෝදවල ඇති මැටි සහ පස් කැටි ද ඔහුට පෙනිණි.

ඔහු මැෂින් තුවක්කුව ක්‍රියා කරවී ය. පහර වැදුණේ පැට්රල් ටැංකියට ද, බඳට ද, එන්ජිමට ද, නැතිනම් බෝම්බ රාක්කයට ද යන්න කිව නොහැකි ය. සතුරු අහස්යානය පුපුරා දුම් වලාවක් ඇති කළේ ය.

අලෙක්සේයිගේ අහස්යානය පැත්තකට විසි විය. ගිනිගත් සතුරු අහස් යානයෙන් ඉවතට ගිය අලෙක්සේයි තම අහස්යානය සමාන්තර තත්ත්වයට හරවා අවට අහස පිරික්සා බැලී ය. ඔහුගේ සගයා වන පෙත්රොව් සබන් පෙණ වැනි සුදු වලාකුළුවලට ඉහළින් නිල්වන් අහසේ දකුණු දෙසින් පියාඹන සැටි දිටී ය. අහස පාළු වෙලා ය. ඈත ක්ෂිතිජයේ කළු ලප වැනි යමක් පෙනිණි. ඒවා විසිර යන තුරු සතුරු අහස්යානා ය. අලෙක්සේයි තම අත්ඔරලෝසුව දෙස බැලී ය. මේ සටන්වල පැය භාගයක් පමණ කාලයක් ගෙවී ඇති බැවින් පැට්රල් ටැංකිය හිස් වී ඇතැයි ඔහු සිතුවේ ය. එහෙත්, ගෙවී ඇති කාලය විනාඩි තුන හමාරක් පමණක් බැව් දුටු ඔහු පුදුම විය.

"පණපිටින්ද?" යි අලෙක්සේයි තම සගයා වන පෙත්රොව්ගෙන් ප්‍රශ්න කළේ ය. මේ වන විට පෙත්රොව් සිය අහස්යානය අලෙක්සේයිගේ අහස්යානයට සමාන්තර ව පැදවී ය.

"පණපිටින්... බිම... බිම බලන්න"

පහළ කඳු ගැටයක් අසල පෙදෙසක ගිනි ගෙන දැවෙන පැට්රල් ටැන්කි සහිත සතුරු අහස්යානා කීපයක් විය. ඒවායින් දුම්වලා නැංගේ ය. එහෙත්, අලෙක්සේයි ඒවා දෙස නොබැලී ය. යුද පිටිය පුරා දුවමින් සිටි අළු පැහැති කුරුමිණියන් වැනි සෝවියට් යුද්ධ ටැන්කි සතුරු කඳවුරට පහර දෙමින් ඉදිරියට යන සැටි ඔහු දිටී ය. ඉඳහිට පිටුපසින් වෙඩි තබන ජර්මන් තුවක්කු විසින් ගිනිබෝල පිටකරන ලදි.

සතුරු කඳවුර බිඳගෙන ඉදිරියට ගොස් සටන් කරන සෝවියට් යුද්ධ ටැන්කිවල අගය අලෙක්සේයි වටහා ගත්තේ ය.

සෝවියට් ජනතාව ද, නිදහස්කාමී ලෝකයා ද ප්‍රීතියට පත් කරවන ඒ විශේෂ සිද්ධිය ගැන පසු දින පුවත්පත්වල පළ විය. දෙපැයක් තිස්සේ නොකඩවා කාලතුවක්කුවලින් බලසම්පන්න ලෙස පහර ගැසූ පසු කුර්ස්ක් අඩ කවයේ පැසිස්ට් ජර්මන් යුද කඳවුරක් බිඳගෙන ඉදිරියට ගිය සෝවියට් යුද්ධ හමුදාවෝ ප්‍රති ප්‍රහාරය ඇරැඹූහ.

එදින පැසිස්ට් අහස්යානාවලට පහර දුන් චෙස්ලොව්ගේ අහස්යානා නවයෙන් දෙකක් සටනේ දී විනාශ විය.

පැසිස්ට් අහස්යානා නවයක් විනාශ කළේ ය. සොහොයුරන් දෙදෙනෙකුගේ අභාවය නිසා ජයග්‍රහණයෙහි දීප්තිය අඩු විණි. අහස්යානා ගුවන්තොටුපළට ගෙනා පසු අහස් නියමුවෝ කෑකෝ ගසමින් හඬ නගමින් කතා නොකළහ. බිහිසුණු සටනකින් ජය ලැබූ පසු සිරිත් පරිදි අනතුරු ගැන සිතමින් පසු වූහ. බුම්මාගෙන නිලධාරි මණ්ඩලයේ ලොක්කා වෙත පැමිණි ඔවුහු ප්‍රතිඵල ගැන කෙටි වාර්තා කොට එකිනෙකා දෙස නොබලා ආපසු ගියහ.

අහස්යානා සේනාංකයට අලුතින් පැමිණි අලෙක්සේයි මිය ගිය සෝවියට් අහස් නියමුවන් දෙදෙනා ගැන නොදත්තේ ය. එහෙත්, පොදු අභාග්‍යය නිසා ඔහු ද දුක් විය. සිත කය දෙක ම යොදමින් ක්‍රියා කළ අරමුණ -අනෙකුත් ප්‍රකෘති මිනිසුන්ට මෙන් ම, තමන්ට ද සමාජයේ සම තැනක් ලබා ගැනීම - ඉටු වී ඇති බව අලෙක්සේයිට අවබෝධ විය. එය ඔහු ලැබූ අනගිතම ජයග්‍රහණය විය. දෙපා කපා දැමූ පසු රෝහලේ ඇඳ මත වැතිර ගෙන ව්‍යායාම් කිරීමෙන් පටන් ගෙන ඇවිදීම, නැටුම් ඉගෙන ගැනීම, අහස් නියමුවකුට අවශ්‍ය සියලු දක්ෂකම් නැවත ලබා ගැනීම ආදී හැම දෙයක් ම කරමින් ඔහු සිහින දුටුවේ මේ දවස ගැන ය. ඔහු බලාපොරොත්තු වූ පරිදි ඒ දවස ඔහුට විශිෂ්ට ජයක් ලබා දුන්නේ ය. එහෙත්, දැන් තමා විසින් පැසිස්ට් ජර්මන් අහස්යානා දෙකක් බිම හෙළා දමනු ලැබීමෙන් පසු, ප්‍රහාරක යානා කණ්ඩායමේ සාමාජිකයකු වශයෙන් සම්පූර්ණ අයිතිය ලැබීමෙන් පසු, සෙසු ප්‍රහාරක අහස් නියමුවන් මෙන් ප්‍රධාන නිලධාරි තැන වෙත ගිය අලෙක්සේයි මෙරේස්යෙව් වෙඩි තැබූ සතුරු අහස්යානා සංඛ්‍යාව ගැන ද, සටන සිදු වූ තත්ත්වය ගැන ද කෙටි වාර්තාවක් කර, තම දෙවැනි නියමු පෙත්රොව්ට පසසා, බිරියෝසා ගස යටට ගොස් එදා සටනේ දී දිවි පිදූ සහෝදර නියමුවන් දෙදෙනා ගැන සිහි කරමින් ශෝක විය.

හිස් වැස්මක් රහිත ව ගුවන් තොටුපළ වටේ දුවමින්, හමු වූ හැම එකකුගේ ම අතින් අල්ලාගෙන සටන් ගැන විස්තර කිරීමට ඉදිරිපත් වූ එක ම පුද්ගලයා වූයේ පෙත්රොව් පමණි.

"ඔන්න සතුරා ළඟටම ඇවිල්ලා. අත ළඟම! අහනවකො. සතුරු කණ්ඩායමට ඉදිරියෙන් ගිය අහස්යානයට අපේ ජ්‍යෙෂ්ඨ ලයිතන් පහර දුන්නා. මම ඊළඟ එකට ගැහුවා. සතුරා බිම වැටුණා!"

අලෙක්සේයි වෙත දුවමින් ගිය පෙත්රොව් ඔහුගේ දෙපා ළඟ වැටී දිගා විය. එයිනුදු ඉවසීමක් ලබා ගත නොහැකි වූයේ නැවත නැඟී සිට කතා කළේ ය.

"අද ඔහෙ හරි ලස්සන සරඹ ටිකක් පෙන්නුවා නෙව! මගේ ඇස්වල අන්ධකාරයක් ඇතිවුණා ඒවා දැකලා. ඔහෙ දන්නවද මම අර අහස්යානාව විනාශ කළ හැටි? ඔන්න අහන්න.... මම ඔහෙ ළඟින්ම පියාඹමින් හිටියා සතුරා අත ළඟටම ආවා..."

"පොඩ්ඩක් නවතිනවා," යැයි ඔහුගේ කතාවට බාධා කළ අලෙක්සේයි සාක්කු සියල්ල අතගාන්නට විය "ලියුම්, ලියුම්.... මම ඒවා කොහේ දැම්ම ද?"

අද ලැබුණු ලියම් දෙක නොකිය වූ බව අලෙක්සේයිට මතක් විය. කබායට යටින් කුහරය අත ගෑ විට ලියුම් කවර අතට දැනුණෙන් ඔහු සැනසුම් සුසුමක් හෙළී ය. ඕල්යා විසින් එවන ලද ලියුම අතට ගත් අලෙක්සේයි ගස මුල වාඩි වී ප්‍රවේසමෙන් ලියුම් කවරය ඉරා ලියුම අතට ගත්තේ පෙත්රොව්ගේ කතාවට සවන් නොදෙමිනි.

එවිට ම රතු රොකට් වෙඩිල්ලකින් ගුවන් තොටුපළ ආලෝකවත් විය. අහස් නියමුවෝ නැවත තම අහස්යානා වෙතට දුවන්නට වූ හ. අලෙක්සේයි ලියුමේ එක ද වගන්තියක් වත් නොකියවා නැවත එය කමිස කුහරයේ ලා ගෙන සිය අහස්යානය වෙත දුව ගියේ ය. ලියුම පමණක් නොව, එහි තවත් යම් කිසි සනැති යමක් තිබෙන බව ඔහුට දැනිණි. අහස්යානය ගෙන ගුවන් ගත වූ අලෙක්සේයි තමාට පුරුදු මඟ ඔස්සේ යමින් එක් අතකින් ලියුම අත ගාමින් කල්පනා කළේ ය. එය කුමක්ද?

අලෙක්සේයි සේවය කළ ප්‍රහාරක අහස්යානා සේනාංකයට -යුද්ධ ටැන්කි විසින් සතුරු කඳවුර බිඳිනු ලැබූ දවසේ සිට- එදා සිට මරු සටන්වලට මුහුණ පෑමට සිදු විය. සතුරු කඳවුරට ඉහළ අහසට ප්‍රහාරක අහස්යානා සේනාංක නොකඩවා වැදිණි. එක් සේනාංකයක් සටන් කොට ඛනිජ තෙල් ලබා ගැනීම සඳහා ගුවන් තොටුපළට

පැමිණෙත් ම, තවත් ප්‍රහාරක අහස්යානා සේනාංකයක් එතැන ගෙන නොනවත්වා සටන් කළේ ය. ගුවන් තොටුපළට එන අහස්යානාවලට විශාල නළ මගින් ඛනිජ තෙල් වක්කළේ ය. ගිම්හාන වැස්සකට අසුවුණු කෙතකින් නගින තුනී මීදුම වැනි පටලයක් හඬ නගමින් ක්‍රියාකාරී වී අහස්යානා එන්ජින්වලින් මතු විණි. නියමුවෝ නියමු අසුන්වල ම වාඩි වී ආහාර ගත්හ. ඇලුමිනියම් බඳුන්වලින් ඔවුන්ට ආහාර ගෙනාවේ ය. එහෙත්, ඔවුනට ආහාර ගැනීමට තරම් වේලාවක් හෝ පහසුවක් හෝ නොතිබිණි. ගිලුණු ආහාර පවා උගුරේ හිර විය.

කපිතාන් චෙස්ලොව්ගේ අහස්යානා කණ්ඩායම වනයක් අසල නැවැතුණු පසු ඒවාට ඛනිජ තෙල් සැපයුවේ ය. නියමු අසුනෙහි වාඩි වී සිටි අලෙක්සේයිට විඩාපත් ගතියක් දැනුණ ද, ඔහු සතුටින් සිටියේ ය. හැකි තරම් ඉක්මනින් ඛනිජ තෙල් පුරවන ලෙස සේවකයන්ට දන්වා සිටි අලෙක්සේයි තෘප්තිමත් ලෙස මඳ සිනා පෑවේ ය. නැවත නැවතත් පරීක්ෂණයට මුහුණ පෑමට හා තව තවත් සටන් කිරීමට ආසාවක් ඔහු තුළ උපනි. ඔහු තම කබායට යටින් ඇති ලියුම නිතර අත ගෑව ද, එවැනි බිහිසුණු සටන් ඇවිළ පවතින තත්ත්වයක දී එය කියවීමට නොසිතුවේ ය.

එදින ඇඳිරි වැටුණු පසු අහස් සටන් නිමා විය. පහර දෙමින් ඉදිරියට ගිය සෝවියට් ගොඩබිම හමුදාවලට සෑහෙන ආරක්ෂාවක් සැලැසූ පසු චෙස්ලොව්ගේ අහස්යානා සේනාංකයට විවේක දුන්නේ ය. අලෙක්සේයි මෙරේස්යෙව් එදින තම නැවැතුම්පළට ගියේ කෙටි මඟ ඔස්සේ නොවේ. වල් පැළෑටිවලින් ගහන දිග මඟක් ඔස්සේ ගමන් කළ ඔහුට, එදින සටන් ගැන නැවත සිතීමට වුවමනා විය.

වේගයෙන් ගමන් ගත් ජීප් රථයක් ඔහු පිටුපස නැවැත්වූ බව අලෙක්සේයිට දැනිණි. සේනාංකය භාර ප්‍රධාන නිලධාරි තැන රථයෙන් එළියට බට සැටි ඔහුට පෙනිණි.

“මම හැම තැනම ඇවිද්දා. අපේ වීරයාව සොයමින් ඇවිද්දා. අපේ වීරයා කොහිද? මෙන්න අපේ වීරයා ඇවිදිනවා” යැයි ප්‍රධාන නිලධාරියා පැවසී ය.

අසීරු අභ්‍යාස කරන විට තම අහස්යානය ඉදිරියෙන් පදවන ප්‍රධාන නිලධාරි තැන හවසට මිකැනික්වරුන් සමඟ එක් වී යන්ත්‍ර සූත්‍ර අත ගැමට ආසා කරන්නාක් මෙන් ම, ඉතා දක්ෂ ලෙස තම මොටෝරිය පැදවූ ඔහු, ඒ යන්ත්‍ර සූත්‍ර අත ගා බැලීමට ද ආසා කළේ ය. ඔහු නිතර ම නිල් පැහැති ඇඳුමකින් සැරසී සිටියේ ය. ඔහුගේ තියුණු මුහුණ හා නිලය හඳුන්වන අලුත් හිස්වැස්ම නිසා නොවේ නම්, ඔහු ද සාමාන්‍ය මිකැනික් ශිල්පියෙකුට සමාන විය.

තම හැරමිටියෙන් පොළොවේ ඉරි අඳිමින් සිටි මෙරේස්යෙව්ගේ උරහිසින් අල්ලාගත් ප්‍රධාන නිලධාරි තැන මෙසේ පැවසී යː

"තමුසෙ දිහා බලන්ට මම කැමතියි. බැලූ බැල්මට නම් විශේෂයක් පෙනෙන්ට නැහැ. දන් ඇත්ත හෙළි කරන්නම්. තමුසෙව මෙහාට එවන විට තමුසෙ ගැන බොහෝ දේ කිව්වට මම විශ්වාස කළේ නැහැ. ඇත්තටම විශ්වාස කළේ නැහැ. තමුසෙට අහසට නැඟල සටන් කරන්ට පුළුවනියි කියල මා විශ්වාස කළේ නැහැ. විශේෂයෙන්ම මේ වගේ සටනක්... ඔන්න අපේ රුසියන් මාතාවගෙ හැටි! මම තමුසෙට සුබ පතනව විතරක් නෙමෙයි තමුසෙගෙ හපන්කම් හින්දා තමුසෙට ගරු කරනව..."

අලෙක්සේයි තම නවාතැනට නොගොස් බිරියෝසා ගසක් මුල හතු මුසු සුවඳ ඇති පඳුරක් අසල වාඩි වී ප්‍රවේසමෙන් ඕල්යාගේ ලියුම ගෙන කියවන්නට විය. ලියුම තුළ වූ ඡායාරූපයක් බිමට වැටුණෙන් ඔහු එය අතට ගෙන බැලී ය. යුද නිල ඇඳුමින් සැරසුණු ඕල්යාගේ ඡායාරූපය විය. අසිපත පලඳින පටිය ඇඳ සිටි ඇගේ රුසපුව රතු ධජයේ පදක්කමකින් සැරසී ඇත. තරුණියකට වඩා ඇගේ රූපය ගැටවරයෙකුට සමාන වී ඇතැයි ඔහුට සිතිණි. ඒ මුහුණ විඩාපත් වූ බවක් කියා පෑවේ ය. යෞවන නොවන ලොකු ඇස් වටකුරු ය. බැල්ම විනිවිද යනසුලුය.

අලෙක්සේයි සිය පෙම්බරියගේ ඡායාරූපය දෙස බොහෝ වේලාවක් බලා සිටියේ ය. කෙනෙක් ලස්සන ගීයක් ගයන සැටි ඇසෙන විට සිත දුක මුසු තෘප්තියකින් පිරී යන්නේ යම් සේ ද, එසේ ම අලෙක්සේයිගේ සිත ද එවැනි තෘප්තියකින් පිරිණි. ඔහු තම සාක්කුවෙන් ඕල්යාගේ පැරැණි ඡායාරූපය ගෙන අලුත් ඡායාරූපය හා

සමකර බැලී ය. මල් පාත්තියක් ළඟ පලා වන් ගවුමක් ඇඳ සිටින ඕල්යාට වඩා යුද ඇඳුමින් සැරසී සිටින විඩාපත් ඇස් ඇති තමා කිසි දිනෙක දැක නැති ඕල්යා තමාට වඩාත් කිට්ටු බවත්, වඩාත් වටිනා බවත් අලෙක්සේයිට අවබෝධ විය. ඡායාරූපය පිටුපස මෙසේ ලියා තිබිණි. "මා අමතක නොකරන්න"

ඇගේ ලියුම කෙටි ය, ප්‍රීතිදායක ය. ඉංජිනේරු භට කණ්ඩායමක නායිකාවක වශයෙන් ඈ ක්‍රියා කරන්නී ය. ඇගේ භට කණ්ඩායම යුද පෙරමුණේ නොව, සාමකාමී වැඩවල යෙදී සිටින බව ඈ ලියා තිබිණි. ඔවුහු ස්ටාලින්ග්‍රාඩ් නැවත ගොඩ නැඟීමෙහි යෙදී සිටිති. තමා ගැන මඳ වශයෙන් ලියූ ඕල්යා මහා නගරය ගැනත්, එහි විනාශය ගැනත්, තරුණියන් මැදිවියේ කාන්තාවන් හා ළමයින් සෝවියට් දේශයේ හැම තැනකින් ම පැමිණ බිම්ගෙවල්වල, යුද කඳවුරුවල, ආරක්ෂක කපොලුවල, විනාශ වූ ගොඩනැගිලිවල පදිංචි වී මහත් උනන්දුවකින් ස්ටාලින්ග්‍රාඩ් නගරය ගොඩ නඟන සැටි මහත් ආයාසයකින් විස්තර කළා ය. හොඳින් වැඩ කරන හැම කෙනෙකුට ම ස්ටාලින්ග්‍රාඩය තුළ ගෙයක් ලැබෙන බවට කතාවක් පැතිර ගොස් තිබෙන සැටි ද ඈ ලියුවා ය. මේ කතාව සත්‍යයක් නම් යුද්ධයෙන් පසු අලෙක්සේයිට විවේක ගැනීමට තැනක් තිබෙන බව ද ඈ ඔහුට දැන්වූවා ය.

ගිම්හාන සමයේ දී ඉක්මනින් ඇදිරි වෙයි. ලියුමේ අවසාන වැකි කීපය ඔහු කියැවූයේ ටෝච් එළියේ ආධාරයෙනි. ලියුම කිය වූ පසු ඔහු නැවත ටොච් එළියේ ආධාරයෙන් යුද නිල ඇඳුමින් සැරසී සිටි ඕල්යාගේ ඡායාරූපය දෙස බැලී ය. ඇගේ බැල්ම බරපතළ ය. දෙනෙත් අවංක ය. සුන්දරිය, සුන්දරිය, නුඹට ලෙහෙසි නැත... යුද්ධයට නුඹ අසුවුණ ද, නුඹ විනාශ කිරීමට යුද්ධය අපොහොසත් වී ඇත. නුඹ මා එනතුරු බලා සිටින්නෙහි ද? බලා ඉන්න! බලා ඉන්න! නුඹ මට පෙම් කරන්නෙහි ද? පෙම් කරන්න! සුන්දරිය! අවුරුදු එකහමාරක් තිස්සේ ස්ටාලින්ග්‍රාඩ් වීරවරියගෙන් ඇත්ත සඟවා තැබීම ගැන අලෙක්සේයි ලජ්ජා විය. වහා ම නවාතැනට ගොස් සම්පූර්ණ ඇත්ත හෙළි කරමින් ලිවීමට ඔහුට වුවමනා විය.

ඕනෑ ම තීරණයක් ගත්තාවේ! ඉක්මන් වන තරමට යහපත් ය. හැම දෙයක් ගැන ම තීරණයක් ගත් පසු දෙදෙනාට ම ලෙහෙසි වනු ඇත.

අද සටනින් පසු ඔහුට ඈ සමඟ සම තත්ත්වයකින් කතාකළ හැකි ය. ඔහු අහස්යානා පදවනවා පමණක් නොව, යුද්ධ කරයි. තම සියලු අදහස් හා සිතැඟියාවන් විනාශ වූ පසු හෝ අනිකුත් ප්‍රහාරක අහස්යානා නියමුවන් සමඟ සම තත්ත්වයකින් සටන් පෙරමුණ ගත් දාට හෝ තමා ගැන සම්පූර්ණ ඇත්ත හෙළි කිරීමට ඔහු එදා දිවුරුම් දුන්නේ ය. දැන් ඔහු සමානයකු සේ ප්‍රහාරක සටනක යෙදී ඇත. තම සිහිනය සැබෑ වී ඇත. හැම දෙනා ම බලා සිටිය දී ඔහුගේ වෙඩි පහරට ලක් වූ සතුරු අහස්යානා දෙකක් බිම වැටී ගිනි ගත්තේ ය. සේවය භාර නිලධාරියා එය සටහන් කළේ ය. එම වාර්තාව ඩිවිෂනයට ද මූළ හමුදාවට ද මොස්කව් නුවරට ද යවා ඇත.

මේ සියල්ල සැබෑ ය. ඔහු තම ප්‍රතිඥාව ඉටු කොට ඇති බැවින්, ඔහුට ලිවීමට අයිතියක් තිබේ. එහෙත්, ඇත්ත වශයෙන් ම කල්පනා කර බලන විට 'ලප්ටේෂ්නික්' නමින් හැඳින්වෙන සතුරු යානාව ප්‍රහාරක නියමුවකුට සෑහෙන සතුරෙක් ද? දක්ෂ දඩයක්කාරයෙක් හාවකුට වෙඩි තැබීය යන සාක්ෂ්‍ය ඉදිරිපත් කරමින් තම දක්ෂතාව ඔප්පු කරති ද?...

## 5

අහස්යානා සේනාංකය අලුයම අවදි කළේ ය. සෝවියට් යුද්ධ හමුදා විසින් සතුරු කඳවුර බිඳිනු ලැබූ පෙදෙසට පෙරදින අලුත් ජර්මන් අහස්යානා හමුදාවක් එවූ බව සඳහන් වන වාර්තාවක් සෝවියට් ඔත්තුකරුවන් එවා ඇති බව දැන ගන්නට ලැබිණි. කුර්ස්ක් අඩ කවයේ ජර්මන් ආරක්ෂක පවුරු බිඳීම නිසා හටගත් තත්ත්වය භයානක බැවින් ජර්මනියේ අතිශයින් දක්ෂ අහස් නියමුවන් විසින් පදවනු ලබන 'රිහ්ට්ගෝපන්' නමැති සුප්‍රසිද්ධ අහස්යානා ඩිවිෂනය එවා ඇති බව නිරීක්ෂකයන් හා ඔත්තු සේවාව විසින් ද තහවුරු කරන ලදි. සතුරා විසින් ගෙන්වන ලද අහස්යානාවල සංඛ්‍යාව විශාල බව ද, මේ ඩිවිෂනය ස්ටාලින්ග්‍රාඩ් අසල සිදු වූ මහ සටන්වල දී පරාජය වුණු

බව ද 'පොක්කේ වුල්ෆ් 190' නමැති නවීනතම අහස්යානා වර්ගය සහිත මේ අහස්යානා හමුදාව සටනෙහි පළපුරුද්ද ඇති බව ද සෝවියට් අහස් හමුදාවට දැනගන්නට ලැබිණි.

පැසිස්ට් ජර්මනියේ නායකයකු වන හර්මන් ගෝරින්ග්ගේ විශේෂ අනුග්‍රහය ලබන 'රිහ්ට්ගෝපෙන්' නම් වූ මෙම අහස්යානා ඩිවිෂනය ගැන පළපුරුදු සෝවියට් අහස් නියමුවෝ දත්හ. ජර්මන් හමුදාව පරාජය ලබන විට මේ අහස්යානා ඩිවිෂනය එවීම සිරිතක් විය. මෙහි සමහරුන් තම නියමු සේවය පටන් ගත්තේ ස්පාඤ්ඤ සිවිල් යුද්ධ කාලයේ දී ජනරජයට විරුද්ධ ව පහර දෙමිනි. අහස් සටන්වල දී දක්ෂතාවක් පෙන් වූ මොවුහු බිහිසුණු සටන්කරුවෝ වූහ.

"සමහරු කියනවා 'රිහ්ට්ගෝපෙන්' කියන අහස්යානා කණ්ඩායමක් අපට විරුද්ධව එවල තියනවයි කියල. මම බොහොම කැමතියි උන්ට විරුද්ධව ඉක්මනින් සටන් කරන්න. අපි කවුද කියල උන්ට පෙන්වන්න ඕන!" යැයි පෙත්රොව් අවන්හලේ වාඩි වී ආහාර ගනිමින්, රායා නමැති සේවිකාව දෙස යටැසින් බලමින් පැවසී ය. අලෙක්සේයි තේරුමක් නැති කතා ඇසීම නොරිස්සුවේ ය.

"'රිහ්ට්ගෝපෙන්' කියන්නේ එසේ මෙසේ අහස්යානා කණ්ඩායමකට නොවේ. නුඹ හොඳට ප්‍රවේසම් නූනොත් අද ගිනිගොඩට අහුවෙන්ට පුළුවනි. අහස් සටන්වල දී සම්බන්ධකම් නැති නොකරගෙන ඇස්, කන් ඇරගෙන සටන් නොකළොත් 'රිහ්ට්ගෝපෙන්' කියන මෘගයෝ නුඹ කට අරින්න පෙර නුඹව එකවරම ගිල දමාවි. සහෝදරය එවුන් එතරම් නපුරු සත්තු වගයක්...."යැයි අලෙක්සේයි පැවසී ය.

හිම්දිරි පාන්දර සේනාංකය භාර ප්‍රධාන නිලධාරියාගේ නායකත්වයෙන් එක් ප්‍රහාරක අහස්යානා කණ්ඩායමක් ගුවන් ගත්තේ ය. ඒ කණ්ඩායම අහස පිරික්සා බලද්දී, සේනාංකයේ දක්ෂතම නිලධාරියකු වූ ද, සෝවියට් සංගමයේ වීරයා යන උසස් සම්මානය දිනා ගත්තා වූ ද මේජර පිදෝතොව්ගේ නායකත්වයෙන් ප්‍රහාරක අහස්යානා දොළහක් අහසට නැගීමට සූදානම් වූ හ. නියමු ආසනවල වාඩි වී යන්ත්‍රවල යතුරු කරකවා සූදානම්

විය. මේ පිරිස මහ කුණාටුවකට පෙර මහ පොළොව කම්පා කරවමින් ගස් වැල් සොලවමින් හමා යන සුළං පහරකට සමාන විය.

නියමු අසුන මත වාඩි වී සිටි අලෙක්සේයි ප්‍රධාන නිලධාරියාගේ අහස්යානා කණ්ඩායම නැවත එන සැටි බලා සිටියේ ය. අහසේ සිට පහතට ලිස්සන්නාක් මෙන් පැමිණි ඒ අහස්යානා වරකට දෙක බැගින් ගොඩ බසින සැටි ඔහු ගණන් කළේ ඉබේට ම මෙනි. හැම අහස්යානයක් ම ආපසු පැමිණි පසු අලෙක්සේයි සැනසුම් සුසුමක් හෙළී ය.

ප්‍රධාන නිලධාරියාගේ අහස්යානා කණ්ඩායමට අයත් අවසාන අහස්යානය ගුවන් තොටුපළට ළඟා වත් ම, මේජර් පිදෝතොව් තම යානය පදවා විදුලි වේගයෙන් ගුවන්ගත කළේ ය. ඔහු පිටුපසින් ඔහුගේ කණ්ඩායමට අයත් අහස්යානා දෙක බැගින් පෙළ ගැසී අහසට නැංගා හ. කැලයට පිටුපසින් නැවත පෙළ ගැසුණු පිදෝතොව්ගේ කණ්ඩායම ඊයේ සෝවියට් පාබළ හමුදාව විසින් සතුරු පෙරමුණ බිඳිනු ලැබූ ස්ථානය පසුකරමින් හැකිතරම් පහළින් පියාසර කළේ ය. පිදෝතොව් තම අහස්යානයේ පියාපත් සොලවමින් ගුවන් මඟ පෙන්වී ය. පිදෝතොව්ගේ අණට අනුව පහළින් පියාසර කළ අලෙක්සේයි යුද බිම දෙසට නෙත් හැරවී ය. පෙරදින ඉහළ අහසේ පියාසර කරන විට දුටු දර්ශනයට වඩා හාත්පසින් ම වෙනස් දර්ශනයකි ඔහු දුටුවේ. ඉහළ අහසේ සිට බලන විට හැම දෙයක් ම සෙල්ලම් බඩු මෙනි. එහෙත්, අද පහළින් පියාසර කරන විට ඔහු දුටු යුද පිටිය අති විශාල ය. හැම තැන ම යුද බටයන්ගේ මළ සිරුරු ය. වෙඩි බෝම්බ ය. ආරක්ෂක අගල් හා වළවල් ය. විනාශ වුණු යුද්ධායුධ ය. අතහැර දමා ගිය කාලතුවක්කු වෙන් වෙන් ව ද කාණ්ඩ වශයෙන් ද ඇත. විනාශ වුණු යුද්ධ ටැන්කි ගිනිගත් ලෝහමය උපකරණ හා අවි ද ඔහු දිටී ය. කාලතුවක්කු වෙඩි පහරට අසුවුණු එක් තැනක සමතලා බිමකි. මෙතැන හැම දෙයක් ම විනාශ වී ගොසිනි. දහස් ගණනක් සතුන්ගේ පාවලට පෑගුණු කලෙක මෙනි. අවසානයක් නැති බිහිසුණු චිත්‍රපටියකට ඒ දර්ශනය සමාන විය. මෙතැන සිදු වූ මහා සටනේ බිහිසුණු බව ද මියගිය

යුද භටයන්ගේ හා විනාශ වුණු යුද්ධායුධවල සංඛ්‍යාව ද එයට දෙස් දුන්නේ ය. මේ සියලු විනාශය නිසා ඉන් ලැබූ ජයග්‍රහණයේ අගය ද සීමා රහිත විය.

සෝවියට් යුද්ධ ටැන්කිවල සටහන් යුද පිටිය පුරා ම දකින්නට තිබිණි. ඉදිරියෙහි වූ හැමදෙයක් ම සමූලඝාතනය කරමින් පැසිස්ට් ජර්මනුන්ගේ කඳවුරට වැද ක්ෂිතිජය දක්වා ම ගමන් කළ මේ යුද්ධ ටැන්කි විසින් තබන ලද සටහන් අමුතු වර්ගයකට අයත් සතුන්ගේ ආක්‍රමණයක් සිහියට නැංවී ය. සෝවියට් යුද්ධ ටැන්කිවලට පිටුපසින් යාන්ත්‍රික කාලතුවක්කු, පෙට්‍රල් හා ඛනිජ තෙල් රැගත් රථ ද, ට්‍රැක්ටර් යන්ත්‍ර මඟින් ඇදගෙන යන යුද්ධායුධ අලුත් වැඩියා කරන කම්හල් ද, කැන්වස්වලින් වැසූ ලොරි ද, ඉදිරියට ගමන් ගෙන ඇත්තේ අළු පැහැති දූලි වලා නංවමිනි. ඉහළ අහසේ සිට බලන විට මේ මහා සේනාවේ ඉදිරි ගමන කුහුඹි රැළකට සමාන විය.

උසට නැඟ ඇති දූලි වලාවලට වැදුණු ප්‍රහාරක අහස්යානා කණ්ඩායම යුද්ධ ටැන්කි හමුදාව ඉදිරියෙන් ගමන් කරන ජීප්රථවලට -සෝවියට් යුද්ධ ටැන්කි හමුදාවේ නායකයන් මේ රථවල ගමන් කරතියි සිතිය හැකි ය. මෙසේ ඉදිරියට යන සෝවියට් යුද්ධ මුදාවට ඉහළින් අහසේ ඇති සතුරු අහස්යානා නොතිබුණ ද, ඈත ක්ෂිතිජයේ නොපැහැදිලි ලෙස තැනින් තැන දුම් වලා පැන නඟින සැටි අලෙක්සේයි දිටී ය. සරුංගල් මෙන් වටේට පියාඹමින් ප්‍රහාරක අහස්යානා කණ්ඩායම ආපසු හැරෙත් ම, ක්ෂිතිජයේ සිට අහසට වන් කළු පැහැති කිසිවක් අලෙක්සේයිට පෙනිණි. කළු ලප වැනි ඒවා පහළින් පියාසර කරමින් ඉදිරියට ආවේ වේගයෙනි. ජර්මන්නු! හැකිතරම් පහළින් පියෑඹූ සතුරු අහස්යානා ඉදිරියට යමින් සිටි සෝවියට් යුද්ධ ටැන්කි හා යුද්ධ රථ විසින් නංවන ලද දූලි වලාවල පසු කොටස වෙතට එමින් සිටියාක් මෙනි. රතු පැහැති යුද පිටියෙන් නැඟි දුම්වලා පෙනිණි. අලෙක්සේයි ඉවෙන් මෙන් වටපිට බැලී ය. පෙත්රොව් තමාට පිටුපසින් හැකිතරම් ළංව පියෑඹී ය.

ඈත සිට කතාකරන හඬක් ඔහුගේ ශ්‍රවණ යන්ත්‍රවලින් පිටවූයෙන් අලෙක්සේයි ඕනෑකමින් සවන් දුන්නේ ය.

"මම දෙවැනි මුහුදු ලිහිණියා, පිදෝතොව්. මම දෙවැනි මුහුදු ලිහිණියා, පිදෝතොව්. සවන් දෙනු! මා පස්සේ එනු!"

ස්නායු පීඩනය හා නොසන්සුන්තාව කොතරම් උග්‍ර ද යත්, අණ දෙන නිලධාරියා අණදීම අවසාන කිරීමටත් පෙර සමහර විට, අහස් නියමුවෝ ඔහුගේ අණ ක්‍රියාවට යොදවති. අණ දෙන නිලධාරි තැනගේ කටහඬ ඈත සිට අණ දීම කර අවසන් වන්නටත් පෙර ප්‍රහාරක අහස්යානා දෙක බැගින් පෙළ ගැසී මනා ලෙස සංවිධානය වී ජර්මන් අහස්යානාවලට පහර ගැසීමට සූදානම් වූ හ. දෘෂ්ටිය, ශ්‍රවණය හා චින්තනය උපරිමය දක්වා උග්‍ර විය. තමා වෙත වේගයෙන් පියාඹන සතුරු අහස්යානා හැර වෙන කිසිවක් අලෙක්සේයිට නොපෙනේ. ප්‍රධානියාගේ අණ ඇසිය හැකි ශ්‍රවණ යන්ත්‍රවල ඝෝෂාව හැර වෙන කිසිවක් ඔහුට නෑසේ. එහෙත්, විදේශීය භාෂාවකින් කියන යමක් ඔහුගේ කන් වැකිණි.

"ආඃට්උන්ග්! අඃට්උන්ග්! 'ලා-ජ්යූන්ප්' ආඃට්උන්ග්!"

ජර්මන් ගුවන් තොටුපළේ නිරීක්ෂකයෙක් තම අහස්යානාවලට අනතුරු හැඟවීමක් කළා විය යුතු ය.

පෙරදින රැයෙහි ජර්මනුන් නිරීක්ෂකයන් සහ ගුවන් විදුලි සංඥා පණිවුඩකරුවන් රැසක් පැරචුට් මඟින් සටන් ඇතිවිය හැකි පෙදෙසේ උපක්‍රමීය අතින් වැදගත් යැයි සැලකිය හැකි තැන්වලට ගොඩබස්වා ඇත. සුප්‍රසිද්ධ ජර්මන් අහස්යානා කණ්ඩායමේ එක් සංග්‍රාමෝපායයකි මේ.

තරමක් නොපැහැදිලි ලෙස තවත් ජර්මන් හඬක් ඇසිණි. රොස් වූ ජර්මන් නිරීක්ෂකයෙක් බැරෑඩි හඬකින් කෑ ගැසී ය.

"ඕ, ඩොන්නෙර්-වෙට්ටර්! ලින්ක්ස් 'ලා ජ්යූන්ප්! ලින්ක්ස් 'ලා-ජ්යූන්ප්!"

ඒ කටහඬෙහි බියක් හා චකිතයක් ගැබ් වී තිබිණි.

සතුරු අහස්යානා දෙස අලෙක්සේයි බැලුවේ ය. 'පොක්කේ වුල්ෆ්-190' නමැති බලගතු කඩිසර ප්‍රහාරක අහස්යානා අලුත් ඒවා ය.

ගණනින් සතුරු අහස්යානා මේජර පිදෝතොව්ගේ කණ්ඩායම මෙන් දෙගුණයකි. 'රිහ්ට්ගෝපෙන්' ඩිවිෂනයට අයත් විශේෂ ක්‍රමයක් අනුව ඒවා පෙළ ගැසී පියැගට

පෙළක් ලෙස පියාසර කරන්නට විය. මේ ක්‍රමය ඉදිරියෙන් පියාඹන අහස් යානයේ වලිගය පිටුපසින් පියාඹන අහස්යානාව විසින් ආරක්ෂා කෙරිණි. සතුරාට වඩා ඉහළින් පියාසර කළ පිදෝතොව් පහර දීම ඇරඹී ය. අලේක්සේයි තමාට සුදුසු ගොදුරක් සොයාගෙන අනිකුත් සතුරු අහස්යානා ගැන ද සොයා බලමින් පහර දීමට පියෑඹී ය. එහෙත්, පිදෝතොව්ට පෙර සෝවියට් 'යාක්' අහස්යානා කීපයක් සතුරාට පහර දුන්හ. ඒ ප්‍රහාරය කොතරම් සාර්ථක වී ද යත්, සතුරු අහස්යානාවල පෙළ ගැසීමේ ආකාරය බිඳිණි. ආකුල ව්‍යාකුල තත්ත්වයක් ඇති වූයෙන් අහස්යානා දෙක හා හතර බැගින් වෙන් ව සටන් කරන්නට වූ හ. සෝවියට් ප්‍රහාරකයෝ සතුරු අහස්යානාවලට මැෂින් තුවක්කුවලින් වෙඩි තැබූ හ. ඒවායේ පිටුපසට හා වලිගයට ද පියාපත්වලට ද පහර දුන්හ.

එකිනෙකාට වෙඩි තබමින්, පහර දෙමින් කතුරු ඔන්චිල්ලාවක් මෙන් ඔවුහු පියෑඹූ හ.

මේ අවුල් ජාලය මැද සිදුවන්නේ මොනවා ද යන්න දකින්නේ පළපුරුදු ඇස් පමණකි. ශ්‍රවණ යන්ත්‍රවලින් පිටවන ඝෝෂාව අතරින් සංඥා නියම ලෙස දැන ගනු ලබන්නේ පළපුරුදු කන් විසිනි. ශ්‍රවණ යන්ත්‍රවලට හැම දෙයක් ම පාහේ ඇසිණි. පහර ගැසීමට ඉදිරියට යන ප්‍රහාරයක නියමුවාගේ බැණ වැදීම් ද, පහර කා වේදනාවෙන් කෑ ගසන්නාගේ බිහිසුණු විලාපය ද ජයග්‍රාහකයාගේ ජය හඬ ද, තුවාල ලැබුවන්ගේ කෙඳිරි ගෑම් සහ දත්කෑම් ද ආශ්වාස ප්‍රශ්වාස කිරීම් ද ඇසිණි. කෝපාවිෂ්ට වූ ප්‍රහාරකයෙක් ජර්මන් බසින් ගීයක් ගැයී ය. එකෙක් විස්මය පත්වූයේ 'අම්මා!' යැයි කෑගැසී ය. තුවක්කුවේ කොකා ගස්සවමින් කෑගැසූවෙක් "ඉඳා උඹට කාපිය" යැයි මොර ගෑවේ ය.

පහර ගැසීමට අලෙක්සේයි තෝරා ගත් සතුරු අහස්යානය අතුරුදන් වී, එතැන සෝවියට් 'යාක්' ප්‍රහාරක යානයක් පියාඹන සැටි ද, එය සතුරු පොක්කෙ වුල්ෆ් අහස්යානයක් ලුහු බඳින සැටි ද අලෙක්සේයි දිටී ය. සුරුට්ටුවකට සමාන සතුරු අහස්යානයක් පියාපත්වල තුවක්කුවලින් 'යාක්' යානයට වෙඩි තැබී ය. අලෙක්සේයි

වහා ම යාක් යානයට ආධාර පිණිස වේගය වැඩි කරත් ම සතුරු යානය ඔහු ඉදිරියේ පෙනිණි. තත්පරයකින් භින්නයක් පමණ වූ ඒ සුළු වේලාවේ දී අලෙක්සේයි සතුරු යානයට වෙඩි තැබී ය. සතුරාට කුමක් වී දැයි ඔහු නොදුටුව ද 'යාක්' යානය කැඩුණු වලිගය සහිත ව හුදෙකලාව පියාඹන සැටි ඔහු දිටී ය. තම සගයා අතරමං වී දැයි අලෙක්සේයි සොයා බැලී ය. පෙත්රොව් තමාට සමාන්තර ව පියාඹන සැටි දුටු අලෙක්සේයි දත්කමින් මෙසේ කී යː

"තරුණයා පමා වෙන්න එපා"

ඔහුගේ ශ්‍රවණ යන්ත්‍රය ඔහුට විවේකයක් නොදුණි. රුසියන් සහ ජර්මන් යන දෙබසින් ම ජය නිසා කෑගසන සැටි ද, පහර කෑ විට භීතිය පළ කරන සැටි ද බැණ වදින සැටි ද, දත්මිටි කන සැටි ද, සුසුම්ලන සැටි ද ඇසිණි. මේ කෑකෝ ගැසීම් හා ඝෝෂාව අහස් සටනක් නොව, යුද අගල්වල පොරකමින් ඇණ කොටා ගන්නා යුද්ධයකට සමාන නොසන්සුන්තාවක් පළ කළේ ය.

අලෙක්සේයි සතුරු යානා සොයමින් වට පිට බැලී ය. ඔහු දුටු දර්ශනය නිසා, ඔහු මොහොතකට ගල් ගැසිණි. ඔහුට පහතින් 'පොක්කේ-වුල්ෆ්' අහස්යානයක් 'ලා-5' කට පහර දෙන සැටි දුටු ඔහු, එහි අංක නොදුටුව ද, එය පෙත්රොව්ගේ අහස්යානය බව ඉවෙන් මෙන් දැන ගත්තේ ය. සතුරා ඔහුගේ හැම තුවක්කුවකින් ම පෙත්රොව්ට වෙඩි තැබී ය. තව මොහොතකින් පෙත්රොව් විනාශ වනු ඇති. අහස්යානා දෙක එකිනෙකට ළං වී සටන් කරන බැවින්, තම මිතුරාට ආධාර දීමට කාලයක් හෝ ඉඩක් හෝ නොතිබිණි. එහෙත්, තම සගයා මරණයෙන් බේරා ගත යුතු ය. අලෙක්සේයි තම අහස්යානය පහතට හරවා විදුලි වේගයෙන් දුවන ඊයක් මෙන් සතුරු අහස්යානය බලා පදවමින් වේගය වැඩි කළේ ය. අහස්යානයේ හා ඔහුගේ බර ද යන්ත්‍රවල වේගය ද අවස්ථිතිය ද නිසා එය සතුරා මත කඩාවැටෙන පර්වතයක් මෙනි. එය පර්වතයක් නොව, රොකට් වෙඩිල්ලක් මෙන් විය. වේගයෙන් සිරස් අතට පහතට පැදවීම නිසා අලෙක්සේයිට සිහි නැති ව යන සැටියක් දැනිණි. තම අහස්යානයේ අවර පෙත්තට හොඳට ම ළං වී තිබුණු සතුරු අහස්යානය දුම් වලාවකින්

වැසී ගිනි ගත් සැටි දැකීමෙහි ඔහු සමත් විය. එහෙත්, පෙත්රොව් දකින්නට නැත. ඔහු කොහි ද? ඔහුගේ අහස්යානය විනාශ වී ද? නැත්නම් ඔහු පැරචුටය මඟින් බිමට පැන ගත්තෙහි ද?

අහස පාළු වී තිබිණි. නොපෙනෙන අහස්යානයකින් අණක් ලැබිණි.

"මම දෙවැනි මුහුදු ලිහිණියා, පිදෝතොව්. මම දෙවැනි මුහුදු ලිහිණියා පිදෝතොව්. ආපසු යාමට පෙළ ගැසෙනු! මම දෙවැනි මුහුදු ලිහිණියා..."

මේජර පිදෝතොව් තම අහස්යානා කණ්ඩායම ගුවන් තොටුපළට ගෙන යාමට තීරණය කර ඇත.

පෙත්රොව්ගේ අහස්යානය ලුහුබැඳ ගිය සතුරු යානයට පහර දුන් පසු නැවත තම අහස්යානය සමාන්තර ලෙස පැදවූ අලෙක්සේයි මෙරේස්යෙව් තුළ සතුටක් හා ශාන්ත බවක් ඇති විය. සතුරා විනාශ කර දැමූ අතර, අවදානම පහවී ගොසිනි. ගුවන් තොටුපළට යා යුතු දුර ප්‍රමාණය හා ඉතිරි ව ඇති ඛනිජ තෙල් ප්‍රමාණය දෙස බැලූ හෙතෙම රොස් විය. ඉතිරි ව ඇති ඛනිජ තෙල් ප්‍රමාණය නැවත ගුවන් තොටුපළට යාමට ප්‍රමාණවත් නොවේ. එහෙත්, එයටත් වඩා බියජනක අවදානමක් අලෙක්සේයි දිටී ය. පුලුන් ගොඩක් වැනි වලාකුළකින් මතු වූ 'පොක්කේ වුල්ෆ් 190' අහස්යානයක් අලෙක්සේයි ලුහු බැන්දේ ය. කල්පනා කිරීමට හෝ පැනයාමට හෝ වේලාවක් නැත.

තමා වෙත එමින් සිටින සතුරාට මුහුණ දීම් වස් අලෙක්සේයි ඉදිරියට ගියේ ය.

## 6

ඉදිරියට යමින් සිටින සෝවියට් යුද්ධ හමුදාවේ පසු කොටසකට ඉහළින් අහසේ සිදු වූ මේ සටනේ හඬ ඇසුණේ අහස් නියමුවන්ට පමණක් නොවේ.

ගුවන් තොටුපළේ බලගතු ගුවන්විදුලි යන්ත්‍රය මඟින් එම සටනට ප්‍රධාන සෙනෙවි කර්නල් ඉවානොව් සවන් දුන්නේ ය. පළපුරුදු අහස් නියමුවෙක් වන ඉවනොව් ගුවන්විදුලි යන්ත්‍රයෙන් නික්මෙන හඬ අනුව එය උණුසුම් සටනක් බව වටහා ගත්තේ ය. ශක්තිමත් මුරණ්ඩු ජර්මන් අහස්යානා පසුබැසීමට නොකැමැති බව පෙනිණි.

පෙදෝතොව්ගේ අහස්යානා කණ්ඩායම අසමාන සටනක යෙදී සිටිතියි යන ආරංචිය ගුවන් තොටුපළ පුරා පැතිර ගියේ ය. කැලෑවේ ආරක්ෂක කපොලුවලින් එළියට ආ සමහරු කැලඹීමෙන් යුතු ව දකුණු දෙස අහස බැලූහ.

සුදු කබා ඇඳගත් දොස්තරවරු අවන්හලින් පිටතට දුව ගියහ. කැලෑවේ ආරක්ෂක ස්ථානවල සඟවා තිබුණු ගිලන් රථවල යන්ත්‍ර ක්‍රියාකාරී විය. ඒවායේ වහලවල රතු කුරුස ඇඳ තිබිණි.

පළමුවැනි අහස්යානා යුගල ගස්වලට උඩින් පියාසර කරමින් වට රවුම් නොගසා ම ගුවන් තොටුපළට ගොඩ බැස්සේ ය. අංක 'එක' දරන අහස්යානාව, එනම් සෝවියට් සංගමේ වීරයකු වන මේජර් පිදෝතොව් විසින් පදවනු ලැබූ ප්‍රහාරක යානය ද අංක 'දෙක' දරන යානය ද පළමුවෙන් ළඟා විය. ඒ එක්කම දෙවැනි අහස්යානා දෙක ද ගොඩ බැස්සේ ය. අහස් තොටුපළට හැරී එන අහස්යානාවල හඬින් වාතය පිරිණි.

කැලඹී සිටි නිරීක්ෂකයෝ "හතයි, අටයි, නවයයි, දහයයි...." යනුවෙන් ගණන් කළෝ අහස දෙස බලාගත්වන ම සිටියහ.

ගුවන් තොටුපළට පැමිණි අහස්යානා ආරක්ෂක ස්ථානවලට ගෙන ගියේ ය. අහස්යානා දෙකක් ඇවිත් නැත.

බලාපොරොත්තු සහිත නිහඬතාවක් පැතිරිණි. විනාඩි ගෙවී ගියේ වේදනාව ඇති කරවමිනි.

"මෙරේස්යෙව් සහ පෙත්රොව් ඇවිත් නැහැ" යි කවුදෝ සෙමින් පැවසී ය.

හිටිහැටියේ ම ගැහැනු කටහඬක් ගුවන් තොටුපළ පුරා පිළිරුව් දුනි.

"එකක් එනවා!"

අහස්යානයක හඬ ඇසිණි. බිරියෝසා ගස්වලට වැදෙන තරම් පහළින් අංක '12' දරන ප්‍රහාරක යානය ආවේ ය. එහි වලිගය කැඩිලා ය. වම් පියාපතේ කොටසක් කැඩී කම්බියක ආධාරයෙන් එල්ලෙමින් තිබිණි. ගුවන් තොටුපළට බට ඒ යානය අමුතු ලෙස පනිමින් යන්නට විය. උඩ පැන නැවත බිම ගැවී, නැවත වරක් උඩ පැන

ගුවන් තොටුපළේ කෙළවරට ම ගිය අහස්යානය නතර වෙත් ම, එහි වලිගය උඩු අතට හිටවිණි. දොස්තරවරුන් රැගත් ප්‍රථමාධාර රථ හා ජීප් රථ කීපයක් ද රැස්ව සිටි පිරිස් ද ඒ අහස්යානය වෙත දුව ගියහ. නියමු අසුනෙන් කිසිවෙක් පිට නොවූයෙන් එහි පියස්ස විවෘත කළේ ය. ලේ ගොඩක් මත වාඩි වී සිටි පෙත්රොව් පිටතට ගත්හ. ඔහුගේ හිස පපුව මත වැටී තිබිණි. ඔහුගේ හිසකේ දාඩියෙන් තෙමිලා ය. දොස්තරවරු හා හෙදියෝ ඔහුගේ ඇඳුම්වල පටි ගලවා ෂෙල් වෙඩිල්ලකින් විනාශ වුණු පැරචුට් බෑගය ඉවත් කොට අප්‍රාණික සිරුර ගිලන් මැස්සක් මත තැබූ හ. පෙත්රොව්ගේ අතක් හා පයක් තුවාල වී තිබිණි. ඔහුගේ නිල් පැහැති නියමු ඇඳුමට උඩින් ලේ පැල්ලම් මතු විය.

පෙත්රොව්ට ප්‍රථමාධාර දුන්නේ ය. ඔහු ප්‍රථමාධාර රථයට තැබීමට ඔසවත් ම ඔහුගේ ඇස් විවෘත විය. පෙත්රොව් යමක් කී නමුදු, එය නෑසුණෙන් ප්‍රධානියා ඔහු වෙත නැඹුරු විය.

"මෙරේස්යෙව් කොහිද්ද" යි පෙත්රොව් ඇසුවේ ය.

"තවම ආවෙ නැහැ"

පෙත්රොව්ගේ ගිලන් මැස්ස නැවත එසැවී ය. තුවාල ලැබ සිටි පෙත්රොව් වේගයෙන් දඟලමින් හිස පවා එසවී ය.

"නවතින්න! මාව ගෙනියන්ට එපා. මට යන්ට බැහැ. මෙරේස්යෙව් එනතුරු ඉන්නම්. එයා මගේ ජීවිතය බේරා ගත්තා"

පෙත්රොව් ඉතිරි ව ඇති ශක්තිය යොදමින් විරුද්ධත්වය ප්‍රකාශ කරමින් වෙළුම් පටි ඉරා දමන බවට තර්ජනය කළේ ය. අතක් වැනූ ප්‍රධානියා දත් සපමින් මෙසේ පැවසී යඃ

"ඔහොම තියන්න. එයා මැරෙන්නෙ නැහැ. මෙරේස්යෙව්ට තව විනාඩියකට වඩා පියාසර කරන්න පැට්රල් ඉතුරු වී නැහැ"

ප්‍රධානියා තම අත්ඔරලෝසුවේ තත්පර කටුව දෙස බැලී ය. රත් පැහැති තත්පර කටුව තත්පර කිරමින් වටය යන්නට විය. අවසාන අහස්යානය පැමිණිය යුතු පෙදෙස සහිත වනය දෙස ඔවුහු බලා සිටියහ. ඈත තුවක්කු වෙඩි

හඬක් සහ කොට්ටෝරුවෙක් ගසකට කොටන ශබ්දය හැර අන් කිසි හඬක් නොවී ය.

විනාඩියක් ගතවීමට සමහර විට බොහෝ වේලා ගත වේ.

## 7

සතුරු අහස්යානා දෙක උපරිමය වේගයෙන් එකිනෙකා හමුවීමට ඉදිරියට ගියහ.

'ලාවොච්කින්-5' නමැති සෝවියට් ප්‍රහාරක අහස්යානාවල සහ 'පොක්කේ වුල්ෆ් 190' නමැති ජර්මන් අහස්යානාවල ධාවන වේගය ඉමහත් ය. ශබ්ද වේගය පරදවමින් එකිනෙකා හමුවීමට ඔවුහු ඉදිරියට පැදවූහ.

අලෙක්සේයි මෙරේස්යෙව් සහ සුප්‍රසිද්ධ 'රිහ්ට්ගෝපෙන්' අහස්යානා ඩිවිෂනයේ දක්ෂ නියමුවෙක් මුහුණට මුහුණ ලා සටන් කිරීම පිණිස ඉදිරියට ගියහ. දුම්බීමෙහි දීර්ඝ පුරුද්දක් ඇත්තෙක් සිගරැට්ටුවක් දල්වීමට ගෙවන කාලයටත් වාඩ අඩු කාලයකි අහස් සටනක් සඳහා ගත වන්නේ. එහෙත්, ඒ මොහොත සඳහා අහස් නියමුවා කොතරම් ශක්තියක් හා ආධ්‍යාත්මික බලයක් යෙදිය යුතු ද යත්, ගොඩබිම සටන් කරන්නෙකුට එය මුළු දවසකට ප්‍රමාණවත් වන්නේ ය.

අහස්යානා දෙකක් මහත් වේගයකින් එකිනෙකාට විරුද්ධ ව ඉදිරියට යන සැටි සිතෙහි මවාගන්න. සතුරු අහස්යානාවේ වේගය වැඩි වී තමා වෙත එය ළංවත් ම එහි ප්‍රමාණය වැඩිවන සැටියක් පෙනෙයි. එහි පියාපත්, මූණත, අවර පෙත්ත, කළු තිත් වැනි තුවක්කු මේ හැම දෙයක් ම ඔබ ඉදිරියේ වෙන් ව විශාල ව පෙනේ. තව මොහොතකින් අහස්යානා එකිනෙකට හැප්පුණු පසු කැලිවලට කැඩී, බිඳී යන අහස්යානාව හා එහි නියමුවාගේ ශරීරාවයව වෙන් කොට සොයාගත නොහැකි වනු ඇත. මෙවැනි මාරාන්තික සටනක දී අහස් නියමුවාගේ අධිෂ්ඨාන ශක්තිය පමණක් නොව, ආධ්‍යාත්මික බලය ද පරීක්ෂාවට භාජන වේ. දුර්වල ස්නායු ඇති නියමුවා පරාජය වනු ඇත. ජයග්‍රහණයේ නාමයෙන් දිවි පිදීමට සූදානම් නැති නියමුවා මාරාන්තික කුණාටුවෙන් බේරීම

පිණිස අහස්යානය හරවනු ඇත. මොහොතකින් ඔහුගේ අහස්යානයට හානි වී බිම පතිත වනු ඇත. ඔහුට ගැලවීමක් නැත. පළපුරුදු නියමුවෝ මේ ගැන ඉතා හොඳින් දනිති. අතිශයින් ම නිර්භය අය පමණක් මෙසේ මුහුණට මුහුණ ලා සටන් කිරීමට ඉදිරිපත් වෙති.

අහස්යානා දෙක එකිනෙකට විරුද්ධ වේගයෙන් පියැඹී ය.

තමාට පහර දීමට එමින් සිටින්නේ හර්මන් ගෝරින්ගේ ඉල්ලීම අනුව, නැඟෙනෙහිර පෙරමුණේ සිදු වී ඇති විශාල අලාභ හානි පිරිමසා ගනු වස් හදිසියෙන් ජර්මන් අහස් හමුදාවට බැඳුණු නවක අහස් නැවියෙකු නොවන බව අලෙක්සේයි දැන ගත්තේ ය. සතුරු අහස්යානා කීපයක් ම විනාශ කළ බව දැක්වෙන සටහන් ඇති 'රිහ්ට්ගෝපෙන්' අහස්යානා ඩිවිෂනයේ දක්ෂ නියමුවෙක් තමාට පහර දීමට එන බවත්, ඔහු අවසාන මොහොතේ දී පලා නොයන බවත් අලෙක්සේයිට වැටහිණි.

තම අහස් යානයේ අවර පෙත්තේ සිදුර තුළින් සතුරාගේ මුහුණ තමාට පෙනෙන බවත්, ඔහුගේ තියුණු දෑස් තමා දෙස බලන බවත් අලෙක්සේයිට දැනෙන්නාක් මෙනි. සතුරාගේ ඇස් වෛරය හා කෝපය නිසා ගිනිගෙන දැවිණි. අලෙක්සේයිගේ ස්නායු ආතතිය විසින් ඔහු මේ මායා දර්ශනය පැහැදිලි ලෙස ම දකිනු ලැබී ය. 'මේ අවසානයයි' මෙසේ සිතූ අලෙක්සේයි මෙරේස්යෙව් තමා සතු මුළු ශක්තිය ගොනු කර ගත්තේ ය. 'මේ අවසානයයි' සතුරු යානය තමා වෙත සුළි සුළඟක් සේ එන සැටි ඔහු දිටී ය. ජර්මන් අහස් නියමුවා පසු නොබසිනු ඇත. මේ අවසානයයි!

අලෙක්සේයි මරණයට සූදානම් විය. එහෙත්, සැණෙකින් ජර්මන් අහස්යානය තමා ළඟට පැමිණිය යුතු ව තිබුණ ද, එය ඉහළට ගිය සැටියක් ඔහුට දැනිණි. ස්නායු ආතතිය උසුලා ගත නොහැකි වූ ජර්මන් අහස් නියමුවා තම යානය ඉහළට පැදවී ය. අලෙක්සේයි ඉදිරිපිට ජර්මන් අහස් යානයේ යටි පැත්ත දිටී ය. එවිට ම ඔහු තම අහස් යානයේ සියලු තුවක්කු එකවර ක්‍රියා කරවී ය. සතුරා අහස්යානය වෙඩි පහරට ගොදුරු ව බිම වැටිණි. අලෙක්සේයි 'මාර වටය' නමින් හැඳින්වෙන පිම්ම

ගසමින් එතැනින් ඉවත් විය. ජයග්‍රාහී ප්‍රබෝධයකින් ඔහු අමුතු පණක් ලැබී ය. හැම දෙයක් ම අමතක කරමින් 'ඕල්යා!' යැයි හඬ නඟා කී අලෙක්සේයි වටරවුම් ගසමින් පහළට බැස්සේ ජර්මන් අහස්යානයේ අවමඟුලට සහභාගි වන්නාක් මෙනි. බිමට වැටුණු ජර්මන් අහස්යානය විශාල ගින්නක් ඇති කරමින් පිපිරිණි.

අලෙක්සේයිගේ ස්නායු ප්‍රබෝධය දැඩි විඩාවකට සැණෙකින් පරිවර්තනය විය. ගල් මෙන් තද ව තිබුණු මාංස පේශීන් මුදු විය. ඔහුට ඉබේට ම මෙන් ඛනිජ තෙල් මීටරය දෙස බැලිණි. මීටර කටුව බින්දුවට ළං වී ඇත.

විනාඩි තුනක් අහස්යානය පැදවීමට තරම් ඛනිජ තෙල් ඉතිරි ව ඇත. විනාඩි හතරක් අහස්යානය පැදවිය හැකි නම් වඩාත් හොඳ ය. ගුවන් තොටුපළ දක්වා යාමට නම් විනාඩි දහයක් අහස්යානය පැදවිය යුතු ය. ඉහළට නැඟීමට තවත් වේලාවක් ගතවනු ඇත. කඩා වැටුණු ජර්මන් අහස්යානය කැටුව පහළට පියාසර කිරීම නිසා අලෙක්සේයි තමාට ම දොස් තබා ගත්තේ ය. "මම මෝඩ කොල්ලෙක් වගේ හැසුරුණා!"

අනතුරක් ඇති වූ විට නිර්භය මිනිස්සු තියුණු ලෙස හා පැහැදිලි ලෙස කල්පනා කරති. අලෙක්සේයි ද කලබල නොවී පැහැදිලි ලෙස කල්පනා කළේ ය. වහා ම උපරිමය ලෙස ඉහළ නඟින අතර හැකි තරම් ගුවන් තොටුපළට ළඟා විය යුතු ය. වට රවුම් ගැසීම නොකළ යුතු ය.

අහස්යානය වුවමනා මඟ ඔස්සේ පැදවූ අලෙක්සේයි බිම බැලී ය. ක්ෂිතිජය නොපැහැදිලි ය. ඔහු නිසල ව තම කාර්යයෙහි යෙදුණේ ය. ඛනිජ තෙල් ගැන බලාපොරොත්තු විය නොහැකි ය. මීටරය සැබෑ තත්ත්වය පිළිබිඹු නොකළත්, ඉතිරි ව ඇති ඛනිජතෙල්වලින් ගුවන් තොටුපළ දක්වා යා නොහැකි ය. ගුවන් තොටුපළට නොගොස් අතර මඟ දී ගොඩ බසින්ට ද? කොතැනට ද? කෙටි මඟ ඔහු මනැසින් විමසා බැලි ය. උසැති ගස්, මඩ වළවල්, කඳු ගැට සහිත ආරක්ෂක කපොලු කටු කම්බි සහිත ආරක්ෂක අගල්.

මඟදී ගොඩ බටහොත් මරණය හමු වනු ඇත.

පැරචුටය මගින් බිමට පනින්ට ද? එය කළ හැකි ය. පියස්ස හැර යතුර කරකවා පැනීම! එවිට අහස්යානයට අද

තෙවරක් ම ජීවිතය ගලවා දුන් ඉස්තරම් යන්ත්‍ර සහිත ශීඝ්‍ර අහස්යානයට කුමක් වේ ද? අහස්යානය ඒ මොහොතේ දී පණැති වස්තුවක් බව ඔහුට දැනිණි. තමාට අවංක ව සේවය කළ පරාර්ථකාමී ලස්සන වස්තුව අතැහර දැමීම පාවාදීමක් ලෙස අලෙක්සේයිට හැඟිණි. ඇරත් පළමුවෙනි සටනින් පසු අහස්යානාව නැතිව ගුවන් තොටුපළට පැමිණීම ද, නැවත අහස්යානාවක් ලැබෙන තුරු නිකම් ඉඳීම ද සෝවියට් හමුදාව විශාල ජය ලබමින් ඉදිරියට යන මෙවැනි අවස්ථාවක අතිරේක භටයකු ලෙස ක්‍රියා විරහිත ව සිටීම ද නොකොට යුතු දේ ය.

"කොහොම වුණත් ඒකට විරුද්ධයි" අලෙක්සේයි හඬනගා මෙසේ කීවේ, යම් කිසිවකු කළ යෝජනාවක් ප්‍රතික්ෂේප කරන්නාක් මෙනි.

ඇන්ජිම නවතින තුරු අහස්යානය පැදවිය යුතු ය. ඉන් පසු? ඉන් පසු ඇතිවන තත්ත්වය අනුව ක්‍රියා කළ යුතු ය.

මීටර තුන්දාහකට ඉහළින් ද, පසු ව මීටර හාරදාහකට ඉහළින් ද ඔහු තම අහස්යානය පදවමින් ගොඩ බැසීටම සුදුසු තැනිතලාවක් සෙවී ය. ක්ෂිතිජයේ කොළ පැහැති වනය මතු වී පෙනිණි. වනයෙන් එපිට ගුවන් තොටුපළ දක්වා ඇති දුර කිලෝමීටර් පහළොවක් පමණ විය. ඛනිජ තෙල් බිඳකුදු නැති බව මීටරයෙන් පෙනිණි. එහෙත් අලෙක්සේයිගේ අහස්යානයේ එන්ජිම තවමත් ක්‍රියා කරයි. ඒවායේ ක්‍රියාකාරීත්වයට අවශ්‍ය ඛනිජ තෙල් ලැබුණේ කොයින් ද? අහස්යානය තව තවත් ඉහළ නැංගේ ය. ඔන්න ඔහොම!

නිරෝගී මිනිසෙකුට තම හදවතේ ගැස්ම නොදැනෙන්නාක් සේ ම, අහස්යානයේ ඒකතානමය හඬට අහස් නියමුවා සවන් නොදෙයි. එහෙත්, අහස්යානයේ හඬ වෙනස් වූ හැටියේ ම අලෙක්සේයිට එය දැනිණි. කිලෝමීටර් හතක් පමණ දුරින් පියිට් වනය කිලෝමීටර් හතරක් පමණ පළල් ය. යා යුතු දුර විශාල නොවේ. එහෙත් අහස්යානයේ යන්ත්‍ර නපුරු ලෙස අමුතු හඬක් නැඟී ය. තම පෙණහලු ආශ්වාස ප්‍රශ්වාස කිරීම නැවැත් වූ කලෙක මෙන් අහස්යානා එන්ජිමේ රෝගී හඬ නියමුවාට දැනිණි. එන්ජිම නැඟූ 'චික්! චික්!' හඬ තම සිරුර වේදනාවෙන් පුරවාලන සැටියකි.

හිටිහැටියේ ම අහස්යානයේ එන්ජිම හොඳින් ක්‍රියා කරන්නට විය. එසේ ය. අහස්යානයේ එන්ජිම නැවත හොඳින් ක්‍රියාකාරී විය. දැන් අලෙක්සේයි හරිත වර්ණ සාගරයක් වැනි මහ වනයට උඩින් පියාසර කළේ ය. දැන් ගොඩ බැසීමට හැකි එක ම ස්ථානය ගුවන් තොටුපළ පමණකි. කළ හැකි එක ම දෙය ඉදිරියට පියාසර කිරීම ය.

"චික්, චික්, චික්" යන හඬ නැවත ඇසිණි.

අහස්යානය නැවත හඬක් නැගී ය. බොහෝ වේලාවක් පවතී ද? පහළ වනය ය. වනය මැදින් වැටී ඇති මග ඔහුට පෙනිණි. එය දිග ය. ගුවන් තොටුපළ දක්වා ඇති දුර කිලෝමීටර තුනකි. වැටක් වැනි සීමාවට එපිට ගුවන් තොටුපළ අලෙක්සේයිට පෙනේ.

"චික්, චික්, චික්, චික්!" හිටිහැටියේ ම දෙයක් නිහඬ විය. සුළං හමන හඬ පවා ඔහුට ඇසිණි. මේ අවසානය ද? තමා අවට හැම දෙයක් ම ශීතල වීගෙන එන සැටි අලෙක්සේයිට දැනිණි. පතිත්ට ද? නැහැ තව මොහොතක් පමා විය යුතු ය. ඔහු තම අහස්යානය ක්‍රම ක්‍රමයෙන් පහතට ගෙනාවේ ය. හැකි තරම් දීර්ඝ වේලාවක් අහස්යානය සමබර ව තබා ගැනීමට හා එය බමරයක් මෙන් කරකැවීමෙන් වළක්වා ගැනීමට ද ඔහු උත්සාහ කළේ ය.

සම්පූර්ණ නිහඬතාව අහස් නියමුවකුට බිය ගෙන දෙන්නකි. නළල දෙපැත්තේ ශංඛක ලේ නහරවල ගැස්ම හා ඉක්මනින් ඉහළ නැගීම නිසා දෙකන්වල ඇතිවන ඝෝෂාව දැනෙන්නාක් මෙන් ම, අහස්යානයේ යන්ත්‍රවල සුළු හඬක් පවා පැහැදිලි ලෙස ඇසිණි. යෝධමය චුම්බකයක් විසින් ඉඳිකටුවක් ඇද ගනු ලබන්නාක් මෙන් අහස්යානය ඉක්මනින් ම පොළොවට ඇදිණි.

වනයේ හරිත වර්ණ සීමාවට ඔබ්බෙන් පිහිටි ගුවන් තොටුපළ අලෙක්සේයි දුටුවේ ය. අහස්යානය අතහැර බිමට පැනීමට පමාවීද? අවර පෙත්ත භ්‍රමණය වීම ද අඩ වශයෙන් නැවතිලා ය. අක්‍රියාකාරී අවර පෙත්ත දෙස අහසේ සිට බලනවිට මාර බියක් උපදී. වනයේ උසැති ගස්වලට අහස්යානය වැදීමට තරම් ළං වී ඇත. මෙය අවසානය ද? දහඅට මසක් තිස්සේ අලෙක්සේයි මෙරේස්යෙව් විඳි දුක් කරදර ගැන ද, සියලු බාධා මැඩ

ඔහු ලැබූ ජය ගැන ද තම පරමාර්ථය විඳි දුක් කරදර ගැන ද සියලු බාධා මැඩ ඔහු ලැබූ ජය ගැන ද, තම පරමාර්ථය මුදුන් පමුණුවා ගනිමින් ඇත්ත වශයෙන් ම සැබෑ මිනිසෙක් වීමෙන් පසු කළ පළමුවැනි සටනින් ජය ලබා හැරී එන අතර, මෙතරම් අවසනාවත් ඉරණමකට මූණ පෑමෙන් අවසන් වීම නිසා ඕල්යා කිසිදිනෙක නොදනගන්නී ද?

පනින්ටද? පමා වී ඇත! තමාට පහතින් ඇති වනය එකම සාගරයක් ලෙස අලෙක්සේයිට පෙනිණි. මෙවැනි දර්ශනයක් ඔහු මීට පෙර දක ඇත. කවදා ද? ඔව්, සැබැවින් ම දක ඇත. පසුගිය වසන්තයේ දී ඔහුගේ අහස්යානය කඩා වැටුණු දවසේ දී දුටු දර්ශනය මෙයට බෙහෙවින් ම සමාන විය. එදා ද මෙලෙස ම මෙවැනි ම දර්ශනයක් ඔහු දිටී ය. අවසාන පරිශ්‍රමය යොදා සුක්කානම් වළල්ල තමා වෙතට ඇද ගත්තේ ය.

## 8

අහස්යානා සේනාංකයේ ප්‍රධානියා දෑත් පහත දමා ගත්තේ, මින් පසු අත්ඔරලෝසුව දෙස බලා සිටීම අවශ්‍ය නොවූ හෙයිනි. දෑතින් හිසකේ අත ගෑ හෙතෙම බොල් හඬකින් මෙසේ පැවසී ය.

"එපමණයි!"

"බලාපොරොත්තුවක් නැත්ද?" යමෙක් ඇසූහ

"පැට්රල් ඉවරයි. සමහර විට කොහේ හරි අහස්යානාව ගොඩබස්වන්ට ඇති. නැත්නම් පැරචුට් මගින් බිමට පනින්ට ඇති. ගිලන් මැස්ස ගෙනෙල්ලා!"

තාල රහිත සින්දුවක් සිවුරු හඬලෑ ප්‍රධානියා ආපසු යාමට හැරුණේ ය. තම උගුර සිර කරමින් යමක් මතු වී එන සැටියක් පෙත්රොව්ට දනිණි. අමුතු විදියකට කහින සැටියක් පැතිර ගියේ ය. ගුවන් තොටුපළ මැද සිටගෙන සිටි මිනිස්සු වටපිට බලා හිස් හරවා ගත්හ. තුවාල ලැබ සිටි පෙත්රොව් කෙඳිරි ගෑවේ ය.

"තුවාලකාරයව ගෙනියපල්ලා!" යැයි ප්‍රධානියා ගිගුම් දුන්නේ ය. වේගයෙන් හමාගිය කුණාටුවකින් ගැලවීමට මෙන් දෙනෙත් අන් අතකට හරවා ගත් හෙතෙම පිරිසෙන් ඉවත් විය.



මිනිස්සු සෙමින් සෙමින් ඉවත් වූහ. මේ අතර වනයට ඉහළින් නිහඬ ව පියැඹූ අහස්යානයක් ගුවන් තොටුපළට ළඟා විය. එහි රෝද තුරු මුදුන් සිප නොගත්තා පමණකි. අවතාරයක් මෙන් මිනිසුන්ගේ හිස්වලට ඉහළින් ගිය නිහඬ අහස්යානය තණ පිටියට ගොඩ බැස රෝද තුනෙන් සිට ගත්තේ ය. වැලි කැට පෑගෙන හඬ ද, තණකොළ ගැටෙන විට ඇති වන සියුම් හඬ ද, අහස්යානාවල ඝෝෂාව නිසා කිසි දිනෙක නෑසුණ ද, මේවර එය පැහැදිලි ව ඇසිණි. මේ සියල්ල සැණෙකින් සිදුවීම නිසා කුමක් වී දැයි කිසිවෙක් නොදත්හ. එහෙත්, සිදුවූයේ අසාමාන්‍ය දෙයකි. අංක '11' දරන ප්‍රහාරක යානය තොටුපළට ගොඩ බැස ඇත. ගුවන් තොටුපළට රැස් වූ හැම දෙනා ම බලා සිටි අහස්යානය පැමිණියේ ය.

"එයාගෙ අහස්යානය!" යැයි එකෙක් මහ හඬින් කෑගසත් ම, පිරිස සම්මොහයෙන් අවදි වූවාක් මෙන් තිගැස්සිණි.

ගොඩ බට අහස්යානය ගුවන් තොටුපළේ කෙළවර ළපටි සුදු පැහැති බිරියෝසා ගසක් ළඟ නැවතිණි. බැස යන හිරු රැස් බිරියෝසා ගසේ ළපටි කොළ හා දලුවල පිළිබිඹු වුණේ දේදුනු පාටිනි.

අහස්යානයේ නියමු අසුනෙන් කිසිවකු නැගිට්ටේ නැත. චකිතයකින් හා බියෙන් යුතු ව හති දමමින් මිනිස්සු අහස්යානය වෙත දුව ගියහ. ප්‍රධානියා අන් අයට වඩා

වේගයෙන් දුව ගොස් අහස්යානයේ පියාපතකට නැග නියමු අසුනේ පියස්ස හැර බැලී ය. හිස්වැසුම රහිත අලෙක්සේයි අසුනේ වාඩි වී සිටියේ ය. ඔහුගේ මුහුණ ගිම්හානයේ වලාවක් මෙන් සුදු පැහැති ය. ලේ රහිත දෙතොල් මඳ සිනාවක් පෑවේ ය. සැපුණු යටි තොලින් ගැලූ ලේ බිඳු දෙකක් නිකට මත වැටිණි.

"පණ පිටින්ද? තුවාල වෙලාද?"

දුබල ලෙස මඳ සිනාවක් පෑ අලෙක්සේයි ප්‍රධානියා දෙස බැලී ය. ඔහුගේ ඇස් විඩාපත් බවක් කියා පෑවේ ය.

"නැහැ තුවාල නැහැ. කිලෝමීටර් හයක් මම ආවේ පැට්‍රල් බිඳක්වත් නැතිවයි. මම හොඳටම බය වුණා"

අහස්යානය වට කර ගත් නියමුවෝ අලෙක්සේයිට අත දෙමින් ඔහුට සුබ පතමින් ප්‍රීති ඝෝෂා කළහ.

"සොහොයුරනි! අහස්යානාව කඩන්ට එපා. අත්තටුවලට නගින්ට එපා. මම එළියට එන්නම්"යැයි කී අලෙක්සේයි ඔවුන් නැවැත්වීය.

ඔහු වටා සිටි පිරිසට තරමක් ඈතින් බිම සිට ආ දුබල හඬක් ඔහුගේ කන්හි වැකිණි.

"අලෙක්සේයි! අලෙක්සේයි!"

සිඳී ගිය ශක්තිය තමාට නැවත ලැබුණු සැටියක් අලෙක්සේයිට දුනුණෙන් දැතේ වාරුවෙන් කඳ ඔසවා, දෙපා නියමු අසුනෙන් පිටතට දමා බිමට පැන්නේ ය. ඔහුගේ පයක් ළඟ සිටියකුගේ ඇඟේ නොවැදුණා පමණකි.

පෙත්රොව්ගේ මුහුණ කොට්ටයට ඇලී ඇත්තාක් මෙනි. ඔහුගේ විශාල ඇස්වලින් කඳුළු කැට කඩා වැටිණි.

"පෙත්රොව් නුඹ ජීවතුන් අතර! නුඹ... නුඹ හරිම යක් පැටියෙක්!" යැයි අලෙක්සේයි කීවේ පේතරොව්ගේ ගිලන් මැස්ස අසල දණ ගසමිනි. පේතරොව්ගේ හිස දැතින් ගත් අලෙක්සේයි වේදනාවෙන් පෙළෙමින් සිටි තම සගයා දෙස බලමින් මෙසේ කීවේ යඃ

"නුඹ ජීවතුන් අතර!"

"අලෙක්සේයි නුඹට ස්තුතියි. නුඹ මගේ ජීවිතය බේරා ගත්තා. නුඹට ස්තුතියි."

"නුඹලට යක්කු වැහිලද? තුවාල කාරයව ගෙනියපල්ලා! මෝඩයො වගේ කට ඇරගෙන බලාගෙන ඉන්නව!" යැයි කෝප වූ ප්‍රධානියා ගිගුම් දුන්නේ ය.

ප්‍රධානියා සීරුවෙන් සිට ගත්තේ ය. ඔහු මිටි ය. ඔහුගේ කකුල් ශක්තිමත් ය. සපත්තු දිලිසිණි. නිල්පැහැති මිකැනික් කබායට යටින් නිල ඇඳුමේ කලිසම පෙනිණි.

"ජ්‍යෙෂ්ඨ ලයිතන් මෙරේස්යෙව්. පියාසැරිය ගැන වාර්තා කරනවා. සතුරු අහස්යානා බිම හෙළුවාද?" ප්‍රධානියා ඇසුවේ ය.

"එසේය. කල්නල් සහෝදරයා. 'පොක්කේ වුල්ෆ්' දෙකක් බිම හෙළුවා!"

"සටන් තත්ත්වය ගැන පැහැදිලි කරනු"

"පෙත්රොව් අහස් යානයේ වලිගයට පහර දුන් සතුරු යානාවකට සිරස් ලෙස පහර ගැසුවා. අනික විනාශ කළේ මුහුණට මුහුණ ලා කළ සටනක දී. පොදු සටන් පෙදෙසට කිලෝ මීටර් තුනක් ඈතින්"

"ඔව් මා දන්නවා. නිරීක්ෂකයො ඒ ගැන වාර්තා කළා. නුඹට ස්තුතියි."

"සේවය....." අලෙක්සේයි උසස් නිලධාරීන්ගේ පැසසුම්වලට පිළිතුරු වශයෙන් කියන පොදු වැකිය කීමට පටන් ගත්තද, නිතර නිල නියමයන් පිළිපදින ප්‍රධානියා ඔහු වළකමින් මිතුරු ලීලාවෙන් මෙසේ පැවසී යඃ

"බොහොම හොඳයි! හෙට සිට තමුසෙ අණ දීම බාර ගන්නවා... තුන්වෙනි කණ්ඩායමේ නායක නියමුවා සටනේ දී ජීවිතය පිදුවා..."

ඔවුහු අණ දෙන කාර්යාලය දෙසට ගියහ. එදින තවත් අහස් සටන් බලාපොරොත්තු නොවූයෙන්, පිරිසේ සිටි මිනිස්සු ද ඔවුන් කැටුව පා නැඟුහ. කාර්යාලය පිහිටි කඳු ගැටයට ළංවෙත් ම, එදින සේවය භාර නිලධාරියා ප්‍රධානියා වෙත දුවමින් පැමිණියේ ය.

"තමුසෙ මොකද තොප්පිය නැතිව? විවේක කාලෙදි සෙල්ලම් කරන ඉස්කෝලෙ කොල්ලෙක් කියල හිතුවද?"

"කල්නල් සහෝදරයා, අවසර දෙන්න වාර්තා කරන්න!" යැයි ඉල්ලා සිටි නිලධාරි තැන ඍජු ව සිටගෙන ආචාර කළේ ආයාසයෙන් හුස්ම ගනිමිනි.

"මොකක්ද?"

"'යාකොව්' වර්ගයේ ප්‍රහාරක අහස් කණ්ඩායමේ නායකයා අපේ අසල්වැසියා කල්නල් සහෝදරයට ටෙලිෆෝන් කරනව"

"අපේ අසල්වැසියද වුවමනාවක්ද?"

ප්‍රධානියා ඉක්මනින් තම කාර්යාලයට ගියේ ය.

"ඒක තමුසෙ ගැන...." යැයි සේවය භාර නිලධාරියා අලෙක්සේයිට කාරණය පැහැදිලි කළේ ය.

කාර්යාලයේ සිටි ප්‍රධානියා කෑ ගැසී ය.

"මෙරේස්යෙව් මෙහෙට එනව!"

දුවගිය මෙරේස්යෙව් සීරුවෙන් සිට ගත්තේ ය. ප්‍රධානියා ටෙලිෆෝනයේ කඨනය අත්ලෙන් වසා ගනිමින් මෙරේස්යෙව්ට බැණ වැදුණේ ය. "තමුසෙ මොකද මට බොරු ආරංචි කීවෙ? අපේ අසල්වැසියා මට ටෙලිෆෝන් කර අහනවා කවුද නොම්මර එකොළහ අහස්යානය පදවන්නෙ කියල. මම කීව ජ්‍යොෂ්ඨ ලයිතන් මෙරේස්යෙව් කියල. එයාගෙ නමට සතුරු අහස්යානා කීයක් ලිව්ව ද කියල එයා මගෙන් ඇහුවා. මම කීව අහස්යානා දෙකක් කියල. එයා කිව්වා එයාගෙ නමට තවත් සතුරු අහස්යානයක් ලියන්ට කියල. තමුසෙගෙ ලයිතන් මගේ වලිගයට පහර දුන් 'පොක්කේ-වුල්ෆ්' අහස්යානයක් විනාශ කළා. මම මගේ ඇස්වලින් ම දක්කා ඒ සතුරු යානය බිමට පාත්වෙන හැටි. ඇයි තමුසෙ නිහඬව ඉන්නෙ?.... එහෙම දෙයක් වුණා ද?.... ඔන්න තමුසෙ පිළිතුරු දෙනව. හලෝ ජ්‍යොෂ්ඨ ලයිතන් මෙරේස්යෙව් දැන් කතා කරාවි. මෙන්න එයාට රිසීවරය දුන්නා"

අලෙක්සේයි රිසීවරය අතට ගත් විට බැරෑඩි හඬකින් කෙනෙක් කතා කළේ ය.

"බොහොම ස්තුතියි, ජ්‍යොෂ්ඨ ලයිතන් තමුසෙ ශාස්ත්‍රීය විදිහට පහර ගැසුවා. බොහොම ඉහළයි. තමුසෙ මාව බේරා ගත්තා. ඔව්, ඔව්. සතුරා බිම වැටෙන තුරු මම ඒ අහස්යානය කැටුව ගියා. තමුසෙ වොඩ්කා බොනව ද? එන්න මගේ කාර්යාලයට. මම තමුසෙට බෝතලයක් ණයයි. නැවත වරක් මගේ කෘතඥතාව පිළිගන්න. ආයුබෝවන්, එන්න බෝතලය ගන්න!"

මෙරේස්යෙව් රිසීවරය තැබී ය. ඔහු කොතරම් විඩාපත් වී ද යත්, සිටගෙන සිටීම පවා ඔහුට අපහසු විය. ඔහු තම නවාතැනට ගොස් ඇඳ මත වැතිරෙන සැටි පමණක් සිහි කළේ ය. බොරු කකුල් ගලවා දමා විවේක ගැනීම පමණකි ඔහුට කල්පනා වුණේ. ඔහු අමාරුවෙන් පා

නඟමින් කාර්යාලයෙන් පිට විය.

"කොහෙද යන්නෙ?" යැයි ඇසූ ප්‍රධානියා අලෙක්සේයි ළඟට විත්, ඔහුගේ අත ගෙන තදින් මිරිකුවේ ය. ප්‍රධානියාගේ අත කුඩා වුව ද, ශක්තිමත් ය. "තමුසෙට මොනව කියන්ට ද? හරිම දක්ෂයා! තමුසෙ ගැන ආඩම්බර වෙනවා! තමුසෙල වැනි අය සිටීම ගැන ආඩම්බර වෙනවා! තව මොනව කියන්ටද? ස්තුතියි. තමුසෙගෙ යාළුවා පෙත්රොව් එයාත් හොඳ මිනිහෙක් නොවේද? අනික් අය... තමුසෙල වගේ උදවිය ඉන්න තුරු අපි මේ යුද්දෙන් පරදින්නෙ නැහැ!"

නැවත වරක් අලෙක්සේයිගේ අත තදින් මිරිකා ආයුබෝවන් කීවේ ය.

රෑ බෝ වූ පසු නවාතැනට පැමිණි මෙරේස්යෙව්ට නින්ද නොගියේ ය. කොට්ටයට මුහුණ ඔබා ගත් ඔහු එකේ සිට දාහ දක්වා ගණන් කළ ද, නිදන්නට බැරි වූයෙන් 'ආ' අකුරෙන් පටන් ගන්නා වාසගම් ඇති තම මිතුරන්ගේ නම් මතක් කළේ ය. පසු ව 'බී' අකුරෙන් පටන් ගන්නා වාසගම් මතක් කළේ ය. සියවරක් අත්හදා බැලූ නිදි මන්ත්‍රයක් වන එයින් ද එදා ප්‍රතිඵල නොලැබිණි. දෑස් වසාගනිමින් නිදාගැනීමට තැත් කළ ඔහු ඉදිරියේ අඳුනන පුද්ගලයන්ගේ මුහුණු වරෙක පැහැදිලි ව ද, තවත් වරෙක නොපැහැදිලි ව ද පෙනිණි. මිහයීල් සීයා යටැසින් ඔහු දෙස බැලී ය. ඔහුගේ බැල්ම නොසන්සුන්තාවක් පළ කළේ ය. අන්ද්‍රෙයි ඩෙග්ටෙරෙන්කෝ තම දිගැති ඇස් පිහාටු නටවමින් ඔහු දෙස බලා මඳ සිනා පෑවේ ය. වසීලියි වසීලෙවිච් රොස් වී කෙනෙකුට බැණ වැදුණේ ඔහුගේ සුදු යටි රැවුළ නැටවිණි. ජර්මන් සෙබළුන් සිය ගණනක් දඩයම් කළ පළපුරුදු සෝවියට් සෙබළා සිනාසෙන විට ඔහුගේ මුහුණේ රැලි මතුවිණි. දේශපාලන කොමසාරිස් තැන්පත් වොරබියොව් අලෙක්සේයි දෙස බැලී ය. ඉටි මෙන් සුදුමැලි ඔහුගේ ඇස් ප්‍රාණවත් ය. බැල්ම විනිවිද යනසුලු ය. උපහාසාත්මක ඇස් හැම දෙයක් ම තේරුම් ගත් සැටි කියන්නාක් මෙනි. සීනාගේ රතු හිසකේ ගිනි දළු සේ දීප්තිමත් ව බැබළිණි. ක්‍රියාශීලී මිටි නවූමච් - අහස්යානා පැදවීමේ ගුරුවරයා ඔහු දෙස බලා මිත්‍ර ලීලාවෙන් ඉඟි

මැරී ය. අඳුර තුළින් අලෙක්සේයි දෙස බලා මඳ සිනා පෑ මිතුරු මුහුණු කොපමණද? ඔවුහු ඔහුගේ හදවත උණුසුම් කළහ. සුහද හැඟීම් ඇවිස්සූහ. මේ සියලු මුහුණු එකට කැලතී ඕල්යාගේ වත ද, විඩාපත් නෙත් ද මැවිණි. ගැටවරයකුට සමාන ඈ යුද නිල ඇඳුමකින් සැරසිලා ය. සැබෑ ජීවිතයේ දී ඇය නොදුටු ලෙස පැහැදිලි ව ඔහු ඇය දිටී ය. සැබැවින් ම ඈ ඔහු ඉදිරියේ සිටින සැටියකි ඔහුට දැනුණේ. ඔහු තිගැස්සිණි.

තම පෙම්වතිය සිහිනෙන් දැකීම නිසා පිබිදුණු සිත් ඇති අලෙක්සේයි ඇඳෙන් නැඟිට 'ස්ටාලින්ග්‍රාඩ්කා' නමැති කුප්පි ලාම්පුවේ අලෝකය වැඩි කොට, ඇක්සයිස් පොතක් මේසය මත තබා පැන්සල් තුඩ උල් කොට ලියුමක් ලියුවේ ය.

"ඕල්යා, මගේ පෙම්බරිය!" යැයි ලියූ ඔහු වේගයෙන් ගලා ආ අදහස් වචනයට නඟා ලිවීම් වස් නොපැහැදිලි ලෙස කුරුටු ගෑවේ ය. "අද මම ජර්මන් අහස්යානා තුනක් විනාශ කළෙමි. එහෙත්, ප්‍රධාන කාරණය එය නොවේ. අපේ සමහර සගයෝ දිනපතාම පාහේ සතුරු අහස්යානා විනාශ කරති. මගේ වැඩ ගැන පුරසාරම් දෙඩීමට මා පෙලඹුණේ... මගේ සුන්දරිය මීට මාස දහ අටකට පෙර මට සිදුවූ අභාග්‍යය ගැන කීමට අයිතියක් මට ලැබී ඇත. මීට පෙර ඒ ගැන ඔබට නොදන්වා සිටීම ගැන මට සමාවෙන්න..."

# පසු වැකිය

ඕර්යොල්හි මහා සටන සෝවියට් යුද්ධ හමුදාවලට ජය ලබාදෙමින් නිමාවට පත් වෙමින් තිබිණි. ගිනිගෙන දැවෙන නගරය ක්‍රාස්නොගොර්ස්ක් කඳුවැටිවල සිට බලන විට පෙනෙන බවට, පෙරමුණ ඉදිරියෙන් ගමන් කළ සෝවියට් හමුදා විසින් කරන ලද වාර්තාවක් බ්‍රයන්ස්ක්හි සෝවියට් යුද හමුදා කාර්යාලයට ලැබිණි. මේ පෙදෙසේ සටන් කළ සෝවියට් ප්‍රහාරක අහස්යානා කණ්ඩායමක් දවස් නවයක් තුළ දී පැසිස්ට් ජර්මන් අහස්යානා හතළිස් පහක් විනාශ කළ බව වාර්තා විය. සෝවියට් අහස්යානා පහක් විනාශ වූ අතර, මියගිය සෝවියට් අහස් නියමුවන් ගණන තුන් දෙනෙකු පමණක් විය. දෙදෙනෙක් පැරෂුට් මගින් පැන පසු ව තම ගුවන් තොටුපළ වෙත ළඟා වූ හ. මහත් වේගයකින් සෝවියට් හමුදා ඉදිරියට ගිය මේ දවස්වල දී වුව ද, මෙවැනි ජයක් ලැබීම දුර්ලභ දෙයක් විය.

මේ ප්‍රහාරක සෝවියට් අහස් හමුදාවේ ජය ගැන 'ප්‍රව්දා' පුවත්පතට වාර්තා කිරීම පිණිස මා එහි ගියේ ප්‍රවාහන අහස්යානයකිනි.

අහස් සටනකින් පසු සෝවියට් අහස්යානා ගුවන් තොටුපළට එන විට අපි එහි ගියෙමු. ඇඳිරි වැටී තිබිණි. ඕර්යොල් නගරය අසල ජර්මන්නු දැඩි අහස් සටන් කළහ. එදින අහස් සටන් හතක් කළේ ය. අටවැනි අහස් සටනට සහභාගි වූ අහස්යානා කණ්ඩායම ගුවන් තොටුපළට පැමිණීමට පටන් ගත්තා පමණි. සේනාංකයේ ප්‍රධානියා මිටි, කඩිසර මිනිසෙකි. නිල් පැහැති කම්කරු කබායක් හැඳ ඉණ වටා හම් පටියක් බැඳ සිටි ඔහුගේ මුහුණ හිරු රැස් නිසා තලෙළු පැහැයක් දැරී ය. හිසකේ මනා ලෙස පීරා තිබිණි. උදේ හසේ සිට ම ගුවන් තොටුපළේ සිටි නිසාත්, තෙවරක් ම අහස් සටන්වලට සහභාගි වූ නිසාත්, විඩාපත් වී සිටි ඔහුට එදින සෑහෙන විස්තරයක් කළ නොහැකි බව ඔහු කීවේ ය. ප්‍රහාරක අහස්යානා කාණ්ඩවල අනෙකුත් නිලධාරීහු ද එදින පුවත්පත් වාර්තාකරුවනට විස්තර සැපයීමේ තත්ත්වයක නොසිටියහ. පසුදා වනතුරු නැවතීමට මම තීරණය කළෙමි. ආපසු යාමට ද වේලාවක් නොතිබිණි. බැස යන හිරු රැස් බිරියෝසා තුරු මුදුන් සිප

ගනිමින් රන් පැහැති ආලෝකය බැබළවිණි.

හවස් වෙත් ම ඉතිරි අහස්යානා කීපය තොටුපළට පැමිණියේ ය. අහස් නියමුවෝ එක හුස්මට තම අහස්යානා ආරක්ෂක ගෙවල්වලට ගෙන ගියහ. මිකැනික් ශිල්පීහු තමන්ට අයත් කාර්යයන් ඉටු කළහ. අහස්යානා කොළ පැහැති ඉටි රෙදි කවරවලින් වැසූ පසු, අහස් නියමුවෝ සෙමින් පා තබමින් ඉවත් ව ගියහ. සුදුමැලි වූ ඔවුහු විඩාපත් වී සිටියෝ ය.

අවසාන වරට පැමිණියේ තුන්වැනි කණ්ඩායමේ නායකයාගේ අහස්යානය ය. ගුවන් තොටුපළට පැමිණි එම යානයේ නියමු අසුනේ දොර විවර වී රන් අකුරු දෙකක් කෙටූ කළුවර සැරයටියක් විසිවිණි. ඉන් පසු කළු හිසකේ සහිත පළල් මුහුණින් හෙබි පුද්ගලයෙක් දෑතේ වාරුවෙන් උඩට ඉස්සී අහස්යානයේ පියාපතක් මත දෙපා තබා නැඟී සිට සෙමින් බිමට පැන්නේ ය. සේනාංකයේ දක්ෂතම අහස් නියමුවා ඔහු බව මට දැන්වී ය. හවස් කාලය නිකරුණේ ගෙවීමට සූදානම් නොවූ මම ඔහු සමඟ කතා කිරීමට තීරණය කළෙමි. ඔහු මා දෙස බැලූ හැටි මට අමතක නොවේ. ඔහුගේ ඇස් කළු පැහැති ය. උතුරු දිග යුරෝපියයෝ මෙවැනි කළු පැහැති ඇස් ඇතියවුන්ට ව්සිගාන්වරුන් (අහිගුණ්ඨිකයන්) යැයි කියති. ඔහුගේ බැල්ම දඟකාරී කොලුවකු සිහියට නඟයි. බොහෝ අත්දැකීම් ලබා ඇති අහස් නියමුවා මඳ සිනා පාමින් මෙසේ පැවසී යඃ

"අනුකම්පා කරන්න. හිටගෙන ඉන්න බැරි තරමට මහන්සියි. කන්වල ඝෝෂාවක් පටන් අරගෙන. මහන්සි වුණාම ඔහොම තමා. ඔහේ රෑ කෑම ගත්තද? නැත්ද? හොඳා ! එන්න මා සමඟ අපේ භෝජන ශාලාවට. හතුරු අහස්යානයක් වෙඩි තැබුවම වොඩ්කා ග්‍රෑම් දෙසීයක් ලැබෙනවා. මට අද ග්‍රෑම් හාරසීයක් ලැබේවි. දෙන්නට ඒ මැදෑ. යමුද? කන ගමන් තමුසෙට වාර්තාවකට වුවමනා විස්තර ලබා ගත හැකියි"

මම එකඟ වීමි. එළිපිට කතා කරන ප්‍රීතිමත් පුද්ගලයා මට රිසි විය. බැද්ද මැදින් වැටී ඇති අඩිපාර දිගේ අපි ගමන් කළෙමු. මගේ සගයා ඉක්මනින් ගමන් කළේ ය. ඉඳහිට ඉදිරියට නැමෙන ඔහු කුඩා පඳුරකින් පලු ගෙඩියක්

දෙකක් කඩාගෙන කටේ දමා ගත්තේ ය. ඔහු විඩාපත් වී සිටි බව සැබෑ ය. පා එසවීම පවා ඔහු කළේ අමාරුවෙන් වුව ද, අත තිබුණු කළුවර ලී සැරයටිය ඔහු පාවිච්චි නොකළේ ය. කිහිලි ගන්නාගත් එම සැරයටියෙන් ඔහු ඉඳ හිට නිදිකුම්බා පඳුරකට ගැසී ය. අප ඉදිරියේ මැටි පස් සහිත කඳුගැටයක් විය. එය නැඟීමේ දී මගේ සගයා ඉහළ තිබුණු පඳුරු දෙතුන් වරක් දෑතින් අල්ලාගෙන උඩට නැග්ග ද, සැරයටිය පාවිච්චි නොකළේ ය.

ආහාර ගැනීමට වාඩි වූ පසු ඔහුගේ විඩාගති සම්පූර්ණයෙන් දුරු වී තිබිණි. ඔහු වාඩිවුණු ජනේලයට බැසයන හිරුගේ රත් පැහැති ආලෝක ධාරා වැටිණි. අහස් නියමුවන් කියන පරිදි එය කුණාටුවක පෙර ලකුණු විය. සූ හඬක් නංවමින් හේ වතුර වීදුරුවක් එක හුස්මට බීවේ ය. අපට ආහාර ගෙනා තරුණියට විහිළුවක් කළ හෙතෙම, ඇගේ හිතවත් අහස් නැවියා තුවාල වී රෝහලට ගිය දා ඈ හැම දෙනෙකුගේ ම සුප් පිඟන්වලට ලුණු වැඩියෙන් දැමූ බව කීවේ ය. ඔහු ආහාර ගත්තේ තෘප්තියකිනි. තමාට බෙදූ එළුමස් කටුව ඔහු හැපුවේ ශබ්ද නඟමිනි. අවට මේසවල ආහාර ගනිමින් සිටි අය සමඟ විහිළු කතා හුවමාරු කර ගත් ඔහු, මොස්කව් නුවර ගැන පුවත් මගෙන් ඇසී ය. අලුත් සාහිත්‍ය කෘතීන් ගැන ද, මොස්කව් රඟහලවල පෙන්වන අලුත් නාට්‍ය ගැන ද තොරතුරු ඇසූ ඔහු, මොස්කව් නැටුම් හලකට කිසිදා නොගිය බව කීවේ ය. අහස් නියමුවන් විසින් 'හෙණ ගුළිය' වශයෙන් හඳුන්වනු ලබන කිසෙල් නමැති පලතුරු යුෂ ජල්ලිය බෙදූ විට ඔහු මගෙන් ඇසුවේ ය.

"තමුසෙ අද රෑට කොහෙද නවතින්නෙ? තැනක් නැති ද? එහෙනම් එන්න මගේ නවාතැනට!" ඔහු නිහඬ විය. ඔහුගේ මුහුණ අඳුරු විය. "මගේ සගයා අද... අහස් සටනේ දි මළා. එයාගෙ ඇඳ හිස් වෙලා. යට ඇඳුම් සොයා ගන්ට පුළුවනි"

අමුත්තන් සමඟ කතා කිරීමට ඔහු කැමැත්තක් දක්වන බව පෙනිණි. අමුත්තාගේ අලුත් තොරතුරු අසා දැන ගැනීමට ඔහු ඉදිරිපත් විය.

ඔහුගේ නවාතැනෙහි රැය ගත කිරීමට මම එකඟ වීමි. අපි ඔහුගේ නවාතැන පිහිටි ගැඹුරු දෙණියට ගියෙමු. බිම්

ගෙයක් වැනි එතැන අවට වැවී ඇති මාදන් ගෙඩිවල හා හතුවල නැවුම් පුසුඹක් දැනිණි.

නවාතැනට ඇතුළු වූ පසු ඔහු කුප්පි ලාම්පුව දල්වීය. නවාතැන තුළ ඉඩකඩ ඇත. පිරිසිදු ය. පරිසරය අනුව මෙතැන සෑහෙන කලක් මිනිසුන් ජීවත් වී ඇති බව පෙනිණි. බිත්තියට සවි කළ ඇඳන් දෙකක පිදුරු මෙට්ට දමා තිබිණි. එයින් නැවුම් සුවඳක් පැතිරිණි 'විශේෂ සුවඳක්' ලබා ගැනීම පිණිස මෙහි පදිංචිකරුවෝ ළපටි බිරියෝසා අතුවලින් නවාතැන සැරසූහ. ඇඳ ළඟ මැටි බිත්තියේ කුහර සාදා තිබිණි. ඒවා තුළ පොත් ගොඩක් ද, රැවුළ කපන දැළි පිහිය, සබන් හා දත් බුරුසු ද තිබෙන සැටි මම දුටිමි. එක් ඇඳකට ඉහළින් මැටි බිත්තියේ එල්ලූ ඡායාරූප දෙකකි. ඒවායේ රාමු හා වීදුරු කණ්ණාඩි, සටන් අඩු කාලයේ දී නිකම් සිටින ගුවන් නැවියන් අතින් නිම වූ අරුමෝසම් බඩු ය. සතුරු අහස්යානාවල කොටස්වලින් මෙවනි බඩු බොහෝ සෙයින් සෑදුවේ ය. මේසය මත බිඳුණු බඳුනකි. එහි මලීන නමින් හැඳින්වෙන පලු වර්ගයක් විය. බිම අතුරා ඇත්තේ නත්තල් ගස්වලින් හා ළපටි බිරියෝසා ගස්වලින් කඩාගත් අතු රිකිලිවලිනි. මේ අමු කොළ හා පලතුරු ආදිය නිසා නිදිමත වැඩි විය. අපේ කතාව පසුදා උදෑසන දක්වා කල් දැමීමට තීරණය කළ අපි නිදන්නට සැරසුණෙමු.

මා මිත්‍ර අහස් නියමුවා පිටතට ගියේ ය. ශබ්ද නඟමින් ඔහු දත් මදින සැටි ද, උගුර පාදමින් කට සෝදන සැටි ද සිසිල් දිය මුහුණට හා බෙල්ලට වක් කර ගනිමින් මුහුණ සෝදන සැටි ද අවට වාතයට පවා ඇසිණැයි මට සිතිණි. හැරී ආ ඔහු මුහුණ හා බෙල්ල පිස දා ගත්ත ද, දිය බින්දු ඔහුගේ හිසකේවල හා ඇසි පිහාටුවල දක්නට ලැබිණි. ඔහු කුප්පි ලාම්පුවේ තිරය අඩු කොට ඇඳුම් ගලවන්නට විය. බරැති කිසිවක් බිම තැබී ය. බිම බැලූ මට මා දුටු දේ විශ්වාස කළ නොහැකි විය. ඔහුගේ දෙපා බිම ඇත. ඔහු ඇඳ මත වැතිර සිටී. දෙපා නැති මිනිහෙක් අහස්යානා පදවනවා. දෙපා නැති ප්‍රහාරක නියමුවෙක්! අද හත්වරක් අහසට නැංග මොහු සතුරු අහස්යානා දෙකක් විනාශ කළේ ය. මෙය කිසි කලෙක නොවිය හැකි පුදුමයකි; හාස්කමකි!

එහෙත්, සැබැවින් ම ඔහුගේ දෙපා -වඩාත් නිවැරැදිව, ඔහුගේ බොරු කකුල්- බිම තබා ඇත. ඒවා වසා ඇත්තේ අලුත් සෙබළ සපත්තුවලිනි. ඒ සපත්තුවල තුඩ දකින මට ඇඳ යට සැඟවී සිටින මිනිහෙක් තම දෙපා එළියට දමා සිටින සැටියක් පෙනිණි. මා පුදුම ව බලන සැටි මගේ මිතුරා දකින්නට ඇත. කපටි තුටුපහටු බැල්මකින් මා දෙස බැලූ හේ මෙසේ ඇසී යඃ

"මීට ඉස්සෙල්ලා මේ ගැන දැන ගත්තෙ නැත්ද?"

"හීනෙන් වත් සිතුවේ නැහැ" යි මම කීවෙමි.

"මා බොහොම සතුටුයි ඔබේ කතාව ගැන. අනික් අය ඔබට මේ රහස හෙළි නොකිරීම ගැන මා පුදුම වෙනවා. දක්ෂයො තරමට ම අපේ කණ්ඩායමේ ආරංචි පතුරුවා හරින උදවිය ඉන්නව. පුවත්පත් වාර්තාකාරයෙකුට විශේෂයෙන් ම 'ප්‍රව්දා' පත්තරේ වාර්තාකාරයකුට දෙපා නැති මිනිහ ගැන නොකීම තමා පුදුමෙ..."

"දෙපා නැතිව අහස්යානාවක් පැදවීම බොහොම විශේෂ, වැදගත් සිද්ධියක්. මෙලොව මෙතෙක් කිසි ම කෙනෙක් නොකළ වීර ක්‍රියාවක්. දෙපා නැති මිනිහෙක් අහස්යානාවක් - ප්‍රහාරක අහස්යානාවක් පදවමින් සතුරාට පරහ දීම ලෝක අහස්යානා හා ගුවන් ශිල්ප ඉතිහාසයේ කිසිම දවසක, කිසිම කාලෙක නෑසූ නොදුටු දෙයක්!" යැයි මම පැවසීමි.

අහස් නියමුවා ප්‍රීතියෙන් උරුවම් බෑවේ ය.

"ගුවන් ශිල්ප ඉතිහාසය!... බොහොම දේවල් ඔය ඉතිහාසය දැන හිටියෙ නැහැ. අපේ සෝවියට් භටයන්ගෙන් මේ යුද්දෙදී බොහෝ දේවල් ගුවන් ශිල්ප ඉතිහාසය ඉගෙන ගත්ත. ඒ වුණාට සතුටු වීමට දෙයක් නැහැ නෙවද? බොරු කකුල් වෙනුවට සැබෑ කකුල් ඇතිව අහස්යානා පැදවීමට මම බොහොම කැමතියි. මොනව කරන්ටද? මෙහෙම විපත්තියකට ගොදුරු වුණා" මෙසේ කී අහස්නියමුවා සුසුම් ලෑවේ ය. "ඇත්තවශයෙන් ම අහස්යානා පැදවීමේ හා ගුවන් ශිල්ප ඉතිහාසයේ මෙවැනි දෙයක් මීට පෙර දැක නැහැ."

ඔහු තම සිතියම් බෑගය ගෙන සඟරාවකින් කපාගත් ලිපියක් අතට ගෙන මට දුන්නේ ය. නැමී ඉරිතැලී තිබුණු එම ලිපිය තෙල් කඩදාසියකින් අලවා තිබිණි. පයක්

නැති මිනිහෙක් අහස්යානාවක් පැදවූ සැටි එම ලිපියෙන් කියැවිණි.

"එයාගෙ කකුලක් විතරයි කපා දමල තිබුණෙ. එයා පැදෙව්වෙ 'පාර්මන්' වර්ගයට අයත් පරණ අහස්යානාවක් මිස ප්‍රහාරක යානාවක් නොවේ" යැයි ලිපිය කියවූ මම කීවෙමි.

"ඔව්. ඒ වුණාට මම සෝවියට් අහස් නියමුවෙක්. මම පුරසාරම් දොඩවනවයි කියල හිතන්ට එපා. ඔය කතාව කීවෙ ඉතාම හොඳ සැබෑ මිනිහෙක්" ඔහු සැබෑ යන වචනය අවධාරණයෙන් පැවසී ය. "ඒ සැබෑ මිනිහා මළා"

අහස් නියමුවාගේ පළල් ප්‍රාණවත් මුහුණ මිහිරි, මුදු, දොම්නසකින් වැසිණි. ඔහුගේ බැල්ම පැහැදිලි ය. දයාන්විත ය. ඔහු අවුරුදු දහයකින් පමණ යෞවන වූ සැටියක් පෙනිණි. මොහු මැදි වියේ පසුවන්නෙකැයි මා සිතූ නමුදු, ඔහුගේ වයස අවුරුදු විසි තුනක් බව දැනගත් මම පුදුම වීමි.

"මගේ දෙපා නැතිවුණේ කවදාද, කොතැනදීද කොහොමද කියල මිනිස්සු අහන විට මට තරමක් කේන්ති එනවා. නමුත්, මට දැන් සියලු දේම අමතක වුණා. ඔහෙ අමුත්තෙක්. අපි හෙට ආයුබෝවන් කියා සමුගත්තම ආයෙමත් කිසි දවසක හමු නොවෙන්ට පුළුවනි... ඔහෙ සතුටු නම් මම මගේ දෙපා පිළිබඳ කතාව කියන්නම්"

ඔහු ඇඳ මත වාඩි වී කම්බිලිය නිකට දක්වා පොරවාගෙන තම කතාව කියන්නට පටන් ගත්තේ, හඬ නගා සිතන්නාක් මෙනි. මා ඔහු අසල සිටින බව පවා ඔහුට අමතක විය. ඔහු තම විපැත්තිය පිළිබඳ කතාව අගනා ලෙසත්, සවිස්තරවත් කීවේ ය. ඔහුගේ තියුණු ඥානය ද, යහපත් කල්පනා ශක්තිය ද කැපී පෙනිණි. ඔහුගේ හදවත දයාන්විත විය. මීට පෙර කිසි දවසක නොඇසූ වැදගත් කිසිවක් මට අසන්නට ලැබෙන බව සිතූ මම මේසය මත තිබූ ඇක්සයිස් පොත ගෙන ඔහුගේ කතාව සටහන් කර ගතිමි. ඒ පොතේ පිට කවරයේ මෙසේ ලියා තිබිණි. "තුන්වන ප්‍රහාරක අහස්යානා කණ්ඩායමේ සටන් පිළිබඳ දින පොත."

මේ අපූරු කතාව නිසා ප්‍රබෝධයට පත් මම, හැකිතරම් විස්තර ලියා ගැනීමට තැත් කළෙමි. එක්



ඇක්සයිස් පොතක් ලියා අවසන් කළ මම දෙවැනි වරට තවත් පොතක් සොයාගෙන එහි ද ලියුවෙමි. රැය ගෙවී ගොස් අරුණෝදයේ ළා එළිය පැතිරෙන සැටි දැකීමට මම අපොහොසත් වීමි. 'රිහ්ට්ගෝපෙන්' නමැති ජර්මන් අහස්යානා කණ්ඩායමේ අහස්යානා තුනකට වෙඩි තබා බිම හෙළූ සිද්ධියෙන් තම කතාව අවසන් කළ අලෙක්සේයි මෙරේස්යෙව් එතැන් සිට තමා අනිකුත් අංග සම්පූර්ණ අහස් නියමුවන්ට සම වූ බව පැවසී ය.

"මදෑ එළිය වැටෙන තුරු කතාන්දර කිව්වා. උදේ පාන්දර සටන් කරන්ට යන්නත් ඕන. මම ඔහෙට නිදාගන්නවත් ඉඩ දුන්නෙ නැහැ. සමාවෙන්නැ"යි හේ පැවසී ය.

"ඉතින් ඔහෙගෙ ඕල්යා ගැන කියන්න. ඈ ඔබට දුන් පිළිතුර?" මෙසේ ඇසූ මම සැණෙකින් මෙසේ ද කීවෙමි. "මට සමාවෙන්න. ඒ ප්‍රශ්නය ඔහෙට කරදරයක් වීමට ඉඩ ඇත. එහෙම නම් ඒ ගැන කියන්න එපා"

"ඇයි මොකද?"යි ඇසූ අලෙක්සේයි හඬ නඟා සිනාසුණේ ය. "අපි දෙදෙනාම එක විදිහක ඔල්මාද කාරයෝ. ඈ මුල සිටම මගේ විපත්තිය ගැන දැන හිටියා. මගේ යහළුවා අන්ද්‍රෙයි ඩෙග්ටෙරෙන්කෝ මගේ අහස්යානය කඩා වැටුණු සිද්ධිය ගැනත්, මගේ දෙපා කපා දැමීම ගැනත් ඕල්යාට ලියා දන්වා තිබෙනවා. මා ඒ බව දැන හිටියේ නැහැ. තමා ඈට ඒ ගැන නොදැන්වූ

නිසා මගේ හිත රිදේවි යන බියෙන් ඈ මට ඒ ගැන කිසිවක් ලිව්වෙ නැහැ. ඔය විදියට අපි දෙදෙනා එකිනෙකා රවටා ගනිමින් ලියුම් ලිව්වා. කවර හේතුවක් නිසා ද කියන්ට බැහැ. ඇගේ ඡායාරූපය බලන්ට ඔහේ කැමති ද?"

ඔහු කුප්පි ලාම්පුව අතට ගෙන එහි ගිනිසිළුව වැඩි කොට බිත්තියේ එල්ලා තිබුණු ඡායාරූප දෙකට ළං කළේ ය. එක් ඡායාරූපයක් නොපැහැදිලි ය. මල් පාත්තියක් අසල වාඩි වී සිටි තරුණිය සිනාසෙන සැටි නොපැහැදිලි ලෙස පෙනිණි. අනික කාර්මික බළකායේ ලයිතන් නිල ඇඳුමින් සැරසුණු තරුණියකගේ ඡායාරූපයකි. ඇගේ මුහුණ සිහින් ය. බැල්ම නුවණක්කාරී ය. ඈ කොතරම් කුඩා ද, යත් ගැටවරයකුගේ හැඩ හුරුකමක් පළ කළා ය. ලස්සන ගැටවරියක වූ ඇගේ දෑස් වයසට වඩා මේරූ බව පළ කරයි.

"ඔහේ හිතන්නෙ ඈ ලස්සනයි කියලද? මාත් හිතන්නෙ එහෙම තමා" යැයි කී අලෙක්සේයි මඳ සිනා පෑවේ ය.

"ස්ට්රුච්කොව් දැන් කොහෙද?"

"කොහෙද කියා දන්නෙ නැහැ. අන්තිම ලියුම මට ලැබුණෙ වෙලීකියෙ ලූකිවලින්. එහෙ සටන් කළා..."

"තමුසෙගෙ යුද්ධ ටැන්කිකාරයා... එයාගෙ නම මොකද්ද?"

"ග්රිගොරි ග්වොස්දෙව්. දැන් එයා මේජර් කෙනෙක්. ප්රොහොරොව්ක මහා සටනට සහභාගි වුණා. ඊට පස්සෙ කුර්ස්ක් අඩ කවයේ ප්රහාරයට සහභාගි වුණා. අපි දෙන්නා එකම යුද පෙරමුණක සටන් කළා. නමුත්, මුණ ගැසුණෙ නැහැ. එයා දැන් යුද්ධ ටැන්කි සේනාංකයක් මෙහෙයවනවා. ළඟක සිට ලියුම් නැහැ. පණ පිටින් හිටියොත් අපි නැවත මුණ ගැසෙනව. සහතිකයි. ජීවත් නොවී ඉන්න හේතුවක් නැහැ නෙවද?... දැන් ඉතින් ටිකක් වත් නිදාගන්න ඕන. දැනටමත් එළිවෙලා"

ඔහු පහන නිවා දමා නිදාගැනීමට සැරසුණේ ය. හිමිදිරි පාන්දර අඩ අඳුර නවාතැන තුළ පැතිරිණි. මේ අනගි නවාතැනේ එක ම කරදරය මදුරුවන්ගේ කෙඳිරියයි.

"ඔහෙ ගැන 'ප්රව්දා' පුවත්පතට විස්තර ලිපියක් ලියන්න මා කැමතියි"

"කැමති නම් ලියන්නැ" යි ඔහු උදාසීන ලෙස කියා නැවත නිදිමතින් මෙසේ ද කීවේ ය. "සමහර විට ඒක නුවණට හුරු නොවෙන්ට පුළුවනි! ගොබෙල්ස් දැනගත්තොත් ඒ මිනිහා ගිරිය පුප්පගෙන කෑ ගහවි. ඔන්න රුසියාව අබ්බගාතයන් පවා යුද්දෙට යවනවා.... කියල. පැසිස්ට්වාදීන් බොරු කීමට උපන් එවුන්"

විනාඩියකින් මෙරේස්යෙව් ගොරවමින් නිදන්නට විය. එහෙත්, මට නින්දක් නොවී ය. ඔහුගේ කතාව හා එහි චාම් බව මා සිත කැලඹී ය. මේ කතාවේ වීරයා මා ඉදිරිපිට ගොරවමින් නිදා නොසිටිත් නම්, අරුණෝදයේ ළා එළියට පෙනෙන, පිනිබිඳු සහිත ඔහුගේ බොරු කකුල් දෙක මා ඉදිරියේ නොතිබිණි නම් මේ කතාව සත්‍යයෙන් තොර වූ ප්‍රබන්ධයෙකැයි සිතීමට මට ඉඩ තිබිණි.

එදා සිට අලේකසේයි මෙරේස්යෙව් මට හමු නොවී ය. එහෙත්, මා ගිය හැම තැනක ම යුද්ධය විසින් මා ගෙන යනු ලැබූ හැම තැනකම මේ අසමාන අහස් නියමුවාගේ ඉතිහාසය ලියා ඇති ඇක්සයිස් පොත් දෙක මම ගෙන ගියෙමි. ඔරිඔල්හි සටන්වලින් පසු ව ද සෝවියට් හමුදාව නැඟෙනහිර යුරෝපයේ රටවල් එකිනෙක මුදාගනිමින් ඉදිරියට යන විට දී ද ඔහුගේ සැබෑ කතාව පදනම් කරගනිමින් නවකතාවක් ලිවීමට මම කීපවරක් ම උත්සාහ කළෙමි. ඔහුගේ සැබෑ ජීවිතයෙන් නොපැහැදිලි ඡායාවක් පමණක් ලිවීමට මා සමත් වූ නිසා, ඒ කෘතිය නිම කිරීම මවිසින් කල් දැමිණි.

යුද්ධවසානයෙන් පසු පැසිස්ට් ජර්මනියේ නායකයන්ට විරුද්ධ ව නියුරම්බර්ග් හි පැවැත්වූ නඩු විභාගයේ සැසි වාරයකට මම ද සහභාගි වීමි. පැසිස්ට් ජර්මනියේ දෙවැනි නායකයා වූ හෙර්මන් ගෝරින්ග්ගෙන් හරස් ප්‍රශ්න ඇසීම නිමාවට පත් විය. සෝවියට් සංගමය වෙනුවෙන් පැමිණිල්ල මෙහෙය වූ ප්‍රධාන නීතිවේදියාගේ ප්‍රශ්නවලට පිළිතුරු දීගත නොහැකි වූ 'නාසි ජර්මනියේ දෙවෙනියා' දත් මිටි කමින්, මෙතෙක් අපරාජිත පැසිස්ට් ජර්මන් යුද්ධ හමුදාව සෝවියට් දේශය තුළ දී සටන්වල දී විනාශ වූ සැටි විස්තර කළේ ය. තම විස්තරයට අමතර සාක්ෂි වශයෙන් දෙනෙත් අහසට යොමු කළ ගෝරින්ග් මෙසේ පැවැසී ය. "දෙවියන් වහන්සේගේ අභිප්‍රාය එය විය."

"ජර්මනිය සාපරාධී ලෙස සෝවියට් සංගමයට පහර දෙමින් ආරම්භ කළ මේ යුද්ධය නිසා ජර්මනිය විනාශ වූ අතර, එම ප්‍රහාරය ආරම්භ කරමින් යුෂ්මතුන් විසින් බලවත් අපරාධයක් කරන ලදැයි පිළිගන්නෙහි දැ"යි ප්‍රධාන සෝවියට් නීතිවේදීන් රොමන් රුදෙන්කෝ ප්‍රශ්න කළේ ය.

"එය අපරාධයක් නොවේ. අති විශාල වරදකි" යි පිළිතුරු දුන් ගේරින්ග් බිම බලාගෙන පහත් හඬකින් මෙසේ පැවසී යඃ "වගකීමෙන් තොරව අප ක්‍රියා කළ බව මට කිව හැකි ය. බොහෝ දේ ගැන අප නොදන්නා බවත්, බොහෝ දේ ගැන සැක කිරීමට පවා අප නොපෙළඹුණු බවත් යුද්ධ පටන් ගත් පසු අපට පිළිගැනීමට සිදු විය. සෝවියට් රුසියානුවන් අවබෝධ කර ගැනීමට අපට බැරිවීම ප්‍රධාන කාරණය විය. එය සදහටම ප්‍රහේලිකාවක් ව පවතිනු ඇත. ලෝකයේ ඉතාම දක්ෂ ඔත්තුකාර සේවයට පවා සෝවියට් රුසියාවේ යුද්ධමය ශක්තිය හා විභව්‍යතාව මේ යැයි නිගමනය කළ නොහැකි ය. මා මෙහිදී කියන්නේ රුසියාව සතු කාලතුවක්කු, අහස්යානා හා යුද්ධ ටැංකි සංඛ්‍යාව ගැන නොවේ. අපට ඒවා ගැන සෑහෙන දැනීමක් තිබිණි. සෝවියට් රුසියාවේ කර්මාන්ත ශක්තිය හා හැකියාව ගැනද නොවේ. සෝවියට් රුසියාවේ ජනතාව ගැනය මා කියන්නේ. රුසියානුවා විදේශිකයාට තේරුම් ගත නොහැකි ප්‍රහේලිකාවකි. නැපෝලියන්ට පවා ඔවුන් තේරුම් ගත නොහැකි විය. නැපෝලියන් කළ වරද අපි ද කළෙමු."

"සෝවියට් රට වැසියාගේ ආධ්‍යාත්මික බලය පිළිබඳ ප්‍රහේලිකාව" ගැනද අප මවුබිමේ 'සැබෑ ශක්තිය' ගැන ද කළ 'ප්‍රකාශය' ගැන අප ඇසුවේ ආඩම්බරයෙනි. යුද්ධ කාලයේ දී මුළු මහත් ලෝකයම මවිතයට පත් කළ සෝවියට් රට වැසියාගේ දක්ෂතාව, හැකියාව, ආත්ම පරිත්‍යාගශීලීත්වය සහ නිර්භයත්වය ගේරින්ග් ප්‍රමුඛ පැසිස්ට්වාදීන්ට මාරක ප්‍රහේලිකාවක් වීම ගැන අපට විශ්වාස කළ හැකිය. ජගත් ස්වාමියා ජර්මන් ජාතිය යැයි කියන දුගඳ හමන 'සිද්ධාන්තයක්' ඉදිරිපත් කළ පැසිස්ට්වාදී ජර්මනුන්ට සමාජවාදී සමාජයක් තුළ හැදී වැඩුණු සෝවියට් රටවැසියාගේ ආධ්‍යාත්මික බලය හා ශක්තිය ගැන අවබෝධ කර ගැනීමට තරම් දැනීමක්

නොතිබීම පුදුමයක්ද? අලෙක්සේයි මෙරේස්යෙව් ගැන ඉබේටම මට සිහිවිණි. පැසිස්ට්වාදය උපන් නියුරම්බර්ග් නුවර අධිකරණ ශාලාව තුළ වාඩි වී සිටි මා ඉදිරියේ මෙරේස්යෙව්ගේ සේයාව මැවිණි. කයිටල් සෙනෙවියාගේ යුද්ධ හමුදාවද ගේරින්ග්ගේ අහස්යානා හමුදාවද රෝඩර්ගේ නාවුක හමුදාවද විනාශ කර දමා හිට්ලර්ගේ කොල්ලකාරී ආණ්ඩුව පරාජය කළ කෝටි සංඛ්‍යාත ජනතාවගේ එක් නියෝජිතයකු වන අලෙක්සේයි මෙරේස්යෙව්ගේ ජීවන චරිතය ප්‍රසිද්ධියේ කීමට මා තුළ මහත් ආසාවක් ඇති විය.

මෙරේස්යෙව්ගේ අත්අකුරින් ලියූ 'තුන්වන අහස්යානා සේනාංකයේ සටන් වාර්තා පොත' යන වැකිය සහිත කහ පැහැති කවර සහිත ඇක්සයිස් පොත් දෙක, නියුරම්බර්ග්හි නැවතී සිටි මා ළඟ තිබිණි. නඩු විභාගයෙන් පසු හෝටලයට පැමිණි මම මෙරේස්යෙව් හා ඔහුගේ සගයන් පිළිබඳ කතාව කියවා යථාර්ථවාදී ලෙස එයින් නවකතාවක් ලිවීම ඇරඹීමි.

එදා මෙරේස්යෙව් මට කී දේවලින් බොහොමයක් අමතක වී ඇත. අවුරුදු හතරක් ඇවෑමෙන් සමහර කරුණු අමතක වී ඇත. නිරහංකාර මෙරේස්යෙව් තම ජීවන තතුවලින් බොහොමයක් හෙළි නොකළේ ය. මේ නිසා මනැසින් අඩු තැන් පිරවීමට මට සිදුවිය. අලෙක්සේයි චමත්කාරී ලෙස තම සගයන් ගැන කළ විස්තර ද මට අමතක විය. සැබෑ වීරයාගේ නම මම යම්තමින් වෙනස් කළෙමි. ඔහුගේ අසීරු කාර්යය ඉටුකිරීමට ඔහුට බෙහෙවින් ආධාර උපකාර දුන් ඔහුගේ මිතුරන්ගේ නම් මවිසින් වෙනස් කැරිණි. ඔවුන් තම චරිතයෙන් නියම ලෙස මේ නවකතාව තුළින් නිර්මාණය වී තිබෙන සැටි දකිනු ඇත. ඔවුන්ගේ සැබෑ නම් වෙනස් කිරීම ගැන ඔවුන් මට සමාව දෙනු ඇතැයි සිතමි.

හෙර්මන් ගේරින්ග් වැනි පැසිස්ට්වාදී ම්ලේච්ඡයන්ට මරණය දක්වා අවබෝධ කර ගත නොහැකි වූ ද, ඉතිහාසයෙන් නිසි පාඩම් ඉගෙන ගැනීමට අකැමැති අය අවබෝධ කර ගැනීමට මැළි වන්නා වූ ද, නැපෝලියන් හා හිට්ලර් ගත් විනාශකාරී මඟ නැවත වරක් ගැනීමට රහසින් සිතන්නා වූ අයට අවබෝධ කර ගත නොහැකි වූ ද,

සෝවියට් චරිතය නියම ලෙස පිළිබිඹු කරන අලෙක්සේයි මෙරේස්යෙව්ගේ ජීවිත කතාව වටා ගෙතුණු නව කතාවට 'සැබෑ මිනිසෙකුගේ කතාවක්' යන නම මම තැබීමි.

'සැබෑ මිනිසෙකුගේ කතාවක්' නමැති නවකතාව බිහිවුණේ එසේ ය.

මුල් පිටපත ලියා පළකිරීමට සූදානම් කොට, නවකතාවේ වීරයා වන අලෙක්සේයි මෙරේස්යෙව් සොයා එය කියවීමට ඔහුට දීමට ඔහු සෙවූ නමුදු, ඔහු සොයාගත නොහැකි විය. අලෙක්සේයි පෙත්රෝවිච් මෙරේස්යෙව්ගේ ලිපිනය සොයා ගැනීම පිණිස අහස් හමුදාවේ නිලධාරින්ගෙන් නිල වශයෙන් ද, දන්නා හඳුනන අහස්යානා නියමුවන්ගෙන් ද ඉල්ලා සිටි නමුදු, ඵලක් නොවී ය.

නවකතාවේ කොටස් සඟරාවේ පළ විය. එය ගුවන් විදුලියෙන් ද කොටස් වශයෙන් ප්‍රචාරය විය. දවසක් දා ටෙලිෆෝනය හඬ නැඟී ය.

බැරෑඬි නිර්භය හඬකින් යමෙක් කතා කළේ ය. ඒ පුද්ගලයා මම හඳුනමියි මට හැඟිණි.

"මා කැමතියි ඔහෙව හමුවන්න"

"කවුද කතා කරන්නෙ?"

"මේජර් අලෙක්සේයි මෙරේස්යෙව්"

පැය කීපයකට මගේ නිවසට අලෙක්සේයි මෙරේස්යෙව් පැමිණියේ ය. ඔහුගේ ගමන කඩිසර ය. වලසකු මෙන් ඔහු තරමක් පැද්දෙයි. ඔහු ක්‍රියාශීලී ය. ප්‍රීතියෙනි. අවුරුදු හතරක යුද්ධය නිසා ඔහු වෙනස් වී නැත. හේ කතාව ඇරැඹී ය.

"මම ගෙදර පොතක් කියවමින් හිටියා. ගුවන්විදුලිය කිසිවක් ප්‍රචාරය කළ නමුදු, පොත ගැන සැලකිල්ලෙන් සිටි මට එය නෑසිණි. මගේ මව හිටිහැටියේ ම මෙහෙම කීවා. ''පුතේ අහපන්! රේඩියෝව නුඹ ගැන කියනව'' මම සැලකිල්ලෙන් අසන්නට වීමි. ඇත්ත. ඒ කතාව මා ගැන ය. මා ගැන ලියුවේ කවුදැයි සිතූ මම පුදුමවීමි. මගේ කතාව කිසිවෙකුට කී බවක් මට මතක නැත. එවිට ඔර්යොල් අසල අහස්යානා තොටුපළ ද, මගේ නවාතැන ද, මුළු රැයක් ම නොනිදා මගේ අත්දැකීම් ඔබට විස්තර කළ සැටි ද මට සිහිවිය... එය විය හැකිද? බොහෝ කලකට පෙර

එනම් මීට අවුරුදු පහකට පමණ පෙර සිදුවූවකි. ගුවන් විදුලිය එදිනට නියමිත කොටස කියවා එහි කතුවරයාගේ නම ද සඳහන් කළේය. ඉන් පසු ඔබ සෙවීමට මම පටන් ගතිමි...”

ඔහු මේ විස්තරය එක හුස්මට කීවේ ය. ඒ අතර ඔහු ඉඳ හිට ලැජ්ජාවෙන් මෙන් මඳ සිනා පෑවේ ය.

බොහෝ කලකට පසු යුද භටයන් දෙදෙනෙකු හමු වූ විට කතා කරන පරිදි අපි සාකච්ඡා කළෙමු. සටන් ගැන ද, දන්නා හඳුනන නිලධාරීන් ගැන ද, දිවි පිදූ වීරයන් ගැන ද අපි කතා කළෙමු. පෙර මෙන් ම, අලෙක්සේයි තමා ගැන කීමට මැළි විය. අපේ හමුවීමෙන් පසු අලෙක්සේයි මෙරේස්යෙව් සාර්ථක ලෙස අහස් සටන් කීපයකට ම සහභාගි වූ බව මට දැනගන්නට ලැබිණි. 1943-1945 කාලයේ දී ඔහු සිය අහස්යානා කණ්ඩායම සමඟ යුද පෙරමුණු කීපයක ම සටන් කළේ ය. ඕර්යොල්හි අපේ හමුවීමෙන් පසු ඔහු තවත් ජර්මන් අහස්යානා තුනක් බිම හෙළී ය. බෝල්ටික් මුහුදු තීරයේ සටන්වල දී තවත් සතුරු අහස්යානා දෙකක් ඔහු විසින් විනාශ කරන ලදි. නැතිවුණ දෙපා වෙනුවට ඔහු සතුරාගෙන් සෑහෙන ලෙස පළිගත්තේ ය. ‘සෝවියට් සංගමයේ වීරයා’ යන උසස් නාමය සෝවියට් ආණ්ඩුව විසින් ඔහුට පිරිනමන ලදි.

අලෙක්සේයි මෙරේස්යෙව් සිය පෞද්ගලික තොරතුරු ද මට කීවේ ය. නවකතාව සතුටින් අවසන් කිරීමට හැකි වීම ගැන මම ප්‍රීතිවෙමි.

යුද්ධයෙන් පසු අලෙක්සේයි ඕල්යා සමඟ විවාහ විය. ඔවුන්ට වික්ටර් නමින් පුතකු ලැබිණි. කමීෂින්හි සිට ඔහුගේ මව පැමිණ මුනුපුරා හදාවඩා ගන්නට වූවා ය. අලෙක්සේයිගේ මව තම පුතා, ලේළි සහ මුනුපුරා සමඟ ප්‍රීතියෙන් වාසය කරන්නී ය.

පිටරටක සිටිය දී මවිසින් ලියා නිම කරන ලද සැබෑ සෝවියට් මිනිසකු ගැන -අලෙක්සේයි මෙරේස්යෙව් ගැන ලියූ නවකතාව එසේ අවසන් වුව ද, ජීවිතය දිගට ම ක්‍රියාකාරී වෙමින් පවතී.

මොස්කව්,
නිව්රම්බර්ග් - 1950